
# ත්‍රිපිටක ධර්මය

## 05

## පස්වෙනි ශ්‍රේණිය



## මූලික පිරිවෙණ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



**සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට**
**www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

ප්‍රථම මුද්‍රණය - 2017
දෙවන මුද්‍රණය - 2018
තෙවන මුද්‍රණය - 2019
සිව්වන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0464-8

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා

ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා

අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා

පිළිගනු මැන අප භක්ති පූජා

නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා

ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති

ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ

ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ

නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා

ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා

එක මවකගෙ දරු කැල බැවිනා

යමු යමු වී නොපමා

ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා

අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යාස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යාස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ තව තවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

**නියාමනය හා අධීක්ෂණය :-**

| | |
|---|---|
| පී. එන්. අයිලප්පෙරුම | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**මෙහෙයවීම :-**

| | |
|---|---|
| පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි | - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි | - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**උපදේශකත්වය :-**

| | |
|---|---|
| මහාචාර්ය පූජ්‍ය කනත්තේගොඩ<br>සද්ධාරතන හිමි | - මහෝපාධ්‍යාය (වැ.බ)<br>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය<br>අනුරාධපුරය |

**සම්බන්ධීකරණය :-**

| | |
|---|---|
| පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි | - විෂය උපදේශක (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| ඩී.එම්.ජේ. පුෂ්පකුමාර | - නියෝජ්‍ය කොමසාරිස් (පාලන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**සංස්කරණය :-**

| | |
|---|---|
| පූජ්‍ය උඩුගම්පොළ ගුණානන්ද හිමි | - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය |
| පූජ්‍ය මාදෝවිට වජිරබුද්ධි හිමි | - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |

**ලේඛක මණ්ඩලය :-**

| | |
|---|---|
| පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි (සභාපති) | - විෂය උපදේශක (පිරිවෙන්)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි | - ගුරු උපදේශක<br>කො/නාලන්දා ධර්මායතන මූලික පිරිවෙණ<br>ගල්කිස්ස |
| පූජ්‍ය උඟුරුගමුවේ අස්සජි හිමි | - පරිවේණාචාර්ය<br>කලු/ගංගාතිලක මූලික පිරිවෙණ<br>කෙසෙල්වත්ත, පානදුර |
| පූජ්‍ය දියගම නාරද හිමි | - පරිවේණාචාර්ය<br>කො/සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ<br>ගංගොඩවිල, නුගේගොඩ |
| පූජ්‍ය ගැමුණුපුර සෝමවංශ හිමි | - පරිවේණාචාර්ය<br>කො/විද්‍යාලංකාර මහ පිරිවෙණ, පන්නිපිටිය |
| පූජ්‍ය ගල්කිස්සේ ධම්මිස්සර හිමි | - ගුරු උපදේශක<br>කො/වංගීස මූලික පිරිවෙණ, කලපලුවාව |
| පූජ්‍ය රම්මලේ සුමනරතන හිමි | - ගුරු උපදේශක<br>ගම්/විද්‍යාදර්ශි මූලික පිරිවෙණ, මුද්දරගම |
| ඊ.ඒ. ජයසේන එදිරිසිංහ | - විශ්‍රාමික විෂය උපදේශක (පිරිවෙන්)<br>498/B, කොස්වත්ත, රදාවාන |
| පී.ඒ. සරත් කුමාර | - පරිවේණාචාර්ය<br>කො/තක්ෂිලා මහ පිරිවෙණ, කොතලාවල |
| ආර්.එම්.ටී.ටී. රත්නායක | - පරිවේණාචාර්ය<br>මහ/විමලධර්ම මහ පිරිවෙණ, දංගොල්ල |
| පී.එල්. ලලිත් අබේසේකර | - ගුරු උපදේශක<br>නුවරඑළිය දිස්ත්‍රික්කය |

**සෝදුපත් කියවීම :-**

| | |
|---|---|
| එස්.ඒ. සුමුදු සුබසිංහ | - උපගුරු, බප/කැළ සපුගස්කන්ද මහා විද්‍යාලය<br>මාකොළ |

**පරිගණකගත කිරීම, පිටු නිර්මාණය සහ පිට කවරය :-**

| | |
|---|---|
| ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ | - පරිගණක අංශය<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

# පටුන


| | | |
|---|---|---|
| 01. | බුදුපියාණෝ උතුමන්ටත් උතුම් මිනිසෙකි | 01 |
| 02. | බුදුරදුන් සමවන්නේ බුදුවරුන්ට පමණි | 10 |
| 03. | කරුණාවෙන් සිසිල් හද ඇති බුදුසඳාණෝ | 24 |
| 04. | ගුණයෙන් අගපත් අගසවු බුදු පුත් | 31 |
| 05. | තෙරණින් අතර අගපත් දීපශිඛාවෝ | 37 |
| 06. | බුදුසසුන් මග යති පහන් | 43 |
| 07. | විනය - තල් කරටියේ බිඳ වැටීම | 51 |
| 08. | විනය - සාසනික පුනරුත්ථාපනය | 63 |
| 09. | විනය - අවිනිශ්චිත විනිශ්චය | 85 |
| 10. | ත්‍රිපිටක සාහිත්‍යය | 88 |
| 11. | ගිහි සමාජ සම්බන්ධතාව (සිගාලක සූත්‍රය) | 98 |
| 12. | ආගමික මතවාද පිළිගැනීමේ නිවැරැදි විධිය (කාලාම සූත්‍රය) | 116 |
| 13. | දැහැමින් නැගෙති අදැහැමින් වැටෙති (පරාභව සූත්‍රය) | 121 |
| 14. | වරදට බිය නිවනට පියවරයි (ආපත්තිභය සූත්‍රය) | 128 |
| 15. | අභිධර්මය - ඔබ ඔබේ රූපය හඳුනනවා ද? | 134 |

16. අභිධර්මය - අපේ රූප විසි අටකි 142

17. අභිධර්මය - නිවනින් නිවීම 147

18. දහසින් එකක්වත් නොවටිනා දේ (සහස්ස වග්ගය) 151

19. පාපය නම් බිහිසුණු ය (පාප වග්ගය) 175

20. ඔබ දඬුවමට බිය නම් අනුන් ද එසේ ම ය (දණ්ඩ වග්ගය) 193

21. බෞද්ධ දර්ශනය හෙවත් විදර්ශනාව 211

22. සිහියේ සිවුකොණ (සතිපට්ඨානය) 217

23. බුදු දහමේ හේතුඵලවාදය 227

24. කළොත් කර්මය භවය එතැන ය 232

25. බුදු දහමේ චරණය 238

26. මිහින්තලාවයි දහම් අමාවයි 244

27. මහතෙර සසුනෙන් බිඳී ගිය වාදය (මහායානය) 248

28. දහමත් දැන දෙසුමත් දැන දහම් දෙසමු 254

29. රජු දැහැමි වේ නම් රට දැහැමි වේ ම ය 266

30. දහම රකින්නා දහමින් රැකේ 272

01
පාඩම

# බුදුපියාණෝ උතුමන්ටත් උතුම් මිනිසෙකි

ලොව පහළ වූ කරුණාවේ හා ප්‍රඥාවේ ප්‍රතිමූර්තිය සම්මා සම්බුදුරජාණන් වහන්සේ ය. අප්‍රමාණ ලෝක සත්ත්වයාට මෙලොව පරලොව යහපත සැලසූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘන් වහන්සේ ද බුදුරජාණන් වහන්සේ ම ය. මිනිසෙකු ලෙස ඉපිද මිනිසෙකු ලෙස වින්ද යුතු සැප හා දුක් විඳ මිනිස් සිත උපරිම තලයකට දියුණු කළ උන් වහන්සේ ආශ්චර්යවත් මනුෂ්‍ය රත්නයක් වන සේක.

සත්ත්වයාගේ හා ලෝකයේ යථා තත්ත්වය මැනවින් වටහා ගත් බුදුරජාණන් වහන්සේ සියලු ධර්මයන් සිය නුවණින් ම අවබෝධ කර ගත් බැවින් සම්මා සම්බුද්ධ නම් වන සේක. මිනිසුන් අතර උපන්නත් බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙකු නොව උත්තරීතර මනුෂ්‍යයෙකි.

දිනක් උක්කට්ඨා නුවර සිට සේතව්‍ය නුවර දක්වා වඩින බුදුරජාණන් වහන්සේගේ පා සටහන් දුටු දෝණ බමුණා උන් වහන්සේ වෙත එළඹ සංවාදයක නිරත වෙමින් මෙසේ විමසී ය.

**බමුණා : ඔබ දෙවියෙක් ද?**
**බුදුරදුන්: බමුණ, මම දෙවියෙක් නොවෙමි.**
**බමුණා : එසේ නම් ඔබ ගාන්ධර්වයෙක් ද?**
**බුදුරදුන්: බමුණ, මම ගාන්ධර්වයෙක් ද නොවෙමි.**
**බමුණා : එසේ නම් ඔබ යක්ෂයෙක් ද?**
**බුදුරදුන්: බමුණ, මම යක්ෂයෙක් ද නොවෙමි.**
**බමුණා : එසේ නම් ඔබ මනුෂ්‍යයෙක් ද?**
**බුදුරදුන්: බමුණ, මම මනුෂ්‍යයෙක් ද නොවෙමි.**

මෙම ප්‍රකාශයෙන් මවිතයට පත් බමුණා මෙසේ කීය. මම ඔබෙන් ඔබ දෙවියෙක් දැයි ඇසූ විට නැතැයි කියති, ගාන්ධර්වයෙක් දැයි ඇසූ විට නැතැයි කියති, යක්ෂයෙක් දැයි ඇසූ විට නැතැයි කියති, මනුෂ්‍යයෙකු දැයි ඇසූ විට නැතැයි කියති. එසේ නම් ඔබ කවරෙක් ද? බමුණාගේ මෙම වදන් ඇසූ බුදුරජාණන් වහන්සේ බමුණාට මෙසේ වදාළහ. බ්‍රාහ්මණය, මම දෙවියෙක් නම් දෙවියන් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් මා තුළ තිබිය යුතු ය. මනුෂ්‍යයෙක් නම් මනුෂ්‍යයන් තුළ තිබිය යුතු කාමාදී ආශ්‍රවයන් තිබිය යුතු ය. එහෙත් මම එබඳු සත්වයන් තුළ ඇති කාමාදී ආශ්‍රවයන් සහමුලින් ම ප්‍රහීණ කළෙමි.

බ්‍රාහ්මණය උපුලක් හෝ පියුමක් හෝ හෙළ පියුමක් හෝ දියෙහි නොගැවී නොතැවරී තිබෙන්නේ යම් සේ ද මම ද මේ ලෝකයෙහි මිනිසුන් අතර උපන්නෙමි.

ලෝකයෙහි මිනිසුන් අතර වැඩී මිනිසුන්ගෙන් ඉස්මතු වී ලෝකය සමග නොගැවී නොබැඳී සිටිමි. මම බුද්ධ යැයි දැනගන්න යැයි දේශනා කළහ.

සාමාන්‍ය මිනිසුන් හැඳින්වීමේ දී යෙදෙන මනුෂ්‍ය යන පදය බුදුරදුන්ට භාවිත වුව ද එහි විශේෂත්වයක් ඇත. මිනිසුන් අතර බුදුරජාණන් වහන්සේ උත්තරීතර මිනිසක් වෙති. සීල, සමාධි, පඤ්ඤා, විමුක්ති, විමුක්තිඥාන දර්ශනයන්ගෙන් ශෝභාමත් වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍ය රත්නය බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේගේ උත්තරීතර මානුෂීය ගුණාංග සමුදාය අන්ධකාර සමාජයට දීප්තිමත් ආලෝකයක් මෙන් විය. බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මිනිසුන්ට සමකළ නොහැකි බැවින් ''අසම'' වෙති. බුදුරජාණන් වහන්සේලා හා පමණක් සම වන බැවින් අසමසම වෙති. උන්වහන්සේ සතු මානුෂීය ගුණාංග උත්තරීතර මානුෂීය ගුණාංගයන් වන්නේ එබැවිනි.

සම්බුද්ධ චරිතය පිළිබඳ විමසීමේ දී කරුණාව, දයාව, අනුකම්පාව, මෛත්‍රිය, පරාර්ථ චර්යාව, නිහතමානී බව, ඉවසීම, කළගුණ සැළකීම, පොදුබව, සමානාත්මතාව වැනි ගුණාංගයන්ට හිමිවන්නේ විශේෂ තැනකි.

**මහාකරුණිකයාණෝ**

අනුන්ගේ දුක්ගැහැට වධ වේදනා අසමානකම් අසරණකම් දැක සත්පුරුෂයන්ගේ හදවත සැලීමේ කම්පාවීමේ උසස් මිනිස් ගුණය කරුණාව නම් වේ. මානව දයාව අනුකම්පාව ලෙස ද මෙය හැඳින්වේ. සාමාන්‍ය පුද්ගලයන්ගේ කරුණාව සීමා සහිත වූවකි. එහෙත් බුදුරජාණන් වහන්සේගේ අසීමිත කරුණාව මහා කරුණාව නම් වේ. සියලු සත්වයා කෙරෙහි සමසිතින් ක්‍රියා කිරීම විශේෂත්වයයි.

**වධකෙ දෙවදත්තම්හි**
**චොරෙ අංගුලිමාලකෙ**
**ධනපාලෙ රාහුලෙ චෙව**
**සබ්බත්ථ සමමානසො**

සසරෙහි පටන් වෛර බැඳ පැමිණ ලොව්තුරා බුද්ධත්වයට පත් වූ ජාතියෙහි පවා විවිධ උවදුරු පැමිණ වූ දේවදත්ත තෙරුන්ටත්, රා බී වියරු වැටී ගිනි ගුලියක් සේ තමන්වහන්සේ වෙතට දිව ආ නාලාගිරි ඇතුටත්, නමින් අහිංසක වුවත් එබඳු ගති හැරදා ගුරු සිසු දෙපිරිස විසින් නොමග යැවීමෙන් මිනීමරුවෙකු වී තමන් වහන්සේ පසුපස එළවා ආ අංගුලිමාලටත්, සිදුහත් බෝසත් ලෙයින් උපන් සුරතල් රාහුල කුමරුටත් සම මෙතින් බුදුරජාණන් වහන්සේ ක්‍රියා කළසේක.

උන්වහන්සේ හිමිදිරි පාන්දර මහාකරුණා සමාපත්තියට සමවැදී තමන් වහන්සේගේ ආධ්‍යාත්මික පිහිට ලැබීමට අද කවරෙක් සුදුසු වෙත්දැයි විමසා බලමින් ඔවුන් සොයා ගොස් පිහිටවෙති. උන්වහන්සේගේ ජීවිතයෙහි පරමාර්ථය වූයේ පරාර්ථ චර්යාවෙහි හෙවත් ලෝකාර්ථ චර්යාවෙහි යෙදෙමින් ලෝක සත්වයා සංසාරයෙන් එතෙර කරවීමයි. බුද්ධත්වයේ සිට මහා පරිනිර්වාණය දක්වා ම වසර හතළිස් පහක් තුළ

දිනපතා වැඩිම කාලයක් කැප කරන ලදදේ මිනිස් සමාජයේ ලෞකික හා ලෝකෝත්තර දියුණුව සලසා දීම උදෙසා ය. උන්වහන්සේ ''පරත්‍ථං පටිපජ්ජථ'' යන දේශනාව ආදර්ශයෙන් ම පෙන්වූ සේක.

මහාකාරුණික වූ බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ සත්ත්වයෝ අපමණ ය. සිය සුළු පියාගේ කෝපයට ලක්වී අමුසොහොනේ මළ සිරුරකට බැඳ සිටි සෝපාක නිවන් සුව ලද්දේත් සැඩොල් කුලයෙහි උපත ලබා කසල ශෝධනයෙහි යෙදී දුක්බර ජීවිතයක් ගතකළ සුනීත සසර බන්ධනයන්ගෙන් මිදී නිවනට පත්වූයේත්, මියගිය තම එක ම දරුවාට බෙහෙත් සොයා දෙව්රම් වෙහෙරට පැමිණි කිසාගෝතමිය මරණයේ නියතබව දැන සසර දුක් කෙළවර කළේත්, දාසියක වූ රජ්ජුමාලා සියලු දුක් දොම්නස් දුරුකර රහත්බව ලැබුයේත්, රෝග පීඩාවන්ට මසුරු පියාගෙන් පිහිටක් නො ලද මට්ටකුණ්ඩලී දෙව්සැපතට පත්වූයේත්, මිනිස් ගුණයෙන් උතුම් වූ මහා කාරුණික බුදුරජාණන් වහන්සේගේ මානව දයාවේ බලයෙනි.

### නිහතමානී නායකයාණෝ

මානය නම් මැනීමයි. ජාතිය, කුලය, ධනය, තනතුරු, උගත්කම, රූපය ආදී කරුණු සලකමින් තමන් අනුන් හා මැනබැලීම මෙහි ස්වභාවයයි.

| | |
|---|---|
| **සෙය්‍යමාන** | **තමා අනුන්ට වඩා උසස් යැයි සිතීම** |
| **සදිසමාන** | **තමා අනුන් හා සමානයැයි සිතීම** |
| **හීනමාන** | **තමා අනුන්ට වඩා පහත්යැයි සැලකීම** |

යනුවෙන් මානයෙහි ප්‍රභේද තුනකි. නිහතමානීබව නම් මානය හෙවත් උඩගුකම සම්පූර්ණයෙන් නැසූ බවයි. බුදුරජාණන් වහන්සේ මහරහතන් වහන්සේ ආදී නික්ලේශී උතුමන් වහන්සේ නිහතමානී ගුණයෙන් යුතු ය. බුද්ධ චරිතයෙහි විවිධ අවස්ථා විමසන විට බුදුරජාණන් වහන්සේගේ නිහතමානී ගුණය අපට වඩාත් හොඳින් අවබෝධ කරගත හැකි ය.

සම්මා සම්බුද්ධත්වය අවබෝධකර ගැනීමෙන් පසු පස්වන සතියේ අජපාල නුගරුක මුල වැඩ සිටිද්දී තමන්ගේ ගුරුවරයා ලෙස ක්‍රියාකළ හැකි අයෙකු ඇත්දැයි විමසා බලන බුදුරජාණන් වහන්සේ ශීලාදී ගුණ දහමින් තමන් වහන්සේට වඩා උසස් කෙනෙකු නොමැති බව සැලකා උතුම් වූ ශ්‍රී සද්ධර්මය ගුරු තැන්හි තබාගත්හ.

දානය සඳහා විශේෂ ආරාධනා නොලද සෑම දිනක ම පිණ්ඩපාතයෙහි වැඩමවමින් රාජ මාළිගයටත් දුගී පැලටත් කිසිදු භේදයකින් තොරව වැඩමවා මිහිරි රස බොජුන් මෙන් ම කටුක නීරස භෝජන පවා සමසිතින් වැළඳූහ.

තමන් වහන්සේ සියල්ලන් අතර ශ්‍රේෂ්ඨ වුවත් සිය ශ්‍රාවක පිරිස් අතර සිටි විවිධ කුසලතා ඇති අය වෙත අගතනතුරු පිරිනැමීම පවා සම්බුද්ධ චරිතයෙහි විද්‍යමාන වන උදාර ගුණාංගයකි. ආනන්ද, නන්ද, රාහුල, මහාකාශ්‍යප, සාරිපුත්ත, මොග්ගල්ලාන ආදී මහරහතන් වහන්සේලා ශාසනික අගතනතුරු ලැබුයේ එබැවිනි.

එක්දිනක් බුදුරජාණන් වහන්සේ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සමග චාරිකාවෙහි නිරතවෙමින් සිටිද්දී අතරමග ගසක් මුල වැඩ සිටීමට අවශ්‍යබව දන්වූ සේක. කාශ්‍යප හිමියෝ බුදුරජුන්ට වැඩ සිටීමට තමන් වහන්සේගේ සිනිඳු පටසිවුර නවා ආසනයක් පිළියල කළ සේක. එහි වැඩසිටි බුදුරජාණන් වහන්සේ කාශ්‍යප හිමියන්ගේ සිවුර ස්පර්ශ කර ''කාශ්‍යප ඔබේ සිවුර සිනිඳුය'' යනුවෙන් පැවසූ සේක. මහාකාශ්‍යප හිමියෝ එම සිනිඳු සිවුර බුදුරජාණන් වහන්සේට පූජාකර බුදුරජාණන් වහන්සේගේ හණ වැහැරි සිවුර පොරවා ගත්හ. මෙවැනි අවස්ථා තුළින් නිහතමානී සරල චාම් පැවතුම් ඇති බුදුරජාණන් වහන්සේ අපට දැකගත හැකි ය.

බුදුරජාණන් වහන්සේ පිළිබඳ මහත් ප්‍රසාදයට පත් පුක්කුසාති රජතුමා උන්වහන්සේ සොයා පැමිණියේ ය. තමන් වහන්සේ හමුවීමට පැමිණීමට තරම් කාලයක් රජතුමාට නොමැති බව තේරුම්ගත් බුදුරජාණන් වහන්සේ රජුගේ පෙරමගට වැඩියහ. දෙදෙනා ම රාත්‍රියෙහි කුඹල් හලක නවාතැන් ගත්හ. මුළු රැය පුරා රජතුමා බුදුරජාණන් වහන්සේ සමග අනන්ත බුදුගුණ සාකච්ඡා කළේ ය. එහෙත් තමන් රැය පහන්වනතුරු ගතකළේ බුදුරජාණන් වහන්සේ සමග බව ඔහු නොදත්තේ ය. බුදුරජාණන් වහන්සේ ද රජතුමා සොයායන බුදුරදුන් තමන් යැයි නොඇඟවූහ. පුක්කුසාති රජතුමාට ධර්මාවබෝධයට අවශ්‍ය මග සැලසූ බුදුරජාණන් වහන්සේ පසුව ඔහුට තමන් වහන්සේව හඳුනා ගන්නට ඉඩ සැලසූහ. රජු ධර්මාවබෝධය ලැබී ය.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන සමයක ආයුෂ්මත් නන්දක තෙරුන් වහන්සේ උපස්ථාන ශාලාවෙහි දැහැමි කථාවෙන් ශ්‍රාවකයින් වහන්සේලාට කරුණු දක්වමින් සිටියහ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සවස් වරුවෙහි උපස්ථාන ශාලාවට පිවිසියහ. නන්දක තෙරුන්ගේ දීර්ඝ ධර්ම කථාව බුදුරජාණන් වහන්සේ දොරකඩ සිට ම ශ්‍රවණය කළහ. කථාව අවසානයෙහි දොරගුල ශබ්ද කළ විට භික්ෂූන් වහන්සේලා දොර විවර කළහ. එවිට නන්දක තෙරුන් ඇමතූ බුදුරජාණන් වහන්සේ ''ඔබ වහන්සේගේ දහම් විස්තරය භික්ෂූන් වහන්සේලාට මනාව වැටහිණි. එසේ වුවත් දීර්ඝ දහම් විස්තරය අසා දොරකඩ සිටි මාගේ පිට රිදෙන්නේයැයි වදාළහ. නන්දක තෙරුන් වික්ෂිප්ත වූ බව තේරුම්ගත් බුදුරජාණන් වහන්සේ නන්ද තෙරුන්ට ප්‍රශංසා කරමින් එම දේශනාව අගය කළහ. තමන් වහන්සේ ශාස්තෘවරයා වුවත් දුක වේදනාව දරාගෙන තම ශ්‍රාවකයන්ගේ දක්ෂතා අගය කිරීමත් ඒ සඳහා නිසි මග පෙන්වීමත් බුදුරජාණන් වහන්සේ තුළ පැවති උතුම් නිහතමානී ගුණය ප්‍රකට කරන්නකි.

### තාදී ගුණයේ ප්‍රතිමූර්තිය

සැපතේ දී උදම් වීමත්, විපත්තියේ දී කම්පාවීමත් මිනිස් සමාජයේ බොහෝ දෙනා තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. එහෙත් බුද්ධත්වයේ සිට පිරිනිවන් පෑම දක්වා වූ පන්සාලිස් වසක් ලෝ වැඩ සැලසූ බුදුරජාණන් වහන්සේ මේ දෙකරුණ එකසේ සලකා ඒවාට මැදහත්ව මුහුණ දුන්හ. ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සැප දුක යන අටලෝ දහම හමුවේ කම්පා නොවී කටයුතු කිරීම තාදි ගුණයයි.

උපතේ සිට මරණය තෙක් ජීවිතයේ විවිධ අවස්ථා පිළිබඳ සලකනවිට අටලෝ දහමේ සුබ පක්ෂයට පමණක් භාජනය වූවන් මෙන්ම අසුභ පක්ෂයට පමණක් භාජනය වූවන් ද සමාජයෙහි නොමැති බව පැහැදිලි ය. අටලෝ දහම අනුව නින්දා අපහාස අවනම්බු නොලැබූවෙකු ලොව නැත. එම අවස්ථාවන්හි දී අවශ්‍ය ම ගුණාංගයක් වන්නේ ඉවසීමේ ගුණයයි. බුදුරජාණන් වහන්සේ අකම්පිතව ඉවසීමේ මහා ගුණය ප්‍රකට කළ සේක.

මාගන්දිය නම් බමුණා බුදුරජාණන් වහන්සේ දැක පැහැදී තම දියණිය විවාහකරදීමට සිතා ඇය සර්වාභරණයෙන් සරසා උන්වහන්සේ වෙත පැමිණිවීය. රූපයේ අසාරත්වය පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ කළ දේශනාව අසා තම රූපයට නින්දා කළේයැයි කලකිරී කෝපයට පත්වූ ඇය බුදුරදුන්ට වෛර බැන්දා ය. පසුව ඇය උදේනි රජුගේ අග මෙහෙසිය වී බුදුරදුන්ට නොයෙක් නින්දා අපහාස හිරිහැර කරවීය. ඒවා ඉවසිය නොහැකි වූ ආනන්ද තෙරුන් මෙම නගරය අතහැර වෙනත් නගරයකට යාමට යෝජනා කළත් බුදුරජාණන් වහන්සේ එම නින්දා අපහාස හිරිහැරයන්ගෙන් අකම්පිතව එහිම වැඩවිසූහ. වරක් ලාභ ප්‍රයෝජනයෙන් පිරිහුණ අන්‍ය තීර්ථකයෝ උපක්‍රමශීලීව සුන්දරී නම් පරිබ්‍රාජික තරුණිය යොදවා අපහාස කිරීමට කටයුතු කළහ. ඇය මරා ජේතවනාරාමය අසල වළදමා ඇයගේ මරණයට බුදුරජාණන් වහන්සේ හා ශ්‍රාවකයන් වහන්සේලා වගකිව යුතුයැයි මහජනයා ඉදිරියෙහි චෝදනා කළහ. මෙම අපහාසය සත්‍යයැයි පිළිගත් ඇතැම්හු බුදුරජාණන් වහන්සේ සහ ශ්‍රාවක භික්ෂූන් වහන්සේට බැන වදින්නට වූහ. ඒ සියලු දේ බුදුරජාණන් වහන්සේ නිහඬව ඉවසූහ.

දෙව්රම් වෙහෙර දම් සභාවෙහි බුදුරජාණන් වහන්සේ සිව්වනක් පිරිසට දහම් දෙසමින් සිටිනවිට එම ස්ථානයට චිංචා නම් මානවිකාවක් පැමිණියා ය. ඇය පැමිණියේ කුසෙහි ලී පුවරුවක් බැඳ ගැබිනි වෙස් මවාගෙන ය. තම කුස ඔත් දරුවාගේ පියා බුදුරජාණන් වහන්සේ යැයි පවසමින් ඇය උන්වහන්සේට අපහාස කරන්නට විය. බුදුරජාණන් වහන්සේ එයින් කම්පා නොවූහ. ටික වේලාවකින් දෙවියන්ගේ බලයෙන් පුවරුව කඩාවැටීම නිසා මහජනයා ඉදිරියේ ඇය නින්දා අපහාස ලැබුවා ය. මෙසේ නින්දා අපහාස කිරීම්, ලාභයෙන් පිරිහෙළීමට ගත් උත්සාහ අවස්ථා රාශියක් සම්බුදු සිරිත පුරා දැකිය හැක. එහෙත් ඒ සියල්ල හමුවේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ අකම්පිත වූහ.

බිම්බිසාර මහරජ, කෝසල මහරජ, අනේපිඬු සිටුතුමා විශාඛා උපාසිකාව ආදී රාජරාජ මහාමාත්‍යවරුන්ගෙන් මෙන්ම බොහෝ ධනවතුන්ගෙන් කෙතරම් ලාභ සත්කාර ලැබුණත් ඉන් බුදුරජාණන් වහන්සේ උදම් නොවූහ. කෙතරම් අලාභ අපහසුකම් විඳින්නට සිදු වුවත් ඉන් කම්පා නොවී සමසිතින් ඉවසූසේක. දොළොස්වන වස්කාලය උදය නම් බමුණාගේ වස් ආරාධනාවට අනුව වේරඤ්ජා නුවර වස් විසූහ. එහෙත් බමුණාට එම ආරාධනාව අමතකවීමත් දුර්භික්ෂයත් නිසා තුන්මසක කාලයක් අශ්වයන්ට දෙන යවහාලින් ජීවත්වීමට බුදුරජාණන් වහන්සේටත් ශ්‍රාවකයන් වහන්සේලාටත් සිදු විය. වෙනත් ප්‍රදේශයකින් පිණ්ඩපාත ආහාරය ගෙනවුත් දීමට සෘද්ධිමත් ශ්‍රාවකයන් වහන්සේලා සූදානම් වුවත් එය ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ එම අලාභය මැදහත් සිතින් ඉවසූහ.

**අසහාය ශාස්තෘවරයාණෝ**

ඉතා උතුම් නිවැරදි මග පෙන්වා දීම ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වයයි, සත්‍ථා හෙවත් ශාස්තෘත්වය යනු ද එයයි.

''**තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා**'' යනුවෙන් බුදුරජාණන් වහන්සේලා අවශ්‍ය මග පෙන්වන බවත් ඒ මග ගමන් කිරීම අපට අයත් කාර්යයක් බවත් උන්වහන්සේ වදාළහ. බුදුරජාණන් වහන්සේලාගේ පරමාර්ථය නම් මහජනයාට දෙලොව දියුණුවට මග කියාදීමයි. පරාර්ථය පරමාදර්ශ කරගත් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ සුව පහසුව පවා නොසලකා අන්‍යයන්ගේ යහපත උදෙසා මග පෙන්වූහ. උපදෙස් දුන්හ, මංගල, පරාභව, ව්‍යග්ඝපජ්ජ, වේළුද්වාර සිඟාලෝවාද වැනි සූත්‍ර දේශනාවන්ගෙන් පැහැදිලිවන කරුණු අනුව මිනිසාගේ ලෞකික ජීවිතය ශිල්පයෙන් මෙන් ම ධනයෙන් පොහොසත් වන අතර ගුණයෙන් ධාර්මික කරවීමට මග පෙන්වා දුන් බව පැහැදිලි වේ.

ධනයෙන් බලයෙන් පිරිපුන් රජ දරුවන්ට සිටුවරුන්ට මෙන් ම ඒකසාටක බමුණා වැනි අන්ත දුගී දුප්පතුන්ටත් විවිධ මිනිස් ගුණ දහමින් හෙබි ගුණවතුන්ට මෙන් ම මිනිස් දහමින් තොරව තිරිසනුන් මෙන් ජීවත් වූ ගුණ හීනයන්ටත් උපශාන්ත ගතිපැවතුම් ඇත්තවුන්ට මෙන් ම අංගුලිමාල ආලවක ආදී අශාන්ත අදාන්තයන්ටත් පිහිට වූ සේක.

සිය දැනඋගත්කම් නිසා මානයෙන් හිස උදුම්මාගත් සච්චක, බක බ්‍රහ්ම ආදීන්ට මෙන් ම නිරහංකාර පුද්ගලයන්ටත් කුලමානය නිසා තමන් උසස් කොට සැලකූ අග්ගික භාරද්වාජ සුන්දරික භාරද්වාජ වැන්නවුන්ටත් සුනීත, සෝපාක වැනි කුලවාදයෙන් පීඩාවට පත් වූවන්ටත් රජුගේ සිට වහල් මෙහෙකරුවා දක්වා සෑම සමාජ තලයක ම පුද්ගලයන්ට යායුතු මග මේ යැයි දැහැමි ඔවදන් දී යහමග පසක් කරවීමට බුදුරජාණන් වහන්සේ සමත් වූහ.

බුදුරජාණන් වහන්සේ හැඳින්වීම සඳහා ''**මග්ග විදූ**'' ''**මග්ගකොවිද**'' ''**මග්ගඤ්ඤු**'' වැනි පද භාවිත කරන්නේ උන් වහන්සේ මාර්ගෝපදේශකයෙකු වූ බැවිනි.අතිවිශාල අනුගාමික පිරිසක් තමන් වහන්සේ වටා සිටියත් ඔවුන් අධිපතියෙකු සේ කටයුතු කිරීමට අපේක්ෂා නොකළහ. උන්වහන්සේ නිරන්තරයෙන් බලාපොරොත්තු වූයේ ස්වෙච්ඡාවෙන් නියම මාර්ගයෙහි ගමන් කරන ආචාරශීලී බුද්ධිමත් ශිෂ්‍ය පරම්පරාවකි.

''තථාගතයන් වහන්සේ වන මම භික්ෂු සංඝයාගේ නායකත්වය දැරීමට කිසි කලෙකත් නොසිතුවෙමි. එසේම භික්ෂු සංඝයා මගෙන් යැපෙන බව ද නොසිතුවෙමි'' යන සඳහනෙන් ඒ බව පැහැදිලි වේ. බුදුරජාණන් වහන්සේට දක්වන සැබෑ ගෞරවය නම් ධර්මානුධර්ම ප්‍රතිපත්ති අනුගමනය කිරීම මිස වෙනත් බාහිර පුදපූජා ආදිය සිදුකිරීම නොවන බව වරක් ආනන්ද හිමියන් අමතා ප්‍රකාශ කළ සේක.

''න ඛො ආනන්ද එත්තාවතා තථාගතො සක්කතො වා හොති ගරුකතො වා මානිතො වා පූජිතෙ වා අපචිතො වා, යො ඛො ආනන්ද භික්ඛු වා භික්ඛුණී වා උපාසකො වා උපාසික වා ධම්මානුධම්මපටිපන්නො විහරති සාමීචිපටිපන්නො අනුධම්මචාරී, සො තථාගතං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති අපචියති පරමාය පූජාය''

(මහා පරිනිබ්බාන සූත්‍රය)

''දාරුණො භික්ඛවෙ ලාභ සක්කාරො'' බල කාමය ධන කාමය තනතුරුවලට ඇති ගිජුකම ප්‍රසිද්ධිය යන මේවා ඉතා භයානක දේවල්ය. එබැවින් ඒවා ප්‍රතික්ෂේප කළ යුතු ය.

**ඵලං වෙ කදලිං හන්ති ඵලං වෙලුං ඵලං නලං**
**සක්කාරො කා පුරිසං හන්ති ගබ්භො අස්සතරිං යථා**

කෙසෙල්, උණ බට ආදී ගස් ඵල ගැනීමෙන් වැනසෙන්නා සේ නොහික්මුණු පුද්ගලයා ලාභ සත්කාර නිසා වැනසේන්නේ ය. එනිසා ''**ධම්ම දායාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිස දායාදා**'' මහණෙනි මා නිසා ලැබෙන ආමිස ලාභය උරුම කර නොගන්න. මාගේ ධර්මය උරුම කොට වසන්නැයි වදාළහ. මෙසේ ශාස්තෘත්වයෙන් බුදුරදුන්ට සමකළ හැක්කෙක් ලොව නොමැත.

## උත්තරීතර සමාජ දාර්ශනිකයාණෝ

බුදුරජාණන් වහන්සේ භාරතීය සමාජයේ පහළ වූයේ බ්‍රාහ්මණ දහම මූලික කරගත් වෛදික සමාජ ව්‍යුහයක ය. කුල භේදය, පන්තිභේදය එකල ජන සමාජය තුළ මහත් සේ ව්‍යාප්තව පැවතුනි. ඒ සියල්ල දෙස මානව හිතවාදීව බැලූ බුදුරජාණන් වහන්සේ සියලු දෙනා එක හා සමානව සැලකීමට සමාජ සත්ත්වයා පෙළඹ වූහ.

කෙනෙකු උසස් බවට හෝ පහත් බවට පත්වන්නේ තම චරිතය හා ක්‍රියාපිළිවෙත හේතුවෙන් බව දේශනාවෙන් මෙන් ම ආදර්ශයෙන් ද පෙන්වූහ. ධනවත් ස්වාමියාට මෙන් ම දුප්පත් සේවකයාටත් මානව නිදහස සමාන ය. සියලු අසාධාරණ සමාජ බෙදීම් ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසට මුළුමහත් ජන සමාජය ම ඇතුළත් කළහ.

කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි වැනි බමුණන්ටත්, නන්ද, රාහුල, ආනන්ද, අනුරුද්ධ වැනි රජ කුමාරවරුන්ටත් පොදුජන සමාජයේ ගොවි කම්කරුවන්ටත් උපාලි කරණවැමියා වැන්නවුන්ටත් සුනීත, සෝපාක වැනි හීන කුලයන්හි උපන්න වුන්ටත් සමසේ සසුනෙහි දායාද හිමිකර උතුම් වූ ප්‍රවුජ්‍යාව ලබාදුන්හ. ගංගා, යමුනා, අචිරවතී ආදී ගංගා මහාසාගරයට පැමිණි පසු පෙර පැවති නම් අතහැර එකම රසයක් හා වර්ණයක් ඇති සාගර ජලය බවට පත්වන්නාක් මෙන් විවිධ කුලවලට අයත් වූවෝ උන්වහන්සේගේ සසුනට ඇතුළු වූ පසු එක ම භික්ෂු සංඝයා ලෙස සැලකෙති.

කෙනෙකු බ්‍රහ්මණයෙකු හෝ වසලයෙකු වන්නේ උපතින් නොව ඔහුගේ ක්‍රියාව අනුව බව වදාළ බුදුරජාණන් වහන්සේ සියලු මිනිසුන්ට සමාන ගෞරවයක් ඇතිව කටයුතු කිරීමට අවස්ථාව උදාකර දුන්හ.

''සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ''

පිරිසිදු බව හෝ අපිරිසිදුබව තමා ම ඇති කර ගත යුත්තක් මිස කිසිවෙකුට තවෙකෙකු පිරිසිදු කළ නොහැකි ය ගතානුගතිකව දේවවාදී ඉගැන්වීම් පසුපස ගිය බොහෝදෙනාට තම චින්තන බුද්ධිය මෙහෙයවා ක්‍රියා කිරීමේ වටිනාකම පෙන්වා දුන් උත්තරීතර ශාස්තෘවරයාණෝ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය. එබඳු අන්ධ විශ්වාසයන් සත්‍යයට මග නොවන බව දේශනා කළ බුදුරජාණන් වහන්සේ විමුක්තිය ඇත්තේ තමා තුළ මිස එය දෙවියන් හෝ අන්කිසිවෙකු තුළ නොවන බව දේශනා කළහ. උන්වහන්සේ නිදහස් චින්තනය අගයකළ එක් අවස්ථාවක් ලෙස කාලාම සූත්‍රය සඳහන් කළ හැකි ය. සිය දහම හා දර්ශනය පමණක් නිවැරදි ය. අන් සියල්ල හිස්ය යනු භාරතයේ බොහෝ ශාස්තෘන් පිළිගත් අදහාගත් මතයයි. කාලාමවරු බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ තමන් හමුවට එන බොහෝ ආගමික ශාස්තෘන් මෙසේ පැවසීම ගැටලුවක් වන බැවින් කුමක් සත්‍ය ලෙස පිළිගතයුතු දැයි විමසූහ. මිනිසුන් යම් යම් දේ විශ්වාස කරන ආකාර දහයක් ගෙනහැර දක්වූ බුදුරජාණන් වහන්සේ ඒවාට වහල් නොවී නුවණින් විමසා බලා හොඳ දේ පිළිගන්නා ලෙසත් නරක දේ බැහැර කරන ලෙසත් කාලාමයන්ට වදාළහ.

කාන්තාවක ලෙසින් උපත ලැබීම එදා සමාජයේ පාපයක් මෙන්ම සාපයක් ලෙසින් ද සැලකිණි. තම මැදුරේ දුවක් ඉපදීම ගැන පසු තැවෙමින් සිටි කොසොල් රජුට බුදුරදුන් වදාළේ ''මහරජ, ස්ත්‍රියක වුව ද නැණවත් නම් සිල්වත් නම් නැදිමයිලන්ට දෙවියන්ට මෙන් සලකයි නම් පතිවත රකී නම් ඇය උතුම් ය. එබඳු වාසනාවන්තියකගේ පුතෙක් රජකම වුවද ලබන්නේය යනුවෙනි.

භාරතීය කාන්තාවගේ විමුක්තිය උදෙසා භික්ෂුණී ශාසනය ඇති කිරීමෙන් මහත් අනුග්‍රහයක් දක්වූහ. සමගින් කාන්තාවට හිමි වූ නිදහස කෙතරම් අගනේ ද යන්න ථේරිගාථාවල එන විතරාගී තෙරණින් වහන්සේලාගේ ප්‍රකාශයන්ගෙන් වඩාත් පැහැදිලි වේ. පැරණි ඉන්දීය බ්‍රාහ්මණයන් විසින් ස්ත්‍රිය සම්බන්ධයෙන් ගොඩනගා තිබූ ආකල්පය බිඳහැර ඔවුන්ට භික්ෂුණියක්, මවක්, සොයුරියක් බිරිඳක් හා දියණියක් ලෙස සමාජ වරප්‍රසාද උරුම වූයේ උතුම් මිනිසත් ගුණයෙන් පිරුණු බුදුරජාණන් වහන්සේ නිසාවෙනි.

පංචශීල ප්‍රතිපදාව අනුව භාරතීය සමාජය යහපත් ගුණගරුක සමාජයක් බවට පත්කිරීමට බුදුරජාණන් වහන්සේ ගත් වෙහෙස අපමණ ය. යහපත් සමාජයක් කරා පුද්ගලයන් ගෙනයන විට එයට විවිධ බාධාවන් එල්ලවීම සාමාන්‍ය ස්වභාවයකි. අන්ධානුකරණයෙන් යුතු සමාජය යථාර්ථය හඳුනන පිරිසක් බවට පත් කිරීමට යාමේ දී බොහෝ පිරිසකගෙන් බුදුරජාණන් වහන්සේට ද බාධා එල්ල විය. එහෙත්, තමන් වහන්සේ පළමුව නිවැරදි පිළිවෙත්හි පිහිටා අන්‍යයන්ට අනුශාසනා කිරීමෙන් බුදුරජාණන් වහන්සේ පරමාදර්ශී වූහ. එබැවින් ම යහපතට නැඹුරු වූ විශාල අනුගාමික පිරිසක් උන්වහන්සේ

වටා රොක් වූහ. තථාගත ශ්‍රී සද්ධර්මය **එහි පස්සික** හෙවත් පැමිණ විමසා බලා අනුගමනය කළ හැකි දහමක් වන බැවින් බුද්ධිමත් පිරිස් බුදුසසුන වටා ඒකරාශී වූහ. බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මිනිස් ගුණ සමුදාය ද එම සත්‍යවාදී දහම වෙත පිරිස් යොමු කරවීමට හේතු විය.

අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ කකුධ සූත්‍රයේ සඳහන් වන පරිදි ලොව ශාස්තෘවරු වර්ග පහකි. එනම්, සීලයෙන් අපිරිසිදු, ජීවිකාවෙන් අපිරිසිදු, ධර්ම දේශනයෙන් අපිරිසිදු, ධර්ම විවරණයෙන් අපිරිසිදු ඥාණ දර්ශනයෙන් අපිරිසිදු ශාස්තෘවරු ය. එහෙත් ඔවුහු ඒ කරුණුවලින් පිරිසිදු අය ලෙස මහජනයාත් ඉදිරියේ පෙනී සිටිති. එපමණක් නොව ඒ බව හෙළිදරවු නොකොට ශ්‍රාවකයන් තමා රැකගනු ඇතැයි අපේක්ෂා කරති. ඒ ශ්‍රාවකයන්ගෙන් රැකවරණ පතන ශාස්තෘවරු ය. එහිදී බුදුරජාණන් වහන්සේ වදාරන්නේ තමන් වහන්සේත් මේ කරුණු පහෙන් ම තමා පිරිසිදු යැයි මහජනයා ඉදිරියේ ප්‍රතිඥා කරන නමුත් එසේ ප්‍රතිඥා කළේ සැබවින් ම ඒවායෙහි පිරිසිදුව සිටිමින් බව ය. එබැවින් මේ කිසි කරුණකින් ශ්‍රාවකයන් තමන් වහන්සේව ආරක්ෂා කිරීම අනවශ්‍ය බවත් එසේ ආරක්ෂා කළ යුතු යැයි තමා කිසිවිටෙකත් අපේක්ෂා නොකරන බවත් උන්වහන්සේ වදාරති. මෙබඳු අභීත සිංහනාදයක් කළ ලොව එකම ශාස්තෘවරයාණෝ බුදුරජාණන් වහන්සේ ය.

**අභ්‍යාස**

01. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති උත්තරීතර මිනිස් ගුණ ප්‍රකට වන අවස්ථා පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කරන්න.
02. ''මහා කාරුණික බුදුරජාණෝ'' යන මැයෙන් රචනාවක් ලියන්න.
03. බුදුරජාණන් වහන්සේ අටලෝ දහමින් කම්පා නොවූ අයුරු උදාහරණ සහිතව පහදන්න.

02 පාඩම

# බුදුරදුන් සමවන්නේ බුදුවරුන්ට පමණි

## බුදුරදුන්ගේ රූප විලාසය

සම්මා සම්බුදුරජාණන් වහන්සේ අසමසම ගුණයන්ගෙන් යුතු වන සේක. උන්වහන්සේගේ රූප විලාසය දුටුදුටුවන් මන නුවන් පිනවන පැහැදීම ඇති කරවන සුලුය. බුදු සිරුර දෙතිස් මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් හා අසීති අනුව්‍යඤ්ජනයන්ගෙන් අසිරිමත් ය.

## බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ

01. **සුප්පතිට්ඨිත පාදො හොති:** පොළොවෙහි මනාව පිහිටි පා ඇතියහ.
02. **හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි හොන්ති:** යටිපතුලෙහි චක්‍ර ලක්ෂණ ඇතියහ.
03. **ආයතපණ්හී හොති:** දික් විලුඹ ඇතියහ.
04. **දීඝඞ්ගුලි හොති:** දික් ඇඟිලි ඇතියහ.
05. **මුදුතළුනහත්ථපාදො හොති:** මොළොක් තරුණ අතුල් පතුල් ඇතියහ.
06. **ජාලහත්ථපාදො හොති:** දැල් කවුළු වැනි අත්පා ඇතියහ.
07. **උස්සඞ්ඛපාදො හොති:** ඉහළින් පිහිටි ගොප් ඇටය ඇතියහ.
08. **එණිජඞ්ඝො හොති:** ඕලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇතියහ.
09. **අනොනමන්තො ජණ්ණුකානි පරාමසති:** නොනැමී දණහිස් ස්පර්ශ කළ හැකියහ.
10. **කොසොහිතවත්ථගුය්හො හොති:** කොපුවෙහි ගිලුණු වත්ථගුහ්‍ය ඇතියහ.
11. **සුවණ්ණවණ්ණො හොති:** රන් බඳු පැහැ ඇතියහ.
12. **සුඛුමච්ඡවී හොති:** දූවිලි නොරඳන සුලු සියුම් සම ඇතියහ.
13. **එකෙක ලොමො හොති:** එක් රෝම කූපයක එක් ලෝමයක් පමණක් ඇතියහ.
14. **උද්ධග්ගලොමො හොති:** උඩුකුරු වූ අගින් උඩට නැමුණු ලෝම ඇතියහ.
15. **බ්‍රහ්මුජ්ජුගත්තො හොති:** බ්‍රහ්මයා බඳු ඍජු ශරීර ඇතියහ.
16. **සත්තුස්සදො හොති:** පිටි අත්, පිටි පා, දෙවුර, කඳ යන සත් තැන උස්ව පිරුණු මස් ඇතියහ.
17. **සීහපුබ්බද්ධකායො හොති:** සිංහයෙකුට බඳු පිරුණු උඩුකය ඇතියහ.
18. **චිතන්තරංසො හොති:** මනාව තැනුණු පිට මැද ඇතියහ.
19. **නිග්‍රොධ පරිමණ්ඩලො හොති:** නුග රුකක් බඳු වටමට වූ උන්වහන්සේගේ කය යම් පමණ ද බඹය ද එපමණ සමප්‍රමාණ වේ.
20. **සමවත්තක්ඛන්ධො හොති:** දික් නොවූ කොට ද නොවූ සමව වට වූ ගෙල ඇතියහ.
21. **රසග්ගසග්ගී හොති:** වහා රස ග්‍රහණයට සමත් සේ උඩුකුරු වූ රසනහර අග ඇතියහ.
22. **සීහහනු හොති:** සිංහයාගේ යටි හනුව සේ පිරිපුන් දෙහනු ඇතියහ.
23. **චත්තාළීස දන්තො හොති:** සම සතළිස් දත් ඇතියහ.
24. **සමදන්තො හොති:** සමව පිහිටි දත් ඇතියහ.
25. **අවිරළදන්තො හොති:** තැන තැන හිදැස් නැති දත් දෙපෙළ ඇතියහ.

26. **සුසුක්කදාඨො හොති**: සුදෝසුදු දත්පෙළ ඇතියහ.
27. **පහූතජිව්හො හොති**: මුහුණ වසාලන තරම් පුළුල් දිව ඇතියහ.
28. **බ්‍රහ්මස්සරො කරවීකභාණී හොති**: බ්‍රහ්මයාගේ බඳු පැහැදිලි ස්වරය හා කුරවිකෙවිල්ලක බඳු මිහිරි උච්චාරණ ඇතියහ.
29. **අභිනීලනෙත්තො හොති**: නිසිතැන්හි පිරිසිදු නිල් පැහැති නෙත් ඇතියහ.
30. **ගොපඛුමො හොති**: ළදරු වස්සෙකුගේ බඳු මැණික් ගුලියකට සමාන ඇස් ගඩු ඇතියහ.
31. **උණ්ණාභමුකන්තරෙ ජාතා ඔදාත මුදුතූල සන්නිභා හොති**: සුදු මෘදු පුළුන් රොදක් බඳු ඌර්ණරෝමයක් දෙබැම අතර පිහිටියේ ය.
32. **උණ්හීසසීසො හොති**: පිරිපුන් නළල් තල සහ පිරිපුන් හිස ඇතියහ.

## අසීති අනුව්‍යඤ්ජන

බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙහි ඇඟිලි, නිය, ගොප්මස, පාද, දනමඬලු, පෙකණිය, බාහු, ශරීරය, කායබලය, දත්, ඉඳුරන්, තොල්, මුහුණ, ශරීර කාන්තිය, දෙකම්මුල්, ඇස්, ඇහිපිය, දිව, කණ්, නළල, බැම, ලොම්, ආශ්වාස ප්‍රාශ්වාස වායුව, කෙස්, කේතුමාලාව, මුව යන මේ අංග හා ගමන් විලාසයෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ අසූවක් අසීති අනුව්‍යඤ්ජන නම් වේ.

## බුදුරදුන්ගේ වාග් විලාසය

1. **විස්සට්ඨතා** (ශබ්දය පහසුවෙන් මුවින් පිටවීම) 2. **විඤ්ඤෙය්‍යතා** (අදහස වහා අවබෝධ වීම) 3. **මඤ්ජුතා** (මිහිරි බව) 4. **සවණීයතා** (සවනට සැප නොදීම) 5. **බින්දුතා** (අතර බිඳීම් නැති බව) 6. **අවිසාරිතා** (පැහැදිලි වීම) 7. **ගම්භීරතා** (ගැඹුරු බව) 8. **නින්නාදිතා** (පිරිස කෙළවර සිටින අයට පවා ඇසීම) යන අෂ්ටාංග සමුපේත බ්‍රහ්ම ස්වරයෙන් යුතු බුදුරජාණෝ කුරවි කොවුලන්ගේ හඬ පරදන කන්කළු මිහිරි කටහඬකින් යුතු වනසේක.

## බුදුරදුන්ගේ ඥාන විලාසය

බුදුරජාණන් වහන්සේගේ ඥාන විලාසය ද මනෝඥ වූවකි. ඥානය නම් ඒ ඒ ධර්මයන්ගේ නියම තත්ත්වය පිළිබඳ පරිපූර්ණ දැනීමයි. අවබෝධයයි. විලාස නම් ආකාරයයි. ස්වභාවයයි. මේ අනුව ඥාන විලාසය නම් බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාවෙහි ස්වභාවයයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ අසමසම නුවණ අචින්ත්‍ය ඥාන නම් වේ. බුදුරජාණන් වහන්සේ හඳුන්වන ස්ථානයන්හි දී මහා පඤ්ඤා, අනන්ත ඤාණ යන පද භාවිත කරන්නේ තථාගතයන් වහන්සේ තුළ පැවති ඥාන සම්භාරය හේතුවෙනි.

**" නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං**
**අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය අතීතං**
**අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන**
**බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති"**

ඒ භාග්‍යතුන් වහන්සේ විසින් නොදන්නා ලද්දක් නොදක්නා ලද්දක්, ඥානයෙන් නොපැමිණෙන ලද්දක්, ප්‍රත්‍යක්‍ෂ නොකරන ලද්දක්, ඥානයෙන් ස්පර්ශ නොකරන ලද්දක් නැත. අතීත වූ ද, අනාගත වූ ද, වර්තමාන වූ ද සකල ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඥානය හමුවේ ප්‍රකට වන්නාහ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ අසමසම බුදුගුණ හැඳින්වීමේදී,

**1. දසබල ඥාන 2. චතුර් වෛශාරද්‍ය ඥාන**
**3. ෂට් අසාධාරණ ඥාන 4. ත්‍රිවිද්‍යා ඥාන**

විශේෂත්වයක් ගනී. මජ්ඣිම නිකායේ මහාසීහනාද සූත්‍රය ආදී බොහෝ සූත්‍රධර්මවල මෙම උසස් ඥානයන් පිළිබඳ විග්‍රහයන් දැකිය හැකි ය.

**★ දසබල ඥාන**

මහාසීහනාද සූත්‍රයට අනුව බුදුරජාණන් වහන්සේගේ ඥානබල දහයකි.

**''දස ඛො පනිමානි සාරිපුත්ත තථාගතස්ස තථාගත බලානි,**
**යෙහි බලෙහි සමන්නාගතො තථාගතො ආසභං ඨානං පටිජානාති.**
**පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තෙති''**

තථාගතයන් වහන්සේට සෙසු අයට නැති ඤාණබල දහයක් ඇත්තේ ය. ඒ බලයන්ගෙන් යුක්ත බැවින් උන්වහන්සේ ලෝකයෙහි උත්තම ස්ථානයට පැමිණ සිටින සේක. ක්‍ෂත්‍රිය පිරිස ය, බ්‍රාහ්මණ පිරිස ය, ගෘහපති පිරිස ය, ශ්‍රමණ පිරිස ය, චාතුම්මහාරාජික පිරිස ය, තාවතිංස පිරිස ය, මාර පිරිස ය, බ්‍රහ්ම පිරිස ය යන අට පිරිසෙහි අභීත සිංහ නාද පවත්වන සේක.

**1. ඨානාඨාන ඤාණය**

**තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති.**

තථාගතයන් වහන්සේ ඒ ඒ දෙය සිදුවීමේ හේතු ද නිවැරදි ලෙස දන්නාහ. එසේම සිදු නොවීමේ හේතු ද නිවැරදි ලෙස දන්නාහ. ඒ හේතු අහේතු ඇති සැටියෙන් ම දන්නා ඨානාඨාන ඤාණය පළමුවන තථාගත ඤාණ බලයයි.

සෝවාන් පුද්ගලයෙකු විසින් කිසියම් සංස්කාරයක් නිත්‍යය කියා ද, සැපය කියා ද ආත්මය කියා ද වරදවා ගනු ලැබිය යන්න සිදුවිය නොහැකි දෙයකි. එහෙත් පෘථග්ජන පුද්ගලයා එසේ වරදවා ගැනීමට හේතු ඇත. සෝවාන් පුද්ගලයෙකු විසින් මව මැරීමට, පියා මැරීමට නපුරු සිතින් තථාගත සිරුරෙහි ලේ සෙලවීමට, රහතන් වහන්සේ මැරීමට සංඝ භේදය කිරීමට කිසිදු කරුණක් නැත. එහෙත් පෘථග්ජනයා විෂයෙහි එසේ වීමට හේතු ඇත. සෝවාන් පුද්ගලයා අන්‍ය ශාස්තෘවරයෙකු අදහන්නේ ය. යන මේ කරුණ ද සිදුවිය නොහැක්ක කි. එහෙත් පෘථග්ජනයා එසේ වීමට හේතු ඇත. මේ ආදී විය හැකි හා නොවිය හැකි කරුණු බුදුරජාණන් වහන්සේ දන්නා සේක.

## 2. කම්ම විපාක ඤාණය

**තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති.**

අතීත, වර්තමාන හා අනාගත කාලයට අයත් ව කරන ලද ඒ ඒ කර්මයන්ට ලැබෙන විපාක හේතු වශයෙන් ද ප්‍රත්‍යය වශයෙන් ද ඇති සැටියෙන් දන්නා නුවණ තථාගතයන් වහන්සේට ඇත. එය ද තථාගත ඤාණ බලයකි. කර්මවිපාක තත්ත්වය ඉතා ගැඹුරු කරුණකි. එය බුදුරජාණන් වහන්සේලාට මිස අන්‍ය ශ්‍රාවකයන්ට විෂය නොවේ. එය සර්වාකාරයෙන් දැනගත හැක්කේ තථාගතයන් වහන්සේට පමණි. කර්ම බිහිවීමට කරුණු වශයෙන් හේතු සාධක හයකි. එනම් ලොභ, දොස, මොහ, අලොභ, අදොස, අමොහ වශයෙනි. කර්ම විපාක දැනවීමේදී මේවා කාල, ගති, උපාධි, පයෝග වශයෙන් වර්ගීකරණය වේ. මෙසේ ප්‍රභේද සහිතව කර්මය දැනීම බුදුරජාණන් වහන්සේට පමණක් සිදු කළ හැකි අතර එසේ යමෙක් අචින්ත්‍ය කර්ම විෂය සිතීමට යන්නේ නම් උන්මත්තක භාවයටත් දුකටත් පත් වේ.

## 3. සබ්බත්ථගාමිනිපටිපදා ඤාණය

**තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති.**

තථාගතයන් වහන්සේ සියලු ම සත්වයන් සුගති දුර්ගති භවයන්ට පැමිණෙන්නා වූ ද රහත් බව ආදී තත්ත්වයන්ට පැමිණෙන්නා වූ ද පිළිවෙත් සියලු ආකාරයෙන් දන්නා සේක. එම දැනීම තථාගතයන් වහන්සේගේ බලයකි. එම බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයේ ඉහළ ම ස්ථානයට පැමිණ සිංහ නාද කරන සේක.

සසර සැරිසරනා සත්වයන් ඒ ඒ සුගති දුර්ගති භවයන්ට පැමිණෙන්නේ ඔවුන් කළ කර්මයන් අනුව ය. එක් කර්මයකින් ලැබෙන විපාකය හැමවිට ම ඒකාකාරී නොවේ. ගමක මිනිසුන් එක්ව හැමදෙනාගේ ම ප්‍රයෝජනය පිණිස සතෙකු මැරූ කල්හි සැමට ම වෙනසක් නැති ව ප්‍රාණඝාත අකුසලය සිදුවේ. එහෙත් එම ක්‍රියාවෙහි යෙදුන ප්‍රමාණයන්ට අනුව එහි විපාකය මහා නරකය, කුඩා නරක ය, ප්‍රේත ලෝකය, තිරිසන් භවය, අසුරකාය ආදී වශයෙන් විවිධාකාර විය හැකි ය. දානාදී පින්කම්වල විපාකයන් ද මෙසේ ය. එක්ව දන්දුන් විට එහි නියැළුණු චේතනාවන්ට අනුව මිනිස් ලොව දෙව්ලොව ආදී ස්ථානයන්හි උපදිති. මේ සියල්ල තථාගතයන් වහන්සේ මැනවින් දන්නා බැවින් එය තථාගත බලයකි.

## 4. නානාධාතු පටිවෙධ ඤාණය

**තථාගතො අනෙකධාතු නානාධාතු ලොකං යථාභූතං පජානාති.**

අනේකධාතු නානාධාතු ලෝකය නියමාකාරයෙන් දන්නා ඤාණය ද තථාගතයන් වහන්සේගේ බලයකි.

සම්පූර්ණයෙන් නැතිවන බැවින් ද මඳින් මඳ කොටස් වශයෙන් බිඳී පලුදුවන බැවින් ද ස්කන්ධ, ධාතු, ආයතනයෝ ලෝක නම් වෙති. තම තමන්ගේ ස්වභාවයෙන් පවතින සියල්ල ධාතු නම් වේ.

| | | | | |
|---|---|---|---|---|
| චක්ඛු ධාතු | → | රූප ධාතු | → | චක්ඛුවිඤ්ඤාණ ධාතු |
| සොත ධාතු | → | සද්ද ධාතු | → | සොතවිඤ්ඤාණ ධාතු |
| ඝාණ ධාතු | → | ගන්ධ ධාතු | → | ඝාණවිඤ්ඤාණ ධාතු |
| ජිව්හා ධාතු | → | රස ධාතු | → | ජිව්හාවිඤ්ඤාණ ධාතු |
| කාය ධාතු | → | ඵොට්ඨබ්බ ධාතු | → | කායවිඤ්ඤාණ ධාතු |
| මනො ධාතු | → | ධම්ම ධාතු | → | මනොවිඤ්ඤාණ ධාතු |

යනා දී ලෙස බොහෝ ධාතු ඇති බැවින් ද, ලක්ෂණ වශයෙන් අනේක ප්‍රකාර වන බැවින් ද අනේකධාතු නානා ධාතු වූ ලෝකය තථාගතයන් වහන්සේට ම ගෝචර වන්නකි. එය උන්වහන්සේගේ උතුම් තථාගත බලයක් සේ දක්වේ.

## 5. නානාධිමුත්තික ඤාණය

**තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති.**

අධිමුක්ති යනු පුද්ගලයාගේ විවිධ මානසික වූ රුචි අරුචිකම් හා අදහස් ය. ඒවා පිළිබඳ ඇතිසැටියෙන් දැනීම මෙයින් අදහස් කෙරේ. තථාගතයන් වහන්සේ ඒ ඒ පුද්ගලයාට ධර්මොපදේශ ලබාදෙන්නේ මේ අධිමුක්තිය සලකාගෙන ය. ඒ ඒ පුද්ගලයා පවා අනුසය ආසය වශයෙන් යටපත් වී පවත්නා තමන්ගේ අදහස් නොදනිති. තථාගතයන් වහන්සේ වෙත පැමිණෙන සෑමදෙනාගේ ම අදහස් නිවැරදි ලෙස දැන ගනිති. එම අදහස් දැනගන්නා වූ ඤාණය තථාගත බලයෙකි.

සත්වයෝ වනාහි නොයෙක් අදහස් ඇත්තෝ ය. දුසිරිතෙහි නියැලෙන ළාමක අදහස් ඇත්තෝ හීනාධිමුක්තික වෙති. සුචරිතයෙහි නියැලෙන යහපත් අදහස් ඇත්තෝ ප්‍රණීතාධිමුක්ත හෙවත් කල්‍යාණාධිමුක්ත වෙති. මෙම අධිමුක්ති අනුව පුද්ගලයන් එක්වීම සිදුවේ. එම එක්වීම සිදුවන්නේ කිනම් කරුණකින් දැයි තථාගතයන් වහන්සේ දනිති. එනම් හීනාධිමුක්තිකයෝ හීනාධිමුක්තිකයන් හා සන්සන්දනය වන්නාහ. සම වන්නාහ. ප්‍රණීතාධිමුක්තිකයෝ ප්‍රණීතාධිමුක්තිකයන් හා සන්සන්දනය වන්නාහ. සම වන්නාහ. මෙම දැනගැනීමේ තථාගතයන් වහන්සේ සතු බලය බුද්ධ විෂයට පමණක් ගෝචර වන්නකි.

## 6. ඉන්ද්‍රියපරොපරියත්ත ඤාණය

**තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති.**

පුහුදුන් බව ඉක්මවා නිවන් පිළිවෙතට අවතීර්ණ වන පුද්ගලයා තුළ වැඩෙන සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය පහකි. පුද්ගලයා තුළ මෙම ඉන්ද්‍රියන්ගේ

වැඩි ඇති ප්‍රමාණයේ අඩුවැඩි බව දැනීමේ හැකියාව මේ ඤාණයෙන් අදහස් කෙරේ. ඉහත කී ඉන්ද්‍රියයන් මෝරා ඇති බව හෝ නැති බව පුද්ගලයා නොදනියි. තථාගතයන් වහන්සේ තමන් වෙත පැමිණෙන සත්වයන්ගේ ඉන්ද්‍රිය තත්ත්වයන් සලකා බලා ධර්මය දේශනා කරති.

සියලු සත්වයන් පිළිබඳ සලකා බලන විට **ආසය** (අදහස්) අනුසය (නැවත නැවත උපදිනා කෙලෙස්) **චරිත** (පුද්ගල චරිත ස්වභාව) **අධිමුක්ති** (රුචිය) අනුව අල්ප **රජස්ක** (කෙලෙස් අඩු) **මහාරජස්ක** (කෙළෙස් වැඩි) **තීක්ෂණෙන්ද්‍රිය** (තියුණු ඉන්ද්‍රිය ඇති) **මෘද්වින්ද්‍රිය** (මෘදු වූ ඉඳුරන් ඇති) **ස්වාකාර** (තියුණු ශ්‍රද්ධා ඉන්ද්‍රිය ඇති) **ද්වාකාර** (නොදියුණු ශ්‍රද්ධා ඉන්ද්‍රිය ඇති) **භව්‍යාභව්‍ය** (මෙලොවදීම මගඵල ලැබීමට හේතු ඇති සහ නැති) පුද්ගලයන් මනාකොට දන්නා හෙයින් මෙය තථාගත බලයක් සේ කියවේ.

## 7. ඣානාදී සංකිලෙස ඤාණය

**තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙස වොදානං යථාභූතං පජානාති.**

ධ්‍යාන පිළිබඳව, සිත කෙලෙස්වලින් නිදහස් කරගන්නා ක්‍රම පිළිබඳව, සමාධිය පිළිබඳව ඒවායෙහි ඇති විවිධතාවන් ගැන හා ඒවායින් පිරිහෙන ආකාරය පිළිබඳ ව ද සිත පිරිසිදු කරගන්නා අයුරු හා ඒ ඒ සමාපත්තිවලින් නැගී සිටීම පිළිබඳ ව ද තථාගතයන් වහන්සේ පූර්ණ වූ අවබෝධයක් ඇති සේක. එබැවින් එය ද තථාගත බලයකි.

ධ්‍යානභාවනා කරන්නාවූ ඇතැම්හු එය පිළිබඳ නිසි දැනීමක් නොමැති බැවින් ධ්‍යානයක් ලැබුව ද එසේ ධ්‍යානයක් ලැබූ බව නොදනිති. තමන් වඩන කර්මස්ථානය නිවැරදි කර්මස්ථානයක් වුව ද එසේ නොවන බව සිතති. ඇතමෙක් ධ්‍යාන නොලබා ම ධ්‍යාන ලැබූයේ යැයි සිතති. සමහර විට භාවනාවේ යෙදී සිටිය දී නින්දට වැටෙති. ඇතැම්හු එය ධ්‍යාන ලැබීමත් සේ සිතති. බුදුරජාණන් වහන්සේ සෑම සත්වයාගේ ම ධ්‍යානාදිය පිළිබඳ ව නියම තත්වයෙන් දන්නා බැවින් මේ ඥානය තථාගත බලයකි.

## 8. පුබ්බේනිවාසානුස්සති ඤාණය

**තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.**

තමන් වහන්සේගේ අතීතභව පරම්පරාව දක්නා නුවණ තථාගතයන් වහන්සේගේ ඤාණ බලයකි. තමන් වහන්සේ අතීතයෙහි මෙබඳු නාම ගෝත්‍රයක් ඇතිව මෙපමණ ආයු ඇතිව අසවලාව උපන්නෙමි. ඉන් චුතව අසවල් තැන උපන්නෙමි'යි, යනාදි වශයෙන් අනේක කල්පකෝටි ගණනක් භවයන් දන්නා සේක.

එක්තරා ප්‍රමාණයකින් අතීත ජාති දැකීමේ සමත් පුද්ගලයන් ඇතත් ඔවුන්ගෙන් ඇතමෙක් වර්තමාන භවයට සමීප වූ අතීත භවය හෝ භව කිහිපයක් දකිති. ඇතැම් බාහිර තවුසෝත් සතලිස් කපක් අතිත භව දකිති. ඉන් එහා දැකීමේ හැකියාවක් නැත. ඔවුනට

වඩා නුවණ ඇති තථාගතයන් වහන්සේගේ ඇතැම් ශ්‍රාවකයෝ කල්ප සියයක් දක්වා අතීත භවයන් ද මහාශ්‍රාවකයෝ කල්ප ලක්‍ෂයක් අතීතය ද, අග්‍රශ්‍රාවකයන් වහන්සේ ඒකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක අතීතය ද දකිති. පසේ බුදුරජාණන් වහන්සේ අසංඛ්‍ය දෙකක් හා ලක්‍ෂයක් අතීතය දකිති. එහෙත් එය තථාගතයන් වහන්සේගේ භවයන් දැකීමේ සීමාවෙන් බොහෝ කුඩා වූවකි. බුදුරජාණන් වහන්සේ අනේක කල්ප කෝටිගණන් භව උත්පත්ති දන්නා වූ නුවණින් යුතුවෙති.

### 9. දිබ්බචක්ඛු ඤාණය

**තථාගතො දිබ්බෙන චක්ඛුනා සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ.**

ඒ ඒ භවයෙන් චුතව ඔවුන් කළ පින් පව් අනුව සත්වයා සුගති දුර්ගති දෙක්හි උපදනා ආකාරය තථාගතයන් වහන්සේ දක්නාහ. එය තථාගත බලයකි. එකිනෙකට මුහුණලා පිහිටි ගෙවල් දෙකක් සමීපයෙහි බලා සිටින්නෙකුට ගෙයින් ගෙට යන එන පිරිස් මනාව පෙනෙන්නාක් මෙන් ලෝකයෙහි සුගති දුගතිවලින් චුතව කර්මානුරූපව උපදනා සත්වයෝ තථාගතයන් වහන්සේට දර්ශනය වෙති.

මෙම ඤාණය ශ්‍රාවකයන්ට ද සාධාරණ ඤාණයකි. වර්තමාන භවයේ චුතිය පමණක් දකින අනාගත උප්පත්තිය නොදකින පුද්ගලයන් සත්වයා මරණින් කෙළවර වන්නේ ය යන උච්ඡේද දෘෂ්ටියට පත් වන බවත් අතීත භවයේ චුතිය නොදුන වර්තමාන උප්පත්තිය පමණක් දක්නා සත්වයෝ ශාස්වත දෘෂ්ටිය ගන්නා බවත් විශුද්ධි මාර්ගයෙහි දක්වා ඇත. එහෙත් සාමාන්‍ය මිනිස් හැකියාවන් ඉක්මවා ගිය ඉතා ම පිරිසිදු වූ දිව්‍ය නේත්‍ර ඤාණයක් තථාගතයන් වහන්සේට ඇත. එය ඤාණ බලයක් ද වේ.

### 10. ආසවක්ඛය ඤාණය

**තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤා විමුත්තිං**
**දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.**

තථාගතයන් වහන්සේ කාමා දී ආශ්‍රවයන් ක්‍ෂය වීමෙන් ආශ්‍රව රහිත වූ අරහත් ඵල සමාධිය අරහත් ඵල ප්‍රඥාව මෙම භවයේ දී ම සිය ඤාණයෙන් අවබෝධ කොටගෙන වාසය කරති. එය තථාගත බලයක් ද වේ. සියලු කෙලෙසුන් නසා උතුම් වූ සම්මා සම්බෝධිය පසක් කරගත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ එතෙක් ලොවට විවර නොවූ ආසවක්ඛය ඤාණය ලෝක සත්වයාට සසරින් එතෙරවීම පිණිස පැහැදිලි කළ සේක.

මෙම තථාගත ඤාණබල දහය ශ්‍රාවකයන් තුළින් සම්පූර්ණයෙන් දැකගත නොහැකි ය. ශ්‍රාවකයන්ට ඇත්තේ එම කාරණා පිළිබඳ සීමිත ඤාණයකි. එහෙත් තථාගතයන් වහනසේගේ මේ ඤාණ බලය අසීමිත ය. උන්වහන්සේ ඒ පිළිබඳ ව අධිපති වන සේක. **බලෙසු වසීභාවං පත්තො** යැයි උන්වහන්සේට පවසන්නේ එබැවිනි.

**තථාගතයන් වහන්සේගේ කායබලය.**

තථාගත ලොව්තුරු බුදුරජාණන් වහන්සේට ඥාණ බල පමණක් නොව ලොව අන් කිසිවෙකුටත් නැති තරම් කාය බලයක් ඇති බව සඳහන් වේ.

**''කාළාවකඤ්ච ගංගෙය්‍යං**
**පණ්ඩරං තම්බ පිංගලං**
**ගන්ධමංගල හෙමඤ්ච**
**උපොසථ ඡද්දන්තිමෙ දස''**

යනුවෙන් දක්වෙන ඇත් කුල දහයක් ඇත. ඉන් කාළාවක ඇතෙකුට පුරුෂයන් දස දෙනෙකුගේ බල ඇත්තේ ය. කාළාවක ඇතුන් දසදෙනෙකුගේ බලය එක් ගංගෙය්‍ය ඇතෙකුට ඇත්තේ ය. ගංගෙය්‍ය ඇතුන් දස දෙනෙකුගේ බල පණ්ඩර ඇතෙකුට ඇත්තේ ය. පණ්ඩර ඇතුන් දස දෙනෙකුගේ බල තම්බ ඇතෙකුට ඇත්තේ ය. තම්බ ඇතුන් දසදෙනෙකුගේ බලය පිංගල ඇතෙකුට ඇත්තේ ය. පිංගලයන් දසදෙනෙකුගේ බල ගන්ධ ඇතෙකුට ඇත්තේ ය. ගන්ධ ඇතුන් දසදෙනෙකුගේ බලය එක් මංගල ඇතෙකුට ඇත්තේ ය. මංගල ඇතුන් දසදෙනෙකුගේ බල හේම ඇතෙකුට ඇත. හේම ඇතුන් දස දෙනෙකුගේ බල උපොසථ ඇතෙකුට ඇත්තේ ය. උපෝසථ ඇතුන් දස දෙනෙකුගේ බල ඡද්දන්ත ඇතෙකුට ඇත්තේ ය. ඡද්දන්ත ඇතුන් දසදෙනෙකුගේ බල ලොව්තුරු බුදුරජාණන් වහන්සේට ඇත්තේ ය. මේ අනුව සාමාන්‍ය පුරුෂයන් කෝටිදසදහසක බලයක් තථාගතයන් වහන්සේට ඇත.

සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන් පසු තථාගතයන් වහන්සේ පන්සාලිස් වසක් ම ලෝකාර්ථචර්යාවෙහි නියැලූ සේක. දුරුකතර දෙපයින් ම වැඩමවමින් සුවහසක් ජනයාගේ සිත් සුවපත් කළ සේක. භාරතය වූකලි සුවිශාල භූමි ප්‍රදේශයකි. ගව්ගණන් දුර එසේ වැඩමවීම සාමාන්‍ය මනුෂ්‍යයෙකුට ඉතා අපහසු කාර්යයකි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ එම වෙහෙසකර කාර්යය මැනවින් සිදුකරන ලද්දේ උන්වහන්සේ සතු අසීමිත කායබලය හේතුවෙනි.

පෙරබත්කිස, පසුබත්කිස, පෙරයම්කිස, මැදියම්කිස, පැසුළුයම් කිස යනුවෙන් දෛනික ජීවිතය සකස්කර ගත් උන්වහන්සේ දිනකට පැය දෙකක් පමණ කාලයක් සිංහ සෙය්‍යාවෙන් සැතපුනහ. එසේ දිනකට දෙපැයක් පමණ සැතපෙමින් ඉතිරි සමස්ත කාලය ලෝ සත වෙත කරුණා මෛත්‍රියෙන් කැපකිරීම සාමාන්‍ය පුද්ගලයෙකුට සිදුකළ හැකි කාර්යයක් ද නොවේ. දෙව්මිනිසුන්ගේ යහපත වෙනුවෙන් කළ මේ මෙහෙවර බුදුරදුන්ගේ අසමසම ගුණය තවතවත් ප්‍රකට කරන්නකි. ඥාණ ශක්තියෙන් තථාගතයන් වහන්සේට කිසිවක් සම නොවන්නා සේ කාය බලයෙන් ද උන්වහන්සේට සමවූවෙකු තුන්ලොවෙහි දැනගත නොහැක.

## ★ සිව් විසාරද නුවණ

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ විසාරද බව ප්‍රකට කරන කරුණු හතරක් මහා සීහනාද සූත්‍රයෙහි චතුර් වෛශාරද්‍යඥානය ලෙස දක්වා ඇත. මෙම විසාරද ඥාණයන්ගෙන් සමන්විත වන බැවින් උන්වහන්සේ ඕනෑ ම ස්ථානයකට ඕනෑ ම පිරිසක් මැදට වැඩමකර නිර්භීතව, නොපැකිලව කථාකිරීමේ ශක්තියකින් යුතු වූ සේක.

**අනන්තරායෙ ච නියානෙ බුද්ධත්තෙ ආසවක්ඛයෙ**
**එතෙසු චතුසු ඨානෙසු බුද්ධො බුද්ධි විසාරදො**

මෙම ධර්ම අන්තරායකර ය, මෙම ධර්ම නිවනට පමුණුවන්නේ ය, මම බුද්ධ වෙමි. මම ආශ්‍රවයන් ක්ෂය කළෙමි යි බුදුරදුන් වදාළ කල්හි එය එසේ නොවේයැයි කිසිවෙකුට ඔප්පු කළ නොහැකි බැවින් බුදුරජහු විශාරදයහ.

**1. සම්මා සම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙධම්මා අනභිසම්බුද්ධා' ති**

මාගේ සම්මාසම්බුද්ධ බව ප්‍රකාශකරන විට නුඹලා මා විසින් මේ ධර්මය අසවල් අවබෝධ නොකරන ලද්දාහු යැයි, චෝදනා කළ හැකි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ හේතු සහිතව චෝදනා කළ හැකි කරුණක් හෝ නොදකිමි. එබඳු පුද්ගලයෙකු හෝ ධර්මයක් හෝ නොදකින්නේ කිසිදු භයක් නැත්තේ විසාරද බවට පැමිණ වාසය කරමි.

**2. ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණා'ති**

මම ආශ්‍රව ධර්මයන් ක්ෂයකර ඇත්තෙමි' යි ප්‍රකාශ කරන විට, ඔබ විසින් ආශ්‍රව ධර්ම ක්ෂය කර නැතැයි කියා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ කරුණු සහිතව ප්‍රතිචෝදනා කරන්නේ ය යන්න මම නොදකිමි. එබඳු පුද්ගලයන් හෝ ධර්මයක් නොදකින්නේ කිසිදු භයක් නැත්තේ විසාරද බවට පැමිණ වාසය කරමි.

**3. යෙ ඛො පන තෙ අනන්තරායිකා ධම්මා වුත්තා තෙ පටිසෙවතො නාලං අනන්තරායා'ති**

මාර්ග ඵලයන්ට අන්තරායික වූ ධර්මයන් ප්‍රකාශ කරන මට, ඒ කරුණු අන්තරායකර නොවේ යැයි කියා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ කරුණු සහිතව ප්‍රතිචෝදනා කරන්නේ ය, යන්නක් මම නොදකිමි. එබඳු පුද්ගලයෙක් හෝ ධර්මයන් නොදකින්නේ කිසිදු භයක් නැත්තේ විසාරද බවට පැමිණ වාසය කරමි.

**4. යසස ඛො පන තෙ අත්ථාය ධම්මො දෙසිතො සො න නියාති තක්කරසස සම්මා දුක්ඛක්ඛයායා'ති "**

ඔබ විසින් යම් අර්ථයක් පිණිස දහම් දෙසන ලද ද ඒ ධර්මය අනුව පිළිපදින තැනැත්තාගේ දුක් මැනවින් කෙළවර කිරීම පිණිස නොවේ යැයි කියා ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ කරුණු සහිතව ප්‍රතිචෝදනා කරන්නේ ය යන්න මම නොදනිමි. එබඳු පුද්ගලයෙක් හෝ ධර්මයක් හෝ නොදකින්නේ කිසිදු භයක් නැත්තේ විසාරද බවට පැමිණ වාසය කරමි.

**★ෂඩ් අසාධාරණ ඤාණ**

බුදුරජාණන් වහන්සේට හා අන්‍ය ශ්‍රාවකයන්ට සාධාරණ අසාධාරණ ඤාණ තෙසැත්තෑවක් (73) පිළිබඳ ව පටිසම්භිදාමග්ගපකරණයෙහි දැක්වේ. ඉන් ඤාණ සයක් බුදුරජාණන් වහන්සේට පමණක් සාධාරණ වූ ඒවා ය.

**ඉමෙසං තෙසත්තියා ඤාණානං සත්ත සට්ඨී ඤාණානි සාවකසාධාරණානි**
**ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි**

ඒ අනුව,

- **ඉන්ද්‍රියපරොපරියත්ත ඤාණය**
- **ආසයානුසයඤාණය**
- **යමකපාටිහීර ඤාණය**
- **මහාකරුණා සමාපත්ති ඤාණය**
- **සබ්බඤ්ඤුත ඤාණය**
- **අනාවරණ ඤාණය**

ෂඩ් අසාධාරණ ඤාණ නම් වේ.

**1. ඉන්ද්‍රියපරොපරියත්ත ඤාණය**

සත්වයන්ගේ කෙලෙස් රජස් අඩුවැඩි බව, ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රියයන්ගේ තියුණු බව, මෘදු බව, යහපත් අයහපත් ස්වභාව, පහසුවෙන් අවබෝධ කළ හැකි බව, නොහැකි බව, පරලොව දුකට පමුණුවන වැරදි පිළිබඳ බිය ඇති බව හෝ නැති බව හෝ දැනගන්නා ඤාණයයි.

**2. ආසයානුසය ඤාණය**

සත්වයාගේ සිත්තුළ පවතින්නා වූ ආසය අනුසය දැනගැනීමේ බුද්ධ ඤාණය ආසයානුසය ඤාණය නම් වේ. සත්වයන්ගේ සිත් හි නිතර ගැවසෙමින් සේවනය කරමින් පවත්නා යහපත් අදහස් හෝ නරක අදහස් ආසය නම් වේ. එසේ ම දෘෂ්ටි පදනම් කරගත්

කාමරාගානුසය, පටිඝානුසය, මානානුසය දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, භවරාගානුසය, අවිජ්ජානුසය යනුවෙන් සිත්වල නිදා සිටින්නාක් මෙන් පවතින කෙලෙස් අනුසය නම් වේ. එම ආසයන් හා අනුසයන් මැනවින් දක්නා නුවණ ආසයානුසය ඤාණයයි.

### 3. යමකපාටිහීර ඤාණය

එකවර ප්‍රාතිහාර්ය දෙකක් දැක්වීමේ හැකියාවයි. එය ශ්‍රාවකයන්ට ළඟාවිය නොහැකි සම්මා සම්බුදුරජාණන් වහන්සේට පමණක් විශේෂ ඤාණයකි. ප්‍රාතිහාර්ය පෑම දුෂ්කර කාර්යයකි. ඍද්ධිප්‍රාතිහාර්යය කළහැකි තත්වයට සමාපත්ති දියුණු කරගත් පුද්ගලයෝ ම ඒවා කිරීමට සමත් වෙති. ධ්‍යාන වශීභාවය වැඩූ පමණට ඉක්මනින් ප්‍රාතිහාර්යය කළ හැකි ය. තථාගතයන් වහන්සේ සමාපත්ති විෂයෙහි වශී භාවයෙන් අගතැන්පත් බැවින් ඉතා වේගයෙන් ප්‍රාතිහාර්ය කළහ. මෙහි වසීභාවය යනු සමාපත්ති පිළිබඳ බලසම්පන්න භාවයයි. තමන් කැමති සේ කිරීමේ ශක්තියයි. ඉතා වේගයෙන් සමාපත්තිවලට සමවැදීම නැගී සිටීම, අධිෂ්ඨාන කිරීම, කළහැකි නිසා එකවර ශරීරයේ එක් තැනකින් ජලධාරාවක් පිටකරමින් අන්තැනකින් ගිනි පිට කළ හැකි ය. එය කළහැකි නුවණ යමක පාටිහාරිය ඤාණයයි.

### 4. මහාකරුණා සමාපත්ති ඤාණය

මහාකරුණාවෙන් යුතු අසමසම බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ආධ්‍යාත්මික පිහිට ලැබිය හැකි පුද්ගලයන් හඳුනා ගන්නේ මහාකරුණා සමාපත්තියට සමවැදීමෙනි. උන්වහන්සේ දිනකට දෙවරක් මහාකරුණා සමාපත්තියෙන් නැගී ලොව බලා වදාරන්නාහ. අළුයම චක්‍රාවාට අන්තයේ සිට ගඳකිළි දොරකඩ දක්වා නුවණ පතුරුවා බලන සේක. සවස් කාලයෙහි ගඳකිළි දොරකඩ පටන් චක්‍රාවාට අන්තය දක්වා ලොව බලා වදාරන සේක. එසේ බලන කල්හි ඒ ඒ දිනයන්හි පිහිටවිය හැකි පුද්ගලයන්ට කෙතෙක් දුර වුව ද සොයා ගොස් උපකාර කරන සේක. මහා කරුණා සමාපත්තියෙන් මුළුමහත් සත්ව සංහතිය ම නිරාමිස සුවයට පත් වූහ. පුතිගත්තසේස තෙරුන්, සෝපාක, මට්ටකුණ්ඩලී ආදීහු එසේ පිහිට ලැබුවෝ වෙති.

### 5. සබ්බඤ්ඤුතඤාණය

**සබ්බං සංඛතමසංඛතං අනවසෙසං ජානාතීති සබ්බඤ්ඤුත ඤාණං''**

යනුවෙන් දක්වා ඇති පරිදි සංඛත වූ ද අසංඛත වූ ද සියලු ධර්ම සමූහය නිරවශේෂකොට දන්නා ඤාණය සර්වඥතා ඥණය නම් වේ. එය ලොව්තුරා බුදුරජාණන් වහන්සේට අරහත් මාර්ග චිත්තයත් සමග ම ලැබෙන විශේෂ ඥානයකි. අරහත් මාර්ග චිත්තය ශ්‍රාවකයෝ ද ලබති. එහෙත් සර්වඥතා ඤාණය ඔවුන්ට නොලැබේ. පාරමිතා පුණ්‍ය බලයෙන් උපදවා ගත් අරහත් මාර්ග ඤාණයෙන් සියලු ධර්ම විෂයෙහි පැවති සම්මෝහය දුරුකළ බුදුරජාණන් වහන්සේට නොදන්නා ලද්දක් නොදක්නා ලද්දක් ඤාණයෙන් නොපැමිණෙන ලද්දක් ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දක් නැත. එබැවින් එයට සර්වඥතා ඤාණය යැයි කියනු ලැබේ. එම නුවණ ඇති බැවින් බුදුරජාණන් වහන්සේ සබ්බඤ්ඤු නම් වෙති.

### 6. අනාවරණ ඤාණය

යමකින් ආවරණය වූ දෙයක්, පෙනෙන මානයේ නොමැති දෙයක් සෙසු අයගේ ඇසට ආවරණය වුවත් සර්වඥතා ඤාණයට ආවරණය වන දෙයක් නැත. ඉදිරියෙහි කොතෙක් දේ ඇතත් ඒවායෙහි පැකිලීමකින් තොරව සර්වඥතා ඤාණය ගමන් කරයි. එයට ආවරණ නැත. එබැවින් සම්බඤ්ඤුත ඤාණයට ම සම්බන්ධ වන අනාවරණ ඤාණ නම් ගෝචර වන සංඛත අසංඛත ධර්මයන් කිසිදු ආවරණයක් නැති ව දැනීමයි.

### ★ ත්‍රි විද්‍යා ඤාණ

බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර අසමසම බුදුගුණ අතර ත්‍රි විද්‍යා ඤාණයට හිමි වන්නේ ද විශේෂ ස්ථානයකි.

01. **පුබ්බේ නිවාසානුස්සති ඤාණය**
02. **දිබ්බචක්ඛු ඤාණය**
03. **ආසවක්ඛය ඤාණය**

එම ත්‍රිවිද්‍යා ඤාණයයි. දසබල ඤාණයන් විවරණය කළ තැන මෙම ඤාණ ශක්තීන් පිළිබඳ ව ද පැහැදිලි කර ඇත.

සාමඤ්ඤඵල සූත්‍රයේ දී ශ්‍රාවකයන් විසින් ත්‍රි විද්‍යාව ඇතිකරගන්නා ආකාරය වදරා ඇත. ඒ අනුව ත්‍රි විද්‍යාව ශ්‍රාවකයන්ට ද ඇති ගුණයක් බව කිව යුතුය.

### ★ අෂ්ට විද්‍යා

**විපස්සනාඤාණ මනොමයිද්ධි ඉද්ධිප්පභෙදොපි ච දිබ්බසොතං**
**පරස්සචෙතොපරියායඤාණං පුබ්බෙනිවාසානුගතඤාච ඤාණං**

**දිබ්බඤ්ච චක්ඛාසවසංඛයො ච එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා**
**අලංකරුං යා මුනි ධම්මදෙහං විසෙසසොභා ගුණමජ්ඣුපෙතා**

අසමසම වූ බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ඤාණයන් අතර අෂ්ට විද්‍යා ඤාණය පිළිබඳ ව ද සූත්‍ර දේශනාවන් හි තොරතුරු සඳහන් වේ. මෙම අෂ්ට විද්‍යාවන් සාමඤ්ඤඵල සූත්‍රයේ දී ශ්‍රමණ භාවයෙහි ඵල වශයෙන් ද දේශනා කර ඇත.
එනම්,

01. **විපස්සනා ඤාණය**
02. **මනෝමය ඉද්ධි ඤාණය**
03. **ඉද්ධිවිධ ඤාණය**
04. **දිබ්බසෝත ඤාණය**
05. **පරචිත්තවිජානන ඤාණය**
06. **පුබ්බේනිවාසානුස්සති ඤාණය**
07. **දිබ්බචක්ඛු ඤාණය**
08. **ආසවක්ඛය ඤාණය** යනුවෙනි.

**1. විපස්සනා ඤාණය**

නාමරූප ධර්මයන් හා ඒවායේ අනිත්‍යාදී ලක්ෂණ දක්නා නුවණයි. ධ්‍යාන සමාපත්ති උපදවා ඒවා පුරුදු කොට වශීභාවය ලබාගත් යෝගාවචරයාගේ සිත සිව්වන ධ්‍යාන සමාධියෙන් සමාධිගත වී සියලු කෙලෙස්වලින් මිදී පිරිසිදු වූ විට ඤාණ දර්ශනය සඳහා සිත මෙහෙයවයි. එසේ පිරිසිදු සිතින් තම ආත්ම භාවය බලන්නෙකුට රූප කාය විනිවිද පෙනෙයි. රූප වෙන්වී පෙනෙයි. ඉපිද බිඳී යන අයුරු පෙනෙයි. සිත හා බැඳී පවතින ස්පර්ශ වේදනා ආදී චෛතසික ධර්ම හෙවත් නාම ධර්මයන් ද පෙනෙයි. නාම රූප ධර්ම විනිවිද පෙනෙන ඤාණය විදර්ශනා ඤාණයයි. එය උපදවා ගත් බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවකයන් වහන්සේට ද එහි මග පෙන් වූ සේක.

**2. මනෝමය ඉද්ධි ඤාණය**

දියුණු කළ සිත් ඇති උතුමන් වහන්සේට තමාගේ කය තුල තමා හා සමාන සර්වාංග පරිපූර්ණ කයක් නිර්මාණය කොට කොපුවක තිබූ දෙයක් පිටතට ගන්නාක් මෙන් එය තමාගේ කයෙන් පිටතට ගත හැකි ය. බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොව දෙවියන්ට අභිධර්මය දේශනා කරන විට මනෝමය ශරීරයක් මවා තබා මනු ලොවට වැඩම කර දන් වැළඳූ බව බුද්ධ චරිතයෙහි සඳහන් වේ. එය මනෝමය ඉද්ධි ඤාණය යි.

**3. ඉද්ධිවිධ ඤාණය**

බුද්ධ චරිතයෙහි විවිධ අවස්ථාවන්හි බුදුරජාණන් වහන්සේගේ ඉද්ධිවිධ ඤාණය ප්‍රකට කරන අවස්ථා දැකිය හැක. බොහෝ රූප නිර්මාණය කොට තමා ම බොහෝ දෙනෙකුන් සේ පෙනීම, පෙනෙන තැන නොපෙනී සිටීම, දියෙහි මෙන් පොළොවෙහි ගිලීම, මතුවීම, අහසෙහි, පොළොවෙහි මෙන් ඉරියව් පැවැත්වීම, බ්‍රහ්ම ලෝකය දක්වා තම බලය පැතිරවීම, වැනි දේ සිදුකළ හැකි වීම මෙම ඤාණයෙහි විශේෂත්වයයි. මහරහතන් වහන්සේලා විසින් ද මෙම ඍද්ධිය කළ අවස්ථා සඳහන් වේ. තථාගතයන් වහන්සේ සියලු ඤාණයන්ගෙන් අගතැන් පත් වූ සේක.

**4. දිබ්බසෝත ඤාණය**

ධ්‍යාන සමාපත්ති විෂයෙහි වශීභාවය ඇති කරගෙන සිත පිරිසිදු බවට මෘදු බවට කර්මණ්‍ය බවට පමුණුවා ගත් කල්හි ප්‍රකෘති කණට නොඇසෙන සියුම් ශබ්ද පවා සිතට දැනෙයි. දෙව්ලොව, බඹලොව, පරසක්වල ශබ්දයන් පවා ඉතා ලඟ සිට අසන්නාක් මෙන් පිරිසිදු ලෙස බුදුරජාණන් වහන්සේට දැනුනේ මෙම ඤාණය හේතුවෙනි. බලවත් කුසලයෙන් උපන් දෙවියන්ගේ කණ්වලට ද ඒවා ඇසෙන බැවින් දිබ්බසොත නම් වේ.

**5. පරචිත්තවිජානන ඤාණය**

අන්‍යයන්ගේ සිත් හා සිතිවිලි දැනගැනීමේ හැකියාව පරචිත්තවිජානනයයි. තමන්ගේ වැඩූ සිත අනුන්ගේ සිත් දැනගැනීම සඳහා පරසන්තානයට යොමු කළ විට ඔවුන්ගේ සිත දැනගත හැකි ය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අන්‍යයන්ගේ සිත් ස්වභාව දැන එයට නිසි පිළියම් යොදා සුවපත් කළ සේක. ධර්ම දේශනාවන් හීදී පරජ්ඣාසය හෙවත් අනුන්ගේ අදහස් දැන ධර්මය දේශනා කරන ලද්දේ මෙම ඤාණය හේතුවෙනි.

අෂ්ට විද්‍යාවන්හි කියවෙන පුබ්බේනිවාසානුස්සති ඤාණය දිබ්බචක්ඛු ඤාණය හා ආසවක්ඛය ඤාණය  මෙහි මුල් කොටසින් විස්තර වී ඇත. අෂ්ට විද්‍යාවන් ශ්‍රාවකයන් තුළ ද විද්‍යාමාන වේ. එහෙත් තථාගතයන් වහන්සේ අෂ්ට විද්‍යාවෙන් ඉතා උසස් අසමසම වන බැවින් එය උන්වහන්සේ වෙත ඇති විශේෂ බුද්ධ ඥාණයක් වන්නේ ය.

**අභ්‍යාස**

01. බුදුරජාණන් වහන්සේගේ අසමසම බුදුගුණ ලේඛන ගත කර එම ගුණයන් ප්‍රකට වන අවස්ථා උදාහරණ ලෙස දක්වන්න.
02. අෂ්ට විද්‍යාවන් බුදුසිරිතෙන් ප්‍රකට වන අවස්ථා ගෙනහැර දක්වන්න.
03. ත්‍රිවිද්‍යා ඥාණ විස්තර කරන්න.

# 03 පාඩම

# කරුණාවෙන් සිසිල් හද ඇති බුදුසඳාණෝ

ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනූපමේය වූ සම්බුද්ධ චරිතය අසිරිමත් වූවකි. උන්වහන්සේ හාත්පසින් ම ආදර්ශ සම්පන්න උතුමන් වහන්සේ වන සේක. අපරිමිත ලෞකික සැප සම්පත් ඇති රජසිරි හැරදා අනන්ත කායික දුක්වේදනා විඳිමින් පරම සැපත උදාකරගත් උන්වහන්සේ තුන් ලෝ වැසි සත්ත්වයන් අවිදු අඳුරෙන් මුදවන ප්‍රඥා ලෝකය විය. පන්සාලිස්වසක සම්බුද්ධ ජීවන ගමන්මග විටෙක කටුක වූ රළු අත්දැකීම් සහිත වූවක් විය. ඒ සියල්ල මහාකාරුණික ගුණය ආදී ගුණ පෙරදැරි කොට ඉවසා දරාගත් බුදුරජාණන් වහන්සේ ජාති ආගම් කුල භේදයකින් තොරව ධනනිධන භේදයකින් තොරව සත්වයාට පිහිට වූහ. කායික පීඩාවන්ගෙන් මෙන් ම මානසික පීඩාවෙන් ද පෙළුණු බොහෝ දෙනෙකුට ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ දර්ශනය පවා මනනුවන් සැනසීමට හේතු විය.

බුදුරජාණන් වහන්සේගේ උතුම් ගුණ සමුදාය අතර අසරණ සරණ ගුණයට හිමිවන්නේ ද විශිෂ්ට ස්ථානයකි. මෙපමණ අසරණ සරණ වූ අන්‍ය ශාස්තෘවරයෙක් දක්නට නොමැති තරම් ය. සමස්ත බුදුසිරිත දෙස බැලීමේ දී මහාකාරුණික බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ බොහෝ පිරිසක් අපට හමුවේ. ඒ ඒ පුද්ගලයාගේ බුද්ධි ඵලය අවබෝධ කරගත් ශාන්තිනායකයන් වහන්සේ කායික මානසික පීඩාවන් දුරුකර ගැනීමට ඔවුන්ට පිහිට වූහ.

තිලොව සතහට පිහිටවනු පිණිස දාන පාරමිතා පිරීම් වශයෙන් සාගර ජලය පරදවා ලේ දන්දුන් බව ද මහපොළව පරදවා ඇඟමස් දන්දුන් බව ද, මහමෙර පරදවා ඔටුනුපළන් හිස් දන්දුන් බව ද, අහසේ තරු පරදවා නෙත් දන්දුන් බව ද කියා තිබේ. අන්‍ය සත්වයන් උදෙසා මෙබඳු මහා පරිත්‍යාගයන් කළ හැකි වූයේ මහාකාරුණික භාවය හේතුවෙනි.

"යො සාගරෙ ජලධිකං රුධිරං අදාසි
භූමිං පරාජිය සමංස මදාසි දානං
මෙරුප්පමාණමධිකඤ්ච සමොලිසීසං
බෙ තාරකාධිකතරං නයනං අදාසි"

දුක්ඛිත සත්වයන් අරමුණුකොට පහළ වන්නේ කාරුණාවයි. සත්වයාගේ දුක දැනගත හැකි වීමට නුවණ තිබිය යුතු ය. නුවණ මඳ අපට දැනෙන්නේ සත්වයාගේ දුක්වලින් ඉතා සුළු කොටසකි. සුගති වශයෙන් සලකන මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම යන තිලොවෙහි වසන සියලු සත්වයෝ දුක්ඛිතයෝ ය. තථාගතයන් වහන්සේ සසර දුක හැඳින ඉන් මිදීමට මග පෙන් වූ සේක. ප්‍රායෝගික ජීවිතයේ විවිධ දුක් අසහනවලින් මිදීමට ද මග පෙන්වූහ. එසේ සම්බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණ ජනයා පිළිබඳ බොහෝ තතු (චරිත) බුදු සිරිතෙහි අපට හමුවේ.

## අසරණයන්ට පිළිසරණ වීම

### සුනීත සැඩොල් පුතු



කසල ශෝධනය ජීවිකා වෘත්තිය කර ගත් සුනීත නම් සැඩොල් දරුවෙක් රජගහ නුවර විසී ය. දිනක් බුදුරජාණන් වහන්සේ මහාසංඝයා පිරිවරා එනුවර පිඩු පිණිස වැඩියහ. ඒ අවස්ථාවේ සුනීත නුවරින් පිටතට කසල කඳ ගෙන යන්නේ භික්ෂූන් සමග වඩිනා බුදුරජාණන් වහන්සේ දැක මගින් බැහැර ව ඉතා යටහත් පහත් ව සිටියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහු වෙත පැමිණ ''සුනීත ඔබ පැවිදි වන්නට කැමැති ද'' යි ඇසූහ. උන් වහන්සේගේ කරුණා බසින් බලවත් සොම්නසට පත් හේ ''පහත් කුලයක උපත ලද මා වැනි දුගී දුප්පතකු කවරෙක් පැවිදි කරද්ද'' යි ඉතා යටහත් පහත් ව කීය. එවිට බුදුරජාණන් වහන්සේ ''මම ඔබ පැවිදි කරමි'' යි වදාරා ඒ සුනීත දරුවා ඒහිභික්ෂු භාවයෙන් පැවිදි කළහ. සුනීත හිමියෝ ද උත්සාහයෙන් භාවනා කොට ටික කලකින් රහත් වූහ. ඉන්පසු කුලීන යයි සම්මත මිනිසුන් පමණක් නොව දෙව් බඹහු ද සුනීත තෙරුන් වහන්සේට වැඳුම් පිදුම් ගරු සත්කාර කළහ.

### දෙව්ලොව උපන් සැඩොල් ස්ත්‍රිය

දුප්පත්, මහලු, සැඩොල් ස්ත්‍රියක් මැරී දුගතියෙහි උපදින බව දැනගත් බුදුරජාණන් වහන්සේ ඇය ඉන් මුදා ගනු පිණිස අනුකම්පාවෙන් රජගහ නුවර පිඩු පිණිස හැසුරුණහ. සැඩොල් ස්ත්‍රිය ද සැරමිටියක ආධාරයෙන් ඉතා අපහසුවෙන් ඉදිරියට ආවා ය. මෙහි දී බුදුරජාණන් වහන්සේගේ අදහස දැනගත් මුගලන් හිමියෝ ඇය අමතා ඔබගේ මරණය ඉතා ආසන්න ය. සිත පහදවාගෙන බුදුරජාණන් වහන්සේට වඳින්නැ යි කීහ. ඒ බස් ඇසූ ඒ මහලු සැඩොල් ස්ත්‍රිය බලවත් සොම්නසින් දොහොත් මුදුන් දී බුදුරජාණන්වහන්සේට වැඳගෙන ම සිටියා ය. ඒ අවස්ථාවේ හදිසියේ දිව ආ ගව දෙනක් ඇයට ඇන්නා ය. එතැන ම මැරී වැටුණු ඕ තොමෝ තව්තිසා දෙව්ලොව උපන්නී ය.

**(චණ්ඩාලි විමානවත්‍ථු)**

### මළකඳක බැඳ සිටි සෝපාක

සෝපාක රජගහනුවර විසූ සැඩොල් දරුවෙකි. ඔහු ළදරු වියේ දී ම පියා කළුරිය කළේ ය. මව තවත් පුරුෂයකු හා සරණ ගියා ය. ඇයට ඔහුට දාව තවත් පුතෙකු ලැබිණ. දරුවන් දෙදෙනා අතර සුළු සුළු දබර ඇති විය. දිනක් ඔහුගේ සුළු පියා ''මොහු මගේ පුතු හා දබර කෙරෙති'' යි කිපී අමු සොහොනකට ගෙන ගොස් මළ සිරුරකට තබා ලණුවකින් තද කොට බැඳ තැබී ය. අමු සොහොනේ තනි වූ සත් හැවිරිදි කුඩා සෝපාක මරණ භයින් තැතිගෙන ''අනේ මාව බේරාගන්නට කිසිවෙක් නැද්ද'' යි විලාප නගන්නට විය.

ඒ අවස්ථාවේ අසරණ දරුවා දිවැසින් දුටු බුදුරජාණන් වහන්සේ ඔහු දෙසට ආලෝකයක් යොමු කොට දරුව, සෝපාක මෙහි එන්න, බිය නොවන්න, මම ඔබ මුදවා ගනිමි'' යි කීහ. මේ වදන් ඇසූ සෝපාක සොම්නසින් බුද්ධානුභාවයෙන් බැම්මෙන් මිදී බුදුරජාණන් වහන්සේ වෙතට ගියේ ය. සෝපාකගේ මව පුතු නැති බව දැන හඬමින් වැළපෙමින් ඒ මේ අත ඇවිදින්නී බුදුරජාණන් වහන්සේ වැඩසිටි විහාරයට ම ගියා ය. බුදුරජාණන් වහන්සේ ඇයට පුතු නොපෙනෙන්නට සලසා දහම් දෙසූහ. ඒ දහම් ඇසීමෙන් ඕ තොමෝ සෝවාන් වූවා ය. මවට දෙසූ දහම් අසා සිටි කුඩා සෝපාක රහත් විය. මව් තොමෝ පුතු රහත් වූ බව අසා පැවිදි කරවා නිවෙස බලා ගියා ය. සෝපාක කුඩා හිමියෝ බුදුරජාණන් වහන්සේ විචාළ ප්‍රශ්න දහයක් විසඳා සත් හැවිරිදි වියේ දී ම උපසම්පදාව ලැබූහ. මෙය ප්‍රශ්න විසඳීමෙන් ලත් පඤ්හ ව්‍යාකරණෝපසම්පදාවයි.

(සෝපාක ථෙරගාථා)

**භද්‍රවතිකා ඇතින්න**

උදේන රජුගේ මංගල ඇතින්න වූ භද්‍රවතිකා ඇතින්න බුදුරදුන් දැක හඳුනන උන්වහන්සේට මහත් ගෞරව දක්වන්නියකි. බොහෝ ගරු සත්කාර විඳිමින් සිටි ඇය මහලු වියට පත් වූ නිසා තනතුරෙන් පහකොට මුදා හරින ලද්දී ය. කෑමක්, නෑමක්, බෙහෙතක්, හෙවනක් නොලත් ඇතින්න ටික දිනකින් වැහැරී ගියා ය. තැනින් තැන ඇවිද අහුලා කමින් දුකසේ ජීවත් වූවා ය. ඇතින්න කෙරෙහි අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේ ඇතින්න එන පෙරමගට වැඩම කළ සේක. බුදුරදුන් දුටු සැටියේ අසලට විත් බිම පෙරළී වැඳ වැටුණු ඇතින්න කඳුළු වගුරන්ට වූවා ය. ඇතින්න සැනැසූ බුදුරජාණෝ උදේනි රජුට කළගුණ සැලකීමේ අගය වදාරා මහලු භද්‍රවතිකාට පෙර පරිදි ම ආහාර පානත්, සත්කාරත් ලැබෙන්නට සැලසූහ.

(දළ්හ ධම්ම ජාතකය)

**බණ ඇසුමට ගොස් ආහාර ලැබූ දුප්පතා**

බුදුරජාණන් වහන්සේ දිනක් භික්ෂූන් පිරිවරා අලව් නුවරට වැඩියහ. නගර වැසියෝ බුදුරජාණන් වහන්සේ ප්‍රධාන භික්ෂු සංඝයාට දන් පිරිනැමූහ. නැති වූ ගොනෙකු සොයමින් එදින උදෑසන නිවෙසින් පිට වූ දුප්පත් ගොවියෙක් වෙහෙස මහන්සි වී ගොනා සොයාගෙන ගවහලට දමා නිවෙසට නොගොස් කුසගින්නේ ම බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ වැඳ එකත් පසෙක සිටියේ ය. ඒ අවස්ථාවේ ඔහුගේ කුසගින්න බලවත් බව දැනගත් බුදුරජාණන් වහන්සේ එහි සිටි තැනැත්තකු ලවා ආහාරපාන දෙවූ සේක. ඔහු ආහාර ගත් පසු එහි සිටි පිරිසට බුදුරජාණන් වහන්සේ දහම් දෙසූහ. ඒ දහම් ඇසූ ගොවියා සෝවාන් විය. බුදුරජාණන් වහන්සේ මේ කාරණය නිමිති කර කුසගින්න බලවත් ම රෝග යයි ද (ජිඝච්ඡා පරමා රොගා) සංස්කාර බලවත් ම දුක යයි ද නිවන පරම සුවය යයි ද භික්ෂු සංඝයාට වදාළහ.


(ධම්මපද සුඛ වර්ගය)

## සෝවාන් වූ පේසකාර දුව

අලව් නුවර එක් පෙහෙකම් කරන තරුණියක් මරණය නියත ය. ජීවිතය අනියත ය. යනාදී වශයෙන් මරණානුස්මතිය වැඩුවා ය. අවුරුදු කීපයකට පසු දිනෙක එම තරුණිය එදා ම මරණයට පත් වන බව දැන ගත් බුදුරජාණන් වහන්සේ ඇය කෙරෙහි අනුකම්පාවෙන් එනුවරට වැඩ රැස්වූ පිරිසට දහම් නොදෙසා ම ඇය පැමිණෙන තෙක් බලා හුන්හ. ඕ තොමෝ ද බුදුරජාණන් වහන්සේ එනුවරට වැඩම වූ බව අසා පෙහෙ කම්හලේ සිය කටයුතු වහා නිම කොට බලවත් සොම්නසින් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ වැන්දා ය. බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේ ඇයගෙන් ප්‍රශ්න කීපයක් විචාළහ. පේසකාර දුව රැස්වූ පිරිස මවිත කරවමින් ඒ ප්‍රශ්න සියල්ල ම විසඳුවා ය. එදින දහම් ඇසූ ඕ තොමෝ සෝවාන් වූවා ය. සෝවාන් ව සිය පියාණන්ගේ පෙහෙකම්හලට ගිය මේ තරුණිය හදිසි අනතුරකින් එහි දී මිය ගියා ය.

(ධම්මපද ලෝක වග්ගය)

## රජ්ජුමාලා මෙහෙකාරිය



ගයා පෙදෙසේ නිවෙසක මාලා නම් තරුණ මෙහෙකාරියක් වූවා ය. ඇය සිය වැඩ කොටස කෙතරම් නිවැරදි ව ඉටු කළත් ස්වාමි දුව ඇගේ කෙස් වැඩියෙන් අල්ලා නිතර පහර දෙයි නිසා ඉන් ගැළවීමට සිතූ මෙහෙකාරිය සිය කෙස්වැටිය කපා දැම්මා ය. ඉන් පසු ස්වාමිදුව මාලාගේ බෙල්ලේ ලනුවක් බැඳ එයින් අල්ලාගෙන පහර දුන්නා ය. නිතර බෙල්ලේ එල්ලෙන ලණුවක් ඇති නිසා මාලා මෙහෙකාරිය රජ්ජුමාලා නම් වූවා ය. ස්වාමි දුවගේ තාඩනපීඩන ඉවසිය නොහැකි වූ ඇය දිනක් දියගෙන ඒමට යන බවක් අඟවා සිය දිවි හානි කර ගන්නා අදහසින් නිවෙසින් පිට ව අසල වනයට ගියා ය. ගෙල වැලලා ගන්නට සැරසෙන විට ඒ ගැන කල් ඇතිව දැන එහි වැඩම කළ බුදුරජාණන් වහන්සේ ඇයට සැනසීමට දහම් දෙසූහ. දහම් අසා සෝවාන් වූ රජ්ජුමාලා බලවත් ප්‍රීතියෙන් දිය කළයකුත් රැගෙන ස්වාමි දුවගේ නිවසට පැමිණියා ය. එදින ඇගේ පමාවීම ගැන කරුණු විචාළෙන් ඕ සිදු වූ සියල්ල පැහැදිලි කළා ය. ඉන්පසු ඒ නිවෙස ඇයට ප්‍රීතිමත් තැනක් විය. ස්වාමි දුව හා සෙස්සෝ ද ඇයට සොයුරියකට මෙන් සැලකූහ.

(රජ්ජුමාලා විමානවත්‍ථු)

### තිස්ස භික්ෂුව

බුදුරජාණන් වහන්සේ දවස කුෂ්ට රෝගයකින් පෙළුණු තිස්ස නම් භික්ෂුවක් සැවැත් නුවර ජේතවනාරාමයේ විසී ය. අබ ඇට තරමින් කුඩාවට පටන්ගෙන විශාල ව පිපිරී ගිය තුවාලවලින් උන්වහන්සේගේ ශරීරය වැසිණ. නිතර ගලන ලේ සැරව නිසා ගතින් දුගඳ හමන්නට විය. ඒ නිසාම පූතිගත්තතිස්ස නමින් උන්වහන්සේ හඳුන්වනු ලැබූහ. උන්වහන්සේගේ සිවුර ශරීරයේ ම ඇලී ගියේ ය. රෝගය අතිශයෙන් ම දරුණු විය. කිසිම උපස්ථායකයකු නැති ව තනි වූ උන්වහන්සේ මරණාසන්න වූහ. මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ තිස්ස භික්ෂුව කෙරෙහි අනුකම්පාවෙන් ඒ හිමියන්ගේ කුටියට වැඩම කොට රෝග තත්ත්වය විමසා අනඳහිමියන් ලවා උණුවතුර පිළියෙල කොට සිවුරු සෝදවා ශරීරය දියෙන් නහවා වේලාගත් සිවුරු පොරවා සුව පහසුව සලසා දී දහම් ද දෙසූහ. දහම් ඇසූ පූතිගත්තතිස්ස තෙරණුවෝ රහත් වී ස්වල්ප වේලාවකින් පිරිනිවන් පෑහ.

**(ධම්මපද චිත්තවග්ග ගාථාව)**

### උදරාබාධයෙන් පෙළුණු භික්ෂුව

උදරාබාධයකින් පෙළුණු එක් භික්ෂුවක් උපස්ථායකයකු ද නොමැති ව ඉතා අසාධ්‍ය තත්ත්වයට පත්විය. මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් සමග ඒ රෝගී තෙරුන් වෙත වැඩම කොට රෝග තත්ත්වය අසා බලා උපස්ථායකයකු නැති බව දැන ආනන්ද තෙරුන් ලවා දිය ගෙන්වා ගෙන ඒ රෝගී භික්ෂුවගේ සිරුර සෝදා අවශ්‍ය සුව පහසුව සලසා දුන්හ. මේ කාරණය නිමිතිකර බුදුරජාණන් වහන්සේ භික්ෂූන් රැස්කරවා ගිහි ගෙයින් නික්ම පැවිදි වූ ඔබ හැමට ඔබ හැමගේ පිහිට තිබිය යුතුයි. රෝගී දුර්වල අවස්ථාවල දී සුදුසු උපස්ථානය කළ යුතු ය යි වදාළහ. එය බුද්ධෝපස්ථානය හා සමානයයි (යො භික්ඛවෙ මං උපට්ඨහෙය්‍ය සො ගිලානං උපට්ඨහෙය්‍ය) වදාරා ගිලානෝපස්ථානය කරන සැටිත් උපස්ථායකයකු තුළ පැවැතිය යුතු ගුණාංගත් පහදා දුන්හ.

**(මහාවග්ග පාළි චීවර ඛන්ධකය)**

### අසරණ සරණ වීමේදී භාවිතා කළ ප්‍රායෝගික ක්‍රම

යමෙක් කායික මානසික වශයෙන් අසරණ බවට පත්වූ විට වික්ෂිප්ත මනසක් අතිවීම සාමාන්‍ය දෙයකි. එබඳු අවස්ථාවන්හිදී ගැඹුරු ධර්මය ඔවුනට ගෝචර නොවී ය හැක. එබඳු අවස්ථාවන්හි මානසික පීඩන ස්වභාවය අවම කොට ඔවුන්ගේ මනස ක්‍රමයෙන් ප්‍රකෘති ස්වභාවයට පත් කිරීම අවශ්‍ය දෙයකි. එබඳු අවස්ථාවන්හි බුදුරජාණන් වහන්සේ ප්‍රායෝගික ක්‍රම අනුගමනය කළ සේක.

කිසාගෝතමිය එක ම දරුවා මළ බව නොපිළිගත් තැනැත්තියකි. ඇයට මරණයේ ස්වභාවය හෝ ජීවිතයේ අනිත්‍යතාව පිළිබඳ බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළේ නම් ඇය එය වටහා නොගනු නොඅනුමාන ය. එහෙයින් බුදුරජාණන් වහන්සේ ඇයට

කිසිවෙකු නොමළ ගෙයකින් අබමිටක් රැගෙන එන ලෙස පවසන්නේ දරුවා නොව ඇගේ මනස සුවපත් කරනු පිණිස ය. ඇය ගිය සෑම නිවසක ම අබ ඇතිමුත් ඥාතියෙක් මියනොගිය ගෙයක් නොවී ය. මෙසේ හැම නිවෙසකම බාල, තරුණ, මහලු කවුරු හෝ මියගොස් ඇතිබව ඇය වැටහී ගියේ ය. මාගේ දරුවාට ද අත්වූයේ එම ඉරණමයැයි සිතූ ඇයට දරුවාගේ සිරුර සොහොනට දමා බුදුරදුන් වෙත ගොස් දහම් අසා පැවිදි වූවා ය. ජීවිතය පිළිබඳ යථාවබෝධයෙන් තොරව සිටි අසරණ කිසාගෝතමිය ජීවිතයේ පරම සුවය උදාකර ගත්තේ තථාගතයන් වහන්සේගේ උපායශිලි ක්‍රමවේදය හේතුවෙනි.

අංගුලිමාල දමනය අවස්ථාව ද එබඳු එක් වැදගත් මොහොතකි. ගුරුවරයාගේ නොමග යැවීමෙන් රුදුරු බවට පත් අහිංසක තරුණයා ගුරු පූජාව සඳහා මිනිසුන් මරා දහස පුරවමින් සිටියේ ය. මේ වන විට හෙතෙම නවසිය අනූනව දෙනෙකු මරා තිබිණ. මේ අතර කොසොල් මහරජු සේනාව පිරිවරා ඔහු නැසීමට පිටත්විය. මෙය ඇසූ ඔහුගේ මව ඊට පෙර පුතු බේරා ගැනීමට තනිවම පිටත් වූවා ය. නිවන් දැකීමට තරම් පිනෙන් පිරී සිටි අංගුලිමාල ආනන්තරිය පාප කර්මයක් සිදුකර අපාගත වන බව දුටු තථාගතයන් වහන්සේ ඔහුට පිහිට පිණිස සියල්ලන්ට පෙර එහි වැඩම වූහ. මේ ශ්‍රමණයා මරා හෝ දහස පුරවමියි සිතූ අංගුලිමාල බුදුරදුන් පසුපස වේගයෙන් ලුහුබැන්දේ ය. උන්වහන්සේ ඔහුට ලංවිය නොහෙන සේ ඍද්ධි බලයෙන් ඈතට ඈතට වැඩි සේක. වෙහෙසට පත් අංගුලිමාල "මහණ සිටුව, මහණ සිටුව" යැයි ගර්ජනා කළේ ය. තථාගතයන් වහන්සේ ඉදිරියට වඩිමින් ම "මම සිටියෙමි ඔබ ද සිටින්න" යැයි පැවසූහ. අංගුලිමාල විමතියට පත්විය. ''හෙතෙම ශ්‍රමණය, ඔබ යන ගමන් මම නැවතුනෙමි'' යි කියති. නැවතුන මට ඔබ සිටින්නැයි'' කියති. මෙහි අදහස කුමක්දැයි ඇසී ය. තථාගතයන් වහන්සේ අංගුලිමාල අමතා "දරුව සියලු සතුන් කෙරෙහි දඬු බහා තබා මම සිටියේ වෙමි. ප්‍රාණවධයෙන් නො වැළකුණු ඔබ තවම නොනැවතුනෙහි''වදාළහ. එයින් බුද්ධිය විකසිත වූ අංගුලිමාල සත්‍යාවබෝධය ලැබී ය. එබඳු නොමග ගිය පුද්ගලයන් දමනය කොට ඔවුන් අසරණ භාවයට පත්වන්නට නො දී ආරක්ෂා කරගැනීමට භාවිත කළ එම ක්‍රමවේදයන් ඉතා ශ්‍රේෂ්ඨ ය.

බුදුරදුන්ගේ ම සුළු මවගේ පුත් නන්ද තෙරුන් උතුම් වූ පැවිද්දෙන් නෙලාගත යුතු පල නෙලාගත නොහැකිව ගිහි දිවියත් පැවිදි දිවියත් අතර දෝලනය වන මනසකින් කල්ගෙවී ය. එය දුටු තථාගතයන් වහන්සේ නන්ද තෙරුන් නිවන් මගට යොමුකළේ උපක්‍රමශිලීව උන්වහන්සේගේ මනස සුවපත් කිරීමෙනි. ඍද්ධියෙන් නන්ද තෙරුන් කැඳවාගෙන දිව්‍ය ලෝකයට වැඩම වූ බුදුරජාණන් වහන්සේ අතරමග දී නවදැලි හේනක දැවීගිය වැඳිරියක් පෙන්වා අනතුරුව දෙව්ලොව සුරූපී දෙවඟනන් දක්වාලූහ. ජනපද කල්‍යාණිය පිළිබඳ සිතින් සිටි නන්ද තෙරුන්ට දෙවඟනන් හමුවේ ඇය දා ගිය වැඳිරිය වැනි යැයි සිතිණ. එමගින් නන්ද තෙරුන්ගේ සිත වෙනතකට යොමුකළ බුදුරජාණන් වහන්සේ උන්වහන්සේට කමටහන් ලබා දී භාවනා මගට යොමුකළ සේක. සසර තතු අවබෝධ කරගත් නන්ද තෙරුණුවෝ රාගාදී සියලු කෙලෙසුන් නසා රහත් බව පසක් කර ගත්හ.

සිය සහෝදරයා වන මහාපන්ථක කුමාරයා අනුව ගිය චුල්ලපන්ථක කුමරු ද සම්බුද්ධ ශාසනයෙහි පැවිදි විය. එහෙත් සිව්මසක් ගතවන තුරුත් උන්වහන්සේ ගාථා සතර පදයක්වත් පාඩම් කර ගැනීමට අපොහොසත් වූහ. උන්වහන්සේගේ ගුරුවරයා

වූ මහාපන්ථක තෙරණුවෝ ''පන්ථක, සතර පද ගාථාවක් පාඩම් කරගත නොහැකි ඔබ සසුන් කිස මුදුන් පමුණුවාගන්නේ කෙසේදැයි'' කියා විහාරයෙන් නෙරපාලූහ. හිමිදිරියේ මහාකරුණා සමාපත්තියෙන් ලොව බලා වදාරණ තථාගතයන් වහන්සේ විහාරයෙන් බැහැරව යන චුල්ලපන්ථක හිමියන් පෙරමග සිට උන්වහන්සේගේ බුද්ධි මට්ටමට ගැළපෙන කමටහනක් ලබාදුන් සේක. පිරිසිදු සුදු රෙදි කඩක් අතට දී "රජොහරණං රජොහරණං" යනුවෙන් පවසමින් ලෙස වදාළ සේක. ටික වේලාවකින් රෙදි කඩ අපිරිසිදු විය. ඒ අනුව සිත මෙහෙය වූ චුල්ලපන්ථක හිමියෝ සව්කෙලෙසුන් නසා මහරහත් බවට පත්වූහ.

පුද්ගලයෝ විවිධාකාර අදහස් සිතුම් පැතුම් බුද්ධි මට්ටම් ඇත්තෝ ය. ඔවුන්ගේ සිතුම් වටහාගෙන ඒ අනුව නිසිමග පෙන්වීමෙන් යහමගට ගත හැකි ය. චුල්ලපන්ථක හිමියන්ට එසේ තථාගතයන් වහන්සේ පිහිට නොවුනේ නම් ගිහි බවට පත්ව මේ සසරේ තවතවත් ගිලෙනු මිස පරම සුවය උදාකර නොගනු ඇත.

මනුෂ්‍ය සත්ත්වයාගේ චිත්ත සන්තානය සුවපත් කර අසරණ භාවයෙන් මිදවීමට බුදුරජාණන් වහන්සේ යොදාගත් ප්‍රායෝගික ක්‍රමවේද අවස්ථාවෝචිත ය. සමස්ත බුදු සිරිතෙහි එබඳු අවස්ථා අපට බෙහෙවින් හමු වෙතත් ඉන් අල්පමාත්‍රයක් මෙහි සඳහන් කරන ලද්දේ තථාගතයන් වහන්සේගේ අසරණ සරණ ගුණය ප්‍රකට කරවනු පිණිස ය.

**අභ්‍යාස**

01. බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය ප්‍රකටවන අවස්ථා බුදු සිරිත ඇසුරෙන් සොයා ලියන්න.
02. "සත්හට වන බව දුකට වෙදාණන්" යන වැකිය පාදක කොටගෙන රචනාවක් ලියන්න.
03. අසරණයන්ට සරණ වීමේ උතුම් මානව ගුණ ධර්මය ප්‍රකට කරන වර්තමාන සිද්ධි කිහිපයක් එක් කර වාර්තාවක් සකසන්න.

# 04 පාඩම

# ගුණයෙන් අගපත් අගසවු බුදු පුත්

බෞද්ධ සමාජය භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් වණක් පිරිසකගෙන් සමන්විත ය. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි සමයෙහි මෙම සිව් පිරිසෙහි ම විශේෂ කුසලතා සැලකිල්ලට ගනිමින් ඔවුනට යෝග්‍ය තනතුරු ප්‍රදානය කළහ. ඒ මගින් බුදුරදුන් අපේක්ෂා කළේ බුදු සසුනේ මනා පැවැත්මයි. එම තනතුරුවල ස්වභාවය විමසා බැලීමෙන් එය මනාව වටහාගත හැකි ය. මෙම තනතුරු අතර වඩාත් විශිෂ්ඨ වනුයේ අගසව් තනතුරු දෙක ය. බුදු සසුනෙහි එම උත්තරීතර තනතුරු ලැබීමට භාග්‍ය සම්පන්න වූයේ සැරියුත්-මුගලන් යන මහරහතන් වහන්සේලා දෙනම ය.

### කලණ මිතුරු ඇසුරක්

රජගහ නුවර දඹදිව ඉතා ප්‍රසිද්ධ නගරයකි. ඒ සමීපයෙහි උපතිස්ස නම් වූ සුන්දර බමුණු ගමක් පිහිටා තිබුණි. එහි මහාසාර බමුණු කුලයක සාරි නම් වූ බැමිණියට උපන් දෙටු පුත්‍රයා උපතිස්ස යන නමින් ප්‍රකට විය. කෝලිත නම් බමුණු ගම ද උපතිස්ස ගම සමීපයෙහි වූ තවත් එවැනි ම සුන්දර ගම්මානයකි. එහි මහාසාර බමුණු කුලයෙහි මොග්ගල්ලාන බැමිණියගේ පුත්‍රයා ප්‍රකට වූයේ කෝලිත යන නමිනි.

මෙම උපතිස්ස-කෝලිත දෙදෙනා ඉතා කුඩා කල පටන් ම ඔවුනොවුන්ට කල්‍යාණ මිත්‍රයෝ වූහ. ක්‍රමයෙන් තරුණ වියට පත් ඔවුහු තවත් මිතුරන් පිරිසක් ද සමග රජගහ නුවර වාර්ෂිකව පවත්වන මහා සැණකෙළියකට සහභාගි වූහ. එය හැඳින්වූයේ ගිරග්ගසමජ්ජ උළෙල ලෙසයි. මෙය නැරඹීමට රජගහනුවර හා තදාසන්න ප්‍රදේශවල තරුණ තරුණියෝ ඉතා උනන්දුවෙන් සහභාගි වෙති. ඔවුන් සැණකෙළිය නරඹනුයේ අපමණ විනෝදාස්වාදයකින් යුක්තවයි. උපතිස්ස කෝලිත දෙදෙනා ද මෙමගින් මුලදී කිසියම් විනෝදයක් ලැබූහ. ක්‍රමයෙන් මුහුකුරා ගිය නුවණ ඇති ඔවුහු ඒවා නිසරු නිරර්ථක දේ යැයි කලකිරීමට පත් වූහ.

මෙලොව උපන් සත්ත්ව වර්ගයා මොහොතින් මොහොත මරණය කරා ළඟා වන කල්හි මෙබඳු නැටුම්, ගැයුම්, වැයුම් දෙස බලා විනෝදවීමෙන් ඇති ඵලය කුමක් දැයි, දෙදෙනා ම නිතර කතාබහ කළ හ. එය ම ඔවුන් සංසාරයේ විමුක්තිය සොයමින් සත්‍ය ගවේෂණය සඳහා යොමු වීමට හේතුවක් විය.

ගිහිගේ හැරගිය ඔවුනට පළමුවෙන් ම මුණගැසුණේ ෂට් ශාස්තෲන්ගෙන් කෙනෙකු වූ ''සංජය'' නමැති පිරිවැජියා ය. එහෙත් සංජය පිරිවැජියා සතුව ද සැබෑ විමුක්ති මාර්ගය නොමැති බව වැඩිකල් නොගොස් ඔවුහු තේරුම් ගත්හ. එතැනින් නික්මුණු ඔවුන් නැවත සත්‍ය සෙවීමට පිටත්වූයේ

''අප දෙදෙනාගෙන් යමෙකු කිසියම් තැනක දී කවර හෝ ලෙසකින් විමුක්තිය පිළිබඳ මග දැනගතහොත් කල්වේලා නොගෙන ඒ බව අනෙකාට ද දැන්විය යුතු ය.'' යන ගිවිසුම ඇතිව ය.

මෙසේ සත්‍යය සොයමින් යන අතර දිනක් උපතිස්ස පිරිවැජියාට රජගහ නුවර දී පස්වග භික්ෂූන් වහන්සේලා ගෙන් එක් නමක් වූ අස්සජි මහරහතන් වහන්සේ මුණගැසුණි. සන්සුන් ඉඳුරන් ඇතිව වැඩමවන උන් වහන්සේගේ ඉරියව් දුටු උපතිස්ස පිරිවැජියා,

''ආශ්චර්යයකි. මේ නම් ඒකාන්තයෙන් ම විමුක්තිය ලැබූ උත්තමයන් වහන්සේ නමක් විය යුතු යැ''යි, සිතී ය. පිඬු පිණිස වැඩමවන වේලාව වන හෙයින් කතාබහ නො කළ යුතු බව සලකා පසුපසින් ගොස් දන් වළඳන වේලෙහි කළ යුතු උවටැන් සිදු කළ උපතිස්ස පිරිවැජියා අවසානයේ දී මෙසේ ඇසී ය.

''ස්වාමීනි, ඔබ වහන්සේ ගේ ඉන්ද්‍රියන් ඉතා ප්‍රසන්න ය. කිසියම් විමුක්ති මගකට පිළිපන් බවක් දිස් වේ. ඔබ වහන්සේ ගේ ගුරුවරයා කවරෙක් ද? ඔබ කවර නම් කෙනෙකුගේ ධර්මයක් ගරු කරන්නෙහි ද?''

**අස්සජි තෙරණුවෝ :**

''ශාක්‍යමුනි ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී සිටිති. මම එම බුදුරජාණන් වහන්සේ උදෙසා ගිහි ගෙය හැරදමා පැවිදි වීමි. උන් වහන්සේ මාගේ ශාස්තෘවරයාණන් වහන්සේ වෙති.''

**උපතිස්ස පිරිවැජියා :**

''ස්වාමීනි, ඔබ වහන්සේගේ එම ශාස්තෘන් වහන්සේ දේශනා කරන ධර්මය කුමක් ද?''

**අස්සජි තෙරණුවෝ :**

''මා පැවිද්දට නවකයෙකි. විස්තර වශයෙන් මට තථාගත ධර්මය දේශනා කළ නො හැකි ය. එහෙත් තථාගත ධර්මයේ මූලික කරුණු එක්කොට කෙටියෙන් ධර්මය පහදා දීමට හැකි ය.''

**එසේ වදාළ අස්සජි තෙරණුවෝ,**

**යෙ ධම්මා හෙතුප්පභවා**
**තෙසං හෙතුං තථාගතො ආහ**
**තෙසඤ්ච යො නිරොධො**
**එවං වාදී මහාසමණො**

යම් ධර්මයක් හේතුන් මුල්කොට පවතී ද, එහි හේතුව තථාගතයන් වහන්සේ දේශනා කරති. එහි නැතිවීම ද දේශනා කරති. උන් වහන්සේ එබඳු වාද ඇති කෙනෙකි යි බුදුරදුන්ගේ දේශනාව ගෙනහැර දැක්වූහ.

මෙසේ කෙටියෙන් දේශනා කළ ධර්මය මැනවින් වටහාගත් උපතිස්ස පිරිවැජියා ගාථා දේශනාවේ මුල් පද දෙක ඇසීමෙන් ම සෝවාන් ඵලයට පත් විය. හේ වහා සිය මිතුරු කෝලිත පිරිවැජියා සොයා ගොස් තමා අසා දැනගත් නිවන් මග ඔහුට හෙළි කළේ ය. ගාථා පද සතර කියා නිමවෙත් ම කෝලිත පිරිවැජියා ද සෝවාන් ඵලයට පත් විය.

පසුව උපතිස්ස කෝලිත පිරිවැජියෝ මහත් ගුරු බැතින් සිය පැරැණි ආචාර්යවරයා වූ සංජය පිරිවැජියා වෙත එළඹියහ. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වී නිවන් මග ලොවට හෙළිකර ඇති හෙයින් උන්වහන්සේ හමුවට යාමට ඔහුට ඇරයුම් කළහ. එහෙත් ශාස්තෲවරයෙකු ලෙස සිට ශ්‍රාවකයෙකු වීමට ඇති අකමැත්ත නිසා සංජය පිරිවැජියා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. අනතුරුව තමා සමග සිටි 250 ක් පමණ පිරිවැජි පිරිස ද සමග උපතිස්ස කෝලිත දෙදෙනා බුදු රදුන් වෙත ගොස් පැවිදි උපසම්පදාව ලද හ. එහි දී උපතිස්ස කෝලිත දෙදෙනා හැර සෙසු පිරිස රහත් වූ හ. පැවිදිවීමෙන් පසු උපතිස්ස පිරිවැජියා සාරි බැමිණියගේ පුත්‍රයා බැවින් සාරිපුත්ත ථෙර නමින් ද, කෝලිත පිරිවැජියා මොග්ගලී බැමිණියගේ පුත්‍රයා බැවින් මොග්ගල්ලාන ථෙර නමින් ද ප්‍රකට වූහ.

පැවිද්දෙන් දෙසතියකට පසු රජගහ නුවර සූකරඛත ලෙනේ දී ''දීඝනඛ'' පිරිවැජියාට දේශනා කළ වේදනා පරිග්ගහ සූත්‍රය අසා සැරියුත් තෙරණුවෝ රහත් වූහ. සැරියුත්-මුගලන් දෙනම ම මහ රහත්භාවය සම්පූර්ණ කළ පසු බුදුරජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයට භික්ෂූන් වහන්සේලා 1250 නමක් එක්රැස් කරවා ප්‍රථම සංඝසන්නිපාතය පැවැත් වූහ. ඒ නවම් පොහොය දිනෙක ය. එහි දී සැරියුත් මහරහතන් වහන්සේට දකුණත් සවු තනතුරත්, මුගලන් මහරහතන් වහන්සේට වමත් සවු තනතුරත් පිරිනැමූහ.

මෙය දුටු ඇතැම් පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ''බුදුරජාණන් වහන්සේ මුහුණ බලා තනතුරු දෙති'' යි, චෝදනා කළ හ. මුලින් පැවිදි වූ භික්ෂූන් වහන්සේලා සිටිය දී මෑතක දී සසුනට ඇතුළත් වූ සැරියුත් මුගලන් දෙනමට අගසව් තනතුරු පිරිනැමීම සාධාරණ නොවන බව ඇතැම්හු ප්‍රකාශ කළ හ. මෙම චෝදනාව පිළිබඳ දැනගත් බුදුරජාණන් වහන්සේ,

''මහණෙනි, පංච වග්ගිය භික්ෂූන්, යස භික්ෂුව, භද්ද වර්ගික භික්ෂූන්, තුන් බෑ ජටිල භික්ෂූන් යන මේ සියලුදෙනා ම අනෙකක් පතා ම පින් කළාහු ය. අගසව් තනතුරු නොපැතූහ. එහෙත් සැරියුත්-මුගලන් දෙනම අගසව් තනතුරු පතා ම පින් කළ හ.'' යනුවෙන් අගසව් දෙනම ගේ අතීත ප්‍රවෘත්ති ගෙන හැර දැක් වූ හ. එයින් භික්ෂූන් වහන්සේලාගේ කුකුස දුරු විය. බුදුරජාණන් වහන්සේ සැරියුත් මුගලන් දෙනම අග්‍රශ්‍රාවක තනතුරුවලට පත් කිරීමේ දී සැරියුත් තෙරණුවන් ප්‍රාඥයන් අතර ද මුගලන් තෙරණුවන් ඍද්ධිමතුන් අතර ද අග්‍රස්ථානයට පත් කළ හ. ඒ බව අංගුත්තර නිකායේ දැක්වෙන්නේ මෙසේ ය.

**එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මහාපඤ්ඤාවන්තානං යදිදං සාරිපුත්තො, එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහා මොග්ගල්ලානො**

ධර්ම සේනාපති තනතුර ලැබුණේ ද සැරියුත් තෙරුන් වහන්සේට ය.

- ඉතා ගැඹුරු ධර්ම කරුණු තම නුවණින් වටහා ගෙන සරලව දේශනා කිරීමේ හැකියාවත්,
- අන්‍යයන්ට ධර්මය අවබෝධ කර දෙමින් එයින් නිසි ඵල නෙලා ගැන්මට ක්‍රියා කිරීමත්

එම තනතුර ලබාදීමට බලපෑ කරුණු අතර ප්‍රධාන ය.

සැරියුත් තෙරුන් වහන්සේගේ දේශනා කෞශල්‍යය බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාවල දී බෙහෙවින් අගය කළහ. අංගුත්තර නිකායේ චක්කානුවත්ත සූත්‍රය එයට උදාහරණයකි. එහිදී බුදුරදහු මෙසේ වදාරති.

මහණෙනි, මේ සසුනේ අර්ථය දන්නා, ධර්මය දන්නා, සිව්පස පමණ දන්නා, කාල පරිහරණය දන්නා, පිරිස් ගැන දන්නා සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ තථාගතයන් වහන්සේ විසින් පවත්වන ලද අනුත්තර වූ ධර්ම චක්‍රය මනාකොට නැවත පවත්වයි. එම ධර්ම චක්‍රය වෙනත් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට හෝ දෙවියෙකුට හෝ මාරයෙකුට හෝ බ්‍රහ්මයෙකුට හෝ ලොවෙහි වෙනයම් කිසිම කෙනෙකුට හෝ කිසිසේත් ම පැවැත්විය නො හැකි ය.

සැරියුත් මහතෙරුන් වහන්සේගේ විශිෂ්ට වූ ගුණ සමුදාය අතර අසීමිත ගුරු ගෞරවය සුවිශේෂ වේ. තමන්ට නිවන් මග පෙන්වා දුන් අස්සජි තෙරණුවන් සිටි දිශාවට දිනකට තෙවරක් නමස්කාර කළ උන් වහන්සේ එදෙසට හිසලා සැතපුණු බව සාරිපුත්ත අපදානයෙහි දැක්වෙයි.

**යො මෙ ආචරියො ආසී අස්සජි නාම සාවකො**
**යස්සං දිසායං වසති උස්සීසම්හි කරොමහං**

මාගේ ආචාර්යවරයා වූ අස්සජි නම් බුද්ධ ශ්‍රාවකයන් වහන්සේ කිසියම් දිසාවක වෙසෙත් ද මම එදෙසට හිසලා සැතපෙමි.

එසේ ම, කුඩා සාමණේරනමක් දෙන අවවාදය වුව ද පිළිගැනීමට තරම් සැරියුත් තෙරණුවෝ නිවාත ගුණයෙන් යුක්ත වූ හ. දිනක් උන් වහන්සේ විහාර මළුවේ සක්මන් කරමින් සිටින අතරතුර නොදැනුවත්ව ම අඳනයේ එක් කොණක් පහතට එල්ලෙමින් බිම ගෑවෙමින් තිබිණ. එදින ම පැවිදි වූ සත් හැවිරිදි සාමණේර නමක් එය පෙන්වා දුන් කල්හි සැරියුත් තෙරණුවෝ,

**තදහු පබ්බජිතො සන්තො ජාතියා සත්ත වස්සිකො**
**සො’පි මං අනුසාසෙය්‍ය සම්පටිච්ඡාමි මුද්ධනා**

එදින ම පැවිදි වූ උපතින් සත් හැවිරිදි සාමණේර නමක් වුව ද මට අනුශාසනා කරයි නම් මම එය හිස මුදුනින් පිළිගනිමියි කියා එය සකස්කර ගෙන ඒ සාමණේර නම ඉදිරියේ එම වරද දෙසා කමා කරවා ගැනීමට තරම් නිහතමානී වූහ.

බුද්ධ ශාසනයේ අගසව් ලෙස සැරියුත් තෙරණුවෝ තමන් සතු කාර්යභාරය පිළිබඳ මනා අවබෝධයකින් ක්‍රියා කළ හ. නොමගට යොමුව සිටි බොහෝ දෙනෙකු සුමගට

යොමු කළ හ. දෙව්දත් තෙරුන් සංඝභේදය කොට භික්ෂු කණ්ඩායමක් රැගෙන ගයා ශීර්ෂයට ගිය අවස්ථාවේ දී සැරියුත් මුගලන් අගසව් දෙනම ම මුල් වී එම පිරිසට නිවන් මග පහදා දී බුදුරදුන් වෙත නැවත කැඳවාගෙන ඒම එක් අවස්ථාවකි.

සැරියුත් තෙරුන් පිරිනිවි අවස්ථාවේ අනඳ තෙරුන් බුදුරදුන් හමුවේ කළ ගුණ කථනය උන්වහන්සේගේ මෙහෙවර සැකෙවින් කියාපාන වැදගත් ප්‍රකාශයකි. එහිදී අනඳ තෙරණුවෝ '' **අපි ච භන්තෙ ආයස්මා සාරිපුත්තො ඔවාදකො අහොසි විඤ්ඤාපකො සන්දස්සකො සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො අකිලාසු ධම්ම දෙසනාය, අනුග්ගාහකො සබ්‍රහ්මචාරීනං** '' යනුවෙන් ස්වාමීනි, එසේවුවත් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අපට අවවාදකරන්නෙක්, කරුණු අඟවන්නෙක්, දක්වන්නෙක්, සමාදන්කරවන්නෙක්, උද්වේග කරවන්නෙක්, සතුටු කරවන්නෙක්, දම්දෙසුම්හි පසුබට නොවන්නෙක්, සබ්බ්‍රහ්මචාරීන්ට අනුග්‍රහ කරන්නෙක් වූහ යි පවසති. සැරියුත් තෙරුන් වහන්සේ පිරිනිවන්පෑමට ආසන්න අවස්ථාවේ දී මිසදිටුගත් සිය මෑණියන් වූ රූපසාරී බැමිණියට නිවන් මග කියා දී සෝවාන් ඵලයෙහි පිහිට වූ හ. උන් වහන්සේගේ පිරිනිවන්පෑම ද එදින ම සිදු වුණි. සැරියුත් තෙරන්ගේ විශිෂ්ට ගුණ වර්ණනා කළ බුදුරජාණන් වහන්සේ උන් වහන්සේගේ ධාතු නිධන් කොට සෑයක් ද කර වූහ.

## මුගලන් මහතෙරණුවෝ

අගසව් පදවි ලද මුගලන් මහ රහතන් වහන්සේ ද සම්බුද්ධ ශාසනයෙහි චිරස්ථිතිය සඳහා තම වගකීම් සම්භාරය පිළිබඳ මනා අවබෝධයකින් හා කැපවීමකින් ක්‍රියා කළ හ. ඍද්ධි බලය ද යොදා ගනිමින් උන් වහන්සේගේ විශේෂ කාර්යයන් කිහිපයක් මෙසේ පෙන්වා දිය හැකි ය.

- නොමගට ගිය දේවදත්ත පාක්ෂික භික්ෂූන් සුමගට ගැනීම.
- මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවාලීම.
- නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීම.
- මජ්ඣිම නිකායේ මාරතජ්ජනීය සූත්‍රයෙහි සඳහන් පරිදි මාරයා තම සිරුර තුළ පෙරළි කළ අවස්ථාවේ තමා ද පෙර මාරයෙක් ව උපන් අවස්ථාවක් ගැන සඳහන් කරමින් මාරයාට තර්ජනය කිරීම.
- බුදුරදුන් මාතෘ දිව්‍යරාජයාට අභිධර්මය දේශනා කිරීමට දෙව්ලොව වැඩම කළ අවස්ථාවේ දී දෙව්ලොව තොරතුරු විස්තර කොට ජනතාවට ධර්මය දේශනා කිරීම.
- මිනිස් ලොව පමණක් නොව දෙව්ලොව ද නිරයේ ද සැරිසරමින් සත්ත්වයන් තුළ පින් පව් හා ඒවායෙහි විපාක ජනතාවට දේශනා කිරීම.

'' **සෙය්‍යථාපි භික්ඛවෙ ජනෙත්ති එවං සාරිපුත්තො, සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ගල්ලානො** '' යනුවෙන් මහණෙනි ඔබට මවක යම් බඳු වේ ද සැරියුත් තෙරුන් එබඳු ය. පියෙකු යම් බඳු ද මුගලන් තෙරුන් එබඳුයැයි වදාළහ.

මුගලන් තෙරුන්ගේ එම තෙදවත් ගුණය ප්‍රකටවන අවස්ථා උන්වහන්සේගේ චරිතයේ කිහිපවර දැකිය හැකි ය. වරක් බුදුරදුන් පොහොය සීමාවේ දුසිල් භික්ෂුවක් සිටීම

නිසා පොහොය නොකර සිටි අවස්ථාවේ එබඳු කෙනෙකු සිටී නම් ඉවත් වන්න යැයි කියාත් එම භික්ෂුව ඉවත් නොවූ විට මුගලන් තෙරණුවෝ දිවැසින් බලා අදාළ තෙරුන් වහන්සේ වෙත ගොස් අතින් අල්ලා ඉවත් කළහ.

චාතුම සූත්‍රයේ සඳහන් වන පරිදි වරක් නවක භික්ෂූන්ගේ කැකෝගැසීමක් නිසා බුදුරජාණන් වහන්සේ සැරියුත් මුගලන් දෙනමත් උන්වහන්සේලාගේ දහසක් පිරිවරත් දෙව්රම් වෙහෙරින් නෙරපාලූහ. පසුව අනේපිඬු සිටුතුමා ආදී දායකයන් හා දෙවිබඹුන් පවා මැදිහත් වී බුදුරදුන් කමා කරවා උන්වහන්සේලා ආපසු වැඩමවා ගන්නා ලදී. ''එම අවස්ථාවේ ඔබ ට සිතුණේ කුමක්ද''යි සැරියුත් තෙරුන්ගෙන් බුදුරදුන් විමසූ විට උන්වහන්සේ වදාළේ තථාගතයන් වහන්සේ භික්ෂූන් පරිහරණයෙන් ඈත් වී විවේක සුවයෙන් වැඩසිටීමට කැමති වෙත් නම් තමනුත් විවේකයෙන් සිටින්නට අදහස් කළ බවයි. එහෙත් මුගලන් තෙරුන්ගෙන් ඇසූවිට උන්වහන්සේ පැවසුවේ තථාගතයන් වහන්සේත්, සැරියුත් තෙරුන් වහන්සේත්, සංඝයා පාලනය කිරීමෙන් ඈත් වන සේක් නම් එය තමන්වහන්සේවත් කළයුතු යැයි සිතූ බව ය.

මුගලන් හිමි ස්වකීය ඍද්ධි බලය ද යොදා ගනිමින් ධර්මය දේශනා කිරීම නිසා සැදැහැවත්හු බුදුරදුන් හා භික්ෂූන් විෂයෙහි මහත් සේ පුද පූජා පැවැත් වූහ. එනිසා, අන්‍ය තීර්ථකයෝ මුගලන් තෙරුන් කෙරෙහි දැඩි වෛරයකින් පසු වූහ. උන් වහන්සේ ඝාතනය කිරීමට ද අපරාධකරුවන් යෙදවූහ. පළමු හා දෙ වැනි ඝාතන වෑයම්වලදී උන්වහන්සේ ඍද්ධි බලයෙන් එයින් ගැලවුණහ. එහෙත් තෙවැනි වර සතුරන් වැටලූ අවස්ථාවේ දී පෙර සසර මව්පියන් මැරීමේ පාප කර්මය නොවැළැක්විය හැකි සේ විපාකය කරා එළඹ ඇති බව දැන නිසලව හුන්හ. සතුරෝ තළා පෙළා උන් වහන්සේ මළහ'යි, සිතා පිටත්ව ගියහ. ඍද්ධි බලයෙන් ශරීරය බලගන්වා බුදුරදුන් වෙත එළඹි උන් වහන්සේ නොයෙක් ඍද්ධි ප්‍රාතිහාර්ය පා වැඳ අවසර ගෙන කාලසිලාවට වැඩමවා එහි දී පිරිනිවන් පා වදාළ හ.

**අභ්‍යාස**

01. සැරියුත් මුගලන් මහරහතන් වහනසේලා සතුව පැවැති විශේෂ ගුණාංග ලෙස මෙම පාඩමෙහි දක්වා ඇති කරුණු එම චරිත දෙකෙහි සිද්ධි ඇසුරින් වෙන වෙන ම පැහැදිලි කෙරෙන වගුවක් පිළියෙල කරන්න.

05
පාඩම

# තෙරණින් අතර අගපත් දීපශිඛාවෝ

**ඛේමා මහරහත් තෙරණිය**

පියුමතුරා බුදුරදුන් දවස දඹදිව හංසවතී නුවර මහත් යසඉසුරු ඇති සිටු කුලයක කුල කුමරියක් උපත ලැබුවා ය. ඒ භාග්‍යවතුන් වහන්සේ ගෙන් බණ අසා මහත් සේ පැහැදුණු ඕ තොමෝ දෙමව්පියන් ගේ ද අවසරය ඇතිව බුද්ධ ප්‍රමුඛ ආර්ය මහාසංඝ රත්නයට සත් දිනක් පුරා මහ දන් පැවැත්වූවා ය. සත් දවස ඉකුත්ව ගිය කල එම භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුණියක මහා නුවණැත්තන් අතරෙහි අග්‍රස්ථානයෙහි පිහිටුවනු දැක ප්‍රසාදයට පත් ඇය ''මම ද බුදු කෙනෙකුන් වහන්සේ නමකගෙන් එම තනතුර ලබන්නෙමි'' යි, ප්‍රාර්ථනා කළා ය. භාග්‍යවතුන් වහන්සේ ද ''ඔබගේ ප්‍රාර්ථනාව සිද්ධ වේවා'' යි, විවරණ දුන් සේක.

බොහෝ පින්කම් සිදුකොට දෙව්ලොව උපන් ඇය එතැන් පටන් දිව්‍ය ලෝකවල ඉපිද දෙව්රජවරුන්ගේ දෙවඟන තනතුරු ද, මිනිස් ලොව සක්විති රජවරුන්ගේ අගබිසෝ තනතුරු ද ඇතුළුව බොහෝ සැප සම්පත් භුක්ති වින්දා ය. විපස්සී බුදුරදුන් සමයෙහි රාජ කුමාරිකාවක්ව ඉපිද සසර පුරුද්ද නිසා ම පැවිදිව කුසල් රැස්කර ගත්තා ය. කෝණාගමන බුදුරදුන් සමයෙහි ද රාජ කුමාරිකාවක්ව ඉපිද විහාරයක් තනවා බුදුපාමොක් මහසඟරුවනට පිදුවා ය. කස්සප බුදුරදුන් සමයෙහි බරණැස් නුවර කිකී රජුගේ සමණී නම් වැඩිමහල් දියණිය ලෙස ඇය උපත ලැබූ ඇය ස්වකීය සෙසු සොහොයුරියන් සය දෙනා ද සමග එක්ව ආරාමයක් කරවා බුදුපාමොක් මහසඟරුවන උදෙසා පූජා කළා ය.

අප බුදුරදුන් සමයෙහි මද්‍ර රට සාගල නුවර මහත් ධනවත් සිටු පවුලක පංච කල්‍යාණයෙන් යුත් විශිෂ්ට රූපශ්‍රීන් හෙබි තැනැත්තියක ලෙස උපන් ඇය ඛේමා නම් වූවා ය. නිසි වයස පැමිණි කල ඇය බිම්බිසාර රජුගේ අගමෙහෙසිය බවට පත්වූවා ය. රූප මදයෙන් මත් වූ ඛේමා ''බුදුරජාණන් වහන්සේ රූපයට නිග්‍රහ කරති'' යි, අසා උන් වහන්සේ දැක්මට ගියේ නැත. එය රජතුමාගේ බලවත් කණස්සල්ලට හේතුවක් විය. ඉතා සැදැහැතියෙකු වූ බිම්බිසාර රජු වේළුවනාරාමය බුද්ධ ප්‍රමුඛ මහසඟනට පූජා කළේ ය. රජු නිරන්තරයෙන් ම බුද්ධ ප්‍රමුඛ මහ සඟනට දානාදී අවශ්‍ය දෑ මැනවින් සපයමින් බණ අසමින් කාලය ගත කරයි. නගරයේ සිටුවරු සේ ම සෙසු පුරවැසියෝ ද නිතර නිතර වේළුවනාරාමයට ගොස් ධර්ම ශ්‍රවණය කරති. එහෙත් කිසි දිනෙක ඛේමාව බුදුරදුන් දැකීමට නො ගිය හෙයින් බිම්බිසාර රජු උපායකින් ඇය බුදුරදුන් හමුවට යැවීමට සිතී ය. ඒ අනුව වේළුවනාරාමයේ ස්වභාව අලංකාරය වර්ණනා කෙරෙන ගීතිකා නිර්මාණය කරවා ඒවා ගායකයන් ලවා මැනවින් ගායනා කරවා ඇයට ඇසීමට සැලැස් වී ය. එම මනහර ගී ඇසීමෙන් වේළුවන උයනෙහි අසිරිය නැරඹීමට ඛේමා බිසවට මහත් ආශාවක් උපනි. ඒ බව දැන් වූ කල්හි මහත් සතුටට පත් රජු සහපිරිවරින් දේවිය වේළුවනාරාමයට යැවී ය.

උයනට ගොස් වන සිරිය බලමින් ඉතා සොම්නසින් ඇවිදින දේවිය එක්තරා තරුණ භික්ෂුවක් රුකක් මුල භාවනානුයෝගීව සිටිනු දුටුවා ය. මෙබඳු රූ සපුවකින් හෙබි යෞවන වියේ පසුවන යෝගාවචර භික්ෂුව ගේ ධ්‍යානය දුටු ඇය මහත් සේ පුදුමයට පත් වූවා ය. උයන පුරා ඇවිදිමින් උයනෙහි අසිරිය බලා අවසානයේ දී බුදුරදුන් නොදැක ම ඇය ආපසු පැමිණීමට සූදානම් වූවා ය. ඇය බුදුරදුන් නොදැක ආපසු පැමිණීමට සැරසුනහොත් වහා ඇය බුදුරදුන් වෙත ගෙන යා යුතු යැයි, රජු රාජ පුරුෂයන්ට අණ කොට තිබුණේ ය. එබැවින් රාජ පුරුෂයෝ ඇයගේ ආපසු හැරීම වලකා වහා ඇය බුදුරදුන් වෙත පැමිණවීමට ක්‍රියා කළ හ.

ඛේමා පිළිබඳ සියලු තතු නුවණින් දැනසිටි බුදුරජාණන් වහන්සේ ඇය පැමිණෙනු දැක ඉර්ධි බලයෙන් දෙවඟනක වැනි රූමත් ස්ත්‍රියක් උන්වහන්සේට විජිනිපතින් පවන් සලන්නාක් සේ ඇයට පෙනෙන්නට සැලැස් වූ හ. එය දුටු ඛේමාවන්ට

''මෙබඳු දෙවඟනක් වැනි රූපශ්‍රීයෙන් යුක්ත වූ ස්ත්‍රීහු බුදුරජාණන් වහන්සේ සමීපයෙහි සිටිති. මම මොවුන් ගේ මෙහෙකාර කමටවත් නො වටිනා තරම් ය. බුදුරජාණන් වහන්සේ රූපශ්‍රීයට නිග්‍රහ කරති යි, රටේ පැතිර පවත්නා කතාව සම්පූර්ණ අසත්‍යයකැයි සිතිණි''

එසේ සිතූ ඇය එම ස්ත්‍රී රූපය දෙස ම බලා සිටියා ය. ඇය බලා සිටිය දී ම බුදු රදුන් ගේ අධිෂ්ඨානය පරිදි එම ස්ත්‍රී රූපය ප්‍රථම වයස ක්‍රමයෙන් ගෙවී මධ්‍යම වයසට පත්ව එය ද ගෙවා මහලු වයසට ද පත්ව හිසකෙස් පැසුණු, සම රැළි වැටුණු, දත් වැටුණු විරූප වූ මැහැල්ලක බවටත් පත් ව විජිනිපත ද හැර දමා බිමට පතිත විණ. එයින් සංවේග යට පත් ඛේමාට

''මෙබඳු රූමත් ශරීර පවා මෙසේ විනාශයට පැමිණෙයි. මාගේ මෙම රූපයට ද මෙබඳු ඉරණමක් අත්වීම නොවැළැක්විය හැකි ය.'' යි වැටහිණ

ඛේමා බිසවගේ රූප මදය හීන වී නුවණ මුහුකුරා ගිය බව දත් බුදුරජාණන් වහන්සේ,

''ඛේමාවෙනි, රෝගාදියෙන් ආතුර වූ දෙතිස් කුණුපයෙන් අපවිත්‍ර වූ කුණු වූ මෙම ශරීරය දෙස බලන්න. ශරීරය ගැන ඇති ඡන්දය දුරු කරන්න. අසුභානුපස්සනාව වඩන්න.''

යනුවෙන් වදාරා මහානිදාන සූත්‍රය දේශනා කළ සේක. ඒ ඇසූ ඛේමා බිසව සෝවාන් ඵලයට පැමිණ බුදුරදුන් හමුවෙහි මෙසේ ප්‍රකාශ කළා ය.

''ස්වාමීනි, මා මෙතෙක් දවස් රූප මදයෙන් මත්ව ඔබ වහන්සේ රූපය හෙලා දකින බව අසා ඔබ වහන්සේ හමුවීමට නොපැමිණියෙමි. දැන් මට සත්‍යය වැටහිණ. මා අතින් යම් වරදක් වී නම් ඊට සමාවුව මැනව.''

එවිට, ''ඔබ අත වරද නැතැ'' යි, බුදුරජාණන් වහන්සේ වදාළ හ. ඉක්බිති ඛේමාව බුදුරදුන් ප්‍රදක්ෂිණා කොට වැඳ රජ මැදුරට ගොස් බිම්බිසාර රජුට හමුවී

''ස්වාමීනි, මම බුදුන් දැක බණ අසා ජීවිතය ගැන මහත් සේ කළකිරීමට පත්වීමි. මහරජ ඔබ අවසර දෙන්නේ නම් බුදු සසුනෙහි පැවිදි වෙමි.''යි පවසා සිටියා ය.

බිම්බිසාර රජු ඇයට පැවිදිවීමට අවසර දුන්නේ ය. ඛේමාව විහාරයට ගොස් පැවිදිව අඩ මසක් ඇවෑමෙන් පහනක් දැල්වීමත්, නිවීමත් දැක ඒ ගැන මෙනෙහි කරමින් සිට රහත් භාවයට පත් වූවා ය. ඛේමා මහරහත් තෙරණිය තම ප්‍රාර්ථනාව පරිදි සසර පුරා නුවණින් පින් පුරමින් පැමිණ මහා නුවණැත්තියක බවට පත් වූ හෙයින් බුදුරදුන් භික්ෂුණීන්ට අග්‍රස්ථානය පිරිනමන කල්හි,

**''එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුණීනං මහාපඤ්ඤානං යදිදං ඛෙමා''**

යනුවෙන් ''මහණෙනි, මාගේ ශ්‍රාවිකාවන්ගෙන් මහා ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර මෙම ඛේමා තොමෝ අග්‍ර වන්නීයැ''යි අග තනතුරෙහි පිහිටුවා වදාළ සේක. ඒ සමග ම ඕතොමෝ බුදුරදුන්ගේ අග්‍රශ්‍රාවිකා තනතුරටද පත් වූවා ය.

## උප්පලවණ්ණා මහරහත් තෙරණිය

පදුමුත්තර බුදුරදුන් සමයෙහි ම හංසවතී නුවර එක් කුල ගෙයක දියණියක් උපන්නා ය. බණ ඇසීම සඳහා විහාරයට යන මහ පිරිස් දැක ඔවුන් සමග ගොස් බණ ඇසූ ඇය බුදුරජාණන් වහන්සේ එක්තරා භික්ෂුණියක් ඍද්ධිමත් භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත්කර වදාරනු දුටුවා ය. ඒ දැක '' මම ද මතු යම් දිනෙක මෙම තනතුර ලබන්නෙම් නම් ඉතා යෙහෙකැ'' යි, සිතා සත් දිනක් ම බුද්ධ ප්‍රමුඛ මහ සඟනට මහදන් පැවැත්වූවා ය.

තවත් බොහෝ පින්දහම් සිදු කළ ඇය එතැන් පටන් සසර පුරා උසස් දිව්‍ය සම්පත් මනුෂ්‍ය සම්පත් විඳිමින් අවුත් කාශ්‍යප බුදුරදුන් සමයෙහි බරණැස් නුවර කිකී නම් කාසි රජුගේ දියණියකව උපත ලබා සමණගුත්තා නමින් ප්‍රකට වූවා ය. ඇයට සොහොයුරියෝ සදෙනෙක් වූ අතර එයින් නැගණියක සමග ගිහිගෙයි සිට ම බඹසර වසමින් භික්ෂූන් වහන්සේලාට පිරිවෙණක් ඉදිකොට දුන්නා ය. එවැනි බොහෝ කුසල් කොට මියගොස් දිව්‍ය ලෝකයෙහි ඉපිද මහත් දිව්‍ය ශ්‍රී සම්පත් විඳිමින් සිට නැවතත් මනුෂ්‍ය ලෝකයෙහි ම එක්තරා දුගී පවුලක උපත ලැබුවා ය.

එම භවයේ දී පසේ බුදුරජාණන් වහන්සේ නමකට දන් දී නැවතත් දෙව්ලොව උපත ලැබුවා ය. එලෙස දිව්‍ය සම්පත් විඳි ඇය නැවත මිනිස් ලොව පියුම් විලක මහ පියුම් ගැබක උපන්නා ය. එම විල අසල සිටි තාපසතුමෙක් ඇය දැක රැගෙන ගොස් හදා වඩා පෝෂණය කළේ ය. ක්‍රමයෙන් හැදී වැඩුණු ඇය පිළිබඳ තතු දැනගත් බරණැස් රජු ස්වකීය රජ මාලිගාවට ඇයව කැඳවා රජු ගේ අග මෙහෙසිය බවට පත්කොට ගත්තේ ය. එම භවය ද ගෙවා දැමූ ඇය නැවතත් රජගහ නුවර දිළිඳු කුල ගෙයක උපත ලැබුවා ය. ක්‍රමයෙන් නිසි

වයසට පත් ඇය අන්‍ය කුලයක කෙනෙකු සමග විවාහප්‍රාප්ත වූවා ය. සිය සැමියා ද සමග එක්ව පසේ බුදුවරුන්ට දන් දුන් ඇය නිලුපුල් අට මිටක් ගෙනවුත් පසේ බුදුවරුන්ගේ පාමුල්හි තබා ''මා උපනුපන් සෑම භවයක ම මාගේ ශරීරය ද මෙම නිලුපුල් මල් හා සමාන පැහැයෙන් යුක්ත වේවා'' යි, ප්‍රාර්ථනාවක් කළා ය. මෙසේ එම ජන්මයෙහි අපමණ පින් රැස්කළ ඇය අප ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ කාලයෙහි උපත ලැබුවේ සැවැත් නුවර එක්තරා සිටු කුලයක ය. පූර්ව ප්‍රාර්ථනා අනුව නිලුපුල් මල් හා සමාන පැහැයෙන් යුක්ත වූ නිසා ඇය ''උප්පලවණ්ණා'' යැයි නම් ලැබුවා ය.

දඹදිව බොහෝ රජවරු ද සිටුවරු ද මෙම උප්පලවණ්ණා කුමරිය පිළිබඳ තොරතුරු අසා ඇය නිසි වියට පැමිණි කල්හි ''නුඹ ගේ දියණිය අපට පාවා දෙව'' යි, කියා ඇය ගේ පියාණන් හට හසුන්පත් එවූ හ. එයින් සිටුවරයා මහත් අපහසුවකට පත්විය. ''මට මේ සැම ගේ සිත් දිනාගැනීමට නොහැකි ය. මින් කාට හෝ මැය දුන්නෙම් නම් සෙස්සෝ මා හා අමනාප වෙති. මීට එයට සුදුසු උපායක් යොදමි.'' යි  සිතූ සිටුතුමා දියණිය කැඳවා ''දරුව, පැවිදිවීමට කැමතිද''යි විමසී ය. මෙය ඇගේ පශ්චිම ආත්මභාවය වූ හෙයින් එය අසා ඉමහත් සතුටට පත් ඇය සතුටුව ''පියාණෙනි, මම පැවිදි වෙමි'' යි, එකහෙලා ම කීවා ය. සිටුතුමා ද එයින් මහත් සොම්නසට පැමිණ මහ පෙරහරින් ඇයව භික්ෂුණී අරමට කැඳවාගෙන ගොස් පැවිදි කර වී ය.

අලුතින් පැවිදි වූ උප්පලවණ්ණා තෙරණියට සෙසු භික්ෂුණීහු එක්ව පොහෝ ගෙයි වත් සැපයීම භාර කළ හ. නිතිපතා පොහෝ ගෙය ඇමද පහන් දල්වන උප්පලවණ්ණා තෙරණිය එම පහන් දැල්ල ම නිමිති වශයෙන් ගෙන තේජෝ කසිණය අරමුණු කොට ධ්‍යාන උපදවා එම ධ්‍යානය ම පාදක කොටගෙන රහත් භාවයට පත් වූවා ය. අනතුරුව එතුමිය ඛේමා තෙරණිය ළඟට බුදුරදුන්ගේ වමත් අග්‍රශ්‍රාවිකාව බවට පත්වූවා ය.

උපුල්වන් තෙරණිය ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමෙහි අතිදක්ෂ වූවා ය. පසු කලෙක බුදුරජාණන් වහන්සේ ගණ්ඩබ්බ රුක් මුල් හි සිට යමක ප්‍රාතිහාර්යය දක්වන දිනයෙහි ම ඕ තොමෝ අසුන් සතර දෙනෙකු යෙදූ රථයක් ඍද්ධි බලයෙන් මවාගෙන බුදුරදුන් වෙත පැමිණ උන්වන්සේගේ දෙපා වැඳ ''ස්වාමීනි, ඔබ වහන්සේ අනුමැතිය දෙනසේක් නම් තීර්ථකයන්ගේ මානය මර්දනය කිරීමට පෙළහර පාන්නෙමියි කියා පසෙක සිටියා ය. එහෙත් එදා තීර්ථක මර්දනය පිණිස බුදුරජාණන් වහන්සේ ම යමාමහ පෙළහර පෑ සේක. බුදුරජාණන් වහන්සේ එම කරුණ ම නිමිති කොට ගෙන ඕ තොමෝ මහත් ඍද්ධි ඇත්තා වූ භික්ෂුණීන් අතර අග්‍ර වන්නී යැයි, වදාරා

**''එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුණීනං ඉද්ධිමන්තීනං යදිදං උප්පලවණ්ණා''**
යැයි උප්පලවණ්ණා තෙරණිය අග්‍ර ස්ථානයෙහි තැබූ සේක.

සංයුත්ත නිකායේ උප්පලවණ්ණා සූත්‍රයේ සඳහන් පරිදි දිනක් මෙතුමිය දිවාවිහරණය සඳහා අන්ධ වනයට පිවිස එහි සල් ගසක් මුල වැඩ සිටියා ය. එකල්හි මාර දිව්‍ය පුත්‍රයා පැමිණ එතුමිය බිය ගන්වනු පිණිස මෙසේ කීවේ ය.

''ලස්සනට පිපුණු මල් ඇති සල් ගසක් මුල අසමසම රූ ඇති ඔබ හුදෙකලාව සිටින්නෙහි ය. ඔබට සල්ලාල ධූර්තයන් කෙරෙන් බියක් නැද්ද?''

එයට පිළිතුරු දුන් උප්පලවණ්ණා මහ තෙරණිය,

''සල්ලාලයන් ලක්ෂයක් පැමිණියත් මම මෙසේ ම ය. ලෝමයක් හෝ නොසොල්වමි, නොසැලෙමි, මාරය ඔබ තනිව මට කුමක් කරන්න ද?''

මම අතුරුදහන් වෙමි. ඔබේ කුසට හෝ පිවිසෙමි. බැම අතර හෝ සිටිමි. එසේ සිටියත් ඔබ මා නොදක්නෙහි ය.

මම මගේ සිත වසඟ කරගත්තෙමි. හොඳින් ඍද්ධිපාද වැඩුවෙක් මි, සියලු බැම්වලින් මිදුණු කෙනෙක්මි යි, මාරය මම ඔබට බිය නොවෙමියි එඩිතරව පැවසුවා ය.

උප්පලවණ්ණා තෙරණිය සසර පුරුද්දෙන් ම කාමයන්ගේ ආදීන ව දන කළකිරී පැවිදි වූ කෙනෙකි. රහත්වී පෙරවිසූ කඳ පිළිවෙළ දැනගත් එතුමිය කාමයන් කොතරම් පිළිකුල් සහගත දැයි තමන්ට ම පෙර භවයක විඳින්නට වූ අත්දැකීමකින් පැහැදිලි කර ඇත්තේ මෙසේ ය.

**උභො මාතා ච ධීතා ච මයං ආසුං සපත්තියො**
**තස්සා මෙ අහු සංවෙගො අබ්භුතො ලොමහංසනො**

**ධීරත්‍ථු කාමා අසුචී දුග්ගන්ධා බහු කණ්ඨකා**
**යත්‍ථ මාතා ච ධීතා ච සභරියා මයං අහු**

මවත් දුවත් යන අපි දෙදෙන ම එක් පුරුෂයෙකු ට සපත්නී වූයෙමු. එය මට ලොමුදහගන්වන මහා සංවේගයක් විය.

කාමයන්ට නින්දා වේවා. ඒවා එතරම් අපවිත්‍ර ය, දුගඳ ය, බොහෝ කෙලෙස් කටු සහිත ය. මවත් දුවත් යන අප සපත්නී වීමම ඊට නිදසුන් ය.

පෙර සැවත් නුවර වෙළෙන්දෙකුගේ බිරියක කුස පිළිසිඳගත් දරුගැබ ගැන වෙළෙන්දා දුර බැහැර ගිය කලක සැකසිතූ නැන්දණිය ඇය ගෙදරින් පළවා හැරියා ය. තැන තැන ඇවිදමින් ගිය ඇය අම්බලමක දී දරුවා බිහිකළා ය. ඇය එළියට ගිය මොහොතක වෙනත් කෙනෙක් දරුවා රැගෙන ගොස් හදාවඩා ගත්තේ ය. පසු කලෙක ඒ අසරණ මව ද වෙනත් කෙනෙකුගේ බිරිය බවට පත්වී දියණියක වැදුවා ය. නැවතත් එම නිවසින් ද පලවා හරින ලද ඇය දියණිය ද අහිමි ව අසරණ ව ඇවිදිමින් සිටියා ය. මේ අතර හැඩිදැඩි තරුණයකු වූ ඇගේ පළමු පුතු තවමත් යොවුන් පෙනුමෙන් සිටි ඇය මව බව නොදන ආවාහ කර ගත්තේ ය. ඇය ද ඒ බව නොදත්තා ය. ඒ සමග ඇගේ දියණිය ද ඔහුට හමු විය. තම සොයුරිය බව නොදත් ඔහු ඇය ද ආවාහ කර ගත්තේ ය. මවට ද දියණිය හඳුනාගත

නොහැකි විය. මෙසේ අන්තිමේදී තිදෙනා ම නොදන පුතා ළඟ මවත් සොහොයුරියත් සමාන භාර්යාවන් බවට පත් වූහ. පෙර භවය දුටු උප්පලවණ්ණා තෙරණිය සසල කළේ මේ බිහිසුණු අත්දැකීමයි. කාමය අසූචි වැනියැයි එතුමිය පවසන්නේ එහෙයිනි.

මේ තෙරණියන්ගේ කතාපුවත්වලින් අපට ඉගෙනගත හැකි පාඩම් රැසකි. විශේෂයෙන් ඛේමා බිසවගේ පුවතින් බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාසය පිළිබිඹු වේ. එහිදී උන්වහන්සේ ඛේමාවන්ට ධර්මාවබෝධය ලබාදෙන්නේ දෘශ්‍ය රූප ආධාරයෙනි. එය ප්‍රබල අධ්‍යාපන උපක්‍රමයකි.

එසේම මෙම සිද්ධියේ දී වේළුවන උයන ඉතා වැදගත්වේ. ආරාමයක් නම් **(ආගන්ත්වා රමති එත්ථාති ආරාමො)** කෙනෙකු ඇවිත් බලා සතුටු වන තැන ආරාමයයි. (පුෂපාරාම ඵලාරාම) එනම් උයන් ය. පන්සලක් උයනක් විය යුතු ය. මුලදී පන්සල් උයන් කිරීම කල්ගත වන බැවින් උයන් පන්සල් ලෙස ගන්නා ලදි. වේළුවනය, ජේතවනය, මහමෙව්නා උයන ඊට නිදසුන් ය. අපේ පන්සල නිතර ම ආරමයක් හෙවත් උයනක් ලෙස තබාගත යුතු ය. එවිට ජනය එය දැක පැහැදෙති. ශ්‍රද්ධාව උපදවා ගනිති. **(සද්ධා ජාතො උපසංකමති)** සැදැහැ ඇති වී පන්සලට එති. **(උපසංකමනෙතා පයිරුපාසති)** පැමිණ සංඝයා ඇසුරු කරති. **(සොතං ඔදහති)** කන් යොමති. **(ධම්මං සුණාති)** බණ අසති. මෙසේ ආරාමයක් උයනක් සේ පවිත්‍රව සුන්දරව තබා ගැනිම ජනයා බුදු සසුනට ඇදගැනීමේ උපාමයක් ලෙස එදා සිට යොදා ගෙන තිබේ. ඛේමා බිසවගේ පුවත ඊට අපූරු නිදසුනකි.

**අභ්‍යාස**

01. අග්‍රශ්‍රාවිකාවන් වහන්සේලාගේ විශේෂ පුණ්‍ය මහිමය පිළිබඳ වෙන් වෙන් වශයෙන් කරුණු ගොනු කරන්න.
02. අග්‍රශ්‍රාවිකාවන් වහන්සේලාගේ ජීවන චරිතයන්ගෙන් ගත හැකි ආදර්ශයන මැයෙන් ජගත් කාන්තාදිනයට යොදාගත හැකි පත්‍රිකාවක් සකස් කරන්න.

06
පාඩම

# බුදු සසුන්මග යති පහන්

## වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමි

අපිස් සතොස් යනාදී ගුණාංගවලින් පිරිපුන් සීල ගුණයෙන් සුගන්ධවත් වූ කාරුණික ගුණයෙන් මෘදු වූ සිත් ඇති මහා භාග්‍යසම්පන්න වැලිවිට අසරණ සරණ සරණංකර සංඝ රාජෝත්තමයාණන් වහන්සේගේ අකලංක චරිතාපදානය ගිහි පැවිදි සැමගේ ආදර්ශය පිණිස හේතු වන්නේ ම ය. උන් වහන්සේ 17 වැනි සියවසේ අග භාගයේ ශ්‍රී ලංකාද්වීපයෙහි සංජාත බෝධිසත්ත්වවරයෙකු සේ පිළිගත හැකි ය. ලංකා ඉතිහාසයේ දුර්දශාපන්න අඳුරු කාල පරිච්ඡේදයක ජන්මලාභය ලැබ පිරිහී ගිය ශාසනික තත්ත්වය, භික්ෂු අධ්‍යාපනය හා ධර්ම ශාස්ත්‍රීය කටයුතු සමග භාෂා සාහිත්‍ය ව්‍යාපාරයන් යථා තත්ත්වයට පත් කළ සංඝරාජ මාහිමියෝ ලක්දිව සුවඳවත් කළ අසහාය යුග පුරුෂයාණ කෙනෙක් වූ හ.

18 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ශාසනික, ජාතික, සාමාජික, සංස්කෘතික හා අධ්‍යාපනික තත්ත්වය අන්ත පරිහානිකර තත්ත්වයකට පත්ව තිබුණේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසි - ලන්දේසි ආධිපත්‍යයට නතුවීම, නිරන්තර යුද කෝලාහල හා ඒ නිසා ම වූ ආර්ථික පරිහානිය, මිෂනාරි ව්‍යාපාර නිසා බෞද්ධයන් අන්‍ය ආගම් වැළඳ ගැනීම යනාදී කරුණු නිසා ය. මේ නිසා ම භික්ෂු සමාජය ද අන්ත පරිහාණිකර තත්ත්වයකට පත්ව තිබුණි. ශාසනික විනය කර්මයකට උපසම්පදා භික්ෂූන් වහන්සේලා සිව්නමක් වත් සොයාගත නොහැකි තත්ත්වයකට භික්ෂු සමාජය පිරිහී පැවතුණි. සංඝරාජ සාධු චරියාව හා සඟරජවත යන ග්‍රන්ථවලින් පෙනෙන පරිදි එකල විහාර සන්තක ඉඩකඩම් පරිහරණය කරමින් සිටියෝ ගණින්නාන්සේලා නම් වූ හ. ඔවුහු ශ්‍රමණ සාරුප්‍ය පැවතුම්වලින් බැහැරව දිවි ගෙවූ හ. බාලාවතාරය නම් වූ සරල පාලි ව්‍යාකරණ ග්‍රන්ථය ඉගෙනීමට සරණංකර සාමණේරයන් වහන්සේට දෙදෙනෙකු වෙත යාමට සිදුවීමත්, රාජ සභාවට පැමිණි බ්‍රාහ්මණයෙකු කී සරල සංස්කෘත ශ්ලෝකයක් තේරුම් කරදීමට සමත් සරණංකර හිමි හැර අන් කිසිවෙකු කන්ද උඩරට නොමැතිවීමත් තුළින් භාෂා සාහිත්‍ය හා අධ්‍යාපනයෙහි පැවැති පරිහාණිකර තත්ත්වය ප්‍රකට වෙයි.

මෙවන් පරිසරයක මධ්‍යම පළාතේ බටහිරින් පිහිටි තුම්පනේ කඳුවලින් වට වූ බලකොටුවක් වැනි සරුසාර කෙත්වතුවලින් පිරිපුන් වැලිවිට ග්‍රාමයේ දී වර්ෂ 1698 ජුනි මස 19 වැනිදා සරණංකර මාහිමියෝ උපත ලද හ. පියා කුලතුංග නම් වූ අතර මේ කුමරු ද කුලතුංග නම් විය. සිය සොහොයුරා වූ කුලතුංග පටබැඳි මුදියන්සේ සමග රජ මාළිගාවෙහි සිටි බැවින් කුලතුංග ළදරුවා ද රජුගේ පුත් තනතුරෙහි හැදුණු වැඩුණු බව සංඝරාජ සාධු චරියාවෙහි සඳහන් වෙයි. සිය පුතණුවන් රාජ පුරුෂයෙකු වනු දැකීම දෙමව්පියන්ගේ අභිප්‍රාය වූ අතර කුලතුංග දරුවාගේ අභිලාෂය වූයේ ගිහි ජීවිතයෙන් වෙන්ව පැවිදිවීම යි. කුඩා කල සිට ම නිති පන්සිල් පොහොය අටසිල් රකිමින් ඉතා ධාර්මික ජීවිතයකට

හුරුපුරුදු වූ කුලතුංග කුල කුමරු සොළොස් හැවිරිදි වියේ දී සූරියගොඩ විහාරයේ දී සූරියගොඩ සාමණේරයන් වෙතින් සරණංකර නමින් උතුම් වූ ප්‍රව්‍රජ්‍යාභූමියට පත් විය.

| | |
|---|---|
| **මෙබඳු සිත්** | **ඉපදී** |
| **ලජ්ජා සඟුන්** | **නොලදී** |
| **සොළොස** | **වයසේ දී** |
| **පහන් මනසින් වෙලා** | **පැවිදී** |

සැහැල්ලු ගති පැවතුම් නිසාත්, පිණ්ඩපාත චර්යාව නිසාත් ''පිණ්ඩපාතික වැලිවිට සරණංකර'' යන නමින් උන්වහන්සේ වඩාත් ප්‍රකට වූහ. භික්ෂූන් වහන්සේලා පිළිවෙත් පිරීමෙහි උදාසීනව සිටි මෙකල භික්ෂු පිළිවෙත් මැනවින් සුරකිමින් උන්වහන්සේ පිණ්ඩපාතයෙන් ජීවත්වෙමින් පාත්‍රයේ වැළඳූහ.

මෙසේ සරණංකර සාමණේරයන් වහන්සේ මනා භික්ෂු ප්‍රතිපත්ති ඔස්සේ ගුණ නුවණින් වැඩෙත් ම මෙකල භික්ෂු ප්‍රතිරූපකයින් විනා සැබෑ සිල්වත් භික්ෂූන් වහන්සේලා නොමැති බව උන්වහන්සේට පෙනී ගියේ ය. මෙම තත්ත්වයෙන් සම්බුද්ධ ශාසනයත්, රටත් මුදවාගෙන යළි ශාසනික ප්‍රබෝධයක් ඇතිකරලීමේ පරම පවිත්‍ර අපේක්ෂාවෙන් යුක්තව ඒ හා අදාළව ගතයුතු ක්‍රියාමාර්ග වෙත අප්‍රතිහත ධෛර්යයෙන් යුක්තව යොමු විය. උන් වහන්සේට ප්‍රථමයෙන් ම අවශ්‍ය වූයේ ධර්මය ඉතා නිවැරදිව තේරුම් ගැනීමට යි. ඒ සඳහා පාලි භාෂාව ඉගෙනීම අවශ්‍ය වූ හෙයින් එය සපුරා ගැනීමට ආචාර්යවරුන් දෙදෙනෙකු වෙත යාමට සිදුවිය. එවකට මාකෙහෙල්වල බන්ධනාගාර ගතව සිටි ලෙව්කේ දිසාව වෙතින් බාලාවතාරයේ නාම කාණ්ඩය තෙක් උගත්හ. ඉතිරි කොටස උගත්තේ පල්කුඹුරේ අත්ථදස්සි හිමියන් වෙතිනි. පාලි ව්‍යාකරණය පිළිබඳ ලබාගත් මෙම මූලික දැනුම පාදක කර ගනිමින් එය තවදුරටත් දියුණු කරගෙන ස්වෝත්සාහයෙන් ම ධර්ම විනය හා භාෂා ශාස්ත්‍රය මැනවින් උගත්හ. සරණංකර හෙරණපාණන් වහන්සේගේ ඊළඟ අභිප්‍රාය වූයේ තමා උගත් ධර්මවිනය උපයෝගී කර ගනිමින් භික්ෂුව නිවැරදි ප්‍රතිපත්ති මාර්ගයට යොමු කිරීම යි. ඒ සඳහා භික්ෂූන් වහන්සේ දැනුවත් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස විශාල පිරිසක් උන් වහන්සේ වටා එක්රැස් වූ හ. බොහෝ කුල දරුවෝ ගිහිගෙය හැරපියා උන් වහන්සේ වෙත අවුත් පැවිදිබව ලබා වත් පිළිවෙත් පුරන්නට වූහ. මෙසේ වැලිවිට හෙරණපාණන් වහන්සේ ඇසුරෙහි සිල් රකින වත් පිළිවෙත් පුරන පිරිස සිල්වත් සමාගම, සිල්වත් තැන් යන නමින් හැඳින් විණ. ඒ සිල්වත් පිරිසට නොයෙක් අයුරින් නින්දා අපහාස කළෝ ''වැලිවිට උන්නාන්සේගේ සමාගම'' යන නාමය ද පටබඳිමින් අවඥාවට ලක් කළහ. එසේ සිදු කළේ ප්‍රතිපත්ති අතින් පිරිහී සිටි ගණින්නාන්සේලා, අන්‍ය ආගමිකයන් හා දුර්මතධාරී බෞද්ධයන් ය.

ඒ එක ද බලවේගයක් හමුවේ නොසැලුණු උන් වහන්සේගේ ඊළඟ අරමුණ වූයේ උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගෙන් හිස්ව තිබූ ශ්‍රී ලංකාවේ නැවත වරක් උපසම්පදාව පිහිටුවීම යි. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ හා ශ්‍රී විජය රාජසිංහ යන රජුන්ගේ සහායෙන් බුරුමය හා සියම යන රටවලින් උපසම්පන්න භික්ෂූන් වහන්සේලා වැඩමවා ගැනීමට

උන්වහන්සේ දැරූ පළමු උත්සාහය අසාර්ථක විය. නමුත් සරණංකර සාමණේරයන් වහන්සේ එයින් අධෛර්යමත් නො වූහ. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සහාය ලබාගෙන නැවත ද සය දෙනෙකු ගෙන් සමන්විත දූත පිරිසක් ලන්දේසීන් විසින් සපයා දෙන ලද නැවකින් සියමට යැවූ හ. මෙම දූත චාරිකාවෙහි ප්‍රතිඵලයක් ලෙස උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන මහතෙරුන් වහන්සේලා 18 නමක් ද සාමණේරයන් වහන්සේලා 7 නමක් ද ලක්දිවට වැඩම කළ හ. වර්ෂ 1753 ජුනි 15 වැනි දිනට යෙදුණු ඇසළ පුර පසළොස්වක පොහෝ දින මහනුවර මල්වතු මහාවිහාරයේ විසුංගාම සීමාවේ දී ප්‍රථම උපසම්පදා විනය කර්මය සිදු කෙරිණි. සියම් රට උපාලි මහතෙරුන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පූර්ණ අනුග්‍රාහකත්වයෙන් මෙය සිදු කෙරිණි. මෙහි දී සරණංකර සාමණේරයන් වහන්සේ ඇතුලු හය නමක් උපසම්පදාව ලැබූ හ. මෙය වර්තමාන ශ්‍යාමෝපාලි (සියම් උපාලි) මහානිකායේ සමාරම්භක අවස්ථාව යි.

මෙම උපසම්පදා විනය කර්මයේ දී සරණංකර හෙරණපාණන් වහන්සේට පළමුව උපසම්පදාව ලබා ගැනීමට අවස්ථාව තිබුණ ද තමන් වහන්සේට ගුරුතන්හිලා සැලකීමට කෙනෙකු සිටීමේ වැදගත්කම සලකා වයසින් වැඩිහිටි නමකට පළමුව උපසම්පදාව ලබාදීමට තරම් උන් වහන්සේ නිහතමානී වූහ. මේ වන විට පනස් පස් වෙනි වියේ පසු වූ වැලිවිට සරණංකර මාහිමියෝ සිරිලක උපසම්පදාව නැවත පිහිටුවා ශාසනික තත්ත්වය යළි පුනර්ජීවනය කිරීමෙහිලා වූ මහනීය මෙහෙවර මැනවින් ඉටු කළ හ.

උපසම්පදාවට පත් සරණංකර මා හිමියන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ලක්දිව සංඝරාජ ධුරයට පත් කරන ලදී. සංඝරාජ පදවියෙන් පූජිත වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජ මාහිමියෝ,

**''උඩගු නොව මහණ, උඩගු නොව මහණ, උඩගු නොව මහණ,''**

යනුවෙන් තෙවරක් තල්පතක සටහන් කොට තැබූ හ. මෙවැනි ශ්‍රේෂ්ඨ පදවියකින් පවා මානය, අහංකාරය වැනි පහත් සිතුවිලි මාත්‍රයක් වත් ඉපදීම උන්වහන්සේ නොරිස්සූ බව මේ සිද්ධියෙන් මනාව පැහැදිලි ය.

අනුන්ගේ උපකාරයෙන් ඉතා ස්වල්ප දෙයක් ඉගෙන ස්වෝත්සාහයෙන් එම දැනුම වර්ධනය කරගත් වැලිවිට සංඝරාජ මාහිමියෝ ශ්‍රී ලංකාවේ පහළ වූ අග්‍රගණ්‍ය මහා පඬිරුවනක් බව විද්වත් ගිහි පැවිදි සකල සාධු ජනයා එක ලෙස පිළිගනිති. ස්වකීය යෞවන වියේ දී ඉතා දුක්ඛදායක පරිසරයක සිට මහත් ආයාසයෙන් ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය කළ උන් වහන්සේ එකී අධ්‍යාපන රටාවෙහි වටිනාකම අත්දැකීමෙන් ම දත් හෙයින් පරිහානි තත්ත්වයකට පත්ව තිබූ ධර්ම ශාස්ත්‍රීය හා සාහිත්‍ය කටයුතු නගා සිටුවීමට නොපැකිලිව ක්‍රියා කළ හ. ක්‍රියා මාර්ග කිහිපයක් ඔස්සේ එම සේවාවන් ව්‍යාප්ත කළ හ.

ඒවා නම්,

1. ග්‍රන්ථකරණයෙහි නියැලීම
2. විද්‍යාපීඨ / ශාස්ත්‍රශාලා ආරම්භ කිරීම
3. විද්වත් ගිහි පැවිදි ශිෂ්‍ය පරපුරක් බිහි කිරීම
4. පැරැණි පොත්පත් ලියන්නන් ලවා පිටපත් කරවීම

සඟරජ මාහිමියන්ගේ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ

1. මුනිගුණාලංකාරය
2. අභිසම්බෝධි අලංකාරය
3. සාරාර්ථ සංග්‍රහය
4. රත්න සූත්‍රය ප්‍රණාම ගාථා සන්නය
5. භේසජ්ජ මඤ්ජුසා සන්නය
6. සතර බණවර සන්නය
7. මහාබෝධි සන්නය
8. රූප මාලාව

සඟරජ මාහිමියන්ගේ පුරෝගාමිත්වයෙන් ඇරැඹි විද්‍යාපීඨ

1. නියමකන්දේ විද්‍යාස්ථානය
2. මල්වතු  අස්ගිරි උභය විහාරස්ථ විද්‍යාස්ථාන
3. ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරස්ථ විද්‍යාස්ථානය
4. පැල්මඩුල්ල රජමහා විහාරය හා පොත්ගුල් විහාර විද්‍යාස්ථානය

සඟරජ මාහිමිගේ ගිහි පැවිදි ශිෂ්‍ය පරපුර

1. තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්‍ෂිත මාහිමි
2. දරමිටිපොළ ධර්මරක්‍ෂිත මාහිමි
3. ගිනිගත්පිටියේ සංඝරක්‍ෂිත මාහිමි
4. රඹුක්වැල්ලේ ධම්මරක්ඛිත මාහිමි
5. මොරතොට ධම්මක්ඛන්ධ මාහිමි සහ
6. අත්තරගම රාජගුරු බණ්ඩාර
7. බරණ ගණිතාචාර්ය
8. පත්තායමේ ලේකම් යනාදී ගිහි පැවිදි විද්වතුන්ගෙන් සමන්විත විය.

වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය හා සාහිත්‍ය සේවාව මහනුවර යුගයට පමණක් සීමා නොවූ අතර එහි ආලෝකය විද්‍යෝදය විද්‍යාලංකාරාදි ආයතන මගින් නූතන යුගය දක්වාම විහිදී ආ අතර එය අනාගතය පුරාවටත් පැතිර යන්නේ ය.

## අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි

බුද්ධභාෂිත ධර්ම විනයෙහි හා ශ්‍රාවක භාෂිතයන් හි ද ඇතුළත් දුරවබෝධ වචන හා සංකල්ප පැහැදිලි කිරීම සඳහා සම්පාදිත අර්ථ ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය පාලි අට්ඨකථා නමින් හැඳින්වේ. ත්‍රිපිටක ග්‍රන්ථවල අන්තර්ගත ධර්ම කරුණු සහ ඓතිහාසික කරුණු සවිස්තරව දැක්වීම එම පාලි අට්ඨකථාවලින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යය යි. පාලිඅට්ඨ කථාවන් ගැන සඳහන් කිරීමේ දී නිතැතින් කියවෙන්නේ අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමියන් ගේ ශ්‍රී නාමය යි. බුද්ධකාලීන අර්ථ ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය  ප්‍රථම ධර්ම සංගායනාවේ දී සහ ඉන් පසුවත් රහතන් වහන්සේලා විසින් සංගායනා කරන ලදි. උන් වහන්සේලා සහ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව ඒවා මුඛ පාඨ වශයෙන් ආරක්ෂා කරගෙන ආහ. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ විසින් ඒවා හෙළ බසින් තබන ලදි. හෙළ බසින් පැවැති එම අටුවාවන් යළි පෙළ බසට පෙරළීමේ භාරදූර කාර්යය ඉටු කළේ අප මේ කතා කරන අටුවාචාර්ය බුද්ධඝෝෂ මා හිමියෝ ය.

බුද්ධඝෝෂ හිමියන් උපත ලැබුවේ දඹදිව බෝ මැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක ය. ඔහු වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහතෙරුන් වහන්සේගේ ශිෂ්‍යයෙකු ලෙස පැවිදි වූ බව ප්‍රචලිත මතය යි. සද්ධම්මසංගහ නම් ග්‍රන්ථයෙහි දැක්වෙන පරිදි බුද්ධඝෝෂ හිමි මහාබෝධි මණ්ඩපයට දකුණු දිග බමුණුගම උපන් කෙනෙකි. බෝ මැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති කථාවේ සඳහන් ය.

පාලි භාෂාව ද දර්ශනය ඉතිහාසය පුරාවිද්‍යාව ද කාය ව්‍යවච්ඡේද විද්‍යාව, ලක්ෂණ ශාස්ත්‍ර ආදී විෂයයන් පිළිබඳ පෘථුල දැනුමින් යුක්ත වුවාක් මෙන් ම වෛදික ඉගැන්වීම් පිළිබඳව ද පැතිරීගිය බුද්ධි ප්‍රභාවයක් බුද්ධඝෝෂ හිමියන් සතුව පැවතිණ. ඒ බව පහත සඳහන් මහාවංස ගාථාවන් ගෙන් ද පැහැදිලි වෙයි.

**බොධිමණ්ඩ සමීපම්හි  ජාතො බ්‍රාහමණ මාණවො**
**විජ්ජාසිප්ප කලාවෙදී  තීසු වෙදෙසු පාරගො**
**සම්මා විඤ්ඤාතසමයො  සබ්බවාද විසාරදො**
**වාදත්ථී ජම්බු දීපම්හි   ආහිණ්ඩනෙතා පවාදිකො**

බුද්ධඝෝෂ හිමි ලක්දිවට වැඩමවීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත්, අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවත්, පිරිත් අටුවාව ලිවීම ආරම්භ කර තිබූ බවත් සඳහන් ය. උන්වහන්සේ කලින් සර්වාස්තිවාදියෙකුව සිට පසුව ථෙරවාදී වූ බව ඇතැම් විචාරකයන් ගේ පිළිගැනීම යි. බුද්ධඝෝෂ මා හිමියන් ලක්දිවට වැඩම වූයේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවස ය. ඒ බුද්ධ වර්ෂ 953 ත් 975 ත් අතර කාලය යි. උන් වහන්සේ ලක්දිවට වැඩමවන විට අට්ඨකථා සංහිතා කිහිපයක් ම මෙරට පැවති බවත් ඒවා හෙළ බසින් ම උගත් බවත් කියවේ.

මිහිඳු මහරහතන් වහන්සේ දවස ම හෙළ බසින් තබන ලද අටුවා කතා වසර 700 ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතුණේ ය. ත්‍රිපිටක

පාලිය තිබුණත් එහි අටුවා මේ වනවිට දඹදිව තිබී නැත. සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ට ද දැනගැන්මට ලැබී ඇත. සිංහල අටුවා පාලියට පරිවර්තනය කිරීම බුදු දහම චිරස්ථායීවීමට හේතුවක් යැයි සැලකූ උන්වහන්සේ හෙළටුවා පාලියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවූ බව මහාවංශයේ සඳහන් වේ.

**පාලි මත්තං ඉධානීතං  නත්ථි අට්ඨකථා ඉධ**
**තථාචරියවාදා ච  භින්නරූපා න විජ්ජරෙ**
**සීහළට්ඨකථා සුද්ධා  මහින්දෙන මතීමතා**
**සංගීතිත්තය මාරූළ්හං  සම්මා සම්බුද්ධ දෙසිතං**
**සාරිපුත්තාදිගීතඤ්ච  තථා මග්ගං සමෙක්ඛිය**
**එකා සීහළභාසාය  සීහළෙසු පවත්තති**
**තං තත්ථ ගන්ත්වා සුත්වා  තං මාගධානං නිරුත්තියා**
**පරිවත්තෙහි සා හොති  සබ්බලොක හිතාවහා**

ත්‍රිපිටක පෙළ පමණක් මෙහි ගෙනෙන ලදි. අටුවාවත් විවිධ ආචාර්යවාදත් නැත. සම්මා සම්බුදුන් විසින් දෙසන ලද සාරිපුත්‍රාදීන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද, එසේම සංගීතිත්‍රයට නගන ලද, මිහිඳු තෙරුන් විසින් සිංහලයෙන් තබන ලද පිරිසිදු අට්ඨ කථා හෙළ බසින් සිංහල රටේ පමණක් පවතී. එහි ගොස් එය අසාගෙන මගධ බසට පෙරලන්න. එය සියලු ලෝවැසියනට හිතසුව ගෙන දෙන්නේ යැයි රේවත තෙරණුවෝ බුදුගොස් හිමියන්ට පවසා තිබේ.

මෙවැනි කටයුත්තක් සඳහා ඉදිරිපත් වූ එක ම ආචාර්යවරයා බුද්ධඝෝෂ හිමියන් යැයි කිව නො හැකි ය. උන් වහන්සේට කලින් බුද්ධදත්ත හිමි ද පසුව ධම්මපාල හිමි ද මෙම කාර්යය සඳහා ම දකුණු ඉන්දියාවේ සිට ලක්දිවට වැඩම කළ හ. බුද්ධදත්ත හිමියෝ තමා මහලුවියට පත්වෙමින් සිටි නිසා අපේක්ෂිත කාර්යය ඉටු කළ නොහැකිව පෙරළා ඉන්දියාටම වැඩම කළහ. බුද්ධදත්ත හිමියන් එසේ වැඩමවන ගමනේ දී බුද්ධඝෝෂ හිමියන් මුහුදේ දී මුණගැසී තමාගේ පන්හිඳත්, අරළු ගෙඩියකුත් දී ආශිර්වාද කළ බව ද කියැවේ.

ශ්‍රී ලංකාවට වැඩම කළ බුද්ධඝෝෂ හිමියෝ අනුරාධපුර මහා විහාරයේ දී එවකට එහි ප්‍රධානත්වය දැරූ සංඝපාල හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා බැහැදැක පැමිණි කාරණාව උන් වහන්සේලාට සැළකර සිටියහ. සිංහල අටුවා පාලියට පරිවර්තනය කිරීමට පළමුව එවකට පැවැති සිංහල භාෂාවත්, එම අටුවාවල අන්තර්ගතයත් හැදෑරීමට අවශ්‍ය විය. සංඝපාල හිමියන් හා බුද්ධමිත්ත හිමියන් වැනි ප්‍රවීණ ආචාර්යවරුන්ගේ උපදෙස් පරිදි බුද්ධඝෝෂ හිමියෝ ස්වකීය අධ්‍යයන කටයුතු සපුරා ගත්හ. සිංහල අටුවා පාලියට පෙරලීමට පෙර නිවන් මග හෙළි කරන ග්‍රන්ථයක් ලිවීමට සංඝපාල හිමියෝ බුද්ධඝෝෂ හිමියන්ට ඇරයුම් කළහ. විසුද්ධි මාර්ගය ලියැවුණේ එහි ප්‍රතිඵලයක් ලෙස යි. සංයුත්ත නිකායේ දේවතා සංයුත්තයේ එන,

**අනෙතා ජටා බහි ජටා ජටාය ජටිතා පජා**
**තං තං ගොතම පුච්ඡාමි කො ඉමං විජටයෙ ජටං**

ඇතුළත ද අවුල් ය. පිටත ද අවුල් ය. මුළු සත්ත්ව වර්ගයා මෙම අවුලෙන් අවුල් වැ සිටිති. ගෞතම සර්වඥයන් වහන්ස, එබැවින් මම ඔබ ගෙන් විචාරමි. මෙම අවුල කවුරු නිරවුල් කෙරෙත් ද? යන

මෙම ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුර,

**සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො**
**චිත්තං පඤ්ඤං ච භාවයං**
**ආතාපි නිපකො භික්ඛු**
**සො ඉමං විජටයෙ ජටං**

සීලයෙහි පිහිටන දක්ෂ ප්‍රඥාවන්ත භික්ෂුව සිතත්, ප්‍රඥාවත් වඩා කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව මේ අවුල් ඉවත් කරන්නේ ය. යනු ය.

මෙසේ බුදුරදුන් ඉතා සංක්ෂිප්ත ලෙස දුන් මෙම පිළිතුර විස්තෘත ලෙස ඉදිරිපත් කිරීම විසුද්ධි මග්ගයේ දී සිදු වී තිබේ. ථේරවාදී බුද්ධ ධර්මයට අයත් විශිෂ්ටතර නිර්මාණ කෘතියක් ලෙස බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධි මාර්ගය සඳහන් කළ හැක. අතිදුර්ලභ වූ බුදු සස්නෙහි පැවිද්ද ලබා විසුද්ධිය සොයා යන කුල පුත්‍රයන්ට අවසාන විමුක්තිය හෙවත් නිවන කරා පමුණුවන මාර්ගය හඳුන්වාදීම පරමාර්ථ කොටගෙන ලියූ විසුද්ධි මාර්ගය සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාව පිළිබඳ ව මනා වූ පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරයි.

බොහෝ දෙනෙකුගේ කුතුහලයට තුඩු දුන් වාර්තාගත සිද්ධියක් වන්නේ බුද්ධඝෝෂ හිමි විසුද්ධි මාර්ගය ලියා එය මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලාට පිළිගන්වන්නට සූදානම්ව සිටිය දී දෙවියන් විසින් එය අතුරුදහන් කරනු ලැබීම ය. නැවත දෙවන වරට ද ලියා අවසන් කොට තිබිය දී එය ද මුල් පිටපත සේ ම අතුරුදහන්වීමත්, තෙවනවර ලියා පිළිගැන්වීමට සූදානම් වූ විට මුලින් ලියූ පිටපත් දෙක ද හමුවී විසුද්ධි මාර්ගය පිටපත් තුන ම එළිදැක්විණ. මෙම පිටපත් තුන ම අර්ථයෙන් ද, ග්‍රන්ථයෙන් ද, පූර්වාපර වශයෙන් ද, ථේරවාදයෙන් ද, පෙළින් ද, පදයෙන් ද, ව්‍යඤ්ජනයෙන් ද වෙනසක් නො වී ය. බුද්ධඝෝෂ හිමියන්ගේ ගැඹුරු පාණ්ඩිත්‍යය හා විශිෂ්ට ලේඛන කෞශල්‍යය එමගින් මනාව පැහැදිලි වේ. ඒ දුටු භික්ෂූන් වහන්සේලා බෙහෙවින් තුටු පහටුව ''නිසැකයෙන් ම මේ තෙම මෛතේ බෝසත්හු ය'' යි, නැවත නැවත කියා ඝෝෂා කොට අටුවා සහිත පිටකත්‍රය ඇතුළත් පොත් ප්‍රදානය කළ හ. පසු ව උන් වහන්සේ මහාවිහාරබද දූරසංකර ග්‍රන්ථාකර පිරිවෙණ වෙසෙමින් බොහෝ සිංහල අටුවා ඒ සියල්ලන් ගේ ම මූල භාෂාව වූ මාගධී භාෂාවට පෙරළූ හ. සියලු ථේරවාදී ආචාර්යවරයෝ ම ඒවා පෙළ පොත් තරමට ගුරු තැන්හි තැබූ හ.

බුද්ධඝෝෂ හිමියන් වැඩ සිටි ස්ථාන අතර දූරසංකර පිරිවෙණට අමතරව මහාවිහාරයට දකුණින් වූ පධානඝරය ද වෙයි. එසේම ලෝවාමහාපායේ පහත මාලය ද ග්‍රන්ථකරණයෙහි යෙදීම සඳහා උන් වහන්සේට වෙන්කර දී තිබුණි. මහාවිහාරයේ ග්‍රන්ථාකරය හෙවත් පුස්තකාලය ද උන් වහන්සේට පරිහරණය කිරීමට ඉඩකඩ සලස්වා තිබුණි. මේවායෙහි වැඩ සිටිමින් විසුද්ධි මාර්ගය සේ ම,

| | |
|---|---|
| **සමන්ත පාසාදිකා** | **විනය අටුවාව** |
| **සුමංගල විලාසිනී** | **දීඝනිකායේ අටුවාව** |
| **පපඤ්චසූදනී** | **මජ්ඣිමනිකාය අටුවාව** |
| **සාරත්ථප්පකාසිනී** | **සංයුත්තනිකාය අටුවාව** |
| **මනෝරථපූරණී** | **අංගුත්තරනිකාය අටුවාව** |
| **කංඛාවිතරණී** | **ප්‍රාතිමෝක්ෂ අටුවාව** |
| **පරමත්ථජෝතිකා** | **ඛුද්දකපාඨ අටුවාව,** |

යනාදී අටුවා කෘති ද සංස්කරණය කළ හ. එම ග්‍රන්ථවල විශාලත්වය හා විවිධත්වය ගැන සලකන විට ඒ සඳහා දැරූ පරිශ්‍රමය කෙතෙක් බැරෑරුම් වූවක් ද යන්න වටහාගත හැකි ය.

බුද්ධඝෝෂ හිමියන් විසින් අටුවාකරණයේ දී භාවිත ක්‍රම ශිල්ප කිහිපයක් සමන්තපාසාදිකාවේ සංක්ෂිප්තව දක්වෙයි.

- **මුල් කෘතියේ බස බැහැර කිරීම**
- **හෙළටුවාවල පැවති ප්‍රමාද ලියවීම් බැහැර කිරීම**
- **දිගු විස්තර බැහැරලා සංක්ෂිප්ත කිරීම**
- **තත්කාලීනව පැවති සියලු විනිශ්චයන් ඇතුළත් කිරීම**
- **පාලි භාෂාවේ ව්‍යාකරණ විධි නො ඉක්මවීම**

මේ අනුව බුදුගොස් හිමියෝ පාළි අට්ඨකථා රචනා කළේ හුදෙක් හෙළ අටුවාවන් හි පර්වර්තන ලෙස නො ව සංස්කරණමය භාෂා පරිවර්තන ලෙසිනි. එකී පාලි අටුවාවන් ඊට සාක්ෂි දරයි. බුදුගොස් හිමි භාවිත කළ එකී ක්‍රමවේදය ම උන් වහන්සේ ගෙන් පසුව පාලි අටුවා ලියූ ආචාර්යවරු ද භාවිතයට ගත් හ. පාලි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් ය. බෞද්ධ අට්ඨකථාචාරීන් අතර උන් වහන්සේ ශ්‍රේෂ්ඨතමයා ය. එකී උත්තරීතර චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසා ම ය. උන් වහන්සේ ලොව පහළ වූයේ බුදුරදුන් ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාලි අට්ඨකථා රචනා කිරීමට ය, යන ජනප්‍රවාදයක් ද ඇත. ඒ නිසා ම ලංකාවේ අටුවා ගැන කතා කරන සෑම තැනෙක ම බුද්ධඝෝෂ හිමියන්ට ''අටුවාචාරීන් වහන්සේ'' යන උත්තම අභිධානයක් යොදා ගැනෙයි.

**අභ්‍යාස**

01. ශාසනික පුනර්ජීවනයෙහි ලා සංඝරාජ හිමියන්ගෙන් සිදු වූ සේවාව පිළිබඳ කරුණු රැස් කරන්න.
02. බුද්ධඝෝෂ හිමියන්ගේ අටුවා පිළිබඳ ලේඛනයක් සකස් කරන්න.

**07**
**පාඩම**

# විනය - තල් කරටියේ බිඳ වැටීම

## විනය

බුදුරජාණන් වහන්සේ ඇති කළ ශාසනය බුද්ධ ශාසනයයි. සම්බුදු සසුන ඉදිරියට පවත්වා ගෙන යනු ලබන ජීවමාන වාහකයන් වන්නේ භික්ෂූන් වහන්සේලා ය. එහි පළමු අවස්ථාව සාමණේර නමින් හඳුන්වයි. දෙවැනි අවස්ථාව උපසම්පදා නම්. එය සිදු කරනු ලබන්නේ විනය කර්මයක් මගිනි. ''විසිවයස් පිරිවෙන් පසු සාමණේර භාවයෙන් ඔසවා තැබීම සඳහා සිදු කෙරෙන විනය කර්මය, 'උපසම්පදා විනය කර්මය'යි.'' උපසම්පන්න භික්ෂූන් වහන්සේ, බුද්ධ ශාසනයෙහි ශ්‍රේෂ්ඨතම ලෙසින් සැලකෙන අධිශීලයෙහි පිහිටියෙකි. ප්‍රවුජ්‍යාවෙන් අපේක්ෂිත පරම ඵලය වන විමුක්තියට අධිශීලය අතිශයින් ම ඉවහල් වෙයි. අධිශීලයට කැළැල් වන අවිනය සංඛ්‍යාත දුෂ්ප්‍රතිපත්තීන්හි යෙදීමෙන් විමුක්ති සාධනයට බාධා වෙයි.

භික්ෂු සමාජය පෞද්ගලික වශයෙන් තම තමන්ගේ විමුක්ති සංසිද්ධිය (ස්වාර්ථය) සඳහාත් පොදු වශයෙන් බහුජන ශුභ සිද්ධිය (පරාර්ථය) සඳහාත් සැකසුණු සංස්ථාවකි. එබැවින් උපසම්පන්න භික්ෂුවකගෙන් සිදුවන සුළු වරද වුව ද ස්වාර්ථයට බාධකයක් වනු පමණක් නොව සංස්ථාවේ ගෞරවයට හා පවිත්‍රතාවට කැළලක් වීමෙන් බහුජන ශුභ සිද්ධිය වැළැකීමට හේතුවක් ද වෙයි. මේ නිසා උපසපන් භික්ෂූන් වහන්සේගේ ආජීව පාරිශුද්ධිය අතිශයින් වැදගත් වෙයි. ස්වාර්ථයට අහිතකර වූත් සංස්ථාවේ ගෞරවයට සමගියට හා චිරජීවනයට බාධක වූත් සාවද්‍ය ක්‍රියාවන් ඒ එකිනෙකෙහි ඇති බරපතල කම් අනුව ආපත්තිස්කන්ධ හතකට වර්ග කොට තිබේ. ඒවා අරක්ෂා කිරීමට උපසපන් භික්ෂුව බැඳී සිටියි. ඒවා මෙසේ ය.

01. **පාරාජික ආපත්ති**
02. **සංඝාදිසෙස ආපත්ති**
03. **ථුල්ලච්චය ආපත්ති**
04. **පාචිත්තිය ආපත්ති**
05. **පාටිදෙසනීය ආපත්ති**
06. **දුක්කට ආපත්ති**
07. **දුබ්භාසිත ආපත්ති**

භික්ෂූන් වහන්සේ කෙනකුගෙන් සිදු විය හැකි වැරදි සියල්ලක් ම පාහේ මෙම සප්තාපත්තිස්කන්ධකයන් යටතේ සංග්‍රහ වී තිබේ. මෙයින් භික්ෂුවකගෙන් සිදුවිය හැකි ඉතාමත් ම බරපතල වැරදි ලෙස ගැනෙන්නේ පාරාජිකාපත්තීන් ය. පාරාජිකා ඇවතකට පැමිණියහුට එයින් නිදහස් වීම සඳහා කිසිදු පිළියමක් නොමැත. හේ භික්ෂූන් සමග

සහවාසයට කිසිසේත් නො සුදුස්සෙකි. සෙසු ඕනෑම ඇවතකින් නිදහස් වීමට හා ඊට පිළියම් යෙදීමට අවසර ඇතත් පරිජි ඇවතකින් යළි පාරිශුද්ධිය ලැබීමට කිසිදු ඉඩක් නැත. ''තාල වර්ගයේ ගසක එහි කරටිය සිඳී ගිය පසු නැවත නොවැඩෙන්නා සේ ය.'' පාරාජිකාවකට පත්වීමත් සමගම ඒ භික්ෂුව ගිහියකුගේ තත්ත්වයට පත්වෙයි. ඔහු කෙරෙහි අධිශීල සංඛ්‍යාත උපසම්පත්තිය නොපිහිටයි. භික්ෂුත්වයට පත්වීමට පෙර යම් සේ ගිහියකු වශයෙන් සිටියේ ද පාරාජිකාපත්තියට පැමිණීමෙන් පසු යළි ඒ තත්ත්වයට පත් වෙයි. එහෙත් සාමණේර සීලය සමාදන්ව සාමණේරයකු වශයෙන් සිටිය හැකි ය.

භික්ෂු සමාජයෙහි ගෞරවයට හා පහසුවට හේතු වන්නාවූත්, එහි සාමූහික පැවැත්මට හා එම සමාජයෙහි ශිෂ්ටත්වයට ඉවහල් වන්නාවූත් සදාචාර ධර්ම සමූහය ආභිසමාචාරික ශික්ෂා නම්. ඒවා මහාවග්ග පාලි, චුල්ලවග්ග පාලි, පරිවාර පාලි, යන ග්‍රන්ථවල ඛන්ධක වත්ථු යන නාමයෙන් විස්තර කොට තිබේ. ආදිබ්‍රහ්මචරිය ගණයට වැටෙන ප්‍රාතිමෝක්ෂ ශික්ෂා දෙසිය විස්සෙන් පාරාජිකා, සංඝාදිසේස සහ අනියත යන ශික්ෂා පද (එකුන් විස්ස) මෙහි දී විස්තර කරනු ලබයි.

**මෙථුනධම්ම පාරාජිකාපත්තිය**

> **''යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවීකත්වා මෙථුනං ධම්මං පතිසෙවෙය්‍ය, අන්තමසො තිරච්ඡානගතාය'පි, පාරාජිකො හොති අසංවාසොති ''**

**අර්ථය:** යම් භික්ෂුවක් භික්ෂූන් පිළිබඳ අධිශීල ශික්ෂාවන්ට පැමිණියේ, (ශීලය) උපසම්පදාව ප්‍රතික්ෂේප නොකොට දුර්වල බව ද නොකියා යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක් සමග ද මෙවුන්දම් සෙවී නම් පරිජි වූයේ වෙයි. උපසපන් භික්ෂූන් සමග සහ වාසයට නුසුදුස්සෙක් වෙයි.

**විවරණ:**

**භික්ඛු:** සම්බුද්ධ ශාසනයෙහි පැවිදිව අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලබාගත් භික්ෂුව, භික්ඛු යනුවෙන් හැඳින්වේ. බුදු සසුනෙහි උපසම්පදාව ලබාගත හැකි ක්‍රම අටෙකි. ගරු ධම්ම පටිග්ගහණ, දූතෙන, අට්ඨ වාචික යන ත්‍රිවිධ උපසම්පදාවෝ භික්ෂුණීන් අරභයා පනවන ලද්දාහු ය. අනෙක් උපසම්පදා ක්‍රම සතර ම ජීවමාන බුදුරජාණන් වහන්සේ වෙතින් ලබා ගත යුතු වෙයි. එබඳු ක්‍රමයකින් උපසම්පත්තියෙහි පිහිටි භික්ෂුවකගෙන් පාරාජිකා ඇවතක් සිදු විය හැකි නො වේ. අටවන ''ඤත්ති චතුත්ථ කර්ම'' වාක්‍යයෙන් භික්ෂු සංඝයා වෙතින් ම උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේ නමක් ම මේ ශික්ෂා පදයෙහි සඳහන් 'භික්ඛු' යන්නෙන් අදහස් කෙරේ.

''**සිකඛාසාජීව සමාපනෙනා**'': සික්ඛා යනු අධිසීල ශික්ෂාවයි. සාජීව යනු බුදුරදුන් විසින් පණවන ලද ශික්ෂා පදයන් ය. අධිශීල ශික්ෂාවන් හා ප්‍රඥප්ති ශික්ෂාවන්ගෙනුත් හික්මීමට පිළිපන්නේ යනු අදහස යි.

''**සිකඛං අපචචකඛාය**'': අධිශීල සංඛ්‍යාත ශික්ෂාව ප්‍රතික්ෂේප නො කොට එනම් උපසම්පදාව ප්‍රතික්ෂේප නොකර යන අදහසයි. ක්‍රමානුකූල ව උපසම්පදාව අත්හැරීම නොකළ භික්ෂුව එම ශික්ෂාවෙහි පිහිටි කෙනෙකි. එබැවින් ශික්ෂා ප්‍රතික්ෂේපය විනයානුකූල ව සිදු නොකළ කෙනෙක් ගිහි ඇඳුම් ඇන්දත් පාරාජිකා වන්නේ ය.

''**දුබබලාං අනාවීකතවා**'': සාජීව නම් වූ ප්‍රඥප්ති ශික්ෂාවන් පිරිහීමට අපහසු බව ප්‍රකාශ නොකොට, මෙයින් පැවසෙනුයේ ශික්ෂා ප්‍රතික්ෂේප කරන්නෙකුට ඒ සඳහා වූ හේතුවයි. එම හේතුව පැහැදිලි ලෙස ප්‍රකාශ කළ යුතු ය.

''**මෙථුනං ධමමං පතිසෙවෙයා**'': එනම් ස්ත්‍රී පුරුෂ සංවාසයෙහි යෙදීමයි. ඔවුනොවුන්ගේ ලිංගේන්ද්‍රියන් තල ඇටයක් පමණ හෝ එකිනෙක ප්‍රවේශ කිරීම මෙහිදී සැලකේ.

''**අනතමසො තිරචඡානගතාය'පි**'' තිරිසන් ගතියෙහි උපන් ස්ත්‍රී සත්ත්වයෙකු සමග හෝ, මෛථුන ධර්මයෙහි බැඳීමෙන් වුව ද අශ්‍රමණයෙකු වන්නේ ය. මිනිස් මාගමක ගැන කියනුම කවරේ ද?

''**පාරාජිකො හොති**'': පාරාජික වූයේ වෙයි. හිසසුන් පුරුෂයෙකු ජීවත් වීමට වරම් නොලබන්නා සේ මේ වරද කළ භික්ෂුව ද ශ්‍රමණ භාවයට වරම් නොලබන්නේ ය. පැරදුනෙක් වන්නේ ය.

''**අසංවාසො**'': උපසපන් භික්ෂූන් සමග එක්ව විසීමට හෝ සංඝ කර්ම කිරීමට නො සුදුසු වන්නේ ය.

අනුප්‍රඥප්තිය

මෙහි ''**අනතමසො තිරචඡානගතායපි**'' යන්න දෙවන පැණවීමයි. එය එක්තරා භික්ෂුවක් තිරිසන් සත්වයකු සමඟ එවන් වරදක බැඳීම නිසා පණවන ලදී. ''**සිකඛං අපචචකඛාය දුබබලාං අනාවීකතවා**'' යන්න තෙවන පැනවීමයි. එය වජ්ජිපුත්තක භික්ෂූන් ශික්ෂාව ප්‍රතික්ෂේප නොකොට ගිහි වේශයෙන් ගොස් වරදෙහි බැඳී ආපසු පැමිණීම නිසා පණවන ලදි. **අනාපතති** - නොදන්නහුට, නොඉවසන්නහුට, උමතු වුවහුට, වික්ෂිප්ත සිත් ඇත්තහුට, වේදනාවකින් පීඩිත වූවහුට ද, ආදිකම්මිකයාට ද ඇවැත් නොවේ.

## මෙථුනධමම පාරාජිකාපතති නිදාන කථාව

අප තථාගත සම්බුදු පියාණෝ එක් කලෙක විසාලා මහනුවර මහවනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වෙසෙති. මෙසමයෙහි විසාලා මහනුවර සමීපයෙහි කලන්දක නම් ගම සුදින්න නමැති කුලපුත්‍රයෙක් බුදුන් වහන්සේ දහම් දෙසන කලැ සිව්පිරිස් මැද හිඳ දහම්

අසා සස්නෙහි පැහැදී ගිහි ගෙය කළකිරී මහණ වන්නට කැමැති විය. දහම් ඇසූ පිරිස ඉවත්ව ගිය විට බුදුන් වහන්සේ සමීපයට ගිය සුදින්න කුලපුත් තෙමේ, තමා, ගිහි ගෙයි කළකිරී ඇති බැවින් සස්නෙහි පැවිදි කරවන ලෙස බුදුන් වහන්සේ අයැදී ය. මාපියන්ගේ හෝ භාරකරුවකුගේ අවසරය නොමැත්තවුන් පැවිදි නොකරන බව බුදුන් වහන්සේ පැවසූ විට හෙතෙම අවසරය ගනු පිණිස මාපියන් හමුවට ගියේ ය.

සුදින්නගේ මාපියනට සිටි එකම පුතා සුදින්න ය. ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ කුලයෙක එම පාරම්පරික ධනයට එකම හිමිකරු වූ සුදින්න පැවිදි වනු ඔහුගේ මාපියෝ කිසිසේත් නො ඉවසති. ගිහිගෙයි දුෂ්කරත්වය හා පැවිද්දෙහි අගය කොතෙක් වටහා දුන් නමුත් තමාගේ පැවිද්දට මා පියන්ගේ අවසරය ලබා ගන්නට සුදින්න අපොහොසත් විය. කොතෙක් ඇවිටිලි කළත් අවසරය නොදෙන විට, තමාට පැවිදි වීමට අවසර නොදුනහොත් නො කා නොබී මියෙන බවට සුදින්න කළ තර්ජනයෙන් ද මාපියෝ මෙල්ල නොවූහ. තම මතයෙහිම තරයේ එල්බ ගත් සුදින්න සත් දිනක් ආහාරයෙන් තොරව උපවාසයෙන් විසී ය. මාපියන් ගිහිගෙයි සැප සම්පත් වර්ණනය කෙරෙමින් ඔහු නගා සිටුවා ආහාර ගැන්වීමට කොතෙක් උත්සාහ කළ ද සුදින්න ඒ කිසිවකට අවනත නොවී ය. තම පුතු අහර නැතිව මියෙනුවට වඩා පැවිදිව ජීවත් වනු දැක්ම යෙහෙකැයි සිතූ මා පියෝ පැවිදි වන්නට අවසර දුන්හ.

මාපියන්ගේ කැමැත්ත ලත් ඇසිල්ලේ ම සතුටු සිතින් පිනාගිය හේ උපවාසයෙන් නැඟී සිට ආහාර පානාදිය ගෙන කිහිප දිනකින් පියෙවි සුවය ලබා බුදුන් වහන්සේ වෙත පැමිණ මා පිය අවසරය දන්වා සස්නෙහි පැවිදි උපසපන් බවට පත් විය. පැවිදිව කලක් ගත වූ පසු මාපියන් පැමිණ යළි ගිහි බවට පත්වැ පාරම්පරික ධනය හිමි කොට ගෙන කම්සැප විඳින ලෙස ඉල්ලා සිටි නමුත් සුදින්න තෙරුන් වහන්සේ ඒ පිළි නොගත්හ.

කලක් ඉකුත් විය. සුදින්න තෙරහු විශාලා මහනුවර මහ වෙනෙහි වෙසෙති. දිනක් උන්වහන්සේගේ මව සුදින්නයන්ගේ ගිහි කලැ බිරියත් සමග මහ වනයට ගොස් සුදින්න තෙරුන් හමු වූවා, තම කුලය නොනසා ගිහිවැ කම් සැපත් විඳිමින් කුල සන්තක ධනය පවරාගෙන දානාදී පින් දහම්හි හැසිරෙන්නැයි ඉල්ලා සිටියා ය. එහෙත් ඊට සුදින්න තෙරුන්ගේ අකමැත්ත පළවිණි. ගිහිවැ කුලය නො රැකිය හැකි නම් කුලය පැවැත්ම සඳහා බිරිය වෙත දරු බීජයක් ලබා දෙන ලෙස අයැදියා ය. මෙකලැ බුදු සස්නෙහි මෛථුන ධර්ම ශික්ෂාපදය පණවා නොතිබිණ. එහෙයින් එහි ආදීනව නොදත් සුදින්න තෙරහු මවගේ ඉල්ලීම පිළිගෙන සිය පැරණි බිරියගේ අතින් ගෙන මහ වනයට වැද ඇය සමග තෙවරක් මෙවුන් දමෙහි යෙදුනහ. පුරාණදුතියිකාව ද ඉන් ගැබ් ගත්තී ය.

මේ වනාහි සංඝ සමාජයෙහි නිරර්බුදවූත් නිරාදීනවවූත් යුගයෙකි. සුපිළිපන්, මහසඟරුවන සුපිරිසිදු සිව්පිරිසිදු සිල්හි මැ නියුතු යැ. එබඳු යුගයෙක එබඳු පිරිසෙක සුදින්න තෙරුන්ගේ ක්‍රියාවෙන් අර්බුදයෙක් පහළ විය. ආදීනවයෙක් හට ගැනිණි. සංඝ සමාජයෙහි සිල්වත් බව ම පතන දෙවියන් අතරෙහි මේ සිදුවීම සාකච්ඡාවට භාජන විය. නිරර්බුද සංඝ සමාජයෙහි සුදින්න කලන්දක පුත්‍රයා විසින් අර්බුදයෙක් කරන ලදැයි දෙවියන් අතර හට ගත් මෙම රාවය චාතුර්මහාරාජික දෙවියන් පටන් ක්‍රමයෙන් බඹලොව දක්වා ම පැතිරිණි.

මේ අතර සුදින්න තෙරුන්ගේ සිත්හි දු කුකුසෙක් පහළ විණි. මවිසින් නොසුදුස්සක් කරන ලදි. මට වූයේ මහත් අලාභයෙකැයි හටගත් විපිළිසරෙන් හේ දිනෙන් දින දුර්වර්ණ වී, පඬුවන් සිරුරු ඇත්තේ වී, නිතර කල්පනා කරන සුලු වූයේ චින්තාපරවශ වීය. මේ බව දත් තථාගතයන් වහන්සේ සුදින්න තෙරුන්ගෙන් කරුණු විමසා නොයෙක් අයුරින් උන්වහන්සේට නින්දා පරිභව කොට මෛථුනධම්මපරාජිකාපත්තිය පණවා වදාළ සේක.

## අදින්නාදාන පාරාජිකාපත්තිය

**"යො පන භික්ඛු ගාමා වා අරඤ්ඤා වා අදින්නං ථෙය්‍යසංඛාතං ආදියෙය්‍ය, යථාරූපෙ අදින්නාදානෙ රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා, පබ්බාජෙය්‍යුං වා චොරො'සි බාලො'සි මූළ්හො'සි ථෙනොසි' ති, තථාරූපං භික්ඛු අදින්නං ආදියමානො අයම්පි පාරාජිකො හොති අසංවාසො "**

**අර්ථය:** යම්කිසි භික්ෂුවක් ගමින් හෝ ආරණ්‍යයෙන් හෝ නොදුන් දෙයක් සොර සිතින් ගනී ද, යම්බඳු සොරකමක දී රජවරු සොරකු අල්ලා ගෙන (තෝ) සොරෙකි, බාලයෙකි, මෝඩයෙකි, අන්සතු දෑ පැහැර ගත්තෙකියි පෙළත් ද, සිරකරත් ද, පිටුවහල් කරත් ද, එබඳු සොරකමක යෙදෙන මේ භික්ෂුව ද පරිජි වූයේ වෙයි. ප්‍රකෘති භික්ෂූන් හා සහවාසයට නොසුදුස්සේ වෙයි.

**විවරණ:**

**ගාමා:** ග්‍රාමයක් ලෙස සැළකෙන්නේ මනුෂ්‍ය වාසය ඇති එළිමහන් භූමි ප්‍රදේශයකි. ශක්තිමත් පුරුෂයකු නිවස සීමාවෙහි සිට විසිකළ ගලක් වැටෙන තැනින් මෙපිට ග්‍රාමය වශයෙන් සැළකෙන බව මාතිකට්ඨ කථාවෙහි දැක්වේ.

**අරඤ්ඤා:** ගමත් ගම් සීමාව හෙවත් ග්‍රාම උපචාරයත් හැර ඉන් එපිට ආරණ්‍යය සේ සැළකේ.

**අදින්නං:** අයිතිකරු විසින් කයෙන් හෝ වචනයෙන් නොදුන් වස්තුව හෝ තමාට අයත් නැති අන් අයෙකුට අයත් වූ දෙය.

**ථෙය්‍ය සංඛාතං:** සොරුන්ගේ ස්වභාවය ථෙය්‍ය නම් වේ. මෙය සොර සිතට ම නමකි. **"ථෙය්‍ය චිත්ත සංඛාතො එකො චිත්ත කොට්ඨාසොති අත්ථො"** සොරසිත නම් වූ එක් සිත් වර්ගයක් ය යන අර්ථ දෙයි. මෙය කරණාර්ථ ද්‍රිතියාවකි. එබැවින් ථෙය්‍ය සංඛාතේන (සොර සිතින්) කියා අර්ථ ගත යුතු ය.

**ආදියෙයය**: ගනී, හැර ගනී, පැහැර ගනී, ඒ සඳහා ඉරියව් මාරු කරයි. තුබු තැනින් ඉවත් කරයි. තුබු සලකුණ ඉක්මවයි.

### යථාරූපෙ අදින්නාදානෙ

පාදයක් (මසුරන් පහක්) හෝ එතරම් වටිනා දෙයක් හෝ ඊට වැඩි දෙයක් (ඒ ඒ කාලයෙහි රාජ නීතියෙන් නියම කරන ලද අවම මුදල් ප්‍රමාණය මීට අදාළ වේ.)

**''රාජානො චොරං ගහෙත්වා හනෙය්‍යුං වා බන්ධෙය්‍යුං වා පබ්බාජෙය්‍යුං වා චොරො'සි බාලො'සි මූළ්හොසි ථෙනොසි' ති''**

මෙම කොටසින් විස්තර කරන්නේ සොරකම ප්‍රමාණ කිරීමයි. රාජනියමය අනුව දඬුවම් පැමිණවීම හා සොරෙක් යැයි නිශ්චිත කිරීම සිදු කරයි. සොරකමට ගැනෙන මුදල් ප්‍රමාණයත් හෝ එතරම් වටිනා වස්තුවක් සොරකම් කරන්නාට ඉහත කී දඬුවම් නියම කෙරේ. එබඳු වැරදි සිදු කරන භික්ෂුව පාරාජික ඇවැතකට පත්වේ.

### අනුප්‍රඥප්තිය

මෙහි ''**ගාමා වා අරඤ්ඤා වා**'' යන කොටස දෙවන පැණවීමයි. ඡබ්බග්ගිය භික්ෂූන් වනයෙහිදීත් රෙදිතොටෙහිදීත් සොරකම් කිරීමක් නිසා එය පණවන ලදි.

### අනාපත්තිය

යමක් තමාගේ ය යන හැගිම් අත්තහුට, විශ්වාසය නිසා ගන්නහුට, තාවකාලික ව ගන්නහුට, ප්‍රේතයන්, තිරිසනුන් සතු දැයෙහි ද පාංසුකුල සංඥාවෙන් ගන්නහුට ද, උම්මත්තක, වික්ෂිප්තචිත්ත, වෙදනට්ඨයන්ට ද ආදිකම්මිකයාට ද ඇවැත් නොවේ.

### අදිනනාදාන පාරාජිකාපත්ති නිදාන කථාව

එක් කලෙක්හි තථාගතයන් වහන්සේ රජගහ නුවර ගොදුරු ගම් කොට ගිජ්ජකූළු පව්වෙහි වැඩ වසන සේක. මෙ සමයෙහි බොහෝ භික්ෂූන් වහන්සේලා ගිජ්ජකූළු පව්වෙහි තෘණ කුටි සාදා ගෙන වස් එළඹුනාහ. මේ අතර ආයුෂ්මත් ධනිය ස්ථවිරයන් වහන්සේ ද වූහ. වස්සාන කාලය අවසන් වූ විට ඒ භික්ෂූන් වහන්සේලා මහා පවාරණයෙන් වස් පවාරණය කොට දනව් සැරිසරනු වස් නික්මුණාහු ය. එහෙත් කුම්භකාර පුත්‍ර ආයුෂ්මත් ධනිය ස්ථවිරයන් වහන්සේ හේමන්ත ගිම්හාන කාලයන්හි ද එහි ම විසූහ. දිනක් මුන් වහන්සේ පිඬු පිණිස ගම්මානයක් බලා ගිය කල්හි තණ හා දර ගෙන යන ස්ත්‍රීහු ගිජ්ජකූළු පව්වට වැද උන්වහන්සේගේ කුටිය දැක එය කඩා බිඳ ගෙන තණ හා දර සඳහා ගෙන ගියහ. ආපසු පැමිණි ධනිය ස්ථවිරයන් වහන්සේ නැවතත් තමා සඳහා තෘණ කුටියක් තනා ගත්හ. එහෙත් යළිත් උන්වහන්සේ පිඬු සිඟා වැඩි කල්හි ස්ත්‍රීහු පැමිණ එය ද කඩාගෙන ගියහ. මෙසේ තෙවරක් ම මෙය සිදු විය.

සිව්වැනි වර ධනිය ස්ථවිරයන් වහන්සේ තෘණ කුටියක් නොකළහ. ''කොතෙක් තෘණ කුටි කළත් තෘණ කාෂ්ටහාරිකාවන් එය කඩා බිඳෙගෙන යන හෙයින් කුම්භකාර ගෝත්‍රයෙහි උපන් මම ඔවුනට කඩා බිඳ ගත නොහැකි මෘන්මය (මැටිවලින් තැනූ) කුටියක් කරන්නෙමැ''යි සිතා සර්වමෘන්මය (සියල්ල මැටියෙන්ම තැනූ) කුටියක් කොට එහි තෘණ කාෂ්ටාදිය දමා දැවූහ. මෙම කිළිය අතිශයින් දකුම්කළු විය. ප්‍රසාදජනක විය. දිනක් භික්ෂූන් පිරිවරා ගිජුකුළු පව් වැඩම කළ බුදුන් වහන්සේ මේ සිත්කළු කුටිය දැක ''මහණෙනි, මේ දකුම්කළු කුටිය කිමෙක්දැ''යි අසා, ධනිය ස්ථවිරයන්ගේ යයි දැන ශ්‍රමණ සාරූප්‍ය නො වූ මෙබඳු කුටියක් භික්ෂූන් සඳහා කෙසේ වටනේදැයි ගර්හා කොට ආයති සංවරය සඳහා කරුණු වදාරා කුටිය බිඳ දැමීමට වදාළ සේක. භික්ෂූන් වහන්සේ කුටිය කඩා දමනු දැක ධනිය ස්ථවිරයන් වහන්සේ ''ඇවැත්නි, කුමක් නිසා මගේ කුටිය බිඳින්නාහුදැ''යි ඇසූහ. තථාගත නියමයෙන් බිඳින්නෙමුයි කී විට එසේ නම් බිඳිව්යැයි පැවැසූහ.

මෙසේ සිව්වැනි වරටත් තම කුටිය බිඳ දැමුණු කල්හි ධනිය ස්ථවිරයන් වහන්සේ තමන් සඳහා දාරුමය (දැවමුවා) කුටියක් තැනීමට අදහස් කොට මෙසේ සිතූහ. ''රාජකීය දැව ගබඩාවේ මා හා කථාබස් කොට ඇති පළපුරුදු තැනැත්තෙක් සිටී. රජයට අයත් ලී ඔහුගෙන් ගෙන අවුත් කුටිය තනන්නෙමි'' මෙසේ සිතූ ධනිය ස්ථවිරයන් වහන්සේ දාරු භාණ්ඩාගාරිකයා කරා එළඹ කුටියක් කරගැනීමට ලී ඉල්ලූහ. ''ස්වාමීනි එබඳු ලී භාණ්ඩාගාරයෙහි නොමැත. එහෙත් නගර ප්‍රතිසංස්කරණය සඳහා තැන්පත් කොට තැබූ රජයට අයත් ලී මෙහි ඇත. රජතුමාගෙන් අවසර ලබා ගෙන ලී ගෙන ගොස් කුටිය තනා ගනු මැනවැ''යි භාණ්ඩගාරිකයා පැවැසී ය.

''පින්වත, රජුගේ අවසරය ලැබී ඇතැ''යි ධනිය ස්ථවිරයන් වහන්සේ කී කල්හි ''එසේ නම් ගෙන යනු මැනැවැ''යි භාණ්ඩාගාරික තෙමේ කීයේ ය. ධනිය ස්ථවිරයන් වහන්සේ ලී කඩ කොට කපා රථවලින් ගෙන ගොස් කුටියක් තනා ගත්හ.

දිනක් මගධ මහාමාත්‍ය වස්සකාර බ්‍රාහ්මණ තෙමේ දාරුභාණ්ඩාගාරයට ගොස් දැව ඉල්ලූහ. එවිට දාරු භාණ්ඩාගාරික තෙමේ, රජතුමන්ගේ අවසරයෙන් ධනිය ස්ථවිරයන් වහන්සේ විසින් දැව ගෙන යන ලදැයි පැවසී ය. මෙ ඇසූ වස්සකාර බමුණු තෙම නො සතුටුව රජුට දැන්වී ය. රජ තෙමේ දාරු ආරක්ෂකයා විනිශ්චය ශාලාවට ගෙන ඒමට අණ කළේ ය. රාජ පුරුෂයෝ ඔහු අල්වා බැඳගෙන ගියහ. මෙය සැළ වූ ධනිය ස්ථවිරයන් වහන්සේ ද රජ ගෙට වැඩම කළ හ. බිම්බිසාර රජ තෙමේ, ධනිය ස්ථවිරයන් වහන්සේ වැඳ එකත් පසෙක සිට ''ස්වාමීනි, නගර ප්‍රතිසංස්කරණය සඳහා වූ දැව මවිසින් ඔබ වහන්සේට දෙන ලදදැයි උන්වහන්සේගෙන් විමසී ය. ''එසේ ය මහරජැ''යි තෙරණුවෝ කීහ.

''ස්වාමීනි, අපි බොහෝ රාජ කාර්ය ඇත්තෝ වෙමු. කිසිවක් ප්‍රදානය කළ ද එය අනුස්මරණය කළ නොහැක්කෙමු. එබැවින් නැවතත් සිහිපත් කරනු මැනවැ''යි බිම්බිසාර රජ තෙමේ කීය.

''මහරජ, තොප අභිෂේක ලත් පළමු වස තුළ දී ම ''මවිසින් මහණ බමුණන්ට තෘණකාෂ්ටොදක දෙන ලද්දේ ය. කැමැති පරිදි පරිභොග කෙරෙත්වා''යි පවරණ ලද්දේ ය'' යනු තෙරුන්ගේ පිළිතුර විය.

''ස්වාමීනි, එය සිහි කරමි. සිල්වත් මහණ බමුණන්ට සුළු දෙයෙහි පවා කුකුස් බහුල හෙයින් උන් වහන්සේලා සඳහා ම මවිසින් ඒ වරය දෙන ලදි. එහෙත් ඒ වනයෙහි අපරිග්‍රහීත දැය පිළිබඳ ව ය'' රජ තෙමේ පවසා මාගේ රාජ්‍යයෙහි වසන ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට කෙසේ දඬුවම් දෙම් ද, ස්වාමීනි, වඩිනු මැනව. මෙයින් පසු මෙබන්දක් නොකරනු මැනවැයි අවවාද කොට ධනිය ස්ථවිරයන් වහන්සේ යැවී ය.

මේ කාරණය දැන ගත් මහා ජනයා භික්ෂූන්ට නින්දා කරන්න ට වූහ. මේ මහණ බමුණෝ අලජ්ජීහු ය. දුශ්ශීලයහ. බොරු කියති. අපි සිල්වතුම්හයි ප්‍රතිඥා කොට වැරදි කරති. මොවුනට ශ්‍රමණ ධර්මයක් නැතැයි යනුවෙන් මහා ජනයා කළ මේ දෝෂාරෝප-ණයන් ඇසූ ලජ්ජී භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මෙකරුණ උන්වහන්සේට සැළ කළහ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් රැස් කොට ධනිය ස්ථවිරයන් වහන්සේ කැඳවා රජු විසින් නොදෙන ලද දැව ගත්තේ සැබෑදැයි විචාරා එසේ යයි කී කල්හි නොයෙක් අයුරින් ගර්හා කොට අනුන් අයත් දැය සොර කම් කිරීමෙහි ලා යටකී අදින්නාදානා පාරාජිකාපත්තිය පණවා වදාළ සේක.

**මනුස්සවිග්ගහ පාරාජිකාපත්තිය**

> **''යො පන භික්ඛු සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙය්‍ය, සත්ථහාරකං වාස්ස පරියෙසෙය්‍ය, මරණ වණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය, අම්භො පුරිස, කිං තුය්හිමිනා පාපකෙන දුජ්ජීවිතෙන, මතන්තෙ ජීවිතා සෙය්‍යො''ති, ඉති චිත්තමනො චිත්ත සංකප්පො අනෙකපරියායෙන මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය, අයම්පි පාරාජිකො හොති අසංවාසො ''**

**අර්ථය:** කිසියම් භික්ෂුවක් (මොහු මරමියි) දැන දැන මනුෂ්‍ය ශරීරය ජීවිතයෙන් තොර කරයි නම්, මරණය සඳහා ආයුධ හෝ පිළියෙල කොට තබයි නම්, මරණයෙහි අගය ප්‍රකාශ කරයි නම්, උත්සුක කරවයි නම්, ''එම්බා මිනිස, ඔබට මේ දුක්බර ජීවිතයෙන් කවර වැඩෙක් ද? ඔබගේ ජීවත් වීමට වඩා මරණය උතුම් ය''යි මරණු කැමැති සිත් ඇතිව, කල්පනා ඇතිව, නොයෙක් අයුරින් මරණයෙහි ගුණ වණන්නේ ද, මරණයෙහි හෝ උත්සුක කරවන්නේ ද ඒ භික්ෂු තෙමේ පරිජි වූයේ වෙයි. (ප්‍රකෘති භික්ෂූන් සමග) සහවාසයට නො සුදුසුස්සෙක් ද වෙයි.

**විවරණ:**

**සංචිච්ච:** ප්‍රාණියෙක බව දැන දිවි තොර කරන බව දැනීම හා හැඟීම ඇතිව ක්‍රියා කිරීම.

**මනුස්ස විග්ගහං:** මව්කුසේ පහළ වන පළමු වන ප්‍රතිසන්ධි සිතෙහි පටන් මරණයේදී පහළ වන චුති සිත දක්වා පවතින මනුෂ්‍ය ප්‍රාණය.

**ජීවිතා වොරොපෙයය:** කළල අවස්ථාවෙහි මැඩීමෙන් හෝ බෙහෙත් යෙදීමෙන් ද ඉන්පසුව ඒ ඒ කාලයට සුදුසු උපක්‍රම යෙදීමෙන් ද කරන ගැබ් හෙළීම.

**සත්‍ථහාරකං වාසස පරියෙසෙයය:** ජීවිතය විනාශ කිරීමට සුදුසු අවිආයුධ ආදිය මරණ චේතනාවෙන් යුතුව සපයා තැබීම.

**මරණවණණං වා සංවණෙණයය:** මිය යාමෙහි අගය පැවසීම ''මෙම දුෂ්කර ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද? මරණින් පසු යහපත් ජීවිතයක් ලබාගත හැකි ය'' ආදී වශයෙන් මරණයෙහි අගය පවසා කිසිවෙකු මරණයට උනන්දු කරවීම.

**මරණාය වා සමාදපෙයය:** මරණය සඳහා උපාය කියාදීම. එනම් අවියකින්, වස විස අනුභ-වයකින් ආදී වශයෙන් මරණය ළඟා කර ගත හැකි ක්‍රම කියාදීමයි.

**චිත්‍තමනො චිත්‍තසංකපෙපා:** මිනිසෙකු මරණයට පත්කරමියි හෝ මරවමි යන අදහස චේතනාව ඇති ව භික්ෂුවක් විසින් සිදු කරන ලබන මනුෂ්‍ය ජීවිත විනාශයකින් මෙම පාරාජික ඇවත සිදු වේ. ඒ සඳහා,

**01. මනුෂ්‍ය ප්‍රාණියෙකු වීම.**
**02. මනුෂ්‍ය ප්‍රාණියෙකු බව දැනීම.**
**03. මරණීය චේතනාව.**
**04. මරණීය උපක්‍රමය.**
**05. එම ක්‍රමයෙන් මරණය සිදු කිරීම.**

යන අංග පහ සම්පූර්ණ වීමෙන් උපසම්පදා භික්ෂුවක් මනුස්ස විග්ගහ පාරාජිකාවට පත්වේ.

### මනුසසවිගගහ පාරාජිකාපතති නිදාන කථාව

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එක් කලෙක විශාලා මහනුවර ඇසුරු කොට මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. කමටහන් ගැන්මට හෝ ධර්ම ශ්‍රවණයට හෝ පැමිණෙන භික්ෂූන් වහන්සේලාට මේ දිනවල බුදුන් වහන්සේගෙන් අසා ගන්නට ලැබුණේ, ශරීරයෙහි පිළිකුල් බව පැවසෙන ධර්මයන් හා අසුභ භාවනාවෙහි අගයත් ය.

අඩ මසක් පමණ කායචිත්ත විවේකය කැමති වූ බුදුරජාණන් වහන්සේ ඒ බව භික්ෂූන්ට පවසා පිණ්ඩපාතය ගෙනෙන භික්ෂුව හැර අනෙක් භික්ෂූන්ගේ පැමිණීම නවතා විවේක සුවයෙන් කල් ගත කළ සේක. භික්ෂූන් වහන්සේ ද අසුභ භාවනාවෙහි යෙදෙමින් ශරීරයෙහි පිළිකුල් බව සලකමින් විසූහ. ශරීරයෙහි ඇති පිළිකුල් බව සලකත්ම උන්වහන්සේලාට ශරීරයෙහි නිසරු බවත් එය දරා සිටීමෙහි නිෂ්ප්‍රයෝජන බවත් වැටහී බොහෝ දෙනෙක් තමන්ම දිවි නසා ගත්හ. ඇතැම්හු අනුන් ලවා සිය දිවි තොර කරවා ගත්හ. තවත් සමහරෙක් මිගලණ්ඩික නැමැති පෙර මුව වැද්දෙකු ව සිට පැවිදි වූ කෙනෙකු

ලවා දිවි තොර කර ගත්හ. අඩ මස ගෙවී යත් ම බොහෝ භික්ෂූන් වහන්සේ මරණයට පත්ව සිටියහ. හුදකළා වාසයෙන් නැගී සිටි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අඩුවී ඇති බව දැක අනඳ හිමියන්ගෙන් කරුණු විමසා හේතුව දැන ඉතිරි සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවෙහි රැස් කරවා සියපණ නසා ගැන්මෙහිත් අනුන් දිවි තොර කිරීමෙහිත් ආදීනව දක්වා ගර්හා කොට ඉහත සඳහන් ශික්ෂා පදය පණවා වදාළ සේක.

## උත්තරිමනුස්සධම්ම පාරාජිකාපත්තිය

> **''යො පන භික්ඛු අනභිජානං උත්තරිමනුස්සධම්මං අත්තුපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය ''ඉති ජානාමි, ඉති පස්සාමි''ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නො විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍යඃ ''අජානමෙවහං ආවුසො අවචං ජානාමි, අපස්සං පස්සාමි, තුච්ඡං මුසා විලපි''න්ති. අඤ්ඤත්‍ර අධිමානා අයම්පි පාරාජිකො හොති' අසංවාසො ''**

අර්ථයඃ යම් කිසි භික්ෂුවක් (තමා වෙත නැති නූපන් බැවින්) ඇතැයි නොදන්නා වූ ආර්ය මාර්ගඥාන දර්ශනය ඇති කරවන සුලු (ධ්‍යානාදී) උතුරු මිනිස් දම් තමා කෙරෙහි (ඇතැයි) අඟවා එය මේ කාරණයෙන් දනිමි, මේ කාරණයෙන් දනිමි යි අධි මානයෙන් තොරව ප්‍රකාශ කෙරෙයි ද, එයින් ම පාරාජිකාපත්තියට පැමිණි ඒ භික්ෂුව පසු කලෙක පිරිසිදු බව කැමැතිව (කිසිවකු විසින්) අසා හෝ නො අසාම හෝ ''ඇවැත්නි, මම (උතුරු මිනිස් දම්) ඇතැයි නො දැනම දනිමි යි කියා නො දැකම දකිමි'යි කියා හිස් (නිසරු) වූ බොරු කීමි යි ප්‍රකාශ කෙරේ ද ඒ භික්ෂුව පරිජි වූයේ වෙයි. (භික්ෂූන් සමග) සහ වාසයට නොසුදුස්සෙක් වෙයි.

විවරණයඃ

**අනභිජානංඃ** තමා වෙත නැති, ඇති බවක් දැන ගන්නට නැති, දක්නට නැති

**උත්තරිමනුස්සධම්මංඃ** සාමාන්‍ය මිනිසුන් සතු ගුණධර්ම මනුෂ්‍ය ධර්ම නම් වේ. එම මනුෂ්‍ය ධර්ම ඉක්මවූ ධ්‍යාන, සමාපත්ති, මාර්ගඵල, අඩුතරමින් ධූතාංග රකින බව වැනි දේ.

**අත්තුපනායිකංඃ** උත්තරි මනුෂ්‍ය ධර්ම තමා කෙරෙහි ඇතැයි ඇඟවීම හෝ තමා උත්තරි මනුෂ්‍ය ධර්ම වෙත පැමිණි බව හෝ ප්‍රකාශ කිරීම.

**අලමරියඤාණදස්සනංඃ** කෙළෙස් නැති කිරීමට සුදුසු, ආර්ය පුද්ගලයන්ගේ ඤාණ දර්ශනය හෙවත් ලෝකෝත්තර ඤාණය ඇති බව දැක්වීම.

**විසුද්ධාපෙක්ඛාඃ** තමා වැරදිකරු බව දැන පිරිසිදු බවට පත්වනු කැමති ව ක්‍රියා කිරීමයි. පාරාජිකාවට පත් භික්ෂුවට ලැබිය හැකි පිරිසිදු බව නම් සාමණේර වීම හෝ ගිහි බවට පත්වීම ය.

අඤ්ඤත්‍ර අධිමානා: අධිමානය නම් තමන් භාවනා කරද්දි අමුතු අමුතු ආලෝක දැකීම, ආදී කරුණකින් තමා ධ්‍යානාදී තත්වයකට පත්වූවේ යැයි රැවටී සිටීමයි. සැබවින් ම එසේ රැවටුණු කෙනෙකුට පාරාජිකා නොවේ.

## උත්තරිමනුස්සධම්ම පාරාජිකාපත්ති නිදාන කථාව

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි වූ මහවෙනෙහි කූටාගාරා ශාලාවෙහි වැඩ වසන සමයෙක බොහෝ භික්ෂූන් වහන්සේ වග්ගුමුදා නම් වූ නදී තීරයෙහි වස් එළැඹියාහු ය. මේ කාලයෙහි වැදෑරට දුර්භික්ෂයෙක් පහළ විය. භික්ෂූන් වහන්සේට ආහාර සොයා ගැන්ම අතිශයින් ම දුෂ්කර විය. පිණ්ඩපාතයෙහි හැසිරීමෙන් ප්‍රයෝජනයක් නොවී ය.

මේ දුෂ්කරතාව ගැන භික්ෂූන් වහන්සේ අතර සාකච්ඡා ඇතිවිය. ''කෙසේ නම් අපි ආහාරපාන ලබමු ද? කවර උපායකින් ආහාරයෙන් ක්ලාන්ත නොවී සමගිව වස් වසන්නෙමුදැ''යි ඔවුනොවුන් විමසූහ. ඇතැම් භික්ෂූහු ''ගිහියන්ගේ කර්මාන්ත (පිළිබඳ ව ''මේ කර්මාන්ත කරවූ මේ ආකාරයෙන් කරවූ ආදි වශයෙන්) උපදෙස් දීමෙන් ගිහියෝ අපට පිණ්ඩදානයෙන් සංග්‍රහ කෙරෙති''යි කීහ. එහෙත් ඒ නොපිළිගත් ඇතැම් භික්ෂූහු ''අපි ගිහියන්ගේ දූතකම් කරමුයි කීහ. ඒ දෙක ම ප්‍රතික්ෂේප කළ ඇතැමෙක් අපි ගිහීන්ගේ සමීපයේදී අසවල් භික්ෂූහු ධ්‍යානලාභීහු ය. අසවල් භික්ෂූහු මාර්ගඵල ලාභීහුයයි. අප තුළ නොමැති උත්තරී මනුෂ්‍ය ධර්ම ප්‍රකාශ කිරීමෙන් ගිහියන්ගේ ප්‍රසාදය ලබා පිණ්ඩපාතය ලැබිය හැකි වෙමු. එබැවින් එසේ කරමු'' යැයි කීහ. මෙය අහර ලබාගැන්මෙහි පහසු උපායකැයි අදහස් කළ සියලු භික්ෂූහු මිනිසුන් වෙත ගොස් තමන් තුළ නොමැති උතුරු මිනිස් ගුණ දම් තමන් තුළ ඇතැයි පවසන්නට වූහ. ගිහියෝ මෙබස් අසා බොහෝ පැහැදුනාහු ''අපට වූයේ ඉතා ලාභයෙකි. මෙවැනි සිල්වත් ගුණවත් භික්ෂූහු පෙර වස් නො එළඹුණාහුය''යි සිතා ආහාරපානයෙන් ඒ භික්ෂූන්ට සංග්‍රහ කළහ. එබැවින් ඔවුනට ආහාරයෙහි දුෂ්කරතාවයෙක් නො වී ය.

වස් පවාරණයෙන් පසු ඒ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ දැක්මට ගියහ. වෙනත් දිශාවලින් පැමිණි භික්ෂූහු ද එහි සිටියහ. ඔහු දුර්භික්ෂයෙන් පීඩාවට පැමිණියාහු බොහෝ දුර්වර්ණව ක්ලාන්ත වූවාහු ය. එහෙත් වග්ගුමුදා නදීතීරයෙන් පැමිණි භික්ෂූන් වහන්සේ තුළ එබඳු වෙනසක් නොවී ය. මනා ආහාර පාන ලැබීමෙන් ඔහු මනා ඡවිවර්ණ ඇත්තාහු පිනා ගිය ඉඳුරන් හා සිත් සතන් ඇත්තාහු වූහ.

බුදුරජාණන් වහන්සේ වග්ගුමුදා තීරයෙන් පැමිණි භික්ෂූන් අමතා ''කෙසේ ද? මහණෙනි, සමගිව සැපසේ වස් විසූවහු ද? දුර්භික්ෂයෙන් පීඩාවට නොපැමිණියාහු ද යි ඇසූහ. ඒ භික්ෂූන් වහන්සේ තමන් ආහාර ලබාගත් අයුරු තත් වූ පරිද්දෙන් පැවසූහ. ''කෙසේ ද? තොප සත්‍යයක් ම කියා ආහාර ලබා ගත්තහු ද, අසත්‍යයක් කියා ගිහියන් මුළා කොට ආහාර ලබා ගත්තහුදැ''යි බුදුන් වහන්සේ විසින් විමසන ලද්දාහු ''ස්වාමීනි අසත්‍යයක් ම කීවෙමු''යි කීහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ''තෙපි කෙසේ නම් මෙබඳු ශ්‍රමණ සාරුප්‍ය නොවූවක් කළහු ද? උදර පූරණය සඳහා කෙසේ නම් ඔවුනොවුන් තුළ නොමැති උතුරු මිනිස් ගුණ දම් ගිහියන්ට කීවෙහුද? මෙසේ තමා තුළ නැති උතුරු මිනිස් දම් ප්‍රකාශ කරනවාට වඩා ගෙරි කපන කැත්තෙන් කුස කපා ගත්තේ නම් මැනවි. මන්ද මේ හේතුවෙන් ඔබ මරණින් මතු දුගතියට, හිස් පුරුෂයෙක් බවට, නිරයට පැමිණෙන්නාහුය. මෙය නොපැහැදුණ වුන්ගේ පැහැදීම සඳහා නොවන්නේ ය. යනාදීන් ගර්හා කොට මේ ශික්ෂා පදය පනවා වදාළ සේක.''

ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන් අතර මුලින් ම දැක්වෙන්නේ සතර පාරාජිකා ධර්මයන් ය. මේවා භික්ෂුත්වයෙන් පරාජයට පත් වන කරුණු සතරකි. මෛථුන ධර්මයෙහි යෙදීම, අදත්තාදානය, මිනිස් ජීවිතයක් නැති කිරීම සහ නැති ආර්ය ගුණ ඇති බව වංක සිතින් පළ කිරීම යන කරුණු සතරින් එකක් හෝ කළහොත් භික්ෂුත්වයෙන් පිරිහී යයි. නැවත සංවරයට අවකාශයක් නැත. එසේ ම නැවත උපසපන් බවට පැමිණිය නොහැකි ය. සාමණේර හෝ ගිහි බව කැමති විය යුතු ය. තවද පරිජි ඇවතකට පත්ව එය සඟවාගෙන සංඝයා නියෝජනය කිරීම බරපතල පාපයකි. ඒ පාරාජිකා ඡේද්‍යගාමිණී ඇවතක් වන හෙයිනි. ශික්ෂාවන් වැඩීමෙහි යම් දුබල බවක්වේ නම් යම් භික්ෂුවකට උපසපන් බව ප්‍රතික්ෂේප කළ හැකි ය. එය 'ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය' නමින් හඳුන්වයි. එවන් භික්ෂුවකට අවශ්‍ය නම් පසුව උපසපන් බව ලැබිය හැකි ය. පාරාජිකා ධර්ම, පාරිශුද්ධි ක්‍රමයක් නැති බැවින් ද, භික්ෂුත්වයෙහි අනන්‍යතාවට හානිකර බැවින් ද බරපතල ගරුකාපත්ති වශයෙන් ගැනේ. එමනිසා ඒවායෙන් මිදී භික්ෂුත්වයත් සම්බුදු සසුනත් රැක ගැනීම බුද්ධ පුත්‍රයන් වහන්සේලා හැටියට අපගේ පරම යුතුකම වන්නේ ය. එය සම්බුදු සසුනෙහි චිර පැවැත්මට, භික්ෂුත්වයෙහි සුරක්ෂිත භාවයට, ශ්‍රාවක ප්‍රසාදයට මෙන්ම විමුක්ති සාධනයටත් මහෝපකාරී වන්නේ ම ය.

**අභ්‍යාස**

01. සතර පාරාජිකා පිළිවෙළින් නම් කරන්න.
02. පාරාජිකා යන්නෙහි සරලාර්ථය පෙන්වා දෙන්න.
03. ''සතර පාරාජිකා ශික්‍ෂා ආරක්ෂ කිරීමෙන් උපසම්පදා භික්ෂුවගේ දෙලොව අභිවෘද්ධිය සැලසේ'' මේ පිළිබඳ නිබන්ධයක් ලියන්න.
04. පහත සඳහන් වචනවල අරුත් පැහැදිලි කරන්න.
    1. භික්ඛු
    2. ප්‍රාතිමොක්‍ෂ සංවර සීලය
    3. පාරාජිකො හොති අසංවාසො
    4. අදින්නං
    5. මරණං වා සමාදපෙය්‍ය
    6. දුබ්බල්‍යං අනාවිකත්වා
    7. ථෙය්‍ය සංඛාතං
    8. තිරච්ඡාන ගතායපි
    9. අනාපත්ති
    10. අත්තුපනායිකං

08
පාඩම

# විනය - සාසනික පුනරුත්ථාපනය

සංඝාදිසේස යනු ගරුකාපත්ති වශයෙන් ගැණෙන ශික්ෂා ප්‍රඥප්ති තෙළෙසකට යෙදී ඇති සංඥා නාමයයි. **'සංඝො ආදිම්හි චෙව සෙසෙ ච ඉච්ඡිතබ්බො අස්සාති සංඝාදිසෙසො'** එනම්,පිරිවෙස් සමාදන් වීම් සංඛ්‍යාත ආදියෙහි මෙන් ම මානත් අබ්භාන සංඛ්‍යාත සෙසු පිළිවෙත්හි ද සඟවෙසෙස් ඇවතකට පැමිණියහු විසින් සංඝයාගේ සහභාගීත්වය කැමති විය යුතු හෙයින් සංඝාදිසේස වේ යැයි සමන්තපාසාදිකාව පවසයි. පාරිශුද්ධිය ලබාගත හැකි ඇවැත් අතුරින් ඉතාමත් බරපතල ඇවත් සංඝාදිසේසාපත්තීහු ය. මේ නිසා ද මේවාට ගරුක යන නම යෙදේ. ඇවතින් නැගී සිටීම් වශයෙන් ද ඉතාම බරතල හෙයින් ද ගරුක යන නම යෙදේ. දේශනා පාරිශුද්ධි වශයෙන් පිරිසිදු විය නොහැකි ය. වත් සමාදානය,මානත පිරීම හා අබ්භාන කර්මය යන විනය පිළිවෙත් මාලාව අනුගමනය කිරීම මගින් පමණක් ම පාරිශුද්ධි භාවයට පත් විය හැකි ය.

## සුක්කවිස්සට්ඨි සංඝාදිසෙසාපත්තිය

''සඤ්චෙතනිකා සුක්කවිස්සට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සංඝාදිසෙසො ති''

අර්ථය: සිහිනයක දී හැර දූන දූන කරන ශුක්‍ර මෝචනය සංඝාදිසේසාපත්තියක් වෙයි.

විවරණය:

**සංචෙතනිකා:** මෝචන ආශ්වාදය ඇතිව කරනු ලබන ශුක්‍රමෝචනය මෙයින් අදහස් කෙරේ.

**සුක්කවිස්සට්ඨි:** විශේෂයෙන් උපක්‍රම මගින් කරන ශුක්‍ර මෝචනයයි. චේතනා සහගත ව ධාතුමෝචනය හෙවත් ධාතු මුදවීම මෙයින් සැලකේ. ශරීරයෙහි කාය ප්‍රසාදය ඇති සෑම තැනක ම ශුක්‍ර ධාතුව ඇතැයි සැලකේ.

**අඤ්ඤත්‍ර සුපිනන්තා :** සිහිනයකදී සිදුවන ශුක්‍ර මෝචනයේදී සංඝාදිසේසය නොවේ. ඒ චේතනාවක් නොමැති හෙයිනි.

## සුක්කවිස්සට්ඨි සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් මහා විහාරයෙහි වැඩ වසති. එකල ආයුෂ්මත් සෙය්‍යසක තෙරුන් සසුනෙහි නොඇලී වාසය කරයි. දුර්වර්ණව කෘශවී ගිය **සෙය්‍යසක** හිමියන් ව දිනක් උදායි හිමියන්ට මුණගැසුණි. මෙසේ දුර්වලවීමට හේතුව කුමක්දැයි උදායි තෙරුන් විමසී ය. සෙය්‍යසක හිමියෝ ''සසුනෙහි ඇල්මක් නැති'' දන්වූ විට උදායි හිමියන් උන්වහන්සේ අමතා '' ඇවැත්නි නොතැවෙන්න, මිහිරි ආහාරපාන ගන්න, සුවසේ ආහාරපාන ගෙන සතුටින් වාසය කරන විට ඔබට කාමරාග ආදී හේතුවක් නිසා කලකිරීමේ ඇති වුවහොත් හස්තාදී උපක්‍රමයකින් ශුක්‍ර මෝචනය කරන්නැයි උපදෙස් දුන්හ. එවිට සෙය්‍යසක තෙරුන් ''එය අපට කැපද'යි විමසූ විට එසේ ය, එය අකැප නොවේ. අපි ද එසේ කරමු'යි පැවසී ය.

මෙතැන් පටන් සෙය්‍යසක තෙරුන් කැමති පරිදි ආහාරපානගෙන සුවසේ සැතපෙමින් ප්‍රීතියෙන් පිනාගිය ඉඳුරන් ඇතිව මනහර සිරුර ඇතිව සිත් සේ වැඩ වසයි. යම් අවස්ථාවක කාම ආශාවක් ඇතිවූ විට උපක්‍රමයෙන් ධාතු මෝචනය කරයි. සෙසු ආරාමික භික්ෂූන් වහන්සේලා සෙය්‍යසක හිමියන් කලින් වැහැරුණු ශරීර ඇතිව සිට දැන් පිනාගිය ඉඳුරන් ඇතිව සිටිනු දැක කරුණු විමසා එම ප්‍රවෘත්තිය දැනගත්හ. සෙය්‍යසක තෙරුන්ට නින්දා කල ආරාමික භික්ෂූන් වහන්සේලා ඒ බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේට සැලකළහ. බුදුරජාණන් වහන්සේ සෙය්‍යසක හිමියන් ගෙන්වා නිග්‍රහ කොට වරද පෙන්වා දී ඉහත සංඝාදිසේසාපත්තිය පණවා වදාළ සේක.

## කායසංසග්ග සංඝාදිසෙසාපත්තිය

> **''යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන'' මාතුගාමෙන සද්ධිං කාය සංසග්ගං සමාපජ්ජෙය්‍ය හත්ථගාහං වා වෙණිගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අංගස්ස පරාමසනං සංඝාදිසෙසො"**

**අර්ථය:** කිසියම් භික්ෂුවක් රාගයට බැස (රාගයෙන්) පෙරළුණු සිතින් මාගමක් සමඟ අත ගැනීම හෝ කෙස්වැටිය ගැනීම හෝ අනෙක් අනෙක් අවයවයක් හෝ ස්පර්ශ කිරීම යන ආකාරයකින් කයින් ස්පර්ශ කිරීමකට පත් වේ නම් සංඝාදිසේසාපත්තිය වෙයි.

**විවරණය:**

**ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන:** කාය සංසර්ග රාගයට බැස එම රාගයෙන් මඩනා ලද, රාගයෙන් පෙරළුන, උමතු වූ සිත් ඇති ව කටයුතු කිරීමයි. සිත රාගයෙන් රත්වූ විට, ද්වේශයෙන් දූෂිත වූ විට, මෝහයෙන් මුළා වූ විට විපරිණත හෙවත් වෙනස් වූ සිතක් වේ. මෙහිදී ඒ අතරින් රාගයෙන් රත්වූ සිත ගැනේ.

**මාතුගාමෙන:** මාතුගාම ස්ත්‍රී වාචක පදයකි. මෙයින් එදවස උපන් ස්ත්‍රියක් වුව ද රාගාදී සිතින් ස්පර්ශ කිරීම සංඝාදිසේසාපත්තියට හේතුවන බව දැක්වේ. අන්‍ය ස්ත්‍රී නොසැලකෙන අතර මනුෂ්‍ය ස්ත්‍රියක් පමණක් මාතුගාම පදයෙන් ගැනේ.

**කායසංසගගං:** කයෙන් කය ස්පර්ශ කිරීමයි. අතින් අත ගැනීම, කේශය ඇල්ලීම අනෙක් අනෙක් අවයව අතගෑම කාය සංසර්ගය ලෙස විශේෂ කොට දක්වා ඇත. රාගයෙන් එදවස උපන් ස්ත්‍රියගේ වුව ද කෙස් අගකින් හෝ පරාමර්ශනය කරයි නම් සංඝාදිසේස වේ. කය හා බැඳුන දෙයකින් ස්පර්ශ කරයි නම් ථුලසි වේ. මනුෂ්‍ය ස්ත්‍රියක් කෙරෙහි මනුෂ්‍ය ස්ත්‍රියක් නොවේ යන හැඟවීමෙන් විමතියෙන් ස්පර්ශ කරයි නම් ථුලසි ඇවැත් වේ. කයෙන් කය හා බැඳුනක් ස්පර්ශ කරයි නම් දුකුළා ඇවැත්වේ.

**කායසංසගග සංඝාදිසෙසාපත්ති නිදාන කතාව**

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් මහා විහාරයෙහි වැඩ වසන සේක. ආයුෂ්මත් උදායි හිමියෝ එකල දර්ශනීය ආරණ්‍ය සේනාසනයක වැඩවසති. සිත් ගන්නා සුලු විහාරාංගයන්ගෙන් යුතු අලංකාර එම ස්ථාන නැරඹීමට බොහෝ මනුෂ්‍යයෝ සිය දරු පවුල ද සමග නිතර පැමිණෙති.

දිනක් එක්තරා බ්‍රාහ්මණයෙක් සිය තරුණ බිරිඳ ද සමග එහි පැමිණ උදායි හිමියන් අමතා ''ස්වාමීනි ඔබ වහන්සේ විහාරය ඉතා විසිතුරු ය එය දකිනු කැමති යැයි කීය. උන්වහන්සේ ද එය පිළිගෙන විහාරයෙහි දොර කවුළු ආදිය හැර බමුණාට සහ බැමිණියට එය නැරඹීමට අවස්ථාව සලසා දුන්හ. ඔවුන් දෙදෙන විහාරයෙහි අසිරිය නරඹන අතර උදායි හිමියෝ බමුණාට නොපෙනෙන පරිදි රාගී සිතින් බැමිණියගේ අඟපසඟ ස්පර්ශ කළහ.

විහාරය නරඹා අවසානයෙහි බමුණා ''උදායි හිමි උසස් ස්ථානයක උදාර ලෙස ජීවත්වෙති එබැවින් උන්වහන්සේ උදාර කෙනෙක් යැයි කීය. එය ඇසූ බැමිණිය උදායි තෙරුන් වහන්සේගේ කුමන උදාර කමක් ද ඔබ මා ස්පර්ශ කරන්නා සේ ඒ තෙරහු ද මා අවයව ස්පර්ශ කළහ'යි කීවා ය. බැමිණියගේ මෙම කථාවෙන් කෝපයට පත් බමුණා උදායි හිමියන්ට හා සෙසු භික්ෂූන්ට ''මේ ශ්‍රමණයෝ ලැජ්ජා නැත්තෝ ය. ශ්‍රමණ ප්‍රතිපත්ති නැත්තෝ යැයි නින්දා අපහාස කළේ ය. මහජනයා ද එම ප්‍රවෘත්තිය දැන භික්ෂූන්ට නින්දා අපහාස කළහ. බුදුරජාණන් වහන්සේ උදායි තෙරුන් පිළිබඳ ප්‍රවෘත්තිය දැන උන්වහන්සේ ගෙන්වා අවවාද කර කායසංසග්ග සංඝාදිසේසාපත්තිය පණවා වදාළහ.

## දුට්ඨුල්ලවාචා සංඝාදිසෙසාපත්තිය

**''යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා තං යුවා යුවතිං මෙථුනූපසංහිතාහි, සංඝාදිසෙසො ''**

අර්ථය: කිසියම් භික්ෂුවක් රාගයට බැස පෙරළීගිය සිත් ඇත්තේ කිසියම් ස්ත්‍රියකට මෛථුන්දම හා සම්බන්ධ ව තරුණයෙක් තරුණියකට කථා කරන ආකාරයෙන් අසභ්‍ය වචනයෙන් කථා කෙරේ නම් සංඝාදිසෙසාපත්තිය වෙයි.

**විවරණය:**

**මාතුගාමං:** සභ්‍ය අසභ්‍ය වචන තීරණය කළ හැකි ස්ත්‍රියක් මෙහිදී මාතුගාම ශබ්දයෙන් ගැනේ. වච්චමග්ග, පස්සාවමග්ග ආදිය පිළිබඳ ව කරන එබඳු අසභ්‍ය වචන තේරුම් ගත නොහැකි ළදැරියක හෝ එබඳු දේ දැනගැනීමෙහි අසමත් මහළු ස්ත්‍රීන් මෙහි නොසැලකේ.

**දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය:** දුට්ඨුල්ලවාචා නම් වච්චමග්ගය පස්සාවමග්ගය හා මෛථුන ධර්මය යන මේවා පිළිබඳ කරනු ලබන කථාවයි. ඒ පිළිබඳ ව ගුණ කීම පෙළඹවීම හෝ අසභ්‍ය වචන කීම මෙයට ගැනෙයි.

## දුට්ඨුල්ලවාචා සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක. එකල ආයුෂ්මත් උදායි තෙරුන් වහන්සේ සිත්කලු ආරණ්‍ය විහාරයක වැඩවසන සේක. වෙහෙර දක්මට බොහෝ ස්ත්‍රී පුරුෂයෝ නිතර එහි පැමිණෙති. පැමිණ තෙරුන් වහන්සේගෙන් අවසර ලබා වෙහෙර සිරි නරඹති.

ඇතැම් ස්ත්‍රීහු පැමිණ වෙහෙර දකිනු කැමැත්තෙමු යි කීවිට උන්වහන්සේ ද ඔවුන්ට විහාරය පෙන්වමින් අසභ්‍ය කථා කියති. ලිංගික අවයව පිළිබඳ රාග මිශ්‍රිත වචන කියති. ලැජ්ජා නැති ලාමක ස්ත්‍රීහු ඒවා අසා සිනාසෙති. එහෙත් ලැජ්ජා ඇති අය එම කථා අසා උදායි හිමියන්ට ආක්‍රෝශ පරිභව කරමින් විහාරයෙන් යති. මෙම පුවත ජනපද වැසියන්ට ද අසන්නට ලැබී ඔවුහු ද භික්ෂූන්ට නින්දා අපහාස කරන්නට වූහ. විහාරවාසී භික්ෂූන්ගෙන් එම පුවත දැනගත් බුදුරජාණන් වහන්සේ උදායි තෙරුන් ගෙන්වා නින්දා කර, ඔවදන් දී මෙම සංඝාදිසේස ශික්ෂාව පණවා වදාළහ.

### අත්තකාම පාරිචරිය සංඝාදිසෙසාපත්තිය

> **''යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමස්ස සන්තිකෙ අත්තකාම පාරිචරියාය වණ්ණං භාසෙය්‍ය, එතදග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍යාති මෙථුනූපසංහිතෙන සංඝාදිසෙසො ''**

අර්ථය: කිසියම් භික්ෂුවක් රාගයට බැසගත්තේ විපර්යාස වූ සිතින් මාගමක් සමීපයෙහි නැගණියෙනි මාබඳු සිල්වත් වූ යහගුණ ඇති බ්‍රහ්මචාරියෙකුට එවන් ධර්මයකින් උවටැන් කිරීම උසස් ම උවටැන වන්නේ යයි මෙවුන්දම් මුසු වදනින් තමාහට මෙවුන්දමින් මෙහෙ කිරීමේ අනුසස් කියා ද සංඝාදිසෙසාපත්තිය සිදු වේ.

**විවරණය:**

**අත්තකාම පාරිචරියාය:** මෙවුන්දම් සේවනයෙන් තමාහට උපස්ථාන කිරීම මෙහි අර්ථයයි. තමාට මෙවුන්දම් සේවනයෙන් උපස්ථාන කිරීමෙහි ආනිසංස ස්ත්‍රියක සමග වචනයෙන් පැවසීම හස්ත සංඥා ආදියෙන් ඇඟ වීම.

**සීලවන්තං:** පරපණ නැසීමෙන් වැළකීම ආදියෙන් සීලවන්ත බවට පත්වූ.

**බ්‍රහ්මචාරිං:** මෙවුන් දමින් වැළකුණු හෙයින් බ්‍රහ්මචාරී බව ඇති.

**කල්‍යාණධම්මං:** යහපත් වූ ගුණධර්මයන්ගෙන් යුතු පැවතුම් ඇති.

### අත්තකාම පාරිචරිය සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් මහා විහාරයෙහි වැඩවසන සේක. උදායි තෙරුන් වහන්සේ නිවෙස්වලට නිතර යාමෙන් ඇසුරු කරන කුලයන් සමග ඉතා හිතවත්ව වාසය කරති. එකල එහි කුළුපග නිවසක සැමියා මියගිය රූමත් ස්ත්‍රියක් විසුවා ය. උදායි තෙරුන් වහන්සේ දිනක් පෙරවරු වේලෙහි එම නිවසට වැඩම කළ මොහොතේ එම ස්ත්‍රිය හිඳිනා අසුන් පනවා එකත් පසෙක හුන්නා ය. ඇය සමග මිහිරි වචනයෙන් සුහද සාමීචි කථා කළ උදායි හිමියන්ගේ ප්‍රිය තෙපුලෙන් සතුටු විය. සතුටු වූ ඇය ''ස්වාමීනි, චීවරාදී සිව්පස දානයෙන් ඔබවහන්සේට අවශ්‍ය දෙයක් වේනම් කියනු මැනවි කීවා ය.

එය ඇසූ උදායි හිමි ''නැගණියනි, අපට සිව්පසය නම් අවශ්‍ය තරමින් ලැබේ. යමක් අපට දුර්ලභ නම් එය දිම උසස් ම ආනිසංසයක් වන්නේයැයි පැවසී ය. ඔබවහන්සේට

දුර්ලභ කුමක් දැයි ඇය විමසුවා ය. අපට මෛථුන්දම් සේවනය ඉතා දුර්ලභයැයි පැවසුවිට ස්වාමීනි එසේනම් වඩිනු මැනවි මම ඔබවහන්සේට මෛථුන්දමින් උපස්ථාන කරමියි. පැවැසූ ඇය කාමරයකට ඇතුළුව ඇඳ සිටි වස්ත්‍ර ගලවා ශයනයක දිගා වූවා ය. උදායි හිමියෝ එම ස්ත්‍රිය සමීපයට ගොස් ''මේ පිළිකුල් උපදවන දුගඳ හමන තුච්ඡ වූවක් කෙසේ ස්පර්ශ කරනනෙම් ද'යි'' කෙළගසා පිටව ගියහ.

උදායි තෙරුන් වහන්සේගේ එම වචනයෙන් කෝපයට පත් ස්ත්‍රිය මෙම ශ්‍රමණයෝ ලැජ්ජා නැත්තෝ ය. තමන් ම මෛථුන සේවනය ඉල්ලා පසුව නින්දා කරන ලද්දේ ය. මා කුමට බියවන්නෙම් දැයි සිතා භික්ෂූන් වහන්සේලාට අපහාස කරන්නට විය. මහජනයාට ද මෙම පුවත අසන්නට ලැබී භික්ෂූන් වහන්සේට නින්දා කරන්නට වූහ. ආරාමවාසී භික්ෂූන්ගෙන් තොරතුරු අසා දැනගත් බුදුරජාණන් වහන්සේ උදායි හිමියන් ගෙන්වා නිග්‍රහ කර අවවාද දී ඉහත විනය ශික්ෂාව පණවා වදාළහ.

**සංචරිත්ත සංඝාදිසෙසාපත්තිය**

**''යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා අන්තමසො තං ඛණිකාය පි සංඝාදිසෙසො ''**

අර්ථය: යම් භික්ෂුවක් නියම අඹුසැමි බවක් හෝ සොර අඹුසැමි බවක් පිණිස හෝ පුරුෂයාගේ අදහස ස්ත්‍රියට හෝ ස්ත්‍රියගේ අදහස පුරුෂායට හෝ යටත් පිරිසෙයින් ඒ මොහොතේ සේවනය සඳහා හෝ කැමැත්ත ඔවුනොවුන් වෙත ගෙන යමින් පණිවුඩ කාරියෙහි යෙදේ නම් සංඝාදිසේස ආපත්තිය වේ.

විවරණය:

**සංචරිත්තං**: ආවාහ විවාහ බලාපොරොත්තුවෙන් සිටින ස්ත්‍රී පුරුෂයන්ගේ ලියුම් හෝ පණිවිඩ ඔවුනොවුන් වෙත ගෙනයාම. තරුණ ස්ත්‍රී පුරුෂයන් අතර හෝ ඔවුන්ගේ මව්පිය දෙපාර්ශවයන් අතර පණිවිඩ හුවමාරුව මෙහිදී අදහස් කෙරේ.

**ස්ත්‍රීහු** : ස්ත්‍රීහු දසදෙනෙක් හා භාර්යාවෝ දසදෙනෙක් මෙම වචනයෙන් සැලකේ.
**මාතුරක්ඛිතා** : මව විසින් රකිනු ලබන ස්ත්‍රිය
**පිතුරක්ඛිතා** : පියා විසින් රකිනු ලබන ස්ත්‍රිය
**භාතුරක්ඛිතා** : සහෝදරයා විසින් රකිනු ලබන ස්ත්‍රිය
**භගිනිරක්ඛිතා** : සහෝදරිය විසින් රකිනු ලබන ස්ත්‍රිය
**ඤාතිරක්ඛිතා** : ඤාතීන් විසින් රකිනු ලබන ස්ත්‍රිය
**ගොත්තරක්ඛිතා** : කුල ගෝත්‍රිකයන් විසින් රකිනු ලබන ස්ත්‍රිය

| | | |
|---|---|---|
| **ධම්මරක්ඛිතා** | : | සිල් ඇත්තියන් මෙහෙණියන් වැනි සහදම්යන් විසින් රකිනු ලබන ස්ත්‍රිය |
| **සාරක්ඛා** | : | මැය අසවලාටයැයි උපදින විටම හෝ පසුව වෙන් කරගත් ස්ත්‍රිය |
| **සපරිදණ්ඩා** | : | ඇසුරු කළහොත් දඬුවම මෙය යැයි නියම කරන ලද ස්ත්‍රිය |
| **මාතුපිතුරක්ඛිතා** | : | මව හා පියා විසින් රකිනු ලබන ස්ත්‍රිය |
| **ධනක්කීතා** | : | ධනය දී මිළ දී ගත් තැනැත්තිය |
| **ඡන්දවාසිනී** | : | ආදරයෙන් කැන්දාගත් තැනැත්තිය |
| **භොගවාසිනී** | : | දායාද සම්පත් පවරාදී වාසය කරවාගත් ස්ත්‍රිය |
| **පටවාසිනී** | : | වස්ත්‍ර දීමෙන් බිරිඳ කරගන්නා ලද්දිය |
| **ඔදපත්තකිනී** | : | අතපැන් වත්කොට ගත් ස්ත්‍රිය |
| **ඔභතචුම්බටා** | : | මුහුණ වසා සිටින වැස්ම ඉවත් කිරීමෙන් තෝරාගත් ස්ත්‍රිය |
| **දාසී ච භරියා** | : | බිරිඳ කරගත් දාසිය |
| **කම්මකාරී ච භරියා** | : | බිරිඳ කරගත් කම්කරු ස්ත්‍රිය |
| **ධජාහටා** | : | බලහත්කාරයෙන් ගෙනෙන ලද ස්ත්‍රිය |
| **මුහුත්තිකා** | : | මොහොතකට බිරිඳ වූ තැනැත්තිය |

**පුරිසමතිං:** පුරුෂයාගේ කැමැත්ත, අදහස, අසවල් තැනට පැමිණෙන්න යනාදී වශයෙන් ස්ත්‍රියට ප්‍රකාශ කළයුතු පණිවිඩ ගෙනයාම

**ජායත්තනෙ:** අඹුසැමියන් වශයෙන් ස්ථිරව විවාහ වීමට බලාපොරොත්තු වන ස්ත්‍රී පුරුෂයන් අතර හුවමාරු වන පණිවිඩ ගෙනයාම ජායත්තන නම් වේ.

**ජාරත්තනෙ:** අහඹුලෙස මුණ ගැසී ඇතිවන හිතවත්කම් මත සොර අඹුසැමි බවට පත්වන බලාපොරොත්තු ඇති ස්ත්‍රී පුරුෂයන්ගේ පණිවිඩ හුවමාරු කිරීම.

**තං ඛණිකායං:** එම මොහොතෙහි පමණක් අඹුසැමියන් වශයෙන් එක්වනු කැමත්තවුන්ගේ පණිවිඩ ගෙනයාම.

**සංචරිත්ත සංඝාදිසෙසාපත්ති නිදාන කතාව**

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයයි. උදායි තෙරුන් වහන්සේ බොහෝ ගිහිකුලයන් සමග කුලුපගව වාසය කරති. මේ හිතවත්කම නිසාම ඒ ඒ කුලයන්හි වසන හිමියා මළ කාන්තාවන් හෝ කුල කුමරියන් හෝ පිළිබඳව වෙනත් කුලයන්හි තරුණයන් හමුව තොරතුරු පවසති. නැතහොත් එම තරුණයන්ගේ මව්පියන් හමුවේ පවසති. මෙම ගුණ කථන අසා පැහැදුණු ඇතැම්හු ''අපි ඔවුන් නොහඳුනන්නෙමු'' ඔබවහන්සේ මේ විවාහය පිළිබඳ තොරතුරු කියා එය ඉටුකර දෙන්නැ'යි කියති. උදායි හිමියෝ එසේ කුලනිවෙස් වෙත ගොස් පණිවිඩ කියා විවාහ කරදෙති.

මෙකල එක් පුරාණ ගණකයකුගේ බිරියකට රූමත් දියණියක් වූවා ය. ඇය පතා පැමිණි ආජීවක ශ්‍රාවකයෝ ගණකිය හමු වී ඔබගේ දියණිය අප පුතණුවන්ට විවාහ කරදෙන්නැයි කීහ. ඔවුන් නොහඳුනන බැවින් ගණකිය අකමැති විය. ඒ බව ආජීවක ශ්‍රාවක පිරිස උදායි හිමියන්ට පවසා උන්වහන්සේගේ මාර්ගයෙන් විවාහය සිදුකර ගත්හ.

මෙම පුවත සැළවීමෙන් මහජනයා අතර භික්ෂූන් වහන්සේ පිළිබඳ විරෝධතාවක් ඇතිවිය. මොවුන් ශ්‍රමණ භාවයට නොසුදුසු දේ කරන්නේ යැයි දොස් නගන්නට වූහ. භික්ෂූන් වහන්සේලා ඒ බව තථාගතයන් වහන්සේට සැළකිරීමෙන් පසුව උදායි තෙරුන් ගෙන්වා වරද පෙන්වා දී අවවාද කර ඉහත කී ශික්ෂා පදය පනවා වදාළ සේක.

### කුටිකාර සංඝාදිසෙසාපත්තිය

**"සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානෙන අසාමිකං අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං දීඝසො ද්වාදස විදත්ථියො සුගතවිදත්ථියා තිරියං සත්තන්තරා, භික්ඛූ අභිනෙතබ්බා වත්ථු දෙසනාය. තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමණං සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය භික්ඛු වා අනභිනෙය්‍ය වත්ථු දෙසනාය, පමාණං වා අතික්කාමෙය්‍ය සංඝාදිසෙසො "**

**අර්ථය:** කරවා දෙන හිමියකු නැතිව, තමා ම ඉල්ලා ගත් උපකරණයෙන් තමා ම උදෙසා කිළියක් කරවන භික්ෂුව විසින් එය නිසි ප්‍රමාණයකට ඉදි කළ යුතු ය. එහි ලා ප්‍රමාණය මෙයයි. දිගින් සුගත් වියතින් වියත් දොළසකි. පුළුලින් ඇතුළත වියත් සතකි. කුටි භූමිය දෙසනාවෙන් සම්මත කිරීම පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් උපද්‍රව රහිත වූත් උපචාර සහිත වූත් කුටි වස්තුව දෙසිය යුතු ය. යම් හෙයකින් භික්ෂුවක් උවදුරු සහිත වූ, උපචාර රහිත වූ කුටි වස්තුවක ඉල්ලාගත් උපකරණයකින් කිළියක් කරවන්නේ නම් හෝ කුටි වස්තුව දෙසීමට භික්ෂූන් නොකැඳවන්නේ නම් හෝ, ප්‍රමාණය හෝ ඉක්මවන්නේ නම් සංඝාදිසෙස ආපත්තිය වෙයි.

**විවරණය:**

**සඤ්ඤාචිකාය:** කුටියක් ඉදිකිරීමේ දී අවශ්‍ය උපකරණ ඉල්ලා ගැනීමේ දී විනායානුකූල බව නොයික්මවා කළ යුතු ය. අනුන්ගේ වෑ පොරෝ ආදී උපකරණ තමන් සතුකර ගැනීමේ අරමුණෙන් නොව එසේ උපකාරයක් අවශ්‍ය විට දන්වන්න යැයි පැවසූ කුලයකින් පමණක් ඉල්ලා ගත යුතු ය. වඩු, කම්කරු, ශ්‍රමය ඉල්ලීමේ දී පවා විනායානුකූල බව නො ඉක්මවා ලබාගත යුතු ය.

**කුටිං:** උල්ලිත්ත ඇතුළත සුණු පිරියම් කළ අවලිත්ත පිටත සුණු පිරියම් කළ උල්ලිත්තාවලිත්ත ඇතුළත හා පිටත සුණු පිරියම් කළ වශයෙන් කුටි වර්ග තුනකි.

**පමාණිකා:** භික්ෂුවක් උදෙසා තනි කුටියක් ඉදිකරන විට නියමිත ප්‍රමාණය විනයානුකූල විය යුතුය. ඇතුළත බිත්ති හැර දිග ප්‍රමාණය බුදුරජාණන් වහන්සේගේ වියතින් වියත් දොළහක් හා පළල වියත් හතක් වීම අවශ්‍ය ය.

**සුගත විදත්ථියා:** සුගත් වියත ලෙස සැලකෙන බුදුරජාණන් වහන්සේගේ වියත මධ්‍යම ප්‍රමාණයේ පිරිමි අයෙකුගේ අතින් වියත් තුනකි. වඩුරියන් එක හමාරකි.

**භික්ඛු අභිනෙතබ්බා වත්ථු දෙසනාය:** කුටි ඉදිකිරීමේදී පළමු ව එම භූමිය උවදුරු රහිත ද උපචාර සහිත ද යන්න සංඝයා වැඩමවා උන්වහන්සේලා ලවා පරීක්ෂා කරවා ගත යුතු ය. එසේ පරීක්ෂා කොට නිරුපද්‍රිත නම් උපචාර සහිත නම් සංඝයා විසින් කර්ම වාක්‍ය දේශනා කොට එම කුටිය ඉදි කිරීමට කුටි භූමිය සම්මත කළ යුතු ය. එසේ කුටි වස්තුව දෙසීමට සංඝයා කැඳවා ගැනීම මින් අදහස් කෙරේ.

**අනාරම්භං:** කුටියක් ඉදිකරන භූමියෙහි නොතිබිය යුතු උපද්‍රව දහසයකි. **කිපිල්ලිකා** (කුහුඹුවන්) **උපචිකා** (වේයන්) **උන්දූර** (මීයන්) **අහි** (සර්පයන්) **විච්ඡික** (ගෝනුස්සන්) **සතපදී** (පත්තෑයන්) **හත්ථි** (ඇතුන්) **අස්ස** (අශ්වයන්) **සීහ** (සිංහයන්) **ව්‍යග්ඝ** (ව්‍යාඝ්‍ර) **දීපි** (කොටි) **අච්ඡ** (කලුහිස් වලස්) **තරච්ඡ** (කරබානා වලස්) යන උවදුරු නොමැති ස්ථාන විය යුතු ය. එසේම රාජ උද්‍යාන ආදිය ආශ්‍රය නොවූ ස්ථානය කුටියකට යෝග්‍ය සේ සැලකේ.

**සපරික්කමණං:** කුටියට පිටතින් ගොනුන් දෙදෙනෙක් බඳින ලද කරත්තයක් ගමන් කළ හැකි ප්‍රමාණයේ ඉඩක් තිබිය යුතු ය. එය උපචාරය නම් වේ.

### කුටිකාර සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් මහා විහාරයෙහි වැඩවසති. අලව් නුවර වාසී භික්ෂූන් වහන්සේලා තමන් උදෙසා කුටි ඉදිකර දෙන පිරිස් නොමැති හෙයින් ප්‍රමාණය ඉක්මවූ කුටි ඉදිකරති. එහෙත් විවිධ අපහසුතා නිසා එම කටයුතු අවසන් කරගත නොහැකි වෙයි. මේ හේතුවෙන් ගම්වැසියන් හමුවන භික්ෂූන් වහන්සේලා උපකරණ, කම්කරුවන්, වඩුවන් ඔවුන්ගෙන් ඉල්ලති. මෙය මහජනයාට බලවත් පීඩාවක් විය. භික්ෂූන් වහන්සේලා දුටු විට නිවෙස් දොරගුලු දමා ගනිති. ඇතැම්හු මගහැර යති.

මහා කාශ්‍යප මහරහතන් වහන්සේ රජගහනුවර වස් වැස අලව්නුවර අග්ගලාව විහාරයට වැඩිසේක. පෙරවරු වේලෙහි පිණ්ඩපාතය වැඩම කළ විට නිවැසියෝ තැතිගෙන දොර වසා ගත්හ. පිණ්ඩපාතය නිමවා වෙහෙරට වැඩි උන්වහන්සේ මහජනයාගේ වෙනස පිළිබඳව භික්ෂූන් වහන්සේගෙන් කරුණු විමසූහ. උන්වහන්සේලා කාශ්‍යප හිමියන්ට තොරතුරු පැවසූහ.

බුදුරජාණන් වහන්සේ ද දිනක් අලව් නුවරට වැඩ අග්ගලාව විහාරයට වැඩිසේක. මහා කාශ්‍යප හිමියො භික්ෂූන් වහන්සේලාගේ ආයාචනා වැඩිවීමෙන් මහජනයා බලවත් පීඩාවට පත්ව ඇති පුවත බුදුරදුන්ට සැළ කර සිටියහ. අලව් නුවර වැසි භික්ෂූන් වහන්සේ කැඳවූ තථාගතයන් වහන්සේ තොරතුරු සත්‍ය බව දැන නිග්‍රහ කොට අනුශාසනා කර මෙම විනය ශික්ෂාව පැණවූහ.

## විහාරකාර සංඝාදිසෙසාපත්තිය

> "මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන සස්සාමිකං අත්තුද්දෙසං, භික්ඛූ අභිනෙතබ්බා වත්ථු දෙසනාය තෙහි භික්ඛූහි වත්ථුං දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමනං සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථු දෙසනාය, සංඝාදිසෙසො"

**අර්ථය:** කරවා දෙන හිමියන් ඇතිව තමා උදෙසා විශාල විහාරයක් කරවන භික්ෂුව විසින් භූමිය දෙසීම සඳහා භික්ෂූහු කැඳවිය යුත්තාහ. ඒ භික්ෂූන් විසින් උපද්‍රව රහිත වූ ද උපචාර සහිත වූ ද විහාර භූමිය දෙසිය යුතු ය. කිසියම් භික්ෂුවක් උපද්‍රව සහිත වූ හෝ උපචාර රහිත වූ බිමක විශාල විහාරයක් කරවන්නේ නම් හෝ එම භූමිය දෙසීම සඳහා භික්ෂූන් හෝ නොකැඳවන්නේ නම් සංඝාදිසෙසාපත්තිය සිදු වේ.

**විවරණය:**

**මහල්ලකං:** මහල්ලක විහාරය නම් මහා විහාරයක් හෙවත් විශාල ප්‍රමාණයේ කුටියකි. විහාරය කරවා දෙන දායකයන් සිටින බැවින් භික්ෂූන් වහන්සේට එහි කිසිදු වෙහෙසක් හෝ උවදුරක් නැත. එහෙත් ඉදිකරන බිම භික්ෂූන් වහන්සේලා වෙත ආරාධනා කොට වැඩමවා සම්මත කරගත යුතු ය.

## විහාරකාර සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

බුදුරජාණන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වැඩවසන සමයකි. එකල ඡන්න හිමියන්ගේ හිතවත් දායක ගෘහපතියෙක් " ස්වාමීනි ඔබවහන්සේ උදෙසා විහාරයක් ඉදිකර දෙනු කැමැත්තෙමි. ඊට සුදුසු භූමියක් පෙන්වනු මැනවැයි ඉල්ලා සිටියේ ය. ඡන්න හිමියන් තමන්ට විහාරය ඉදිකර ගැනීම සඳහා මහජනයාගේ වන්දනාවට පාත්‍ර වූ වනස්පතියක් අසල භූමියක් පෙන්වී ය. ගෘහපතියා එම වනස්පතිය සිඳ වීය. මෙය දුටු ගම්වැසියෝ මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ වෘක්ෂ චෛත්‍යයන් සිඳති. තුරුලතාවන්හි එකින්ද්‍රිය ප්‍රාණයක් ඇති බැවින් එය ප්‍රාණඝාතයකැයි දොස් කීහ. මෙම ප්‍රවෘත්තිය සැළවූ බුදුරජාණන් වහන්සේ ඉහත විනය ශික්ෂාව පනවා වදාළහ.

## පඨම දුට්ඨදොස සංඝාදිසෙසාපත්තිය

"යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො
අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය අප්පෙව නාම
නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති, තතො අපරෙන සමයෙන
සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අමූලකඤ්චෙව තං අධිකරණං
හොති භික්ඛු ච දොසං පතිට්ඨාති, සංඝාදිසෙසො

අර්ථය: කිසියම් භික්ෂුවක් කෝපයට පැමිණියේ අනුන් කෙලෙසන සිත් ඇත්තේ නොසතුටු සිත් ඇත්තේ මොහු මේ සසුනෙන් නෙරපන්නේ නම් යෙහෙකැයි භික්ෂුවකට අමූලික වූ පරාජිකාපත්තියකින් චෝදනා කෙරේ නම්, පසු කලෙක විචාරනු ලබන්නේ හෝ නොලබන්නේ අධිකරණය අමූලික වෙයි නම් ඒ චෝදක භික්ෂුව ද දෝෂයෙහි පිහිටා සිටින්නේ නම් සංඝාදිසෙස ආපත්තිය සිදු වේ.

**විවරණය:**

**දුට්ඨො:**
දුෂ්ට වීම හෙවත් කෝපයට පත් වීම.

**දොසො:**
අනුන් දූෂණය කරන සිත් ඇතිව, අනුන් දෝසයට භාජනය කරවන සිත් ඇති යන අදහසයි.

**අප්පතීතො:**
ප්‍රීතියෙන් තොර සතුටෙන් තොර වීම.

**අමූලකෙන පාරාජිකෙන ධම්මෙන:**
හේතු සාධක නැතිව පාරාජික ඇවතකින් චෝදනා කිරීම මෙයින් අදහස් කරයි. කිසියම් භික්ෂූන් වහන්සේ නමකට පාරාජික ඇවතකින් චෝදනා කරන විට එය නිශ්චිත ලෙස ම දැන ක්‍රියා කළයුතු වෙයි. චෝදනා කරන භික්ෂුව චුදිත භික්ෂුවගේ යම් පාරාජිකාපත්තියක් නොදක්නේ ද නොඅසන ලද්දේ ද, සැක නොකරන ලද්දේ ද මෙසේ දැකීම්, ඇසීම් සැක කිරීම් යන මුල් හේතු නොමැති හෙයින් එම චෝදනාව අමූලක නම් වේ.

**අනුද්ධංසෙය්‍ය:**
ඇවතකට පැමිණි බවට චෝදනා කිරීමයි. තමන් විසින් චෝදනා කිරීම හෝ අනුන් ලවා චෝදනා කරවීම මෙහි දී සැලකේ.

සසුනෙන් නෙරපා හැරීම වැනි දුෂ්ට චේතනාවෙන් එබඳු බරපතල චෝදනාවක් කිරීම බලවත් වරදකි. චෝදනා කරන භික්ෂූන් වහන්සේ දැන දැන ම ඇවතකට පත්වීමට එය හේතුවක් වේ.

### පඨම දුට්ඨදොස සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක. මේ අවධියෙහි දබ්බමල්ලපුත්ත හිමියන් සත් හැවිරිදි වයසේදී ම රහත් විය. සියලු කෙලෙස් බර බිම තැබූ රහතන් වහන්සේට වතාවත් කරනු විනා අන් කළයුතු දෙයක් නොමැති හෙයින් උන්වහන්සේ මහා සංඝරත්නයට උපස්ථාන කිරීමට සිතූහ.

බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි දබ්බමල්ලපුත්ත හිමියෝ ස්වාමීනි, මහරහත් බව පසක් කළ මම ආර්ය සංඝරත්නයට උපස්ථාන කරනු කැමැත්තෙමි' යි ප්‍රකාශ කළහ. සේනාසන පැනවීම, දන් නියම කිරීම සඳහා බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලබාගත් දබ්බමල්ලපුත්ත හිමියෝ එතැන් පටන් මහත් උනන්දුවෙන් ප්‍රීතියෙන් එම කාර්යයෙහි නියැලුනහ. තමන් වහන්සේගේ ඍද්ධි බලයෙන් මහා සංඝයාට කැමති කැමති සේනාසන ද පනවති. කල් ගතවෙත් දී දබ්බමල්ල පුත්ත හිමියන් පිළිබඳ මහා සංඝයා වහන්සේ අතර මහත් ප්‍රසාදයක් හා ජනප්‍රියතාවයක් ඇති විය. මින් කෝපයට පත් මෙත්තිය භූම්මජක භික්ෂූහු උන්වහන්සේට අමූලික පාරාජිකාපත්තියකින් චෝදනා කළහ. මෙම කරුණ අරමුණු කරගත් බුදුරජාණන් වහන්සේ ඉහත ශික්ෂාපදය පනවා වදාළහ.

### දුතිය දුට්ඨදොස සංඝාදිසෙසාපත්තිය

**''යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය, අප්පෙවනාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යන්ති, තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අඤ්ඤභාගියං චෙව තං අධිකරණං හොති කොචිදෙසො ලෙසමත්තො උපාදින්නො, භික්ඛු ච දොසං පතිට්ඨාති, සංඝාදිසෙසො ''**

අර්ථය: කිසියම් භික්ෂුවක් කිපියේ, අනුන් ද කෙලෙසන සිත් ඇත්තේ, නොසතුටු සිත් ඇත්තේ, මේ භික්ෂුව මේ සසුනෙන් නෙරපා දමන්නෙමි යි සිතා භික්ෂුවකට අන් කෙනෙකු හා සම්බන්ධ අධිකරණයක් (අපරාධයක්) (ඒ තැනැත්තා හා චෝදනා කළ යුතු තැනැත්තා අතර ඇති) සුළු සමානකමක් පදනම් කරගෙන (ඔහුගේ වරද ද මොහුට ආරෝපණය කරමින්) පාරාජිකා ධර්මයකින් චෝදනා කරයි. ඉන් පසු අවස්ථාවක දී විමසනු ලබන්නේ හෝ නොවිමසනු ලබන්නේ එම අධිකරණය අනුන් හා සම්බන්ධ වූවක් ම වේ ද, ලේෂමාත්‍ර සමානත්වයක් ගෙන ඇත්තේ ද, චෝදක භික්ෂුව ද වරද පිළිගනී ද, සංඝාදිසෙසාපත්තිය සිදු වේ.

විවරණය:

**අඤ්ඤභාගියස්ස අධිකරණස්ස**

චෝදනා කරනු ලබන භික්ෂුවගෙන් අන්‍ය වූ කෙනෙකු හා සම්බන්ධ වරදක් ය යන අරුත දෙයි. එබඳු වරදක් තමා චෝදනා කරනු කැමති තැනැත්තාට ආරෝපණය කිරීම මින් අදහස් කෙරේ. අධිකරණ යන පදය මෙහි ආපත්තාධිකරණය පමණක් බලාපොරොත්තුවෙන් යොදා තිබේ.

**කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදිනනං**

චෝදනා කරන භික්ෂුවගේ හා චෝදනාවට මූලිකවූ ක්‍රියාව කළ පුද්ගලයා අතර සමනාත්වය මෙයින් කියවෙයි. ජාති, නාම, ගොත්ත, ලිංග, ආපත්ති, පත්ත, චීවර, උපජ්ඣාය. ආචරිය, සෙනාසන යන කරුණුවලින් එකක් හෝ කිහිපයක් එම ක්‍රියාව කළ පුද්ගලයාගේ හා භික්ෂුවගේ අතර සමානත්වය සලකා ආරෝපණය කිරීම මෙයින් අදහස් කරයි.

**දුතිය දුට්ඨදොස සංඝාදිසෙසාපත්ති නිදාන කතාව**

බුදුරජාණන් වහන්සේ රජගහනුවර ගිජුකුළු පව්වෙහි වෙසෙති. මේ කාලයේ මෙත්තිය-භුම්මජක භික්ෂූහු දබ්බමල්ලපුත්ත තෙරුන් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් පසු වූහ. උන්වහන්සේට අපවාදයක් කිරීමට මඟක් සොයන ඔවුහු එළුවකු හා එළුදෙනක ගිජුකුළු පව්ව අසල සංවාසයෙහි යෙදෙනු දුටහ. මෙහිදී ඒ එළුවාට දබ්බමල්ල කියා ද, එළුදෙනට මෙත්තියා කියා ද නම් පට බැන්දහ.

සෙසු භික්ෂූන් වහන්සේලා හමුවට ගිය මෙත්තිය භුම්මජක භික්ෂූහු ඇවැත්ති, පෙර ඇසූ පුවතක් අද සියැසින් ම දුටුවෙමු. දබ්බමල්ලපුත්ත තෙරුන් මෙත්තියා භික්ෂුණිය සමග ගිජුකුළු පව්ව පාමුල සංවාසයෙහි යෙදෙනු දුටුවෙමුයි පැවසූහ. සෙසු භික්ෂූන් වහන්සේලා ''එසේ නොකියව'' දබ්බමල්ල පුත්ත තෙරුන් එබඳු අයෙකු නොවේ යැයි කියා එම පුවත බුදුරජාණන් වහන්සේට සැලකළහ. බුදුරජාණන් වහන්සේ දබ්බමල්ලපුත්ත තෙරුන් කැඳවා එම කරුණ විමසූහ. තම දිවියෙහි සිහිනෙන් හෝ එබන්දක් සිදුනොවී යැ යි උන්වහන්සේ පැවසූහ. එවිට බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා ලවා මෙත්තිය භුම්මජක භික්ෂූන් පරීක්ෂා කරවා අමූලිකව ගොතන ලද චෝදනාවක් බව දැන මෙම ශික්ෂා පදය පනවා වදාළහ.

**පඨම සංඝභෙද සංඝාදිසෙසාපත්තිය**

> **"යො පන භික්ඛු සමග්ගස්ස සංඝස්ස භෙදාය පරක්කමෙය්‍ය, භෙදන සංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා සමග්ගස්ස සංඝස්ස භෙදාය පරක්කමි භෙදන සංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතායස්මා සංඝෙන සමග්ගො හි සංඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසුවිහරතී ති. එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව, පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාව තතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සංඝාදිසෙසො"**

අර්ථය: යම්කිසි භික්ෂුවක් සමගි සංඝයාගේ භේදය පිණිස උත්සාහ කරයි ද, භේදකර කාරණයක් හෝ දැඩි ව ගෙන සිටී ද, ඒ භික්ෂුවට සෙසු භික්ෂූන් විසින් මෙසේ පැවසිය යුතු ය. ඇවැත්නි සමගි සංඝයාගේ භේදය පිණිස වෑයම් නොකරන්න. භේදකර කරුණක් හෝ දැඩි ව ගෙන නො සිටින්න. ඇවැත්නි සංඝයා සමග එකතු වනු මැනවි. සමගි සංඝයා වනාහි ඔවුනොවුන් සතුටින් වාදවිවාද රහිතව එකට පාමොක් දෙසීම් කරන කල සුව සේ වෙසෙති යනුවෙනි. භික්ෂූන් විසින් මෙසේ පවසද්දීත් ඒ භික්ෂුව එසේ ම (අදහස්) දැඩි ව ගෙන සිටී නම් භික්ෂූන් විසින් තෙවන වර දක්වා (එය අත්හරිනු පිණිස) කරුණු කිව යුත්තේ ය. තෙවන වර දක්වා ම කරුණු කියන විට ඒ අදහස අත්හරී නම් එය යහපති. යම් හෙයකින් එය අත් නොහරී නම් සංඝාදිසෙසාපත්තිය සිදු වේ.

විවරණ:

**සමග්ගස්ස සංඝස්ස** සමගි සංඝයා හඳුන්වන පාරාජිකා පාලිය **''සමග්ගො නාම සංඝො සමාන සංවාසකො සමාන සීමායං ඨිතො''** යනුවෙන් සඳහන් කරයි. මෙයින් සමාන සංවාස හෙවත් එකට වාසය කරන, සමාන සීමාවෙහි සිටි සංඝයා අදහස් කෙරේ. සමාන සංවාස යන්නෙන් දෘෂ්ටි වශයෙන් වෙනසක් හෝ ප්‍රතිපදා වශයෙන් වෙනසක් හෝ නැතිව එකම ආකාරයකට බඹසර රකින යන අදහස දෙයි. එයින් ඔවුනොවුන්ගේ සමචිත්තතාව අදහස් කෙරේ. සමාන සීමා (සමාන සීමායං ඨිතෝ) යන්නෙන් කාය වශයෙන් ද වෙන්ව විසීමක් නැති බව අදහස් කෙරේ. සියලු දෙනා භේදයකින් තොරව එකම සීමාවට රැස්ව වෙති. එය 'සමග්ග සංඝ' යන යෙදුමෙන් අදහස් කෙරෙයි.

**භෙදන සංවත්තනිකං අධිකරණං** : සමගි සංඝයාගේ භේදයට හේතුවන කරුණු 18 ක් චුල්ල වග්ග පාළියේ සඳහන් වේ.

01. අධම්මං ධම්මොති දීපෙන්ති
අධර්මය ධර්මය යැයි දක්වති.

02. ධම්මං අධම්මොති දීපෙන්ති
ධර්මය අධර්මය යැයි දක්වති.

03. අවිනයං විනයොති දීපෙන්ති
අවිනය විනය යැයි දක්වති.

04. විනයං අවිනයොති දීපෙන්ති
විනය අවිනය යැයි දක්වති.

05. අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්ති
බුදුරජාණන් වහන්සේ දේශනා නොකරන ලද්දක් දේශනා කරන ලද්දක් මෙන් දක්වති.

06. භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති
බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දක් දේශනා නොකරන ලද්දක් මෙන් දක්වති.

07. අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති
බුදුරජාණන් වහන්සේ විසින් පුරුදු නොකරන ලද්දක් පුරුදු කරන ලදයි දක්වති.

08. ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්ති
බුදුරජාණන් වහන්සේ විසින් පුරුදු කරන ලද්දක් පුරුදු නොකරන ලද්දක් ලෙස දක්වති.

09. අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති
බුදුරජාණන් වහන්සේ විසින් නොපණවන ලද්දක් පණවන ලද්දක් ලෙස දක්වති.

10. පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්ති
බුදුරජාණන් වහන්සේ විසින් පණවන ලද්දක් නොපණවන ලද්දක් ලෙස දක්වති.

11. අනාපත්තිං ආපත්තීති දීපෙන්ති
ඇවැත් නොවන්නක් ඇවැතකැයි දක්වති.

12. ආපත්තිං අනාපත්තීති දීපෙන්ති
ඇවැතක් ඇවත් නොවේයැයි දක්වති.

13. ලහුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙන්ති
ලුහු ඇවැත් පාරාජිකා, සංඝාදිසේස යන ගරු ඇවැත් සේ දක්වති.

14. ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්ති

ගරු ඇවැතක් ලුහු ඇවැතකැයි දක්වති.

15. සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්ති

සාවසෙස හෙවත් පාරාජිකා හැර සෙසු ආපත්තිස්කන්ධ සයට අයත් ඇවැත් පාරාජිකා ස්කන්ධයට අයත් ඇවැත් සේ දක්වති.

16. අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්ති

අනවසෙස හෙවත් පාරාජිකාස්කන්ධයට අයත් ඇවැත් සෙසු ආපත්තිස්කන්ධ සයට අයත්කොට දක්වති.

17. දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති

දුට්ඨුල්ල හෙවත් පාරාජිකා සංඝාදිසෙස්ස කාණ්ඩවල අයත් ඇවැත් සෙසු ආපත්තිස්කන්ධ පහට අයත් සේ දක්වති.

18. අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්ති දීපෙන්ති

අදුට්ඨුල්ල හෙවත් සෙසු ආපත්ති ස්කන්ධ පහට අයත් ඇවැත් පාරාජිකා, සංඝාදිසෙස කාණ්ඩවල අයත් කොට දක්වති.

**සමනුභාසිතබ්බො** සමනුභාසන කර්මය කළ යුතු ය. මෙහි සමනුභාසන කර්මය නම් මෙවන් වැරදි අදහස් ගත් කෙනෙකුට එම අදහස අත්හරින ලෙස සංඝයා කරන බලකිරීමයි. එය සංඝයා මැදට ගෙන ගොස් ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුවක් විසින් ඤත්තිචතුත්ථ කර්ම වාක්‍යය ප්‍රකාශ කිරීමෙන් සමනුභාසන කර්මය කළ යුතු ය.

**පඨම සංඝභෙද සංඝාදිසෙසාපත්ති නිදාන කතාව**

බුදුරදුන් රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන අවදියකි. එකල දෙව්දත් තෙර සංඝයා පාලනය තමන් යටතට ගැනීමට නොයෙක් උපක්‍රම යෙදී ය. අවසානයේ දී කෝකාලික හිමියන් ඇතුලු පිරිසක් වෙත ගොස් අපි සංඝභේදයක් ඇති කරවමු යැයි පැවසීය. එවිට උන්වහන්සේලා බුදුරජාණන් වහන්සේ නම් මහත් සෘද්ධි ඇත්තාහ. කෙසේ නම් සංඝභේදයක් කරමු දැයි විමසූහ. ශ්‍රමණ ගෞතමයෝ අල්පේච්ඡතාව ආදී ගුණයන් වර්ණනා කරති. එබැවින් පංච වරයක් ඉල්ලමුයි කථා කර ගත්හ. ඔවුන් එය ඉල්ලූ කල බුදුරජාණන් වහන්සේ එය ප්‍රතික්ෂේප කරමින් යම් භික්ෂුවක් කැමති නම් පමණක් ඒවා අනුගමනය කළ හැකි බව දේශනා කළහ.

උන්වහන්සේලා පංච වරය ඉල්ලා නොලැබුණු තැන, සංඝ භේදය කිරීමට ඉටා ගත්හ. එය ම ආවුධයක් කරගෙන තම සංඝයාගේත් බුදුරදුන්ගේ සංඝයාගේත් වෙනස එය බව දක්වමින් සංඝයාට දොස් කීමට මහජනයා පෙළඹවූහ. ඇතැම් අඥාන පිරිස් දෙව්දත් තෙරුන්ගේ කීම පිළිගෙන උන්වහන්සේගේ පක්ෂය ගත්හ. තව පිරිසක් දෙව්දත් තෙරුන්ට දොස් කීහ. මෙය සැළවීමෙන් බුදුරජාණන් වහන්සේ මේ ශික්ෂා පදය පැණවූහ.

## දුතිය සංඝභෙද සංඝාදිසෙසාපත්තිය

තස්සෙව ඛො පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා එකො වා ද්වෙ වා තයො වා තෙ එවං වදෙය්‍යුං, 'මා ආයස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ ධම්මවාදී චෙසො භික්ඛු විනයවාදී චෙසො භික්ඛු අම්හාකං චෙසො භික්ඛු ඡන්දං ච රුචිඤ්ච ආදාය වොහරති, ජානාති නො භාසති, අම්හාකම්පෙතං ඛමතී'ති. තෙ භික්ඛූ භික්ඛූහි එවමස්සු වචනියා, මා ආයස්මන්තො එවං අවචුත්ථ න චෙසො භික්ඛු ධම්මවාදී න චෙසො භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සංඝභෙදො රුච්චිත්ථ සමෙතායස්මන්තානං සංඝෙන, සමග්ගො හි සංඝො සම්මොදමානො අවිවාදමානො එකුද්දෙසො ඵාසු විහරතී ති. එවඤ්ච තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථෙව පග්ගණ්හෙය්‍යුං තෙ භික්ඛූ භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානා නං පටිනිස්සජෙය්‍යුං, ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජෙය්‍යුං සංඝාදිසෙසොති.

අර්ථය:

සංඝභේදය පිණිස උත්සාහ කරන ඒ භික්ෂුවට අනුකූල වූ භේදයට පක්ෂ ව කථා කරන්නට එක් භික්ෂුවක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝ ඇත්නම්, ඔවුහු ඇවැත්නි ඒ (සංඝභෙදක) භික්ෂුවට කිසිවක් නොකියමු. ඒ භික්ෂුව ධර්මවාදී ය, විනයවාදී ය, හේ අපගේ ද කැමැත්ත හා රුචිය ද ගෙන (මෙසේ) කියයි. හේ අපගේ කැමැත්ත දනියි. අප සමග ද කතා කරයි. එය අපට ද රිසි වේ. යයි කියත් නම් ඒ භික්ෂූන්ට සෙසු (දැහැමි) භික්ෂූන් විසින් මෙසේ කරුණු කිව යුතු ය. ඇවැත්නි එසේ නොකියව්. ඒ භික්ෂුව ධර්මවාදී නොවේ. ඒ භික්ෂුව විනයවාදීත් නොවේ. ආයුෂ්මතුන් වහන්සේලාට ද සංඝභේදය රිසි නොවේවා. ආයුෂ්මතුන් වහන්සේලා ද සංඝයා සමග එකතු වනු මැනවි. සමගි සංඝයා වනාහි, සතුටින් විවාද රහිත ව එක් ව පාමොක් දෙසන කල පහසුවෙන් වෙසෙන්නාහ යනුවෙනි. ඒ භික්ෂූහු භික්ෂූන් විසින් මෙසේ කියද්දීත් ඒ අදහස එසේ ම දැඩිව ගෙන සිටිත් ද ඒ භික්ෂූහු භික්ෂූන් විසින් තුන්වන වර දක්වා ම සමනුභාසන කර්මය කළ යුතු වෙයි. තුන්වන වර දක්වා සමනුභාසනය කරන විට ඒ අදහස දුරලන්නාහු නම් යෙහෙකි. දුර නොලන්නාහු නම් සංඝාදිසෙසාපත්තිය සිදු වෙයි.

විවරණ:

සංඝ භේදයට උත්සාහ කරන භික්ෂුවගේ පක්ෂය ගෙන ඔහුගේ ගුණ වනමින් ඔහු ධර්මවාදී විනයවාදී බව පවසන කිසියම් භික්ෂුවක් හෝ වැඩි පිරිසක් හෝ සිටිත් නම් ඔහුට හෝ ඔවුනට අනෙක් භික්ෂූන් විසින් එසේ සංඝභේදක භික්ෂුවගේ පක්ෂය ගෙන ක්‍රියා නොකරන ලෙස අවවාද දිය යුතු අතර තෙවන වර දක්වා එසේ සමනුභාසන කර්මයෙන් හෝ නොහික්මුණහොත් ඒ සංඝභේදක භික්ෂුවට හෝ භික්ෂූන්ට සංඝාදිසෙසාපත්තිය සිදු වෙයි.

**අනුවත්තකා:**

සංඝභෙදක භික්ෂුව අනුව යන : ඔහුට රුකුල් දෙන යන අරුත මෙහි වෙයි.

**වග්ගවාදකා:**

සංඝයාගේ වර්ග වීමට හෙවත් භේද වීමට පක්ෂව කරුණු කියන්නහු වර්ගවාදකයෝයි.

**එකුද්දෙසො:**

ඒ ප්‍රදේශයේ වසන, ඒ සීමාවට අයත් සියලු භික්ෂූන් වහන්සේලා එකම සීමාවට රැස්ව එකට පාමොක් දෙසීමයි. (පොහොය කිරීම)

**දුතිය සංඝභෙද සංඝාදිසෙසාපත්ති නිදාන කතාව**

බුදුරදුන් රජගහ නුවර වේළුවනාරාමයේ වෙසෙන සමයෙකි. එකල දෙව්දත් තෙර සංඝභේදය සඳහා ගිහි පැවිදි පිරිස මෙහෙයවමින් සිටී. ඔහුට පක්ෂපාතී වූ කෝකාලික කටමෝරක තිස්ස ආදී භික්ෂු පිරිසක් ද වූහ. ඔවුහු සෙසු භික්ෂූන් දෙව්දත් තෙරුන්ගේ වෑයමට දොස් කියන කල දෙව්දත් තෙරුන්ගේ නිවැරදි බවත් ඔහු එසේ කරන්නේ තමන්ගේ ද කැමැත්ත ඇතිව බවත් ඒ ක්‍රියාවට තමන් ද කැමති බවත් පැවසූහ. එවිට සංඝභේදය රිසි නොවූ දැහැමි භික්ෂූහු ඒ බව බුදුරදුන්ට දැන්වූහ. ඒ නිමිති කොට උන්වහන්සේ මේ සිකපදය පැණවූහ.

**දුබ්බච සංඝාදිසෙසාපත්තිය**

**භික්ඛු පනෙව දුබ්බච ජාතිකො හොති, උද්දෙස පරියාපන්නෙසු සික්ඛාපදෙසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති. 'මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ. කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි. කල්‍යාණං වා පාපකං වා විරමථාය සමන්තො මම වචනායාති. සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි වචනීයමෙවායස්මා අත්තානං කරොතු, ආයස්මාපි භික්ඛු වදෙතු සහධම්මෙන, භික්ඛූපි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන එවං සංවද්ධාහි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤ වචනෙන අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනෙනාති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය. යාව තතියඤ්චෙ සමනුභාසිය මානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සංඝාදිසෙසො.**

අර්ථය:

කිසියම් භික්ෂුවක් දුර්වච (අකීකරු) ස්වභාව ඇත්තේ වෙයි. ප්‍රාතිමෝක්ෂයේ ඇතුළත් ශික්ෂාපද පිළිබඳ ව සෙසු භික්ෂූන් විසින් විනයානුකූලව කරුණු කියන කල්හි ද, ඇවැත්නි, මට යහපත් වූ හෝ අයහපත් වූ හෝ කිසිවක් නො කියව්. මම ද ආයුෂ්මතුනට යහපත් වූ හෝ අයහපත් වූ හෝ කිසිවක් නොකියමි. ආයුෂ්මතුනි, මට අවවාද කිරීමෙන් වළකිනු මැනවැ'යි කියා තමා අවවාද නොකළ යුත්තකු කරයි නම්, ඒ භික්ෂුව සෙසු භික්ෂූන් විසින් මෙසේ කිව යුතු වන්නේ ය. ඇවැත්නි තමා අවවාද නොකළ යුත්තෙකු නො කරව. තමා අවවාද කළ යුත්තෙකු ම කරව. ආයුෂ්මතුන් ද භික්ෂූන්ට විනයානුකූලව කරුණු කියනු මැනවි. භික්ෂූන් ද ආයුෂ්මතුන්ට විනයානුකූලව කරුණු කියනු ඇත. ඒ භාග්‍යවතුන් වහන්සේගේ සඟ පිරිස මෙසේ ඔවුනොවුන්ට අවවාද කර ගැනීමෙන් ඔවුනොවුන් (ඇවතින්) නඟාලීමෙන් වැඩෙන්නේ ය යනුවෙනි. ඒ භික්ෂුව මෙසේ භික්ෂූන් විසින් කරුණු කියනු ලබන්නේත් එසේ ම ඒ අදහස දැඩිව ගන්නේ නම් ඒ භික්ෂුව ඒ අදහස අත්හරිනු පිණිස භික්ෂූන් විසින් තුන්වන වර දක්වා සමනුභාෂණ කර්මය කළ යුතු වන්නේ ය. තුන්වන වර දක්වා සමනුභාෂණය කරන්නේ එය අත්හළේ නම් යෙහෙකි. අත් නොහළේ නම් සංඝාදිසෙසාපත්තිය වෙයි.

විවරණ:

**දුබ්බච ජාතිකො:** වචනයට කීකරු නොවන, අවවාදක්ෂම නොවන, අකීකරු

**උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු:-** උද්දෙසය යනු ප්‍රාතිමොක්ෂයයි. ප්‍රාතිමෝක්ෂයට අයත් ශික්ෂාපද මෙයින් ගැනේ.

**සහධම්මිකං:** බුදුරජාණන් වහන්සේ විසින් පණවන ලද ශික්ෂාපද සමූහය 'සහධම්මික' නම්, ඒ ශික්ෂාපදවලට අනුව අවවාද කෙරේ යන අදහස ය.

**අවචනීයං කරොති:** තමාට කවුරුවත් අවවාද නොකළ යුතුය යි කියයි.

**දුබ්බච සංඝාදිසෙසාපත්ති නිදාන කතාව**

බුදුරජාණන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වෙසෙන අවදියෙකි. එසමයෙහි ඡන්න තෙරුණුවෝ නොයෙකුත් අකීකරුකම් කරති. එවිට සෙසු භික්ෂූහු ඇවැත්නි, මෙසේ නො කරව, එය කැප නැතැ යි අවවාද කරති. එවිට ඡන්න තෙර, 'මට අවවාද නො කරව්, බුදුරදුන් අපේ ය, ධර්මය ද අපේ ය. අපගේ ආර්යයන් වහන්සේ බුදුබවට පත් වූහ. අපට අවවාද කරන්නට ඔබට ඇති අයිතිය කුමක් ද? ආදී වශයෙන් අවවාද ප්‍රතික්ෂේප කරයි.

ඡන්න තෙරුන්ගේ නොමනා හැසිරීම් පිළිබඳව නොසතුටට පත් භික්ෂූන් වහන්සේලා ඒ බව බුදුරදුන්ට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කොට මේ ශික්ෂා පදය පණවා වදාළහ.

## කුලදූසක සංඝාදිසෙසාපත්තිය

භික්ඛු පනෙව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති. කුලදූසකො පාපසමාචාරො, තස්ස ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව, සූයන්ති ච කුලානි ච තෙන දුට්ඨානි දිස්සන්ති චෙව සූයන්ති ච සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො: ආයස්මා ඛො කුලදූසකො පාප සමාචාරො ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සූයන්ති ච කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සූයන්ති ච පක්කමතායස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා ති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ එවං වදෙය්‍ය ඡන්දගාමිනො ච භික්ඛූ දොසගාමිනො ච භික්ඛූ මොහගාමිනො ච භික්ඛූ භයගාමිනො ච භික්ඛූ තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති එකච්චං න පබ්බාජෙන්තී ති. සො භික්ඛු භික්ඛූහී එවමස්ස වචනීයො. මායස්මා එවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො. න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ. භයගාමිනො, ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙව සූයන්ති ච' කුලානිචායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙව සූයන්ති ච පක්කමතායස්මා ඉමම්හා අවාසා, අලං තෙ ඉධ වාසෙනාති එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාව තතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය. යාව තතියඤ්ච සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය සංඝාදිසෙසොති.''

අර්ථය:

භික්ෂුවක් වනාහි කුලයක් දූෂණය කරමින්, ළාමක පැවතුම් ඇතිව කිසියම් ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කරමින් වෙසේ ද, ඔහුගේ ළාමක හැසිරීම් දක්නට හෝ අසන්නටවත් ලැබේ ද එහු නිසා දූෂිත වූ කුලයන් ද දක්නට හා අසන්නට ලැබේ ද, ඒ භික්ෂුවට භික්ෂූන් විසින් මෙසේ පැවසිය යුතු වන්නේ ය.

''ආයුෂ්මතුනි ඔබ කුල දූෂකයෙකි, ළාමක හැසිරීම් ඇත්තෙකි. ආයුෂ්මතුන්ගේ ළාමක හැසිරීම් දකින්නටත් අසන්නටත් ලැබේ. ඇවැත්නි ආවාසයෙන් බැහැර වන්න. ඔබ මෙහි විසීමෙන් පලක් නැත'' යනුවෙනි. භික්ෂූන් විසින් මෙසේ කියනු ලබන කල්හි 'භික්ෂූහු ඡන්දගාමීහු ය, දොසගාමීහු ය, මොහගාමීහු ය, භයගාමීහු ය, මෙබඳු ඇවතකින් ඇතමෙකු අරමින් බැහැර කරවත්, ඇතමෙකු බැහැර නොකරවත්, යනුවෙන් ඒ භික්ෂුව කියන්නේ නම් භික්ෂූන් විසින් මෙසේ පැවසිය යුතු වන්නේ ය. ඇවැත්නි එසේ නොකියව, භික්ෂූහු ඡන්ද, දෝස, මෝහ, භය ගාමීහු නොවෙති. ආයුෂ්මත් කුලදූෂකයෙකි. ළාමක හැසිරීම් ඇත්තෙකි. ආයුෂ්මතුන් විසින් දූෂිත කුලයන් ද දකින්නටත් අසන්නටත් ලැබේ. ආයුෂ්මතුනි මේ ආවාසයෙන් පිට වෙන්න. ඔබ මෙහි විසීමෙන් පලක් නැත යනුවෙනි. ඒ භික්ෂුව, භික්ෂූන් විසින් මෙසේ කියනු ලබද්දීත් එසේම සිය අදහස ගෙන සිටී ද, ඒ භික්ෂුව භික්ෂූන් විසින් තුන්වන වර දක්වා අදහස බැහැර කරවීමට සමානුභාසන කර්මය කටයුතු

වන්නේ ය. තුන්වන වර දක්වා සමනුභාසනය කිරීමෙන් එය අත් හරින්නේ නම් යෙහෙකි. අත් නොහරින්නේ නම් සංඝාදිසෙසාපත්තිය වෙයි.

**විවරණ:**

**කුලදූසකො:**

බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය සහ ශුද්‍ර යනුවෙන් කුල සතරෙකි. ඒ හා සමානව අද කුමන හෝ පවුලක පවතින ශ්‍රද්ධාව විනාශ කරන්නා කුලදූසක නම් වෙයි. පහන් වූ හෝ නොපහන් වූ හෝ කුලයන් යම් යම් දෑ දීමෙන්, වෙදකමින්, හසුන් ගෙන යාම ආදියෙන් කෙළෙසීමයි. තිබෙන ප්‍රසාදය නැතිවීමත්, නැති ප්‍රසාදය ඇති නොවීමත් ඉන් අදහස් කෙරේ.

**පාප සමාචාරො:**

ශ්‍රමණසාරූප්‍ය නොවන ළාමක, පහත් හැසිරීම පාපසමාචාර නම්. කුලයන්හි ඇලී ගැලී වෙසෙමින් ගිහියන් සේ කුලයන්හි කුදුමහත් කටයුතුවලට සම්බන්ධ වීම මෙයින් අදහස් කෙරේ. කුල සංග්‍රහය සඳහා කැප භූමියක හෝ අකැප භූමියක

**01. මල්පැල රෝපණය කිරීම, කරවීම.**
**02. පැන් ඉසීම, ඉස්ස වීම.**
**03. මල් නෙලීම, නෙලවීම.**
**04. මල් දම් ගෙතීම, ගෙතවීම.**

ආදී ක්‍රියා පාප සමාචාර ක්‍රියා නම් වෙයි.

## කුලදූසක සංඝාදිසෙසාපත්ති නිදාන කතාව

බුදුරදුන් සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වෙසෙන සමයෙක අස්සජි, පුනබ්බසුක නම් වූ ඡබ්බග්ගිය භික්ෂූහු දෙනම කීටාගිරියෙහි විසූහ. ඔවුහු කුල සංග්‍රහ පිණිස මල් වතු වැවීම් ආදියෙන් ගිහියන්ට උපකාර කරති. ඔවුන්ගේ ක්‍රියාවලට හුරුපුරුදු වූ ගම්වැසියෝ එහි වැඩම කළ සුපේශල භික්ෂූන්ට සංග්‍රහ නොකළහ. ඒ ඔවුන්ට ඒ භික්ෂූන්ගෙන් පලක් නැත කියා ය. එසේ ගිය එක් භික්ෂු නමක් බුදුරදුන් වෙත පැමිණ ඒ බව සැළ කළේ ය. බුදුරජාණන් වහන්සේ අග්‍රශ්‍රාවකයින් වහන්සේලා කැඳවා කීටාගිරියට ගොස් අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට පබ්බාජනීය කර්මය කරන ලෙස නියම කළහ. උන්වහන්සේලා එසේ කළහ. එහෙත් එය අස්සජි පුනබ්බසුකයෝ නො පිළිගත්හ. ඒ වෙනුවට එලෙස ම හැසිරෙමින් පෙරළා සංඝයාට ආක්‍රෝශ කරන්නට ද වූහ. මේ නිමිති කොට මේ සික පදය පණවන ලදි.

බුද්ධ ශාසනය තුළ ඇති බරපතල ම වැරදි පාරාජිකා නමින් හැඳින්වේ. එම බරපතල ආපත්තියකට පැමිණි භික්ෂුව නැවත භික්ෂූන් හා සහවාසයට නුසුදුසු ය. එහෙත් සංඝාදිසේසාපත්තියකට පැමිණි භික්ෂුවකට සංඝයාගෙන් සම්පූර්ණයෙන් ඉවත් වීමට සිදු නොවෙයි. එහි පාරිශුද්ධිය ලබා ගත හැකි ය. ඉන්පසු ප්‍රකෘති උපසපන් භික්ෂුවකගේ තත්ත්වයට පැමිණිය හැකි ය.

**අභ්‍යාස**

01. සංඝාදිසේස යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න
02. සංඝාදිසේස හා පාරාජිකා අතර වෙනස පෙන්වා දෙන්න.
03. සංඝාදිසේසාපත්තියකට අයත් නිදාන කතාවක් ලියන්න.
04. පහත සඳහන් වචනවල අර්ථය පෙන්වා දෙන්න.

    1. වත් සමාදානය
    2. මානත පිරීම
    3. අබ්භාන කර්මය
    4. අඤ්ඤත්‍ර සුපිනන්තා
    5. මහල්ලකං

09
පාඩම

# විනය - අවිනිශ්චිත විනිශ්චය

සංඝාදිසේසුද්දේසයෙන් අනතුරුව උදෙසනුයේ අනියත ශික්ෂාද්වයයි. අනියත යනු අවිනිශ්චිත, ස්ථිර වශයෙන් නොදත් යන අරුත් ප්‍රකට කරයි. අනියත ශික්ෂා දෙකකි. එනම් ආපත්තිය පිළිබඳ නිශ්චයක් නැති වැරදි සම්බන්ධ ශික්ෂාපද දෙකකි. මේ ආපත්ති සිදුවන්නේ භික්ෂුවක් මාගමක් සමග හුදකලාව සිටීමෙන් පාරාජිකා, සංඝාදිසේස හා පාචිත්තිය යන ඇවැත් තුනින් එකකින් චෝදනා ලැබීම අනුව ය. පළමු ශික්ෂාවට අනුව මෛථුනයට යෝග්‍ය ස්ථානයක මාගමක හා හුදකලා වීමෙනුත්, දෙවන ශික්ෂාවට අනුව මෛථුනයට අවකාශ නැති තැනෙක මාගමක හා හුදකලා වීමෙනුත් චෝදනාවට ලක්වීමට ඉඩ තිබේ. මේ ශික්ෂා අනුව චෝදනා කළ හැක්කේ ඇදහිය හැකි වදන් ඇති උවසියකට පමණි. එනම් දිට්ඨප්පත්ත, විඤ්ඤාත සාසන වශයෙන් ගත හැකි සම්‍යක් දෘෂ්ටික, සසුන හඳුනන උවසියකට පමණි. එවැන්නියක් බොරු චෝදනා කිරීමට නො පෙළඹෙන බැවිනි. ඒ උවැසිය චෝදනා කරන ඇවත පාරාජිකා වේවා, සංඝාදිසේස වේවා, පාචිත්තිය වේවා ඒ කවර ඇවතකින් නමුත් භික්ෂුවට චෝදනා කළ යුත්තේ උන්වහන්සේ පත්වූයේ යයි පිළිගන්නා ඇවතකින් පමණි. 'අනියත' යන ව්‍යවහාරය කරන්නේ එහෙයිනි. කිසියම් සිද්ධියක දී භික්ෂුවකට පාරාජිකාදී ඇවතකින් චෝදනා කරන විට ඒ භික්ෂුව ඒ චෝදනා කරන ඇවත නොපිළිගනී නම් එම ඇවතින් චෝදනාව පැවරිය නො හැකි ය. එහි දී ඒ භික්ෂුව පිළිගන්නා ඇවතක් පැවරිය යුතු වෙයි. එබඳු අවස්ථා අනියත නම් වෙයි.

## ප්‍රථම අනියත ශික්ෂා පදය

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලං කම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍ය වචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍ය වචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො අයං ධම්මො අනියතො.**

පදාර්ථය:

යම්කිසි භික්ෂුවක් ස්ත්‍රියක සමග හුදෙකලා ව රහසිගත ව ආවරණය වූ මෛවුන්දමට යෝග්‍ය වූ අසුනක හිඳී ද ඇදහිය යුතු බස් ඇති උපාසිකාවක් එසේ හිඳින භික්ෂුව දැක පාරාජික, සංඝාදිසෙස, පාචිත්තිය යන ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන් යම් ආපත්තියකින් චෝදනා කරයි ද, තමන් එසේ හුන් බව භික්ෂුව පිළිගන්නේ නම් පාරාජිකා, සංඝාදිසෙස,

පාචිත්තිය යන ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන්, ඇදහිය යුතු බස් ඇති උපාසිකාව චෝදනා කරන ඇවතින් භික්ෂුවට ක්‍රියා කරවිය යුතු ය. මේ අනියත ඇවතයි.

**විවරණයඃ**

**මාතුගාමෙනඃ**

මාගම යනු ස්ත්‍රියයි. මෙහි දි මනුස්ස නොවන යක්ෂ, ප්‍රේත, තිරශ්චීන ආදී මනුෂ්‍ය නොවන ස්ත්‍රිය අනියත සඳහා වලංගු නොවෙයි.

**රහොඃ**

යනු බාහිර කිසිවෙකුට නොපෙනෙන පරිදි අප්‍රකටව සිටීමයි.

**අලංඃ**

යනු සුදුසු යන අර්ථයි.

**කම්මනියඃ**

යනු මෙවුන්දම් කර්මයට යෝග්‍ය වූ යන අර්ථයයි.

**නිසජ්ජං කප්පෙය්‍යඃ**

මෙහි දී හිඳීම හෝ සයනය කිරීම විශේෂයෙන් අදහස් කෙරේ.

**සද්ධෙය්‍ය වචසා උපාසිකාඃ**

සෝවාන් ආදී මගඵල ලැබූ ආර්ය ශ්‍රාවිකාවක් අදහස් කෙරේ.

**පටිජානමානොඃ**

ඒ හුන් භික්ෂුව ඒ චෝදනාව ඒ ආකාරයෙන් පිළිගන්නේ නම් පමණක් ක්‍රියා කළ යුතු බව මෙයින් අදහස් කෙරේ.

**නිදානයඃ**

බුදුරදුන් සැවැත් නුවර දෙව්රම්හි වැඩ වෙසෙන සමයෙහි උදායි තෙර උපස්ථායක කුල හා ඉතා කුලුපග ව වෙසේ. වරක් උන්වහන්සේගේ කුලුපග පවුලකින් කුමරියක් එබඳු වූ ම පවුලකට පාවා දෙන ලදි. ඒ කුමරිය සොයා ගෙන එහි ගිය උන්වහන්සේ එහි ඇතුළු කාමරයක ඇය සිටි තැනට ම ගොස් අසුනෙක වාඩි වී ධර්ම කථාවක යෙදුණේ ය. එම ගෙදර විශාඛාවට ද ගරු කරන තැනකි. ඒ අවස්ථාවේ ඔවුන්ගේ ඇරයුම් පරිදි ඇය ද එහි ආවා ය. එහි දී උදායි තෙරුන්ගේ මේ ක්‍රියාව දුටු උපාසිකාව උන්වහන්සේට එහි වරද ගැන කරුණු කීවා ය. එය උන්වහන්සේ නොපිළිගත්හ. පසුව මෙය විශාඛාවගෙන් දැනගත් භික්ෂූහු බුදුරදුන්ට දැන්වූහ. බුදුහු ඒ නිමිති කොට සිකපදය පැණවූහ.

**දෙවන අනියත ශික්ෂා පදය**

න හෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලං කම්මනියං අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං, යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය තමෙනං සද්ධෙය්‍ය වචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍යා වචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො අයම්පි ධම්මො අනියතො.

පදාර්ථය:

ආසනය ආවරණය වූවක් නොවේ. මෙවුන්දම් ක්‍රියාවකට සුදුසු ද නොවේ. එහෙත් ස්ත්‍රියක් හා අසැබි වදනින් කථා කිරීමට ප්‍රමාණවත් වෙයි. යම් භික්ෂුවක් එබඳු අසුනක හුදෙකලා ව රහසිගත ව හිඳින්නේ නම් එය ඇදහිය යුතු බස් ඇති උපාසිකාවක දැක සංඝාදිසෙස හෝ පාචිත්තිය යන ද්විධ ආපත්තීන් ගෙන් එකකින් චෝදනා කරයි ද භික්ෂුව ද එම හිඳීම පිළිගන්නේ නම් සංඝාදිසේස, පාචිත්තිය යන ඇවැත් අතුරෙන් ඒ ඇදහිය යුතු වචන ඇති උපාසිකාව චෝදනා කරන ඇවතකින් එම භික්ෂුවට ක්‍රියා කරවිය යුතු ය. මෙය ද අනියත ආපත්තියකි.

විවරණය:

**'නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති'**

මෙය පාරාජිකාවකින් චෝදනා කිරීමට තරම් ආවරණය වූවක් නොවේ. එබැවින් සෙසු ආපත්තිවලින් පමණක් චෝදනා කිරීමට ඉඩ ඇත. සංඝාදිසේසයෙන් වුව ද දුට්ඨුල්ලාපත්තියකට පමණි, ඉඩ ඇත්තේ.

නිදාන කතාව:

බුදුරදුන් සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයකි. පළමු අනියත සික පදය පැණවීමෙන් පසු ව එම නිවසට ම ගිය උදායී තෙරණුවෝ ආවරණය නොවූ එහෙත් හුදෙකලා තැනක හිඳ ඒ කුමරිය සමග ධර්ම කතා පැවැත්වී ය. එහි ද සපැමිණි විශාඛාව දැක කරුණු කීවා ය. උන්වහන්සේ නොපිළිගත්හ. මෙය බුදුරදුන්ට සැළවීමෙන් පසු මෙම සිකපදය පදවන ලදි.

සැ.යු.

**මේ අනියත සිකපද දෙකේ ද, උපාසිකාවගේ සාක්ෂිය වැදගත් ය. ඇය ඇදහිය යුතු කෙනෙකු විය යුතු ය. එසේම වාඩි වී සිටිනු මිස පළමු සික පදයේ දී පාරාජිකාදියට අදාළව හෝ දෙවැන්නේ සංඝාදිසේසාදියට අදාළ ව හෝ කරුණු ඉදිරිපත්ව නැත. චෝදනාව කෙරෙන්නේ සිටින ආකාරයට අනුව ය. එබැවින් මෙය සැකය මත කෙරෙන චෝදනාවකි. මේ අනුව සාක්ෂිකාරිය කියන ආපත්තියෙන් චෝදනා කළ හැක්කේ චූදිත භික්ෂූන් වහන්සේ එය පිළිගන්නේ නම් පමණකි. මේ නිසා මේ දෙක අනියත වෙයි.**

10
පාඩම

# ත්‍රිපිටක සාහිත්‍යය

ත්‍රිපිටකය නම් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයත් පණවා වදාළ විනයත් ය. එයින් විනය ''විනය පිටකය'' වශයෙන් ද, ධර්මය ''සූත්‍ර පිටකය'' හා ''අභිධර්ම පිටකය'' වශයෙන් ද පිටක තුනකට බෙදේ. පිටක යන්නෙන් භාජනය, කූඩය, සංග්‍රහය (එකතුව) යන අර්ථ කියැවේ. මෙහිදී පිටක යන්න යෙදී ඇත්තේ සංග්‍රය යන අර්ථයෙනි. විශේෂයෙන් ආගමික ග්‍රන්ථ හැඳින්වීම සඳහා ද පිටක යන්න යෙදෙන බව කාලාම සූත්‍රයේ එන '**මා පිටක සම්පදානෙන**' යන පාඨයෙන් පෙනේ.

**පාලි භාෂාව**

ථෙරවාදී ත්‍රිපිටකයට මාධ්‍ය වූ භාෂාව පාලි භාෂාවයි. ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගී වූ පන්සියයක් මහරහතන් වහන්සේලාගෙන් පැවත එන බෞද්ධ සම්ප්‍රදාය ථේරවාද නම්. දෙවන සංගායනාවෙන් පසු බෙදී ගිය අනෙක් සම්ප්‍රදාය මහායානයයි. එහි ත්‍රිපිටකයේ මාධ්‍ය භාෂාව සංස්කෘතයයි.

බුදුරදුන් දවස භාරතයේ සංස්කෘත (වෛද භාෂාව) ප්‍රාකෘත, මාගධී, අර්ධ මාගධී, පෛශාචී, ශෞරසේනි යනුවෙන් ප්‍රධාන භාෂා හයක් සහ ඒවා සමග බැඳුනු අතුරු භාෂා රාශියක් පැවතිණ. එයින් පාලි භාෂාවට ප්‍රධාන වශයෙන් මුල් වූයේ මාගධී භාෂාවයි. එහෙයින් එය මාගධී නමින් ද හැඳින්වේ. එහෙත් පාලි භාෂාව මාගධී භාෂාව හෝ තත්කාලීන වෙනත් භාෂා සමග එකහෙළා ම සමාන නොවන වෙනම ම භාෂාවකි. එසේ වීමට හේතුව විවිධ භාෂා ව්‍යවහාර කළ පිරිස් බුදුසසුනට ඇතුල් වී කටයුතු කිරීමේදී, ධර්ම දේශනා කිරීමේදී හා ධර්මය ඉගැන්වීමේදී ඒ ඒ ඇත්තන්ගේ පුරුදු භාෂා ව්‍යවහාර එකට සංකලනය වී පොදු භාෂාවක් නිර්මාණය වීමයි. කෙසේ වෙතත් ප්‍රථම ධර්ම සංගායනාවේදී අද පවතින පාලි භාෂාව ත්‍රිපිටකයේ මාධ්‍ය භාෂාව සේ සම්මත විය.

බුදු දහමේ භාෂාව ලෙස පාලි භාෂාව භාවිත වන්නේ ශ්‍රී ලංකාව, මියන්මාරය, තායිලන්තය ආදී ථෙරවාදී බුදුදහම පවතින රටවල පමණි. චීනය, ජපානය, කොරියාව ආදී මහායාන බුදුදහම පවතින රටවල බුදු දහමේ භාෂාව වන්නේ සංස්කෘතයයි.

පාලි භාෂා මාධ්‍යයෙන් ලියැවී ඇත්තේ ත්‍රිපිටකය, අටුවා, ටීකා, මූලික ධර්ම ග්‍රන්ථ හා පාලි භාෂාවට අදාළ ව්‍යාකරණ ඡන්දස් අලංකාර ග්‍රන්ථත් බෞද්ධ සංස්කෘතියට හා බෞද්ධ ඉතිහාසයට අදාළ වංස කථා ආදී ග්‍රන්ථ ස්වල්පයකුත් පමණි. සැකෙවින් කිවහොත් බුදුදහමටත් බෞද්ධ සංස්කෘතියටත් පාලි භාෂාවටත් පිටස්තර ග්‍රන්ථ කිසිවක් පාලි භාෂාවෙන් ලියැවී නැත. **භෙසජ්ජ මඤ්ජූසා** නම් වෛද්‍ය ග්‍රන්ථයක් ඇති අතර එයත්

භික්ෂූන් වහන්සේ නමක විසින් ලියන ලද බෞද්ධ ග්‍රන්ථයක් සේ සැලකෙන්නකි. අනෙක් සුවිශේෂ කාරණය නම් මූලික ත්‍රිපිටකයට පරිබාහිරව අමුතුවෙන් ලියැවුණු වංස කථා ආදි සියලු ග්‍රන්ථ භික්ෂූන් වහන්සේලා විසින් ම ලියන ලද ඒවා වීම ය. ගිහියෙකු විසින් ලියන ලද කිසිදු ග්‍රන්ථයක් පාලි සාහිත්‍යයේ නැත.

## බුද්ධ දේශනාව

බුදුරජාණන් වහන්සේ තම ධර්මය හඳුන්වමින් වදාළ ප්‍රථම ප්‍රකාශය වන **චරථ භික්ඛවෙ චාරිකං** ආදී පාඨයේ සඳහන් වන පරිදි මුලදීම බුද්ධ දේශනාව හඳුන්වා ඇත්තේ **ධම්ම** සහ **බ්‍රහ්මචරිය** යනුවෙනි. විනය පැනවීමෙන් පසු එය **ධම්ම විනය** යනුවෙන් හඳුන්වන්නට පටන් ගෙන තිබේ.

බුද්ධ දේශනාව වර්ග කිරීම් හෝ බෙදීම් ගැන සලකන විට බුදුරජාණන් වහන්සේ විසින් ම ධර්මය වර්ග කර ඇත්තේ ''නවංග සත්ථු සාසනය'' වශයෙනි. ඒ අනුව එහි **සුත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වෙදල්ල** යනුවෙන් අංග නවයකි. එහෙත් ඒවා බුද්ධ ධර්මය වෙන් වෙන් ව සංග්‍රහ කළ ග්‍රන්ථ නොව දේශනාවේ විශේෂ ලක්ෂණ වූ අංගයන් ය. දේශනා වර්ගයන් ය. ප්‍රථම ධර්ම සංගායනාවේදී ධර්ම විනය පිටක වශයෙන් තුනකටත්, ග්‍රන්ථ වශයෙන් විසි එකකටත් (21) බෙදුණු නමුත් එම බෙදීම් සිදු කර ඇත්තේ ඉහත කී අංග නවයට නොවේ. එහෙත් අටුවාචාරීන් වහන්සේලා පසුව ත්‍රිපිටක ග්‍රන්ථ එම නවාංගය සමග ගලපන්නට උත්සාහ ගෙන තිබේ. එය මෙසේ ය.

**සුත්ත** සම්පූර්ණ විනය පිටකයත් සුත්ත නිපාතයේ එන මංගල, රතන, නාලක, තුවටක යන සූත්‍රත් සූත්‍ර නමින් හැඳින්වෙන වෙනත් දේශනාවනුත් සුත්ත අංගයට ගැනේ. විනය පණවන්නට පෙර භික්ෂූන් වහන්සේගේ හික්මීමට අවශ්‍ය කරුණු ඇතුළත් වූයේ සූත්‍රවල ය. දීඝ නිකායේ සීලක්ඛන්ධ වර්ගයේ සඳහන් වන චූල්ලසීල, මජ්ඣිම සීල, මහා සීල ඊට නිදසුන් ය. එනිසා විනය පැනවීමෙන් පසු ඒ විනය කාරණා සුත්ත විභංග නමින් හැඳින්විණ. මෙම නවාංගයේදී විනය සුත්ත ගණයට ඇතුළත් කර ඇත්තේ එහෙයිනි.

**ගෙය්‍ය** සියලු ම ගාථා සහිත සූත්‍ර ගෙය්‍ය නමි. විශේෂයෙන් සංයුත්ත නිකායේ සගාථක වර්ගය මීට අයත් ය.

**වෙය්‍යාකරණ** සම්පූර්ණ අභිධර්ම පිටකයත්, ගාථා රහිත සූත්‍රත් සෙසු අංග අටට අයත් නොවන දේශනාවනුත් වෙය්‍යාකරණ ගණයට ගැනේ. උදාහරණයක් ලෙස දම්සක් පැවතුම් සූත්‍රයේ ''ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං'' යනුවෙන් සූත්‍රයේදී ම එයට වෙය්‍යාකරණ යන නම යෙදී ඇත.

**ගාථා** ධම්ම පද, ථෙර ගාථා, ථෙරී ගාථා යන ග්‍රන්ථත් සුත්ත නිපාතයේ සූත්‍ර නාමයෙන් හඳුන්වා නැති ''වත්ථු ගාථා '' වැනි ශුද්ධ ගාථා ද ගාථා අංගයට අයත් වේ.

**උදාන** බුදුරජාණන් වහන්සේ විසින් සොම්නස හා ඥාණමය ප්‍රීතියත්, ධර්ම සංවේගයත් පදනම් කරගෙන වදාළ ''අනෙක ජාති සංසාරං'' වැනි ගාථා දේශනා උදාන නම්. උදාන පාලියේ එබඳු උදාන අඩංගු සූත්‍ර අසූ තුනක් ඇත.

**ඉතිවුත්තක** ඉතිවුත්තක පාලියේ එන ''වුත්තං හෙතං භගවතා'' ආදී වශයෙන් සංග්‍රහ කර ඇති එකසිය දහයක් වූ සූත්‍ර දේශනා ඉතිවුත්තක නම් වේ.

**ජාතක** බුදුරජාණන් වහන්සේගේ බෝසත් ජීවිත ගැන කියැවෙන **අපණ්ණක** ආදී පන්සිය පනහක් පමණ වූ දේශනා ජාතක නම්.

**අබ්භුතධම්ම** බෝසතාණන් වහන්සේ පිළිබඳවත් බුදුරජාණන් වහන්සේ පිළිබඳවත් ආනන්ද ආදි රහතන් වහන්සේලා පිළිබඳ ව ත් ආශ්චර්ය අද්භූත කරුණු ඇතුළත් **අච්ඡරිය අබ්භූත** සූත්‍රය වැනි දේශනා අබ්භූත ධම්ම නම්.

**වෙදල්ල** වේද හෙවත් ඥානයත් සතුටත් ලබමින් විමසන ප්‍රශ්නෝත්තර ඇතුළත් චූල්ල වේදල්ල, මහා වේදල්ල, සම්මා දිට්ඨි, සක්ක පඤ්හ, සංඛාරව භාජනීය, මහා පුණ්නම යනාදී සූත්‍ර වේදල්ල ගණයට වැටේ.

### අසූහාරදහසක් ධර්මස්කන්ධ

බුද්ධ දේශනාව ධර්මස්කන්ධ වශයෙන් අසූහාරදහසකට බෙදා දැක්වීම ද සුවිශේෂ බෙදීමකි. දීඝනිකාය අටුවාවේ සඳහන් වන අන්දමට ඒ ධර්මස්කන්ධ බෙදෙන්නේ මෙසේ ය.

එක් අනුසන්ධියක් ඇති සූත්‍රයක් එක් ධර්මස්කන්ධයකි. අනුසන්ධි යනු සූත්‍රයක ඇතුළත් වෙනස් වෙනස් අර්ථ ප්‍රකාශ කෙරෙන දහම් කොටස් ය. දම්සක් පැවතුම් සූත්‍රය ගත් විට එහි අන්ත දෙක අනුසන්ධි දෙකකි. එනම් ධර්මස්කන්ධ දෙකකි. සත්‍ය සතර ධර්මස්කන්ධ හතරකි. සංඛ්‍යා ධර්ම අඩංගු සූත්‍රවල එක් එක් කරුණක් වෙන වෙන ම ධර්මස්කන්ධයකි. ප්‍රශ්නෝත්තර අඩංගු සූත්‍රවල ප්‍රශ්නය එක් ධර්මස්කන්ධයකි. පිළිතුර එක් ධර්මස්කන්ධයකි.

අභිධර්මයෙහි පට්ඨාන ආදියෙහි එහි දුක, තික වශයෙන් ඇති බෙදීම් ද චිත්ත වාර එක එකක් වෙන වෙන ම ද එක් එක් ධර්මස්කන්ධයෝ ය. චෛතසික රූප ආදිය ද එසේ ය.

විනයෙහි වත්ථු, මාතිකා, පදභාජනීය, ආපත්ති, අනාපත්ති ආදී ශික්ෂා පද පිළිබඳ කෙරෙන විවිධ විවරණ එකක් එකක් වෙන වෙන ම ධර්මස්කන්ධයෝ ය.

මෙසේ අසූ දෙදහසක් ධර්මස්කන්ධ බුද්ධ දේශනා වශයෙන් ද, දෙදහසක් ශ්‍රාවක දේශනා වශයෙන් ද ත්‍රිපිටකයේ අඩංගු වන බව එහි සඳහන් වේ.

### සද්ධර්ම සංරක්ෂණය හා ත්‍රිපිටක බෙදීම

බුදුරජාණන් වහන්සේ වරක් දෙසූ සූත්‍රයක් ඒ ආකාරයෙන් ම නැවත නො දෙසති. එහෙත් එය අසා ගැනීමේ වරය බහුශ්‍රැතයන් අතර අගතැන්පත් අනඳ තෙරුන්ට පමණක් ලැබී තිබුණි. ඒ උන්වහන්සේ ඒ සඳහා ප්‍රාර්ථනා කොට පෙරුම්පුරාගෙන ආ බැවිනි. මුල් යුගයේදී බුද්ධ දේශනාවන් ඒවා ශ්‍රවණය කර ශ්‍රාවකයන් වහන්සේලා විසින් ම සිහිතබාගෙන එන ලද අතර අනඳ තෙරුන් උපස්ථායක තනතුරුට පත්වීමත් සමග ධර්මය දරාගැනීමේ වගකීම ද උන්වහන්සේ ම භාරගත්හ.

විනයධරයන් අතර අගතැන්පත් උපාලි තෙරණුවෝ විනය දරාගෙන ආහ. ප්‍රථම ධර්ම සංගායනාවේදී මේ දෙදෙනා වහන්සේ විසින් ධර්මයත් විනයත් සම්පූර්ණයෙන් ම ඉදිරිපත් කරන ලදි. එහිදී පන්සියයයක් රහතන් වහන්සේලා විසින් එක්ව සජ්ඣායනා කොට සම්මත කරගත් එම ධර්ම විනය පිටකවලට හා ග්‍රන්ථවලට බෙදා ඒවා කටපාඩමින් පවත්වාගෙන යාම සඳහා ඒ ඒ තෙර පරපුරවලට භාර කරන ලදී එය මෙසේ ය.

## විනය පිටකය

විනය මුලින් ම බෙදන ලද්දේ උභතො විභංග, ඛන්ධක, පරිවාර යනුවෙන් වර්ග තුනකට ය. නැවත ඒවා පාලි නමින් හැඳින්වෙන ග්‍රන්ථ පහකට බෙදා ඇත.

### 01. උභතො විභංග

භික්ෂූන්ට පනවන ලද ශික්ෂා පද භික්ඛු විභංග නමින් ද භික්ෂුණීන්ගේ ශික්ෂාපද භික්ඛුණී විභංග නමින් ද හැඳින්වේ. උභතො විභංග යනු එයයි. ඒවා ග්‍රන්ථ වශයෙන් ද දෙකකි.

#### පාරාජික පාලි

භික්ෂූන් වහන්සේලා සඳහා පණවන ලද පාරාජිකා, සංඝාදිසේස, අනියත, නිස්සග්ගිය පාචිත්තිය යන ශික්ෂා පද හතළිස් නවයක විස්තර විවරණ මෙහි ඇතුළත් ය.

#### පාචිතත්තිය පාලි

භික්ෂූන් වහන්සේලාට පණවන ලද පාචිත්තිය අනූ දෙකත්, සේඛියා හැත්තෑ පහත්, යන ඉතිරි ශික්ෂා පද සහ භික්ෂුණීන් සඳහා පණවන ලද තුන්සිය එකොළහක් (311) වූ සියලු ශික්ෂා පද විස්තර පාචිත්තිය පාලියෙහි ඇතුළත් ය.

### 02. ඛන්ධක

ඛන්ධක ග්‍රන්ථ දෙකකි. ඒවායේ අඩංගු කරුණු ඛන්ධක නමින් පරිච්ඡේදවලට බෙදා ඇති නිසා ඒ නම යෙදේ.

#### මහාවග්ග පාලි

පැවිද්ද, උපසම්පදාව, පොහොය කිරීම, වස් විසීම හා පවාරණය, කඨිනය, බෙහෙත්හේත් ආදී කාරණා පිළිබඳ පැනවීම් හා විස්තර විවරණ අඩංගු ඛන්ධක දහයකින් මේ ග්‍රන්ථය සමන්විත වේ.

#### චුල්ලවග්ග පාලි

මෙහි ඛන්ධක දොළහකි. එයින් පළමු ඛන්ධක දහයේ දඬුවම් විධි, සංඝාදිසේස ආපත්තිවලින් මිදෙන හැටි, අධිකරණ සමථ, හිසකෙස් කැපීම නැම ආදී සුළු සුළු කරුණු (ඛුද්දක වත්ථු) පිළිබඳ පැනවීම් හා විස්තර විවරණ ඇතුළත් වේ. එහි අවසාන ඛන්ධක දෙකෙන් පඤ්චසතිකක්ඛන්ධකයේ ප්‍රථම ධර්ම සංගායනා වාර්තාවත්, සත්තසතිකක්ඛන්ධකයේ දෙවන සංගායනා වාර්තාවත් ඇතුළත් ය.

### 03. පරිවාර

#### පරිවාර පාලි

ඉහත කී විනය ග්‍රන්ථ සතරේ ම එන පැනවීම් පිළිබඳ අතිරේක විස්තර ඇතුළත් සාරාංශයක් මෙහි අඩංගුවේ.

මෙසේ ග්‍රන්ථ පහකින් සංග්‍රහ කරන ලද විනය පිටකය ධාරණය කරගෙන පවත්වා ගෙන යාමේ වගකීම උපාලි තෙරුන්ගේ සඟ පරපුරට පවරන ලදි.

## සූත්‍ර පිටකය

සූත්‍ර පිටකය ද ග්‍රන්ථ පහකින් සමන්විත ය. ඒවා නිකාය ග්‍රන්ථ නමින් හැඳින්වෙන අතර දීඝාගම ආදී වශයෙන් ආගම නමින් ද හඳුන්වා තිබේ.

### 01. දීඝ නිකාය

'බ්‍රහ්මජාල' ආදි ප්‍රමාණයෙන් ඉතා දීර්ඝ සූත්‍ර තිස්හතරක් සීලක්ඛන්ධ වර්ගය, මහා වර්ගය හා පාථික වර්ගය නමින් වර්ග තුනකට බෙදා මෙහි සංග්‍රහ කර තිබේ. එය පවත්වාගෙන යාමේ වගකීම ආනන්ද තෙරුන්ගේ පරම්පරාවට භාර විය.

## 02. මජ්ඣිම නිකාය

'මූලපරියාය' ආදී මධ්‍යමප්‍රමාණයේ සූත්‍ර එකසිය පනස් දෙකක් පනහ බැගින් මූල පණ්ණාසක, මජ්ඣිම පණ්ණාසක, උපරි පණ්ණාසක යනුවෙන් වර්ග තුනකට බෙදා මෙහි සංග්‍රහ කර තිබේ. එය පවත්වාගෙන යාම පැවරුණේ සැරියුත් මහතෙරුන්ගේ පරම්පරාවටය.

## 03. සංයුත්ත නිකාය

'ඕඝතරණ' ආදී සූත්‍ර හත්දහස් හත්සිය හැට දෙකක් (7762) සංයුත්ත නමින් වර්ග කොට එය පවත්වාගෙන යාම සඳහා මහාකාශ්‍යප මහතෙරුන්ගේ පරම්පරාවට භාර කරන ලදි.

## 04. අංගුත්තර නිකාය

එකේ සිට එකොළහ දක්වා ධර්මකාරණා අඩංගු සූත්‍ර නවදහස් පන්සිය පනස් හතක් (9557) මෙහි ඇතුළත් වේ. ඒවායින් එකේ කරුණු ඒකක නිපාතයට ද, දෙකේ කරුණු දුක නිපාතයට ද, යනාදී වශයෙන් ක්‍රමයෙන් නිපාත එකොළහකට සූත්‍ර වර්ග කොට තිබේ. මෙසේ නිපාතයෙන් නිපාතයට කරුණු ආරෝහණ ක්‍රමයට සංග්‍රහ කර ඇති නිසා මෙය අංගුත්තර නිකාය නම් වේ. මෙය පවත්වාගෙන යාම අනුරුද්ධ තෙරුන්ගේ සඟ පරපුරට භාර විය.

## 05. ඛුද්දක නිකාය

ඉහත කී නිකාය ග්‍රන්ථ සතරට ඇතුළත් නොවූ ඉතිරි ධර්මය ඛුද්දක නිකාය නමින් සංග්‍රහ කර ඇත. ඒවා ද ඒ ඒ ධර්ම කොට්ඨාස අනුව ග්‍රන්ථ වශයෙන් පහළොවකට බෙදා ඇත. එනම්

ඛුද්දක පාඨ පාලි, ධම්මපද පාලි, උදාන පාලි, ඉතිවුත්තක පාලි, සුත්ත නිපාත පාලි, විමාන වත්ථු පාලි, ජේතවත්ථු පාලි, ථෙර ගාථා පාලි, ථෙරී ගාථා පාලි, ජාතක පාලි, නිද්දේස පාලි, පටිසම්භිදා මග්ග පාලි, අපදාන පාලි, බුද්ධ වංස පාලි, චරියා පිටක පාලි යනුවෙනි. ඒවායේ අඩංගු කරුණු එම නම්වලින් ම සිතාගත හැකි ය.

මේ අතරින් ඛුද්දක පාඨයේ භික්ෂූන් වහන්සේ නමක් මූලික ව පාඩම් කළ යුතු සරණාගමනයේ පටන් සූත්‍ර ධර්ම ඇතුළත් වේ. සුත්ත නිපාතයේ පැරණි සූත්‍ර ලෙස සැලකෙන රතන සූත්‍රය, මංගල සූත්‍රය ආදී සූත්‍ර මෙන් ම අට්ඨක වර්ගය හා පාරායණ වර්ගය නමින් ප්‍රකට වර්ග දෙකක් ද ඇතුළත් ය. නිද්දේස පාලියේ අඩංගු වන්නේ සුත්ත නිපාතයේ අට්ටකපාරායණ වර්ගවලට සපයන ලද විවරණයන් ය. පටිසම්භිදා මග්ගයේ චතුපටිසම්භිදා ඤාණය ඇතුලු සියලු බුද්ධඥාන පිළිබඳ විස්තර ඇතුළත් ය. චරියා පිටකයේ ඇත්තේ ද ජාතකවල මෙන් ම බෝධිසත්ව චරිත පිළිබඳ විස්තරයකි. සෙසු ග්‍රන්ථ පිළිබඳ කලින් විස්තර කර ඇත. ඛුද්දක නිකාය පවත්වාගෙන යාමට එක් භික්ෂු පරම්පරාවකට නොපැවරුණු අතර එය සියලු දෙනා විසින් ම හදාරා පවත්වාගෙන යා යුතු යැයි නිගමනය විය.

## අභිධර්ම පිටකය

බුද්ධඥානයට ම විෂය වූ ස්කන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, සත්‍ය, පටිච්චසමුප්පාද, මාර්ග, ඵල, නිර්වාණ ආදි මූල ධර්මයන් මාතෘකා කරගෙන වදාළ පරමාර්ථ දේශනාව අභිධර්මයයි. එය සම්මුති දේශනාව වූ සූත්‍ර හා විනය දෙකට වඩා විශේෂ වූ දේශනාවක් වන හෙයින් අභිධර්ම නම් වේ. ධර්ම විනය වශයෙන් බෙදීමේදී අභිධර්මය අයත් වන්නේ ධර්මයටයි. අභිධර්ම පිටකය ග්‍රන්ථ හතකින් සමන්විත ය. විභාගය, විවරණය යන අර්ථයෙන් එම ග්‍රන්ථ ප්‍රකරණ නමින් හැඳින්වේ.

**ධම්මසඞගනී ප්‍රකරණය**

ධම්මසංගනී යනු ධර්ම සංග්‍රහය යන අදහසයි. චිත්ත විභක්ති, රූප විභකිති, නික්ෂෙප රාශි, අර්ථෝද්ධාර යන වර්ග හතරකට බෙදා නාම රූප විස්තර කර තිබේ.

**විභංගප්‍රකරණය**

සුත්තන්ත භාජනීය, අභිධම්ම භාජනීය, පඤ්හ පුච්ඡක යන තුන් ආකාරයට ස්කන්ධ ධාතු ආයතන ආදි ධර්ම කොට්ඨාස 18 ක් බෙදා දක්වා විවරණය කර ඇත.

**ධාතු කථා ප්‍රකරණය**

ස්කන්ධ ආදිය ස්වභාවාර්ථයෙන් ධාතු නම් වෙති. එසේ පඤ්චස්කන්ධයේ පටන් මනසිකාර චෛතසිකය දක්වා ධර්ම 125 ක් මෙහි සංග්‍රහ අසංග්‍රහ ආදි තුදුස් ආකාරයකට විග්‍රහ කෙරේ.

**පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණය**

පඤ්ච විධ ඥෙය මණ්ඩලයෙන් එකක් වන ප්‍රඥප්තියට අදාළ ව ඛන්ධ, ආයතන, ධාතු, සච්ච, ඉන්ද්‍රිය, පුග්ගල යන ප්‍රඥප්ති පහ පිළිබඳ ව සංක්ෂිප්තව හා පුග්ගල ප්‍රඥප්තිය පිළිබඳ ව සවිස්තර ව මෙහි විවරණය කෙරේ.

**කථාවත්ථුප්‍රකරණය**

මොග්ගලීපුත්තතිස්ස හිමියන් විසින් බුදුරදුන් වදාළ නය ක්‍රමයට අනුව කරන ලද විවරණයකි. මෙහි දෘෂ්ටිවාද පිළිබඳ ව විග්‍රහ කෙරේ. පරවාද පන්සියයක් මර්ථනය කරමින් ද සකවාද පන්සියයක් උද්දීපනය කරමින් මෙම විවරණය කර ඇත.

**යමකප්‍රකරණය**

මෙය බෞද්ධ දර්ශනයේ එන නාමරූප ධර්මයන්ගේ යථා තත්ත්වය ප්‍රශ්නෝත්තර ස්වරූපයෙන් නිරූපණය කරන විවරණයකි. ධම්මසංගනී ආදි සෙසු ප්‍රකරණයන්හි දක්වන ලද ධර්ම තවදුරටත් තහවුරු කිරීම මින් සිදුව ඇත.

**පට්ඨානප්‍රකරණය**

පඤ්චස්කන්ධය භවය හා නිවන යන මේවායේ අංගයන් එහිම වෙනත් අංගයන්ට ප්‍රත්‍යය වන ආකාරය මෙහි සංවිස්තරව දක්වේ. එසේ දක්වන ප්‍රත්‍යය සූවිස්සකි.

මෙසේ ප්‍රකරණය සතකින් යුතු ව සංග්‍රහ වූ අභිධර්ම පිටකය පවත්වාගෙන යාම සාරිපුත්ත මහතෙරුන්ගේ පරම්පරාවටම පැවරී තිබුණි.

## ත්‍රිපිටක අටුවා

අට්ඨකතා හෙවත් අටුවා යනු තථාගත ධර්මය විස්තර කිරීමට යාමේදී සැපයුණු අර්ථ විවරණයි. බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනා කළේ ඒ ඒ පුද්ගලයන්ගේ වැටහීමේ ප්‍රමාණයට සැකෙවිනි. එහෙයින් බොහෝ දේශනා පොදුවේ කාටත් තේරුම් ගැනීමට විස්තර විවරණ ගැටලු තැන්වලට අර්ථ සැපයීම ආදිය බුද්ධ කාලයේදී ම අවශය විය. නිදසුනක් ලෙස දම්සක් පැවතුම් සූත්‍රය බුදුරදුන් වදාළේ එක්වරක් පමණි. එම යුගයේ ම ඇතැම් ශ්‍රාවකයන්ට එය වටහා ගැනීමට අපහසු වූ හෙයින් නැවත ඒ පිළිබඳ විවරණයක් කරන ලෙස බුදුරජාණන් වහන්සේ ම සැරියුත් තෙරුන්ට පැවරූහ. සච්චවිභංග සූත්‍රය දේශනා වූයේ එලෙස ය. ඒ අනුව සච්චවිභංග සූත්‍රය දම්සක්පැවතුම් සූත්‍රයේ අටුවාවක් වැනි ය.

මෙසේ බුදුරදුන් වදාළ ධර්මය නැවත විස්තර කිරීමේ සමත් සාරිපුත්ත ථෙර, මහාකච්චායන තෙර, මහාකොට්ඨිත තෙර ආදි තෙරවරු රැසක් ප්‍රකටව සිටියහ. බුදුරජාණන් වහන්සේ විසින් සැකෙවින් දෙසන ලද (සංඛිත්තේන භාසිතස්ස) සූත්‍රවල අර්ථ කියාදෙන ලෙස භික්ෂූන් වහන්සේලා මේ තෙරවරුන් වෙත පැමිණ ඉල්ලා සිටි අවස්ථා සූත්‍රපිටකයේ නිතර හමුවේ. මජ්ඣිම නිකායේ ''මහාකච්චාන භද්දේකරත්ත'' සූත්‍රය එවැන්නකි. ඇතැම්විට භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීම පරිදි බුදුරජාණන් වහන්සේ ම සැකෙවින් වදාළ ධර්ම පිළිබඳ ව විවරණ සපයා තිබේ. මහාරාහුලෝවාද සූත්‍රය එවැන්කි.

භික්ෂූන් වහන්සේලා ධර්මය සේ ම එහි අර්ථයත් අනිවාර්යයෙන් ම හදාළ යුතු බව අංගුත්තර සත්තක නිපාතයේ ධම්මඤ්ඤූ සූත්‍රයේ දක්වේ.

මෙසේ බුදුරදුන් හා රහතන් වහන්සේලා විසින් ආරම්භ කරන ලද අර්ථකථන සම්ප්‍රදාය පසුව වෙනම සාහිත්‍යාංගයක් ලෙස සංග්‍රහ කොට මුඛ පාඨයෙන් පවත්වාගෙන යන ලදි. සංගායනා තුනේදී ම සංගායනා වී සම්මත වූ එම අටුවා මිහිඳු මාහිමියන්

විසින් ලක්දිවට ගෙන අවුත් සිංහලයෙන් තබන ලද බව මහාවංසයේ සඳහන්වේ. ඒවා සීහළට්ඨකතා නම් විය. මුලදී එය පැවතුණේ මහාඅට්ඨකතා නමින් ත්‍රිපිටකයට ම පොදු එක් අටුවාවක් වශයෙනි.

ක්‍රි. පස්වන ශතවර්ශය වන විට දඹදිව අටුවා අතුරුදහන්ව ගිය හෙයින් රේවත නම් තෙරණුවෝ සිංහල අටුවා පාලියට පෙරලාගෙන එන ලෙස ස්වකීය ශිෂ්‍ය වූ බුද්ධඝෝෂ හිමියන් ලංකාවට එවූහ. මුළු ත්‍රිපිටකය ම සමාලෝචනය කොට විසුද්ධි මාර්ගය නම් ධර්ම ග්‍රන්ථය සම්පාදනය කළ උන්වහන්සේ එයින් තම හැකියාව පෙන්වා මහා විහාරීය ථෙරවරුන්ගෙන් අවසරය ලබාගෙන අටුවා පාලියට පෙරලූහ. බුද්ධඝෝෂ හිමියන් කිසිම අටුවාවක් අමුතුවෙන් ලියුවේ නැත. කළේ සිංහල අටුවාවල සදොස් තැන් මහා විහාර භික්ෂූන්ගේ අවසරය පරිදි නිදොස් කොට සංස්කරණය කරමින් පාලියට පෙරළීමයි. එහිදී උන්වහන්සේ විනය අභිධර්ම නිකාය ග්‍රන්ථ ආදියට වෙන වෙන ම අටුවා බෙදා සංස්කරණය කළ හ. ඒ අනුව උන්වහන්සේ ප්‍රධාන නිකාය අටුවා හතරත්, විනය හා අභිධර්ම අටුවා දෙකත් ඛුද්දක නිකායේ ග්‍රන්ථ කිහිපයක අටුවාත් සම්පාදනය කොට නැවත දඹදිවට ගියහ. ඉන්පසු ධම්මපාල තෙර, ආදී තෙරවරු සෙසු අටුවා සංස්කරණය කොට පරිවර්තනය කළහ.

අටුවාවල ධර්මයේ ගැටලු තැන් පැහැදිලි කෙරෙන අතර ඒවාට අදාළ නිදාන කථා අතිරේක විවරණ ආදී බොහෝ විස්තර ඇතුළත් වේ. නිදසුන් ලෙස ධම්මපදයේ ඇත්තේ ගාථා පමණකි. එහි නිදාන කථාව සහ අර්ථ විවරණ තිබෙන්නේ ධම්මපද අටුවාවේ ය. ජාතක කතා ද එසේම ය මේ අනුව අටුවා නැතිව ධර්මය තේරුම් ගැනීම පහසු නැත. එසේ පාලි සාහිත්‍ය දක්නට ලැබෙන අටුවා මෙසේ ය.

| | | |
|---|---|---|
| **සමන්තපාසාදිකා** | **විනය අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **සුමංගලවිලාසිනී** | **දීඝනිකාය අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **පපඤ්චසූදනි** | **මජ්ඣිමනිකාය අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **සාරත්ථප්පකාසිනී** | **සංයුත්ත නිකාය අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **මනොරථ පූරණී** | **අංගුත්තර නිකාය අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **අත්ථසාලිනී** | **ධම්මසංගිනි අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **සම්මොහවිනොදනී** | **විභංග අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **පරමත්ථදීපනී** | **පඤ්චප්පකරණ අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **කංඛා විතරණී** | **පාතිමොක්ඛ අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **පරමත්ථජොතිකා** | **ඛුද්දකපාඨ අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **ධම්මපදට්ඨ කථා** | **ධම්මපද අටුවාව** | **බුද්ධඝෝෂ හිමි** |
| **පරමත්ථජොතිකා** | **සුත්තනිපාත අටුවාව** | **ධම්මපාල හිමි** |
| **මධුරත්ථවිලාසිනී** | **බුද්ධවංස අටුවාව** | **බුද්ධදත්ත හිමි** |

ආදී මහතෙරුන් වහන්සේලා යුගයෙන් යුගය රචනා කරන ලද අටුවාග්‍රන්ථ සමුදායකින් ථෙරවාදී ත්‍රිපිටක සාහිත්‍ය සංවර්ධනය වී ඇත.

## ත්‍රිපිටක ටීකා

අටුවාවන්හි දුරවබෝධ තැන් පැහැදිලි කිරීම සඳහා ටීකා ලියන ලදි. ථෙරවාදී ත්‍රිපිටක සාහිත්‍යය සංවර්ධනය උදෙසා ටීකාවන්ගෙන් ලද දායකත්වය ද ඉතා විශාල ය. ටීකා සාහිත්‍යයෙහි ආදි කෘතිය වන්නේ වජිරබුද්ධි නම් භික්ෂූන් වහන්සේ නමක විසින් රචනා කරන ලද වජිරබුද්ධි ටීකාවයි. මෙය ලක්දිව මහා පරාක්‍රමබාහු යුගයට පෙර රචනා වී ඇතැයි සැලකෙන අතර සමන්තපාසාදිකාවේ ගැටපද විවරණයක් සේ දැක්වේ.

| | | |
|---|---|---|
| **සාරත්ථදීපනී** | **විනය ටීකාව** | **දිඹුලාගල කාශ්‍යප හිමියන්ගේ ශිෂ්‍යයෙකි.** |
| **විමතිවිනොදනී** | **විනය ටීකාව** | **චෝලිය කාශ්‍යප හිමි** |
| **කංඛාවිතරණී** | **උභය ප්‍රාතිමොක්ෂ ටීකාව** | **බුද්ධනාග හිමි** |
| **ලීනත්ථප්පකාසිනී** | **දීඝනිකාය ටීකාව** | **ධර්මපාල හිමි** |
| **සාරත්ථමඤ්ජුසා** | **අංගුත්තර නිකාය ටීකාව** | **සැරියුත් හිමි** |
| **සාධුවිලාසිනී** | **සීලක්ඛන්ධ වග්ග ටීකාව** | **ඤාණාභිවංසධම්ම හිමි** |

ආදී කොටගත් ටීකාවන් විශාල ප්‍රමාණයක් ලියවී ඇත. බුරුමය ඉන්දියාව ශ්‍රී ලංකාව ආදී ථෙරවාදී රටවල විසූ යතිවරයන් වහන්සේලාගෙන් මෙම සාහිත්‍යය සංවර්ධනය විය.

ටීකායුගයෙන් පසු ටිප්පණි නමින් තවත් ග්‍රන්ථ සමූහයක් රචනා විය. ටිප්පණියක් යනු ටීකාවන්ටත් වඩා සියුම් ලෙස ගැටපද විවරණය කරන ලද්දකි.

ත්‍රිපිටක සාහිත්‍යය වනාහි අතිශයින් පුළුල් පරාසයක් කරා විහිදී පැතිරී ඇත. මුල් බුද්ධ වචනය නොඉක්මවා දහම විවරණය කිරීම සෑම කතුවරයෙකුගේ ම අභිප්‍රාය විය. එනිසාම ථෙරවාදී ත්‍රිපිටක සාහිත්‍යය බෞද්ධ ලෝකයෙහි සම්භාවනාවට පාත්‍ර වී ඇත.

**අභ්‍යාස**

01. ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ වෙන් වෙන් වශයෙන් වර්ග කර දක්වන්න.
02. ලක්දිව රචනාවූ අටුවා ග්‍රන්ථ පිළිබඳ ලේඛනයක් සකසන්න.
03. ථෙරවාදී ත්‍රිපිටක සාහිත්‍යයේ සංවර්ධනයට මූලික වූ ලක්දිව ආදි යතිවරයන් වහන්සේලා පිළිබඳ තොරතුරු රැස්කර වාර්තාවක් සකසන්න.

11 පාඩම

# ගිහි සමාජ සම්බන්ධතාව
## (සිගාලක සූත්‍රය)

රජගහ නුවර සිගාල නම් තරුණ ගෘහපති පුත්‍රයෙක් විය. ඔහුගේ පියා මහා ධනවත් ගෘහපතියෙකි. නිධන් කරන ලද ධනය පමණක් හතළිස් කෝටියක් විය. සිගාලගේ මව සහ පියා තෙරුවන් සරණ ගිය සෝවාන් උපාසක උපාසිකාවෝ වූහ. එහෙත් මෙම සිගාල පුත්‍රයා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙනෙක් නොවී ය. බුදුරජාණන් වහන්සේ හමුවීමට නැතහොත් සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා හමුවන්නට යැයි මව්පියන් කොතෙක් අවවාද කළත් හෙතෙම එසේ නොකළේ ය. තෙරුවන් ඇසුර අප්‍රිය කළ හෙතෙම විනෝදයෙන් ම කල් ගෙවී ය. කලක දී පියා මරණාසන්න විය. පුතණුවන් කැඳවා අවවාද කරන පියා බුදුන්, දහම්, සඟුන් ඇසුරු කරන්නට නොකියා නිතිපතා දිසා නමස්කාර කරන ලෙස උපදෙස් දුන්නේ ය. පියාගේ ඇවෑමෙන් ඔහුගේ අවවාදය නො පිරිහෙලා ඉටුකරමි'යි සිතූ සිගාල දිනපතා උදෑසන ම අවදි වී නගරයෙන් පිටත එළිමහන් තැනකට ගොස් හිස සෝදා නා තෙත රෙදි පිටින් ඇඳිලි බැඳ සදිසාවට හැරෙමින් දිසා නමස්කාරය කරයි.

සිගාලගේ පියා මෙසේ දිසා නමස්කාරය කරන ලෙස තම පුතුට කීවේ එබඳු ඇදහිල්ලක් හෝ විශ්වාසයක් ඔවුන්ට තිබූ නිසා නොවේ, එය නිරර්ථක වැඩක් බව පියා ද දනී. එහෙත් තමන් ජීවත්වන තුරු යහමගට ගැනීමට නොහැකි වූ පුතණුවන් කරන මේ නිරර්ථක ක්‍රියාව දැක කවදා හෝ දිනක බුදුරජාණන් වහන්සේ ඔහුට මග පෙන්වනු ඇතැයි විශ්වාසයෙනි. ඒ ආකාරයෙන් ම දිනක් බුදුරජාණන් වහන්සේ උදෑසන පා සිවුරු ගෙන පිඬු සිඟා වඩින අතර එසේ දිසා නමස්කාර කරන සිගාල හමු විය. එහි දී ඔහු ඇමතූ බුදුරජාණන් වහන්සේ ''ගෘහපති පුත්‍රය, ඔබ මෙසේ දිසා නමස්කාරය කරන්නේ මන්දැයි විමසූහ. ''ස්වාමීනි, මගේ පියා මිය යන මොහොතේ පුතණුවනි, දිසා නමස්කාර කරන්න යැයි නියම කළේ ය. මම පියාගේ එම වචනයට ගරු කරමින් දිනපතා මෙසේ දිසා නමස්කාරය කරමි'යි සිගාල කීවේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ගෘහපති පුත්‍රය, අපගේ මේ ශාසනයේ නම් දිසා නමස්කාරය යනු උතුරු,දකුණ, නැගෙනහිර,බටහිර, උඩ, යට යන සදිසාවට ම වැඳීම නොවේ යැයි වදාළහ. එවිට සිගාල, ස්වාමීනි එසේ නම් මේ උතුම් ශාසනයෙහි සදිසා නමස්කාරය යැයි කියන්නේ කුමකට ද මට එය පහදා දෙන්න යැයි අයැද සිටියේ ය. අනතුරුව බුදුරජාණන් වහන්සේ ඔහුට මෙම සිගාල සූත්‍රය දේශනා කර වදාළහ.

එම සූත්‍රයෙහි අන්තර්ගත වන සදිසා සමස්කාරය හා එම නමස්කාරය සිදුකරන්නා විසින් සම්පූර්ණ කරගත යුතු ගුණධර්ම මොනවාදැයි පළමුකොට සැකෙවින් මෙසේ වදාරති. ''ගෘහපති පුත්‍රය, ආර්ය ශ්‍රාවකයෙකුගේ සතර කර්මක්ලේශ ප්‍රහීණ වූයේ වේ ද සතර අගති ගමනෙන් පව් නොකරයි ද භෝග විභාග මුඛ භය සේවනය නොකරයි ද මේ කියන පව්වු කාරණා තුදුසෙන් (14) දුරු වූ හෙතෙම සදිසා සංග්‍රහය ද නො පිරිහෙලා කරයි, ද දෙලොව ජයගැනීමට පිළිපන් කෙනෙක් වෙයි. ඔහුගේ මෙලොව ද සඵල වූයේ වෙයි. පරලොව ද



නොමිලේ බෙදා හැරීම පිණිසයි

සඵල වූයේ වෙයි. මරණින් මතු හෙතෙම සුගතියෙහි උපදී. මේ අනුව මෙම සූත්‍ර දේශනාව අංග හයකින් සමන්විත වේ.

01. කර්ම ක්ලේශ සතර
02. අගති ගමන සතර
03. අපාය මුඛ හය
04. පාප මිත්‍ර වර්ජනය හා කළ්‍යාණ මිත්‍ර සේවනය
05. ධනෝපාර්ජනය හා සංරක්ෂණය
06. සදිසා ආවරණය

## • කර්මක්ලේශ සතර

01. ප්‍රාණ ඝාතය
02. අදත්තාදානය
03. කාම මිථ්‍යාචාරය
04. මුසාවාදය

"පාණාතිපාතං අදින්නාදානං
මුසාවාදො ච වුච්චති
පරදාරගමනඤ්චෙව
නප්පසංසන්ති පණ්ඩිතා"

යනු කර්මක්ලේශ සතරයි. කර්ම ක්ලේශ නම් කෙලෙස් සහගත ක්‍රියාය. කිලිටි සහගත වූ සිතින් ප්‍රාණඝාත කරයි. නොකිලිටි සිත් ඇති පුද්ගලයා ප්‍රාණඝාත නොකරයි. සෙසු කර්ම ක්ලේශ තුන ද එසේ ය. සාමාන්‍යයෙන් ගිහියාගේ සීලය වන පංච සීලයට අදාළ දුශ්චරිත හතරක් මෙහි ඇතුළත් වේ. පස්වැන්න සුරාපානයයි. එය කර්මක්ලේශයක් නොව මීළඟට එන භෝග විනාශ මුඛ හයෙන් එකක් ලෙස දක්වයි. රාගාදී ක්ලේශයන් නිසා සිදුකරන පාප ධර්ම කොතෙකුත් ඇත. ඒ අතරින් පුද්ගලයෙකුගේ ගිහි ජීවිතය අවුල් කරන, කිලිටි කරන මෙලොව ම පිරිහෙලන ප්‍රධාන කර්ම සතර මේවා ය. පුද්ගල ජීවිත හානිය, දේපල නැතිවීම, පවුල් ජීවිත අවුල්වීම සහ තොරුවන් වසාලීම නිසා පාප ධර්ම බහුලව සිදුවේ. එය මුළු ජීවිතය ම අවුල් කරන ප්‍රධාන කරුණු සතරක් වන බව එහි අදහසයි. මේවාට කර්ම ක්ලේශ කීවේ එබැවිනි. ආර්ය ශ්‍රාවකයා හෙවත් උපාසක උපාසිකාවෝ මේ කර්ම ක්ලේශ සතර දුරු කළ යුතු ය.

## • අගති ගමන සතර

කෙනෙකු පාප කර්ම කරන්නේ නොයා යුතු වැරදි අන්ත හතරකට යාම නිසා ය. එනම් කෙනෙක් ඡන්දයෙන් හෙවත් තමාගේ කැමැත්ත අනුව පක්ෂග්‍රාහී වීමෙන්, කැමති පැත්ත පමණක් ගැනීමෙන් පාප කර්ම සිදුකරයි. එය ඡන්ද අගතියයි. කෝපයෙන්, ද්වේශයෙන් හෝ පළිගැනීමේ අදහසින් පාපකර්ම කරයි. එය දොසාගතියයි. භයෙන් තැති ගැනීම නිසා හෝ බියගුළුකම නිසා හෝ පාප කර්ම කරයි. එය භය අගතියයි. හොඳ නරක නිර්ණය කරගැනීමට තරම් නුවණ නැතිකමින් හෝ කල්පනාව නැතිකමින්

පාපකර්ම කරයි. එය මෝහ අගතියයි. මේ කියන ඡන්ද, ද්වේශ, භය, මෝහ යන කාරණා සතර නිසා කෙනෙක් ධර්මයට පිටුපා අධර්මයෙහි යෙදෙයි නම් ඔහුගේ කීර්තිය හෝ ගුණය අවපක්ෂයේ සඳමෙන් පිරිහී යන්නේ ය. ආර්ය ශ්‍රාවකයා සතර අගතියට නොයයි. එමෙන් ම අගතියට යාමෙන් සිදුකරන පාපධර්ම ද නොකරයි.

ඡන්‍දා දොසා භයා මොහා
යො ධම්මං අතිවත්තති
නිහීයති තස්ස යසො
කාළපක්ඛෙව චන්‍දිමා

### ● භොග අපාය මුඛ භය

ධනය විනාශවන දොරටු භයකි. එනම්,

01. **සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයෙගො**
02. **විකාලවිසිඛාචරියානුයෙගො**
03. **සමජ්ජාභිචරණං**
04. **ජූතප්පමාදට්ඨානානුයෙගො**
05. **පාපමිත්තානුයෙගො**
06. **ආලස්සානුයෙගො**

යනුවෙනි.

### ■ සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගාදීනව

මදයට හෙවත් මත් වී සිහි කල්පනාව නැතිවීමට, ප්‍රමාදයට හෙවත් විළිබිය නැතිව අකුසල කර්මවල යෙදීමට හේතුවන සුරාමේරය යැයි කියන මත්පැන් හෝ මත්ද්‍රව්‍ය පානයෙහි ආදීනව භයකි.

01) **සන්දිට්ඨිකා ධනඤ්ජානි**
බලාසිටියදී ම ධනය විනාශ වී යාම.

02) **කලහප්පවඩ්ඪනී**
කලකෝලහල වැඩිවීම.

03) **රොගානං ආයතනං**
රෝගයන්ට ආකරයක් වීම.

04) **අකිත්ති සඤ්ජනනී**
අපකීර්තිය ඇතිවීම.

05) **කොපීන නිදංසනී**
විළිබිය නැති ව හැසිරීම.

06) **පඤ්ඤාය දුබ්බලීකරණී**
නුවණ දුර්වල වීම යනුවෙනි.

## ▪ විකාලවිසිඛාචරියානුයොගාදීනව

අවේලාවෙහි නොහොත් බොහෝ රෑ බෝ වී මංමාවත්වල හැසිරීමේ ආදීනව හයකි.

**01. අත්තාපිස්ස අගුත්තො අරක්ඛිතො හොති**
තමාගේ ම රැකවරණය නැති වෙයි.

**02. පුත්තදාරොපිස්ස අගුත්තො අරක්ඛිතො හොති**
ඔහුගේ අඹු දරුවන්ගේ ද ආරක්ෂාව නැතිවෙයි.

**03. සාපතෙය්‍යම්පිස්ස අගුත්තං අරක්ඛිතං හොති**
ඔහුගේ ධනයේ ද රැකවරණ නැතිවෙයි.

**04. සංකියො ච හොති පාපකෙසු ඨානෙසු**
වැරදි අපරාධවලට සැකකරුවෙක් වෙයි.

**05. අභූතවචනං ච තස්මිං රූහති**
ඔහුවෙත අභූත චෝදනා නැගෙයි.

**06. බහූනඤ්ච දුක්ඛධම්මානං පුරක්ඛතො හොති**
බොහෝ දුක් කරදර ඔහු පසුපස එයි.

## ▪ සමජ්ජාභිචරණාදීනව

සන්දර්ශන උත්සව සොයා ඇවිදීමට පුරුදු වීමේ ආදීනව හයකි.

| | |
|---|---|
| **01. ක්ව නච්චං** | **නැටුම් තිබෙන්නේ කොහි ද?** |
| **02. ක්ව ගීතං** | **ගායනා තිබෙන්නේ කොහි ද?** |
| **03. ක්ව වාදිතං** | **වැයුම් තිබෙන්නේ කොහි ද?** |
| **04. ක්ව අක්ඛානං** | **කතා නාට්‍ය තිබෙන්නේ කොහි ද?** |
| **05. ක්ව පාණිස්සරං** | **බෙර තාලම් වාදන තිබෙන්නේ කොහි ද?** |
| **06. ක්ව කුම්භථූණං** | **කළ පිඹීම් තිබෙන්නේ කොහි ද?** |

මෙහි ආදීනව හයක් ලෙස දක්වන්නේ නැටුම් ගැයුම් වැයුම් ආදිය ඇසීමට නැරඹීමට පුරුදු වූ පුද්ගලයා තමාගේ කටයුතු අතපසු කොට කාලය විනාශ කරමින් ඒවා තිබෙන තැන්වලට යාමෙන් වන හානියයි. එයට ඇබ්බැහි වූ පුද්ගලයා එබඳු තැන් සොයමින් ගමන් කරයි. එසේ යන ස්ථාන හයක් මෙහි දක්වා ඇත. ඔහුට හය ගුණයක පාඩුවක් ඉන් සිදුවේ. ඒ අනුව වර්තමානයට අනුව ගෙදර සිටිමින් රූපවාහිනී චිත්‍රපට නැරඹීමෙන් ද සංදර්ශන සොය සොයා යාමෙන් කෙරෙන කාලය හා කටයුතු විනාශ කරගැනීම මින් අදහස් කෙරේ.

## ■ ජූතප්පමාදාදීනව

කටයුතු අඩාල වීමෙන් ධනය විනාශවීම් ආදියෙන් ජීවන ගමන ප්‍රමාද කරන අවුල් කරන සූදු ක්‍රීඩාවල යෙදීමේ ආදීනව හයකි.

**01. ජයං වෙරං පසවති**

දිනූ කල්හි පැරදුන අයගේ වෛරය ඇතිවේ.

**02. ජිතො විත්තමනුසොචති**

පැරදුන කල්හි පැරදුණු ධනය පිළිබඳ ව ශෝක වෙයි.

**03. සන්දිට්ඨිකා ධනංජානි**

තමා බලා සිටිය දී ම ධනය නැසී යයි.

**04. සභාගතස්ස වචනං න රූහති**

සභාවක අධිකරණයක ඔහුගේ වචන නොපිළිගනී.

**05. මිත්තාමච්චානං පරිභූතො හොති**

හිතමිතුරන් අතර පිරිහුණ කෙනෙක් වෙයි.

**06. ආවාහවිවාහකානං අපත්ථිතො හොති, අක්ඛ ධුත්තො අයං පුරිස පුග්ගලො නාලං දාරභරණායාති**

මොහු සූදු අන්තුවෙකි. අඹුදරුවන් පෝෂණය කරන්නට නුසුදුස්සෙකැයි ආවාහ විවාහවලදී ප්‍රතික්ෂේප වේ.

## ■ පාපමිත්තානුයොගාදීනව

පාපමිතුරන් ඇසුරු කිරීමේ ආදීනව හයකි.

| | |
|---|---|
| **යෙ ධුත්තා** | සූදු කාරයින්ගේ ඇසුරට වැටීම. |
| **යෙ සොණ්ඩා** | ස්ත්‍රී ලෝලීන්ට හා සමාජ ශාලාවලට ලොල්වූවන් ඇසුරට වැටීම. |
| **යෙ පිපාසා** | මත්පැනට ඇබ්බැහිවූවන් ඇසුරට වැටීම. |
| **යෙ නෙකතිකා** | කිරුම් මිනුම් රන්රිදී වෙළඳාම් ආදියෙන් කූටකම් කරන්නන් ඇසුරට පත්වීම. |
| **යෙ වඤ්චනිකා** | බොරු බසින්, චාටුවෙන් මිනිසුන් රවටන වංචනික ඇසුරට පත්වීම. |
| **යෙ සාහසිකා** | මිනීමැරුම්, ගෙවල් බිඳීම් මං පැහැරීම් වැනි සැහැසිකම් කරන්නන්ගේ ඇසුරට පත්වීම. |

මොවුහු පාප මිත්‍රයෝ ය. මොවුන්ගේ ඇසුරට පත්වුන පුද්ගලයා ඒවාට පුරුදුවීමෙන් දෙලොවම විනාශ කරගනී.

## ■ අලසසාදීනව

අලසකමෙහි ආදීනව හයකි.

01. **අතිසීතන්ති කම්මං න කරොති**
    අලසයා දන් ඉතා සීත යැයි කියා වැඩ නොකරයි.
02. **අතිඋණ්හන්ති කම්මං න කරොති**
    ඉතා උෂ්ණය සහිත යැයි වැඩ නොකරයි.
03. **අතිසායන්ති කම්මං න කරොති**
    බොහෝ සවස් වී යැයි වැඩ නොකරයි.
04. **අතිපාතොති කම්මං න කරොති**
    ඉතා උදෑසන වැඩි යැයි වැඩ නොකරයි
05. **අතිඡාතොසමීති කම්මං න කරොති**
    ඉතා කුසගිනි යැයි වැඩ නොකරයි.
06. **අතිධාතොසමීති කම්මං න කරොති**
    කුස පිරී වැඩි යැයි වැඩ නොකරයි.

මෙම හය ආකාරයෙන් වැඩ කටයුතු අතපසු කිරීමට බහුල කොට වසන පුද්ගලයාට අලුතින් සම්පත් නූපදී. උපන් සම්පත් විනාශ වෙයි.

## ● පාපමිත්‍ර වර්ජනය හා කල්‍යාණමිත්‍ර සේවනය

### මිත්‍ර ප්‍රතිරූපකයෝ

මිතුරු වෙසින් පෙනී සිටින අමිත්‍රයෝ සතර දෙනෙකි.

01. අඤ්ඤදත්ථුහර
02. වචීපරම
03. අනුප්පියභාණී
04. අපාය සහාය

"අඤ්ඤදත්ථුහරො මිත්තො
යො ච මිත්තො වචීපරො
අනුප්පියං ච යො ආහ
අපායෙසු ච යෙ සඛා"

## 1. අඤ්ඤදත්ථුහර අමිත්‍රයා

නිතරම අනුන්ගෙන් යැපීමට උත්සාහ කරන, මිතුරකු සේ පෙනී සිටින අමිත්‍රයා කරුණු හතරකින් හඳුනා ගත යුතු ය.

"අඤ්ඤදත්ථුහරො හොති
අප්පෙන බහුමිච්ඡති
භයස්ස කිච්චං කරොති
සෙවති අත්ථකාරණා"

ඔහු නිතරම මිතුරාගෙන් කිසිවක් රැගෙන යන්නට උත්සාහ කරයි. එසේ ම ස්වල්පයක් දී බොහෝ දේ බලාපොරොත්තු වේ. තමාට කරදරයක් වූ විට පමණක් මිතුරුකම් පෙන්වයි. තම වාසිය පමණක් සළකමින් කටයුතු කරයි.

## 2. වචීපරම අමිත්‍රයා

මිතුරෙකු සේ පෙනී සිටින වචනයෙන් පමණක් සංග්‍රහ කරන අමිත්‍රයා කරුණු හතරකින් හඳුනාගත හැකි ය. එනම් මෙසේය,

i. අතීතෙන පටිසන්ථරති
අතීතයෙන් සංග්‍රහ කරමින් මගහරී.

උදව්වක් උපකාරයක් පතාගෙන ගියවිට ටික වේලාවකට පෙර පැමිණියේ නම්, ඊයේ පැමිණියේ නම් දෙන්නට තිබුණේයැයි අතීතයෙන් සිත සතුටු කොට මිස එම උපකාරය මගහරියි.

ii. අනාගතෙන පටිසන්ථරති

අනාගතයේ ලැබෙන්නට ඇති දේ ගැන කියමින් මගහරී. එම මොහොතේ උපකාරය නොකරයි.

iii. නිරත්ථකෙන සංගණ්හාති

මිතුරාගේ අවශ්‍යතා ගැන සැලකිල්ලක් නොදක්වා එය අමතක වන ලෙසට වෙනත් කතාවලින් සංග්‍රහ කොට අවශ්‍යතාව මග හරියි.

iv. පච්චුප්පන්නෙසු කිච්චෙසු බ්‍යසනං දස්සෙති

මිතුරා වාහනයක්, කිසියම් උපකරණයක් වැනි දෙයක් ඉල්ලාගෙන පැමිණි විට එය කැඩුණු බව, නැති වූ බව කෙනෙක් රැගෙනගිය බව කියා එම උපකාරය මග හරියි.

මෙම තැනැත්තන් උපකාරය නොකර මිතුරුකම ද රැකෙන කතාවෙන් පමනක් සංග්‍රහ කරන නිසා ඔහු හෝ ඇය වචීපරම නම් වේ.

## 03. අනුප්පියභාණී අමිත්‍රයා

සැම දෙයට ම ''හොඳයි'' කියමින් මිතුරා සතුටු කරවන්නට බලන මිත්‍ර ප්‍රතිරූපකයා කරුණු හතරකින් හඳුනාගත හැකි ය.

i. **පාපකම්පිස්ස අනුජානාති**

මිතුරාගේ නරක ක්‍රියාවද අනුමත කරයි.

ii. **කල්‍යාණම්පිස්ස අනුජානාති**

මිතුරාගේ යහපත් ක්‍රියාවන් ද අනුමත කරයි.

iii. **සම්මුඛාස්ස වණ්ණං භාසති**

මිතුරා ඉදිරිපිට ඔහුගේ ගුණ කියයි.

iv. **පරම්මුඛාස්ස අවණ්ණං භාසති**

මිතුරා නැති තැන ඔහුගේ නුගුණ කියයි.

## 04. අපාය සහාය මිත්‍රයා

කුල පුත්‍රයාගේ විනාශයට සහාය වන මිත්‍ර ප්‍රතිරූපකයින් සිව්දෙනෙකි.

i. **සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගෙ සහායො හොති.**

රහමෙර පානය සඳහා යහළුවෙක් වෙයි.

ii. **විකාල විසිඛාචරියානුයොගෙ සහායො හොති.**

අවේලාවෙහි වීථි සංචාරය සඳහා යහළුවෙක් වෙයි.

iii. **සමජ්ජාභිචරණෙ සහායො හොති**

නාට්‍ය සංදර්ශන ආදිය නැරඹීමට යාම සඳහා යහළුවෙක් වෙයි.

iv. **ජුතපපමාදට්ඨානානුයොගෙ සහායො හොති**

සූදු කෙළිය සඳහා යහළුවෙක් වෙයි.

සාමාන්‍යයෙන් මිනිස් සිත හොඳ පැත්තට වඩා නරක පැත්තට පහසුවෙන් යොමු වෙයි. එහෙයින් මෙවැනි පුද්ගලයන් එක්වර ම අපට පෙනෙන්නේ යහපත් තැනැත්තන් ලෙස ය. එහෙත් මොවුන් ඇසුරු කිරීමෙන් වන හානි ගැන සලකා බලන විට ඔවුන් අමිත්‍රයන් බව පැහැදිලි වේ. එනිසා දෙලොව දියුණුව කැමති බෞද්ධයා මෙවැනි පුද්ගලයන් දුරින් දුරු කළ යුතු ය.

## සුහද මිත්‍රයෝ

සුහද, හිතවත් මිත්‍රයෝ සතර දෙනෙකි. එනම්

01. උපකාරක මිත්‍රයා
02. සමාන සුඛ දුක්ඛ මිත්‍රයා
03. අත්ථක්ඛායී මිත්‍රයා
04. අනුකම්පක මිත්‍රයා

**උපකාරොච යො මිත්තො යො ච මිත්තො සුඛෙ දුඛෙ**
**අත්ථක්ඛායී ච යො මිත්තො යො ච මිත්තානුකම්පකො**

### ▲ උපකාරක මිත්‍රයා

උපකාරක මිත්‍රයා සතර ආකාරයකින් දත හැකි ය.

i. **පමත්තං රක්ඛති**
සුරාමතින් හෝ කායික මානසික අපහසුතාවකින් අසරණ වූ මිත්‍රයා ව රැකබලා ගනී.

ii. **පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති**
පමා වූ මිතුරාගේ ධනය රකී.

iii. **භීතස්ස සරණං හොති**
බියට පත්වූ මිතුරාට පිහිට වෙයි.

iv. **උප්පන්නෙ කිච්චකරණීයෙ තදද්විගුණං භොගං අනුප්පදෙති**
කිසියම් කටයුත්තකට මිල මුදලක් උවමනා වූ විට දෙගුණයක් දෙයි.

### ▲ සමාන සුඛදුක්ඛ මිතුරා

දුක් සැප දෙකෙහිදී තමා හා සමාන කොට සිතා සලකන මිතුරා සතර ආකාරයකින් දත හැකි ය.

i. **ගුය්හමස්ස ආචික්ඛති**
තමාගේ රහස් නොසඟවා මිතුරාට කියයි

ii. **ගුය්හමස්ස පරිගුහති**
මිතුරාගේ රහස් හෙළි නොකොට සඟවා ගෙන සිටී

iii. **ආපදාසු න විජහති**
විපතක දී මිතුරා අත් නොහැර සිටී.

iv. **ජීවිතම්පිස්ස අත්ථාය පරිච්චත්තං හොති**
දිවි පරදුවට තබා වුව ද මිතුරාට උපකාර වේ.

▲ **අත්ථක්ඛායී මිතුරා**

දියුණුවට මග කියන සුහද මිතුරා සතර අයුරකින් හඳුනාගත හැකි ය.

i. **පාපා නිවාරෙති**
මිත්‍රයා පවින් වළක්වයි.

ii. **කල්‍යාණෙ නිවෙසෙති**
මිත්‍රයා යහපතෙහි යොදවයි.

iii. **අස්සුතං සාවෙති**
නො ඇසූ දහම් අසන්නට සලස්වයි.

iv. **සග්ගස්ස මග්ගං ආචික්ඛති**
සුගතියට මග කියාදෙයි.

▲ **අනුකම්පක මිතුරා**

මිතුරාට අනුකම්පාවෙන් සලකන කටයුතු කරන මිතුරා ද සතර අයුරකින් හඳුනා ගත හැකි ය.

i. **අභවෙනස්ස න නන්දති.**
මිතුරාගේ පිරිහීමක් විපතක් දැක කණගාටු වෙයි

ii. **භවෙනස්ස නන්දති.**
මිතුරාගේ දියුණුවක් දැක සතුටුවෙයි

iii. **අවණ්ණං භණමානං නිවාරෙති**
මිතුරාගේ නුගුණ කියන්නන් වළක්වයි

iv. **වණ්ණං භණමානං පසංසති**
මිතුරාගේ ගුණ කියන විට ප්‍රසංසා කරයි.

මෙම සුහද මිතුරන් සතර දෙන මනාව දන මවක සිය කුස උපන් දරුවකු රැකගන්නා සේ ළඟින් ඇසුරු කළ යුතු ය.

● **ධනෝපාර්ජනය හා සංරක්ෂණය**

මීළඟට ගිහි ආර්ය ශ්‍රාවකයා ධනය රැස්කරන ආකාරයත් ඒවා කළමනාකරණය කොට පරිහරණය කරන ආකාරයත් ඉගැන්වේ.

**පණ්ඩිතො සීලසම්පන්නො ජලං අග්ගීව භාසති**
**භොගෙ සංහරමානස්ස භමරස්සෙව ඉරීයතො**
**භොගා සන්නිචයං යන්ති වම්මිකො වූපචීයති**

මෙතෙක් කී කරුණු අනුව සීලවන්ත කළණ මිතුරන් ඇසුරුකරන ඥාණවන්තයා දිලිසෙන ගින්නක් සේ බබලයි. ඔහු ධනය රැස්කිරීමේ දී මල නොතලා රොන්ගන්නා බඹරෙකු මෙන් අනුන් නොපෙළා ධනය රැස්කරයි. එසේ රැස් කරන්නාගේ ධනය වේයන් විසින් බිඳුවෙන් බිඳුව එකතු කිරීමෙන් ගොඩ නගන තුඹසක් සේ වැඩි දියුණු වන්නේය.

**එවං භොගෙ සමාහත්වා අලමත්තො කුලෙ ගිහී**
**චතුධා විභජෙ භොගෙ ස වෙ මිත්තානි ගන්ථති**

නිසි ලෙස ගිහිගෙයි වසන්නට සමත් ගිහියා මෙසේ දැහැමින් භවභෝග සම්පත් රැස්කොට එය සතර කොටසකට බෙදා ගත යුත්තේ ය. එයින් හෙතෙම හිත මිතුරන් තමා වෙත ඇද බැඳ ගනී.

**එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය**
**ද්වීහි කම්මං පයොජයෙ**
**චතුත්ථං ච නිධාපෙය්‍ය**
**ආපදාසු භවිස්සති**

මෙසේ බෙදාගත් කොටස් හතරෙන් එක් කොටසක් පරිභෝජනය කොට සැප සම්පත් විඳින්නේ ය. කොටස් දෙකකින් ව්‍යාපාර, ගොවිතැන් ආදී කර්මාන්ත කරගන්නේ ය. සතරවන කොටස ආපදාවක දී ප්‍රයෝජන වෙතැයි සලකා තැන්පත් කර ගන්නේ ය.

සිගාල ගෘහපති පුත්‍රයා බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ බුදු සසුනේ ධර්ම විනයට අනුව සදිසා නමස්කාරය නිවැරදි ලෙස සිදුකරන්නේ කෙසේ ද යනුවෙනි. එය විස්තර කරන්නේ මෙතැන් සිට ය.

මේ දක්වා සිදුකරන ලද්දේ සදිසා නමස්කාරය සිදුකිරීමට සූදානම් වන පුද්ගලයා ඊට සුදුස්සෙකු වීමට අවශ්‍ය කාරණා ඉදිරිපත් කිරීමයි. සිගාල ගෘහපතියා තෙරුවන් ආශ්‍රය කොට බණ දහම් අසා ජීවන මග ගොඩ නගාගත් අයෙක් නොවේ. එබඳු තත්වයක සිටි ඔහුට හෝ වෙනත් අයෙකුට එක්වර ම සදිසා නමස්කාරය කරන්නැයි පැවසුවහොත් එය නිසි පරිදි ඉටු කළ නොහැකි ය. මන්ද යත් ඔහු හෝ ඇය එය අවංකව ගෞරවයෙන් ලැදියාවෙන් සිදු කරන්නට තරම් ගුණවත් කෙනෙකු හෝ ඒ සඳහා කාලය, ධනය, ශ්‍රමය කැප කරන්නට අවබෝධයක් ඇති අයෙකු නොවන හෙයිනි. මෙම සදිසා සංග්‍රහය කරන්නා පාප ධර්ම මොනවාදැයි හඳුනාගෙන එයින් වළකින්නෙකු විය යුතු ය. අගතියට ගොස් ක්‍රියාකරන්නෙකු නොවිය යුතු ය. ධනය විනාශවන මාර්ගවලින් මිදිය යුතු ය. පිරිහීමට හේතුවන මිත්‍ර ප්‍රතිරූපකයන්ගෙන් ඈත්විය යුතු ය. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතු ය. ධනය කළමනාකරණය කොට පරිහරණය කරන්නට පුරුදු විය යුතු ය. මේ ගුණාංගයන්ගෙන් සපිරුණු ගිහියා තමන්ගේ ජීවිතය සුවසේ ගතකරමින් මෙතැන් සිට ඉගැන්වෙන සමාජ යුතුකම් ඉටුකරන්නට සමර්ථ වන්නේ ය.

එබැවින් බුදුරජාණන් වහන්සේ සිගාලක ගෘහපතියාට සදිසා නමස්කාරය එක්වර ම හඳුන්වා නොදී එය කිරීමට පෙර තමන් සකස් වියයුතු ආකාරය පැහැදිලි කළේ එබැවිනි.

**සදිසා ආවරණය**

ගෘහපති පුත්‍රය ආර්ය ශ්‍රාවකයා හෙවත් බෞද්ධයා සදිසා ආවරණය කෙසේ කරන්නේ ද යත්: ගෘහපති පුත්‍රය දිසා හයකි. පෙරදිග මව්පියෝ යැයි දත යුතු ය. දකුණු දිග ගුරුවරු ය, බටහිර අඹුදරුවෝ ය, උතුරු දිග නෑහිත මිතුරෝ ය. යටදිග දාසිදස් කම්කරුවෝ ය. උඩදිග මහණ බමුණෝ ය.

## 01. පුරත්ථිමා දිසා (පෙරදිග) මව්පියෝ

ගෘහගති පුත්‍රය, කුලපුත්‍රයෙකු විසින් පෙරදිග වන මව්පියන්ට කරුණු පහකින් උපස්ථාන කළ යුතු ය.

**භතො නෙ සංභරිස්සාමි**

මව්පියන් විසින් පෝෂණය කරනු ලැබූ මම ඔවුන් හොඳින් පෝෂණය කරමි. උපස්ථාන කරමි'යි ක්‍රියාකළ යුතු ය.

**කිච්චං නෙසං කරිස්සාමි**

මව්පියන්ට සිදුකිරීමට ඇති කටයුතු ඔවුන් වෙනුවෙන් මම දැන් කරමියි ක්‍රියාකළ යුතු ය.

**කුලවංසං ඨපෙස්සාමි**

කුලසිරිත් ආදිය රැකගැනීමෙන් කුල පරම්පරාව ආරක්ෂා කරගමියි'යි ක්‍රියාකළ යුතු ය.

**දායජ්ජං පටිපජ්ජාමි**

මාපියන්ගෙන් ලත් දායාද නොනසා පරිහරණය කරන්නෙමි'යි ක්‍රියාකළ යුතු ය.

**අථ වා පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පදස්සාමි**

මාපියන් මිය පරලොව ගිය කල්හි දන් දී පින් අනුමෝදන් කරවන්නෙමි යි ක්‍රියාකළ යුතු ය.

මෙම කරුණු පහෙන් පුත්‍රයා විසින් මව්පියන්ට උපස්ථාන කරන කල්හි ඔවුනුදු කරුණු පහකින් පුත්‍රයාට අනුකම්පා කරති.

**පාපා නිවාරෙන්ති**

පුත්‍රයා පාපයෙන් වළක්වති.

**කල්‍යාණෙ නිවෙසෙන්ති**

යහපත් වූ පින්දහම්හි යොදවති.

**සිප්පං සික්ඛාපෙන්ති**

සුදුසු ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කරවති.

**පතිරූපෙන දාරෙන සංයොජෙන්ති**

සුදුසු කුල කතක් ආවාහ කර දෙති.

**සමයෙ දායජ්ජං නීයාදෙන්ති**

සුදුසු කල්හි තමා සන්තක වස්තුව පවරා දෙති.

මෙසේ කුල පුත්‍රයා විසින් මේ පූර්ව දිශාව උපද්‍රවරහිත කොට නිර්භය කොට ආවරණය කරන ලද්දේ වෙයි.

## 02. දක්ඛිණා දිසා (දකුණු දිග) ගුරුවරු

ගෘහපති පුත්‍රය, කුල පුත්‍රයෝ දකුණු දිග වන ආචාර්යවරුන් කෙරෙහි කරුණු පහකින් උපස්ථාන කළ යුතු වෙති.

**උට්ඨානෙන**

ගුරුවරයා දැක හුනස්නෙන් නැගිටීමෙන්.

**උපට්ඨානෙන**

ගුරුවරයාට අවශ්‍ය උපස්ථාන කිරීමෙන්.

**සුස්සූසාය**

උගන්වන දෑ මැනවින් අසා සිටීමෙන්.

**පාරිචරියාය**

ගුරුවරයාට වතාවත් කිරීමෙන්.

**සක්කච්චං සිප්පපටිග්ගහණෙන**

උගන්වන ශිල්ප මැනවින් ඉගෙනීමෙන්.

මෙම කරුණු පහෙන් අන්තේවාසිකයා ආචාර්යවරයාට උපස්ථාන කරන කල්හි ආචාර්යවරයා කරුණු පහකින් සිය අන්තේවාසිකයාට (ශිෂ්‍යයාට) අනුකම්පා කරයි.

**සුවිනීතං විනෙනති**

තම ශිෂ්‍යයාව මැනවින් හික්මවති.

**සුගගහීතං ගාහාපෙනති**

ශිෂ්‍යයාට මැනවින් උගන්වති.

**සබබසිපපසුතං සමකඛායිනො භවනති**

තමා උගත් සියලු ශිල්ප ශාස්ත්‍ර ශිෂ්‍යයාට ගුරුමිටු නොතබා මැනවින් කියා දෙති.

**මිතතාමචෙචසු පටියාදෙනති**

තම මිත්‍ර අමාත්‍යාදීන්ට ශිෂ්‍යයා හඳුන්වා දෙති.

**දිසාසු පරිතතානං කරොනති**

හැම අතින්ම ආරක්ෂා කරති.

මෙසේ කුලපුත්‍රයා විසින් දකුණු දිශාව උපද්‍රව රහිත කොට භය රහිත කොට ආවරණය කරන ලද්දේ වෙයි.

## 03. පචඡිමා දිසා (අපර දිග) භාර්යාව

ගෘහපති පුත්‍රය, කුල පුත්‍රයා බටහිර දිශාව හෙවත් පශ්චිම දිශාව වන භාර්යාවට කරුණු පහකින් උපකාර කළයුතු වෙයි.

**සමමානනාය**

බිරිඳකට දැක්විය යුතු බුහුමන් කිරීම.

**අනවමානනාය**

අවමන් නොකිරීම.

**අනතිචරියාය**

අන් අඹුවන් සේවනය නොකිරීම.

**ඉසසරියවොසසගෙගන**

නිවසෙහි කටයුතුවල ප්‍රධානත්වය ලබාදීම.

**අලංකාරානුපපදානෙන**

තමාගේ වත්කමට අනුව ඇඳුම් පැළඳුම් ලබාදීම.

මෙම කරුණු පසින් සැමියා විසින් භාර්යාව විෂයෙහි යුතුකම් කරනු ලබන කල්හි බිරිඳ කරුණු පහකින් සිය යුතුකම් ඉටුකරයි.

**සුසංවිහිතකම්මන්තා ච හොති**

කලට වේලාවට ආහාරපාන ලබාදීම් ආදී වශයෙන් මනා සංවිධානයෙන් කරන ලද කටයුතු කරන්නී වෙයි.

**සුසංගහිතපරිජනා ච**

දැසි දස් කම්කරු ආදී පිරිවර ජනයාට මැනවින් සංග්‍රහ කරන්නී ය.

**අනතිචාරිනී ච**

සැමියා හැර අන් සැමියෙකු සිතිනුදු නොපතයි.

**සම්භතං අනුරක්ඛති**

සැමියා සපයන ධනය ආරක්ෂා කරයි.

**දක්ඛා ච හොති අනලසා සබ්බකිච්චෙසු**

සියලු කටයුත්තෙහි දක්ෂ ද නොමැලි ද වෙයි.

මෙසේ ගෘහපති පුත්‍රයා විසින් බටහිර දෙස බිය රහිත කොට උපද්‍රව රහිත කොට ආවරණය කරන ලද්දේ වෙයි.

## 04. උත්තරා දිසා (උතුරු දිග) මිත්‍රාමාත්‍යයෝ

ගෘහපති පුත්‍රයා කුලපුත්‍රයෙකු විසින් කරුණු පහකින් උතුරු දිශාව නම් මිත්‍රයන්ට ද සැප දුක දෙකෙහි එක්ව කටයුතු කරන්නන්ට ද සංග්‍රහ කළ යුතු ය.

| | |
|---|---|
| 01. දානෙන | පරිත්‍යාග කිරීමෙන්. |
| 02. පෙය්‍යවජ්ජෙන | ප්‍රියවචනයෙන් කතා කිරීමෙන්. |
| 03. අත්ථචරියාය | අවශ්‍ය විට දියුණුවට උපකාර කිරීමෙන්. |
| 04. සමානත්තතාය | තමා හා සමාන කොට සැලකීමෙන්. |
| 05. අවිසංවාදනතාය | මිතුරන් නොරැවටීමෙන්. |

මෙසේ හිත මිතුරන්ට උපස්ථාන කරන කල්හි හිතමිතුරෝ ද කුල පුත්‍රයාට කරුණු පහකින් සංග්‍රහ කරත්.

| | |
|---|---|
| 01. පමත්තං රක්ඛන්ති | - මත්වීම්, සිහිමුලාවීම්, ආදියෙහිදී මිතුරා රකිති. |
| 02. පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛන්ති | - එසේ මතින් ප්‍රමාදයෙන් අසරණ වූ මිතුරාගේ ධනය රකිති. |
| 03. භීතස්ස සරණං හොන්ති | - බියට පත් මිතුරාට පිහිට වෙති. |
| 04. ආපදාසු න විජහන්ති | - විපත්තීන්හිදී අත් නොහරිති. |
| 05. අපර පජා චස්ස පටිපූජෙන්ති | - මිතුරාගේ දරු මුණුපුරන්ට ද මමත්වයෙන් සලකති. |

මෙසේ කුල පුත්‍රයා විසින් උතුරු දිග බිය රහිත කොට උවදුරු රහිත කොට ආවරණය කරන ලද්දේ වෙයි.

## 05. හෙට්ඨිමා දිසා (යටදිශාව) - දාසිදස් කම්කරුවෝ

ගෘහපති පුත්‍රය, කුල පුත්‍රයෙකු විසින් කරුණු පහකින් යට දිශාව නම් වූ දාසිසස් කම්කරුවන්ට සංග්‍රහ කළ යුතු ය.

| | |
|---|---|
| **01. යථාබලං කම්මන්තසංවිධානෙන** | - ඔවුන්ගේ ශක්තියට අනුව කර්මාන්තවල යෙදවීමෙන්. |
| **02. භත්තවෙතනානුප්පදානෙන** | - නිසි පරිදි බත් වැටුප් ලබාදීමෙන්. |
| **03. ගිලානුපට්ඨානෙන** | - ගිලන් වූ කල නිසි උපස්ථාන සැලසීමෙන්. |
| **04. අච්ඡරියානං රසානං සංවිභාගෙන** | - මිහිරි ආහාරපාන තමා තනිව නොවළඳා ඔවුන්ටත් බෙදා වැළඳීමෙන්. |
| **05. සමයෙ වොස්සග්ගෙන** | - සුදුසු කාලයෙහි වැඩකටයුතුවලින් මුදාහැරීමෙන් ද දාසිදස් කම්කරුවන්ට සංග්‍රහ කළ යුතු ය. |

එසේ සංග්‍රහ ලබන දාසිදස් කම්කරුවෝ කුල පුත්‍රයාට කරුණු පහකින් පෙරළා උපකාර කරන්නාහ.

| | |
|---|---|
| **01. පුබ්බුට්ඨායිනො ච හොන්ති** | - ස්වාමියාට පෙර නැගී පිබිදෙති. |
| **02. පච්ඡානිපාතිනො ච** | - ස්වාමියාට පසුව නිදති. |
| **03. දින්නාදායිනො ච** | - සොරෙන් නොගෙන දුන් දෙය පමණක් ගනිති. |
| **04. සුකතකම්මකරා ච** | - කටයුතු මැනවින් ඉටු කරති. |
| **05. කිත්තිවණ්ණහරා ච** | - ස්වාමියාගේ ගුණ යහපත්කම කියති. |

මෙසේ කුල පුත්‍රයා යට දිශාව නිරුපද්‍රිත කොට නිර්භය කොට ආවරණය කරගන්නා ලද්දේ වෙයි.

## 6. උපරිමාදිසා (උඩදිශාව) ශ්‍රමණ බ්‍රාහ්මණ

ගෘහපති පුත්‍රය, කුල පුත්‍රයා විසින් කරුණු පහකින් උඩ දිශාව නම් වූ ශ්‍රමණ බ්‍රහ්මණාදීන්ට සංග්‍රහ කළ යුතු ය.

| | |
|---|---|
| **01. මෙත්තෙන කායකම්මෙන** | - මෛත්‍රී සහගත ක්‍රියාවලින්. |
| **02. මෙත්තෙන වචීකම්මෙන** | - මෛත්‍රී සහගත වචනයෙන්, කතාබහෙන්. |

| | |
|---|---|
| **03. මෙත්තෙන මනොකම්මෙන** | - මෛත්‍රී සහගත සිතිවිල්ලෙන්. |
| **04. අනාවටද්වාරතාය** | - ඔවුන්ට නිතර දොර විවරව තැබීමෙන්. |
| **05. අමිසානුප්පදානෙන** | - සිව්පස පූජා පැවැත්වීමෙන්. |

එසේ සංග්‍රහ ලබන ශ්‍රමණ බ්‍රහ්මාදීහු කුල පුත්‍රයාට කරුණු හයකින් උපකාර කරන්නාහු ය.

| | |
|---|---|
| **01. පාපා නිවාරෙන්ති** | - පාපයෙන් වළක්වති. |
| **02. කල්‍යාණෙන නිවෙසෙන්ති** | - යහපතෙහි යොදවති. |
| **03. කල්‍යාණෙ මනසා අනුකම්පන්ති** | - යහපත් සිතින් අනුකම්පා කරති. |
| **04. අස්සුතං සාවෙන්ති** | - නොඇසූ ධර්මය අස්වති. |
| **05. සුතං පරියොදපෙන්ති** | - ඇසූ ධර්මයෙහි සැක දුරුකොට පිරිසිදු කරති. |
| **06. සග්ගස්ස මග්ගං ආචික්ඛන්ති** | - සුගතියට මග කියා දෙති. |

මෙසේ කුල පුත්‍රයා විසින් උඩ දිශාව නිරුපද්‍රිත කොට භය රහිත කොට ආවරණය කරන ලද්දේ වෙයි.

සමාජ සම්බන්ධතාවන් මැනවින් පවත්වාගෙන යමින් මෙලොව දියුණුව බලාපොරොත්තු වන කුල පුත්‍රයා මෙම සදිසා නමදින්නේ ය. සදිසා නැමදීම ලෙස මෙහිදී අර්ථවත් කරන්නේ තම යුතුකම් මනාව ඉටු කිරීමයි. තම යුතුකම් මැනවින් ඉටුවන විට ඊට ප්‍රති උපකාරය අනෙක් පාර්ශ්වයන්ගෙන් නොඅඩුව සැලසේ. එයින් අන්‍යොන්‍ය සහයෝග යෙන් යුතු සාමකාමී ප්‍රියජනක සමාජ පසුබිමක් නිර්මාණය වේ.

**මාතාපිතා දිසා පුබ්බා ආචාරියා දක්ඛිණා දිසා**
**පුත්තදාරා දිසා පච්ඡා මිත්තාමච්චා ච උත්තරා**
**දාසකම්මකරා හෙට්ඨා උද්ධං සමණබ්‍රාහ්මණා**
**එතාදිසා නමස්සෙය්‍ය අලමත්තො කුලෙ ගිහී**

මෙම සූත්‍ර දේශනාව අවසානයෙහි අනුශාසනාවක් කරන බුදුරජාණන් වහන්සේ ඉහත දහම්හි හික්මෙන සිල්වත් ගුණවත් උතුමන් කීර්ති ප්‍රශංසා බුහුමන් ලබන අයුරු විස්තර කරති. එහිදී සමාජ සම්බන්ධතා තහවුරුවීමට සතර සංග්‍රහ වස්තුව අත්‍යවශ්‍ය කාරණයකි. ඒවායින් තොරව මේ කිසි සංග්‍රහයක් සම්පූර්ණ නොවේ.

**පණ්ඩිතො සීලසම්පන්නො සණ්හො ච පටිභානවා**
**නිවාතවුත්ති අත්ථද්ධො තාදිසො ලභතෙ යසං**

පණ්ඩිත වූ සිල්වත්, සියුම් අර්ථ දන්නා, වැටහෙන නුවණ ඇති, යටහත් පැවතුම් ඇති ගොරහැඩි නොවූ එබඳු තැනැත්තා කීර්තිය ලබයි.

එතෙ බො සංගහා ලොකෙ        රථස්සාණීව යායතො
එතෙ ච සංගහා නාස්සු        න මාතා පුත්තකාරණා
ලභෙථ මානං පූජං වා        පිතා වා පුත්තකාරණා

දානය ද ප්‍රියවචනය ද අර්ථචර්යාව ද සමානාත්මතාවය ද යන මේවා රියකට ඇණය මෙන් ලොව සමාජ පැවැත්මට අවශ්‍ය සංග්‍රහයෝ මේ සතර සංග්‍රහ ඉටු නොවන තැන පුතු වූ පමණය පියා හෝ පුතු වූ පමණින් මව හෝ ගරු බුහුමන්, පුද පූජා නොලබන්නේ ය.

යස්මා ච සංගහෙ එතෙ        සමවෙක්ඛන්ති පණ්ඩිතා
තස්මා මහත්තං පප්පොන්ති        පාසංසා ච භවන්ති තෙ

යම් හෙයකින් පණ්ඩිතයෝ මේ සංග්‍රහයන් දෙස ගෞරවයෙන් බලත් නම් එයින් ම ඔවුහු උදාරත්වයට පැමිණෙති. සෙසු ලෝකවාසීන් ගෙන් ප්‍රසංසා ලබන්නෝ වෙති.

මෙසේ සිගාලක ගෘහපතියාට වදාළ කල්හි ස්වාමීනි මැනවි. ''යටිකුරු කළ දෙයක් උඩුකුරු කරන්නා සේ ද, වැසුණු දෙයක් විවර කරන්නා මෙන් ද, මංමුළා වූවකුට මග කියාදෙන්නා මෙන් ද, ඇස් ඇත්තෝ රූප දකිත්වා යි අඳුරෙහි තෙල් පහනක් දරන්නාක් සේ ද භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කාරණයෙන් ධර්මය දේශනා කළ සේක. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද ආර්‍ය්‍ය සංඝයා ද සරණ යමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස අද පටන් දිවි ඇතිතාක් තෙරුවන් සරණ ගිය උපාසකයෙකු කොට සලකන සේක්වා යි පැවසූ සිගාලක ගෘහපති තෙමේ තෙරුවන් සරණ ගිය උපාසකයෙකු බවට පත් වූයේ ය.

**අභ්‍යාස**

01. සිගාලෝවාද සූත්‍රයේ අන්තර්ගත කරුණු පිළිබඳ වගුවක් ඇඳ පන්තියේ හෝ බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්න.
02. ශිෂ්‍යයෙකු වශයෙන් ඔබෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් කවරේදැයි පැහැදිලි කරමින් ශිෂ්‍ය සමිතියේ කතාවක් කරන්න.
03. භික්ෂූන් වහන්සේ නමකගෙන් දායකයන්ට ඉටුවිය යුතු මෙහෙවර මැයෙන් නිබන්ධනයක් ලියා ගුරුවරයාට ඉදිරිපත් කරන්න.
04. නිරර්ථක ඇදහිලි විශ්වාස නින්දා කොට බැහැර කරනු වෙනුවට බුදුරදුන් විසින් ඒවා සමාජයට වැඩදායී ප්‍රායෝගික ප්‍රතිපදා බවට පත්කළ ආකාරයට විශිෂ්ඨම නිදර්ශනය සිගාලක ප්‍රතිපදාවයි. මෙය සනාථ කරමින් රචනයක් ලියන්න.

12
පාඩම

# ආගමික මතවාද පිළිගැනීමේ නිවැරැදි විධිය
## (කාලාම සූත්‍රය)

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්ෂු සමූහයක් පිරිවරාගෙන කොසොල් රටෙහි සැරිසරණ අතර කේසපුත්ත නම් කාලාම ගෝත්‍රිකයන්ගේ නියම් ගමට වැඩි සේක. කේසපුත්ත වැසි කාලාමයන්ට බුදුරජාණන් වහන්සේ තම නියම් ගමට වැඩි බව ආරංචි විය. එසේ ම උන්වහන්සේ අරහං ආදී ගුණයන්ගෙන් පිරිපුන් උතුමෙක් ය යන ගුණ කීර්තිය ද ඔවුනට අසන්නට ලැබිණි. ඒ නිසා එබඳු උතුම් රහත් කෙනෙකුන් දක්නට යායුතු යැයි ඔවුහු සිතූහ. අනතුරුව එතෙක් බෞද්ධයන් නොවූ කාලාමයෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ තමතමන්ගේ ශ්‍රද්ධාවේ භක්තියේ ප්‍රමාණයට වැඳුම් පිදුම් ආචාර සමාචාර දක්වා එකත්පස්ව හිඳ ගත්හ.

එසේ හිඳ ගත් කාලාමයෝ බුදුරදුන්ට මෙසේ සැළකර සිටියහ. ස්වාමීනි විවිධ මහණ බමුණෝ මේ කේසපුත්තයට පැමිණෙති. ඒ හැම කෙනෙක් ම තමතමන්ගේ මතවාදය ආගම හෝ දර්ශනය ම නිවැරැදියැ යි හුවා දක්වති. අනුන්ගේ ආගම් දර්ශන සියල්ල වැරදියැ යි අසත්‍යයැ යි හෙළා දකිති. ස්වාමීනි, මේ හේතුව නිසා මොවුන්ගෙන් කවරෙක් ඇත්ත කියත් ද? කවරෙක් බොරු කියත්දැයි අපට ඇතිවන්නේ සැකයකි.

ඊට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ "**අලං හි වො කාලාමා කඞ්ඛිතුං අලං විචිකිච්ඡිතුං, කඞ්ඛනීයෙ ච පන වො ඨානෙ විචිකිච්ඡා උප්පන්නා, එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මාදිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූති**" කාලාමවරුනි, ඔබ සැක කිරීම සාධාරණය. ඔබට සැක ඇති වී තිබෙන්නේ සැක කළ යුතු තැන ම ය. කාලාමයෙනි, මෙය අසන්න, ඔබ **(මා අනුස්සවෙන)** කටකතාවෙන් ඇසූ නිසා හෝ **(මා පරම්පරාය)** පියපුතු පරපුරෙන් හෝ ගුරු පරපුරෙන් ආ නිසා හෝ **(මා ඉතිකිරාය)** මෙය මෙසේ විලුයි කියා හෝ **(මා පිටකසම්පදානෙන)** අපගේ දහම් පොත පතට ගැළපේ කියා හෝ **(මා තක්කහේතු)** මෙය තර්කානුකූල යැයි කියා හෝ **(මා නයහෙතු)** න්‍යාය ධර්මයන්ට ගැලපේ කියා හෝ **(මා ආකාර පරිවිතක්කේන)** පෙනෙන ආකාරයට නම් මෙය නිවැරැදි යැයි කියා හෝ **(මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා)** අප පිළිගත් දෘෂ්ටියට ගැලපේය කියා හෝ **(මා භබ්බරූපතාය)** මෙය මෙසේ විය හැකිය කියා හෝ **(මා සමණෝ නො ගරූ)** මේ ශ්‍රමණයන් වහන්සේ අපේ ගුරුය ඒ නිසා ඔහු කියන දේ පිළිගත යුතුය කියා හෝ කිසිවක් නොපිළිගන්න.

"**යදා තුමෙහ කාලාම අත්තනාව ජානෙය්‍යාථ, ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤූගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තීති. අථ තුමෙහ කාලාමා පජහෙය්‍යාථ**" කාලාමයෙනි, මේ ධර්ම අකුසලය, මේ ධර්ම වැරදි සහගතය, මේ ධර්ම නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ය. මේ ධර්ම පිළිගෙන පිළිපැදීම අහිත පිණිස දුක් පිණිස පවතීයයි යම් විටක ඔබට ම වැටහේ නම් ඒවා අත්හරින්න. දුරුකරන්න.

කාලාමයෙනි, ඔබ සිතන්නේ කුමක් ද? ලෝභය පුරුෂයාගේ සිත තුළ ඉපදීම ඔහුට හිත පිණිස පවතී ද? අහිත පිණිස පවතී ද? (ස්වාමීනි, අහිත පිණිස පවතින්නේ ය) ලෝභයෙන් යුතු ලෝභයට යටත් වූ සිත් ඇති පුද්ගලයා ප්‍රාණඝාත අදත්තාදාන පරදාරසේවන මුසාවාද ආදිය කරයි නම්, අනුනුත් ඊට පොළඹවයි නම්, එය ඔහුට බොහෝ කාලකට අහිත පිණිස දුක් පිණිස පවතිනවා නොවේ ද? (එසේ ය ස්වාමීනි)

කාලාමයෙනි, ඔබ කෙසේ සිතන්නහු ද? ද්වේෂය පුද්ගලයාගේ සිත තුළ ඇති වීම ඔහුට හිත පිණිස පවතී ද? අහිත පිණිස පවතී ද? (ස්වාමීනි, අහිත පිණිස පවතින්නේ ය) කාලාමයෙනි, ද්වේෂයෙන් යුතු ද්වේෂයට යත්ට වූ සිත් ඇති පුද්ගලයා ප්‍රාණඝාත අදත්තාදාන පරදාර සේවන මුසාවාද ආදිය කරයි නම්, අනුනුත් ඊට පොළඹයි නම් ඔහුට එය දිගු කලක් අහිත පිණිස දුක් පිණිස පතිනවා නොවේ ද? (එසේ ය ස්වාමීනි)

කාලාමයෙනි, ඔබ කුමක් සිතහු ද? මෝහය පුරුෂයාගේ සිත තුළ ඉපදීම ඔහුට හිත පිණිස පවතී ද අහිත පිණිස පවතී ද? (ස්වාමීනි, අහිත පිණිස පවතින්නේ ය) කාලාමයෙනි, මෝහයෙන් යටපත් මෝහ සහගත සිත් ඇති පුද්ගලයා ප්‍රාණඝාත අදත්තාදාන පරදාරසේවන මුසාවාද ආදිය කරයි නම් හෝ අනුනුත් ඊට පොළඹවයි නම් හෝ එය ඔහුට අහිත පිණිස දුක් පිණිස පවතිනවා නොවේ ද? (එසේ ය ස්වාමීනි)

කාලාමයෙනි ඔබ කුමක් සිතන්නහු ද? මේ ලෝභ ද්වේෂ මෝහ සහ ප්‍රාණඝාතාදී ධර්මයන් කුසල් ද අකුසල් ද? ස්වාමීනි අකුසල් ය. වැරදි ද? නිවැරදි ද? (ස්වාමීනි වැරදියි) නුවණැත්තන් විසින් පසසන ලද්දේ ද ගරහන ලද්දේ ද (ස්වාමීනි, ගරහන ලද්දේ ය) මේ ධර්මයන්ගෙන් යුක්ත වීම ඒ ක්‍රියා සිදු කිරීම අහිත පිණිස දුක් පිණිස පවතිනවා ද? නැද්ද? ඒ ගැන ඔබේ අදහස කුමක්ද? (ස්වාමීනි, ඒවායින් යුක්ත වීම ඒවා ක්‍රියාවෙන් සිදු කිරීම අහිත පිණිස දුක් පිණිස පවතින්නේ ය යනු අපේ අදහසයි.)

කාලාමයෙනි, යමක් කටකතාවෙන් පරම්පරාවෙන් ආරංචියෙන් පොතේ තිබුණු පමණින් තර්ක හේතුවෙන් න්‍යාය හේතුවෙන්. හරි යැයි පෙනෙන පමණින් තම මතයට ගැළපෙන පමණින් පිළිගත වූ කෙනෙකු කී පමණින් ගුරුවරයා කී පමණින් වත් නොපිළිගත යුතු ය. යම් විටක මේ ධර්ම අකුශලය, වැරදි සහගතය ඒවා ඇතිවීම ඊට අනුව ක්‍රියා කිරීම බොහෝ කල් අහිත පිණිස දුක් පිණිස පවතින්නේ යැයි ඔබට ම වැටහේ නම් ඒ ධර්ම දුරු කරන්න යැයි මා වදාළේ මේ නිසා ය.

එසේ ම කාලාමවරුනි, කිසිවක් කටකතා ආදියෙන් නොපිළිගන්න. යම් ධර්මයන් පිළිබඳව මේ ධර්ම කුසල් ය නිවරදි ය, නුවණැත්තන් විසින් පසසන ලද්දේ ය. ඒවායින් යුක්ත වීම ඒ අනුව ක්‍රියා කිරීම හිත පිණිස සැප පිණිස පවතී යැයි ඔබට ම වැටහේ නම් ඒවා වැඩි දියුණු කරගෙන වාසය කරන්න.

කාලාමයෙනි, කුමක් සිතන්නහු ද අලෝභය පුද්ගලයාගේ සිතේ ඇති වීම හිත පිණිස පවතී ද අහිත පිණිස පවතී ද (ස්වාමීනි, හිත පිණිස පවතින්නේ ය.)

අද්වේෂය පුද්ගලයාගේ සිත තුළ පැවතීම හිත පිණිස පවතින්නේ ද අහිත පිණිස පවතින්නේ ද (ස්වාමීනි, හිත පිණිස පවතින්නේ ය.)

අමෝහය පුද්ගලයාගේ සිත තුළ පැවතීම හිත පිණිස පවතින්නේ ද අහිත පිණිස පවතින්නේ ද (ස්වාමීනි, හිත පිණිස පවතින්නේ ය.)

ලෝභයෙන් ද්වේෂයෙන් මෝහයෙන් තොර ඒවාට යටත් නොවුණු ඒවාට හසු නොවූ සිත් ඇති පුද්ගලයා ප්‍රාණඝාත අදත්තාදාන කාම මිථ්‍යාචාර මුසාවාද ආදිය නොකරයි නම් අනුනුත් ඊට යොමු නොකරයි නම් එය ඔහුට බොහෝ කල් සිත සුව පිණිස පවතින්නේ නොවේ ද? (එසේ ය ස්වාමීනි,) කාලාමයනි ඔබ කුමක් සිතන්නහු ද එසේ නම් මේ අලෝභ ආදී ධර්ම කුසල් වේ ද අකුසල් වේ ද? (ස්වාමීනි, කුසල් ය.) වැරදි වේ ද? නිවැරැදි වේ ද? (ස්වාමීනි, නිවැරැදි ය.) නුවණැත්තන් විසින් පසසන ලද්දේ ද ගරහන ලද්දේ ද? (ස්වාමීනි, පසසන ලද්දේ ය.) එයින් යුක්ත වීම ඒ අනුව ක්‍රියාවෙන් සම්පූර්ණ කිරීම හිත සුව පිණිස පවතී ද නැද්ද? ඒ ගැන ඔබේ අදහස කුමක් ද? (ස්වාමීනි, ඒවායින් යුක්ත වීම ඒවා ක්‍රියාවෙන් සම්පූර්ණ කිරීම හිත පිණිස සුව පිණිස පවතී යනු අපේ අදහසයි.) කාලාමයෙනි, කිසිවක් කටකතා ආදී දස ආකාරයෙන් නොපිළිගන්නා ලෙසත් යමක් කුසල් ය නිවැරැදි ය නුවණැත්තන් විසින් පසසන ලද්දේ ය ඒවායින් යුක්ත වීම ඒවා ක්‍රියාවෙන් සපිරීම හිත සුව පිණිස පවතී යැයි ඔබට ම වැටහේ නම් පමණක් පිළිගෙන වැඩි දියුණු කරන්නැයි මා වදාළේ මේ නිසා ය.

කාලාමයෙනි, මෙසේ ඒ ආර්ය ශ්‍රාවකයා දැඩි ලෝභය ව්‍යාපාදය දුරු කොට මෝහයෙන් මුලා නොවී සිහිකල්පනාවෙන් යුතුව. මෛත්‍රී සහගත සිතින් කරුණා සහගත සිතින් මුදිතා සහගත සිතින් හෝ උපේක්ෂා සහගත සිතින් උතුර දකුණ නැගෙනහිර බස්නාහිර යන සිවු දිසාවට ද උඩයට සරස යන සැම දෙස ද යනුවෙන් ලෝකයේ කෙළවර දක්වා ම සියල්ලන් තමා හා සමව සලකා පුළුල් වූ මහත් වූ අප්‍රමාණ වූ අවෛරී නිදුක් වූ සිත පතුරුවාගෙන වාසය කරයි. කාලමයෙනි, එසේ අවෛරී වූ අහිංසක වූ නොකිලිටි සිත් ඇති මෙබඳු පිරිසිදු සිත් ඇති ආර්ය ශ්‍රාවකයා මෙලොවදීම අස්වැසිලි හතරක් ලබයි.

1. **යම් හෙයකින් පරලොවක් තිබේ නම් හොඳ නරක කර්මවල ඵලවිපාක තිබේ නම් මම ඒ කාන්තයෙන් මරණින් මතු සුගති ලෝකයක උපදින්නෙමි'යි යන්න පළමුවන අස්වැසිල්ලයි.**

2. **යම් හෙයකින් පරලොවක් නැත්නම්, හොඳ නරක කර්මවල ඵලවිපාකයකුත් නැත්නම් මම මෙලොවදී වෛරයෙන් තොර පීඩාවලින් තොර දුකින් තොර සුවපත් ජීවිතයක් ගත කරන්නෙමි'යි යනු වන අස්වැසිල්ලයි.**

3. **යම් හෙයකින් සිතා මතා කරන ක්‍රියාවකින් පාපයක් සිදුවේ නම්, කිසිවක් පිළිබඳ මගේ පවිටු සිතක්වත් නැත. සිතා මතා පව් කිරීමක් කිසිසේත් නැති මට පව් සිදුවන්නේ කෙසේ ද යනු තුන්වන අස්වැසිල්ලයි.**

4. **යම් හෙයකින් නරක ක්‍රියාවක් කළත් පව් සිදු නොවේ නම්, කිසිසේත් නරක ක්‍රියා නොකරන මම නරක දේ කළොත් පව් සිදු වේය, නරක දේ කළත් පව් සිදු නොවේය යන දෙයාකාරයෙන් ම වරදට නොවැටෙන පිරිසිදු වූ ජීවිතයක් ගත කරන්නෙක් බව මට දූනේ යනු සිව්වන අස්වැසිල්ලයි.**

මේ දේශනාව අවසානයේ දී කාලාමයෝ මෙබඳු නුවණින් කටයුතු කරන ආර්ය ශ්‍රාවකයා අන්තිමේ දී මේ අස්වැසිලි හතර ලබන බව පිළිගත් හ. එයින් බුදුරදුන් කෙරෙහි පැහැදුණු ඔවුහු තෙරුවන් සරණ ගිය උපාසකයෝ බවට පත් වූහ.

**සමාලෝචනය**

**කාලාම සූත්‍රයේ ප්‍රධාන අංශ පහකි.**

**01. යමක් පිළිගැනීමට එක ම පදනම නොවිය යුතු කරුණු දහය.**

කටකතාව පරම්පරාවෙන් පැවතීගෙන ඒම ආදී මෙම ආකාර දහය ලොව මිනිසුන් සාමාන්‍යයෙන් යමක් පිළිගැනීමට හේතු කරගන්නා කරුණු ය. බුදුරජාණන්වහන්සේ වදාරන්නේ මෙම කරුණු දහය ම නිත්‍ය නිවැරදි ක්‍රමය විය නොහැකි බවයි. ඒවායේ වැරදීම් බොහෝ තිබිය හැකි ය. ඒ නිසා කිසිවිටකත් ඒ දහය පදනම් කරගෙන පමණක් මෙලොව පරලොව දියුණුව හෝ නිවන වැනි දේ පිළිබඳ නිගමනයට නොබසින ලෙස ය.

**02. යමක් හරිද වැරදි දූයි නිගමය කළ යුතු ක්‍රමය**

අප විසින් ඕනෑම දෙයක් හරිද වැරදි දූයි නිගමනය කිරීමේ දී අංශ හතරකින් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතුය. එනම්,

- **එය කුසල් ද අකුසල් ද?**
- **හරිද වැරදි ද?**
- **එය නුවණැත්තන්ගේ පැසසුමට ලක්වේ ද ගැරහුමට ලක් වේ ද?**
- **ඒවා සිතීම කීම හෝ කිරීම හිත පිණිස පවතී ද අහිත පිණිස පවතී ද? යනුවෙනි.**

**03. එම කාරණා හතර දූන ගැනීමට පාදක වන ප්‍රමිති**

යමක් කුසල් ද අකුසල් දැයි දූන ගැනීමට ඊට පදනම් වන චේතනාව සැලකිය යුතු ය. අකුසලය පිළිබඳ ප්‍රධාන චේතනා තුනකි. ලෝභය ද්වේෂය මෝහය යනුවෙනි. ප්‍රාණඝාතාදිය ඒ අකුසල චේතනා නිසා සිදුවන අකුසල ක්‍රියාවන් ය. යමක් කුසලයක් නම් එයට අලෝභ අදෝස අමෝහ චේතනා මුල් වී තිබිය යුතු ය. ඒ චේතනා ඇති විට ප්‍රාණඝාතා දී අකුසල් නොකරයි. කරන්නේ කුසල් පමණි. මේ බව වටහා ගෙන අකුසල චේතනාත් අකුසල ක්‍රියාත් දුරු කළ යුතු ය. කුසල චේතනාත් කුසල ක්‍රියාත් දියුණු කළ යුතු ය.

**04. සතර බ්‍රහ්ම විහරණ**

මෙසේ චේතනාවෙන් හා ක්‍රියාවෙන් පිරිසිදු වූ ආර්ය ශ්‍රාවකයා භවාග්‍රය දක්වා සදිසාවේ ම සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ඛා යන ධර්මයන්ගෙන් මහත්සේ පැතිර ගිය පුළුල්ව පැතිර ගිය බ්‍රහ්ම විහාර සිතින් වාසය කරයි.

**05. අස්වැසිලි හතර**

මෙසේ ආවාට ගියාට යම් යම් ආගම් මතවාද මිථ්‍යා දෘෂ්ටි නොපිළිගෙන මෙහි කියන ලද අයුරින් ධර්මානුකූලව පිළිගත හැකි දේ පමණක් පිළිගෙන අකුසලයෙන් වැළකී කුසලය දියුණු කොට සියලු සතුන් කෙරෙහි සිව් ඔබ විහරණයෙන් වාසය කරන පුද්ගලයාට අන්තිමේ දී අස්වැසිලි හෙවත් සැනසිලි දායක සිතුවිලි හතරක වාසිය ලැබෙන්නේ ය.

**01. පරලොවක් තිබේ නම් හොඳ කර්මවලට හොඳ විපාක ලැබේ නම් තමා අනිවාර්යයෙන් සුගතියට යන බවත්.**
**02. පරලොවකුත් නැත්නම් හොඳ නරක කර්මවල විපාකත් නැත්නම් හොඳින් ජීවත් වන තමා මෙලොව සුවෙන් සිටින බවත්.**
**03. පව් කිරීම කියා දෙයකුත් ඊට දුක් විපාකයකුත් තිබේනම් පව් නොකරන තමාට දුකක් විඳින්නට සිදු නොවන බවත්.**
**04. පව් කළත් නරක විපාකයක් නැත්නම් පව් නොකරන තමා එකවර අතින් බැලුවත් පිරිසිදු කෙනෙක් බවත් ය.**

අවසානයේ කී අස්වැසිලි හතර මෙලොව පරලොව හෝ හොඳ නරක විශ්වාස කරන නොකරන කාහට වුවත් නරකින් ඈත්ව හොඳ ජීවිතයක් ගත කිරීමේ වැදගත් කම හෝ අවශ්‍යතාවත් උගන්වයි. කියා දෙයි. ඒ නිසා මෙය ආගම් අදහන නො අදහන කාට වුවත් ප්‍රයෝජන දහමකි. ඒ සියලු දෙනා අවිවාදයෙන් බලාපොරොත්තු වන්නේ සුවසේ ජීවත් වී සතුටු සිතින් මිය යන්නට ය. එය සැබෑවක් කළ හැකි වන්නේ මේ සූත්‍රයේ ඉගැන්වූ පිළිවෙතට කටයුතු කළොත් පමණි. එසේ නැති කිසිවෙකුට මේ අස්වැසිල්ල ලැබෙන්නේ නැත. මේ දහම ඉතා අපූරුවට අලගියවන්න මුකවෙටි කවියා සුභාෂිතයේ දී පවසන්නේ මෙසේ ය.

> **ඇතත් නැතත් පරලොව සුදනෙනි මහත**
> **හළොත් යෙහෙකි පව්කම් නොතබා මැ සිත**
> **නැතොත් ඒ පරලොව ඉන් වන අවැඩ නැත**
> **ඇතොත් නැතැයි පව් කළහට වේ විපත**

**අභ්‍යාස**

01. යමක් පිළිගැනීමට එකම පදනම නොවිය යුතු කරුණු දහය පිළිබඳ විස්තරයක් කරන්න.
02. කාලාම සූත්‍රයේ සඳහන් පුද්ගලයෙක් මෙලොවදී ලබන අස්වැසිල්ල පිළිබඳ සටහනක් ලියන්න.

# 13 පාඩම

# දැහැමින් නැගෙති අදැහැමින් වැටෙති
## (පරාභව සූත්‍රය)

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජේතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමාගේ ආරාමයෙහි වැඩ වසන සේක. මේ අතර දිනක් එක්තරා දෙවියෙක් රාත්‍රියේ ප්‍රථම යාමය ඉක්ම ගිය කල්හි විශිෂ්ට ශරීර වර්ණයෙන් මුළු ජේතවනය ම ඒකාලෝක කරගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹුණේ ය. එළඹ, බුදුරදුන් වැඳ එකත් පස්ව සිට ගාථාවකින් මෙසේ සැළකළේ ය.

'පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං
භගවන්තං පුට්ඨුමාගම්ම කිං පරාභවතො මුඛං'

ගෞතමයන් වහන්ස, අපි පිරිහෙන පුද්ගලයා පිළිබඳ ව විමසමින් සිටිමු. ඒ පිළිබඳව භාග්‍යවතුන් වහන්සේගෙන් පිළිවිසීමට පැමිණියෙමු. ස්වාමීනි, පිරිහෙන්නාගේ පිරිහීමට දොරටු කවරේ ද?

'සුවිජානො භවං හොති සුවිජානො පරාභවො;
ධම්මකාමො භවං හොති ධම්මදෙස්සී පරාභවො'

දියුණුවන්නා පහසුවෙන් දත හැකි ය. පිරිහෙන්නා ද පහසුවෙන් දත හැකි ය. දහමට කැමැත්තා දියුණු වේ. දහමට ද්වේෂ කරන්නා පිරිහෙයි.

'ඉති හෙතං විජානාම පඨමො සො පරාභවො;
දුතියං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි දත් ඒ පළමුවන පිරිහීමේ කාරණය දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ දෙවන කාරණය කුමක් ද? වදාරනු මැනවි.

'අසන්තස්ස පියා හොන්ති සන්තෙ න කුරුතෙ පියං;
අසතං ධම්මං රොචෙති තං පරාභවතො මුඛං'

හේ අසත් පුරුෂයන් ප්‍රිය කරයි. බුද්ධාදී සත්පුරුෂයන් ප්‍රිය නොකරයි. අසත් පුරුෂයන්ගේ මිසදිටු දහම් රුචි කරයි. එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම, දුතියො සො පරාභවො;
තතියං භගවා බ්‍රෑහි, කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ දෙවන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස පිරිහෙන්නාගේ තුන්වන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'නිද්දාසීලී සභාසීලී අනුට්ඨාතා ච යො නරො;
අලසො කොධපඤ්ඤාණො තං පරාභවතො මුඛං'

යම් මිනිසෙක් නිතර නිදන සුලු වෙයි ද? පිරිස් මැද ගැවසෙන සුලු වෙයි ද? උත්සාහයෙන් තොර වෙයි ද? අලස වෙයි ද? කිපෙන්නෙකැයි ප්‍රකට වෙයි ද? එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම තතියො සො පරාභවො;
චතුත්ථං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ තුන්වන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ සිව්වන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'යො මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං;
පහු සන්තො න භරති තං පරාභවතො මුඛං'

යමෙක් හැකියාව තිබිය දී තරුණ විය ගෙවී ගොස් මහලුවියට පත් වූ මව හෝ පියා පෝෂණය නොකරයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම චතුත්ථො සො පරාභවො;
පඤ්චමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ සතරවන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ සිව්වන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'යො බ්‍රාහමණං වා සමණං වා අඤ්ඤං වාපි වණිබ්බකං;
මුසාවාදෙන වඤ්චෙති තං පරාභවතො මුඛං'

යමෙක් බමුණෙකු හෝ ශ්‍රමණයන් වහන්සේ නමක හෝ වෙනත් කිසියම් යදියෙකු හෝ බොරුවෙන් රවටයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම පඤ්චමො සො පරාභවො;
ඡට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ පස්වන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ සයවන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'පහූතවිත්තො පුරිසො සහිරඤ්ඤො සභොජනො;
එකො භුඤ්ජති සාදූනි තං පරාභවතො මුඛං'

බොහෝ රන් රුවන් ඇති රසමුසු බොජුන් ඇති. මහා ධනවත් පුරුෂයෙක් තමා පමණක් තනිව මිහිරි බොජුන් වළඳයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම ඡට්ඨමො සො පරාභවො;
සත්තමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ සයවන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස පිරිහෙන්නාගේ හත්වන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'ජාතිත්ථද්ධො ධනත්ථද්ධො ගොත්තත්ථද්ධො ච යො නරො;
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති තං පරාභවතො මුඛං'

යම් මිනිසෙක් ජාති මදයෙන් තද වූයේ ධන මදයෙන් තද වූයේ කුල මදයෙන් තද වූයේ සිය නෑයන් හෙළා දකී ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම සත්තමො සො පරාභවො;
අට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ හත්වන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ අටවන කාරණය කුමක් ද? වදාරනු මැනවි.

'ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො ච යො නරො;
ලද්ධං ලද්ධං විනාසෙති තං පරාභවතො මුඛං'

යම් මිනිසෙක් ස්ත්‍රීන්ට ලොල් වූයේ සුරාවට ලොල් වූයේ සූදුවට ලොල් වූයේ ලැබුණු ලැබුණු ධනය වනසයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම අට්ඨමො සො පරාභවො;
නවමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ අටවන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ නවවන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'සෙහි දාරෙහි සන්තුට්ඨො වෙසියාසු පදිස්සති;
දිස්සති පරදාරෙසු තං පරාභවතො මුඛං'

යමෙක් සිය අඹුවගෙන් සතුටු නොවී වෙසඟනන් වෙත යයි ද නැතහොත් පර අඹුවන් වෙත යයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම නවමො සො පරාභවො;
දසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ නවවන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ දසවන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'අතීතයොබ්බනො පොසො ආනෙති තිම්බරුත්ථනිං;
තස්සා ඉස්සා න සුපති තං පරාභවතො මුඛං'

යොවුන් විය ඉක්ම ගිය පුරුෂයෙක් තිඹිරිපල බඳු පියයුරු ඇති තරුණ යුවතියක් ආවාහකොට ගනී ද හෙතෙම ඇය පිළිබඳ ඊර්ෂ්‍යාවෙන් නින්ද පවා නොලබයි ද එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම දසමො සො පරාභවො;
එකාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ දසවන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන්නාගේ එකොළොස්වන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'ඉත්ථිං සොණ්ඩිං විකිරණිං පුරිසං වාපි තාදිසං;
ඉස්සරියස්මිං ඨපාපෙති තං පරාභවතො මුඛං'

පර ස්ත්‍රීන් පර පුරුෂයන් සුරා සූදු ආදියට ලොල් වූ ඒවා සඳහා ධනය විසුරුවන ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ගෙදරක හෝ කිසියම් ආයතනයක අධිපති තනතුරෙහි තබයි නම් එය පිරිහීමේ දොරටුවකි.

'ඉති හෙතං විජානාම එකාදසමො සො පරාභවො;
ද්වාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං'

මෙසේ අපි ඒ එකළොස්වන පිරිහීමේ කාරණය ද දැන් දනිමු. භාග්‍යවතුන් වහන්ස පිරිහෙන්නාගේ දොළොස්වන කාරණය කුමක් දැයි වදාරනු මැනවි.

'අප්පභොගො මහාතණ්හො ඛත්තියෙ ජායතෙ කුලෙ;
සො ච රජ්ජං පත්ථයති තං පරාභවතො මුඛං'

භවබෝග සම්පත් අල්ප වූ එහෙත් මහත් තෘෂ්ණාවක් ඇති යම් පුද්ගලයෙක් රාජකීය පවුලක උපදියි ද හෙතෙම රජකම ද පතයි නම් එය පිරිහෙන්නාගේ දොරටුවකි.

'එතෙ පරාභවෙ ලොකෙ පණ්ඩිතො සමවෙක්ඛිය;
අරියො දස්සනසම්පන්නො ස ලොකං භජතෙ සිවන්ති'

නුවණැති පුද්ගලයා මේ කියන ලද පිරිහෙන කරුණු මැනවින් දැක නුවණින් පිරිසිඳ දක්නා සුලු ආර්ය පුද්ලයෙකු ලෙසින් කටයුතු කොට පරලොව සුගතියට යන්නේ ය.

**විවරණය:**

දෙවියන් හා මිනිසුන් අතර මංගල කරුණු මොනවාදැයි කුකුසක් ඇති වූ අවස්ථාවේ දෙවියෙකු පැමිණ ඒ පිළිබඳ විමසූ විට මංගල යනු දෙලොව දියුණුවට හේතුවන කරුණු බව පැහැදිලි කරමින් මංගල සූත්‍රය වදාරණ ලදි. ඉන් අනතුරුව දෙවියන් අතර නැවත කුකුසක් ඇති විය. එනම් භාග්‍යවතුන් වහන්සේ වදාරණ ලද්දේ දෙලොව දියුණුවට හේතුවන කරුණු පමණි. පිරිහීමට හේතුවන කරුණු මොනවා දැයි අසා දැන ගතයුතු ය කියා ය. ඒ අනුව සක් දෙව් රජ විසින් ඒ ගැන විමසීමට එක්තරා දෙව් පුතෙකු බුදුරදුන් වෙත එවන ලදි. පරාභව සූත්‍රයෙන් දැක්වෙන්නේ ඔහු ඒ පිරිහීමේ දොරටු විමසූ ආකාරයත් බුදුරදුන් ඊට පිළිතුරු දුන් ආකාරයත් ය.

මේ සූත්‍රයේ පුද්ගලයෙකු පිරිහෙන තැනට වැටෙන ප්‍රධාන කරුණු දොළහක් ඇතුළත් වේ.

**01.**

**දහමට රුචි අරුචි බව** මෙහි ධර්මය යනු දස අකුසලයෙන් වෙන් වීම හෙවත් දස කුසලයයි. ලොව බොහෝ දෙනෙක් ප්‍රාණඝාතාදී දස අකුසලයට ස්වාභාවයෙන් ම නැමෙති. ඒවායෙන් වෙන් වීමට නැතහොත් දස කුසලයට කැමති නැත. එය තමාට අහිත කර වුවත් ඔවුන් කැමති වන්නේ අකුසලයට ම ය. මේ බව ධම්මපදයේ එන සුකරානී අසාධූනී ආදී ගාථාවෙන් මනාව පැහැදිලි කෙරෙයි. ලෝකයාගේ පිරිහීමට ප්‍රධාන කාරණය වී ඇත්තේ මේ කියන අධර්මයට ප්‍රිය කිරීම හා ධර්මයට එරෙහි වීමයි.

**02.**

**අසත් පුරුෂයන් ප්‍රිය කිරීම** මෙහි අසත් පුරුෂයන් යැයි කියන්නේ කර්මය හා කර්ම විපාක විශ්වාස නොකරන වැරදි දෘෂ්ටි දරන වැරදි මත උගන්වන පුද්ලයන් ය. අප අතර ජීවත් වන බොහෝ දෙනෙක් බුදුන් දහම් සඟුන් හෝ කුසල් අකුසල් ගරු නොකරන අයයි. ඔවුහු අසත් පුරුෂයෝ ය. ඔවුන් දරන මතය මිථ්‍යා දෘෂ්ටියයි. ඔවුන් කථා කරන්නේ ඒ වැරදි අදහස් ය. එය අසත් ධර්මයයි. එබඳු අසත් පුරුෂයන් ඇසුරු කිරීමත් ඔවුන්ගේ වැරදි අදහස් උදහස්වලට කැමති වීමත් කෙනෙකුගේ පිරිහීමට හේතුවකි.

03.
**නිකරුණේ ගෙවෙන අලස ජීවිතය** මෙම ගාථාවේ දී පිරිහීමට අදාළ කාරණා පහක් දක්වේ එනම්, නිතර නිදා ගැනීම. පිරිස් මැද ඕප දූප කථාවෙන් ගත කිරීම. උත්සාහයක් නැතිකම සහ අලසකමත් කෝපවන ගතියත් ය. මෙහි කියවෙන කරුණු හතරක් ම අලසයාගේ ලක්ෂණයි. තමාගේ දියුණුව පිළිබඳ කිසි උනන්දුවක් නැති හෙතෙම නිතර නිදයි. නැතහොත් යහළු මිතුරන් සමග කෙළිදෙලෙන් ගත කරයි. මේ නිසා ඉගෙනීමෙන් ධනයෙන් පිරිහෙන ඔහු තරහ ගැනීම ද ස්වභාවයකි. විශේෂයෙන් ඔහු උනන්දු කිරීමට කරන අවවාදවලදී නිතර ම කෝපවෙයි. මේ නිසා අලස කමත් කෝපයත් ඔහුගේ පිරිහීමේ ලක්ෂණයි.

04.
**මවුපියන්ට නොසැලකීම** තමා බිහි කොට හදා වඩා ගත් මවුපියන් තමා සමග ජීවත් කරගෙන ඔවුන් රැක බලා ගැනීම දියුණු වන දූදරුවන්ගේ ගතියයි. නැති බැරි දරුවෝ පවා අපහසුවෙන් නමුත් මෙය සිදුකරති. එහෙත් කෙනෙකු හැකියාව තිබිය දී එය නොකරන්නේ නම් එය ඔවුන්ගේ පිරිහීමට හේතුවන බව මෙයින් කියවේ.

05.
**මහණ බමුණන් රැවටීම** සිල්වත් ගුණවත් මහණ බමුණෝ දායකයන් දෙන දෙයින් යැපෙන්නෝ ය. ඔවුන්ට යමක් පිදිය යුතු තැන දී මග හැරීම හෝ වංචාවෙන් රැවටීම පහත් ක්‍රියාවකි. මහණ බමුණන් පමණක් නොව දුගී මගී යාචකාදී කෙනෙකු වුවත් එසේ රැවටීම පිරිහීමට මුලකි.

06.
**ධනය තනිව භුක්ති විඳීම** සිගාලෝවාද සූත්‍රය, පත්ත කම්ම සූත්‍රය වැනි, සූත්‍රවලදී කෙනෙකු උපයන ධනයෙන් තමා සමග ජීවත් වන හෝ තමා හා බැඳුණු නෑ හිත මිතුරන් ගුරු දෙමා-පියන් ආදී සියලු දෙනා සමග බෙදා හදාගෙන ජීවත් විය යුතු බව උගන්වා තිබේ. යම් කිසි ධනවතෙක් මසුරු සිටාණන් මෙන් අන් කිසිවෙකු ගැන නොසලකා ආත්මාර්ථකාමීව තමා පමණක් සුඛෝපභෝගීව ජීවත් වන්නේනම් එය ඔහුගේ පිරිහීමට මුලයි.

07.
**මාන්නාධික බව** කෙනෙක් තමන්ගේ ජාතිය නිසා හෝ ධනය නිසා හෝ කුලය නිසා හෝ වෙනත් දෙයක් නිසා හෝ තමාගේ ම නෑ හිතවතුන් පහත් කොට සලකමින් තමාගේ මහන්තත්තකම පෙන්වයි නම් එය පිරිහීමට කරුණකි.

08.
**දුසිරිතට ලොල් වීම** ස්ත්‍රීන්ට ලොල් වූ සුරාවට ලොල් වූ සූදුවට ලොල් වූ බොහෝ දෙනා තමාගේ දූදරුවන් ගැන පවා නොතකා උපයන ධනය ඒවාට ම වැය කරති. මහධන සිටු පුත්‍රයා මේ හේතුව නිසා සිටු තනතුරෙනුත් පිරිහී මෙලොව හිඟමනට ම ඇද වැටුණේ ය.

**09.**
**පරදාර සේවනය** සිය බිරියගෙන් හෝ සැමියාගෙන් තෘප්තිමත් නොවී පරපුරුෂයන් හෝ පරඅඹුවන් සේවනය කිරීමත් එබඳු පුරුෂයන් වෙසඟණුන් ඇසුරු කිරීමත් පිරිහීමට තවත් කාරණයකි.

**10.**
**මහලලෙක් තරුණියක ආවාහ කර ගැනීම** සත්තුභත්ත ජාතකයේ එන දුගී බමුණා සහ වෙස්සන්තර ජාතකයේ එන ජූජක බමුණා මෙන් මහලු කෙනෙක් යෞවනියක ආවාහ කර ගැනීම මහා අවුලකි. ඔහු දවස ගෙවන්නේ වෙනත් තරුණයන් ඇය කෙරෙහි ඇල්ම බැල්ම හෙළාය යන ඊර්ෂ්‍යාවෙනි. ඒ නිසා ඔහුට හරි හැටි නින්දක්වත් නැත. වයසින් පිරිහිහෙන ඔහුට මෙය තවත් පිරිහීමට කරුණකි.

**11.**
**නාස්ති කාරයෙකු අධිපති කිරීම** නිවසක හෝ ආයතනයක හෝ අධිපති වන ස්ත්‍රිය හෝ පුරුෂයා සුරාව සූදුව, ස්ත්‍රී පුරුෂ ඇසුර රස මසවුලු ආහාරයට කෑදරකම ආදී නාස්තිකාර වැඩවලින් ධන සම්පත් නසන්නෙක් නම් එය ඔහුගේ හෝ ඇයගෙත් එම ආයතනයෙත් පිරිහීමට හේතුවකි.

**12.**
**ධනය නැත්තෙක් රජකම් පැතීම** පෙර රජකම් කළේ ක්ෂත්‍රියෝ ය. රජකම් කිරීමට තමාට සෑහෙන ධනයක් තිබිය යුතු ය. එසේ ධනය නැතියෙක් රජ පවුලක උපන්නත් පාලනයට අත නොගැසිය යුතු ය. එය පිරිහීමට කරුණක් වන හෙයිනි. අද තත්වය මීට වඩා වෙනස් ය. අද පාලනට අත ගසන බොහෝ දෙනෙක් තැන්පත් ධනයක් ඇති අය නොවෙති. ඔවුන් බොහෝ දෙනෙක් දේශපාලනය තෝරා ගන්නේ ධනය ඉපයීමයට ය. අද රාජ්‍ය පාලනය පිරිහී ඇත්තේ මේ නරක ගතිය නිසා ය. එය මුළු රටේ ම පිරිහීමට කාරණයකි.

මේවා පිරිහීමේ කාරණා බව දැනගත් නුවණැත්තා මෙලොවත් දියුණු වී පරලොව සුගතියට යන්නේ ය. මෙහි දස්සන සම්පන්නයැ යැයි සදහන් කර ඇත්තේ ඒ පිරිහීමේ කරුණු දැනගෙන ඒවායින් වැළකී සිටින්නා ගැන ය.

**අභ්‍යාස**

01. පිරිහීමේ කරුණු ලැයිස්තුවක් පිළියෙල කරන්න.
02. මෙහි පිරිහිමේ කරුණක් මාතෘකා කරගෙන ශිෂ්‍ය සමිතියේ කතාවක් කරන්න.
03. මෙසේ පිරිහීමට පත්වූ අය ගැන ඔබ දන්නා තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

14
පාඩම

# වරදට බිය නිවනට පියවරයි
## (ආපත්තිභය සූත්‍රය)

''චත්තාරිමානි, භික්ඛවෙ, ආපත්තිභයානි. කතමානි චත්තාරි? සෙය්‍යථාපි, භික්ඛවෙ, චොරං ආගුචාරිං ගහෙත්වා රඤ්ඤො දස්සෙය්‍යුං 'අයං තෙ, දෙව, චොරො ආගුචාරී, ඉමස්ස දෙවො දණ්ඩං පණෙතූ'ති. තමෙනං රාජා එවං වදෙය්‍ය 'ගච්ඡථ, භො, ඉමං පුරිසං දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දථා'ති. තමෙනං රඤ්ඤො පුරිසා දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දෙය්‍යුං. තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස 'පාපකං වත, භො, අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං සීසච්ඡෙජ්ජං. යත්‍ර හි නාම රඤ්ඤො පුරිසා දළ්හාය රජ්ජුයා පච්ඡාබාහං ගාළ්හබන්ධනං බන්ධිත්වා ඛුරමුණ්ඩං කරිත්වා ඛරස්සරෙන පණවෙන රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං පරිනෙත්වා දක්ඛිණද්වාරෙන නික්ඛාමෙත්වා දක්ඛිණතො නගරස්ස සීසං ඡින්දිස්සන්ති. සො වතස්සාහං එවරූපං පාපකම්මං න කරෙය්‍යං ගාරය්හං සීසච්ඡෙජ්ජන්ති.

එවමෙව ඛො, භික්ඛවෙ, යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති පාරාජිකෙසු ධම්මෙසු. තස්සෙතං පාටිකඞ්ඛං: අනාපන්නො වා පාරාජිකං ධම්මං න ආපජ්ජිස්සති, ආපන්නො වා පාරාජිකං ධම්මං යථාධම්මං පටිකරිස්සති.

''සෙය්‍යථාපි, භික්ඛවෙ, පුරිසො කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මුසලං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය 'අහං, භන්තෙ, පාපකම්මං අකාසිං ගාරය්හං මොසල්ලං, යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති තං කරොමී'ති. තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස 'පාපකං වත, භො, අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං මොසල්ලං. යත්‍ර හි නාම කාළවත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මුසලං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වක්ඛති 'අහං, භන්තෙ, පාපකම්මං අකාසිං ගාරය්හං මොසල්ලං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමීති. සො වතස්සාහං එවරූපං පාපකම්මං න කරෙය්‍යං ගාරය්හං මොසල්ලන්ති.

එවමෙව ඛො, භික්ඛවෙ, යස්ස කස්සචි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති සඞ්ඝාදිසෙසෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං අනාපන්නො වා සඞ්ඝාදිසෙසං ධම්මං න ආපජ්ජිස්සති, ආපන්නො වා සඞ්ඝාදිසෙසං ධම්මං යථාධම්මං පටිකරිස්සති.

''සෙය්‍යථාපි, භික්ඛවෙ, පුරිසො කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා අස්සපුටං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය 'අහං, භන්තෙ, පාපකම්මං අකාසිං ගාරය්හං උපවජ්ජං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති තං කරොමී'ති. තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස 'පාපකං වත, භො, අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං අස්සපුටං. යත්‍ර හි නාම කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා අස්සපුටං ඛන්ධෙ ආරොපෙත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වක්ඛති අහං, භන්තෙ, පාපකම්මං

**අකාසිං ගාරය්හං අස්සපුටං; යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති තං කරොමීති. සො වතස්සාහං එවරූපං පාපකම්මං න කරෙය්‍යං ගාරය්හං අස්සපුටන්ති.**

**එවමෙවං ඛො, භික්ඛවෙ, යස්ස කස්ස චි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති පාචිත්තියෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං අනාපන්නො වා පාචිත්තියං ධම්මං න ආපජ්ජිස්සති, ආපන්නො වා පාචිත්තියං ධම්මං යථාධම්මං පටිකරිස්සති.**

**'සෙය්‍යථාපි, භික්ඛවෙ, පුරිසො කාළවත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය 'අහං, භන්තෙ, පාපකම්මං අකාසිං ගාරය්හං උපවජ්ජං. යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති, තං කරොමී'ති. තත්‍රඤ්ඤතරස්ස ථලට්ඨස්ස පුරිසස්ස එවමස්ස 'පාපකං වත, හො, අයං පුරිසො කම්මං අකාසි ගාරය්හං උපවජ්ජං, යත්‍ර හි නාම කාළකං වත්ථං පරිධාය කෙසෙ පකිරිත්වා මහාජනකායං උපසඞ්කමිත්වා එවං වක්ඛති අහං, භන්තෙ, පාපං කම්මං අකාසිං ගාරය්හං උපවජ්ජං; යෙන මෙ ආයස්මන්තො අත්තමනා හොන්ති තං කරොමීති. සො වතස්සාහං එවරූපං පාපකම්මං න කරෙය්‍යං ගාරය්හං උපවජ්ජන්ති.**

**එවමෙව ඛො, භික්ඛවෙ, යස්ස කස්ස චි භික්ඛුස්ස වා භික්ඛුනියා වා එවං තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හොති පාටිදෙසනීයෙසු ධම්මෙසු, තස්සෙතං පාටිකඞ්ඛං අනාපන්නො වා පාටිදෙසනීයං ධම්මං න ආපජ්ජිස්සති, ආපන්නො වා පාටිදෙසනීයං ධම්මං යථාධම්මං පටිකරිස්සති. ඉමානි ඛො, භික්ඛවෙ, චත්තාරි ආපත්තිභයානීති.**

මහණෙනි, ආපත්ති භය සතරාකාර වෙයි. ඒ සතර කවරේ ද? යත් මහණෙනි යම්සේ අපරාධ කරන සුලු සොරෙකු අල්ලාගෙන දේවයන් වහන්ස, මේ සොරා අපරාධ කරන්නෙකි. දේවයන් වන්සේ, මොහුට දඬුවම් පනවනු ලැබේවායි, රජතුමා වෙත ඉදිරිපත් කරණු ලැබෙයි. රජු මෙසේ නියම කරයි. රාජ පුරුෂයනි, මේ පුරුෂයා දැඩි රැහැනකින් පිටිතල හයා තද බැඳුමෙන් බැඳ හිස මුඩු කොට ගොරහැඩි වද බෙර හඬ මැද වීදියෙන් වීදිය මංසන්දියෙන් මංසන්දිය හරහා රැගෙන ගොස් දකුණු වාසල් දොරෙන් පිටතට යවා හිස සිඳ දමවයි කියාය. රාජ පුරුෂයෝ ද එම පුරුෂයා දැඩි රැහැනකින් පිටිතල හයා දැඩි බැඳුමෙන් බැඳ හිස මුඩුකොට ගොරහැඩි වද බෙර හඬ මැද වීදියෙන් වීදිය මංසන්දියෙන් මංසන්දිය ඔස්සේ ගෙන ගොස් දකුණු වාසල් දොරෙන් පිට කරවා නගරයේ දකුණු පස දී හිස සිඳ දමන්නාහ.

අතර මග තැනක සිටි එක්තරා පුරුෂයෙකුට මෙසේ සිතෙයි. අහෝ මේ පුරුෂයා හිස සිඳිය යුතු තරම් පව්ටු ක්‍රියාවක් සිදු කොට ඇත. රාජ පුරුෂයන් ඔහු දළ රැහැනකින් පිටිතල හයා තද බැඳුමෙන් බැඳ හිස මුඩුකර ගොරෝසු වද බෙර හඩ මැද වීදියෙන් වීදිය මංසන්දියෙන් මංසන්දිය ඔස්සේ ගෙන ගොස් දකුණු දොරින් පිටත් කොට නගරය දකුණු පස දී හිස සිඳ දමන්නේ ඒ නිසා ය. එහෙයින් මම නම් මෙබඳු ගැරහිය යුතු හිස සිඳිය යුතු තරම් පාප කර්මයක් නොකරන්නෙමි'යි යනුවෙනි.

ඒ ආකාරයෙන් ම මහණෙනි, යම් කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට පාරාජිකා ආපත්ති ධර්ම පිළිබඳ මෙබඳු තියුණු බිය හැඟීමක් ඇති විය යුතු ය. උන්වහන්සේට මෙතෙක් නොපත් පාරාජිකා ආපත්තියකට පත් නොවන්නේ ය. පත්වූ පාරාජිකා ආපත්තියට ධර්ම විනයානුකූලව පිළියම් කරන්නේ ය යැයි අපේක්ෂාව ඇති විය යුතු ය.

මහණෙනි, යම්කිසි පුරුෂයෙක් කලු වස්ත්‍රයක් හැඳගෙන කෙස් විසුරුවාගෙන මෝල් ගසක් කර තබාගෙන මහජනයා මැදට ගොස් මෙසේ කියයි. ස්වාමීනි, මම ගැරහිය යුතු, මෝල් පහර දිය යුතු පාප කර්මයක් කෙළෙමි. ඔබතුමන්ලා මට යම් දඬුවමක් කරනු කැමති වන්නහු නම් මම ඒ දඬුවමට යටත් වෙමි යනුවෙනි.

මේ අතර එහි පසෙක සිටින එක්තරා පුරුෂයෙකුට මෙසේ සිතෙයි අහෝ මේ පුරුෂයා ගැරහිය යුතු මෝල් පහර දිය යුතු පව්ටු ක්‍රියාවක් කර ඇත. ඔහු කලු වස්ත්‍රයක් ඇඳගෙන කෙස් විසුරුවාගෙන මෝල් ගසක් කරේ තබාගෙන මහජනයා මැදට පැමිණ ස්වාමීනි, මම ගැරහිය යුතු, මෝල් පහර දිය යුතු පව්ටු ක්‍රියාවක් කෙළෙමි. එයට තමුන්නාන්සේලා යම් දඬුවමක් කරණු කැමති නම් මම එය විඳීමට කැමැත්තෙමි'යි කියන්නේ ඒ නිසා ය. මම නම් ඒකාන්තයෙන් ම මෙබඳු ගැරහිය යුතු මොල් පහරදියයුතු පාප කර්මයක් නොකරන්නනෙමි'යි යනුවෙනි.

එසේ ම මහණෙනි, යම් කිසි භික්ෂුවකට හෝ භික්ෂුණියකට සංඝාදිසේස ආපත්ති ධර්ම පිළිබඳ තියුණු බිය සිතක් ඇතිවිය යුතු ය. එසේම උන්වහන්සේට මෙතෙක් නොපත් සංඝාදිසේසාපත්තියකට නොපැමිණෙන්නේ ය. පත්වූ වූ සංඝාදිසේසා පත්තියක් වේ නම් ධර්ම විනායනුකූලව පිළියම් කරන්නේ ය යන අපේක්ෂාව ඇති විය යුතු ය.

යම් සේ මහණෙනි, පුරුෂයෙක් කළු වස්ත්‍රයක් හැඳගෙන කෙස් විසුරුවාගෙන අළු පොදියක් කරේ තබාගෙන මහජනයා මැදට පැමිණ මෙසේ කියන්නේ ය. මම ස්වාමීනි, ගැරහිය යුතු, අළු පොදියෙන් පහර දිය යුතු, පව්ටු ක්‍රියාවක් කළෙමි. ඒ සඳහා තමුන්නාන්සේලා යම් දඬුවමක් කිරීමට කැමතිවන්නහු නම් එය කිරීමට මම කැමැත්තේමි.

මෙසේ කියන විට එහි පසෙක සිටින පුරුෂයෙකුට මෙසේ සිතෙයි. අහෝ මේ පුරුෂයා ගැරහිය යුතු අළු පොදියෙන් පහර දිය යුතු. පව්ටු ක්‍රියාවක් කර ඇත. ඔහු කලු වස්ත්‍රයක් ඇඳගෙන කෙස් විසුරුවාගෙන මෝල් ගසක් කරේ තබාගෙන මහජනයා මැදට පැමිණ ස්වාමීනි, මම ගැරහිය යුතු, මෝල් පහර දිය යුතු පව්ටු ක්‍රියාවක් කෙළෙමි. එයට තමුන්නාන්සේලා යම් දඬුවමක් කරනු කැමති නම් මම එය විඳීමට කැමැත්තෙමි'යි යැයි කියන්නේ ඒ නිසා ය. මම නම් ඒකාන්තයෙන් මෙබඳු ගැරහිය යුතු අලුපොදියෙන් පහර දිය යුතු පව්ටු ක්‍රියාවක් නොකරමි, යනුවෙනි.

මහණෙනි, එසේ ම කිසියම් භික්ෂුවකට හෝ භික්ෂුණියකට පාචිත්තිය ආපත්ති පිළිබඳව මෙබඳු තියුණු බිය හැඟීමක් ඇති විය යුතු ය. එසේම උන්වහන්සේට මෙතෙක් නොපත් පාචිත්තිය ආපත්තියකට නොපැමිණෙන්නේ ය. පත්වූ පාචිත්තිය ආපත්තියට ධර්ම විනයානු කූලව පිළියම් කරන්නේ ය යන අපේක්ෂාව ඇතිවිය යුතු ය.

යම් සේ මහණෙනි, පුරුෂයෙක් කළු වස්ත්‍රයක් හැඳගෙන මහජනයා මැදට පැමිණ මෙසේ කියන්නේ ය. මම ස්වාමීනි, ගැරහිය යුතු, දොස් නැගිය යුතු පව්ටු ක්‍රියාවක් කළෙමි. ඒ සඳහා තමුන්නාන්සේලා යම් දඬුවමක් කිරීමට කැමතිවන්නහු නම් එය කිරීමට මම කැමැත්තෙමි යනුවෙනි.

මෙසේ කියන විට එහි පසෙක සිටින පුරුෂයෙකුට මෙසේ සිතෙයි. අහෝ මේ පුරුෂයා ගැරහිය යුතු, දොස් නැගිය යුතු, පව්ටු ක්‍රියාවක් කර ඇත. ඔහු කළු වස්ත්‍රයක් ඇඳගෙන කෙස් විසුරුවාගෙන මහජනයා මැදට පැමිණ ස්වාමීනි, මම ගැරහිය යුතු, දොස් නැගිය යුතු පව්ටු ක්‍රියාවක් කෙළෙමි. එයට තමුන්නාන්සේලා යම් දඬුවමක් කරනු කැමති නම් මම එය විඳීමට කැමැත්තෙමි'යි යැයි කියන්නේ ඒ නිසාය. මම නම් ඒකාන්තයෙන් මෙබඳු ගැරහිය යුතු දොස් නැගිය යුතු පව්ටු ක්‍රියාවක් නොකරමි යනුවෙනි.

මහණෙනි, එසේම කිසියම් භික්ෂුවකට හෝ භික්ෂුණියකට පාටිදේසනීය ආපත්ති පිළිබඳ ව මෙබඳු තියුණු බිය හැඟීමක් ඇති විය යුතු ය. එසේම උන්වහන්සේට මෙතෙක් නොපත් පාටිදේසනීය ආපත්තියකට නොපැමිණෙන්නේ ය. පත්වූ පාටිදේසනීය ආපත්තියට ධර්ම විනයානු කූලව පිළියම් කරන්නේ ය යන අපේක්ෂාව ඇතිවිය යුතු ය.

මහණෙනි, මේ ආපත්ති භය හතරයි.

## විවරණය

මෙම ආපත්තිභය සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ උපසපන් භික්ෂු භික්ෂුණී දෙපිරිස ඇවැත් පිළිබඳ බියෙන් කටයුතු කළයුතු බවට අවවාද කරති. විනය පිටකයේදී උපසපන් භික්ෂු භික්ෂුණීන් සඳහා පනවන ලද විනය ශික්ෂාපද ප්‍රධාන වශයෙන් වර්ග හතරක ට බෙදේ. පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය යනුවෙනි.

## පාරාජිකා

භික්ෂූන් වහන්සේලා සඳහා පාරාජිකා ශික්ෂාපද හතරකි. භික්ෂුණීන් වහන්සේලා සඳහා පාරාජිකා ශික්ෂා පද අටකි. මෙයින් කවර හෝ පාරාජිකා ශික්ෂා ආපත්තියකට පත් භික්ෂුවකුගේ හෝ භික්ෂුණියකගේ උපසම්පදාව සහමුලින් ම නැති වන්නේ ය. නැවත මේ ජීවිතය තුළදී උපසම්පදා වීමට ඉඩ නොලැබේ. ඊට පිළියම් ඇත්තේ දෙකකි. මුළු ජීවිතය ම සාමණේරයෙකු වශයෙන් ගත කිරීම හෝ ගිහිව උපාසක උපාසිකාවක වශයෙන් ගත කිරීම ය. පාරාජිකා ආපත්ති ගැන සඳහන් වන්නේ තල් පොල් වැනි ගසක් කරටියෙන් ම කැඩීයාමක් ලෙස ය. එය නැවත ලියලන්නේ නැතුවාසේ උපසම්පදාව ද නැවත ලැබිය නොහැකි බැවිනි. මෙම සූත්‍රයේ දී එය හිස සිඳීමකට උපමා කොට ඇත. අපරාධ කරුවෙකුගේ හිස ගසා දමනු දකින පුද්ගලයෙකුට අපරාධ කිරීමට යම් බියක් ඇති වේනම් ඒ හා සමාන බියක් භික්ෂුවකට හෝ භික්ෂුණියටක පාරජිකා පත්තියකට පැමිණීම පිළිබඳ ඇති විය යුතුබව මෙහි සඳහන් වේ. එසේම පාරාජිකා ඇවතකට පත්වූවෙක් නම් ඊට පිළියම ද ඉක්මනින් කර ගත යුතු බව තව දුරටත් දැක්වේ.

## සංඝාදිසේස

පාරාජිකාවලින් පසුව බරපතල ම ඇවැත් නම් සංඝාදිසේසයි. භික්ෂූන් සඳහා සංඝාදිසේස දහතුනකි. භික්ෂුණීන් සඳහා දාහතකි. මෙම ආපත්තිවල දී පිළියම් කොට නැවත උපසම්පදාව යථා තත්වයට පත්කර ගත හැකි ය. එහෙත් ඒ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත උසම්පදාව ලැබීමටත් වඩා බරපතලය. පාරාජික හැර ඕනෑම ඇවතකට පත් වුවහොත් ඒ බව නිසිපරිදි උපසපන් භික්ෂුවකට දැනුම් දීම පළමුවෙන් ම කළ යුතු කාර්යයයි. එය ඇවත් දෙසීම නමින් හැඳින්වේ. සංඝාදිසේසවලට ඇවත් දෙසීමෙන් පමණක් පිළියම් කළ නොහැකි ය. ඇවැත් දෙසීමෙන් සිදුවන්නේ එම ඇවත කල් ගතවීම වැළැක්වීම පමණි. පාරාජිකාව මෙන් මහණකම සහමුලින් ම නැති නොවුනත් සංඝාදිසේසාපත්තියකට පත්වූ භික්ෂුවකගේ උපසම්පදාව තාවකාලිකව අත්හිටවනු ලැබේ. ඒ සඳහා නියමිත පිළිවෙත් පුරා උපසම්පදාවීම හා සමානව ම උපසපන් භික්ෂූන් 21ක් නමක් සීමාවට වැඩමවා නැවත ඒ භික්ෂුවගේ උපසම්පදාව වලංගුභාවයට පත්කළ යුතු ය. එය සංඝයාගෙන් තාවකාලික ව ඉවත් කොට නැවත සංඝයා අතරට කැඳවා ගැනීමක් වන බැවින් එයට අබ්බාහන (ආහ්වාන - කැඳවීම) විනය කර්මයයැයි කියනු ලැබේ.

සංඝාදිසේසාපත්තියකට පත් වූ භික්ෂුවකට පිළියම් කිරීමේ දී මුලින්ම සංඝයා මැදට කැඳවා එම භික්ෂුවට සංඝ කර්මවලින් ඉවත්ව පරිවාස කාලයක් ගත කිරීමට නියම කරනු ලැබේ. පරිවාසය දෙයාකාරයකින් සිදුවේ. යම් විදියකින් භික්ෂුව ඇවත නොදෙසා වසන් කරගෙන සිටියොත් ඒ සිටි කාලය හා සමාන කාලයක් වෙනම ආවාසක හිඳ දිනපතා තමන් ඇවතට පත් වූ බවත් පිරිවෙස් පුරණ බවත් එම වෙහෙරේ සිටින හා වෙහෙරට පැමිණෙන උපසපන් භික්ෂූන්ට දැනුම් දෙමින් ගත කළ යුතු ය. එය පරිවාස නමින් හඳුන්වනු ලැබෙයි.

ඇවත නොදෙසා වසන් කරගෙන නැත්නම් හෝ වසන් කළ කාලයට සරිලන පිරිවෙස් පුරා අවසන් කළ පසුව හෝ නැවත දින හයක් අනිවාර්යයෙන් ම පෙරසේ ම සංඝයාගෙන් වෙන්ව තමන් ප්‍රකෘති භික්ෂුවක් වීමට අපේක්ෂාවෙන් සිටින බව උපසම්පදා භික්ෂූන්ට දැනුම් දෙමින් ගත කළ යුතු ය. ඒ දින හයේ ගත කරන පරිවාසය මානත්ත(මානත්) යැයි හඳුන්වනු ලැබේ. සීමාවට කැඳවා අබ්බාහන කර්මය කරන්නේ මෙම පිරිවෙස් හා මානත් සපුරා අවසන් වූ පසුව ය. මේ ආපත්තිවලට පිළියම් කිරීමේ දී ආරම්භයේ දීත් මැද දීත් අවසානයේ දීත් සංඝයා අවශ්‍ය වන හෙයින් සංඝයාගේ අනුමැති හා සහභාගීත්වය අවශ්‍ය වන හෙයින් මේවා සංඝ + ආදි + සේස යැයි කියනු ලැබේ.

### පාචිත්තිය

පාරාජික සංඝාදිසේස තරම් බරපතල නොවන ඇවත් වර්ගයකි. පාචිත්තිය වර්ග දෙකකි. නිස්සග්ගිය පාචිත්තිය සහ සුද්ධ පාචිත්තිය යනුවෙනි. නිස්සග්ගිය පාචිත්තිය යනු සිවුරු පිරිකර වැනි උපකරණ වැරදි ලෙස පාවිච්චි කළ විට එය නිස්සග්ගිය වේ. එනම් ඒ පිළිබඳව භික්ෂුවට තිබෙන අයිතිය නැති වේ. නැවත එය ලබා ගැනීමට නම් එම වරද නිවරද කොට ඇවත දෙසිය යුතු ය. උදාහරණයක් ලෙස සිදුරක් සහිතව සිවුරක් පාවිච්චි කළොත් එය නිසගි වේ. එහිදී එම සිදුර මසා උපසපන් භික්ෂුවකට ඉදිරිපත් කොට එහි අයිතිය ලබාගෙන ඇවත දෙසිය යුතු ය. එම සිවුර මසන තුරු ඇවතෙන් පිරිසිදු විය නොහැකි ය. භික්ෂු භික්ෂුණී දෙපිරිසට ම පොදුවේ නිසැගි පචිති තිහකි.

සුද්ධ පාචිත්තිය නම් විකාල භෝජනාදී සුළු සුළු වැරදි ය. ඒවා තවත් උපසපන් භික්ෂුවක් ඉදිරියේ ආරෝචනය කිරීමෙන් හෙවත් ඇවත් දෙසීමෙන් පමණක් පිරිසිදු විය හැකි ය. භික්ෂූන් සඳහා සුද්ධ පාචිත්තිය අනූ දෙකකි. භික්ෂුණීන් සඳහා එකසිය හැට හයකි.

### පාටිදේසනීය

පාටිදේසනීය යනු ගැරහිය යුතු ඇවැත් ය. පාචිත්තිය වැනි වැරදි නොව සාමාන්‍යයෙන් ශ්‍රමණ ධර්මයට නොගැළපෙන, සාමාන්‍යයෙන් මිනිස් දහමටත් නොගැළපෙන ක්‍රියාවක දී තමන් එය කළ බව භික්ෂුවක් ඉදිරියේ ප්‍රකාශ කිරීමයි. මෙබඳු ගැරහිය යුතු ආපත්ති භික්ෂූන් සඳහා හතරකි. භික්ෂුණී සඳහා අටකි. මේ සියල්ලටම පදනම වී ඇත්තේ ආහාර පිළිගැනීමයි. උදාහරණයක් ලෙස භික්ෂුවක් ඉතා දුගී දිළිඳු ගෙදරට ඇරයුමකින් තොරව ගොස් ආහාර ගැනීම ගැරහිය යුතු වරදකි. එහි දී තමා එවැන්නක් කළ බව ප්‍රකාශ කොට ඇවත් දෙසීමෙන් පිරිසිදු විය යුතුයි. එය පාටිදේසනීය නම්.

මේ සූත්‍රයේ සඳහන්වන පරිදි පාරාජිකාපත්තියට හිස ගසා දැමීමට තරම් බියවිය යුතු ය. සංඝාදිසේසාපත්තියට මෝල් පහර කෑමට සිදු වීම තරම් බිය විය යුතු ය. පාචිත්තියාපත්තියකට අළු පොට්ටනියකින් පහර කෑමට තරම් බිය විය යුතු ය. පාටි දේසනීය ආපත්තියකට ප්‍රසිද්ධියේ බැනුම් ඇසීමට සිදුවීමට තරම් බිය විය යුතුයි. මේ සියලු ශික්ෂා පදවලදී සැලකිය යුතු ප්‍රධාන කාර්යය නම් පාරාජිකා හැර අනෙක් සෑම ඇවතකදීම අවශ්‍යයෙන් ම ඇවත් දෙසීම කළ යුතු බවයි. එනම් තමා එම වරද කළ බව භික්ෂුවකට දැනුම් දීමයි. පාචිත්තිය හා පාටිදේසනීය ඇවත් එසේ දෙසූ පමණින් ම පිරිසිදු වන අතර සෙසු ඇවත්වල දී එදිනෙදා ද ඇවත් දෙසීම පිළියම් කර ගැනීමට පහසුවක් වෙයි.

මේ නිසා වරදට බිය ඇති ගිහියන් දිනපතා පන්සිල් සමාදන් විය යුතු ය. වරදට බිය ඇති සාමණේරයන් වහන්සේලා නිතිපතා දසසිල් දමාදන් විය යුතු ය. වරදට බිය ඇති උපසම්පදා භික්ෂූන් වහන්සේලා නිතිපතා ඇවත් දෙසා ගත යුතු ය. යනු මෙම සූත්‍රයෙන් දෙන පණිවුඩයයි.

**අභ්‍යාස**

01. මෙහි සඳහන් වන පුරාණ දඬුවම් සතර පැහැදිලි කරන්න.
02. භික්ෂූන් සඳහා පණවා ඇති පාටිදේසනීය ආපත්ති මොනවාදැයි ප්‍රාතිමෝක්ෂයෙන් සොයා සටහන් කර පෙන්වන්න.

# 15 පාඩම — අභිධර්මය - ඔබ ඔබේ රූපය හඳුනනවා ද?

චිත්ත, චෛතසික, රූප, සහ නිබ්බාණ වශයෙන් පරමාර්ථ ධර්ම සතරක් ඇති බව ඔබ දන්නෙහි ය. ඉන් චිත්ත සහ චෛතසික පරමාර්ථ පිළිබඳ පසුගිය වසරවල දී ඉගෙනගත් ඔබට මෙම පාඩමේ දී රූප පරමාර්ථය පිළිබඳ ඉගෙනීමට ලැබේ. ශීත උෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යයන් නිසා විකාරයට නොහොත් වෙනස්වීමට පත්වන්නේ රූපය යි.

**රුප්පතීති භවෙ රූපං විකාර පච්චයෙ සති**
**රූප රූපං තථා රූපං පරියාපන්නතො පරං**

යනුවෙන් ශීත, උෂ්ණ ආදී විරුද්ධ ප්‍රත්‍ය ඇතිකල්හි යම් රූපයක් විකාරයට පැමිණේ ද එය රූපරූප නම් වේ. වෙනත් රූප ද, රූප රූපයට ම ඇතුළත් වන බැවින් ඒවා රූප නම් වේ. යැයි දක්වා ඇත. මෙම රූප පිළිබඳ විග්‍රහ කරන අභිධර්මාර්ථ සංග්‍රහයේ දී රූප ආකාර පහක් යටතේ විභාග කොට දක්වා ඇත.

| | |
|---|---|
| 01. රූප සමුද්දෙස | රූප පිළිබඳ සැකෙවින් විස්තර කිරීම. (නම් වශයෙන්) |
| 02. රූප විභාග | දක්වන ලද රූප නැවත බෙදා දැක්වීම. |
| 03. රූප සමුට්ඨාන | රූප උපදවන හේතු ප්‍රත්‍ය දැක්වීම. |
| 04. රූප කලාප | රූප සමූහ වශයෙන් බැඳී සිටින ආකාරය දැක්වීම. |
| 05. රූප ප්‍රවෘත්ති ක්‍රම | රූප පවතින පිළිවෙල දැක්වීම. |

## 1. රූප සමුද්දේස

අභිධර්මයට අනුව රූප විසි අටකි (28) කි. එම රූප පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනුවෙන් මහා භූත රූප හතරක් සහ උපාදාය රූප 24 ක් ලෙස දෙයාකාර ය. එසේ ම නිෂ්පන්න රූප 18 ක් හා අනිෂ්පන්න රූප 10 ක් ලෙස ප්‍රධාන කොටස් දෙකකි. ඒවා සියල්ල මාතෘකා එකොළසක් යටතේ වර්ග කර ඇත.

### නිෂ්පන්න රූප 18

| | | | |
|---|---|---|---|
| 01. | මහා භූතරූප | 4 | පඨවි, ආපෝ, තේජෝ, වායෝ |
| 02. | පසාද රූප | 5 | චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය |
| 03. | විසය රූප | 4 | රූප, ශබ්ද, ගන්ධ, රස |
| 04. | භාව රූප | 2 | ඉත්ථිභාව, පුරිස භාව |
| 05. | හදය රූප | 1 | හෘදය වස්තුව |
| 06. | ජීවිත රූප | 1 | ජීවිතින්ද්‍රිය රූපය |
| 07. | ආහාර රූප | 1 | කබලිංකාහාර |

**අනිෂ්පන්න රූප 10**

| | | | |
|---|---|---|---|
| 01. | පරිච්ඡේද රූප | 1 | ආකාස ධාතුව |
| 02. | විඤ්ඤත්ති රූප | 2 | කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති |
| 03. | විකාර රූප | 3 | ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා |
| 04. | ලක්ඛණ රූප | 4 | උපචය, සන්තති, ජරතා, අනිච්චතා |

රූප සියල්ල 28 කි. (අභිධර්ම II පාඩමේ දී මේ පිළිබඳ විස්තරයක් ඇත.)

**2. රූප විභාග**

මේ අට විසි රූප සියල්ල පොදුවේ ලක්ෂණ අටකින් යුක්ත ය. එනම්

**අහෙතුක, සප්පච්චය, සාසව, සංඛත, ලෞකික, කාමාවචර, අනාරම්මණ, අප්පහාතබ්බ** යනුවෙනි.

**අහෙතුක** - නාම - හෙවත් චිත්ත - චෛතසිකයන්හි මෙන් රූපයන්හි ලෝභාදී අකුසල මූලයන් ද, අලෝභාදී කුසල මූලයන් ද යෙදීමක් නැති බැවින් අහේතුක ය.

**සප්පච්චය** - රූප සමග යෙදෙන ලෝභාදී හේතු නැතත් රූප, කර්ම, චිත්ත, ඍතු ආහාර යන ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා බැවින් සප්පච්චය වෙයි.

**සාසව** - ආසව නම් කාම ආදී කේලශයන් ය. රූප අරමුණු කොට කෙලෙස් උපදී. එබැවින් රූපය සාසව ය.

**සංඛත** - හේතු ප්‍රත්‍යයන්ගේ එක්වීමෙන් සකස් වන සැම දෙයක් ම සංඛත ය. නිවන හැර සියල්ල සංඛත ගණයට වැටේ. මේ අනුව රූප ධර්ම ද සංඛත ය.

**ලෞකික** - නව ලොව්තුරා දහම් (මග පල, නිවන හැර) සියල්ල ලෞකික ය. ඒ අනුව රූපධර්ම සියල්ල ම ලෞකික ය.

**කාමාවචර** - කාමාවචර යන්නෙන් කාම භූමියට අයත් හෝ කාමයට හෙවත් තෘෂ්ණාවට ගොදුරුවන යන අර්ථ දෙයි. ඒ අනුව රූපය කාම ලෝකයට අයත් ය. මේ නිසා රූපය කාමාවචර ය.

**අනාරම්මණ** - චිත්ත චෛතසිකයන් මෙන් අරමුණු ගැනීමක් රූපයට නැති හෙයින් අනාරම්මණ ය.

**අප්පහාතබ්බ** - ප්‍රහාණය කළ යුත්තේ ක්ලේශයන් ය. රූප පිළිබඳ ව ප්‍රහාණය කළ යුත්තේ රූප නොව රූප රාගයයි. එවිට රූපය නිරායාසයෙන් ම ප්‍රහාණය කළා වන්නේ ය. එබැවින් රූපය අප්පහාතබ්බ වෙයි.

රූප ධර්ම නැවත දෙයාකාර වශයෙන් වගී නවයකට බෙදේ.

**1. අජ්ඣත්තික රූප බාහිර රූප**

පඤ්ච ඉන්ද්‍රිය හා සම්බන්ධ ධර්ම පිළිබඳ මම ය, මාගේ ය යන මමායනය ඉතා දැඩි ය. එබැවින් චක්ඛු, සොතාදි ප්‍රසාද රූප ආධ්‍යාත්මික රූප ලෙස ගැනේ. සෙසු රූප 23 පිළිබඳ ව ම එතරම් තෘෂ්ණාවක් නොමැති බැවින් ඒවා බාහිර රූප නම්.

**2. වත්ථු රූප අවත්ථු රූප**

චිත්ත චෛතසිකයන්ගේ හට ගැනීමට හා වාසයට හේතු වන බැවින් ප්‍රසාද රූප පසත්, හදය රූපයත් වත්ථු රූප ලෙස ද, එසේ නාම ධර්මයන්ට වාසය නොවන සෙසු රූප ධර්ම අවත්ථු රූප ලෙස ද සැලකේ.

**3. ද්වාර රූප අද්වාර රූප**

චිත්ත පරම්පරාවන්ගේ ඇතිවීමට හා පැවතීමට දොරටු වන චක්ඛු සොත ආදී ප්‍රසාද රූප පසත් කාය කර්ම හා වාක් කර්මයන් පහළ වීමට දොරටු වන විඤ්ඤත්ති රූප දෙකත් ද්වාර රූප නම්. සෙසු රූප 21 අද්වාර නම් වෙයි. ඒවා කාය කර්මාදියට දොරටු නොවේ.

**4. ඉන්ද්‍රිය රූප අනින්ද්‍රිය රූප**

ඉන්ද්‍රිය ශබ්දය අධිපති හෝ පාලනය කරන යන අර්ථය දෙයි. චක්ඛු විඤ්ඤාණාදී විඤ්ඤාණයන්ට අධිපති වන බැවින් ප්‍රසාද රූප පසත්, ස්ත්‍රීත්වය හා පුරුෂත්වය පාලනය කරන බැවින් භාවරූප දෙකත්, කර්මජ රූප පාලනය කරන බැවින් ජීවිතින්ද්‍රියත් යන රූප අට (8) ඉන්ද්‍රිය රූප නම්. සෙසු රූප 20 අනින්ද්‍රිය රූප වෙයි.

**5. ඕළාරික රූප සුඛුමරූප**

ප්‍රසාද රූප පසත්, විසය රූප සතත් යන දොළොස් රූපයන් ඉන්ද්‍රිය-අරමුණු වශයෙන් ගැටෙන සුලු බැවින් ඕළාරික ය. මෙහි විසය රූප සතක් වූයේ පොට්ඨබ්බ රූපය පඨවි, තේජෝ, වායෝ යන භූත රූප තුන ගැනෙන හෙයිනි.

වර්ණ රූපය ඇසට ද, ශබ්ද රූපය කණට ද, ගන්ධ රූපය නාසයට ද රස රූපය දිවට ද දැනෙන අතර කයට දැනෙන රූප තුනකි. එනම් පඨවි, තේජෝ, වායෝ යන රූපයන් ය. එබඳු ගැටීමක් නැති බැවින් ඉහත දැක්වූ දොළොස් රූප හැර ඉතිරි රූප 16 සුඛුම රූප නම්.

**6. උපාදින්න රූප  අනුපාදින්න රූප**

ඉන්ද්‍රිය රූප අටත්, ඉදිරියට කියවෙන අවිනිබ්භාග රූප අටත් උපාදින්න රූප නම්. මේවා තණ්හා දිට්ඨි වශයෙන් දැඩිව අල්ලා ගන්නා බැවින් එනම් වෙයි. මේවා පූර්ව කර්මයෙන් හටගන්නා බැවින් කර්මජ රූප නමින් ද හැඳින්වේ. එබඳු අල්ලා ගැනීමක් නැති චිත්ත, සෘතු, ආහාරයන් ගෙන් හටගන්නා ඉතිරි රූප දහය අනුපාදින්න නම්.

**7. සනිදස්සන රූප  අනිදස්සන රූප**

ඇසින් දැකිය හැකි රූපයයි. එනම් වර්ණ රූපයයි. සෙසු රූප සත් විස්ස ම අනිදස්සන නම්.

**8. ගොචරග්ගාහික රූප  අගොචරග්ගාහික රූප**

ගොදුරු ගන්නා හෙවත් අරමුණු ගන්නා ප්‍රසාද රූප පස ගොචරගාහික නම්. සෙසු රූප 23 අගොචරගාහික නම් වෙයි.

**9. අවිනිබ්භොග රූප  විනිබ්භොග රූප**

වෙන් කළ නොහැකි පරිදි එක ම කලාපයක් ලෙස නිතර ම පවතින භූත රූප සතරත්, වර්ණ (රූප රූපය) ගන්ධ, රස, ඕජා (ආහාර) යන රූප සතරත් අවිනිබ්භාග රූප නම්. අනිකුත් රූප 20 සෙසු රූපයන්ගෙන් වෙන්කොට දැක්විය හැකි බැවින් විනිබ්භාග වේ.

**රූප සමුට්ඨාන**

රූප උපදවන හේතු රූප සමුට්ඨාන නම්. එනම්, කම්ම, චිත්ත, උතු ආහාර යන සතරයි.

**කම්ම** රූප උපදවන කර්ම නම් අකුසල දොළස (12) කාමාවචර කුසල අට (8) රූපාවචර කුසල පස (5) යන පස්විසි චේතනාවන් ය. අරූපාවචර හා ලොකුත්තර චෙතනා (කර්ම) රූප නොඋපදවයි. අට විසි රූප අතුරෙන් කර්ම හේතුවෙන් පමණක් උපදින රූප නම් ඉන්ද්‍රිය රූප අට සහ හදය රූපයයි. අතීත කුසලාකුසල චේතනා නැමැති කර්මය සත්ව සන්තානයෙහි ප්‍රතිසන්ධියේ පටන් ක්‍ෂණයක් පාසා ම රූප උපදවයි. කර්මයෙන් උපදවන රූප කර්මජ රූප නම්. ජීවිතින්ද්‍රිය පවා මරණය තාක් පවතින්නේ කර්මයෙනි.

**චිත්ත** අසූ නවයක් වූ සිත් අතුරින් දෙපස් විඤ්ඤාණ සිත් හා අරූපාවචර විපාක සිත් හැර සෙසු සිත් පන් සැත්තෑව ම රූප උපදවයි. සිතින් පමණක් උපදනා රූප දෙකකි. එනම් විඤ්ඤත්ති රූප දෙකයි. ශරීරය ඉබේ සෙලවෙන්නේ නැත. යාම්ඊම් අත්පා එසවීම් ආදී ශරීරයෙන් කෙරෙන ක්‍රීඩා මෙන් ම වචනයෙන් කෙරෙන සියලු ප්‍රකාශන කෙරෙන්නේ සිතින් උපදවන රූප බලයෙනි.

**උතු** සත්ව ලෝක හා සංඛාර ලෝක යනුවෙන් ගැනෙන ජීව - අජීව වූ සියලු ලෝකය ම ඇති කිරීමෙහි සමත් බලවේගය වන තේජෝ ධාතුව මෙහි උතු යන්නෙන් ගැනේ. ''උදයති ජනෙතීති උතු'' යනු ඊට දී ඇති අර්ථයයි. මෙය රූප උපදවන රූපයකි. හුදු උතුවෙන් පමණක් හටගන්නා රූප කිසිවක් නැත. උතු බලපෑමෙන් උපදින රූප අතරින් අවිනිබ්භොග රූප අටට සෙසු හේතු තුන ම බලපායි. ශබ්ද රූපයට චිත්තය ද, විකාර රූප තුනට චිත්ත හා ආහාර හේතු දෙක උතුවට සහාය වේ.

**ආහාර** ඕජාව දෙයාකාර ය. අභ්‍යන්තර ඕජාව හා බාහිර ඕජාව වශයෙනි. අවිනිබ්භොග හෙවත් ඕජට්ඨමක රූපවලට අයත් ඕජාව අභ්‍යන්තර ඕජාව ය. එය ශරීරයේ සියලු රූපයන් තුළ ඇතුළත් ව තිබේ. කබලිංකාහාර මගින් පිටතින් ලැබෙන ඕජාව බාහිර ඕජාව ය. රූප උපදවන්නේ මේ ඕජා දෙකම එකතුවීමෙහි එකකටවත් තනිව රූප ඉපදවිය නොහැකි ය. කුසගිනි උපදිනවිට ශාරීරික ඕජාව මතු වී එයි. ආහාර ගත්විට ඕජා දෙක එකතු වී ශරීරයට දිරවා ගනී. එතැන් සිට රූප උපදවයි. අම්ල පිත්ත රෝගය වැළඳෙන්නේ වෙලාව පසුවී ආහාර ගන්නා විට අභන්තර ඕජාව වියළී යාම නිසා, බාහිර ඕජාවට තනිව දිරවීමට හෝ රූප ඉපදවීමට නොහැකි බැවිනි. ඒ බව අං.නි. පඤ්චක නිපාතයේ උස්සුරභත්ත සූත්‍රයේ සඳහන් ය.

සත්ත්වයාට නැවත නැවත ආහාර ගැනීමේ උවමනාව ඇතිවන්නේ ද ඍතුජ රූප වූ ශරීරය මලානික වන්නේ ද මේ ඕජාව නැතිවීමෙනි. ගස්වැල්වල මෙකී ආහාර රූපය ඇත. එහි ඇත්තේ ඍතුජ රූපයෝ ය. ඒවා වැඩෙන්නේ ඍතුජ රූප හේතු කොට ගෙන ය. සත්ත්වයා සහ ගස්වැල් අතර වෙනස ද මෙයයි. ඕජාවෙන් හෙවත් ආහාරයෙන් පමණක් උපදනා රූප ද කිසිවක් නැත. ආහාරජ රූපවලට ද වෙනත් හේතු සම්බන්ධ විය යුතු ය.

රූප සමුට්ඨානය පිළිබඳ ව මෙතෙක් විස්තරයේ දී ප්‍රකාශ වී ඇත්තේ රූප දොළොසක් පමණි. එනම් කර්මජ රූප දහයත්, ඒකාන්ත චිත්තජ රූප දෙකත් ය. ඉතිරි රූප පිළිබඳ සමුට්ඨානය මෙසේය.

ශබ්ද රූපය, චිත්ත, ඍතු දෙකින් ම හටගනී. විකාර රූප තුන චිත්ත, ආහාර දෙකින් හටගනී. අවිනිබ්භෝග රූප අට හා ආකාශ රූපය කර්ම ආදී හේතු සතරින් ම හටගනී. ලක්ෂණ රූප සතර මේ කිසිදු හේතුවකට අදාළ නොවේ. ඒවා මෙකී හේතුවලින් නොඋපදනා රූප ලෙස හඳුන්වනුයේ කර්ම ආදී හේතු පහෙන් හටගත් රූපයන්ගේ ඉපදීම, දිරීම, බිඳී යාම යන ලක්ෂණ මාත්‍රයක් පමණක් වන බැවිනි.

**රූප හටගැනීමේ පිළිවෙළ සැකවින් මෙසේ යඃ-**

**01. කර්මජ රූප 18**

අවිනිබ්භෝග රූප අට, ආකාශ ධාතුව, හෘදය රූපය සහ ඉන්ද්‍රිය රූප අට.

**02. චිත්තජ රූප 15**

අවිනිනිබ්භෝග රූප අට, ආකාශ ධාතුව, ශබ්ද රූපය, විඤ්ඤත්ති රූප දෙක, විකාර රූප දෙක

**03. උතුජ රූප 13**

අවිනිබ්භෝග රූප අට, ආකාශ ධාතුව, ශබ්ද රූපය, විකාර රූප තුන

**04. ආහාරජ රූප 12**

අවිනිබ්භෝග රූප අට, ආකාශ ධාතුව, විකාර රූප තුන

**රූප කලාප**

රූප කිසි විටකත් තනි තනි ව නො උපදී. ඒවා තවත් රූප හා සම්බන්ධ වී උපදින්නේ ය. සාමාන්‍යයෙන් එකවර උපදින්නේ අවම වශයෙන් රූප අටකවත් සමූහයකි. ඒවා රූප කලාප නමින් හැඳින්වේ. රූප කලාපවලට වෙනත් කලාපවලින් වෙන්වීමේ සීමාවක් (පරිච්ඡේදයක්) ඇත. එහෙත් ඒ කළාප තුළ ඇති රූප අතර පරිච්ඡේදයක් නැත. එකිනෙක තුළ ගිලී ගියා සේ පවතී.

එකට ඉපදීම, එකට බිඳීම, එක ම නිශ්‍රයක (ඇසුරක) පැවතීම, එකට පැවතීම යනු මේ රූප කලාපවල ලක්ෂණයයි. රූප කලාප එක්තරා ක්‍රමයකට සැදී තිබේ. ඒ අනුව කලාප විසි එකකි. ඒවා කර්මජ කලාප නවයක් ද, චිත්තජ කලාප සයක් ද, ඍතුජ කලාප සතරක් ද, ආහාරජ කලාප දෙකක් ද යනුවෙන් වගී කෙරේ.

**කර්මජ කලාප 9**

| | | |
|---|---|---|
| 01. | **චක්ඛු දසකය** | අවිනිබ්භාග රූප අට සහ ජීවිත රූපය යන නවයට චක්ඛුප්පසාද රූපය එක්වීමෙන් සෑදේ. |
| 02. | **සොත දසකය** | මුලින් කී රූප නවයට සොතප්පසාද රූපය එක්වීමෙන් සෑදේ. |
| 03. | **ඝාණ දසකය** | ඒ රූප නවයට ම ඝාණප්පසාද රූපය එක්වීම. |
| 04. | **ජිව්හා දසකය** | ඒ රූප නවයට ම ජිව්හාප්පසාදය එක්වීම. |
| 05. | **කාය දසකය** | ඒ රූප නවයට ම කායප්පසාදය එක්වීම. |
| 06. | **ඉත්ථිභාව දසකය** | ඊට ස්ත්‍රීභාව රූපය එක්වීමෙන් සෑදේ. |
| 07. | **පුමභාව දසකය** | ඊට පුරුෂභාව රූපය එක්වීමෙන් සෑදේ. |
| 08. | **වත්ථු දසකය** | ඊට හදය රූපය එක්වීමෙන් සෑදේ. |
| 09. | **ජීවිත දසකය** | ඊට ජීවිත රූපය එක්වීමෙන් සෑදේ. |

**චිත්තජ කලාප 6**

| | | | |
|---|---|---|---|
| 01. | **සුද්ධට්ඨක කලාපය** | | අවනිබ්භාග රූප අට |
| 02. | **කාය විඤ්ඤත්ති නවකය** | - | සුද්ධට්ඨකයට කාය විඤ්ඤත්තිය එක් වී සෑදෙයි |
| 03. | **වචී විඤ්ඤත්ති දසකය** | - | සුද්ධට්ඨකයට වචී විඤ්ඤත්ති, සද්ද යන රූප එක් වී සෑදෙයි |

| | | | |
|---|---|---|---|
| 04. | **ලහුතාදීඑකාදසකය** | - | සුද්ධට්ඨකය සහ විකාර රූප තුන. |
| 05. | **කායවිඤ්ඤත්තිලහුතාදී ද්වාදසකය** | - | සුද්ධට්ඨකය, කාය විඤ්ඤත්තිය, සහ විකාර රූප තුන. |
| 06. | **වචී විඤ්ඤත්ති සද්දලහුතාදී තෙරසකය** | - | සුද්ධට්ඨකය, කාය විඤ්ඤත්තිය, සද්ද රූපය සහ විකාර රූප තුන. |

**උතුජ කලාප 4**

**01. සුද්ධට්ඨක කලාපය**
**02. සද්ද නවක කලාපය (සුද්ධට්ඨකය හා ශබ්දය)**
**03. ලහුතාදීඑකාදසක කලාපය (සුද්ධට්ඨකය විකාර රූප තුන)**
**04. සද්දලහුතාදී ද්වාදසක කලාපය (සුද්ධට්ඨකය, ශබ්දය, විකාර රූප)**

**ආහාරජ කලාප 2**

**01. සුද්ධට්ඨක කලාපය**
**02. ලහුතාදී එකාදසක කලාපය (සුද්ධට්ඨකය විකාර රූප තුන)**

මෙසේ රූප කලාප සියල්ල එක්විස්සකි.

**රූප ප්‍රවෘත්තිය**

රූප පහළ වීම හා පැවතීම සත්ත්ව යෝනි හෙවත් උත්පත්ති වර්ග අනුව ද, භූමි හෙවත් කාමාදී ලෝක අනුව ද විවිධ වෙයි.

උත්පත්ති වර්ග අනුව සත්ත්ව වර්ග සතරකි.

| | | |
|---|---|---|
| **01.** | **අණ්ඩජ** | **බිජුවටින් හටගන්නා සත්ත්වයෝ** |
| **02.** | **ජලාබුජ** | **මාතෘ ගර්භයේ වැදෑමසෙන් හටගන්නා සත්ත්වයෝ** |
| **03.** | **සංසේදජ** | **ගහ කොළ, පස්. කසල වැනි තැන්වල උපදින සත්ත්වයෝ** |
| **04.** | **ඕපපාතික** | **කර්මානුරූප ව ඉබේ පහළ වන දේව ආදී සියුම් ශරීර ඇති සත්ත්වයෝ** |

මෙයින් අණ්ඩජ, ජලාබුජ යන දෙකොටස ම මව් කුස හට ගන්නා බැවින් ගබ්භසෙය්‍යක නම් වෙයි. ගබ්භසෙය්‍යක සත්ත්වයන්ට ප්‍රතිසන්ධියේ දී ම කාය දසක, භාව දසක, වත්ථු දසක යන රූප කලාප පහළ වෙයි. ඇතැම් අලිංගික සත්ත්වයන්ට භාව දශකය පහළ නොවේ. මේවා ප්‍රතිසන්ධියත් සමග ම පහළ වන්නේ කර්මජ කලාප වන බැවිනි.

ගබ්භසෙය්‍යයක සත්ත්වයන්ගේ චක්ඛු, සොත, ඝාණ, ජිව්හා දසක පහළ වන්නේ ප්‍රතිසන්ධියෙන් පසුව එන ප්‍රවෘත්ති කාලයන්හි ය. එයින් අල්පායුෂ්ක සත්ත්වයන් මව් කුස වෙසෙන්නේ මද කලකි. ඔවුන්ට චක්ඛු ආදී දසක ඉක්මනින් පහළ වේ. දීර්ඝායුෂ්ක

සත්ත්වයන් මවු කුස වැඩි කලක් වෙසෙන අතර ඒ දසක සතර පහළ වන්නේ කල් ගත වීමෙනි. මනුෂ්‍යයන්ට චක්ඛු, සෝත, ආදී සතර පහළ වන්නේ ප්‍රතිසන්ධියෙන් සති එකොළහකට පසුව යයි අටුවා මතයයි. මේ පිළිබඳ ස්ථිර නිගමනයක් නැත.

මෙසේ කර්මජ රූප ප්‍රතිසන්ධියේ දී ම පහළ වීම ඇරඹෙන අතර ප්‍රතිසන්ධි සිතට අනතුරු ව පහළ වන දෙවන සිත වන භවංග සිතේ පටන් චිත්තජ රූප පහළ වීම ද ඇරඹෙයි. ප්‍රතිසන්ධි සිත තහවුරු (ස්ථිර) වූ තැන් පටන් උතුජ රූප පහළ වෙයි. කර්ම, චිත්ත, සෘතු යන රූප පහළ වීමෙන් පසු ඒවා එක්ව ඕජා ප්‍රත්‍ය නිපදවයි. එයට මවගෙන් ලැබෙන බාහිර ඕජාව ද (ආහාර) එක්වීමෙන් ආහාරජ රූප ඉපදීම ඇරඹෙයි. මෙතැන් පටන් දිගට මේ පරම්පරාව ජීවිත කාලය පුරා උපදිමින්, පවතිමින්, නැතිවෙමින් යයි.

සංසේදජ සහ ඕපපාතික යන සත්ත්වයන්ට ප්‍රතිසන්ධියත් සමග ම චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, භාව, වත්ථු යන දසක සත ම පහළ වෙයි. මේ අතර චක්ඛු, සොත, ඝාණ, භාව යන දශකයන් නොලබන සත්ත්වයෝ ද වෙති. එය ඇතැම් සත්ත්වයන්ට ප්‍රතිසන්ධියට යෙදවූ කර්මයේ දුබලකම නිසා සිදු වේ. ඔවුන් උපදින්නේ ම එවන් ශක්තීන් නැති සත්ත්ව වර්ගයක ය. ඒ දශක ලැබිය යුතු මනුෂ්‍යයන් වැනි සත්ත්වයන් අතර ද අකුසල කර්ම හේතුවෙන් මේ දසක නොලබන්නෝ වෙති. අඳ, ගොළු, බිහිරි, නපුංසක ආදී වෙනස්කම් ඇති වන්නේ ඒ අදාළ දශක පහළ නො වීමෙනි.

සත්ත්වයා මැරෙන කල චුති චිත්තයට සිත් දහහතකට (17) පෙරාතුව කර්මජ රූප පහළ වීම නවතී. උපන් කර්මජ රූප ද චුති සිතත් සමග නිරුද්ධ වෙයි. චුති සිතෙන් සිතේ පහළොවකට පසු ව චිත්තජ රූප පරම්පරාව ද සිඳී යයි. ඒවාට පැවතීමට ශක්තියක් ඉන් පසුව නැත. මෘත ශරීරය යනුවෙන් ඉතිරි වන්නේ උතුසමුට්ඨාන රූප පමණි. රූප ලෝකයෙහි ඝාණ දසක, ජිව්හා දසක, කාය දසක, භාව දසක, සහ ආහාරජ කලාප ද නැත. රූපී බ්‍රහ්මයන්ට ප්‍රතිසන්ධියත් සමග ම චක්ඛු, සොත, වත්ථු යන දසක තුන ද ජීවිත නවකය ද යන කර්මජ කලාප සතර පහළ වෙයි. ප්‍රතිසන්ධියෙන් පසුව ප්‍රවෘත්තියේ දී (පැවතීමේදී) චිත්තජ හා උතුජ රූප කලාප පහළ වෙයි. ඔවුනට ආහාරජ කලාප නැති බැවින් ඔවුන්ගේ ජීවිතය පාලනය වන්නේ ජීවිත නවකයෙනි.

අසඤ්ඤ සත්ත්වයන්ට චක්ඛු, සොත, වත්ථු යන දසක සහ ශබ්ද රූපය නො ලැබේ. චිත්තජ රූප ද කිසිවක් පහළ නොවේ. ඔවුන්ගේ ප්‍රතිසන්ධියේ දී පහළ වන්නේ ජීවිත නවකය පමණකි. ප්‍රවෘත්ති කාලයෙහි දී ශබ්දය හැර සෙසු උතුසමුට්ඨාන රූප පහළ වේ.

මේ අනුව කාම ලෝකයෙහි රූප විසි අට ම පහළ වෙයි. රූප ලෝකයෙහි ඇත්තේ රූප විසි තුනකි. (23) ඝාණ, ජිව්හා, කාය රූප තුන හා භාව රූප දෙක නැත. අසඤ්ඤ සත්ත්වයන්ට ප්‍රසාද රූප පස, භාවරූප දෙක, හදය රූපය විඤ්ඤත්ති රූප දෙක සහ ශබ්ද නැති බැවින් රූප ඇත්තේ දාහතක් (17) පමණි. අරූප ලෝකයෙහි මේ රූප විසි අට ම පහළ නොවේ.

රූපී සත්වයන්ට ශබ්ද රූපය, විකාර රූප තුන සහ ජරතා අනිච්චතා යන රූප ප්‍රතිසන්ධියේ දී පහළ නොවේ. එහෙත් ප්‍රවෘත්තියේ දී සියල්ල පහළ වෙයි.

16
පාඩම

# අභිධර්මය - අපේ රූප විසි අටකි

## 01. මහාභූත රූප 4

මහා භූත රූප සතරකි. පඨවි ධාතුව, අපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව යනු ඒ සතර යි. පඨවි යනු තද ගතිය හෝ මෙලෙක් ගතිය යි. ධාතු යනු මූල ස්වභාවය යි. සියලු වස්තූන් හි පවත්නා මූලික තද ගතිය පඨවි ලෙස හැඳින් වේ. යමක් අතට හසුවන්නේ මෙම පඨවි ධාතුව නිසා යි.

ආපෝ ධාතුව නම් ද්‍රව ගතිය යි. යම් වස්තුවක ඇති වැගිරෙන ගතිය ආපෝ නමින් හැඳින් වේ. ආපෝ ධාතුවෙන් සිදුවන්නේ සෙසු රූප එකට බැඳී පවත්වාගෙන යාම යි. විසිරෙන දූවිල්ල ජලය සමග මුසු වූ විට එකට බැඳී පවතින්නාක් මෙනි. ආපෝ ධාතුව ස්පර්ශ කළ නො හැකි ය. ජලය ආපෝ ධාතුවට අයත් වුව ද එය ඇල්ලීමේ දී අතට දැනෙයි. ඒ එහි ඇති පඨවි ධාතුව නිසයි.

තේජෝ ධාතුව කිසියම් දෙයක් තුළ පවතින උණුසුම් හෝ සිසිල් ගතිය යි. මේ හැරුණු විට දිලිසෙන ගතිය, තියුණු ගතිය, පැහෙන ගතිය තේජෝ ධාතුව ලෙස හැඳින් වේ. කුඩා දරුවෙකු තරුණ බවට පත්වන්නෙත් තරුණයකු මහලු බවට පත්වන්නෙත් තේජෝ ධාතුව නිසයි. පැසවීම, මේරීම, දිරීම යනාදිය තේජෝ ධාතුවයි. ගින්නෙහි තේජෝ ධාතුව අධිකව ඇත.

වායෝ ධාතුව නම් සැලෙන, ඉල්පෙන ගතිය යි. සෙසු රූපයන් නොවැටෙන සේ උසුලාගෙන සිටින්නේ වායෝ ධාතුව යි. මෙයින් රූපයන්ගේ චංචල භාවය, ගමන් කරන ස්වභාවය, ක්‍රියා කිරීම ආදිය සිදු වේ. වායෝ ධාතුව සුළඟෙහි අධිකව දැකිය හැකි ය.

## 01. උපාදාය රූප

රූප 28 න් පළමු සතර මහාභූත රූප බව සඳහන් කෙරිණි. ඉතිරි රූප 24 උපාදාය රූප ලෙස හැඳින් වේ. ඒවා මහාභූත රූප සතර ඇසුරු කරගෙන ඒ හා ඇඩිව බැඳී පවත්නා බැවින් එසේ හැඳින් වේ. ඒවා කොටස් දහයකි.

## 02. පසාද රූප 5

ප්‍රසාද නම් ඔපය යි. අප සතු චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය වශයෙන් ඉන්ද්‍රිය පහකි. ඒවාට අදාළව ප්‍රසාද රූප උපදී. ඒ අනුව චක්ඛුප්පසාදාදී වශයෙන් පසාද රූප පහකි. ඇසින් රූප දැකීමට ඇති කැමැත්ත, ආශාව සත්ත්වයා තුළ ඇඩිව ඇත. එසේ අන් ඉන්ද්‍රියන්හි අරමුණු පිළිබඳ ව ඇති කැමැත්ත නිසා පසාද රූප හටගනී. එමගින් අරමුණු විඳගෙන ඒවා නිසා සත්ත්වයා නැවත නැවත උපදී. චක්ඛුප්පසාදය, සොතප්පසාදය, ඝාණපප්සාදය, ජිව්හාප්පසාදය, කායප්පසාදය යනුවෙන් ඒ පසාද රූප පහ නම් කෙරේ.

**චක්ඛුප්පසාදය**

චක්ඛු හෙවත් ඇස සසම්භාර චක්ඛු හා පසාද චක්ඛු වශයෙන් කොටස් දෙකකට බෙදේ. ඇසට අදාළ මස් පිඬුව සසම්භාර චක්ඛු නම් වේ. එය ඇසුරු කොට පවත්නා කෘෂ්ණ මණ්ඩලය හෙවත් කලු ඉංගිරියාව මැද පිහිටි රූප පරාවර්තනය වන ප්‍රසාද ගතිය චක්ඛුප්පසාද නමින් හැඳින් වේ.

**සෝතප්පසාදය**

මෙය ද සසම්භාර සෝත හා ප්‍රසාද සෝත යනුවෙන් දෙයාකාර ය. සසම්භාර සෝත යනු කන් බිලය තුළ පවත්නා ඇඟිලි මුදුවක් බඳු කන් බෙරය මත ඇති තඹවන් රෝමයකි. එය ඇසුරුකොට පවත්නා ශබ්ද දැනගැනීමේ ශක්තිය ඇති සියුම් ස්වභාවය සෝතප්පසාද නම් වේ.

**ඝාණප්පසාදය**

නාසිකා සිදුරෙහි ඇති එළු කුහරයක ස්වරූපයෙන් පිහිටි මස් වැදැල්ල සසම්භාර ඝාණ නමින් හැඳින් වේ. ඒ ඇසුරුකොට පවත්නා ගඳ සුවඳ විඳ ගැනීමේ ශක්තිය ඝාණප්පසාදය යි.

**ජිව්හාප්පසාදය**

මසින් සැදුණු දිවෙහි මුල පවත්නා මහනෙල් පෙති අගක් බඳු කොටස සසම්භාර ජිව්හාව යි. එහි තැවරුණු යම් දෙයක රස විඳගැනීමේ සියුම් ශක්තිය ජිව්හාප්පසාදය යි.

**කායප්පසාදය**

මෙහි සසම්භාර ගණයට මුළු ශරීරය ම ඇතුළත් වේ. ඒ ස්පර්ශය දැනගැනීමේ ශක්තිය ශරීරය පුරාම ඇති නිසයි. කෙස්, ලොම් සහ නිය ද, වියලි සම ද හැර සෙසු ශරීරයෙහි සෑම තැන ම ස්පර්ශය දැනගැනීමේ ශක්තිය කායප්පසාද නම් වේ.

## 03. විසය රූප 4

රූප, ශබ්ද, ගන්ධ, රස යන සතර විසය රූප ලෙසින් හැඳින් වේ. ඉහත දැක් වූ පසාද රූප පහට විෂය වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රශ්ටව්‍ය යන සියල්ල එක් වස්තුවක් තුළ පවතී.

**රූප :**

ඇසට ගෝචර වන හෙවත් ඇසින් දැකිය යුතු වර්ණ හෝ පැහැය රූප නමින් හැඳින් වේ. නාම-රූප ව්‍යවහාරයේදී භෞතික සියල්ල රූප නමින් හැඳින්වෙන්නේ සීතෝෂ්ණාදියෙන් විනාශ වන දේ නිසා ය. ඒ සියල්ල ඇසට පෙනෙන නිසා නොවෙයි. කවර වස්තුවක හෝ ඇසට පෙනෙන්නේ ඊට අදාළ වර්ණයයි. රූප යනු ඊට කියන නමයි. නිල්, කහ, රතු ආදිය වර්ණයි. සාමාන්‍යයෙන් වර්ණය රඳාපවතින්නේ පඨවි, ආපො, තෙජො ධාතුවලය. වායෝ ධාතුව සියුම් බැවින් වර්ණයක් නොරඳයි. වායුව නොපෙනෙන්නේ ඒ නිසාය.

**ශබ්ද :**

සතර මහාභූතයන් ඇසුරුකොට ගනිමින් පවතින කණට ගෝචරවන හඬ ශබ්ද නමින් හැඳින් වේ. සතර මහා භූතයන්ගෙන් හැදුණු භූතපිණ්ඩයක් තවත් භූත පිණ්ඩයක ගැටීමෙන් ශබ්දය උපදී බෙරයත් කඩිප්පුවත් මෙනි. ශබ්දය ත්‍රිවිධය. එකිනෙක ගැටීමෙන් උපදින ශබ්දය **සංයෝගජ** ය. කැඩීමෙන් බිඳීමෙන් හට ගන්නා ශබ්දය **විභාගජ** ය. ශබ්දයෙන් ශබ්දය තරංග වශයෙන් කණට එන්නේ **ශබ්දජ** ය. (එය මුල් දෙක කණට පැමිණෙන ආකාරය මිස අමුතු ශබ්දයක් නොවේ.

ගන්ධ :

නාසයට දැනෙන ගඳ හෝ සුවඳ ගන්ධ නමින් හැඳින් වේ. සතරමහා භූතයන්ගෙන් සැදුණු සෑම වස්තුවකම ඇසට පෙනෙන වර්ණයක් පවතින්නා සේම නාසයට දැනෙන ගඳක් ද ඇත. එය සුවඳ දුගඳ වශයෙන් දෙයාකාර වේ. ඒ ඒ වස්තුවල එකතුවන භූත ධර්මයන්ගේ විවිධත්වය අනුව විවිධ ගඳ දැනේ.

රස :

දිවෙන් දත යුතු දෙය රසයයි. කෂාය, තික්ත, මධුර, ලවණ, අම්ල, කටුක යන සය ආකාර වූ රසයන් දැනගන්නේ දිව ඇසුරු මගිනි. මසින් සැදි දිවට සීතල, උණුසුම, තද, මෘදු ගතිය වැනි දේ දැනේ. ඒවා දැනෙන්නේ දිව මසේ තිබෙන කායප්‍රසාදයටයි. ජිව්හාප්‍රසාදයට දැනෙන්නේ ඉහත කී රසයන් පමණි. සතර මහා භූතයන්ගෙන් සැදි. සෑම වස්තුවක ම රසයක් ද ඇත. ඒ වස්තු දියෙන් තෙත් වූ විට. රසය දැනේ. තෙත්වීමේ කාර්යය කේටයෙන් ද සිදුවේ. කලුගල්, මැණික් ආදියේත් රසයක් ඇත. එකවර එය නොදැනෙන්නේ තෙත් නොවන නිසා ය. රස පරික්ෂකවරයෙක් රස බලා යම් යම් දේ නිගමනය කරන්නේ හැම දෙයක ම රසයක් ද ඇති නිසා ය.

ස්ප්‍රෂ්ටව්‍ය:

අභිධර්මයට අනුව පොට්ඨබ්බ ධාතුවක් නැත. එහෙත් කාය ප්‍රසාදයට දැනෙන ස්පර්ශයක් ඇත. පඨවි, තේජෝ, වායෝ යන ධාතු තුන ස්පර්ශවන අතර ආපෝ ධාතුව ස්පර්ශ කළ නො හැකි ය. ආපෝ ධාතුව යනු වැගිරෙන ගතිය මිස ද්‍රව්‍යයක් නොවේ. ජලයේ කායප්‍රසාදයේ ගැටෙන්නේ අතට හසුවන්නේ සෙසු ධාතු තුන යි. එයිනුත් ස්පර්ශයේ දී වඩාත්ම දැනෙන්නේ පඨවි, තේජෝ දෙක යි. වායෝ ධාතුව ද ස්පර්ශ නොවන තරම් සියුම් ය. සුළඟින් යමක් පෙරලෙන්නේ එහි ඇති පඨවි බලයත්, වේගයත් නිසා ය. රූප විභාගයේ දී රූප, ශබ්ද, ගන්ධ, රස යන සතර පමණක් ප්‍රසාද රූප ලෙස දක්වන්නේ ස්ප්‍රෂ්ටව්‍ය හෙවත් ස්පර්ශ වන දෙය පඨවි, තේජෝ, වායෝ වශයෙන් භූතරූපවලදී කියවුණු නිසා ය. පොට්ඨබ්බ (ඵුස + තබ්බ) යන්න පරිවර්තනය විය යුත්තේ ස්පර්ශ කියා නොව ස්ප්‍රෂ්ටව්‍ය කියා ය. එනම් ස්පර්ශ වන දෙය යි. ස්පර්ශ යනු කායප්‍රසාදයේ කාර්ය යි.

**04. භාව රූප 2**

ඉත්ථිභාව හා පුරිසභාව කියා භාව රූප දෙකකි. භාව රූප සත්ත්වයන්ට ඇතිවන්නේ කර්මානුරූපව ප්‍රතිසන්ධි සිතත් සමග ය. අප කාගේත් ශරීර සැකසී ඇති සතර මහාභූතයන්ගේ ස්ත්‍රී, පුරුෂ භේදයක් නැත. එහෙත් ශරීරය නිර්මාණය වීමේ දී පුරුෂ භාව රූපය ඇති භෞතික ශරීරය පුරුෂයෙකු ලෙසත් ස්ත්‍රී භාව රූප ඇති භෞතික ශරීරය ස්ත්‍රියක ලෙසත් වර්ධනය වේ. මෙම භාවරූප ශරීරය සෑම තැන ම පැතිර ඇත. භෞතික රූපයක ස්වභාවය වෙනස් කිරීමට කර්මයට හැකි බවත්, කර්මජ රූප කියා දෙයක් ඇති බවත් පැහැදිලිව ම පෙන්නුම් කරන සාධකය නම් මේ භාව රූප දෙක යි.

**05. හදය රූපය**

හදය රූප ඇත්තේ එකකි. චක්ඛු සෝතාදී විඤ්ඤාණ පස ඇතිවීමට චක්ඛු ආදී පසාද රූප පස වස්තු හෙවත් ස්ථාන වේ. එම පඤ්ච විඤ්ඤාණ හැර මනෝ ධාතුව හා මනෝ විඤ්ඤාණ ධාතු සිත ඇතිවීමට ස්ථානය වන්නේ හෘදය වස්තු රූපය යි. මනෝ ධාතුව යනු මනෝද්වාරය යි. සිත් පහළ වන තැනයි. අප සිත කියන්නේ ද එයටයි. එය හෘදය වස්තුවේ ඇති පතක් පමණ ලේ ධාතුව ඇසුරුකොට පවතින බව ධර්මධරයන්ගේ මතයයි. ඒ අනුව සිතට වස්තුවන්නේ හෘදය යි. ඒ නිසා එයට වත්තුරූප යැයි ද කියනු ලැබේ.

### 06. ජීවිත රූපය.

ජීවිතින්ද්‍රිය රූපය නම් තමා හා බැඳී උපදනා සෙසු රූපයන් පරම්පරා වශයෙන් බොහෝ කාලයක් පවත්නා පරිදි ආරක්‍ෂා කරන, ජීවත් කරවන රූපය යි. ශරීරයක කර්මය, චිත්ත, ඍතුවය, ආහාරය යන හේතු සතරකින් හට ගන්නා රූප ඇත. එම හේතු සතරින් චිත්ත, ඍතු, ආහාර යන හේතු තුන ඒවායින් උපදවන රූප ළඟ ම ඇත. එම රූප පාලනය කිරීමට අමුතු දෙයක් වුවමනා නැත. එහෙත් කර්මජ රූප හට ගැනීම හා පවත්වාගෙන යෑම එසේ සිදු නොවේ. කර්මජ රූප ආරක්‍ෂා කරන පවත්වාගෙන යන බලය ජීවිතින්ද්‍රිය රූපය යි. එය ජීවිතයේ පැවැත්මට ආශ්වාස ප්‍රාශ්වාසය වැනි ය.

### 07. ආහාර රූපය.

ඵස්සාහාර, මනෝසංචේතනිකාහාර, විඤ්ඤාණාහාර, කබලිංකාහාර යනුවෙන් ආහාර සතරකි. එයින් ආහාර රූපය ලෙස ගැනෙන්නේ කබලිංකාර ආහාරයයි. අනෙක් ආහාර තුනම සිතින් ගැනෙන නාම ධර්මයි. ඕජා යනු ද මේ කබලිංකාර ආහාරයට ම නමකි. කබල යනු බත් ආදියේ පිඬුවයි. ආහරණය, ගිලීම කරන හෙයින් ආහාරයැයි කියනු ලැබේ. බත් පිඬු ආදියේ අඩංගු ඉතා සියුම් රස ධාතුව ඕජාවයි. එමගින් කුසගින්න නිවීමත් සෙසු රූප පෝෂණය කරමින් පැවැත්වීමත් වර්ධනයත් සිදුකරයි. ආහාරය ගොරෝසු වන තරමට එහි ඕජාව අඩුය. කිරි ගිතෙල් ආදී සිනිඳු ආහාරයේ ඕජාව අධික ය. එබැවින් ගොරෝසු ආහාර කුස පිරෙන්නට වළඳනවාට වඩා සිනිඳු ආහාර ස්වල්පයක් වැළඳීම ශරීරයට දවසට ම සෑහෙන්නේ ය.

### 08. පරිච්ඡේද රූපය

පරිච්ඡේද නම් වෙන් කිරීමයි. රූපකලාප ඔවුනොවුන්ගෙන් වෙන් කෙරෙන පරතරය ආකාශ නම්. ආකාශය, අජටාකාශය, පරිච්ඡේදාකාශය යැයි දෙයාකාර වේ. ලෝකයේ වස්තූන්වලට හා සත්ත්වයන්ට පැවැත්මට තිබෙන ඉඩකඩ, ලෝක කුහරය අජටාකාශයයි. අටවිසිරූප එකින්එක වෙන් කෙරෙන්නේ පරිච්ඡේදාකාශයෙනි. එය වෙනත් රූප මෙන් සංස්කරණය වූ ධර්මයක් නොවේ. රූපාකාරයක් ඊට නැත. එහෙත් සෙසු රූපයන්ගේ මිශ්‍ර නොවී පැවතීමට එය අවශ්‍ය වන බැවින් වෙනම රූපයක් ලෙස දක්වේ.

### 09. විඤ්ඤත්ති රූප 2

කෙනෙක් අනුන්ට තම අදහස් දක්වන ආකාරය විඤ්ඤත්ති නම්. කාය විඤ්ඤත්ති සහ වචී විඤ්ඤත්ති යනුවෙන් එය දෙයාකාරය. ශරීර අවයව ක්‍රියා කරවන චිත්තකිරිය වායෝ ධාතුව ඒ ඒ ක්‍රියාව හැඟවීමට යෝග්‍ය වන පරිදි ඒ ඒ අතට හරවන බල විශේෂය කාය විඤ්ඤත්ති නම් වේ. අපට යමක් කතා කිරීමට අවශ්‍ය වූ විට වුවමනා අකුරු මෙන් ම වචන සෑදෙන පරිදි උගුරෙන් එන වායුව මෙහෙයවන බල විශේෂය වචී විඤ්ඤත්ති නමින් හැඳින් වේ.

### 10. විකාර රූප 3

රූපයන්ගේ විශේෂ ආකාර විකාර නම්. ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා යනුවෙන් ඒවා විකාර රූප තුනකි. ශරීරය තමාටම ඔසවාගෙන යාහැකි පරිදි ඇතිවන ශාරීරික රූපයන්ගේ සැහැල්ලුබව ලහුතා නමින් හැඳින් වේ. නැවිය හැකි හැරවිය හැකි පරිදි රූපයන්ගේ ඇතිවන මෘදු බව මුදුතා නම් වේ. ඒ ඒ ක්‍රියාවට අවශ්‍ය වන ආකාරයට

අවශ්‍ය වේගයෙන් ශරීරය ක්‍රියාකරවිය හැකි පරිදි රූපයන්ගේ ඇතිවන කාර්යක්ෂමභාවය කම්මඤ්ඤතා නම්. කාල ගුණය අයහපත් වීම, නිසි ආහාර නොලැබීම, සිත නරක්වීම, අයෝග්‍ය ආහාර ගැනීම, රෝගී වීම ආදී හේතු නිසා රූපයන්ගේ සැහැල්ලු බව ආදිය නොමැති වෙයි. ඒවා නිසි පරිදි පවතින විට ලහුතාවත්, මුදුතාවත්, කම්මඤ්ඤතාවත් ඇති වේ. විඤ්ඤත්ති රූප දෙකක් සමග විකාර රූප පහක් ලෙස ද ගැනේ.

**11. ලක්ඛණ රූප 4**

රූපයන්ගේ දක්නට ලැබෙන උත්පාද ආදී ලක්ෂණ මෙහි ලක්ෂ රූප නම් වේ. උපචය, සන්තති, ජරතා, අනිච්චතා යනුවෙන් ලක්ඛණ රූප සතරකි. කර්මාදී හේතු නිසා රූපයන්ගේ ප්‍රථම හට ගැනීම උපචය නම්. ක්ෂණයක් පාසා නැසෙන නැසෙන රූප වෙනුවට නැවත නැවත රූප හට ගනිමින් ජීවිතාවසානය තෙක් රූප පරම්පරාව පැවතීගෙන යාම සන්තති නම්. එම රූපයන්ගේ දිරීම ''ජරතා'' නම්. රූපයන්ගේ බිඳීම අනිච්චතා නම් වේ. මේවා අන්‍ය රූපයන්ගේ ලක්‍ෂණ වන බැවින් ලක්ඛණ රූප නමින් හැඳින් වේ.

මෙහි අවසානයට කියන ලද පරිච්ඡේද, විඤ්ඤත්ති, විකාර, ලක්ෂණ යන රූප දහය කර්මාදී ප්‍රත්‍යයන්ගෙන් කෙලින්ම හට ගන්නා රූප නොවන බැවින් අනිශ්පන්න රූප නම්. එනිසා මේවාට අරූප රූප යැයිද කියනු ලැබේ. මේවා රූප නමින් වෙන් කර දක්වීමෙන් රූපයන් පිළිබඳ සියලු කරුණු ඉතිරි නැතිව කීවා වන්නේ ය. බුදු දහමේ පරමාර්ථය සත්ත්වයාට සසර දුකින් මිදීමේ මගකියා දීමයි. සත්ත්වයාට සසරින් එගොඩවිය නොහැක්කේ මම කියා කෙනෙක් ඇත. (එසොහමස්මි) මගේ කියා දෙයක් ඇත. (එතං මම) මට සදාකාලිකව පවතින ආත්මයක් ඇත. (එසො මෙ අත්තා) යන වැරදි දෘශ්ටියේ බැඳී සිටින නිසාය. එම දෘශ්ටිය බිඳ දැමීමට බුදුදහම අනුගමනය කරන්නේ සියල්ල බෙදා දැක්වීමේ (විභජ්ජවාදී) ක්‍රමය යි.

පළමුවන් ම සත්ත්වයා නාමරූප යනුවෙන් දෙකට බෙදා දක්වනු ලැබේ. චිත්ත චෛතසික විග්‍රහයෙන් කළේ එයින් නාම කොටස බෙදා දැක්වීම යි. එහිදී දුගතියට යන අකුසල සිත මෙය ය, සුගතියට යන කුසල සිත මෙයය, දුකින් මිදෙන ලෝකෝත්තර සිත මෙය යැයි දක්වන ලදි.

එහෙත් සත්ත්වයාට තිබෙන ලොකුම බාධකය මේ රූපස්කන්ධය යි. කුඩා දරුවා සෙල්ලම් බඩුවලට ඇලෙන්නා සේ සත්ත්වයාද මුලින්ම ඇලෙන්නේ මේ රූපයට යි. මේ රූප විග්‍රහයෙන් කෙරෙන්නේ ඒ රූපය පිළිබඳ වළක්වාලීම යි. රූපය විසි අටකට බෙදා බලනවිට මමය කියා ගත යුත්තක් නැති බව වැටහේ. රූපයේ සකස්විම හා ක්‍රියාකාරීත්වය බලනවිට එහි සැපක් නැති බවද වැටහේ. අනිත්‍ය බවද වැටහේ. හේතුප්‍රත්‍යයෙන් හටගත් බව දකින විට කාගේවත් මැවිල්ලක් නොවන බවත්, ඉබේ හටගන්නා නොවන බවත් වැටහේ. රූපයන්ගේ ලක්ෂණ බලනවිට සදාකාලික නොවන බව වැටහේ. ඒ අනුව මේ රූප විග්‍රහය සත්ත්වයාට තිබන මූලික ම ගැටලුව වන ගිය ගිය තැන ඇලෙන මේ රූපය පිළිබඳ ගැටලුව නිරාකරණය කරගැනීමට ඉවහල් වන්නේ ය.

**අභ්‍යාස**

01. රූප විසි අට මොනවා ද? මතකයෙන් ලියන්න.
02. එම එක් එක් රූපවලට අයත් ලක්‍ෂණ මොනවා ද? ඔබේ වචනයෙන් ලියන්න.

17 පාඩම

# අභිධර්මය - නිවනින් නිවීම

වාණ යනු තෘෂ්ණාවට නමකි. **නිර්වාණ** යනු තෘෂ්ණාවෙන් මිදුනා යන අර්ථය යි. බෞද්ධයන්ගේ ප්‍රාර්ථනාව වන්නේ ද මෙම තත්ත්වයට පත්වීම යි. ''**රාගක්ඛයො නිබ්බාණං**'' ''**දොසක්ඛයො නිබ්බාණං**'' ''**මෝහක්ඛයො නිබ්බාණං**'' යනාදී වශයෙන් රාගය, දෝෂය, මෝහය යන අකුසල මූල ක්‍ෂය කිරීම නිර්වාණය බව බොහෝ සූත්‍ර දේශනාවල දැකිය හැකි ය. මෙම අකුසල මූල ප්‍රහීණ කර නිර්වාණය පසක් කරගන්නේ කෙසේ ද යන්න නිවැරැදි ව දැනගැනීමට අභිධර්මය හැදෑරීම අවශ්‍ය වේ. සිත පියවරින් පියවර අකුසලයෙන් මිදී කුසලයට යොමු කොට නිවන් මග කරා යන ආකාරය චිත්ත චෛතසික කාණ්ඩවලදී මැනවින් දක්වන ලදී.

නිවනේ ඉපදීමක් නැත. මහලුවීමක් මරණයක් නැත. සකස්වීම් නැත. විඳීම් නැත. කොටින්ම සසර පවතින කිසිවක් නැත. සසර විඳින සියල්ල දුකය. නිවන සුවයකි. එය සුවයක් වන්නේ මේ කිසි දුකක් නැති නිසා ය. නිවන් දකින්නේ රහත්වීමෙනි. රහත්වීම යනු කුමක්ද?

**ඛීණං පුරාණං** - සසර නැවත නැවත ඉපදීමට හේතුවන පැරණි කර්ම අවසන් කරන ලදි. **නවං නත්ථි සම්භවං** - නැවත කර්ම රැස්කිරීමක් ද නැත. **ආයතිකෙ භවස්මිං විරත්ත චිත්තා** - නැවත ඉපදීමේ ඇල්මක් ද නැත. **ඛීණ බීජා** - ඉපදීමේ බීජ ශක්තිය නැසූ **අවිරූළ්හිච්ඡන්දා** - නැවත ඉපදීමේ ආසාවක් ද නැති. **තෙ ධීරා** - ඒ උතුමෝ **යථා අයං පදීපො** මේ පහන නිවී යන්නා සේ **නිබ්බන්ති** - මෙහිදිම නිවී යති.

**දීපො යථා නිර්වෘති මභ්‍යුපෙතො  නෛයවාවනිං ගච්ඡති නාන්තරීක්ෂම්**
**දිසං න කාඤ්චිත් විදිසං න කාඤ්චිත්  ස්නෙහක්ෂයා කෙවලමෙති ශාන්තිම්**

පහනක් නිවී යන විට එහි ආලෝකය පොළොවට නොයයි. අහසටද නොයයි. දිසා අනුදිසාවලට ද නොයයි. හුදෙක් (ස්නේහ) තෙල් සිඳීමෙන් එතැනම නිවී යයි.

එසේම කෙළෙසුන් නැසූ රහතන් වහන්සේ ද පරලොව කිසිතැනකට නොයති. (ස්නේහ) නැවත ඉපදීමේ තෘෂ්ණාව සිඳීමෙන් මෙහිදීම නිවී යති. මේ අනුව නිවන යනු තවත් උපදින තැනක් නොව මෙහිදිම නූපදින බවට පත්වීම යි.

## 01. සෝපධිසේස නිර්වාණය

පරිනිර්වාණය දෙයාකාරය. සෝපධිසේස හා නිරුපධිසේස යනුවෙනි. උපධි යනු පඤ්චස්කන්ධය යි. යම් කෙනෙකු ජීවත්ව සිටියදී රහත්වීම සෝපධිසේස පරිනිර්වාණය නමි. බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වය සෝපධිසේස පරිනිර්වාණය යි. එය ක්ලේශ පරිනිර්වාණය නමින්ද හැඳින්වේ. උන්වහන්සේලා එතැන්සිට සිරුර පවතින තුරු කර්මානු

රූපව පැමිණෙන සැපදුක් විඳිමින් වෙසෙති. ඉතා යහපත් ජීවිතයක් ගතකරන නමුත් අකුසලයක් තබා කුසලයක්වත් රැස් නොකරති.

### 02. අනුපධිසේස නිර්වාණය

රහතන් වහන්සේගේ මරණය හෙවත් පිරිනිවන් පෑම අනුපධිසේස පරිනිර්වාණය යනුවෙන් හැඳින්වේ. පඤ්චස්කන්ධයෙන් සදහටම මිදුණු හෙයිනි. එය ස්කන්ධ පරිනිර්වාණය නමින් ද හැඳින්වේ.

සෝපදිසේස නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරගත හැකි ආකාර තුනකි.

**01. සම්මා සම්බුද්ධත්වයට පත්වීම**
**02. පසේ බුද්ධත්වයට පත්වීම**
**03. අරහත්වයට පත්වීම**

යනුවෙනි.

### 01. සම්මා සම්බුද්ධත්වයට පත්වීම

බොහෝ කාලයක් සසර දස පාරමිතා, දස උපපාරමිතා, දස පරමත්ථ පාරමිතා යන පාරමිතා ධර්ම තිහක් සම්පූර්ණ අනුන්ගෙන් උපදෙසකින් තොරව කොට තමා ම ධර්මය අවබෝධ කරගෙන අන්‍යයන්ටත් ඒ ධර්මය අවබෝධ කිරීම සම්මා සම්බුද්ධත්වයේ ඇති විශේෂ ලක්ෂණය යි. අප තථාගතයන් වහන්සේ එදා සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට ඉන් අනතුරුව මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ ගමන් කොට සොයාගත්තේ ඒ මෙම සම්බුද්ධත්වය යි. ''පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු'' සසරින් සත්ත්වයන් එතර කිරීමේ මාර්ගය යි. ''චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි'' යනාදී වශයෙන් වදාළේ මෙතෙක් තමා කිසිදා කිසිවෙකුගෙන් අසා තිබේ. දුක්ඛ, සමුදය, නිරෝධ මග්ග සහ සතර ධර්ම පිළිබඳ අවබෝධය තමාට ඉබේම පහළ වූ බවය. සම්මා සම්බුදුරදුන්ගේ සුවිශේෂතාවය නම් තුන්ලොව සියලු ධර්මයන් සෑම අයුරකින්ම අවබෝධ කිරීමයි. එයට සර්වඥතාඥානය යැයි කියනු ලැබේ. එසේම උන්වහන්සේ සියලු බලයන්හි වසීභාවයට පත්ව සිටි සේක. එනම් කාය බල, ඤාණ බල යන මේ සියලු බලයන්ගෙන් මිනිසුන් දෙවියන් බඹුන් අභිබවා සිටියහ. ඕනෑම කෙනෙකු හමුවේ ඒ බලය යෙදීමේ ශක්තිය උන්වහන්සේට හැර තුන්ලොව කිසිවෙකුට නැත. මා ගඟෙන් එගොඩට විසිකරන්නට සමතෙක් තුන්ලොවම නැත. ඕනම ප්‍රශ්නයක් අසන්නැයි ආලවකට වදාළේ එහෙයිනි.

### 02. පච්චේක බුද්ධත්වයට පත්වීම

පසේ බුදුරජාණන් වහන්සේ ද අනුන්ගේ පිහිටක් නැතිව තමන් වහන්සේ ම චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරන සේක. කෙලෙසුන් නසන සේක. උන්වහන්සේට සර්වඥතාඥානය හෝ බලයන් හා වසීභාවය හෝ නැත. එහෙයින් උන්වහන්සේලා අනුන්ට ධර්මාවබෝධ කරවීමට සමත් නොවෙති. සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් වැඩ

සිටින කාලයට පසේ බුදුරජාණන් වහන්සේලා පහළ නොවන බව ධර්මයෙහි සඳහන් වේ. එය ලෝක ධර්මතාවකි. අප ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ දිනයේ මාතංග නම් පසේ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ බව සඳහන් වේ.

## 03. අරහත්වයට පත්වීම

තමාට තනිවම ධර්මය අවබෝධ කරගැනීමට හැකියාවක් නොමැති ශ්‍රාවකයන් වහන්සේලා සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු හෝ දෙසූ දහම අසා ධර්මය අවබෝධ කරගනී. රහතන් වහන්සේට ද අන්‍යන්ට දහම් දෙසා අනුන් ද එය අවබෝධ කරවීමේ හැකියාව ඇත. එහි අරහත්වය කරා පැමිණීමේ පියවර සතරකි. සෝවාන්, සකගාමි, අනාගාමි, අරහත් වශයෙනි. සසර පෙරුමන් පුරා පුරුදු ළ ආකාරය අනුව කෙනෙක් එක්වරම රහත් වෙති. සමහරු සෝවාන් ආදි මගපල පිළිවෙලින් ගොස් රහත් වෙති. මුලින්ම සකගාමි හෝ අනාගාමි වී රහත් වන අයද වෙති.

## 01. සෝවාන්වීම

නිවන් මගෙහි පළමු පියවර සෝවාන් වීම යි. නිවනට අනිවාර්යයෙන් පමුණුවන හෙයින් එසේ දියුණු කළ ආර්ය අෂ්ටාංගික මාර්ගය සෝත නම් වේ. එය සැඩ පහරක් සේ ගමන් කරන හෙයින් ඒ නම යෙදේ. සැඩපහරකට හසු වූ දෙයක් එක එල්ලේ ම ගඟට හෝ මුහුදට ගසාගෙන යයි. එසේ ම සෝවාන් මාර්ගයට පැමිණි පුද්ගලයා අනිවාර්යයෙන් ම නිවනට ළඟා වේ. ''නියතො සමෙබාධි පරායණො'' යනුවෙන් ඒ බව දක්වා තිබේ. සෝවාන් මාර්ගය සත්ත්වයා සසර බැඳ තබන දස සංයෝජන අතුරින් සක්කාය දිට්ඨි (ආත්ම දෘෂ්ටිය) විචිකිච්ඡා (සැකය) සීලබ්බත පරාමාස (විවිධ නිෂ්ඵල සිල්ව්‍රත අනුගමනය කිරීම) යන සංයෝජන තුන මුළුමනින් ම නසා දමයි.

සෝවාන් ඵලයට පත් වූ තැනැත්තා නැවත කිසිදාක අපාගාමී වීමක් නැත. මෙලොව දී ම රහත් නොවූයේ නම් ජන්ම සතක් ඇතුළත රහත් වන්නේ ය. එයින් දෙවන ජන්මයේ රහත්වන පුද්ගලයා ඒක බීජී නමින් ද, සත්වන ජන්මයෙහි රහත්වන්නා සත්තක්ඛත්තු පරම යැයි ද ඒ අතරතුර රහත් වන්නා **කෝළං කෝළ** යැයි ද හඳුන්වනු ලැබේ.

## 02. සකදාගාමි වීම

නිවන් මගෙහි දෙවන පියවර සකදාගාමී වීම යි. සකිං + ආගාමි යන්න සකදාගාමී නම් වී ඇත. එනම් එක් වරක් පමණක් එන්නේ ය යන අදහස යි. මෙම දෙවන මාර්ගයට පත් වූ පුද්ගලයා මියගොස් නැවත කාම ස්වර්ගයකට එන්නේ නම් ඒ එක්වරක් පමණි. ඉන්පසු පිරිනිවන් පාන්නේ ය. සකදාගාමි පුද්ගලයා කාමරාගය හා පටිඝය හෙවත් ද්වේශය යන සංයෝජන දෙක තුනී කරන්නේ ය. බල බිඳින්නේ ය. සකදාගාමී පුද්ගලයා එක්වරක් පමණක් මනුලොවට නැවත එන්නේ කාමරාගය මුළුමනින් සිඳ නොදැමූ නිසා ය. එවැනි සකදාගාමී පුද්ගලයන් පස්දෙනෙකු පිළිබඳව විශුද්ධි මාර්ගයේ සඳහන් වේ.

01. මෙලොව සකදාගාමී ඵලයට පැමිණ මෙලොව දී ම රහත්ව පිරිනිවන්පාන තැනැත්තා.
02. මෙලොව සකදාගාමී ඵලයට පැමිණ දෙව් ලොව දී පිරිනිවන්පාන තැනැත්තා.
03. දෙව්ලොව දී සකදාගාමී ඵලයට පැමිණ දෙව්ලොව දී ම පිරිනිවන්පාන තැනැත්තා.
04. දෙව්ලොව දී සකදාගාමී ඵලයට පැමිණ මෙලොවට පැමිණ පිරිනිවන්පාන තැනැත්තා.
05. මෙලොව දී සකදාගාමීව දෙව්ලොව ඉපිද ආයු ඇතිතාක් සිට නැවත මෙ මිනිස් ලොවට පැමිණ පිරිනිවන්පාන තැනැත්තා.

### 03. අනාගාමී වීම

නිවන් මගෙහි තෙවන පියවර අනාගාමී වීම යි. අනාගාමී යනු න + ආගාමි හෙවත් නො එන්නේ ය යන අදහස යි. මේ මාර්ගයට පත් වූ පුද්ගලයා රහත් නොවී කළුරිය කළහොත් නැවත කිසිදාක කාම භවයකට නොඑන්නේ ය. රූප අරූප බ්‍රහ්මලෝක අතරත් උපදින්නේ අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨ යන පංච ශුද්ධාවාස බ්‍රහ්මලෝකවල පමණි. එහි ඉපිද එහි දී ම පිරිනිවන් පාන්නේ ය. එසේ සිදුවන්නේ ඒ පුද්ගලයා සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ යන ඕරම්භාගිය සංයෝජන පහ ම සහමුලින් ම සිඳලන බැවිනි. ඕරම්භාගිය යනු කාම භව වශයෙන් සැළකෙන දිව්‍යලෝක හයේ මිනිස් ලොව හා සතර අපායේ ඉපදීමට හේතුවන සංයෝජන යි. මේවා හීන හෙවත් පහත් භව ලෙස සලකන බැවින් **ඕරම්භාගිය** යැයි කියනු ලැබේ. අනාගාමි පුද්ගලයා කිසි දිනක දිව්‍ය මනුෂ්‍ය යන කාම ලෝකයකට පැමිණෙන්නේ නැත.

### 04. රහත් වීම

නිවන් මගෙහි සිව්වන පියවර හෙවත් අවසානය රහත් වීම යි. අරහත් ඵලයට පත්වන උත්තමයන්ට පහළවන සිත අරහත් ඵල සිත යි. මෙම ඵලයට පත්වන උතුමා රූපරාග අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන උද්ධම්භාගිය හෙවත් බ්‍රහ්මලෝකවල ඉපදීමට හේතුවන සංයෝජන පහ ද මුළුමනින් ම සිඳ දමයි. එයින් අදහස් වන්නේ උන්වහන්සේ සංසාරයෙහි ඉපදීමට හේතුවන සියලු සංයෝජන නැසූ බව යි. නැවත උන්වහන්සේගේ ඉපදීමක් නැත.

ඉහත දැක් වූ සම්මා සම්බුද්ධත්වය, පච්චේක බුද්ධත්වය හා අරහත් භාවය යන මාර්ග තුන ඔස්සේ ඕනෑම කෙනෙකුට මෙම සසර දුක් කෙළවර කොට නිර්වාණාවබෝධය ලැබිය හැකි වේ. ඒ සඳහා කළ යුත්තේ අදාළ ආර්ය මාර්ගයේ ගමන් කිරීමයි.

**අභ්‍යාස**

01. බුදු, පසේ බුදු, මහරහත් යන උතුමන් වහන්සේලා අතර පවත්නා වෙනස්කම් මොනවා ද?
02. සෝවාන්, සකදාගාමි, අනාගාමී, අරහත් යන පුද්ගලයන් සිව්දෙනා පිළිබඳ විස්තරයක් කරන්න.

18 පාඩම

# දහසින් එකක්වත් නොවටිනා දේ
## (සහසස වගගය)

සූත්‍ර පිටකයේ නිකාය ග්‍රන්ථ අතරින් පස්වැන්න වූ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළොවකි. එයින් දෙවැන්න ධමමපදය යි. එහි නමින් ම කියවෙන පරිදි එම ග්‍රන්ථයේ අඩංගු වන්නේ විවිධ දහම් කරුණු සැකවින් කැටිකොට ගෙතුණු ධර්ම ගාථාවන් ය. බොහෝවිට එක් එක් ගාථාවකින් වෙනස් වෙනස් දහම් පද කියවෙයි.

මේ ග්‍රන්ථයේ ඇති තවත් සුවිශේෂීත්වයක් නම් මෙහි එන ගාථා ධර්ම පද යම් යම් තේමාවන් යටතේ බෙදා දැක්වීමයි. එසේ සංග්‍රහ කරන ලද වර්ග 26 කි. සිත ගැන විස්තර කෙරෙන ගාථා චිත්ත වග්ගය නමින් ද, අප්‍රමාදය ගැන කියවෙන ගාථා අප්‍රමාද වර්ගය නමින් ද යනාදී වශයෙන් එම වර්ග නම්කොට ඇති අතර දණ්ඩ, ජරා, අත්ත, පිය, කෝධ, තණ්හා, ආදිය එබඳු ධර්ම කාරණා පදනම් කොට ගොනු වූ වර්ගයන් ය. යම් යම් පුද්ගලයන් පිළිබඳ ධර්ම කාරණා ගොනු කොට, බාල, පණ්ඩිත, භික්ඛු, බ්‍රාහ්මණ යනාදී වර්ග බෙදා ඇත. ඇතැම් වර්ග යොමු වී ඇත්තේ යම් යම් ධර්ම කාරණා පැහැදිලි කිරීමට යොදාගත් උපමා අනුවය. මල් උපමා කරගත් දහම් පද පුප්ඵ වර්ගයට ද, දහසේ සංඛ්‍යා උපමා කළ ධර්ම පද සහස්ස වර්ගයට ද, මල හෙවත් කිළුටු උපමා කරගත් දහම් පද මලවර්ගයට යනාදී වශයෙන් බෙදා දැක්වීම ඊට නිදසුන් ය.

ධම්මපදය යනු ත්‍රිපිටකයේ විවරණය කෙරෙන බුද්ධ දේශනාව ම සංක්ෂිප්ත කර දක්වන සංග්‍රහයක් බව යට කියන ලදී. බුදු දහමේ එන චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය, කර්මය පුනර්භවය වැනි මූලික සංකල්ප ද, පුද්ගල විවරණ ද ධර්මෝපදේශ ද මෙහි දක්නට ලැබේ. බුදුදහමේ ගැඹුරු ධර්ම කාරණා ධම්මපදයේ දී ඉදිරිපත් කෙරෙන්නේ ඊට ම ආවේණික වූ වෙනත් ක්‍රමයකට ය. උදාහරණයක් ලෙස කුසලාකුසල සිත් හා චෛතසික පිළිබඳ අභිධර්මයේ චිත්ත චෛතසික කාණ්ඩවල විස්තර කෙරේ. **''චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි''** යනුවෙන් චේතනාව මුල්කොට ම කර්ම සිදුවන බව සූත්‍ර ධර්මවල විස්තර කෙරේ. එසේ ම කුසලයට සැප විපාකත් අකුසලයට දුක් විපාකත් ලැබෙන බවත් සඳහන් ය. සිත, කර්මය හා විපාකය යන මේ ඉතා ගැඹුරු ලෙස විස්තරව කිව යුතු කාරණා තුන ම ධම්මපදයේ **''මනොපුබ්බංගමා ධම්මා''** ආදී මුල් ම ගාථා දෙකෙන් ඉතාම සරල ව සිත් වදින ආකාරයෙන් අපූරු උපමා සංයෝජනයකින් ඉදිරිපත් කර ඇති ආකාරය විසිතුරු ය.

මෙහි එන ධර්මෝපදේශ ද මෙම ග්‍රන්ථයට ම ආවේණික වූ විශේෂ ක්‍රමයකට ඉදිරිපත් කරයි. ඒවා බොහෝ විට ඒ ආකාරයෙන් ත්‍රිපිටකයේ වෙනත් තැන්වල නැත. නිවන් මග ගමන් කරන පුගලයා පළමු කොටම මෙලොව ජීවිතය මෙන් ම සසර ජීවිතයත් සකස් කර ගත යුතු ය. ඒ සඳහා උපදෙස් සපයන මංගල, පරාභව, ව්‍යග්ඝපජ්ජ, වසල ආදී සූත්‍ර

රාශියක් සූත්‍රපිටකයේ අඩංගු වෙයි. ඒ සියල්ලෙන් ම නොකියවෙන යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීමට අවශ්‍යවන තවත් බොහෝ කාරණා ඇත. වෙනත් ලෙසකින් කිව හොත් සාමාන්‍ය ජනයාට සුළු සුළු යැයි සැළකෙන කරුණු පවා කියාදීම අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් අපේ ජනකවිවලින් සිදුවන්නේ යම් බඳු කාර්යයක් ද ඒ හා සමාන කාර්යයක් බොදු පිළිවෙත් මගෙහි ගමන් කරන්නන් සඳහා ධම්ම පදයෙන් ඉටු වී ඇත.

**''න භජෙ පාපකෙ මිත්තෙ''**
**''න හි වෙරෙන වෙරානි සම්මන්තී'ධ කුදාචනං''**
**''මත්තා සුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං''**
**''න වණ්ණරූපෙන නරො සුජානො''**
**''න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති''**
**''සුදස්සං වජ්ජමඤ්ඤෙසං අත්තනො පන දුද්දසං''**
**''සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා''**
**''අසජ්ඣාය මලා මන්තා අනුට්ඨාන මලා ඝරා''**

යනාදී, එබඳු පූර්ණ මිනිසෙකු ගොඩනැගීමට උපයෝගීවන උපදේශ සිය ගණනක් ධම්ම පදයේ අඩංගු වේ.

තවද මෙලොව ජීවිතය සහ පරලොව ජීවිතය සාර්ථක කරගන්නා ආකාරය, බබුළුවාගන්නා ආකාරය ව්‍යග්ඝපජ්ජ ආදී සූත්‍රවලින් විවිධාකාරයෙන් විස්තරකර ඇති අතර ඒ කිසි තැනක නොමැති අමුතු ම කාරණා ධම්ම පදයේ පද හතරක ගාථාවකට ගොනුකර තිබෙනු දැකිය හැකි ය. මෙලොව ජීවිතය ගැන කතා කරන විට ජනප්‍රියත්වය කාගේත් අපේක්ෂාවකි.

**''සීලදස්සන සම්පන්නං**
**ධම්මට්ඨං සච්චවෙදිනං**
**අත්තනො කම්ම කුබ්බානං**
**තං ජනො කුරුතෙ පියං''**

යන ගාථාවෙන් කියවෙන්නේ මෙලොව කෙනෙකුට ජනප්‍රිය විය හැක්කේ කෙසේද යන්නයි.

පරලොව ගැන කතාකරන විට කාගේත් බලාපොරොත්තුව සුගතියට යාමයි. එයිනුත් දෙව්ලොව යාම ඉතා ජනප්‍රිය බලාපොරොත්තුවකි.

''සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය
දජ්ජාප්පස්මිම්පි යාචිතො
එතෙහි තීහි ඨානෙහි
ගච්ඡෙ දෙවාන සන්තිකෙ''

යන ගාථාවෙන් කියවෙන්නේ දෙව්ලොව යන කෙටි ම ක්‍රමයයි. මෙහි ''**දජ්ජාප්පස්මිම්පි යාචිතො**'' යන පදයෙන් මුළු මහත් ධර්මය පුරාම දානය ගැන කියවෙන කරුණුවල වඩා සුවිශේෂ කාරණයක් පරිත්‍යාගය ගැන කියවේ. එනම් කවුරුන් හෝ යමක් ඉල්ලා ගෙන ආවිට ඔහුගේ බලාපොරොත්තු සුන් නොකොට සුළු දෙයක් හෝ දියයුතු බවයි.

මේ කාරණා සළකා බලනවිට පෙනීයන්නේ ධම්මපදය යනු ත්‍රිපිටකයේ ම එන කරුණු සංක්ෂිප්ත කොට දක්වෙන එහි ම දිගුවක් නොව බුදු දහම උගන්වන වෙනම ම ආකාරයක ග්‍රන්ථයක් බවයි. එහි ත්‍රිපිටකයේ එන විවරණවලට සමාන විවරණ ඇතත් වැඩිපුර ඇත්තේ ධම්මපදයට ම ආවේණික වූ සුවිශේෂ විවරණයක් බව මින් පැහැදිලිය.

මේ නිසා ශාසනයේ එළිපත්තේ සිටින එතරම් නුවණ මුහුකුරා නොගිය උපාසක උපාසිකාවන්ට වුව ද ශාසනයට පිවිසෙන කුඩා සාමණේරවරුන්ට වුව ද මුළු මහත් ත්‍රිපිටකය නො හදාළ නමුත් සත්‍යය, ධර්මය. බාලයාගේ පටන් රහතන් වහන්සේ දක්වා පුද්ගලයන් මෙන් ම මෙළොව පරළොව ජීවිතය සාර්ථක කරගන්නා ආකාරයත් නිවනත් තේරුම් ගැනීමට මේ ධම්මපදයේ එන ගාථා 423 හැදෑරීම පමණක් වුව ද ප්‍රමාණවත් ය. එනිසා මෙය දූනට ලබා තිබෙන බෞද්ධයාගේ අත්පොත යන විරුදාවලිය වෙනුවට බුදුදහමේ අත්පොත යැයි හැඳින්වීම සුදුසු ය.

## 5.5.1 සහස්ස වග්ගය

ධම්මපදයේ අටවන වර්ගය සහස්ස වර්ගයයි. සාමාන්‍යයෙන් අපි එදිනෙදා ව්‍යවහාරයේ දී යම් කිසි කාරණයක වැදගත් කම හෝ නොවැදගත්කම ප්‍රකාශ කිරීමට සීය, දහස වැනි සංඛ්‍යා යොදා ගනිමු. ''සීයෙන් පංගුවක් වටින්නැ'' ''දාහෙන් පංගුවක් වටින්නැ'' වැනි ව්‍යවහාර අපිට හොඳට හුරු පුරුදු ය.

බුදුරජාණන් වහන්සේගේ දේශනා අතර ද මෙවැනි යෙදුම් බහුලව දකින්නට ලැබේ. සහස්ස වර්ගය යනු එවැනි ගාථාවල එකතුවකි. මෙහි ඉදිරිපත් කෙරෙන කාරණා අංශ කිහිපයකි. නිරර්ථක කථා, ගාථා ඇසීමේ හෝ කීමේ නිෂ්ඵල බව. එසේ ම නියම ජයග්‍රහණය යුද්ධ දිනීම නොව තම සිත දිනීම බව, යාගහෝමවල නිෂ්ඵල බව හා ධර්මානුකූල ජීවිතයක වටිනා කම යන කරුණු මෙහි ඉතා සංවේදී ආකාරයෙන් ඉදිරිපත් කෙරේ.

### 5.5.1.1. සැරියුත් තෙරණුවෝ අපරාධකරුවෙකු නිවන් මග යවති.

රජගහ නුවර පන්සියක පමණ සොර මුලක් විය. දිනක් තඹපාට දැලි රැවුලක් ඇති තම්බදාඨික නැමැත්තා ඔවුන් වෙත පැමිණ ඔවුන් සමග එක්වන්නට අවසර පැතීය. පුද්ගලයන් ගැන හොඳ අවබෝධයක් ඇති සොර දෙටුවා මොහු මවුපියන් වුවත් පාවාදෙන තරම් දුෂ්ටයෙකු බව වටහාගෙන ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ ය. එහෙත් මේ තම්බදාඨිකයා යාප්පුවෙන් සොරුන්ගේ සිත් දිනාගෙන ඔවුන් හා එක්ව දිවිගෙවන්නට විය. මේ අතර දිනක් නුවර වැසියෝ රාජ පුරුෂයන් සමග එක්ව සොරුන් අල්ලා රාජාධිකරණය වෙත ගෙන ගියෝ ය. විනිශ්චයකාර තැන ඔවුන් සියලු දෙනා ම පොරොවෙන් හිස ගසා දමන ලෙස නියෝග කළේ ය. රාජ පුරුෂයන්ට සොරුන් ඝාතනය කරන්නෙක් ඔවුන් අතරින් ම සොයා ගැනීමට අවශ්‍ය විය. එහෙත් කිසිවෙක් ඉදිරිපත් නොවී ය. අන්තිමේ දී ඉදිරිපත් වන්නාට නිදහසත් සම්මානත් ලැබෙන බව දැන්වී ය. හාරසිය අනුනව දෙනෙක් ම ඊට අකමැති වුවත් අවසානයේ සිටි තම්බදාඨික එය භාරගත්තේ ය. හෙතෙම ඒ සියලු දෙනා පොරොවෙන් ගසා මරා දමා නිදහසක් සම්මානත් ලැබී ය. එතැන් සිට රාජපුරුෂයන්ගේ නියමයෙන් දිගට ම එම කාරිය කරගෙන ගිය ඔහු වයස් ගතව දුර්වල වීම නිසා තනතුරෙන් පහකරන ලදී.

මෙතෙක් කලක් හරිහැටි ඇඳුමක් පැළඳුමක් විලවුන් ගැල්වීමක් නැතිව ඉතා අප්‍රසන්න පුද්ගලයෙකු ලෙස දිවිගෙවූ තම්බදාඨික එතැන් පටන් කෙස් රැවුල් කපා නාගෙන සුවඳ විලවුන් ගල්වා සළුපිළියෙන් සැරසී ගිතෙල් මිශ්‍ර කිරිකැඳක් බොන්නට සූදානම් විය. චෝර ඝාතකයෙකු වුවත් මොහු සසරින් ගෙනා පින් ඇත්තෙක් විය. එනිසා ම ඔහුගේ මේ අළුත් දිවියට පා තැබීම ධ්‍යාන සමාපත්තියට සමවැදී නැගී සිටි සැරියුත් මහරහතන් වහන්සේ දිවැසින් දුටහ. ඔහුට පිහිට වන අටියෙන් උන්වහන්සේ ඒ මොහොතේ ම පිඬු පිණිස ඒ නිවසට වැඩම කළහ. මෙතුවක් කිසිදු පිනක් දහමක් කරගන්නට ඉඩක් නොලද තම්බදාඨික සැරියුත් මහ තෙරුන් දැක ප්‍රීතියෙන් පිනා ගියේ ය. හෙතෙම උන්වහන්සේ වඩා හිඳුවා ගිතෙල් සහ කිරිකැඳ පිළිගැන්වී ය. වළඳා අවසානයේ පුණ්‍යානුමෝදනාව කළත් තමා කළ අපරාධ සිහිවීම නිසා ඔහුට සිත සනසාගත නොහැකි විය. ඒ බව වටහාගත් සැරියුත් තෙරණුවෝ උපාසකය, ඔබ අපරාධ කළේ ඔබේ උවමනාවට නොව රජුගේ හෝ රාජ පුරුෂයින්ගේ කීම නිසා යැයි සිතා සිත හදාගන්න යැයි අවවාද කළහ. එයින් සැනසිල්ල ලැබූ තම්බදාඨික උපාසක තැන බණ අසා සෝවාන් මාර්ගයට ආසන්න අනුලෝමික ඥාණය උපදවා ගත්තේය.

අවසන තෙරුන්ගේ පසුගමන් කොට ආපසු එන තම්බදාඨික ගවදෙනක වෙසින් ආ යක්ෂණියක විසින් මරා දමන ලදී. හෙතෙම මියගොස් තුසිත දෙව්ලොව උපන්නේ ය.

සැරියුත් තෙරුන් විසින් කරන ලද ඉතා සුළු අනුමෝදනාවකින් මෙතරම් මහත් ඵලයක් මෙවැනි අපරාධ කරුවෙකු වූ මොහු ලැබුවේ කෙසේද'යි එදා දම් සභා මණ්ඩපයට රැස්වූ භික්ෂූන් වහන්සේලා අතර කතා බහක් ඇතිවිය. බුදුරජාණන් වහන්සේ ඒ නිමිත් කොට මේ ගාථාවෙන් දම්දෙසා වදාළහ.

"සහස්සමපි චෙ වාචා
අනත්ථ පදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යො
යං සුත්වා උපසම්මති"

පදාර්ථ:

**අනත්ථපදසංහිතා,** නිවනට උපකාරයක් නොවන නිරර්ථක වාක්‍යවලින් යුක්ත: **සහස්සං අපි චෙ වාචා,** වැකි දහසකට වඩා: **යං සුත්වා උපසම්මති** යමක් අසා රාගාදී කෙලෙසුන් සංසිඳේ නම්: **එකං අත්ථපදං සෙය්‍යො:** එබඳු අර්ථවත් එක් පදයක් වුව ද අසන්නට ලැබීම උතුම් ය.

විවරණ:

**අනත්ථපද සංහිතා** කාව්‍ය, නාටක, ගීත, කතාන්දර වැනි රාගාදී කෙලෙසුන් අවුස්සන ප්‍රබන්ධ, **අත්ථපදං** චතුරාර්ය සත්‍ය, පටිච්ච සමුප්පාදය, සතරසතිපට්ඨානය, ස්කන්ධ, ධාතු ආයතන ආදී ජීවිතයේ සැබෑ තත්ත්වයත් නිවන් මගත් කියන දහම් පද.

### 5.5.1.2 ක්ෂණික අවබෝධයෙන් අගතැන්පත් රහතන් වහන්සේ.

දඹදිව සුප්පාරක නම් පටුන අසල දාරුචීරිය නම් තවුසෙක් විසී ය. මොහු මුහුදේ ගමන් කරමින් සිටියදී නැව කැඩී බිඳීයාම නිසා ලී පුවරුවක ආධාරයෙන් මේ පටුනට සේන්දු වූ අයෙකි. මුහුදේ දී ඇඳුම් ගසාගිය නිසා ගොඩබිමට පැමිණි හෙතෙම රිටිපට්ටාවලින් ඇඳුමක් වියා ඇන්දේ ය. එනිසා හෙතෙම දාරුචීරිය යයි ප්‍රසිද්ධ විය. මේ අමුතු ඇඳුම නිසා ඔහු තවුසෙකු සේ පටුන් ගම් වැසියන්ගේ සැලකිල්ලට පාත්‍ර විය. ඔහු ද එලෙස ම හඟවා දිවි ගෙවීය. මෙසේ දාරුචීරිය තවුසෙකු වීම සසර පුරුද්දෙන් සිදු වූවකි.

කාශ්‍යප බුදුරජුන්ගේ සසුන පිරිහී යන අවධියේ සාමණේර ආදීන්ගේ නොමනා හැසිරීම් නිසා කළකිරුණු භික්ෂූන් වහන්සේලා හත් නමක් දිවි පරදුවට තබා ගොස් මහණ දම් පුරන්නට කතිකා කරගෙන ඉනිමගකින් ගල්පර්වතයට නැග ඉනිමග පෙරළා දමා මහණ දම් පුරන්නට වූහ. එක් නමක් පළමු දින දිනයේ දී ම රහත් බවට පත්විය. උන්වහන්සේ ඍද්ධියෙන් වැඩ පිඬු සිඟාගෙන අවුත් සෙස්සන්ට පිළිගැන්වූවත් ගිවිසුම කඩන්නට අකමැති නිසා ඔවුහු එය ප්‍රතික්ෂේප කොට නිරාහාරව මහණ දම් පුරන්නට වූහ. දෙවන දිනයේ තවත් නමක් අනාගාමී ඵලයට පත්විය. රහතන් වහන්සේ පිනිවන් පෑහ. අනාගාමී තෙරණුවෝ බඹලොව උපන්හ. කිසිදු විශේෂ අධිගමයකට පත්නොවූ සෙසු පස්දෙනා දෙව්ලොව සැරිසරා අවුත් අප බුදු සමයෙහි දඹදිව තැනින් තැන උපන්හ.

එක් අයෙක් පුක්කුසාති නම් රජ විය. තවත් කෙනෙක් කුමාර කාශ්‍යප තෙරුන් විය. තවත් අයෙක් දබ්බමල්ලපුත්ත තෙරුන් ලෙස ද සිව්වැන්නා සභිය පරිබ්‍රාජකයා ලෙස

ප්‍රකටව සිටියෝ ය. මේ සියලු දෙනා බුදුරජාණන් වහන්සේ හමු වී බණ අසා නිවන් පසක් කළ අය වූහ. පස්වැන්නා දාරචීරිය තවුසා ය.

මොහු තවුසෙකු සේ මිනිසුන් රවටාගෙන ජීවත්වෙනු දුටු බඹලොව ඉපිද සිටි කල්‍යාණ මිත්‍රයා දාරුචීරිය බුදුරදුන් වෙත යැවී ය. සුප්පාරක පටුනේ සිට එකසිය විසි ගවුවක් ගෙවා එක් රැයකින් ම ඔහු සැවැත් නුවරට ආවේ බුද්ධ යන නම ඇසුණු සැණින් ඇති වූ බලවත් උද්වේගය නිසා ය.

ඔහුට බුදුරජාණන් වහන්සේ හමුවූයේ උන්වහන්සේ පිඬු සිඟා වඩිමින් සිටි මහ මගදී ය. උන්වහන්සේ පාමුල වැඳ වැටුණු හෙතෙම තමාට බණ දේශනා කරන ලෙස ඉල්ලා සිටියේ ය. බාහිය මම පිඬු සිඟා පිණිස යමි, මඳක් ඉවසන්න යයි උන්වහන්සේ වදාළත් බාහිය වැළැක්විය නොහැකි විය. තම ජීවිතයේ අවසාන මොහොත ගත කරන බව ඉබේම දැණුනු නිසාදෝ, ස්වාමීනි, ඔබවහන්සේගේ ජීවිතයත් මගේ ජීවිතයත් කවර මොහොතෙහි අවසන්වේදැයි විශ්වාසයක් නැත. එබැවින් ඉක්මනින් බණ දෙසැන්නැයි හෙතෙම නැවත නැවතත් පෙරැත්ත කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ''**තසමාතිහ තෙ බාහිය එවං සිකඛිතබබං දිටෙඨ දිටඨමතතං භවිසසති**'' යනාදී වශයෙන් බාහිය, දුටු දේ දුටු පමණින් ද, ඇසුණු, දැණුනු, සිතුණු දේ එපමණකින් ම නවතන්න. ඒවා මිහිරියයි, සැපයයි, නිමිති නොගන්න, ඒවායේ නොඇලෙන්නයයි ඉන්ද්‍රිය සංවරය පිළිබඳ ධර්මයක් දේශනා කළහ. සසර පුරුද්දෙන් නුවණ මුහුකුරා ගිය බාහිර දාරුචීරය, එය ඇසූ පමණින් ම උතුම් වූ රහත් ඵලයට පත්විය.

අනතුරුව ඔහු පැවිද්ද ඉල්ලා සිටියත් සසරේ දී සඟනට පාත්‍රා සිවුරු පුදා පුරුද්දක් නොතිබුණු නිසා ඒහි භික්ඛුභාවයෙන් පැවිදි කිරීමට නොහැකි විය. උන්වහන්සේ වසර විසිදහසක් මහණ දම් පුරා තිබුණත් තමන්ට ලැබුණු සියලු පිරිකර තනිවම පරිභෝග කළා මිස කිසිවෙකුට දුන්නේ නැත භික්ෂුවක් විසින් වුව ද අටපිරිකර සිවුරු අඳනා ආදී පිරිකර පූජා කර තිබිය යුතු බව මින් පැහැදිළි වේ.

බුදුරජාණන් වහන්සේ පා සිවුරු සොයාගෙන එන්නැයි කියා දාරුචීරිය රහත් උපාසක තුමා පිටත් කොට යැවූහ. එතුමාට දැණුනු පරිදි ම ආයුෂ කෙළවරට පැමිණ සිටි දාරුචීරිය රහතන් වහන්සේ ගව දෙනකගේ පහර කෑමට ලක්වී පිරිනිවන් පෑහ. පැවිදිවන්නට ඉඩක් නොලැබිණ.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමග එහි වැඩම කොට එතුමාගේ ශරීරය ආදාහන කරවා ස්ථූපයක් ද කරවූහ. මේ සුවිශේෂී සිදුවීම ගැන කුතුහලයට පත්ව සිටි භික්ෂූන් වහන්සේලා ඇමතූ බුදුරජාණන් වහන්සේ, බාහිය දාරුචීරිය රහත් වූ කෙනෙකි. උන්වහන්සේ පිරිනිවන් පෑහයි වදාළහ. දාරුචීරිය තවුසා රහත් වූයේ කෙසේ දැයි විමසූ කල මහණෙනි, උන්වහන්සේ මා එතරම් වෙහෙසට පත් කළේ නැත. එක බණ පදයකින් ම සත්‍ය අවබෝධ කළ සේකැයි වදාරා දාරුචීරිය රහතන් වහන්සේ මේ සසුනේ **ඛිප්පාභිඤ්ඤ** හෙවත් ක්ෂණයකින් ධර්මාවබෝධය කළ ඇත්තන් අතර අග්‍ර වේ යයි

අගතනතුරු ද දී වදාළ සේක. ඒ පිළිබඳ දම්සභා මණ්ඩපයේ දී ඇති වූ කතාබහ නිමිති කරගෙන බුදුරාණන් වහන්සේ මෙම ගාථාව දේශනා කොට දහම් දෙසා වදාළහ.

> **"සහස්සමපි චෙ ගාථා**
> **අනත්ථ පදසංහිතා**
> **එකං ගාථා පදං සෙය්‍යො**
> **යං සුත්වා උපසම්මති"**

**පදාර්ථ:** **අනත්ථපද සංහිතා,** නිරර්ථක පදයන්ගෙන් යුක්ත වූ: **සහස්සමපි චෙ ගාථා,** ගාථාවන් දහසක් වුවත් උතුම් නොවේ: **යං සුත්වා උපසම්මති,** යමක් අසා කෙලෙසුන් සංසිඳේ නම්: **එකං ගාථා පදං සෙය්‍යො,** එබඳු එක් ගාථා පදයක් වුවද උතුම් ය:

**විවරණ:** මෙහි **ගාථා පදං** යන්නට මේ ධම්මපදයේ ම එන **"අප්පමාදො අමතපදං"** වැනි ගාථාවන් නිදසුන් කොට දක්විය හැක. දාරුචීරියතුමාට මුළු බුදු දහම ම අසන්නට හෝ හදාරන්නට අවස්ථාවක් නොවි ය. සසර නුවණ මුහුකුරා ඇති කෙනෙකුට එක ගාථා පදයක් වුව ද සෑහෙන බව මෙයින් තහවුරුවේ.

### 5.5.1.3 සිටුකුමරිය ස්ථානෝචිත ප්‍රඥාවෙන් මරණෙන් මිදෙයි.

රජගහ නුවර එක් සිටු පවුලක සොළොස් හැවිරිදි ඉතා රූමත් සිටු කුමරියක් සිටියා ය. ඕ තොමෝ කුණ්ඩලකේසී නම් වූවා ය. එම වයසේ යුවතියන් පුරුෂයන් කෙරෙහි ඇල්ම වැඩි බැවින් මව්පියෝ ඇය සත්මහල් ප්‍රාසාදයක මතු මහලේ රඳවා රැකබලා ගත්හ. ඇගේ සමීපයේ සිටියේ එක් දාසියක් පමණි.

දිනක් හිස ගසා දැමීමට නියම වූ එක්තරා සොරෙකු වද බෙර වයමින් දංගෙඩිය කරා රාජ පුරුෂයන් විසින් ගෙනයනු ලැබී ය. වද බෙර හඬ ඇසී සී මැදුරු කවුළුවෙන් එබී බැලූ කුමරියට එක්වර ම දක්නට ලැබුනේ දංගෙඩිය කරා ගෙන යනු ලැබූ සොරා ය. යෞවන පුරුෂයකු දැකිමටවත් අවසරයක් නැතිව සිටි ඇයට දුටු සැණින් ඔහු කෙරෙහි පිළිබඳ සිතක් ඇතිවිය. රාගයෙන් මුසපත්ව ගිය කුමරිය ඔහු ලබාදෙන්නැයි ඉල්ලා සිටියා ය. මව්පියන් කොතෙකුත් කරුණු කීවත් ඇයගේ සිත වෙනස් නොවී ය. කළහැකි කිසිවක් නොවූයෙන් මවුපියෝ රාජ පුරුෂයන්ට අල්ලස් දී සොරා මුදවා ගෙන කුමරිය ඔහුට සරණ පාවා දුන්හ.

ඇය කොතරම් ධනවත් කුමරියක් වුවත් සොරාට සොරකම නොකර සිටිය නොහැකි විය. ඔහුට සිටු මැඳුරේ වාසය ද රිසි නොවී ය. ඔහු කල්පනා කරමින් සිටියේ කොයි මොහොතක දී හෝ කුමරිය පැළඳි ආභරණ සොරාගෙන පලා යන්නට ය. ඒ සඳහා උපායක් යෙදූ හෙතෙම වරදට හසු වී මරන්නට ගෙන යන අවස්ථාවේ වූ භාරයක් ඔප්පු කිරීමට ඇති බව කියා මල් පහන් ආදී පූජා ද්‍රව්‍යය ද රැගෙන කුමරිය සමඟ සොරුන් හෙළන චෞර ප්‍රපාත නම් පර්වතය මුදුනට ගියේ ය. එහිදී තමා ඇය මෙතනට කැඳවාගෙන ආවේ

ආභරණ ගෙන ඇය පර්වතයෙන් පහලට හෙළන්නට බව හෙළි කළේ ය. එහි දී නුවණැති කුමරිය උපායශීලීව අන්තිම වතාවට තමාට තෙවරක් පැදකුණුකොට සැමියාට නමස්කාර කරන්නට අවසර ඉල්ලා සිටියා ය. ලත් අවසරයෙන් පැදකුණු කරන මුවාවෙන් ඇය පසුපසින් යන ගමන් ඔහු පර්වතයෙන් පහලට තල්ලුකර දැම්මා ය. ඒ දුටු වන දෙවියෙක් ඇයගේ මෙම ක්‍රියාව පසසමින් මෙසේ පැවසීය.

'' න සො සබ්බෙසු ඨානෙසු
පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථීපි පණ්ඩිතා හොති
තත්‍ථ තත්‍ථ විචක්ඛණා''

පුරුෂයා පමණක් ම හැමතැනක දී ම පණ්ඩිත නොවේ. ඒ ඒ තැන්වලදී ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ස්ත්‍රීහු ද පණ්ඩිතයෝ වෙති යනුවෙනි.

සොරා ඝාතනය කිරීමෙන් පසු නුවරට යන්නට බිය වූ කුණ්ඩල කේසී වන මැදින් යන අතර පරිබ්‍රාජිකා ආශ්‍රමයක් දැක එහි ගොස් සියලු පුවත් පවසා පරිබ්‍රාජිකාවක බවට පත්වූවා ය. එහිදී ඇයට යන්නට අංශ දෙකක් තිබුණි. පළමුවැන්න ධ්‍යාන වැඩීම ය. දෙවැන්න වාද දහසක් ඉගෙන වාදිනියක වීම ය. එයින් දෙවැන්න තෝරාගත් කුමරිය වාද දහස ඉගෙන දඹ අත්තක් ද ගෙන ප්‍රතිවාදීන් සොය සොයා ගමින් ගම නගරයෙන් නගරය සැරිසැරුවා ය. ඉන් ඇය ජම්බු පරිබ්‍රාජිකා ලෙස ප්‍රසිද්ධ විය. ඇය දඹඅත්ත කිසියම් තැනක සිටුවා ගිය කල්හි කවරෙකු හෝ එය උදුරා දැමුවහොත් ඇයගේ දහසක් වාද මැද ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු විය. ඒ වන විට ඇය හා වාද කිරීමට සමත් කිසිවෙක් කිසිතැනක නොවී ය.

මේ අතර දිනක් පිඬු පිණිස වඩිමින් සිටි සැරියුත් මහ තෙරණුවෝ එම දඹ අත්ත වටකරගෙන සිටි කොළු කුරුට්ටන් පිරිසක් දැක ඔවුන් ලවා ම එය උදුරා දැමූහ. එදා උන්වහන්සේ සමග වාදයට ගිය කුණ්ඩලකේසියගේ ප්‍රශ්න දහසට ම සැරියුත් තෙරණුවෝ පිළිතුරු දුන්හ. අනතුරුව උන්වහන්සේ ''එකනාම කිං'' ආදී ප්‍රශ්න දහය ඇයට ඉදිරිපත් කළ නමුත් ඉන් එකක් හෝ විසඳීමට ඇයට නොහැකි විය. පැරදී උන්වහන්සේ කෙරෙහි පැහැදුණු ඇය පැවිද්ද ඉල්ලා සිටියා ය. තෙරණුවෝ ඇය භික්ෂුණීන් වෙත යවා පැවිදි කරවූහ. පැවිදි වී නොබෝ කලකින් ම ඕ තොමෝ සිව්පිළිසිඹියාපත් රහත් මෙහෙණියක බවට පත් වූවා ය.

පසු දිනෙක මේ පිළිබඳ දම් සභා මණ්ඩපයේ දී භික්ෂූන් වහන්සේලා අතර කතාබහක් ඇති විය. කුණ්ඩලකේශී තනිව ම දරුණු සොරකු පරාජය කොට පැමිණීමත්, පැවිදි වී නොබෝ කලකින් ම වැඩිපුර දහම් ඇසීමකුත් නැතිව සිව්පිළිසිඹියාපත් රහත් බවට පත්වීමත් උන්වහන්සේලාගේ විමතියට හේතු විය. ඒ මොහොතේ දම්සභා මණ්ඩපයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කොටගෙන මේ ගාථාවන් වදාළ සේක.

> "යො වෙ ගාථා සතං භාසෙ
> අනත්‍ථ පදසංහිතා
> එකං ධම්මපදං සෙය්‍යො
> යං සුත්‍වා උපසම්මති"

**පදාර්ථ:**

**යොච,** යම් පුද්ගලයෙක්: **අනත්‍ථ පදසංහිතා,** නිරර්ථක ලෞකික වර්ණනාවලින් යුක්ත: **ගාථා සතං භාසෙ,** ගාථා සිය ගණනක් කීමට වඩා: **යං සුත්‍වා උපමම්මති,** යමක් අසා කෙලෙසුන් සංසිඳීමට පත්වේ නම්: **එකං ධම්මපදං සෙය්‍යො,** එබඳු එක් ගාථා පදයක් වුව ද කීම උතුම් ය.

> "යො සහස්සං සහස්සෙන
> සඞ්ගාමෙ මානුසෙ ජිනෙ
> එකඤ්ච ජෙය්‍ය අත්තානං
> ස වෙ සඞ්ගාමජුත්තමො"

**පදාර්ථ:**

**යො,** යමෙක්: **සඞ්ගාමෙ,** යුද බිමකදී; **මානුසෙ;** මිනිසුන්; **සහස්සං සහස්සෙන,** දහසින් දහසක් හෙවත් දසලක්ෂයක්; **ජිනෙ,** දිනනවාට වඩා; **එකඤ්ච ජෙය්‍ය අත්තානං,** එකම එක් තමා දිනීම හෙවත් සිත පාලනය කරගැනීම උතුම් ය: **ස වෙ සඞ්ගාමජුත්තමො,** ඔහු උතුම්ම යුධ ජයග්‍රාහකයා වන්නේ ය.

**විවරණ:**

මෙහිදී පළමු ගාථාවෙන් ප්‍රකාශ වූයේ කුණ්ඩල කේශී පරිබ්‍රාජිකාව වැනි නුවණැති කෙනෙකුට දහස් ගණන් බණපද අවශ්‍ය නැත. එක් බණ පදයක් වුව ද ප්‍රමාණවත් ය යන්න යි.

දෙවන ගාථාවෙන් කියවෙන්නේ ඇය දරුණු සොරෙකු උපක්‍රමයෙන් පරාජය කොට පැමිණීම නොව එවැනි අය දශලක්ෂයක් පරාජය කරනවාටත් වඩා කෙලෙසුන් නසා තමා දිනාගැනීම උතුම් බවයි.

### 5.5.1.4 අනර්ථයට හේතු සොයන්නා.

දිනක් බුදුරජාණන් වහන්සේ හමුවීමට එක්තරා බ්‍රාහ්මණයෙක් පැමිණියේය. ඔහුගේ විශේෂත්වය නම් අනෙක් හැම දෙනාම අසන්නේ දියුණුවට හේතු ය, මොහු අසන්නේ පිරිහීමට අනර්ථයට හේතු ය. එනිසා මොහු අනත්‍ථ පුච්ඡක බ්‍රාහ්මණ නම් වීය. බුදුරදුන් වෙත පැමිණි හෙතෙම, සම්බුද්ධයන් වහන්ස, ඔබ දන්නේ අර්ථය පමණක් ද නැතහොත් අනර්ථයත් දන්නේදැයි ඇසී ය. එවිට බුදුරජාණන් වහන්සේ, බ්‍රාහ්මණය මම අර්ථයත් දනිමි, අනර්ථයත් දනිමියි වදාළහ. එසේ නම් මට අනර්ථය කියාදෙනු මැනවැයි හෙතෙම ඉල්ලා සිටියේ ය. එවිට උන්වහන්සේ,

"උස්සූර සෙය්‍යං ආලස්සං
චණ්ඩික්කං දීඝ සොත්ථියං
එකස්සද්ධානගමනං
පරදාරූපසෙවනං
එතං බ්‍රාහ්මණ සෙවස්සු
අනත්ථං තෙ භවිස්සතිති"

හිරු නැගෙනතුරු නිදාගැනීම, අලසකම, සැඩපරුෂකම, වැඩ කල් ඇදීම (සෙමින් වැඩ කිරීම) තනිව දුර ගමන් යාම, පරදාර සේවනය, යන මේවා සේවනය කිරීමෙන් බ්‍රාහ්මණය ඔබට අනර්ථයක් ම වන්නේ ය.

එය ඇසූ බමුණා සාධුකාර දී ඔබ වහන්සේ අර්ථය මෙන් ම අනර්ථයත් දන්නා සේකැ'යි බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා කළේ ය.

ඔහු ගැන දන්නා බුදුරජාණන් වහන්සේ බමුණා, ඔබ කුමකින් ජීවත්වන්නේ දැයි විමසූහ. පින්වත් ගෞතමයන් වහන්ස, මම දූ කෙලියෙන් ජීවත්වෙමියි හේ කීය. එවිට. බමුණා, ඔබට ඉන් ජය ලැබේ ද පරාජය ලැබේදැ'යි ඇසූවිට, ස්වාමීනි, ජය පරාජය දෙක ම ලැබේයයි හෙතෙම කීය. එවිට බුදුරජාණන් වහන්සේ මේ ගාථා දෙකෙන් දහම් දෙසූහ.

"අත්තා හවෙ ජිතං සෙය්‍යා
යා චායං ඉතරා පජා
අත්තදන්තස්ස පොසස්ස
නිච්චං සඤ්ඤතචාරිනො"

පදාර්ථ:

**යා චායං ඉතරා පජා,** යමෙක් මේ යුද්ධයෙන් හෝ සූදුවෙන් අනෙක් මිනිසුන් දිනීමට වඩා: **නිච්චං සඤ්ඤත චාරිනො,** නිරන්තරයෙන් ම සංවර පැවතුම් ඇති: **අත්ත දන්තස්ස පොසස්ස,** තමා දිනාගත් ඒ පුද්ගලයාගේ. **හවෙ අත්තා ජිතං සෙය්‍යො,** ඒකාන්තයෙන් ම තමා දිනීම උතුම් ය:

විවරණ:

**නිච්චං සඤ්ඤත චාරිනො,** යනු කෙලෙසුන් සංසිඳ වූ රහතන් වහන්සේ නිරතුරුව ම කයින් වචනයෙන් සිතින් සංවරව හැසිරෙන බවයි.

> ''නෙව දෙවො න ගන්ධබ්බො
> න මාරො සහ බ්‍රහ්මුණා
> ජිතං අපජිතං කයිරා
> තථා රූපස්ස ජන්තුනො''

පදාර්ථ:

**තථාරූපස්ස ජන්තුනො,** එබඳු පුද්ගලයාගේ: **ජිතං,** ජයග්‍රහණය: **දෙවො,** දෙවියෙක් හෝ: **ගන්ධබ්බො,** ගඳඹෙක් හෝ: **මාරො,** මරුවෙක් හෝ: **සහ බ්‍රහ්මුණා,** බ්‍රහ්මයා ඇතුළු කිසිවෙක්: **නෙව අපජිතං කයිරා,** පරාජයක් බවට පත්කිරීමට සමත් නොවන හෙයිනි.

විවරණ:

**නෙව ජිතං අවිජිතං කයිරා,** යනු සියලු කෙලෙසුන් නසා රහත් වූ පුද්ගලයා තුළ නැවත කෙලෙස් උපදවන්නට කිසිවකුටත් නොහැකි බවයි.

### 5.5.1.5 ආර්යයන් වහන්සේට කරන පිදුම අන් සියලු දන් පරදයි.

රජගහ නුවර සැරියුත් තෙරුන්ගේ මයිලනු බමුණෙක් විසී ය. දිනක් ඔහු වෙත ගිය සැරියුත් තෙරණුවෝ ඔබ පින් දහම් කිසිවක් කරන්නේදැයි ඇසූහ. එවිට හෙතෙම එසේ ය ස්වාමීනි, මම මසක් පාසා කහවනු දහස බැගින් වැයකොට නිගණ්ඨයන්ට දන්දෙමි'යි පැවසී ය. එසේ ඔවුන්ට දන්දෙන්නේ කුමක් සිතාගෙනදැ යි ඇසූ කළ බඹලොව පතාගෙන යයි බමුණා කීය. බඹලොවට යන මග මෙය යැයි ඔබට කියුවේ කවුරුන්ද යි ඇසූවිට ඒ බව තමාට ආචාර්යවරුන් කී බව හේ පැවසී ය. එවිට තෙරණුවෝ බමුණ, බඹලොවට යන මග ඔබ දන්නේත් නැත. ඔබගේ ආචාර්යවරුන් දන්නේත් නැත. එන්න එය තථාගතයන් වහන්සේ දනිති'යි කියා බමුණා ද කැටුව බුදුරජාණන් වහන්සේ වෙත ගියහ. ඒ පුවත ඇසූ බුදුරජාණන් වහන්සේ එය සැබෑවක් දැයි බමුණාගෙන් අසා එසේය ස්වාමීනි, එය සැබෑවකියි බමුණා කී කල්හි බමුණ, ඔබ මෙබඳු අයට සියක් වසක් දෙන දානයට වඩා ආර්යයන් වහන්සේ නමකට මොහොතකට දෙන බත් හැන්දක් මහත් ඵල වන්නේ යයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

> ''මාසෙ මාසෙ සහස්සෙන
> යො යජෙථ සතං සමං
> එකඤ්ච භාවිතත්තානං
> මුහුත්තමපි පූජයෙ
> සා යෙව පූජනා සෙය්‍යො
> යඤ්චෙ වස්සසතං හුතං ''

පදාර්ථ:

**යො,** යමෙක්: **මාසෙ මාසෙ,** මසක් මසක් පාසා: **සහස්සෙන,** කහවණු දහස බැගින් වැය කොට: **සතං සමං,** සියවසක් පුරා, **යජෙථ,** සාමාන්‍ය අයට දන්දෙන්නේ නමුත්: **එකං ච භාවිතත්තානං,** කෙලෙසුන්ගෙන් මුදවා සීලාදී ගුණයෙන් සිත වැඩූ එක් උත්තමයෙකුට: **මුහුත්තං අපි,** මොහොතක් හෝ: **පූජයෙ,** යම් පූජාවක් කරයි නම්: **යං චෙ වස්සසතං හුතං,** යම් ඒ සියවසක් කරනන යාගයට වඩා: **සා යෙව පූජනාං සෙය්‍යො,** ඒ ආර්යයන්ට කරන පූජාව ම උතුම් වන්නේ ය.

විවරණය:

''**යජෙථ**'' යන්නෙන් කියවන යාගයත්, ''**හුතං**'' යන්නෙන් කියවන හෝමයත් බමුණන්ගේ පූජා විධි දෙකකි. මෙහි දී ඒ දෙකම, යොදා ඇත. බමුණන්ගේ යාගහෝම අවසානයේ දී ද දන් දීමේ සිරිතක් ඇත. මෙහි ''**භාවිත අත්ත**'' යන්නෙන් වැඩූ සිත යන අදහස දෙයි. අභාවිත සිත යනු රාගාදී කෙලෙසුන්ගෙන් ගැවසුණු සිතයි. භාවිත සිත යනු සීලයෙන් සිල්වත්ව සමාධියෙන් සිත එකඟ කරගෙන අනිත්‍ය දුකඛ ආදී විදර්ශනා වැඩූ සිතයි ''**අත්ත**'' යන්නෙන් තමා යන අර්ථය කියවේ. බුදු දහමේ ''**අත්ත**'' යනු තම සිතයි. එනිසා මෙහි ''**භාවිතත්ත**'' යන්නෙන් කෙලෙසුන්ගේ මිදි මිදී සිත දියුණු කරගෙන යන සෝවාන් ආදී ආර්යයන් වහන්සේලා අදහස් කෙරේ. **මජ්ඣිම නිකායේ දක්ඛිණා විභංග සූත්‍රයේ** සඳහන් වන්නේ උන් වහන්සේලාට දෙන දානයේ ආනිශංස අනන්ත අප්‍රමාණ බවයි.

### 5.5.1.6 සියවසක් ගිනිපිදීමට වඩා එක් මොහොතක් ආර්යයන් වහන්සේ පිදීම උතුම් ය.

සැරියුත් මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ අගසව් වුවත් උන්වහන්සේගේ ඥාති වර්ගයා බොහෝ දෙනෙක් බමුණු දහම ඇදහූවෝ වූහ. දිනක් උන්වහන්සේ සිය බෑණනු කෙනෙකු වෙත වැඩියහ. ඔහු බිලිපූජා කොට ගිනි පුදන බමුණෙකි. ඔබ කරන පින් දහම් මොනවාදැයි තෙරුන් වහන්සේ ඇසූ විට බඹලොව පතාගෙන පුදන බව බමුණා කීය. බඹලොව යන මග ඔබ දන්නේ නැත. එන්න එය භාග්‍යවතුන් වහන්සේගෙන් දැනගනිමුයි කියා තෙරණුවෝ ඔහුත් සමග ගොස් බුදුරජාණන් වහන්සේට මෙපවත් සැල කළහ. එවිට උන්වහන්සේ බමුණ, අවුරුදු සීයක් ගිනි පුදනවාට වඩා සිත වැඩූ ආර්යන් වහන්සේ නමකට එක මොහොතක කරන පූජාව අගනේයයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

"යොච වස්ස සතං ජන්තු
අග්ගිංපරිචරෙ වනෙ
එකඤ්ච භාවිතත්තානං
මුහුත්තමපි පූජයෙ
සා යෙව පූජනා සෙය්‍යො
යඤ්ච වස්සසතං හුතං "

පදාර්ථ:

**යො ජන්තු,** යම් පුද්ගලයෙක්: **වස්සතං,** අවුරුදු සියයක් **වනෙ,** වනයට වී: **අග්ගිං පරිචරෙ,** ගිනි පුදන්නේ ද, ඊට වඩා: **එකඤ්ච භාවිතත්තානං,** එක් ආත්ම දමනය කළ ආර්යයන් වහන්සේ නමකට **මුහුත්තං අපි පූජයෙ,** මොහොතක් හෝ පුදයි ද: **යං චෙ වස්සසතං හුතං,** ඒ වසර සීයක් කරන යාගයට වඩා: **සා යෙව පූජනා සෙය්‍යො,** ඒ ආර්යයන් වහන්සේට කරන පූජාව ම උතුම් වන්නේ ය.

විවරණය:

**අංගිං පරිචරෙ,** ගිනිපිදීම. ගින්න බමුණන් විසින් සලකන ලද්දේ දෙවියෙකු ලෙස ය. බමුණෙකු නම් ඔහු වාසය කරන තැන නිතරම ගිනි දැල්වී තිබිය යුතු ය. යාගය සඳහා විශේෂ තැනක විශේෂ දර යොදා යාග ගින්න සාදා ගනු ලැබේ. ගිතෙල් හෝ වෙනත් පූජා ද්‍රව්‍ය එම ගින්නට කැප කරමින් යාගය පවත්වනු ලැබේ. ඇතැම් විට සතුන් මරා බිලි පූජා කරන්නේ ද ගින්නට ය. මේ අනුව යාගය යනු ගින්න යොදා කරන පූජා විධියකි.

මහා බ්‍රහ්මයා ලොව මැවීයැයි ද විෂ්ණු දෙවියන් ලොව පාලනය කරන්නේ යැයි ද, ඊශ්වර දෙවියන් ලොව වනසන්නේයැයි ද ඔවුන්ගේ විශ්වාසය යි. ත්‍රිමූර්තිය නමින් හඳුන්වන මේ දෙවිවරු තිදෙනා සතුටු කිරීම, ගිනි දෙවියන් පිදීමේ යාගයේ අරමුණ යි. ඒ අනුව ගිනි දෙවියන් පිදීමෙන් බ්‍රහ්මයා සතුටු කොට බඹලොව යා හැකියැ යි ඔවුහු විශ්වාස කළහ. සැරියුත් තෙරුන්ගේ මේ ඥාතීන් යාගහෝම කර ඇත්තේ එසේ බඹලොව යාමට ය.

## 5.5.1.7 වසරක් පුරා කරන යාගයට වඩා ආර්යයන් වහන්සේට වැඳීම උතුම්මය.

රජගහනුවර සැරියුත් මහ රහතන් වහන්සේගේ පැරණි යහළුවෙකු වූ බමුණෙක් විසීය. හෙතෙම බඹලොව යාමට පින් කරනු පිණිස මහ යාග පවත්වයි. සැරියුත් තෙරුන් ඔහු කැටුව ගොස් බුදුරජාණන් වහන්සෙට ඒ වග සැලකළ විට උන්වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

"යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ
සංවච්ඡරං යජෙථ පුඤ්ඤපෙක්ඛො
සබ්බම්පි තං න චතුභාගමෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො "

පදාර්ථ:

**යං කිඤ්චි,** යම්කිසි: **යිට්ඨං වා,** යාගයක්, නැතහොත් මංගල ආදී කාරණා හේතු කොටගෙන දෙන දන් හෝ: **හුතං වා,** හෝමයන් නැතහොත් යම් යම් පිදිය යුත්තන් රැස්කොට දෙන දන් හෝ කර්ම ඵල අදහා දෙන කවර හෝ දානයක්: **පුඤ්ඤපෙක්ඛො,** පින් ඵල බලාපොරොත්තුවෙන්: **සංවච්ඡර යජෙථ,** වසරක් පුරා සාමාන්‍ය පුද්ගලයින්ට දුන්නේ නමුත්: **සබ්බම්පි තං,** ඒ සියලු යාග හෝ දාන: **උජ්ජුගතෙසු අභිවාදනා,** උජුපටිපන්න හෙවත් ආර්ය මාර්ගයට පිළිපන් සෝවාන් ආදී උතුමකුට කරන වන්දනාවකින්: **න චතුභාගාමෙති,** සතරෙන් පංගුවක්වත් නොවටනේ ය. ඒ උජුපටිපන්න ආර්යයන් වහන්සේට කරන වන්දනාව පවා ශ්‍රේෂ්ඨ වන්නේ ය.

විවරණය:

'**අභිවාදනා උජ්ජුගතෙසුසෙය්‍යො**' යන මෙහි '**උජ්ජුගත**' යනු උජුපටිපන්න යන අදහසම ය. **උජුපටිපන්න** යනු කාමසුඛල්ලිකානු යෝග අත්තකිලමථානුයෝග යන අන්ත ද්වයට නොවැටී මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය මාර්ගයට පිවිසීම යි. ඒ ආර්යයන් වහන්සේලාට දන්දීම නොව වන්දනා කිරීම පවා වසර සිය ගණනක් වෙනත් මහණ ශ්‍රමණ බමුණන්ට දන්දීමට වඩා උතුම් බව කියවේ.

## 5.5.1.8 දිගාසිරි ලැබූ බුදුන් දවස පිරිත් දෙසුමක්.

දීඝ ලම්බික නම් නුවර වැසි බමුණෝ දෙදෙනෙක් වනගතව හතලිස් අට වසරක් තවුස් දම් පිරූහ. මේ අතුරින් එක් අයෙක් තමාගේ කුල පරපුර ගැන සිතා නැවත ගිහිගෙට ගොස් ආවාහයක් කරගෙන පුතෙකු ද ලැබී ය. අනෙක් තවුසා වරක් සිය යහළුවා දැකීමට එම නුවරට පැමිණියේය. ඒ බව ඇසූ යහළුවා අඹු දරුවන් සමග ඒ තවුසා දැකීමට ගියේය. යහළුවා වැන්ද විටත් බිරිය වැන්ද විටත් දීඝායුවේවා යයි කී තවුසා දරුවා ලවා වැන්ද වූ විට නිහඬව සිටියේ ය. ඊට හේතුව විමසූ විට මොහු ජීවත්වන්නේ තව සත් දිනක් පමණකැයි තවුසා කීය. මෙය වළක්වා ගැනීමට පිළියමක් නැද්ද යි ඇසූවිට පිළියම් ඇත. එහෙත් මම නොදනිමි. ගෞතම බුදුරජාණන් වහන්සේ දන්නවා ඇති උන්වහන්සේගෙන් විමසන්න යැයි තවුසා පිළිතුරු දුන්නේ ය.

දරුවා රැගෙන බුදුරාණන් වහන්සේ වෙත ගිය දෙමහල්ලන් දරුවා ලවා වැන්දවූ විට බුදුරජාණන් වහන්සේ ද දිගාසිරි නොකොට නිහඬ වූ සේක. ඊට හේතුව උන්වහන්සේ වදාළ විට දරුවාගේ ආයු වැඩීමට පිළියමක් නැද්ද යි මව්පියෝ ඇසූහ. එවිට බුදුරජාණන් වහන්සේ බමුණ පිළියමක් ඇත. ඔබේ ගෙදර දොරටුවෙහි මණ්ඩපයක් කරවන්න. එහි මැද කුඩා පුටුවක් තබා ඒ වටා ආසන අටක් හෝ දාසයක් පනවන්න දරුවා ඒ කුඩා පුටුවෙහි හිඳුවා වටා ඇති ආසනවල භික්ෂු සංඝයා හිඳුවා සත් දවසක් නො නවත්වා පිරිත් දේශනා කරවන්නට ඇත්නම් මේ අනතුරෙන් ගැලවිය හැකියයි වදාළහ. බමුණ ද එකී පරිදි මණ්ඩපයක් කරවා අසුන් පනවා පිළියෙල කරවී ය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා පිටත්කොට යැවූහ. සත් දවසක් පිරිත් දේශනා කොට නිම කළ විට බුදුරජාණන් වහන්සේ එහි වැඩම කළහ. එවේලේ සියලු සක්වල වැසි දෙවියෝ ද එතනට රැස් වූහ.

එදිනට එම දරුව ගොදුරු කරගැනීමට අවරුද්ධ නම් යක්ෂයෙක් වෛශ්‍රවණ දෙවියන්ගෙන් වරයක් ලබා සිටියේ ය. බුදුරජාණන් වහන්සේ එහි වැඩමවා මහේ ශාක්‍ය දෙව් දේවතාවන් ද එහි සිටි නිසා අවරුද්ධ යක්ෂයාට ඒ අසලටවත් ළං විය නොහැකි විය. මුළු රාත්‍රිය ම බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ පිරිත් දෙසූහ. පසු දා පහන් විය. යක්ෂයාට බිල්ල හිමිවීමේ කාලය අවසන් විය. අටවනි දවසේ උදෑසන පිරිත් හමාර වීමත් සමඟ දෙමාපියෝ දරුවා ලවා බුදුරදුන් වැන්දවූහ. දීර්ඝායුෂ වේවා යි උන්වහන්සේ ආශිර්වාද කළහ. දරුවාට කොපමණ ආයුෂ ඇත්තේ දැයි විමසූ කල මේ කුමරුට එකසිය විස්සක් ආයුෂ වන්නේ යැයි බුදුරදුන් වදාළහ. එතැන් සිට ඔහු ආයුවඩ්ඪන කුමාර නමින් ප්‍රසිද්ධ විය. වැඩිවියට පත් හෙතෙම ගිහි බන්ධනයෙන් නොබැඳී පන්සීයක් උපාසකයන් සමග උපාසක ජීවිතයක් ගත කළේය.

දම් සභා මණ්ඩපයේ දී මේ කථා පුවත සංඝයාගේ කතාබහට ලක්විය. ඒ නිමිතිකොට බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

**''අභිවාදනසීලිස්ස නිච්චං වද්ධාපචායිනො**
**චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයු වණ්ණො සුඛං බලං''**

**පදාර්ථ:**

**අභිවාදන සීලිස්ස,** නිතර වැඳිය යුත්තන් වඳින සුලු: **වද්ධාපචායිනො,** වැඩිහිටියන් වඳින පුදන සුලු ගිහියාට හෝ පැවිද්දාට: **චත්තාරො ධම්මා වඩ්ඪන්ති,** ධර්ම හතරක් වැඩේ, **ආයු වණ්ණො සුඛං බලං,** එනම් ආයුෂය, වර්ණය හෙවත් හැඩරුව ද පස්කම් සැපත ද බලය හෙවත් කාය බලය පිරිස් බලය යන මේවා ය.

**විවරණ:**

'**අභිවාදන සීලිස්ස**' යනු නිතර වඳින සුලු යන අදහසයි. වැඳිය යුත්තන් වැඳීමයි. ගිහියන්ට දෙමාපියෝ වැඳිය යුත්තෝ වෙති. පැවිද්දන්ට ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා වැඳිය යුත්තෝ වෙති. එහෙත් මෙහි ''වද්ධා පචායිනො'' යනුවෙන් වැඩිහිටියන් පිදීම වෙනම ම දක්වා තිබෙන හෙයින් මෙහි වැඳිය යුත්තන් වන්නේ බුදුන්, දහම්, සඟුන් සහ සිල්වතුන් ගුණවතුන් ය. එබඳු උතුමන්ට නිතර වඳින සුළු, ගුරුවර දෙමව්පිය වැඩිහිටියන්ට පුදන සුළු පුද්ගලයාට ආනිශංස හතරක් ලැබෙන බව මෙයින් කියවේ. මෙහි ඇති විශේෂත්වය නම් ඒ වැඳුම් පිදුම් පෙර කළ පින් විය යුතු නැත. අද කරන වැඳුම් පිදුම් බලයෙන් මේ ජීවිතයේදී ම ආයුෂ, වර්ණ, සැප, බල, ලැබේ. ආයුවඩ්ඪන කුමාරයාගේ කතාවෙන් කියවෙන්නේ පිරිත් අනුහසින් ආයුෂ වැඩුණු බවයි. එහෙත් වැඳිය යුත්තන්ට වැඳීමෙන් ද පිදිය යුත්තන්ට පිදීමෙන් ද ඒ ආනිශංසය ලැබෙන බව බුදුරජාණන් වහන්සේ වදාළහ.'

### 5.5.1.9 දුසිල්වත් සියවසකට වඩා සිල්වත් එක් දිනක් උතුම් ය.

අගසව් සැරියුත් තෙරුන්ගේ අතවැසි වූ සංකිච්ච නම් සත් හැවිරිදි සාමණේර නමක් විය. මේ කුමාරයා මව් කුස සිටියදී ම මව මිය ගියා ය. දරුගැබත් මියයන්නට ඇතැයි සිතූ මිනිස්සු ඇගේ මළකඳ සෑයක තබා දැවූහ. ඒ සා දරුණු ගිනි කඳක් මැද මේ පින්වත් දරුවා නො පිළිස්සී සිටියේ ය. සත් අවුරුද්දක් යනතුරු දරුවා පෝෂණය කළ නෑදෑයන් ඔහු සැරියුත් තෙරුන් ළඟ පැවිදි කළහ. හිස මුඩු කරද්දී ම සංකිච්ච කුමාරයා සිව් පිළිසිඹියාපත් රහත් බවට පත්විය. උපතේ දී ම ප්‍රාතිහාර්යයක් පෑ උන්වහන්සේ සාමණේර නමක් වුවත් මහා සෘද්ධි බල ඇත්තෙක් විය.

දිනක් භික්ෂූන්වහන්සේලා තිස් නමක් බුදුරදුන්ගේ කමටහන් ගෙන මහණදම් පිරීම සඳහා වනගත සෙනසුනක් වෙත යන්නට අවසර ඉල්ලා සිටියහ. එහි ගිය විට උන්වහන්සේලාට සිදු විය හැකි විපතක් ගැන දුටු බුදුරජාණන් වහන්සේ ඒ බව නොපවසා සැරියුත් තෙරුන් හමු වී යන ලෙස පැවසූහ. උන්වහන්සේලා සැරියුත් තෙරුන් වෙත ගිය විට උන්වහන්සේ බුදුරදුන් මේ පිරිස තමා වෙත එවන ලද්දේ කුමක් නිසාදැයි දිවැසින් බලා කාරණය තේරුම්ගෙන එසේ ඒ වනයට යන්නේ නම් මේ සංකිච්ච සාමණේරයන් ද කැටුව යන්නයි කීහ. උන්වහන්සේලා සාමණේරයන් ද කැටුව වනයට ගොස් මහණදම් පුරන්නට පටන් ගත්හ.

මේ අතර එක්තරා දුගියෙක් භික්ෂූන් වහන්සේලාට ලැබෙන ආහාර පහසුව දැක උන් වහන්සේලාට උවටැන් කරමින් ඒ අසපුවේ ම විසුවේ ය. දිනක් සිය දියණියක් බැලීමට වන මැදින් යන ඔහු සොර මුලකට හසුවිය. එදා සොරුන්ට අවශ්‍ය වූයේ බිලි පූජාවක් සඳහා මිනිසෙකි. ඒ අනුව ඔහු අල්ලාගත් සොරුන් මරා බිලි දෙන්නට සූදානම් විය. එහිදී බැගෑපත් වූ මේ මිනිසා, මම අසරණ දුගියෙකි, මෙවැනි උතුම් පූජාවකට මා වටින්නේ නැත. මාත් යැපෙන්නේ අසවල් අසපුවේ සිටින ශ්‍රමණයන් වහන්සේලා නිසා ය. ඔවුහු උපතින් ම ධනවතුන් ය කුලවතුන් ය. ශරීරයෙන් ද මට වඩා පුෂ්ටිමත් ය. දෙවියන් ට පිදිය යුත්තේ එබඳු පූජාවකැයි කියා කෑ බත් පතේ ගුණයවත් නොතබා සංඝයා පාවා දුන්නේ ය.

සොරු ද ඒ ආරංචිය අනුව ගොස් ඒ මිනිසා දුන් ඔත්තුව අනුව ගෙඩිය ගසා සංඝයා රැස් වූ විට ඉන් එක් නමක් ඉල්ලූහ. එහි දී මහ තෙරුණුවෝ එය තමන්ගේ වගකීමක් යයි කියා ඊට ඉදිරිපත් වූහ. ඊට එරෙහි වූ සෙසු භික්ෂූන් වහන්සේලා ද තම තමන් ඉදිරිපත් වූ හෙයින් තීරණයක් ගත නොහැකි විය. අන්තිමේ දී සංකිච්ච සාමණේර වහන්සේ ස්වේච්ඡාවෙන් ම ඊට ඉදිරිපත් විය. එහි දී සත් හැවිරිදි මේ කුඩා සාමණේරයන් ගැන තමන් වහන්සේලාට සැරියුත් තෙරුන්ට වගකියන්නට සිදුවන හෙයින් සෙසු භික්ෂූන් වහන්සේලා ඊට අකමැති වූහ. එවිට සාමණේරයන් වහන්සේ ගුරුදේවයන් වහන්සේ ඔබ වහන්සේලාට මා සමඟ යන්න යැයි කීවේ මේ දේ ගැන දැනගෙන ය. මම සාමණේර වුවත් සසුන් කිස නිමවා සිටින කෙනෙක්මි. ඔබවහන්සේලාට තව බොහෝ දුර යන්නට තිබේ. එහෙයින් මම යමියි කීහ. සංඝයා නිහඬ වූහ.

සාමණේරයන් වහන්සේ රැගෙනගොස් ගිනිගොඩක් ගසා එහි බිලිදෙන්නට සොරදෙටුවා තම කඩුවෙන් උන්වහන්සේට කෙටුවේ ය. එහෙත් පළමුවර කඩුව ඇඹරී ගියේ ය. දෙවන වර කඩුව හැකිලී ගියේ ය. තෙවන වර ද කඩුව ඇඹරී උණ්ඩි වී ගියේ ය. මෙම ආශ්චර්යවත් සිද්ධියෙන් පුදුමයටත් බියටත් පත් වූ සොරු වැඳ සමාව ගෙන උන් වහන්සේ වෙතම පැවිදි වූහ. සාමණේරයෝ ඒ පිරිසත් කැටුව හඬා වැටෙමින් සිටි සෙසු භික්ෂූන් හමු වී සමුගෙන එම පිරිවරත් සමග සැරියුත් තෙරුන් වෙත ගියහ. සංකිච්ච ඔබට අතවැසියන් හම්බ වූවා නොවේදැයි කියා සිය ප්‍රසාදය පළකළ සැරියුත් තෙරණුවෝ සියළු දෙනා වහන්සේ ද කැටුව ගොස් බුදුරදුන්ට මෙපුවත සැළ කළහ. එහි දී පෙරදින සොර මුලක්ව සිට පැවිදි වූ පිරිස අමතා තථාගතයන් වහන්සේ මේ ගාථා ව දේශනා කළහ.

> **"යො ච වස්සසතං ජීවෙ**
> **දුස්සීලො අසමාහිතො**
> **එකාහං ජීවිතං සෙය්‍යො**
> **සීලවන්තස්ස ඣායිනො "**

**පදාර්ථ:**

**යො ච,** යම්කිසි කෙනෙක් වනාහි: **දුස්සීලො,** සොරකම් කිරීම් යනාදියෙන් දුස්සීල ව: **අසමාහිතො,** සිත භාවනාවෙන් සන්සුන් කර නොගෙන: **වස්සසතං ජීවෙ,** වසර සීයක් ජීවත්වනවාට වඩා: **සීලවන්තස්ස ඣායිනො,** සිල්වත්ව ධ්‍යාන භාවනාවේ යෙදී සිටින පුද්ගලයාගේ: **එකාහං ජීවිතං සෙය්‍යො,** එක් දවසක ජීවිතය වටින්නේ ය.

**විවරණය:**

ඒ ධර්මය අසා පන්සීයක් භික්ෂු පිරිස ද සිව් පිළිසිඹියාපත් රහත් බවට පත්වූහ. සංකිච්ච සාමණේරයන් වහන්සේ අවුරුදු 7ක් ඇතුළත දෙවරක් ම දිවි බේරුණු කෙනෙකි. පළමුවර ඒ කුමාරයාගේ දිවි ගැලවුනේ ලෝක ධර්මයක් නිසා ය. එනම් පශ්චිම භවික සත්වයෙක් හෙවත් ඒ භවයේ නිවන් දකින්නට සිටින කෙනෙකුගේ ජීවිතය කිසිදු බලවේගයකින් නැසිය නොහැකි ය. මීළඟට ඇති ඉතා ම වැදගත්ම කාරණය නම් මේ සාමණේර පොඩි හාමුදුරුවෝ අවුරුදු හත වනවිටත් රහත් වී ඍද්ධි බලයෙන් මහා බලසම්පන්නයෙකුවීසිටීමයි.බුදුරජාණන්වහන්සේත්සැරියුත්තෙරණුවෝත්මේසාමණේරයන් වහන්සේ පිරිස සමග යවන්නේ වනයේදී සෙසු භික්ෂු පිරිස ආරක්ෂා කරගැනීමට ය. එක් අතකට උන්වහන්සේ සාමණේර නමකි. භික්ෂූන්ට වතාවත් කළහැකි කෙනෙකි. අනෙක් අතට උන්වහන්සේට මහණකමේ තවත් කරන්නට දෙයක් නැති බැවිනි. ඒ සියල්ලටමත් වඩා විශේෂ කාරණය නම් බුදුරදුන්ටත් සැරියුත් තෙරුන්ටත් අවශ්‍ය වූයේ මේ පුංචි රහතන් වහන්සේගේ අසිරිමත් බලපරාක්‍රමය ලෝකයාට ප්‍රකාශ කිරීමයි.

## 5.5.1.10 අකුසල් කිරීම අනුවණකමේ ලක්ෂණයකි.

එක්තරා භික්ෂුවක් බුදුරදුන්ගෙන් කමටහන් ගෙන වනගතව වෙසෙමින් විදසුන් වඩා රහත් බවට පත්විය. ඒ බව බුදුරදුන්ට දක්වනු පිණිස එන අතර මග වෙහෙස නිසා මාර්ගය අසල ගල්තලාවක ධ්‍යානයට සමවැදී වැඩ හුන්හ. මේ අතර ගමක් කොල්ල කා ගත් බඩු හිසින් කරින් ඔසවාගෙන යන සොරමුලක් ද වෙහෙස නිවාගැනීමට ඒ ගල්තලාව අසල නැවතුනහ. මඳ අඳුරේ නොසැලී හිඳින තෙරුන් කණුවකැයි සිතූ සොරුන් තමන්ගේ බඩු පොදි උන්වහන්සේගේ සිරුර මත තැබූහ. රාත්‍රිය නිදාගෙන පසුදා ආපසු යන්නට පිටත්වන සොරුන්ට මෙතැන සිටියේ භික්ෂූන් වහන්සේ නමක බව වැටහුනේ බඩුපොදි ආපසු ඉවතට ගත් විට ය. මේ විස්මය ජනක සිදුවීම නිසා උන්වහන්සේගේ රහත් බලය පිළිබඳ පැහැදුණු සොරු මහත් සංවේගයට පත්ව සොරබඩු ඉවත ලා පැවිදි වී උන්වහන්සේ වෙතම මහණ දම් පුරන්නට වූහ. එතැන් සිට කාණුකොණ්ඩඤ්ඤ තෙර යැයි උන් වහන්සේ හැඳින්විණ. පිරිසත් සමග බුදුරදුන් වෙත ගිය තෙරණුවෝ සියලු පුවත් උන්වහන්සේට සැලකර සිටියහ. එවේලෙහි ඒ භික්ෂු පිරිස ඇමතූ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

> **''යො ච වස්සසතං ජීවෙ**
> **දුප්පඤ්ඤො අසමාහිතො**
> **එකාහං ජීවිතං සෙය්‍යො**
> **පඤ්ඤාවන්තස්ස ඣායිනො ''**

**පදාර්ථ:**

**යො ච,** යම්කිසි කෙනෙක් වනාහි: **දුප්පඤ්ඤො,** අනුවණකමින් යුතුව, **අසමාහිතො,** එකඟ නොවූ සිත් ඇතිව: **වස්සසතං ජීවෙ,** වසර සියයක් ජීවත්වනවාට වඩා, **පඤ්ඤාවන්තස්ස,** ප්‍රඥාවන්තව: **ඣායිනො,** ධ්‍යාන භාවනා කරන්නේ: **එකාහං ජීවිතං,** එකදවසක ජීවිතය, **සෙය්‍යො,** උතුම්ය:

**විවරණ:**

මෙහිදී ''**දුප්පඤ්ඤො**'' යන්නෙන්, සොරකම් ආදී අකුසල් කිරීම මෙන් ම අනුවණකම් පිළිබඳ ව කියන ලදී. එහිදී පෙර ගාථාවේ මෙන් ම අදහස් කරන ලද්දේ සිල් නැති කමයි. ''**අසමාහිතො**'' යන්නෙන් දෙපලේ ම කියවුනේ සමාධිය නැති කමයි. සීලයත් සමාධියත් නැති පුද්ගලයා වසර සීයක් නොව වසර අනන්ත කාලයක් ජීවත්වුවත් ඉන් වන පලක් නැත. ''**පඤ්ඤාවන්තස්ස ඣායිනො**'' යයි කියූ පරිදි සීලයෙන් හා සමාධියෙන් යුක්ත පුද්ගලයාගේ එක් දවසක ජීවිතය වුව ද වටින්නේ ය. මේ කථාවෙහි කියවුණු පරිදි සොරුන් මෙන් සීලයත් සමාධියත් සම්පූර්ණ කළවිට ඒ මොහොතේ ම ප්‍රඥාවට හෙවත් අරහත් මාර්ගයට පත්විය හැකි ය. සීලය හා සමාධිය නැති කමින් සසර පුරා යන්නට තිබුණු ගමනක් එක් දවසකින් අවසන් වෙයි.

### 5.5.1.11. ගෙල සිඳගන්නට ගොස් කෙලෙස් සිඳගෙන සසරෙන් මිදෙයි.

සැවැත් නුවර එක්තරා කුලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැහැදී පැවිදිව උපසම්පදාව ද ලැබී ය. කලක් යන විට උන්වහන්සේට පැවිද්ද ගැන කළකිරීමක් ඇති විය. එහෙත් නැවත ගිහිවීම ද උන්වහන්සේට පිළිකුල් විය. එහෙයින් මිය යාමට සිතී ය. දැන් උන්වහන්සේ ඊට උපායක් සොයමින් සිටී. මේ අතර පිරිසක් ගිනිහල්ගේ සිටි නයෙකු අල්ලාගෙන කුඩයක දමා ඈතකට දැමීමට ගෙන යමින් සිටියහ. මෙය දුටු කළ කිරුණු භික්ෂුව තමාට මිය යාමට හොඳ උපායකැයි සිතා සර්පයා ඉවතලීම තමා භාරගත්තේ ය. මඳ දුරක් ගෙන ගොස් සර්පයා ලවා දෂ්ට කරවා ගැනීමට සිතා කුඩයට අත දැමීය. එහෙත් සර්පයා දෂ්ට නොකළේ ය. නොයෙකුත් කෙවිටිකම් කළේය. අන්තිමේදී සර්පයාගේ මුවට ම ඇඟිල්ල දැමීය. එහෙත් දෂ්ට කළේ සර්පයා නොවේ. උන්වහන්සේ සර්පයා අතහැර ආපසු ආවේ ය. සර්පයා ඉවත දැමුවේදැයි භික්ෂූන් ඇසූ විට උඟ විසකුරු සර්පයෙකු නොව ගැරඬියෙකු යැයි උන්වහන්සේ කීය.

මෙසේ උන්වහන්සේ තවදුරටත් මැරෙන්නට උපායක් සොයමින් සිටින අතර භික්ෂූන්ගේ හිස මුඩු කිරීමට කරනවැමියා පැමිණි දවසක ඔහුගේ දැළිපිහියක් ගෙන පසෙක තිබූ ගසක් වෙත ගොස් එහි අත්තක ගෙල තබා ගෙල සිඳගන්නට සැරසුණි. ඒ මොහොතේ උපසම්පදා වූ දින පටන් මේ දක්වා තමන් රැකි පිරිසිදු සීලය උන්වහන්සේට සිහි විය. එයින් මුළු මහත් සිරුර පුරා ප්‍රීතිය පැතිර ගියේ ය. ප්‍රීතිය මැඩගෙන විදසුන් වැඩූ උන්වහන්සේ සිව්පිළිඹියා පත් රහත් වූහ. ආපසු වඩින උන්වහන්සේ දුටු භික්ෂූන් වහන්සේලා දැළිපිහියකුත් ගෙන කොහි ගියේදැයි ඇසූහ. ගෙල සිඳගන්නට ගිය මම කෙලෙස් සිඳගෙන ආවෙමි'යි උන්වහන්සේ පැවසී ය. මෙතෙම තමන් රහත් වූ බව බොරුවට හඟවන්නේයැයි කියා භික්ෂූහු උන්වහන්සේ කැටුවගොස් බුදුරජාණන් වහන්සේට ඒ බව සැල කළහ. එහිදී බුදුරජාණන්වහන්සේ මහණෙනි රහතන් වහන්සේ නමක් සිය අතින් දිවි තොර කරගන්නේ නැතැයි වදරා උන්වහන්සේ රහත් කෙනෙකු බව හෙළි කළහ.

මෙහිදී භික්ෂූන් වහන්සේලාට ගැටළු තුනක් ඇති විය. එකක් නම් රහත් වන්නට සිටි කෙනෙක් සසුනේ කළකිරුනේ මන්ද යන්න යි. ඊට හේතුව කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ සමයෙහි උන්වහන්සේ තමන් සමග මහණදම් පුරණ භික්ෂුවකගේ සිවුරු පිරිකට ආශාවෙන් උන්වහන්සේ උපැවිදි වෙන්නට පෙළඹවීම යි. දෙවන කරුණ නම් සර්පයා උන්වහන්සේට දෂ්ට නොකළේ මන්ද යන්න යි. ඊට හේතුව නම් ඒ සර්පයා පෙර ආත්මභාවයක උන්වහන්සේගේ දාසයෙකු වීම බව වදළහ. මේ හේතුව නිසා ම මුන්වහන්සේ පසුකලෙක සප්පදසතෙර නමින් ප්‍රසිද්ධ විය. තුන්වන කාරණය නම් උන්වහන්සේ රහත් වූයේ කෙසේ ද යන්නයි. දැළිපිහිය ගෙල තැබූ පමණින් උන්වහන්සේ රහත් වූයේ කෙසේද? මණෙනි, එද කාශ්‍යප බුදුරදුන් සමයේ මේ භික්ෂුව අවුරුදු විසිදහසක් මහණ දම් පිරීය. එය මේ ජීවිතයේදී රහත් වීමට උපනිඃශ්‍රය විය. කුසීත පුද්ගලයෙකුට පැවිදිව වසර සීයක් ගත කළත් මග ඵලයකට පත් විය නොහැකි ය. වීර්යවන්ත භික්ෂුව එක් පයක් ඔසවා බිම තබන්නට පෙර වුව ද රහත් විය හැකියැයි වදරා මේ ගාථාව දේශනා කළ සේක.

> "යො ච වස්සසතං ජීවෙ
> කුසීතො හීනවීරියො
> එකාහං ජීවිතං සෙය්‍යො
> විරියමාරභතො දළ්හං"

පදර්ථ:

**යො ච**, යම් කෙනෙක් වනාහී; **කුසීතො**, අලසව; **හීනවීරියො**, වීර්යයෙන් තොරව; **වස්සසතං ජීවෙ**, වසර සීයක් ජීවත් වනවාට වඩා; **දළ්හං විරියං ආරභතො**, ධ්‍යාන උපදවන තරම් දැඩි වීර්යයක් ආරම්භ කළ පුද්ගලයාගේ; **එකාහං ජීවිතං**, එක් දවසක් ජීවත් වීම; **සෙය්‍යො**, උතුම් ය.

විවරණය:

'**කුසීතො**' මෙහි කුසීතයෙක් හෙවත් අලසයෙක් යනු කාම විතක්ක හෙවත් පස්කම් සැපතෙන් තෘප්තිමත් වීමේ අදහසින් හෝ **ව්‍යාපාද විතක්ක** හෙවත් ද්වේෂ සහගත සිතිවිලිවලින් හෝ **විහිංසා විතක්ක** හෙවත් තමන්ටත් අනුන්ටත් පීඩාකාරී අහිතකර සිතිවිලිවලින් කල් ගෙවන පුද්ගලයා ය.

### 5.5.1.12 මරණ දුකින් මිදී සැනසුම ලත් පටාචාරාවෝ.

සැවැත් නුවර සතළිස් කෝටියක් ධනය ඇති සිටු මැදුරක ඉතා රූමත් දියණියක් වූවාය. මව්පියෝ ඇය සත්මහල් ප්‍රාසාදයක මතු මහලේ තබා රැක්කෝ ය. එහෙත් ඒ කුමරිය ඒ සිටු මැදුරේම සුළු සේවකයෙකු සමග පැන ගියා ය. එසේ ගොස් පළමු දරුවා ලැබෙන්නට සිටින අවස්ථාවේ ඇයට මව්පියන් වෙත යන්නට අවශ්‍ය විය. බිය පත් සැමියා ඊට අකමැති විය. ඇය සැමියාට හොර රහසේ නිවසින් පිටත් වූවා ය. ඒ බව සැළවූ සැමියා ඇය ලුහුබැඳ ගියේ ය. අතර මගදී දරුවා බිහි විය. ගමට යාමෙන් පලක් නැති බැවින් ඔවුහු පෙරලා නිවසට පැමිණියහ.

දෙවන දරුවා ලැබෙන්නට සිටියදීත් මේ ආකාරයෙන් ම සිදු විය. එදා ඇය ගියේ පළමු දරුවා ද රැගෙන ය. ඇය ලුහුබැඳ ආ සැමියාට ඔවුන් හමුවිය. ඒ මොහොතේම ඇයට දරුවා බිහිවීමේ ලකුණු පහළ විය. ඒ සමගම මහ වැස්සක පෙර නිමිති ද පහළ විය. ආවරණයක් තනාගන්නට කොළ අතු කඩන්නට ගිය සැමියා සර්පයෙකු විසින් දෂ්ට කරනු ලැබ මිය ගියේ ය. වැස්සේ ම දරුවා බිහිකළ ඇය. සැමියා මියගිය බව දැක දරු දෙදෙනා ද කැටුව ගමට යන්නට පිටත් වූවා ය. එම ගමනේදී ඇය අචිරවතී ගඟින් එතෙර විය යුතු විය. වැස්ස නිසා සැඩපහර දැඩි ය. දරු දෙදෙනා ම රැගෙන පීනාගත නොහැකි විය. එනිසා එදින උපන් කුඩා බිළිඳා ද රැගෙන එගොඩට ගිය ඇය ඔහු එගොඩ ඉවුරේ තබා අනෙක් දරුවා ගෙන යන්නට මෙගොඩට පීනුවා ය. ඇය ගඟ මැදට එද්දී මස් වැදැල්ලකැයි සිතූ උකුස්සෙක් අවුත් මොළකැටි දරුවා ඩැහැගෙන ගියේ ය. උකුස්සා එලවීමට ඇය දෑත් තලද්දී තමාට අඬගසනවා යයි සිතූ මෙගොඩ සිටි වැඩිමහල් දරුවා ගඟට බැස්සේ ය.

ඇයට දරුවන් දෙදෙනා ම අහිමි විය. මහත් ශෝකයෙන් වැලපෙමින් ඇය ගම බලා පිටත් විය. අතර මගදී සැවැත් නුවර සිට එන කෙනෙකුගෙන් දැනගන්නට ලැබුණේ පෙරදා මහා වැස්සෙන් සිටුමැදුර කඩා වැටී ඇයගේ මවත් පියාත් සහෝදරයාත් මිය ගිය බවයි. නුවරට ළං වන විට ඔවුන් දැවෙන සොහොන ද ඇය දුටුවා ය.

ශෝකයෙන් උමතු වූ ඇය ඇඳිවත වත් නොසලකා වියරුවෙන් නගරය පුරා දුවන්නට වූවා ය. ඇය පිළිබඳ තොරතුරු දත් මිනිස්සු ඇය බුදුරජාණන් වහන්සේ වෙත පිටත් කළහ. උමතුවෙන් ම දම් සභා මණ්ඩපය වෙත දිවගිය ඇයට බුදුරදුන් දුටු සැණින් සිහිය ලැබිණි. විලිබියෙන් ඇලළී ගිය ඇය බිම වැටී වකුටු වූවා ය. මිනිසෙක් ඇයට උතුරුසළුවක් දුන්නේ ය. අනතුරුව බුදුරජාණන් වහන්සේ ඇයට නොයෙක් ආකාරයෙන් සැනසීමට කරුණු වදාරා **''න සන්ති පුත්තා''** ආදී ගාථාවෙන් දහම් දෙසූ සේක. ඒ අසා ඇය සෝවාන් වූවා ය. නිරුවතින් හැසිරුණු නිසා එතැන් පටන් ඇය පටාචාරා නම් වූවා ය.

ඇය එක් දිනක් පැන් කෙණ්ඩියෙන් පැන් ගෙන පය දෝවනය කරමින් සිටියා ය. පළමුවන වර දැමූ ජලය මද දුරක් ගොස් නතර විය. දෙවැනිවර දැමූ වතුර තවදුරක් ගොස් නැවතුණේය. තෙවන වර දැමූ දිය වඩා දුර ගියේ ය. මෙය අරමුණු කරගත් ඕ තොමෝ සත්වයා ද මේ අයුරින් පළමුවෙනි වයසේදීත් මැද වයසේදීත් වයස අගදීත් මැරෙන්නේ යයි වටහා ගත්තා ය. මේ සිතුවිල්ල දුටු බුදුරජාණන් වහන්සේ ගඳකිළියේ වැඩ හිඳිමින් ම ආලෝකයක් පතුරුවා මේ ගාථාවෙන් දහම් දේශනා කර වදාළ සේක.

**''යො ච වස්සසතං ජීවෙ
අපස්සං උදයව්‍යයං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො උදයව්‍යයං ''**

**පදාර්ථ:**

**යො ච,** යම් කෙනෙක් වනාහි; **උදයව්‍යයං,** පංචස්කන්ධයාගේ ඇතිවීම හා නැති වීම; **අපස්සං,** නුවණින් නොදැක; **වස්සසතං ජීවෙ,** වසර සියක් ජීවත් වෙනවාට වඩා; **පස්සතො උදයව්‍යයං,** ඒ ඇති වීම හා නැති වීම දකින්නාගේ; **එකාහං ජීවිතං,** එක් දවසක් ජීවත් වීම; **සෙය්‍යො,** උතුම්ය.

**විවරණය:**

**'උදයව්‍යයං'** මේ ලෝකයේ පවතින සත්වයන් ඇතුළු ජීව අජීව සියලු දේ නිතර ම ඇති වී නැති වී යන සුළුය, සදාකාලිකව පවත්නා කිසිවක් නැත, ඉපදී පවතින තාක් කල් බොහෝ දෙනාට තමා පිළිබඳ ව හෝ ලෝකය පිළිබඳව මේ යථාර්ථය නොපෙනේ ඇසින් ම දුටුවත් කාමයට ඇති තණ්හාවත් සසරට ඇති තණ්හාවත් නිසා එය නුවණට නොපෙනේ. පටාචාරාව උමතුවන්නේ මේ සැබෑව නොපෙනුණු නිසා ය. මෙය නොදැක සසර දිගුකලක් දිව ආ ඇය මෙය දුටු සැණින් සසර කෙළවර කළා ය.

### 5.5.1.13 මළදරුවාට බෙහෙත් සොයාගිය මවක්.

සැවැත් නුවර මහ සිටුවරයෙකුගේ සතළිස් කෝටියක් ධනය කිසියම් පාපකර්මයක් නිසා එක්වර ම අඟුරු බවට පත් විය. සිදු වූ විපත උහුලාගත නොහැකි වූ සිටුවරයා නොකා නොබී වැලපෙමින් ඇඳක වැතිරී සිටියේ ය. ඒ බව දුටු ඔහුගේ නුවණැති මිතුරෙක් ආශ්චර්යයකින් සිදු වූ දෙයක් ආශ්චර්යයකින් ම විසඳෙනු ඇතැයි නිගමනය කොට අපූරු උපායක් යෝජනා කළේ ය. ඒ අනුව සිටුවරයාට කඩපිලේ වෙනත් අය නොයෙක් බඩු විකුණද්දී පැදුරක් එලා එහි අඟුරු දමා විකුණන්නැ යි මිතුරා කීවේය. එහිදී අඟුරු විකුණන්නේ මන්දැයි මිනිසුන් ඇසුවොත් තිබෙන දේ විකුණනවා මිස වෙන කුමක් කරන්න දැයි අසන්න. ඒ අතර කවුරුන් හෝ පැමිණ ඔබ රත්තරන් විකුණන්නේ මන්දැයි ඇසුවොත් කෝ කොහිදැයි අසා ඔහු හෝ ඇය අතින් ම ඒ රත්තරන් ගෙන භුක්ති විඳින්න යුවතියක් ඇසුවොත් ඇය ඔබගේ පුතුට ආවාහ කර දෙන්නැයි මිතුරා කීහ.

ඒ නුවර ම දුප්පත්ව ගිය සිටු කුලයක දුගී බව නිසා ම කෙට්ටු වී ගිය කුමාරිකාවක් වූවා ය. ගෝතමී නම් වු ඇය එතැන් සිට කිසාගෝතමී නම් වූවා ය. කඩපිලේ ඇවිදින ඇයට පෙනුණේ සිටුවරයා රත්තරන් විකුණන බව ය. ඇය වහා පැමිණ පියාණෙනි, ඔබ මේ රත්තරන් විකුණන්නේ මන්දැයි ඇසුවා ය. කෝ කොහිදැයි ඇසූ විට ඇය ඔහුගේ පැදුරේ තිබූ අඟුරු අරන් දුන්නා ය. ඇය දෙන දෙන අඟුරු රත්තරන් විය.

උපාය හරි ගියේ ය. සිටුවරයා ඇය සිය පුතුට ආවාහ කර දුන්නේ ය. එතැන් සිට සියලු රත්තරන් යථා තත්වයට පත්විය. කලකදී ඇය දරුවෙකු බිහි කළා ය. ඔහු දෙපයින් නැගී සිටින අවධියේ රෝගයකින් හදිසියේ මිය ගියේය. දරු සෙනෙහස නිසාත් දරුවන් මැරෙන බව නොදුටු නිසාත් ඇය පුතුට පිළියම් කරගැනීමට වෙදුන් සොය සොයා දිව්වා ය. දරුවා මිය ගිය බව කීවත් ඇය නොපිළිගත්තා ය. එයින් උමතු බවට පත් වූ ඇය දරුවා ඇකයෙහි හොවාගෙන නගරය පුරා දිව ගියා ය. මේ අතර මිනිසුන් විසින් ඇය බුදුරදුන් වෙත යවන ලදී. දෙව්රම් වෙහෙරට දිවගිය ඇය බුදුරජාණන් වහන්සේ දෙපා මුල දරුවා තබා තම පුතුගේ රෝගය සුවකර දෙන්නැයි ඉල්ලා සිටියා ය. එහිදී බුදුරජාණන් වහන්සේ කිසිවෙකු නොමළ ගෙයකින් අබ ටිකක් සොයාගෙන එන ලෙස ඇයට වදාළහ. ඇය නගරයේ ගෙයක් ගෙයක් පාසා ගියත් හැමතැනක ම අබ තිබුණි, එහෙත් කිසිවෙකු නොමළ ගෙයක් නම් හමු නොවී ය. මෙතෙකින් කරුණ වටහා ගත් ඇය පෙරළා, බුදුරදුන් වෙත පැමිණ තමාට ඇත්ත වැටහී ගිය බව පැවසුවා ය. එහි දී බුදු රජාණන්වහන්සේ ''**තං පුත්ත පසු සම්මත්තං**'' ආදී ගාථාවෙන් දහම් දෙසූහ, කිසා ගෝතමිය සෝවාන් වූවා ය. භික්ෂුණීන් අතර පැවිදි වූ ඇය දිනක් පොහොය ගෙයි පහන දල්වා ඒ පහන් දැල්ල දෙස බලා සිටියා ය. එහිදී ඒ ගිනිදැල් සියුම්ව බිඳී බිඳී උපදින සැටි පෙනිණි. බුදුරජාණන් වහන්සේගේ ඒ අරමුණෙහි සිත රඳවා සිටි ඇයට ගඳකිළියේ සිටම ආලෝකයක් පතුරුවා ගෝතමියනි, මේ ගිනිදැල් සේම සත්වයා උපදිති, මැරෙති, නිවනට පත්වූවෝ පමණක් නැවත නූපදිතියි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

''**යො ච වස්ස සතං ජීවෙ
අපස්සං අමතං පදං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො අමතං පදං**''

**පදාර්ථ:**

**යො ච**, යම්කෙනෙක් වනාහි; **අමතං පදං**, නොමැරෙන, තැන හෙවත් නිවනින් නිවීම; **අපස්සං**, නොදක; **වස්ස සතං ජීවෙ**, අවුරුදු සීයක් ජීවත් වෙනවාට වඩා; **අමතං පදං පස්සතො**, සතර මාර්ග ඥාණය හෙවත් නිවන් පදය දකින්නාගේ; **එකාහං ජීවිතං**, එක් දවසක ජීවිතය; **සෙය්‍යො**, උතුම්ය.

**විවරණය:**

''**අමතං පදං**'', අමත යනු නොමැරෙන යන තේරුමයි. මරණය යනු පංචස්කන්ධයේ පැවැත්ම අවසන් වීමයි. මැරෙන්නේ සාමාන්‍ය පෘථග්ජනයන් ය. ඔවුන් ජීවත් වුවත් මළා වැනියයි. (''**යෙ පමත්තා යථා මතා**'') සඳහන් වේ. පෘථග්ජනව මැරෙන සියල්ලෝ නැවත උපදිති. ඒ නිසා මැරෙන්නේ රහත් නොවූ අයයි, රහත්ව ජීවිතය අවසන් වීමට මරණය යයි කියන්නේ නැත. එය පිරිනිවන් පෑමයි. නිරුපධිසේස පරිනිර්වාණය කියන්නේ එයයි. ඒ නිසා නිවන නැවත නොමැරෙන බැවින් අමත පදය යයි කියනු ලැබේ.

## 5.5.1.14. දූ දරුවන් තුදුසක් සිටියදීත් අසරණ වූ මව

සැවැත් නුවර එක් පවුලක පුත්තු සත්දෙනෙක් මෙන් ම දූවරු සත්දෙනෙක් ද වූහ. කලකදී ඔවුන්ගේ පියා කළුරිය කළේ ය. දැන් මුළු ධනය ම පාලනය කරන්නේ මවයි. මේ අතර දරුවෝ මෑණියෙනි, මුළු ධනය ඔබ සතුව තබාගෙන සිටින්නේ ඇයි. අප ඔබට සළකනවා නොවේ ද ඒ ධනය අපට බෙදා දෙන්නැයි කීහ. මව ද එකී පරිදි ධනය දරුවන් අතර බෙදා දුන්නා ය. එතැන් සිට දරුවන්ගෙන් යැපෙන්නට ගිය ඇයව ලේලිවරුන් විසින් පමණක් නොව දියණිවරුන් විසින් ද නොසලකා එලවා දමනු ලැබී ය.

අන්තිමේදී මෙහෙණවරකට ගොස් පැවිදි වූ ඇය බහුපුත්තිකා තෙරණිය නමින් ප්‍රකට වූවා ය. ඉතා උනන්දුවෙන් මහණ දම් පුරණ එතුමිය දවල් දවස සෙසු භික්ෂූණීන්ගේ වතාවත් කොට රාත්‍රියෙහි භාවනාවෙහි යෙදෙයි. තමා මහලු බැවින් ඇදවැටේ යයි යන බියෙන් කණුවක් අල්ලාගෙන ඒ වටා යමින් භාවනා කරයි සක්මන් මළුවේ ද කළුවරේ ගස්වල හැපේයැ යි බියෙන් ගසක් අල්ලා ගෙන ඒ වටා යමින් භාවනා කරයි මේ සිදුවීම දුටු බුදුරජාණන් වහන්සේ ගඳකිළියේ වැඩ සිටිමින් ම ආලෝකයක් පතුරුවා ඇය අමතමින් මේ ගාථාව දේශනා කළහ.

"**යො ච වස්ස සතං ජීවෙ
අපස්සං ධම්මමුත්තමං
එකාහං ජීවිතං සෙය්‍යො
පස්සතො ධම්මමුත්තමං** "

**පදාර්ථ: යොච,** යම් කෙනෙක් වනාහි; **උත්තමං ධම්මං අපස්සං,** නව ලෝකෝත්තර ධර්මය නොදැක; **වස්සසතං ජීවේ,** වසර සීයක් ජීවත්වෙනවාට වඩා; **උත්තමං ධම්මං,** ඒ උතුම් ධර්මය; **පස්සතො,** දකින්නාගේ; **එකාහං ජීවිතං,** එක් දවසක ජීවිතය වුවද; **සෙය්‍යො,** උතුම් ය.

**විවරණය:**

"**ධම්මමුත්තමං**" නවලෝකෝත්තර ධර්මයයි. එනම් සතරමග සතර ඵල හා නිවනයි. එය නොදැක සසර පුරා ඇවිදීම මහ අනුවණ දුක්ඛිත කාර්යයකි. නව ලොව්තුරු දහම දුටු කෙනෙකුට නැවත ජීවිතයේ ගතයුතු පලක් නැත. එනිසා ඔහුට එක් දවසක් ජීවත් වුවත් කමක් නැත.

**අභ්‍යාස**

01. මෙහි එන කතාපුවතක සිදුවීමක් තෝරාගෙන වාර්තාවක් ලියන්න.
02. සහස්ස වග්ගයේ කියැවෙන ධර්ම කාරණා ලැයිස්තු ගත කරන්න.
03. සහස්ස වග්ගය ඇසුරින් ධර්ම දේශනාවක් නිර්මාණය කර ශිෂ්‍ය සමිතියට ඉදිරිපත් කරන්න.

19
පාඩම

# පාපය නම් බිහිසුණු ය
## (පාප වග්ගය)

## කුමට ද කුසලට කම්මැලි වන්නේ

සියලු පව් නොකිරීමත් කුසල් වැඩි දියුණු කර ගැනීමත් සිත පිරිසිදු කර ගැනීමත් සිදු කළ යුතුය යන්න බුදුරජාණන් වහන්සේලාගේ අනුසාසනාව යි. සත්වයා පාපයට නැඹුරු වීම වැඩි ආයාසකින් තොරව බොහෝ විට ඉබේම සිදු වේ. මේ නිසා පාපය කුමක් දැයි හඳුනාගෙන නිතරම එයින් ගැලවීමට වෑයම් කළ යුතු ය.

පාපය යනු කුමක් ද? එහි විපාක කවරේ ද යන්න, බුදු දහමෙහි නිතර විස්තර කෙරේ. ධම්මපදයේ යමක වර්ගය සහ තවත් තැන්වල පාපය ගැන දෙසූ දහම් රැසක් දක්නනට ලැබේ විශේෂයෙන් පාපය ගැන ම කියවෙන දහම් පද කිහිපයක් පාප වර්ගයෙහි අඩංගු වේ.

පාපය වළක්වා ගැනීම කළ යුත්තේ නිතර කුශලයෙහි යෙදීමෙන් ය. පාපය දුක් ගෙන දෙන්නකි. ඒ නිසා පාපය බහුලව නොකළ යුත්තකි. පව් කරන්නාට එය කරන අවස්ථාවේ එහි බරපතල කම නොවැටහේ. එය වැටහෙන්නේ විපාක දෙන දවසටය. මේවා සුළු සුළු පව් යැයි කියා පාපය නොසලකා නොහැරිය යුතු ය. සුළු සුළු පව් රැසක් ගොඩ ගැසීමෙන් මහ පව්කාරයෙක් වෙයි. පාපය හලාහල විෂක් සේ බැහැර කළ යුත්තකි. පව් කරන්නාට එහ විපාකයෙන් ගැලවීමට නම් ලොව කිසිදු ක්‍රමයක් නැත්තේය යනාදී පාපය පිළිබඳ කරුණු ගාථා දහතුනක් මෙහි එයි.

## 5.5.2.1 තිබුණු එකම සළුව පුදා සබ්බචතුක්කය දිනූ දුගියා.

සැවැත් නුවර චූල ඒකසාටක නම් දුගී බමුණෙක් විසී ය. එම බමුණාටත් බැමිණියටත් ගෙයින් පිටත යාමේ දී උඩුකය වසා ගන්නට තිබුණේ එක ම උතුරු සළුවකි. එම බමුණා ද ඒක සාටක නමින් ප්‍රසිද්ධ වූයේ ඒ නිසා ය. මේ බමුණු දෙමහල්ලෝ ම තුනුරුවන් කෙරෙහි ඉතා සැදැහැතියෝ වූහ. දිනක් බුදුරදුන් දෙව්රම් වෙහෙරෙහි දහම් දෙසන දවසක හවස් වරුවේ බැමිණිය සළුව පොරවාගෙන වෙහෙරට ගොස් බණ අසා පැමිණියා ය. බමුණා රාත්‍රියේ සළුව පොරවාගෙන බණ අසන්නට ගියේ ය.

බුදුරදුන් ඉදිරිපිට ම ඉදගෙන බණ අසන ඔහුට මහත් ප්‍රීතියක් ඇති විය. කුමන හෝ දෙයක් හෝ පුදන්නට සිතුනත් ඔහු සතුව තිබුණේ එක ම සළුව පමණකි. එය පිදුව හොත් දෙදෙනාට ම වන පාඩුව ගැන සිතා බමුණා ඒ අදහස යටපත් කර ගත්තේ ය. රාත්‍රිය ප්‍රථම යාමය ගෙවුනි. දෙවන යාමයේ දී ද එම අදහස නැවත පහළ වූ නමුත් එවර ද එය යටපත් කර ගත්තේ ය. දැන් රාත්‍රියේ පශ්චිම යාමය යි. නැවත නැවත පිදීමේ අදහස මතුවෙ යි. අන්තිමේ දී සැදැහැ සිත ඇති වූ සැණින් ම මසුරුකම යටපත් කරගෙන සළුව ගලවා නවා

පොත් කොට වහා ගෙන ගොස් බුදුන් පාමුල පිදුවේ ය. ඔහුගේ ප්‍රීතිය නිම් හිම් නැතිව ගියේ ය. මම දිනුවා මම දිනුවා යැයි මහ හඬින් කෑගැසී ය.

බණ අසමින් සිටි කොසොල් රජුට ඒ හඬ ඇසී රාජ පුරුෂයන් ලවා දිනුවේ කවුද යි විමසා බැලී ය. එවිට මේ බමුණාගේ ක්‍රියාව ගැන දැනගත් රජතුමා ඔහු කර ඇති ඉතා අපහසු ක්‍රියාව දැක ඔහුට රජගෙදරින් සළු යුවලක් ම ගෙන්වා දෙවී ය. ඒවා ද බමුණා බුදුරදුන්ට පිදී ය. නැවත සළු හතරක් දෙවී ය. ඒවා ද පිදී ය. මෙසේ අටක් දොළහක් ආදී වශයෙන් දෙගුණ කොට දෙමින් අවසානයේ සළු තිස් දෙකක් දෙවී ය. රජතුමා අපහසුවකට පත් නොකළ යුතු යැ යි සිතූ බමුණා එයින් දෙකක් තබා ගෙන අන් සියල්ල බුදුන්ට පිදී ය.

එදා රජ ගෙදරට ගිය රජතුමා බමුණා කෙරෙහි ඇති වූ ප්‍රසාදය නිසා ඔහුට ඉතා අගනා කම්බිලි දෙකක් තෑගිකර යැවී ය. ඒවා ද තමාට නොගැලපේ යැ යි සිතූ බමුණා ඉන් එක් බුදුරදුන්ගේ ගඳ කිළයේ ද අනෙක තම නිවසේ සංඝයා වැඩ සිටින තැන ද උඩු වියන් ලෙස බැන්දේ ය. බුදුන් බැහැ දකින්නට ගිය විටෙක ගඳ කිළියේ තිබූ වියන හඳුනාගත් රජතුමා එය බමුණා පිදූ බව අසා වඩාත් පැහැදී ඔහුට ස්ත්‍රීන් දාසි දසුන් ඇතුන් අසුන් සහ ගම්වර ද යන සියල්ල හතර බැගින් පරිත්‍යාග කළේ ය. එය සබ්බචතුක්ක ත්‍යාගය නම් විය.

එදා දම්සභාවට රැස්වූ භික්ෂූන් වහන්සේලා අතර කතාබහට ලක් වූයේ මේ ඒක සාටක බමුණාගේ පූජාවත් එයින් ඔහු ලැබූ විපාකයත් පිළිබඳ ව ය. එවේලේ එහි වැඩි බුදුරජාණන් වහන්සේ මහණෙනි, මේ බමුණා සිතුණු පළමුවෙනි අවස්ථාවේ දීම සිය මසුරු කම යටපත් කර ගෙන මේ සළුව පිදුවේ නම් ඔහුට සියල්ල සොළොස බැගින් ලැබෙන්නේ ය. දෙවන යාමයේ පිදුවේ නම් සියල්ල අට බැගින් ලැබෙන්නේ ය. සියල්ල සතර බැගින් ලැබුණේ මසුරු කම කම මැඬගන්නට ප්‍රමාද වූ නිසා ය. ඒ නිසා පින්කමක් කරන විට ප්‍රමාද නොවිය යුතු ය. පසුබසින තරමට විපාකය ද හීනවන්නේ යැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

> "අභිත්ථරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ
> දන්ධංහි කරොතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො "

පදාර්ථ:

**කල්‍යාණෙ,** දාන සීල ආදී යහපත් කයුතුවල දී; **අභිත්ථරෙථ,** යුහුසුළුව කළ යුතු ය; **චිත්තං පාපා නිවාරයෙ,** සිත අකුසල සිතිවිලිවලින් හා අකුසල ක්‍රියාවන්ට යොමු වීමෙන් වළකා ගත යුතු ය; **දන්ධංහි පුඤ්ඤං කරොතො,** කරම් ද නොකරම් දැ'යි පසු බාමින් පින් කරන්නාගේ; **මනො පාපස්මිං රමති,** සිත ලෝභකම් මසුරුකම් ආදී පාපයන්හි ඇලෙන බැවිනි;

**විවරණය:**

සිත රාගාදී කෙලෙසුන්ගෙන් මුසුවී පවතින්නකි. එවා තදංග වශයෙන් යටපත් වී ශ්‍රද්ධාවක් මතුවන්නේ ඉතා කලාතුරකිනි එය සඳ වළාකුලින් මිදුණු අවස්ථාවක් වැනි ය. සතුටින් පින්කමක් කරන්ට හිත දුන් විට ම එය කළ යුතු ය. ප්‍රමාදවන විට අඳුරුවළා පැමිණ යළි සඳ වැසෙන්නා සේ කෙලෙස් මතු වී සිත වසාගන්නේ ය. සිතුණු විගස ම කරන පින අභිධර්මයට කරන පින අනුව **අසංඛාරික ය** එහි විපාකය බලවත් ය. නොකර බැරි තැන කිරීමේ දී පහළවන සිත **සසංඛාරිකය** එය තම සිතෙන් ම ලද තල්ලුවකින් කෙරෙන්නක් නිසා ය. ඒ දුර්වල සිතේ විපාකය ද දුර්වල වන බවට මෙම කථාපුවත සාක්ෂි දෙයි.

## 5.5.2.2 පව් සියයට දුක් සියයකි.

ලාලුදායී මහතෙරුන්ගේ අත වැසි වූ සෙය්‍යසක නම් හිමි නමක් විය. උන්වහන්සේ මහණකම් කළත් එය කළේ ආසාවකින් නොවේ. උන්වහන්සේගේ සිත නිතර ම රාගයෙන් ඇවිලී යයි. ඒ නිසා සිවුරු හැර යාමට සිතුණු වාර අනන්ත ය. මේ කාරණය පිළිබඳව වෙනත් නො හික්මුණු කෙනෙකු දුන් පව්ටු උපදේශයක් පිළිගත් උන්වහන්සේ දැන දැන උපක්‍රමයෙන් ශුක්‍ර මිදවීමේ පාපකර්මය කළේ ය. මේ පිළිබඳ ව දැන ගත් බුදුරජාණන් වහන්සේ සෙය්‍යසක හිමියන් ගෙන්වා විමසා උන්වහන්සේ වරද පිළිගත් කල්හි දැඩිසේ අවවාද කොට ප්‍රථම සංඝාදිසේසාපත්තිය පනවා වදාළ සේක. අනතුරුව ඒ නිමිති කොට මේ ගාථාවෙන් ධර්ම දේශනා කළ සේක.

**''පාපං චෙ පුරිසො කයිරා න තං කයිරා පුනප්පුනං**
**න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො''**

**පාදාර්ථ:**

**පුරිසො,** කිසියම් පුද්ගලයෙක්; **පාපං කයිරා,** පාපයක් කරන්නේ වේ ද; **තං,** එය; **න කයිරා පුනප්පුනං,** යළි යළිත් නොකළ යුතු ය; **තම්හි,** ඒ පාපය කෙරෙහි; **ඡන්දං න කයිරාථ,** කැමැත්ත ඇති කර නොගත යුතු ය; **පාපස්ස උච්චයො,** පව් වැඩි වීම; **දුක්ඛො,** මහාදුකකි;

**විවරණය:**

අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රයේ ඉගැන්වෙන පරිදි පාපයක් කිරීමට පෙර, කරන විට, කිරීමෙන් පසු යන අවස්ථා තුනෙන් කවර අවස්ථාවක හෝ ඒ පිළිබඳ ආපසු හැරී බැලිය යුතු ය. එය කිරීමෙන් වන හානිය සලකා බැලිය යුතු ය. කෙනෙකුට ආවේගය නිසා හෝ නොදැනුවත් කම නිසා හෝ වෙනත් කරුණක් නිසා පවක් කරන්නට සිදු වුවත් ඒ ගැන සිතා බලා නැවතත් එවැනි දේ නොකරන්නට වග බලා ගත යුතු ය. පාපය අනිවාර්යයෙන් දුක් විපාක දෙන්නේ ය. එක පවකින් දුක් විපාක එකකි. එකම පව කරන වාර සියයකට දුක් විපාක සියයකි.

### 5.5.2.3 පින් යැයි කියා නුසුදුසු දේ නොකළ යුතු ය.

මහා කාශ්‍යප මහරතහන් වහන්සේ වරක් නිරොධ සමාපත්තියෙන් සත් දිනක් ගෙවා සත්වන දා ඉන් නැගී පිඬු පිණිස කොහි වඩින්නේ දැයි සලකා බැලූහ. එවිට හැල් කෙතක් රකින සැදැහැත්තියක දැක ඇයට වන යහපත සලකා එම කෙත අසලින් පිඬු පිණිස වැඩියහ. එවේලේ ඇය සිටියේ වී පොරි සකසමිනි. තෙරුන් දැක ප්‍රීතියෙන් පිනා ගිය ඇය වහා දිව ගොස් පොරිවලින් පාත්‍රය පුරවා පුදා ඔබ වහන්සේ අත් කරගත් නිවන් සුව ලබන්නට මටත් හැකිවේවා යි පැතුවා ය. තෙරුන්වහන්සේ ද එසේ ම වේවා යි පින් අනුමෝදන් කොට වැඩියහ. දන් පුදා ආපසු එන ඇයට සර්පයෙක් දෂ්ට කළේ ය. එතන ම ඇද වැටී පිනෙන් පිනා ගිය සිතින් ම මිය ගිය ඇය තව්තිසා දෙව් ලොව උපන්නා ය. එහිදී ලාජා දෙවඟන නමින් ඇය ප්‍රකට වුවා ය. ලාජ යනු විළඳවලට කියන නමකි.

තමාට මේ සා මහත් සැපතක් කෙසේ ලැබුනේ දැයි බැලූ ඇයට මෙතරම් සුලු පින්කමකින් මෙතරම් සැපතක් ලැබුනේ නම්. තව තවත් පින් කොට එම සැප තහවුරු කර ගත යුතුයැයි සිතුණි. ඒ අනුව දිනපතා ම ඇය කසුප් තෙරුන් වැඩසිටින වෙහෙරට ගොස් මිනිස් වෙසින් මළු පෙත්මං හැමදීම් පැන් පෙරා තැබීම් ආදී වතාවත් සිදු කරන්නට පටන් ගත්තා ය. දෙතුන් දිනක සිට මේවා කරන්නේ කවුද යි බැලූ තෙරුන්ට ඇය දක්නට ලැබුණි. ඔබ කවුදැයි ඇසූ විට තමා එදා විළඳ පුදා මිය ගිය ලාජා දෙවඟන බව කීවා ය. මේ කුමක් කරන්නේ දැයි ඇසූ විට එය සුළු පින්කමකි. බොහෝ පින්කම් කොට ලද සැපත තහවුරු කරගන්නට ආවෙමි යි කීවා ය. එවිට තෙරුන්වහන්සේ ඔබ කර ඇත්තේ නො කටයුත්තකි. දෙවඟනක් මගේ වතාවත් කරන්නී යැයි කියා මිනිසුන් දොස් කියනු ඇත. ඒ නිසා මින් මතු මෙහි නො එන්නැයි ඇය පළවා හැරියහ. පිනට ම ලැදි වූ ඇය එතනින් ඉවත් ව අහසට නැගී හඬා වැළපෙමින් සිටියා ය. මේ සිදු වීම දිවසින් දුටු බුදුරජාණන්වහන්සේ ගඳකිලියේ සිට ම දෙව් දුව අමතා දෙව්දුවනි, මා පුත් කාශ්‍යපට සංවරය වැදගත් ය. පින් කරන අය කරුණු සලකා සුදුසු දේ පමණක් කළ යුතු යැයි වදාරා මේ ගාථාවෙන් දහම් දෙසූහ.

> "පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථෙතං පුනප්පුනං
> තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො"

**පදාර්ථය:**

**චෙ**, ඉදින්; **පුරිසො**, කිසියම් පුද්ගලයෙක්, **පුඤ්ඤං කයිරා**, පින් කරනවිට; **එතං**, එය; **පුනප්පුනං කයිරාථ**, නැවත නැවත කළ යුතු ය; **තම්හි ඡන්දං කයිරාථ**, ඒ පිනට ම කැමැත්ත ඇති කර ගත යුතු ය; **පුඤ්ඤස්ස උච්චයො**, පින්වැඩි වීම; **සුඛො**, සැපයක් වන බැවිනි;

**විවරණය:**

මෙහි දී බුදුරජාණන්වහන්සේ ලාජා දෙවඟනට අවවාද කරන්නේ පින් කරනවා යැයි කියා නුසුදුසු දේ නොළ යුතු බව ය. සුදුසු පින්නම් කොතෙක් කළත් වරදක් නැතැයි දෙවගන සිතූ සිතුවිල්ලම මෙහිදී අගේ කොට වදාරා ඇත.

### 5.5.2.4 සැපත ගෙන දෙන පිනක අසිරිය.

අනේපිඬුසිටුතුමා දෙව්රම් වෙහෙර උදෙසා පමණක් පනස් හතර කෝටියක ධනය වැය කළේ ය. දිනපතා තෙවරක් බුදුරජාණන් වහන්සේ උපස්ථානයට යයි. යන විට කුඩා සාමණේර හිමිවරුන්ට කුමන හෝ රස කැවිල්ලක් ගෙන යයි. ගෙදර දිනපතා පන්සියයකට දානය සූදානම් ව තිබේ. මෙසේ පින්දහමින් ම ගත වූ සිටුතුමාගේ ධනය ක්‍රමයෙන් පිරිහී ගියේ ය. ගණුදෙනුකරුවන් ගත් ණය පමණක් අටළොස් කෝටියක් විය. ගං ඉවුරේ නිදන් කොට තිබූ අටළොස් කෝටියක් ධනය මුහුදට ගසාගෙන ගියේ ය. මෙසේ ධනය පිරිහී තිබියදීත් සිටුතුමා දිගට ම සංඝයාට දන්දීම කළේ ය. එහෙත් ප්‍රණීතව නොවේ. මේ බව දැනගත් බුදුරජාණන් වහන්සේ ගෘහපතිය, ඔබ තවමත් දන් දෙන්නේද යි ඇසූහ. එසේ ය ස්වාමීනි, එහෙත් දැන් මිහිරි ලෙස දන් දීමට නොහැකි ය. නිවුඩු හාලේ බත කාඩි හොදි සමග ඉතා රූක්ෂ ලෙස දන්දෙන්නට සිදුවී ඇතැයි කීය. එවිට උන්වහන්සේ ගෘහපතිය, එය රූක්ෂ ප්‍රත්‍යයකැයි නොසිතන්න. දායකයාගේ සිත ප්‍රසන්න නම් බුද්ධාදී උතුමන්ට ඔහුගේ දානය කුමක් වුවත් රූක්ෂ නොවේ. මා වේලාම බ්‍රාහ්මණව සිටි කාලයේ මහ දන් දුන් නමුත් තෙරුවන් සරණ ගිය ප්‍රතිග්‍රාහකයෙක් වත් සොයාගත නොහැකි විය. ඔබට ඒ දුර්ලභ ප්‍රතිග්‍රාහක ලාභය ලැබී ඇත. එනිසා දානයේ රූක්ෂ බව නොසිතන්නැ යි කියා වේලාම සූත්‍රය දේශනා කළහ.

මේ අතර එතුමාගේ මැදුරු දොරටුවෙහි අධිගෘහිත දෙව්දුවක් සිටියා ය. නිතර බුදුරදුන් හා රහතන්වහන්සේලා වැඩම වීම ගැන ඇය සිටියේ නො සතුටිනි. එනිසා සිටුතුමා මේ කටයුතුවලින් වලක්වන්නට අවස්ථාව මෙය යැයි සිතූ ඇය දිනක් සිටුතුමාට අවවාද කරමින් මහ සිටුතුමනි, ඔබ තමාගේ අවසාන කාලය ගැන නො සිතා ගෞතම ශාසනය විෂයෙහි මහ ධනයක් කැප කළේ ය. දැන් ඔබ ධනයෙන් පිරිහී ඇත. තවදුරටත් ඔවුන්ට ධනය වැය කරන්නේ ඇයි? වැඩිපුර කරන පරිත්‍යාග නවතා තම පවුල රැකබලා ගන්නැ'යි කීවා ය. එයින් සංවේගයට පත් සිටුවරයා නුඹ වැනි කෙනෙක් මා වැන්නෙකුගේ නිවසෙහි සිටීම නුසුදුසු යැයි කියා වහා ම මැදුරෙන් පළවා හැරියේ ය.

යනඑන මං නැති වූ ඇය තමාට වූ විපත ගැන නගරාරක්ෂක දෙව්පුතුටත් එතැනින් සතරවරම් දෙවිවරුන්ටත් කීය. පලක් නොවූ තැන සක් රජුට ම සැලකර සිටියා ය. එවිට ඇය කළ අපරාධය කුමක්ද යි විමසූ සක්දෙවිඳු මටවත් ඔබ වෙනුවෙන් සිටුතුමාට කරුණු කියන්නට නොහැකි යැ යි කියා උපායක් කීය. එනම් අයකැමියෙකුගේ වෙසින් ගොස් ගණුදෙනුකරුවන්ගෙන් අටළොස් කෝටියක ණය රැස්කර දීමත්, තම ආනුභාවයෙන් මහ මුහුදට ගිය ධනයත් ගෙනවුත් සිටුතුමාගේ අටුකොටු පිරවීමත් ය. ඇය ඒ සියලු දේ ඉටුකොට සිටුතුමා වෙත ගොස් තමා කළ අපරාධයට සමාව අයැද සිටියා ය. ඇය සමාව කරවාගත යුත්තේ තමා නොව බුදුරදුන් යැයි සිතූ සිටුතුමා ඇය උන්වහන්සේ වෙත කැඳවාගෙන ගියේ ය. එහිදී දෙව්දුව බුදුරදුන් සමා කරවා ගෙන සිටුතුමා ද සමා කරවා ගත්තෝ ය. අනතුරුව බුදුරජාණන් වහන්සේ කළ කුසල් පිළිබඳ ව සිටුතුමාටත් කළ වරද පිළිබඳ දෙව්දුවටත් අවවාද කරමින් මේ ගාථාව දේශනා කළ සේක.

''පාපොපි පස්සති භද්‍රං යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති''

''භද්‍රොපි පස්සති පාපං යාව භද්‍රං න පච්චති
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රො භද්‍රානි පස්සති''

පදාර්ථය:

**යාව පාපං න පච්චති,** පාපය නොපැසවන තුරු; **පාපො අපි,** පව් කරන්නා ද; **භද්‍රං පස්සති,** තමා සුඛිතයෙකැයි දකී; **යාදා ච,** යම් කලෙක වනාහි; **පාපං පච්චති,** පාපය පැසවයි ද; **අථ,** එවිට; **පාපො,** පව් කරන්නා; **පාපානි පස්සති,** තමා කළ පව්කමේ තරම දකී.

පදාර්ථය:

**භද්‍රොපි,** කුසලයෙහි නියතු යහපත් පුද්ගලයා ද; **යාව භද්‍රං න පස්සති,** එම කුසලය නොපැසවන තුරු; **පාපං පස්සති,** තමා දුක්ඛිතයෙකැයි දකී; **යාදා ච,** යම් කලෙක වනාහි; **භද්‍රං පච්චති,** කුසලය පැසවයි ද; **අථ,** එවිට; **භද්‍රො,** පින්වතා; **භද්‍රානි පස්සති,** තමා කළ කුසලයේ තරම දකී.

විවරණය:

**න පච්චති,** යනු පව හෝ පින විපාක නොදෙන තුරු යන අදහසයි. ''භද්‍රං පස්සති'' යනු පෙර කළ පිනෙන් ජීවත් වෙමින් පව් කරන පුද්ගලයා පාපය විපාක දෙනතුරු සිතන්නේ තමාගේ සැපත නැති කරන්නට කිසිවෙකුට බැරි ය. තමාට වරදින්නේ නැත කියා ය. අදත් පව්කම් කරන බොහෝ දෙනා එසේ සිතා සිටිති. ඔවුන් කළ පාපයේ තරම ඔවුන්ට පෙනෙන්නේ එය විපාක දෙන විට ය. ''**භද්‍රොපි පස්සති පාපං**'' යනු පින් දහම් කරන දුගී දුප්පත් අය සමහර විට සිතන්නේ අප කොයිතරම් පින්දහම් කළත් මේ දුක නම් ඉවරයක් නැත කියා ය. ඔවුන් තමා කළ පිනේ මහිමය දකින්නේ තමා කළ පින් පලදෙන විට ය.

## 5.5.2.5 අකුසලය සුළුය විපාක නො දේ යැයි අවමන් නොකළ යුතු ය.

දෙව්රම් වෙහෙරෙහි සිවුරු පිරිකර පිළිබඳ අරපරිස්සමක් නැති භික්ෂූන් වහන්සේ නමක් විසුවේ ය. උන්වහන්සේ වැලේ දමූ සිවුරු වේළුණු පසු නමා තැන්පත් කරන්නේ නැත. දින ගණන් සති ගණන් වැලේ ම තිබී වැටී විනාශ වී යයි. පරිහරණය සඳහා බැහැරට ගන්නා ඇඳ පුටු ආදී භාණ්ඩ කිසිවිටෙක නිසිතැන තැන්පත් කොට තබන්නේ නැත. ඒවා ද අව්වේ වේලී වැස්සට තෙමී වේයන් කා විනාශ වී යයි. සෙසු භික්ෂූන් වහන්සේලා, ඇවැත්නි, මේ උපකරණ ප්‍රවේශම් කර තැබිය යුතු නොවේද යි කියන විට එය මහ ලොකු දෙයක් ද? ඒවාට සිත්පිත් නැතැ යි කියා එලෙස ම කටයුතු කරයි. භික්ෂූන් වහන්සේලා මේ බව බුදුරදුන්ට දන්වූහ. එම භික්ෂුව කැඳවූ බුදුරජාණන් වහන්සේ එය සැබෑදැයි විමසූ විට ඒ

භික්ෂුව එහිදී ස්වාමීනි, මම ලොකු වරදක් කළේ නැත. ඒවාට හිත්පිත් නෑ නොවේදැයි කියා තමා කළ වරද ලඝු කොට කතා කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ මහණ පාපය සුළු යැයි නොසලකා නොහැරිය යුතු යැ යි වදාරා මේ ගාථාව දේශනා කර වදාළ සේක.

**''මාප්පමඤ්ඤෙථ පාපස්ස**
**න මං තං ආගමිස්සති**
**උදබින්දු නිපාතෙන**
**උදකුම්භොපි පූරති**
**පූරති බාලො පාපස්ස**
**ථොක ථොකම්පි ආචිනං''**

**පදාර්ථය:**

**න මං තං ආගමිස්සති,** (මා කළ වරද සුළුය) එය මට විපාක නොදෙනු ඇතැයි; **පාපස්ස,** පාපයට; **මා අප්පමඤ්ඤෙථ,** සුළුයැයි සලකා අවමන් නොකළ යුතු ය; **උදුබින්දු නිපාතෙන,** දිය බිංදුව බැගින් වැටීමෙන්; **උදකුම්භොපි,** දිය කළයක් වුව ද; **පූරති,** පිරේ; **පාපස්ස,** පාපයාගේ; **ථොක ථොකම්පි ආචිනං,** ටික ටික වුවත් රැස් කිරීමෙන් වුව ද; **බාලො,** බාලයා; **පූරති,** පවින් පිරී යන්නේ ය;

**විවරණය:**

''**මාප්පමඤ්ඤෙථ පාපස්ස**'' පාපය සුළුයැ යි නොතකන්න යනුයි. බොහෝ දෙනා වැරදි සුළුයැ යි කියා නොසලකා හැරීම සිරිතකි. එහෙත් බුදුරජාණන් වහන්සේ, ''**අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී**'' ඉතා කුඩා වරදේ වුවත් භය දක්නා සුලු විය යුතු ය. ''**න ච ඛුද්දංසමාචරෙ කිඤ්චි**'' කුඩා වරදක්වත් නොකළ යුතු ය. යනාදී දේශනාවලින් වදාරා ඇත්තේ සුළු වරදක්වත් නොකළ යුතු බව ය. සුළු වරදට බිය නැති පුද්ගලයා එවැනි වැරදි නිතර කරයි. එවිට ඔහු ක්‍රමයෙන් වරදින් පිරුණු කෙනෙක් වෙයි. ඔහු විපාක ලබන විට නිතර සුළු සුළුවෙන් හෝ දුක් ගෙන දේ. කිසිදිනෙක සුවසේ සිටිය නොහැක. දිය කළයක් සේ ඔහු පාපයෙන් පිරී යතැයි කීවේ එනිසා ය.

### 5.5.2.6 පුංචි වූ දෙයක් දුන්නත් විපාක පුංචි නැත.

එක් සමයක සැවැත් නුවර වැසියෝ කණ්ඩායම් ගැසී බුද්ධ ප්‍රමුඛ සංඝයාට දන් දෙති. එක් දවසක් බුදුරජාණන්වහන්සේ දන් වළඳා අවසානයේ පින් අනුමොදන් කරන සේක් මෙසේ වදාළහ. ''උපාසකවරුනි මෙලොව කෙනෙක් තමන් දන් දෙයි. අනුන් සහභාගී කර නො ගනි යි. හෙතෙම උපනුපන් තැන භවබෝග සම්පත් ලබයි. පිරිවර සම්පත් නො ලබයි. කෙනෙක් තමා දන් නො දෙයි. අනුන් ලවා දන් දෙවයි. හෙතෙම උපනුපන් තැන පිරිවර සම්පත් ලබයි. භවබෝග සම්පත් නොලබයි. කෙනෙක් තමා ද දන් නො දෙයි. අනුන් ලවා ද දන් නො දෙවයි. හෙතෙම උපනුපන් තැන භවබෝග සම්පත් හෝ පිරිවර සම්පත් හෝ නො ලබයි. තවත් කෙනෙක් තමාත් දන් දෙයි. අනුන් ද සහභාගී කර ගනියි. හෙතෙම උපනුපන් තැන භවබෝග සම්පත් මෙන් ම පිරිවර සම්පත් ද ලබයි'' යනුවෙනි.

එක්තරා නුවණැති පුරුෂයෙක් ඒ අනුමෝදනා දෙසුම අසා මේ සම්පත් දෙක ම ලබා ගැනීමට පින් කමක් කරමි'යි සිතා බුද්ධ ප්‍රමුඛ සංඝයාට පසුදා දනට ආරාධනා කළේ ය. බුදුරජාණන් වහන්සේත් එම ආරාධනාව පිළිගත්හ. ඒ පුරුෂයා ද ගම පුරා ඇවිදිමින් තමා පසුදා දනට බුද්ධ ප්‍රමුඛ සංඝයාට ඇරයුම් කළ බවත් කැමති කැමති අය තම තමන් කැමති පමණින් දානයට අවශ්‍ය හාල්, මුං, තල තෙල් ආදිය දෙත්වා'යි ඒ ඒ අයට දන් පවරමින් ගියේ ය.

එක්තරා සිටුවරයෙක් මේ තැනැත්තා තමාට හැකි පමණින් දන් නො දී ගම පුරා දන් සලාක බෙදමින් ඇවිදින්නේ යැයි කිපී ඔහු අත තිබූ භාජනය ගෙන සහල් මුං ආදිය ඇඟිලි තුඩු තුනෙන් ගෙන දුමී ය. පැණි ආදිය දෙන විට කරඬිය සැලියට දමා නැවත උඩට ගෙන එයින් සැලෙන බින්දු පමණක් දුන්නේ ය. එම පුරුෂයා ද සෙසු අය දුන් ද්‍රව්‍ය වෙනමත් සිටුවරයා දුන් දේ වෙනමත් ගෙන ගියේ ය. ඒ දුටු සිටුවරයා මොහු කුමක් කරන්නේ දැයි බැලීමට ඔහු පසුපසු මිනිසෙකු යැවී ය. එපමණක් නොව ඔහු පිරිස් මැද තමාගේ නම කියා අපහාස කළොත් මරන්නෙමි යැ'යි ද සිතී ය.

එම උපාසක තැන ද සියලු දෙනා දුන් ද්‍රව්‍ය එකතුකොට ගම් වැසියන්ගේ සහායෙන් දන් පිසින අතර සිටුවරයා දුන් ද්‍රව්‍ය ඒ ආකාරයෙන් ම බිඳුව බැගින් ඒ ඒ පිසින ආහාරවලට එක් කළේ ය. පසු දා බුද්ධප්‍රමුඛ සංඝයාට දන් පිළිගැන් වූ උපාසක තැන ස්වාමීනි, ''**මා මේ දානය දුන්නේ ගමේ හැම දෙනාගේ ම උදව්වෙනි, උපකාරයෙනි, බොහෝ සහල් ආදිය දුන් අයට මෙන් ම ස්වල්පය බැගින් දුන් අයටත් එක සේ ම මහත්ඵල මහානිසංස ලැබේ වා' යි**'' පැවසීය. තමාට අපහාසයක් කළහොත් මොහු මරමි'යි කියා අවියක් ද ගෙන එහි පැමිණ සිටි සිටුවරයා එය අසා මහත් කම්පාවට පත් විය. මා මේ අපරාධය කරන්නට සිතුවේ මෙබඳු සත් පුරුෂයෙකුට ය. දැන් මා මොහු කමා නො කළහොත් දෙවියන් මට දඬුවම් දෙනු ඇතැයි බියටපත් සිටුවරයා. ඒ උපාසකයා ළඟට ගොස් දණින් වැටී සමාව ඉල්ලී ය.

මේ සිද්ධිය දුටු බුදුරජාණන් වහන්සේ ඒ පුවත අසා උපාසකයා හා සිටුවරයා ඇතුළු සියලු දෙනා අමතා උපාසකවරුනි, පින නම් සුළුයැයි කියා අවමන් නොකළ යුතු යැයි අවවාද කරන සේක් මේ ගාථාව වදාළ සේක.

''මාපපමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති
උදබින්දු නිපාතෙන උදකුම්භොපි පූරති
පූරති ධීරො පුඤ්ඤස්ස ථොක ථොකම්පි ආචිනං ''

**පදාර්ථය:**

**න මං තං ආගමිස්සති,** (මා කළ පින සුළුය) එය මට විපාක දෙන තරම් එකක් නොවේ යැයි, **පුඤ්ඤස්ස,** පිනට; **මාපපමඤ්ඤෙථ,** අවමන් නොකළ යුතු ය. **උදබින්දු නිපාතෙන,** දිය බිඳුව බැගින් වැටුනත්; **උදකුම්භොපි පූරති,** දිය කලයක් වුව ද පිරෙයි, **පුඤ්ඤස්ස,** පින; **ථොක ථොකම්පි ආචිනං,** ටික ටික වුවත් රැස්කරන; **ධීරො,** ඥානවන්තයා; **පූරති,** පිනෙන් පිරීයන්නේ ය.

**විවරණය:**

මේ අනුව දෙන දේ සුළුයැයි කියා එයින් ලැබෙන පින ලඝු කොට නො සැලකිය යුතු ය. බුදුන් සඟුන් වැනි උතුමන්ට කරන පූජාව සුළු වුවත් ආනිශංස අප්‍රමාණ වේ. වර්තමානයේ බොහෝ දෙනා තමා දුගී දුප්පත් නිසා දන් දීමට ඉදිරිපත් නො වෙති. එයින් සිදුවන්නේ ඔවුන් නැවත නැවතත් දුප්පත් වීම ය. එබැවින් ඔවුන්ට මේ දහම කියා දී හාල් මිටක් පොල් ගෙඩියක් බැගින් හෝ දන් දීමට පෙළඹ විය යුතු ය. එසේ ම ඔවුන් දෙන ඒ සුළු දෙය සතුටින් භාර ගෙන ඔවුන්ගේ සිත් පිනා යන ආකාරයෙන් අනුමෝදන් කිරීමට ද සංඝයා වශයෙන් අපට හැකි විය යුතු ය.

## 5.5.2.6.7 පව නම් හලාහල විෂක් බඳු ය.

සැවැත්නුවර මහා ධන නම් වෙළෙන්දෙක් විය. පන්සීයක් සොරු ඔහුගේ නිවස කොල්ලකෑමට අස්ථාවක් බලබලා සිටියෝ ය. මේ අතර දිනයක් ඒ වෙළෙඳ තැන පන්සීයක් ගැල් පුරුවා ගෙන වෙළදාම සඳහා පිටත් විය. යන්නට පෙර චාරිකාවේ වඩින භික්ෂූන් වහන්සේලා හමුවී. ස්වාමීනි, කැමැති නම් මා සමඟ වඩිණු මැනවි. මම ආහාර පානයෙන් උපස්ථාන කරන්නෙමියැ'යි ආරාධනා කළේ ය.

එම ආරාධනය පිළිගත් පන්සීයක් භික්ෂූන්වහන්සේලා ද ඔහු සමඟ වැඩිය හ. ඒ අතර ඉහත කී සොරු ද මගදී මොහුගේ ධනය කොල්ලකමු'යි කියා අතර මඟ කැලෑවක රැකගෙන සිටියෝ ය.

මහධන වෙළඳ තැන ද වන ගත මාර්ගයට පිවිසීමට පෙර ඒ අසල ගමෙහි නැවතී භික්ෂූන් වහන්සේලාට සංග්‍රහ කරමින් දින කීපයක් ගත කළේ ය. නැවත පිටත්වීමට සූදානම් වෙද්දී ඒ අතර මඟ සොරුන් රැක සිටින බව ආරංචි විය. අනතුරුව හෙතෙම ගමන නවතා ආපසු හැරුණේ ය. ඒබ ව දැනගත් හොරු ද එම මාර්ගයේත් රැක ගෙන සිටියෝ ය. ඒ බව දැනගත් වෙළඳ තැන ගමන් නවතා ටික දවක් එතැන ම විසීමට තීරණය කළේ ය. අනතුරුව භික්ෂූන් වහන්සේලා හමුවූ හෙතෙම ''ස්වාමීනි සොර උවදුර නිසා ගමන ටික කලකට නවතිමි. ඔබ වහන්සේලා කැමති කෙනෙක් මා සමඟ නවතිනු මැනවි. කැමති කෙනෙක් රිසි සේ වඩිනු මැනවැයි'' කීවේ ය.

සියලු භික්ෂූන් වහන්සේලා චාරිකාව නවතා පෙරළා දෙව්රම් වෙහරට වැඩියෝ ය. බුදුරදුන් හමුවූ වේලෙහි ගමන නවතා ආපසු වැඩියේ මන්දැයි. උන්වහන්සේ විචාළහ. ස්වාමීනි, මහධන වෙළෙන්දා මං පහරණ සොරුන් නිසා ගමන නවතා ඒ ගමෙහි ම රැඳුනේ ය. ඒ නිසා අපි ආවේමු'යි. භික්ෂූන් වහන්සේලා පිළිතුරු දුන්හ. එම සිදුවීම අරමුණු කරගෙන එයම උපමාවට ගෙන භික්ෂූන් වහන්සේලාට ධර්මාවවාදයක් දෙමින් බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළ සේක. දේශනාවසානයෙහි භික්ෂූන් වහන්සේලා සිව් පිළිසිඹියාපත් රහත් බවට පත්වූහ.

**''වාණිජොව භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො**
**විසං ජීවිතුකාමො ව පාපානි පරිවජ්ජයෙ ''**

**පදාර්ථය:**

**අප්පසත්ථො,** කුඩා වෙළඳ කණ්ඩායමක් ඇති; **මහද්ධනො,** මහා ධනයක් ඇති, **වාණිජො,** වෙළෙන්දෙක්; **භයං මග්ගං ඉව,** බියකරු මගක් මගහරින්නාක් මෙන් ද; **ජීවිතු කාමො,** ජීවත්වනු කැමැත්තෙක්; **විසං ඉව,** වස විෂක් දුරු කරන්නාක් මෙන් ද, **පාපානි පරිවජ්ජයෙ,** පවට බියෙන් පව දුරු කළ යුත්තේ ය.

**විවරණය:**

''**තතොනං දුක්ඛ මන්වෙති චක්කං ව වහතො පදං**'' යනුවෙන් වදාළ පරිදි පාපයේ විපාකය දරුණු ය. ගොනුට දුක් දෙමින් පසුපස කරකැවෙන රථ රෝදය මෙන් ලුහුබැඳ එන්නේ ය. ගැලවීම පහසු නැත. එහෙයින් **අත්තානුවාද භය** (තමාට තමා ම දොස් කියාවි යන බිය) **පරානුවාද භය** (දකින අසන අන් අය දොස් කියාවි යන බිය) **දණ්ඩ භය** (දඬුවමට ඇති බිය) **දුග්ගති භය** (අපාගත වීමට ඇති බිය) යන මේ කවර හෝ බියක් පෙරදැරි කරගෙන **(අණුමත්තෙසු වජ්ජෙසු භය දස්සාවි)** - ඉතා කුඩා වරදෙහිමුත් බිය දක්නා සුලුව ''**සබ්බ පාපස්ස අකරණං**'' කී ආකාරයෙන් පාපයෙන් වැළකිය යුතු ය.

දේශනාව අවසානයේ භික්ෂූන්වහන්සේලා සිව්පිළිසිඹියා ලත් රහතුන් බවට පත්වූහ.

### 5.5.2.8 කර්මය යනු ක්‍රියාව නොව චේතනාවයි.

සැවැත් නුවර එක්තරා සිටු දුවක් හිටියා ය. ළමා වියේ දීම බුදුරදුන්ගෙන් බණ අසා සෝවාන්ව සිටි ඇය දෙමාපියන් විසින් මතුමහල් තලයෙහි රඳවා රැක ගනු ලැබුවා ය. මේ අතර දින පතා දුණු මදුවැල් ආදිය ගෙන දඩයමේ යන කුක්කුට මිත්ත නම් දඩයක් කරුවෙකු සී මැඳුරු කවුළුවෙන් දකින ඇයට ඔහු පිළිබඳ සිතක් ඇති විය. දාසියකගේ වෙස් ගෙන මැදුරෙන් පලා ගිය ඇය කුක්කුට මිත්තගේ භාර්යාව බවට පත් වූවා ය. ඔවුනට පුත්තු හත් දෙනෙක් ම ලැබිණ. ඔවුන් නිසි වයසේ දී කරකාර බන්දවන ලදි. දැන් කුක්කුට මිත්තගේ පවුලේ පිරිස සොළොස් දෙනෙකි.

දිනක් ලොව බලා වදාරණ බුදුරජාණන් වහන්සේට මේ සියලු දෙනාට නිවන් දකින්නට වසනාව ඇති බව පෙනිණ. ඒ නිසා උන්වහන්සේ කුක්කුට මිත්ත යන එන මග පිය සටහන් සිටින සේ මද දුරක් ගමන් කොට අසල ගසක් මුල වැඩ හුන්හ. එදා කුක්කුට මිත්තගේ මළපුඩු කිසිවෙකුට කිසිදු සතෙක් හසුවී තිබුණේ නැත. ඒ ගැන කෝපයෙන් පෙරළා එන ඔහුට බුදුරදුන්ගේ පිය සටහන් දක්නට ලැබිණ. කවුරු හෝ තමාගේ මළපුඩුවලින් සතුන් මුදා හැර ඇතැයි උපන් සැකයෙන් ඒ පියවර ඔස්සේ ගිය ඔහුට බුදුරදුන් දක්නට ලැබිණ. මෙය කරන්නට ඇත්තේ මොහු තමා යැයි කියා බුදුරදුන්ට විදීමට දුනු දිය ඇද්දේ ය. ක්ෂණයකින් හෙතෙම එය විද ගැනීමට හෝ ඇද ගැනීමට නොහැකිව ගල් ගැසුනාක් මෙන් විය. සෙසු අයත් එන තුරු බුදුරජාණන්වහන්සේ ඔහුට එසේම ඉන්නට හැරියහ.

පියා නො පැමිණීම නිසා ඔහු සොයා ආ පුත්තු ද බුදුරදුන්ට විදින්නට සැරසුණ හ. එවිට ඔවුහු ද ගල් වූහ. අනතුරුව ඒ සියල්ලන් සොයා නැන්දනියත් ලේලිවරුන් සත් දෙනාත් පැමිණියෝ ය. මොවුන් දුනු මානාගෙන ඉන්නේ කාට දැයි බැලූ ඔවුන්ට බුදුරදුන් දක්නට ලැබිණ. ඒ වන විටත් සෝවාන්ව සිටි නැන්දනිය වූ සිටු දියණිය උපන් ශ්‍රද්ධාවත් බියත් නිසා අනේ මාගේ පියා මරන්න එපා යැයි කෑගැසුවා ය. කුක්කුට මිත්ත ඇතුලු සියලු දෙනා ම සිතුවේ බුදුරදුන් ඇයගේ පියාය කියා ය. තමන් මහ බරපතල වරදක් කෙළේ යැයි බියට පත් ඔවුහු අවි පසෙක ලා බුදුරදුන් වැඳ සමා කරවා ගත්හ. එහිදී බුදුන් දෙසූ බණ අසා සෙසු පහළොස් දෙනාම සෝවාන් ඵලයටපත් වූහ. මේ සිදුවීම ගැන දම් සභා මණ්ඩපයේ දී කථාබහ කරන භික්ෂූන්හන්සේලාට ලොකු ම ගැටලුව වූයේ සෝවාන්ව සිටි කුක්කුට මිත්ගේ බිරිද ඔහුගේ ප්‍රාණඝාතයට හවුල් වූයේ කෙසේ ද කියා ය. උන්වහන්සේලාගේ එම අදහස දැනගත් බුදුරජාණන් වහන්සේ මහණෙනි, සෝවාන් වූ අය ප්‍රාණඝාත නොකරති. මැය කර ඇත්තේ සිය සැමියාගේ උවමනාවන් ඉටු කිරීම ය. මෙය රැගෙන ගොස් සතුන් මරව යි අදහසක් ඇයට නැත. පාප චේතනාවක් නොමැති නම් සැමියාට සේවය කළ පමණින් ඇය පවක් කළා නොවන්නේ යැයි වදාරා මෙම ගාථාව දේසනා කළහ.

> "පාණිම්හි චෙ වණො නාසස හරෙය්‍ය පාණිනා විසං
> නාබ්බණං විසමන්වෙති නත්‍ථි පාපං අකුබ්බතො "

පදාර්ථය:

**චෙ,** ඉදින්; **පාණිම්හි,** (කෙනෙකුගේ) අත්ලෙහි; **වණො නාස්ස,** තුවාලයක් නැත්නම්; **පාණිනා විසං හරෙය්‍ය,** අත්ලට විසක් ගත්ත ද; **අබ්බණං,** තුවාලයක් නැති අතකින්, **න විසං අන්වෙති,** විස සිරුර තුළට නොවදියි එසේම; **අකුබ්බතො,** පාපයක් කිරීමේ චේතනාවක් නොමැති කෙනෙකුට; **නත්‍ථි පාපං,** (කිසියම් ක්‍රියාවක් කළ පමණින්) පාපයක් සිදු නොවෙයි.

විවරණය:

''**චෙතනාහං භික්ඛවේ කම්මං වදාමි**'' යැයි වදාළ පරිදි පිනක් හෝ පවක් කර්මයක් බවට පත් වන්නේ චේතනාවෙන් හෙවත් සිතා මතා කළොත් ය. **මනො පුබ්බංගමා ධම්මා** - කුසලා කුසල ධර්මයන්ට මුල සිත යැයි කීවේ ද ඒ නිසා ය. දඩයක්කරුගේ බිරියට එබඳු පාප චෙතනාවකින් තොරව දඩයක්කාර සැමියාට සේවය කළ හැකිව තිබුණේ ඇය නියත වශයෙන් ම අපාගතවන කෙලෙස් සිතින් දුරු කළ (අවිනිපාත ධම්ම) කෙනෙකු වූ නිසා ය. බුදුරජාණන් වහන්සේ ඇයගේ සිත ගැන ඇප වූයේ ද ඒ නිසා ය. පෘථග්ජන කෙනෙකුගේ නම් මෙවැනි අවස්ථාවක රාග ද්වේෂ වැනි පව්වු අදහස් ඇති නොවේ යැයි එක හෙලා ඇප විය නොහැකි ය.

කුක්කුට මිත්ත ඇතුලු මේ සොළොස් දෙනාට එක වර නිවන් දැකීමට හැකි වූයේ පෙර සියලු දෙනා එක්ව නිතර කුසල් දම් පුරා තිබුණු නිසා ය. විශේෂයෙන් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ සමයේ මොහු ගැමි සිටුවරයෙක් විය. බුදුරදුන් වෙනුවෙන් සෑයක් ඉදි කිරීමේ දී ප්‍රධාන දායකත්වය වෙනුවෙන් නාගරික මහා ධනවත් සිටුවරයෙකු සමඟ තරග කොට මුදලින් අට කෝටියක් වැය කොට ඉතිරි මුදලට මුළු පවුල ම සෑයට දාස බවට පත්වූහ. සිටු කුමරියට තමාට කිසිසේත් නො ගැලපෙන කුක්කුට මිත්ත පිළිබඳ සිතක් ඇති වූයේ මේ සසර පුරුද්ද නිසා ය.

**''පුබ්බෙව සන්නිවාසෙන පච්චුප්පන්න හිතෙන වා**
**එවං තං ජායතෙ පෙමං උප්පලං ව යථොදකෙ ''**

නෙළුම් මහනෙල් මල් දිය ගැඹුරෙහි වැඩී දඬුදික් වී දිය මතුපිටට පැමිණ පිපෙන්නා සේ පෙර එකට විසීම නිසා හෝ අද ඇති වූ හිතවත් කමක් නිසා හෝ උනුන් අතර මේ ප්‍රේමය හටගන්නේ ය.

### 5.5.2.9 අනුන්ට කළ දේ තමන්ට පල දේ.

සැවැත් නුවර කෝක නම් සුනක වැද්දෙක් සිටියේ ය. ඔහු කළේ බල්ලන් පිරිවරාගෙන ගොස් උන් උසි ගන්වා සතුන් ලුහු බැඳ අල්ලා ගෙන දඩයම් කිරීමයි. දිනක් ඔහු දඩයමට මගට බසින විට ම හමුවුණේ පිඩු පිණිස වඩින හිමි නමකි. ඉන් ඔහු කෝපයට පත් විය අද උදේ ම හිස මුඩු කළ කාලකණ්ණියෙකු දුටුවේය යැයි කළකිරුණු සිතින් ම හේ පිටත්ව ගියේ ය. එදා මුළු කැලයේ ම ඇවිද්දත් දඩයමක් සපයා ගැනීමට නොහැකි විය. වෙහෙස වී හිස් අතින් ආපසු එන ඔහුට පෙර කී හිමියන් ම යලිත් හමු විය. කෝපය ඉහවහා ගිය හෙතෙම උන්වහන්සේ දෙසට බල්ලන් උසිගැන්වී ය. තෙරුන්වහන්සේ අසල වූ ගසකට නැග ගත්හ. බල්ලෝ ගස වට කර ගත්හ. වැද්දා ගස මුල සිට ඊතල තුඩින් උන්වහන්සේගේ යටිපතුල්වලට අනින්නට විය. තෙරුන් ඉන් බේරීමට පයින් පය මාරු කර දඟලද්දී උන්වහන්සේගේ සිවුර ගැලවී වැද්දා මතට ඇද වැටුණි. ඔහු සිවුරෙන් වැසී ගියේ ය. ගස මත සිටි තෙරුන් වැටුණේයැ යි සිතූ බල්ලෝ වියරුවෙන් සිවුර තුළට වැදී වැද්දා කීතු කීතු කොට කා දැමූහ.

තෙරුන් වහන්සේ ද දඬු කැබැල්ලක් ගෙන බල්ලන් එලවා දමා සිවුරත් පොරවාගෙන දෙව්රම් වෙහෙරට වැඩියහ. වහා බුදුරදුන් වෙත ගිය උන්වහන්සේ එම පුවත සැළ කොට ස්වාමීනි, මගේ සිවුර නිසා එම වැද්දා නැසුණේ ය. මගේ සීලයට හානියක් සිදුවී ද. මගේ මහණ කම තවම තිබේදැයි ඇසූහ. එවිට බුදුරජාණන්වහන්සේ මහණ, ඔබේ සීලටය හානියක් නැත. මහණකම ද නිරුපද්‍රිත ය. කිසිවෙකුට ද්වේෂ නොකරන අහිංසක කෙනෙකුට හිංසා කොට ඒ වැද්දා මේ විනාසයට පත්වූයේ යැයි වදාරා මේ ගාථාවෙන් දම් දෙසූ සේක.

> **''යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස**
> **තමෙව බාලං පච්චෙති පාපං සුඛුමො රජො පටිවාතංව ඛිත්තො ''**

පදාර්ථය:

**යො,** යමෙක්; **අප්ප දුට්ඨස්ස,** කිසිවෙකුට ද්වේෂ නොකරන; **නරස්ස,** පුද්ගලයෙකුට; **සුද්ධස්ස,** නිරපරාධී; **අනංගනස්ස,** නික්ලේශී, **පොසස්ස,** පුද්ලයෙකුට; **දුස්සති,** දේවෂ කරයි නම්, පීඩාකරයි නම්; **පාපං,** ඒ පාප කර්මය; **පටිවාතං ඛිත්තො,** උඩුසුළඟට දැමූ, **සුඛුමො රජො ඉව,** සියුම් දූවිල්ලක් මෙන්; **තං එව බාලං,** එම අනුවණයා වෙත ම; **පච්චේති,** පෙරලා එන්නේ ය;

විවරණය:

**සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස** - මෙහි **සුද්ධස්ස** යන්නෙන්, සිතින් හෝ අනුන්ට පීඩාවක් නැති නිරපරාධී පුද්ගලයා ගැණෙයි. **අනඞ්ගනස්ස** යන්නෙන් කෙලෙස් දුරු කළ මඟ පල ලැබූවෝ ගැනෙති. අහිංසකයන්ට කෙරෙන හිංසාව තමාටම පල දෙන බව මෙයින් කියවේ. සෝවාන් ආදී උතුමෝ පරම අවිහිංසකයෝ ය. පැවිදි උතුමෝ ස්වභාවයෙන් ම අහිංසකයෝ ය. ඔවුහු අනුන්ට හිංසා නොකරති. '**න හි පබ්බජිතො පරූපඝාති න හි සමණො හොති පරං විහෙඨයන්තො**' යැයි වදාළේ ඒ නිසා ය.

### 5.5.2.10 තමන් කළ දේ අනුව විපාක ලැබේ.

සැවැත් නුවර තිස්ස නම් තෙර නමක් විසී ය. උන්වහන්සේගේ කැප කරු දායක වූයේ මැණික්කාර පවුලකි. අවුරුදු දොළහක් පුරා උන්වහන්සේ පිණ්ඩාහාර ලැබුවේ ඒ නිවසිනි. ඒ දෙමහල්ලෝ ද දෙමාපියන් මෙන් ගෙදරට ම වැඩමවා වළඳවමින් උන්වහන්සේ රැක බලා ගත්හ. ඒ නිසා ම ඒ හිමියෝ මණිකාරකුලූපග තිස්ස නමින් ප්‍රකට වූහ. දිනක් තෙරුන් නිවසට වැඩමවා සිටිද්දී ගෙහිමියා මස්කපමින් හුන්නේ ය. මේ අතර කොසොල් රජතුමා ඔපදමා විද දෙන ලෙස කියා ඔහුට මැණිකක් එවා තිබුණේ ය. හෙතෙම ලේ වැකි අතින් ම මැණික ගෙන බලා පෙට්ටගම මත තබා දැත් සෝදාගෙන ඒමට ගේ පිටුපසට ගියේ ය. මේ අතර ගෙයි ඇති කරන කොස්වා ලිහිණියෙක් ලේ සුවදට මස් කැටියෙකැයි සිතා මැණික ගිල දැම්මේ ය. මැණික්කරු පැමිණ බලන විට මැණික නැත. ගෙදර අයගෙන් ඇසු නමුත් ඔවුන් ද ගෙන නැත. අන්තිමේ දී මැණික් කරු සැක කළේ තෙරුන්වහන්සේ මැණික ගන්නට ඇති බවට ය. ඔහුගේ බිරිය එසේ සිත්නටවත් එපායැයි කීවත් මැණික්කරු එය නො පිළිගත්තේ මැණික නැති වුවහොත් තමා රාජ දණ්ඩනයට ලක්වන නිසා ය.

මැණික ගත්තේ දැයි ඇසූ විට තෙරණුවෝ නැතැයි කීහ. එය ලිහිණියා ගිල දැමූ බව උන්වහන්සේ දුටු නමුත් ඒ කාන්තයෙන් ම ඌ මරණ බව දන්නා නිසා උන්වහන්සේ එය හෙළි නො කළහ. වධ දී ඇත්ත අසා ගනිමි යි සිතූ මැණික්කරු භාර්යාවගේ බලවත් විරෝධතාව මැද උන්වහන්සේගේ හිස වටා කඹයක් දවටා ලී දණ්ඩකින් ඇඹරුවේ ය. උන්වහන්සේගේ කන් නාසාවලින් ලේ වැගිරෙන්නට විය. එවිට බිම වැටුණු ලේ බොන්නට ලිහිණියා එතනට ආවේ ය. වියරු වැටී සිටි මැණික් කරු දුන් පා පහරින් ඌ වීසි වී ගොස් ඇද වැටී මළේ ය.

උපාසකය, මගේ හිස වෙළුම අත හැර අර සතා මළේ ද නැද්දැයි බලන්නැයි තෙරණුවෝ කීහ. ඌ මළේ ය. ඇත්ත නො කීවොත් ඔබට වන්නේත් එය ම යැයි මැණික්කරු තර්ජනය කළේ ය. එවිට තෙරණුවෝ උපාසකය මැණික ගිල දැමුයේ ඒ සතා ය. ඌ නොමැරුණා නම් මා මැරුවත් මේ බව කියන්නේ නැතැයි පැවසූහ.

ලිහිණියාගේ කුස පලා බැලූවිට මැණික හමු විය. මහත් සංවේගය පත් මැණික් කරු වෙව්ලමින් තෙරුන් පාමුල වැටී සමාව අයැදී ය. එවිට උන්වහන්සේ උපාසකය මෙය ඔබේ හෝ මගේ හෝ දෝෂයක් නො වෙයි සංසාර දෝසයකැයි කියා ඔහුට සමාව දුන්හ. ඉදිරියටත් අපේ ගෙදරින් ම දන් පිළිගනුමැනවැ යි ඔහු කීවිට තෙරුන්වහන්සේ උපාසකය මින් මතු කිසි දා මම ගෙරක පියස්සෙන් ඇතුළු නො වන්නෙමි. මේ එසේ ගෙවල්වලට පිවිසීමෙන් සිදු වූ අනිසි විපාකයකැයි කියා ආපසු වැඩිය හ.

තෙරුන්වහන්සේ එම ආබාධයෙන් නොබෝ දිනකින් පිරිණිවන් පෑහ. කොස්වා ලිහිණියා මැණික්කරුගේ බිරිඳගේ කුසේ පිළිසිඳ ගත්තේ ය. මැණික්කරු මියැදී අපා ගත විය. ඔහුගේ බිරිඳ තෙරුන් කෙරෙහි දැක්වූ ශ්‍රද්ධාව හා ගෞරව නිසා දෙව්ලොව උපන්නා ය.

දම්සභා මණ්ඩපයේ දී භික්ෂූන් අතර මේ පිළිබඳව ඇති වූ කතා බහ නිමිති කරගෙන බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

> "ගබ්භමෙකෙ උපපජ්ජන්ති නිරයං පාපකම්මිනො
> සග්ගං සුගතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවා "

පදාර්ථය:

ඇතමෙක් **ගබ්භං උපපජ්ජන්ති,** මිනිස් කුස උපදිති; **පාප කම්මිනො,** පව්කාරයෝ, **නිරයං උපපජ්ජන්ති,** නිරයේ උපදිති; **සුගතිනො,** කුසල් කොට සුගතියට යන්නෝ; **සග්ගං යන්ති,** දෙව් ලොව යති; **අනාසවා,** කෙලෙස් නැසූ රහතන් වහන්සේලා; **පරිනිබ්බන්ති,** පිරිනිවන් පාති;

විවරණය:

මෙහි කුසලා කුසල කර්ම අනුව සත්වයන්ගේ කර්ම සහ කර්ම ගති හතරක් දක්වා තිබේ. මජ්ඣිම නිකායේ **කුක්කුරවතිය සූත්‍රයේ දී** මේ කර්ම හතර සහ විපාක විස්තර කරන්නේ මෙසේ ය. **කළු කර්ම** කළ අය කළු විපාක ලබති. **කළු කර්මය නම් පාපයයි.** කළු විපාක නම් සතර අපායයි. ඒවායේ හැමදාම දුකය. **සුදු කර්ම** කළ අය **සුදු විපාක** ලබති. **සුදු කර්ම නම් කුසල් ය. සුදු විපාක නම් දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝකයන් ය.** ඒවායේ සැම දාම සැප ය. **සුදුකළු මිශ්‍ර කර්ම නිසා සුදු කළු මිශ්‍ර විපාක විඳින්නට සිදු වේ.** සුදු කළු **මිශ්‍ර කර්ම යනු පින්කම් කරන ගමන් ඒවා කෙළෙසන අකුසල් සිත් ඇති කර ගැනීම ය.** සුදු කළු **මිශ්‍ර විපාකය නම් මිනිස් ලොව ඉපදීමයි.** එහි **දුක සැප දෙක මිශ්‍රව ලැබෙයි. සුදුත් නොවන කළුත් නොවන කර්ම කරන්නේ රහතන් වහන්සේලා ය.** උන්වහන්සේලා පිරිනිවන් පාති.

## 5.5.2.11 මිදිය හැකි තැනක් නැත කළ අකුසලෙන් මෙදා.

දිනක් බුදුන් දකින්නට යන භික්ෂූන් වහන්සේලා එක් ගමකට පිඬු පිණිස වැඩියෝ ය. උන්වහන්සේලාට දන් පිළියෙල කරමින් සිටි කාන්තාවකගේ තෙල් බඳුනකින් නැගුණු ගින්නක් වහලට වැදී එහි වූ පිදුරු රොදකට ඇවිලී අහසට නැගුනේ ය. ඒ මොහොතේ ම එතනින් ගිය කපුටෙක් ඒ ගිනිදැල්ලට හසු වී පිළිස්සී මිය ගියේ ය. මේ විස්මය දුටු ඒ භික්ෂූන් වහන්සේලා ඒ පිළිබඳ බුදුරදුන්ගෙන් විචාරන්නට සිතාගෙන පිටත්ව ගියහ.

මේ අතර තවත් බුදුරදුන් දකින්නට එන භික්ෂූන් වහන්සේලා සිටි නැවක් මුහුද මැද දී නතර විය. මෙය කාගේ හෝ අවාසනාවක් යැයි සිතූ ඔවුහු එය සෙවීමට තුණ්ඩු දැමූහ. තුන්වරක්ම සීට්ටුව වැටුණේ නැව්පතියාගේ බිරිඳගේ නමට ය. එක් ස්ත්‍රියක් නිසා සියලුදෙනා විනාශ නො විය යුතුයැ යි තීරණය කළ නැව්පති තැන තමාට නැවත නො පෙනෙන ලෙස ඇය දියේ ගිල්වන්නැයි නියම කළේ ය. අතවැසියෝ වැලි පිරවූ කළයක් ගෙලේ බැඳ ඇය මුහුදේ ගිල්ලූහ. මේ බිහිසුණු සිදුවීම දුටු භික්ෂූන් වහන්සේලා එහි පාප කර්මය බුදුරදුන්ගෙන් විමසමු යි සිතාගෙන පැමිණියහ.

ඒ අවධියේ ම තවත් භික්ෂූන් වහන්සේලා සත්නමක් බුදුන් දකින්නට එන අතර එක් වෙහෙරක ගල්ලෙනක නවාතැන් ගත්හ. එදා රෑ මහා ගල් කුළක් අවුත් ලෙන්දොර වැසී ගියේ ය. පසුදා ගම් වැසියන් සැවොම එක්ව කොතරම් වෙර දැරුවත් ගල්කුළ ඉවත්කළ නොහැකි විය. හත්දවසක් ම ගෙවුණි. භික්ෂූන් වහන්සේලා නිරාහාරව වැහැරී ගියෝ ය. හත්වන දා ගල්කුළ ඉබේම ඉවත්ව ගියේ ය. ඉතා අපහසුවෙන් පිටතට ආ භික්ෂූන් වහන්සේලා අහර වළඳා සුවපත් වූ පසු මේ කවර කර්මයක්දැයි බුදුන්ගෙන් විමසමුයි කියා බුදුරදුන් බැහැදැකීමට පැමිණියේ ය.

මේ සියලු භික්ෂූන් වහන්සේලා එකවර හමුවී බුදුරදුන් වෙත ගොස් මේ සියළු පුවත් සැලකොට මේ අරුම පුදුම සිදුවීම්වලට හේතුව විමසා සිටියෝ ය. එවිට බුදුරජාණන් වහන්සේ, මහණෙනි කපුටා, පෙර කල ගොවියෙක් ව සිටියේ ය. සී සෑම් ආදියට ගවයන් පුහුණු කරන්නට ගිය ඔහුට එම කාරිය කරගත නොහැකි විය. කොතරම් පුහුණු කළත් ඔවුහු මද දුරක් ගොස් ඇදවැටෙති බිම ලැග ගනිති. කොතරම් තැළුවත් නැගිටවා ගත නොහැකි විය. කෝපයට පත් ගොවියා. බිම ලැගගත් ගවයන් මත පිදුරු දමා ගිනි ලා උන් පුළුස්සා දැමීය. එතැන් සිට කොතෙකුත් නිරාදුක් ආදිය වින්ද ඔහු අදත් මේ කපුටෙකුව අහසෙහිදී ම පිළිස්සී ගියේ ය.

මහණෙනි, මුහුදේ ගිල්වන ලද ඒ ස්ත්‍රිය පෙර කල ගෘහපතිනියක්ව සිටියදී ඇයට ඉතා ඇළුම් කළ නිතර ම ඇ පසුපස යන බල්ලෙක් සිටියේ ය. ඒ මීට තුන් භවයකට පෙර ඇගේ ස්වාමියා වූවෙකි. ඇය යන යන තැන බල්ලා ද යයි. ඒ නිසා ඇය මිනිසුන්ගේ උපහාසයට ද ලක් විය. කොතෙකුත් තරවටු කළත් ඌ වළක්වා ගත නොහැකි වූ තැන දිනක් දියවලට ගිය ඇය වැල් කැබැල්ලක් ගෙන බල්ලා ආදරයෙන් කැඳවා වැල් කොණෙන් උගේ ගෙල බැඳ අනෙක් කොණෙන් වතුර කලය ගැටගසා බල්ලා ගිල්වා දැමුවා ය. අදත් ඇය ගිල්වා දමන ලද්දේ ඒ පාප කර්මය නිසා ය.

මහණෙනි, ගල්ලෙනෙහි හිර වූ ඔබත් පෙර කළ කර්මයක් ඇත. එක් කලෙක ගොපළු කොල්ලන් ව සිටි ඔබ සත්දෙනා විනෝදයට තලගොයෙකු පසුපස පන්නද්දී ඌ තුඹසකට වැදුණේ ය. තුඹසේ සියලු සිදුරු වසා දැමූ ඔබට එතැනින් යන්නට පෙර එය විවෘත කිරීමට අමතක විය නැවත ඔබ ඒ පළාතට ආවේ සත්දිනකට පසුව ය. එදා තලගොයා ගැන සිහිපත් වී ඔබ තුඹස විවෘත කළ විට දින සතක් නිරාහාරව සිටි ඒ සතා අමාරුවෙන් ඇදී ගියේ ය. ඔබට අනුකම්පා සිතී ඒ සතාට යන්නට දුන්හු ය. එහෙයින් ඔබ නිරාගත වූයේ නැත. එහෙත් එබට මෙසේ සත් දින බැගින් නිරාහාරව සිටින්නට සිදුවූ දහහතරවෙනි වතාව මෙය යි.

මේ නිසා මහණෙනි, මේ මිහිමත කොතැනක සිටියත් පාපකර්මයෙන් මිදීමක් නම් නැතැයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

''න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා ''

පදාර්ථය:

**යත්ථට්ඨිතො,** යම්තැනක සිට; **පාපකම්මං මුච්චෙය්‍ය,** පාප කර්මයෙන් මිදිය හැකි වේද; එබඳු තැනක්, **න අන්තලික්ඛෙ,** අහසෙහිත් නැත; **න සමුද්දමජ්ඣෙ,** මුහුද මැදවත් නැත; **න පබ්බතානං විවරං පවිස්ස,** පර්වත කුහරයකට පිවිසුනත් නැත; **සො ජගතිප්පදෙසො,** ලොව එබඳු තැනක්; **න විජ්ජති,** කිසි තැනක දක්නට නැත;

දේශනාව අවසානයෙහි ඒ භික්ෂූන් වහන්සේලා සෝවාන් ආදී මගපල ලැබූහ.

## 5.5.2.12 මරණයෙන් මිදී සැඟවෙනු හැකි තැනක් නැති.

බුදුරජාණන් වහන්සේ වරක් ශාක්‍ය රට කිඹුල්වත් පුර නිග්‍රෝධාරාමයේ වැඩවෙසෙන සේක. සුප්පබුද්ධ කෝලිය රජු යශෝධරා දේවියගේ සහ දෙව්දත් තෙරුන්ගේ පියා ය. යශෝධරාවන් අතරමං කළේ යයි ද, දෙව්දත් තෙරුන්ට තැනක් නො දුන්නේ යයි ද කියා ඔහු සිටියේ බුදුරදුන් සමග වෛරයෙනි. දිනක් හෙතෙම බුදුරදුන් පිඬු පිණිස වඩින මග අවුරා වීදිය මැද මත්පැන් බිබී සිටියේය. බුදුරදුන්ට වඩින්නට ඉඩ දෙන්නැයි ඉල්ලා සිටියත් ඔහු ඉවත් වූවේ නැත. බුදුරජාණන් වහන්සේ මාමාගෙන් ඉඩක් නො ලැබුණ බැවින් එතනින් ආපසු හැරුණහ. හැරෙන අතර උන්වහන්සේ සිනහ පහළ කළහ. අනඳ තෙරුන් ඊට හේතුව විමසූවිට ආනන්දය; මා වැනි බුදු කෙනෙකුගේ මග ඇහිරීමෙන් සුප්ප බුද්ධ කරගත්තේ මහ බැරෑරුම් පාපයකි. මොහුට දින හතකට වඩා ආයුෂ නැත. සත්වන දින මහ පෙළොවට අඩිය තැබූ විගස පොළොව පලාගෙන යන්නේ යැයි පැවසූහ.

බිමතින් සිටි සුප්පබුද්ධ රජු චරපුරුෂයන් අතින් ඒ පුවත අසා බුදුරදුන්ගේ බස බොරු කරමි යි තීරණය කොට මැදුරට ගියේ ය. සියලු පහසුකම් ලංකරවාගෙන මැදුරේ සත්වෙනි මහලට නැගුණු රජු සත් දවසක් නික්මෙන තුරු තමන් පහලට බසින්නට ආවත් කිසිසේත් ඉඩ නොදෙත්වාය යි කියා සෑම මහලකම පියගැට පෙළ පාමුල යෝධයන් යොදා රැකවල් ලා මතු මහලට වී සිටියේ ය.

සත්වන දවස උදාවිය. රජතුමා සිටියේ කිසිසේත් නොබසින දැඩි අධිෂ්ඨානයෙනි. හදිසියේ ම එදින මංගල අශ්වයා කුලප්පු විය. ඌ බිත්තිවලට පවා පහර දෙමින් හේෂාරව කරමින් මහ කලබැගෑනියක් ඇති කළේ ය. එවැනි අවස්ථාවක රජතුමාට හැර කිසිවෙකුට ඌ මෙල්ල කළ නො හැකි විය. මේ ඝොෂාවෙන් රජු කලබල වී නො ඉවසිල්ලකුත් මහ ආවේගයකුත් ඇති විය. සියලු රැකවලුන් පෙරළාගෙන රජු පහතට දිව ආවේ ය. පැමිණ මහ පොළවට පය තබනවාත් සමග ම පොළව පලාගෙන ගොස් නිරයේ උපන්නේ ය. භික්ෂූන් වහන්සේලාගෙන් මේ පුවත ඇසූ බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කළ සේක.

**"න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස**
**න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චු "**

**පදාර්ථය:**

**යත්ථ ඨිතො,** යම් තැනක සිට; **නප්පසහෙථ මච්චු,** මාරයා මැඩ පැවැත්වීමට හැකි වෙයි ද?; **සො ජගාතිප්පදෙසො,** ලොව එබඳු තැනක්; **න විජ්ජති,** දක්නට නැත; **න අන්තලිකෙ,** අහසෙහි ද නැත; **න සමුද්දමජ්ඣෙ,** මුහුද මැද ද නැත; **න පබ්බතානං විවරං පවිස්ස,** පර්වත කුහරයකට පිවිස සිටිය ද ඉන් ගැලවීමක් නැත.

**විවරණය:**

"**න පසහෙථ මච්චු**" මාරයා හෙවත් මරණය සත්වයා බිලිගන්නේම ය. ඒ බිලි ගැනීම වැළැක්විය නොහැක යනු මෙහි අදහසයි.

**අභ්‍යාස**

01. මෙහි කතාපුවත්වල ඔබ සිත්ගත් තොරතුරු ගොනුවක් පිළියෙල කරන්න.
02. පාප වග්ගය ඇසුරින් ධර්ම දේශනාවක් පවත්වන්නේ කෙසේදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
03. කොතැනක සිටියත් පාපයෙන් ගැලවීමක් නැත. යන්නට ඔබ දන්නා නිදසුන් දෙකක් පන්තියට ඉදිරිපත් කරන්න.

20 පාඩම

# ඔබ දඬුවමට බිය නම් අනුන් ද එසේ ම ය

## (දණ්ඩ වග්ගය)

දණ්ඩ යනු දඬුවම හෝ දඬු මුගුරු ගල්මුල් ආදියෙන් හිංසා කිරීමයි. දණ්ඩ වර්ගයේ ප්‍රධාන තේමාව වී ඇත්තේ එයයි. අපි සියල්ලෝ ම එබඳු දණ්ඩනය ඉදිරියේ තැති ගනිමු, බිය වෙමු. අපත් එසේ දණ්ඩනයට බිය නම් අප අනුන්ට දණ්ඩන හිංසන කරන්නේ කෙසේ ද? සාමාන්‍යයෙන් වරදට දඬුවම් දීම අපරාධයක් නොවේ. එහෙත් එම දඬුවම කායික හිංසාවක් වීම සුදුසු නැත.

එබඳු දණ්ඩන හිංසන වල දී සිල්වතුන් ගුණවතුන් වැනි අහිංසකයන්ට කරන හිංසාව ඉතා බරපතල ය. බෙහෝ විට ඒවා **දිට්ඨධම්මවේදනීය** වශයෙන් **එවේලේ ම පල දෙන්නේ ය.** දණ්ඩ වර්ගයේ දී දඬුවම පිළිබඳ ව මේ කරුණු ගෙන හැර දක්වන අතර **ආත්ම දමනය** හෙවත් තම **සිත දමනය** කරගැනීම පිළිබඳ කරුණු රැසක් ද ඇතුළත් වේ. ඒ අතර කෙලෙස් සෝදා හැරීම සඳහා නිෂ්ඵල ව්‍රත රැකීම. ගිහියෙකු වුවත් සියලු කෙලෙස් සෝදාහළේ නම් භික්ෂුවක් යයි කීමට හැකිය වැනි විශේෂ කරුණු ද මෙහි ඇතුළත් ව තිබේ. මෙහි ගාථා සංඛ්‍යාව දාහතකි. අටුවාවේ ඇතුළත් නිදානකතා එකොළහකි.

### 5.5.3.1 තමා මෙන් ම අන් අයත් දණ්ඩනයට බිය වෙතියි සිතනු.

බුදුරදුන් දවස ඡබ්බග්ගිය (හය දෙනාගේ කණ්ඩායම) සහ සත්තරසවග්ගිය (දාහත් දෙනාගේ කණ්ඩායම) නමින් අකටයුතු කම් කළ භික්ෂු කණ්ඩායම් දෙකක් විය. දිනක් සප්ත රස වග්ගිය භික්ෂූන් වහන්සේලා, තමන්ට සෙනසුන් පිළියෙල කරමින්සිටියදී එතැනට පැමිණි ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා, අප වැඩිහිටියෝ වෙමු මේ සෙනසුන් මුලින් ම ලැබිය යුත්තේ අපටයයි කීහ. එවිට සත්ත රස වග්ගිය භික්ෂූහු, කල් ඇතිව පැමිණ මේවා පිළියෙල කරගත්තේ අප ය එබැවින්, කිසිවෙකුට නො දෙන්නෙමුයි කීහ. එයින් කිපුණු ඡබ්බග්ගිය භික්ෂූන් ඔවුන්ට පහර දුන්හ. එයින් බියපත් වූ සත්තරස වග්ගීය භික්ෂූහු මහ හඬින් කෑගසූහ.

ඒ පුවත ඇසූ බුදුරජාණන් වහන්සේ දෙපිරිස ම කැඳවා මහණෙනි, භික්ෂූන් මෙවැනි දේ නොකළ යුතුයයි අවවාද කොට ''**යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තියං**'' යනුවෙන් පහරදීම තහනම් කොට ශික්ෂා පදයක් ද පනවා මේ ගාථාවෙන් දහම් දෙසූහ.

"සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය, න ඝාතයෙ "

**පදාර්ථය:**

**දණ්ඩස්ස,** දඬුවමින් හෝ පහර දීමෙන්; **සබ්බෙ තසන්ති,** සියලු දෙනා තැති ගනිති. **මච්චුනො,** මරණයට, **සබ්බෙ භායන්ති,** සියලු දෙනා බිය වෙති; **අත්තානං උපමං කත්වා,** තමා උපමා කරගෙන; **න හනෙය්‍ය** අනුන්ට පහරදීමෙන් වැළකිය යුතු ය, **න ඝාතයෙ,** පහර දෙවීමෙන් ද වැළකිය යුතු ය.

**විවරණය:**

**අත්තානං උපමං කත්වා.** සියලු දෙනා දණ්ඩනයට හෙවත් පහර දීම් වලට බියවෙති. මමත් ඊට බිය වෙමි. වෙනත් කෙනෙකු මට පහර දෙනවාට මා බිය නම් මා පහර දෙනවාට අනුනුත් බියවෙනු ඇත. යනුවෙන් තමා ම උපමා කරගෙන අනුන්ට පහරදීමෙන් වැළකිය යුතු බව මින් කිය වේ. සංයුත්ත නිකායේ වෙළුද්වාරෙය්‍ය සූත්‍රයේදී මෙම ධර්ම න්‍යාය දක්වා ඇත්තේ අත්තූපනායික ධර්මය නමිනි. උපනායික යනු උපමා කිරීම නොව තමා ඉදිරියටගෙන බැලීම ය. අනුන්ට හිංසා කරන්නට පෙර එය තමාට වූවොත් කෙසේදැයි සිතීමයි.

## 5.5.3.2 සියල්ලෝ ම ජීවිතයට ප්‍රිය වෙති.

ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා සහ සත්තරස වග්ගිය භික්ෂූන් වහන්සේලා අතර නැවත වරක් ගැටුමක් ඇති විය. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂුවක් කිසිවෙකුට පහර නොදිය යුතු යයි සික පදයක් පනවා තිබූ නිසා එවර ඡබ්බග්ගිය භික්ෂූන් පහර දුන්නේ නැත. ඒ වෙනුවට සත්තරස වග්ගීය භික්ෂූන්ට අත උළුක් කොට හෝ දඬු මුගුරු උළුක් කොට පහර දෙන ලෙසක් පෙන්වූහ. එයින් බියපත් සත්තරසවග්ගිය භික්ෂූහු කෑගැසූහ. එවිට ද ඒ භික්ෂූන් කැඳවා අවවාද කළ බුදුරජාණන් වහන්සේ පහර දීමට මෙන් අත උළුක් කිරීම ද තහනම් කරමින් "**යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තල සත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තියං**" යනුවෙන් තලසත්තික යනුවෙන් අත උළුක් කිරීම පිළිබඳ පචිති ඇවතක් පනවා මේ ගාථාවෙන් දහම් දෙසූහ.

"සබ්බෙ තසන්ති දණ්ඩස්ස
සබ්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ "

පදාර්ථය:

**සබ්බෙ**, සියල්ලෝ; **දණ්ඩස්ස**, දණ්ඩනයට හිංසාවට; **තසන්ති**, බියවෙති; **සබ්බෙසං**, සියල්ලන්ට; **ජීවිතං**, ජීවිතය, **පියං**, ප්‍රිය ය, **අත්තානං උපමං කත්වා**, මමත් මගේ ජීවිතයට ප්‍රිය නොවේදැයි තමා ම උපමාකොට; **න හනෙය්‍ය**, පහර නොදිය යුත්තේ ය. **න ඝාතයෙ** අනුන් ලවා හෝ පහර දීම නොකළ යුත්තේ ය.

විවරණය:

**න හනෙය්‍ය, හන** (හිංසා කිරීමෙහි) ධාතුවෙන් නිපන් සප්තමී ආඛ්‍යාතයෙකි. **හන** යන්න හිංසා කිරීමට මෙන්ම නැසීමට ද යෙදේ. මේ ගාථා දෙකෙහි ම එය යෙදී ඇත්තේ හිංසා කිරීම පහර දීම සඳහාය. ඝාතයේ යනු ද හන ධාතුවෙන් ම හැදෙන ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි.

### 5.5.3.3 තම සුව පතා අනුන් නොපෙළනු.

දිනක් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිරෙද්දී අතර මග ළමයින් පිරිසක් ගැරඬියෙකු වටකර ගෙන පහර දෙනු දුටහ. දරුවෙනි, ඔබ මේ කුමක් කරන්නහු දැයි උන්වහන්සේ ඇසූහ. සර්පයෙකුට දණ්ඩෙන් පහර දෙමුයි දරුවෝ කීහ. එසේ පහර දෙන්නේ මන්දැයි බුදුරදුන් විමසූ විට ස්වාමීනි, අපට දෂ්ට කරාවියයි බියෙන් පහර දෙමුයි කීහ. එවිට උන්වහන්සේ දරුවෙනි, අද තමාගේ සුවය තකා මෙසේ මේ සතාට පහර දෙන ඔබට උපනුපන් තැන සැපයක් නම් ලැබෙන්නේ නැතැයි අවවාද කරමින් මේ ගාථා දෙක දේශනා කළහ.

> "සුඛ කමානි භූතානි
> යො දණ්ඩෙන විහිංසති
> අත්තනො සුඛමෙසානො
> පෙච්ච සො න ලභතෙ සුඛං "

පදාර්ථය:

**යො**, යමෙක්; **අත්තනො සුඛං එසානො**, තමාගේ සුවය බලාපොරොත්තුවෙන්; **සුඛ කාමානි භූතානි**, සැප කැමති වෙනත් සත්වයන්ට **දණ්ඩෙන විහිංසති**, දඬු ආදීයෙන් හිංසා කෙරෙත් නම්; **සො**, හෙතෙම; **පෙච්ච**, පරලොවදී, **සුඛං න ලභතෙ**, සැපයක් නම් නොලබන්නේ ය.

> "සුඛ කාමානි භූතානි
> යො දණ්ඩෙන න හිංසති
> අත්තනො සුඛමෙසානො
> පෙච්ච සො ලභතෙ සුඛං "

පදාර්ථ:
**යො**, යමෙක්; **අත්තනො සුඛං එසානො**, තමාගේ සැප බලාපොරොත්තුවෙන්; **සුඛ කාමානි භූතානි**, සැප කැමති සත්වයන්ට; **දණ්ඩෙන න හිංසති**, දඬු ආදියෙන් පහර නොදෙයි නම්; **සො**, හෙතෙම **පෙච්ච**, පරලොව දී; **සුඛං ලභතෙ**, සැප ලබන්නේ ය.

විවරණය:
**අත්තනො සුඛමෙසානො**, තමාගේ සුවය පතා අනුන්ට හිංසා කිරීම අසාධාරණ ය මන්ද **සුඛ කාමානි භූතානි**, සත්වයෝ කවුරුත් තමා වගේ ම සැප කැමැත්තො වෙති. අද සැපය ගැන සිතා එසේ කළත් පරලොව දී නම් එය සැපයක් නොවන්නේ ය. එයින් ඔහුට ලැබිය යුතු නිවන් සුවය පමණක් නොව දෙව් සැපය හෝ මිනිස් සැපයවත් නො ලබා අපාදුක් විඳින්නට සිදු වන්නේ ය.

## 5.5.3.4 කළ කළ දේ පල පල දේ.

කුණ්ඩධාන තෙරුන් වහන්සේ පෙර කළ පාපකර්මය කින් ඉතා අශෝභන විපාකයක් විඳි කෙනෙකි. උන්වහන්සේ පැවිදි උපසම්පදා වූ දවසේ පටන් යන යන තැන පසුපසින් ගැහැණියක් යනු අන් අයට පෙනේ. ඒ බව උන්වහන්සේට නොපෙනේ එයින් උන් වහන්සේ මිනිසුන්ගේ නොයෙකුත් උසුළු විසුළුවලට ලක්වෙති. පිණ්ඩපාතය දෙන දායකයෝ ඔබ වහන්සේගේ සහායිකාවට යයි කියා වැඩිපුර දන් කොටසක් දෙන අවස්ථා ද තිබිණ. ඇතැම් භික්ෂූන් වහන්සේලා මෙය දැක උන්වහන්සේ දෙව්රම් වෙහෙරෙන් පිටමං කරන ලෙස අනේ පිඬු සිටුතුමාට කීහ. එසේ ම තම වෙහෙරට වැද්ද නොගන්නැයි විශාඛා උපාසිකාවට ද දැනුම් දුන්හ. එවිට එය බුදුරජාණන් වහන්සේ විසින් විසඳනු ඇතැයි කියා ඔවුහු නිහඬ වූහ. අන්තිමේ දී උන්වහන්සේලා මෙය කොසොල් රජතුමාට ද දැනුම් දුන්හ. රජතුමා උන්වහන්සේගේ ආවාසය වටා රැකවල් ලා පරීක්ෂා කරවී ය. දුරදී උන්වහන්සේ පිටුපස ගැහැණියක් සිටිනු පෙනුණත් කුටිය පුරා පරීක්ෂා කර බැලූ රජ තුමාට එවැනි කෙනෙකු හමු නොවී ය. අන්තිමේදී රජතුමා මෙය කිසියම් මායාකාරී දෙයක් බවත් තෙරුන්වහන්සේ අත වරදක් නැතිබවත් වටහා ගෙන ස්වාමීනි, මේ කාරණය නිසා ඔබ වහන්සේට දාන මානදියෙන් හිරිහැරයක් වුවහොත් රජගෙදරට වඩිනු මැනැවැයි කියා යන්නට ගියේ ය.

සියලු පැමිණිළි අසාර්ථක වූ විට පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ඇතැමෙක් සොෂා කරන්නට වූහ. මෙතුවක් මේ පිළිබඳව ලැජ්ජාව නිසා කරබාගෙන සිටි කුණ්ඩධාන හිමියෝ රජතුමාගේ විනිශ්චයෙන් පසු තමාට දුස්සීලයෙකැයි දොස් කියන භික්ෂූන්ට දුස්සීලයා මම නොව ඔබලා යයි පෙරලා දොස් කියන්නට පටන් ගත්තේ ය.

ඒ භික්ෂූන් වහන්සේලා ඒ බව බුදුරජාණන් වහන්සේට පැමිණිළි කළහ. කුණ්ඩධාන තෙරුන් කැඳවා ඔබ මේ ඇත්තන්ට දුස්සීලයයි චෝදනා කළේ ඇයිදැයි විමසූ විට තමාට ද එසේ චෝදනා කළ නිසා යයි පැවසූහ. එසේ චෝදනා කළේ මන්දැයි භික්ෂූන්ගෙන් ඇසූ විට මුන් වහන්සේ පිටුපස ගැහැණියෙකු හැසිරෙනු දුටු නිසායයි උන්වහන්සේලා කීහ. එවිට කුණ්ඩධාන තෙරුන්ගෙන් විමසන බුදුරජාණන් වහන්සේ මොවුන් චෝදනා කර ඇත්තේ

එවැන්නක් දුටු නිසා ය. ඔබ ඔවුන්ට චෝදනා කර ඇත්තේ එබඳු හේතුවක් නැතිව ය. ඔබ මේ අපහාස විඳින්නේ පෙර කළ කර්මයක් නිසා ය. නැවතත් එබඳු කර්මයක් ම කරන්නට සැරසෙන්නේදැයි අසා උන්වහන්සේ ට අවවාද කළහ. එවිට උන්වහන්සේ පෙර කළ පාප කර්මය කුමක්දැයි භික්ෂූහු විමසා සිටියෝ ය.

බුදුරජාණන් වහන්සේ මහණෙනි, කාශ්‍යප බුදුන් දවස භික්ෂූන් වහන්සේලා දෙනමක් එක මවකගෙ දරුවන් සේ සමගියෙන් විසූහ. එක් දේවතාවියකට තම නොපනත් කම නිසා උන්වහන්සේලාගේ විස්වාසය බිඳ බලන්නට සිතිණ.

දිනක් මේ දෙදෙනා වහන්සේ පොහොය කරනු පිණිස සංඝයා රැස්වන සීමාව කරා යමින් සිටියහ. අතර මගදී එක් නමක් කැලයට ගොස් සිරුරු කිස කර එන විට මේ දෙව්දුව මිනිස් ගැහැණියක වෙසින් ඇඳිවත සකස් කරමින් උන්වහන්සේ පසුපස එන ලෙස පෙන්වූවා ය. මෙය දුටු අනෙක් භික්ෂූන් වහන්සේට එය එකවරම අදහාගත නොහැකි වුවත් නැවත නැවත උවමනාවෙන්ම බලන විටත් ඇය එසේ ම පෙණුනු නිසා සැබෑවක් ලෙස හැඟී ගියේ ය. ඔබ වහන්සේ සිල් බිඳගත්තා නොවේදැයි ඇසූ විට එවැන්නක් කිසිසේත් ම සිදු නොවූ බව ඒ භික්ෂුව කීය. තමා දෑසින් ම දුටු දේ නැතැයි කියන්නේ කෙසේදැයි කියා අනෙක් භික්ෂූන් වහන්සේ හැර දමා තනිව ම යන්නට ගියේ ය. පෝය සීමාවේ දී ද උන්වහන්සේ මේ භික්ෂුව සමග පොහොය කරන්නට අකමැති විය.

දෙව්දුවට තම කළ ක්‍රියාවේ බරපතල කම වැටහුණේ එවිට ය. වහා ම සංඝයා ඉදිරිපිට පෙනී සිට ඇය. උන්වහන්සේගේ වරදක් නැති බවත් තමා නිකමට කළ දෙයක් කියා පාපොච්චාරණය කළා ය. එය පිළිගත් භික්ෂූන් වහන්සේලා පොහොය කර්ම කළහ.

ඒ පාප කර්මයෙන් ඇය බුද්ධාන්තරයක් ම නිරාදුක් වින්දා ය. මෙකළ සැවැත් නුවර මෙසේ ඉපිද පැවිදි වූ උන්වහන්සේ පිටුපස ගැහැණු රුවක් පෙනෙන්නේ ඒ පාප කර්මය නිසා බව වදාළ බුදුරජාණන් වහන්සේ මින්මතු උන්වහන්සේට කිසිවක් නොකියන ලෙස භික්ෂූන්ටත් වදාරා එසේ කීවත් එකට එක නොකියන ලෙස කුණ්ඩධාන තෙරුන්ටත් අවවාද කොට මේ ගාථාව දේශනා කළ සේක.

> **"මා වොච ඵරුසං කඤ්චි**
> **වුත්තා පටිවදෙය්‍යු තං**
> **දුක්ඛා හි සාරම්භ කථා**
> **පටිදණ්ඩා ඵුසෙය්‍යු තං "**

පදාර්ථ :

**කඤ්චි;** කිසිවෙකුට; **ඵරුසං,** පරුෂ වචන; **මා අවොච,** නොකියන්න, මන්ද; **වුත්තා,** එසේ ඔබ පරුෂ වචන කී විට ඔවුන් ඔබට ද පරුෂ වචන කියනු ඇත; **සාරම්භ කථා,** එකට එක කියා ගැනීම; **දුක්ඛා හි,** දුකක්ම ය, **පටිදණ්ඩා තං ඵුසෙය්‍යුං,** ඔබ අනුන්ට පහරදීම් ආදිය කළොත් පෙරලා ඔබට ද පහර කෑමට සිදු වන්නේ ය.

"සචෙ නෙරෙසි අත්තානං
කංසො උපහතො යථා
එස පත්තො'සි නිබ්බානං
සාරම්භො තෙ න විජ්ජති "

පදාර්ථ:

**සචෙ**, ඉදින්; **උපහතො**, කැඩී පිපිරී හඬනොහැගෙන; **කංසො යථා**, ලෝහ තලියක් මෙන්; **අත්තානං**, තමා **නෙරෙසි**, අපවාද ඉදිරියේ නිහඬ කර ගන්නෙහි නම්, **එකො**, ඒ ඔබ; **නිබ්බානං පත්තො සි**, නිවීමට පත් වූවේ වෙහි; (එවිට) **තෙ**, ඔබට; **සාරම්භො**, එකට එක කියුම් හෝ කෙරුම්; **න විජ්ජති**, ඇති නොවන්නේය.

විවරණය:

**සාරම්භ කථා**, යනු එකට එක කියා ගැනීමයි. බැන්නොත් බැනීම, ගැහුවොත් ගැහීම, සාමාන්‍ය ජනයාගේ සිරිතයි. එය බරපතල දුක්වලට, ඇතැම් විට මිනී මරා ගැනීමට පවා හේතු වේ. ලෝහ තලියකට තට්ටු කළ විට හඬක් නැගේ, බිඳුණු තලියක හඬක් නැත. එසේම වචනවලින් පහර දෙන විට නිහඬව සිටීමට හැකිනම් ඔබ නිවුනු කෙනෙකි. ඒවායින් සහමුලින්ම වැළකිය හැකිනම්, ඔබ එමගින් නිවනට ම යන්නෙහිය. සංයුත්ත නිකායේ වේපචිත්ති සූත්‍රයේ දී කුදලාගෙන ආ වේපචිත්ති අසුරේන්ද්‍රයා සක් දෙවිඳුට අසභ්‍ය වචනයෙන් බැණවැදී සක් දෙවිඳු නිහඬ ය. ඔබ නිහඬ වන්නේ බියටදැයි මාතලී අසයි එවිට සක්දෙවිඳු පවසන්නේ කළහකාරී අවස්ථාවක අනෙකා කෝප වී ඇති බව දැක එක් අයෙක් සන්සුන් වන්නේ නම් එයින් දෙදෙනාට ම යහපතක් සිදුවන බවත් එසේ ඉවසන්නා ජයග්‍රහණය කිරීමට අමාරු ම යුද්ධයක් ජයගන්නෙකු බවත්ය.

## 5.5.3.5 බිහිසුණු විපත් දැක දැක එහි ම ඇලෙන්නෝ.

එක් පොහෝ දිනක සැවැත් නුවර පූර්වාරාමයේ පන්සීයක් පමණ ස්ත්‍රීහු පෙහෙවස් සමාදන්ව සිටියා ය. විශාඛා මහා උපාසිකාව ඔවුන් වෙත ගොස් මැණිවරුණි, ඔබ පෙහෙවස් සමාදන් වූයේ කුමක් පතාගෙන දැයි විමසුවා ය. තමා පෙහෙවස් රකින්නේ පරලොව දෙව්සැප පතාගෙන බව මහළු කාන්තාවෝ කීහ. සසරෙදීවත් බිරියන් කිහිපදෙනෙකු ඇති සැමියෙකු ලඟ සපත්නියක වීමෙන් වළකින්නට පෙහෙවස් රකින බව මැදිවියේ අය පැවසූහ, තරුණියන් පැවසුවේ කුළුදුලේ ම පුතෙකු ලබන්නට පතන බව ය. තරුණ වියේදී ම පතිකුලයට යන්නට පතන බව කුඩා කුමරියෝ කීහ. විශාඛා මහා උපාසිකාව ඔවුන් සමඟ බුදුරදුන් වෙත ගොස් ඔවුන්ගේ මේ අපූරු පැතුම් උන්වහන්සේට සැලකළා ය. එවිට බුදුරජාණන් වහන්සේ විශාඛාවෙනි, මේ සත්වයන් ජාති ජරා මරණාදී මෙතරම් බිහිසුණු විපත් දැක දැකත් සසර ම පතනවා මිස සසරෙන් මිදීමක් පතන්නෝ නම් දුර්ලභයයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

"යථා දණ්ඩෙන ගොපාලො
ගාවො පාචෙති ගොචරං
එවං ජරා ච මච්චූ ච
ආයුං පාචෙන්ති පාණිනං "

පදාර්ථ:

**යථා**, යම් සේ; **ගොපාලො**, ගොපොල්ලෙක්; **දණ්ඩෙන**, කෙවිටෙන් තලමින්; **ගාවො**, ගවයන්; **ගොචරං**, තණබිම කරා; **පාචෙති** (පාජේති) දක්කන්නේ ද; **එවං**, එසේ ම; **ජරාචමච්චූ ච**, මහළු බව සහ මරණය ද **පාණීනං**; සත්වයන් ගේ ආයුෂ; **පාචෙොති**, පැසවා ක්ෂය කොට දමති.

**විවරණය:**

ජාති ජරා දෙක ගොපොල්ලා වැනිය. ජීවිතය ගවයා වැනිය. මරණය තණබිම් වැනියයි මෙහි එක් අතකින් උපමාව සැසඳේ. තව ලෙසකින් දක්වුවහොත් ජාතිය ඉපදීම සත්වයාගේ ජීවිතින්‍ද්‍රිය ය. ක්‍රමයෙන් ජරා ව්‍යාධි දෙක මරණය කරා යවයි මරණය පොරොවෙන් කැපුවා සේ ජීවිතය සිඳ දමයි. සසරට උරුම වූ මේ සැබෑව නොදකියි. සත්වයෝ සසර ම සැප සොයති.

## 5.5.3.6 තමා ඉදිකළ විහාරය දැවීම ගැන සතුටු වූ සුමංගල සිටුතුමා.

දිනක් ලක්ඛණ තෙරුන් සමග ගිජුකුළු පව්වෙන් බසින මුගලන් මහ තෙරුන්ට යොදුන් විසි පහක් තරම් දිග අජගර හෙවත් පිඹුරු ප්‍රේතයෙකු දිවැසින් දැක සිනා පහළ විය. ඔහු මහ ගිනි ජාලාවකින් දැවෙමින් සිටියේ ය. ලක්ඛණ තෙරුන් එසේ සිනාසීමට හේතුව විමසූ විට බුදුරදුන් හමුවෙහි දී කියන්නෙමියි කියා පිටත් වූහ. බුදුරදුන් හමුවේ දී මුගලන් තෙරුන් තමා දුටු දේ හෙළි කළ විට බුදුරජාණන්වහන්සේ මහණෙනි, බුදු වී බෝ මැඩ සිටියදී ම මේ ප්‍රේතයා මම දුටුවෙමි. මෙතෙක් නොකීවේ කිසිවෙකු නො අදහතියි කියායි වදාළහ. දැන් මුගලන් තෙරුන් සාක්ෂි දරණ නිසා පවසමියි කියා එම ප්‍රේතයාගේ අතීත කතාව ගෙන හැර දැක්වූහ.

කාශ්‍යප බුදුන් සමයේ සුමංගල නම් සිටුවරයෙක් විය. හෙතෙම රන් ගඩොලින් මහා විහාරයක් ඉදි කරවා බුදුරදුන්ට පූජා කළේය. දිනක් උදෑසනම බුදුන් දැකීමට යන ඔහුට නුවර දොරටුව අසල අම්බලමක හිසේ සිට පොරවා නිදන දෙපයේ මඩ තැවරුණු සොරෙකු දක්නට ලැබිණි. ඔහු දැක රෑ තිස්සේ ඇවිද දවල් නිදන්නෙකි යි කියමින් එතුමා යන්නට ගියේය. ඒ වදන් අසා කිපුණු හොරා ඒ වචනයට සිටුවරයා සමග වෛර බැඳ හත්වරක් ම සිටුවරයාගේ කුඹුරු ගිනි තැබී ය. හත්වරක් ම ගාලේ ගොණුන්ගේ පා සින්දේය. සත්වරක් සිටු මැදුර දැවීය. ඒ කිසිවකින් සිටුවරයා කම්පා නොවී ය. එයිනුත් සොරාගේ වෛරය නො සන්සිඳුණු අතර ඔහු තවත් දරුණු විය. සිටුවරයා ඉතාම ප්‍රිය කරන දෙය කුමක්දැයි සොයා ඒ බුදුන්ගේ ගඳ කිළිය බව දැනගෙන බුදුරදුන් පිඬු පිණිස වැඩි මොහොතක එහි ඇතුළු වී පැන්කළ ආදිය බිඳ දමා ගඳ කිළිය ගිනිතැබී ය. එය ගිනි ගන්න

බව ඇසූ සිටු වරයා අත්පොළසන් දී සිනාසෙන්නට විය. ඒ මන්දැයි ඇසූ විට මෙතරම් දුර්ලභ සසුනක මෙතරම් ධනයක් වැය කොට දෙවන වරටත් එබඳු විහාරයක් ඉදිකරන්නට වාසනාව ලැබීම කෙතරම් සතුටක් දැයි කියා හෙතෙම නැවත ඒ ආකාරයෙන් ම බුදුමැදුර ඉදි කළේ ය.

සිටුතුමා විහාරය ඉදිකරවා බුද්ධ ප්‍රමුඛ විසිදහසක් මහ සඟනට සත් දවසක් මහ දන් පවත්වමින් විහාර පූජාව සිදු කළේ ය. සොරා ද මොහුට දනවන්නට මොහු මරා දැමීම හැර වෙන ක්‍රමයක් නැතැයි තීරණය කොට කිණිස්සක් ගෙන සිටුවරයා මැරීමට ඒ සත් දවසම විහාරය අසල ගැවසුණු නමුත් ඉඩක් නොලද්දේ ය. සත්වන දා දන් වළඳා අවසානයේ පින් අනුමෝදන් කරන වේලාවෙහි බුදුන් වැඳ ස්වාමීනි, එක්තරා පුරුෂයෙක් මට මේ ආකාරයේ විපත් සිදු කළේ ය. අවසානයේ මා ඉතා ආශාවෙන් ඉදිකළ ගඳකිළිය ද වැනසී ය. කෙසේ වුවත් මට අද මේ මහඟු පූජාව කරන්නට ලැබුණේ ඔහු නිසා ය. මම පළමුකොට ඔහුට මේ පින පවරමියි කීය. මේ අසා සිටි සොරා මහත්සේ කම්පාවට පත්වීය. මා මේ තරම් අපරාධයක් කර තිබියදීත් බිඳුවක්වත් කෝපයක් නැතිව මොහු මට පින්දෙයි. මා මහා ද්‍රෝහියෙකි. මෙතුමාගෙන් සමාව නොගත්තොත් දෙවියෝ මට දඬුවම් කරනු ඇතැයි කියා සිටුතුමාගේ දෙපා මුල වැඳවැටී සමාව ඉල්ලී ය. මෙතෙක් විපත් තමාට කළේ ඇයි දැයි ඇසූ විට සිටුතුමා එදා කී වචනය සිහි කළේ ය. එබන්දක් කීම ගැන සොරාගෙන් සමාව ගත් සිටුතුමා ඔහුට ද සමාව දුන්නේ ය.

ඒ සොරා ආයු කෙළවර අවීචියෙහි ඉපදී එහි පැසී දන් ප්‍රේතයෙකුව මෙසේ ගිජුකුළු පව්වේ පැසෙන්නේ යයි වදාරා මේ ගාථාවෙන් දහම් දෙසූ සේක.

**"අථ පාපානි කම්මානි**
**කරං බාලො න බුජ්ඣති**
**සෙහි කම්මෙහි දුම්මෙධො**
**අග්ගිදඩ්ඪො'ව තප්පති "**

**පදාර්ථ:**

**පාපානි කම්මානි කරං,** පව්කම් කරන; **බාලො,** අනුවණයා; **අථ,** එහෙත්; **න බුජ්ඣති,** මේ පවට මෙබඳු විපාකයක් ලැබෙයියි අවබෝධ කර නො ගනී; **සෙහි කම්මෙහි,** (විපාක දෙන කල) තමා ම කළ පව්කමින්; **දුම්මෙධො,** ඒ අනුවණයා; **අග්ගිදඩ්ඪො ඉව,** ගින්නෙන් දවන ලද්දෙක් මෙන්; **තප්පති,** තැවෙන්නේ ය.

**විවරණය:**

වෛරයෙන් ද්වේෂයෙන් අනිකෙකු නසන්නාට පෙනෙන්නේ තම වෛරය පිරිමසා ගන්නේ කෙසේ ද යන්න පමණි. සොරකම් කරන්නාට පෙනෙන්නේ තම ආශාව පිරිමසා ගන්නේ කෙසේ ද යන්න පමණි. ඔවුහු එවිට ද්වේෂයෙන් ලෝභයෙන් අන්ධ වූවෝ ය. වරදක් කරන ඕනෑම කෙනෙකුට තමා කළ ක්‍රියාවේ තරම වැටහෙන්නේ පසුවය.

### 5.5.3.7 රහත් වූවත් කළකම් පල දෙන පව්කම්.

මුගලන් මහරහතන් වහන්සේ දෙව්ලොවට වැඩ දෙවියන් වීමට හේතු වූ කර්මත්, නිරයට වැඩමකොට නිරාදුක් විඳින්නන් කළ කර්මත් අසා දැගෙන අවුත් මහජනයාට කියාදීමේ සිරිතක් විය. මෙයින් මිනිස්සු බොහෝ දෙනා බුදු දහම වෙත ඇදෙති. මෙය තමන්ට ලාභ සත්කාර අඩු වීමට හේතුවක් ලෙස දුටු අන්‍ය තීර්ථකයෝ උන්වහන්සේ ඝාතනය කරවන්නට උපක්‍රමයක් යෙදූහ. මිනිසුන් මරණ අපරාධ කරුවන්ට මුදල් දී මුගලන් තෙරුන් මරන්නට යවන ලදී. ඔවුහු ගොස් තෙරුන්ගේ කුටිය වැටලූහ. එය දිවැසින් දුටු තෙරණුවෝ ඍද්ධි බලයෙන් යතුරු සිදුරින් නික්මී ගියහ. සතුරන්ගේ වෑයම අසාර්ථක විය. මෙසේ වැටලූ හැම දිනක ම තෙරණුවෝ ඍද්ධි බලයෙන් පිට වී ගැලවුනහ. මෙසේ මාස දෙක තුනක්ම සතුරන්ගෙන් ගැලවි ගැලවී සිටි මුගලන් මහ තෙරණුවෝ මෙය තමා පසු පස එන පෙර කළ කර්මයක් බව දැන අවසානයේ පිටට නොගොස් කුටියේ ම රැඳී සිටියේය. එදා එහි වැදුණු අපරාධ කරුවෝ උන්වහන්සේගේ ඇටකටු කුඩු වෙන තරමට තළා පෙළා මැරුණේ යයි සිතා පිටව ගියෝ ය.

තෙරුන් වහන්සේ ද දැන් මට පිරිනිවන් පාන්නට සිදු වී ඇත. එහෙත් බුදුරදුන් වෙත ගොස් වැඳ අවසර ගෙන පිරිනිවන් පාමියි සිතා ධ්‍යාන බලයෙන් ශරීරය නැගිටුවාගෙන බුදුරදුන් හමු වී වැඳ අවසර ගෙන බුදු රදුන්ගේ ආරාධනාව පරිදි අහසට පැන නැගී දහම් දෙසා ඍද්ධි ප්‍රාතිහාර්ය පා කාලසිලා වනයට ගොස් පිරිනිවන් පෑහ.

මෙම සිද්ධිය දැනගත් අජාසත්ත රජතුමා චරපුරුෂයන් යොදවා බීමත් සොරුන්ගේ මුවින් ම රහස දැනගෙන ඔවුන් ගෙන්වා එසේ කරන්නට අණ කළේ කවුදැයි විමසී ය. ඒ නිගණ්ඨයන් බව සොරු කීහ. රජු ඒ සොරුන්ටත් නියම කළ නිගණ්ඨයින්ටත් මරණ දණ්ඩනය පැණවීය. මේ බිහිසුණු සිදුවීම පිළිබඳ සංවේගයට පත් භික්ෂූන් වහන්සේලාට මුගලන් තෙරුන්ට පලදුන් මේ කර්මය කුමක් ද යන්න පිළිබඳ ගැටළුවක් ඇති විය. ඒ පිළිබඳ බුදුරදුන්ගෙන් විමසූ කල උන්වහන්සේ අතීත පුවත මෙසේ ගෙනහැර දැක්වූහ.

පෙර බරණැස් නුවර එක් කුල පුත්‍රයෙක් තම අඳ මව්පියන් ආදරයෙන් රැකබලා ගෙන සිටියේ ය. තනිව ම සියලු කටයුතු කිරීමට අපහසු නිසා ඔහුට බිරියක් කැඳවාගෙන එන්නැයි මව් පියන් කොතෙක් කීවත් ඔහු අකමැති විය. අන්තිමේදී මව්පියන්ගේ පෙරැත්තය නිසා ම කුමරියක් කැන්දාගෙන ආවේ ය. මුලදී ඇය ඉතාමත් මැනවින් අඳ මව් පියන්ට සත්කාර කළ නමුත් කලක් යන විට ඔවුන් පෙන්නන්නට බැරි තරම් විය. ඇය නොයෙකුත් උපක්‍රම කොට කෙසේ හෝ සැමියාගේ සිත මව්පියන් කෙරෙහි බිඳවූවා ය. ඇගේ බස් අදහා කෝපයට පත් පුත්‍රයා මව් පියන් මරවන්නට තීරණය කළේ ය.

දුර බැහැර නෑදෑ ගෙදරකට කැඳවාගෙන යන බව අඟවා අඳ මව්පියන් කැලයක් මැදට කැඳවාගෙන ගිය ඔහු මංකොල්ලකාර සොරුන්ට හසු වූ බව අඟවා මහා සෝෂාවක් කොට මව්පියන් තළාපෙළා මරා කැලේ ම දමා පෙරලා ආවේ ය. ඔහු කළ මේ කර්මය නිසා අවුරුදු ලක්ෂ ගණන් නිරයේ පැසී මේ අවසාන ආත්ම භාවයේ දී අග්‍රශ්‍රාවකව මහා ඍද්ධි බල ඇතිව සිටියදීත් මෙසේ තැළුම් පෙළුම් ලබා මරණයට පත් විය. සොරුන්

පන්සියයක් අන්‍ය තීර්ථකයෝත් ඔවුන් කිසිවෙකුට ද්වේෂයක් හිංසාවක් නොකළ මා පුත්‍ර මුගලන්ට පීඩාකොට ඊට අනුකූල මරණ දඬුවම ලැබූහ. මෙසේ අහිසංසකයින්ට හිංසා කරන අය දස ආකාරයකින් විනාශ වන්නාහයි වදාරා මේ ගාථා දේශනා කළ සේක.

"යො දණ්ඩෙන අදණ්ඩෙසු
අප්පදුට්ඨෙසු දුස්සති
දසන්නමඤ්ඤතරං ඨානං
ඛිප්පමෙව නිගච්ඡති "

**පදාර්ථ :**

**යො,** යමෙක්; **අදණ්ඩෙසු,** කිසිසේත් හිංසාවක් දඬුවමක් කිරීමට නුසුදුසු, **අප්පදුට්ඨෙසු,** කිසිවෙකුට ද්වේෂ නොකරන නිරපරාදී පැවිදි උතුමන් වැනි ඇත්තන්ට; **දණ්ඩෙන,** දඬුමුගුරු අවි ආදියෙන්; **දුස්සති,** අපරාධ කරයිද; (හෙතෙම) **දසන්නං,** මතු කියන දුක් විපාක දහයෙන්; **අඤ්ඤතරං ඨානං,** එක් විපාකයකට හෝ; **ඛිප්පං එව,** වහා ම **නිගච්ඡති,** පැමිණෙන්නේ ය.

"වෙදනං ඵරුසං ජානිං
සරීරස්ස ච භෙදනං
ගරුකං වාපි ආබාධං
චිත්තක්ඛෙපඤ්ච පාපුණෙ"

**පදාර්ථ:**

ඒවා නම්, **ඵරුසං වෙදනං,** දරුණු ශාරීරික වේදනාවකට හෝ **ජානිං,** ධන හානිය කට හෝ; **අපි,** තව ද; **ගරුකං ආබාධං** වා, බලවත් රෝගයකට හෝ; **චිත්තක්ඛෙපං වා,** සිත උමතු වීමකට හෝ; **පාපුණෙ,** පැමිණෙන්නේ ය.

"රාජතො වා උපස්සග්ගං
අබ්භක්ඛානං ච දාරුණං
පරික්ඛයං ච ඤාතීනං
භොගානං ච පභඞ්ගුරං"

පදාර්ථ:-

**රාජතො,** රජුන්ගෙන් වන; **උපස්සග්ගං වා,** දණ්ඩනයකට පීඩනයකට හෝ; **දාරුණං,** දරුණු; **අබ්භක්ඛානං වා,** අපරාධ චෝදනාවලට හෝ; **ඤාතීනං,** ඤාතීන්; **පරික්ඛයං වා,** අහිමි වීමකට හෝ; **භොගානං වා,** භවභෝග සම්පත්වල; **පභඞ්ගුරං,** විනාශයකට හෝ පැමිණෙන්නේ ය.

"අථ වාස්ස අගාරානි
අග්ගි ඩහති පාවකො
කායස්ස භෙදා දුප්පඤ්ඤො
නිරයං සො උපපජ්ජති "

පදාර්ථ:

අථ වා, එසේ නැතහොත්; **අස්ස,** ඔහුගේ; **අගාරානි,** ගෙවල්; **පාවකො අග්ගි,** රුදුරු ගින්න; **ඩහති,** දවයි, අවසානයේ; **සො දුප්පඤ්ඤො,** ඒ අනුවණයා; **කායස්සභෙදා,** මරණින් මතු; **නිරයං උපපජ්ජති,** නිරයෙහි උපදී.

විවරණය:

සියල්ල පෙරකළ කර්මයෙන් ම සිදු වේ යයි ඉගැන්වීමක් බුදුදහමේ නැත. අපට සිදුවෙන විපත් උතු නියාම, බීජ නියාම, චිත්ත නියාම, කම්ම නියාම, ධම්ම නියාම, යන නියාම ධර්ම පහකට අනුව සිදුවිය හැකි ය. කර්මය ඒ පහෙන් එකක් පමණි. මෙයින් බහුලව දුක් විඳින්නට සිදුවෙන්නේ කර්ම නියාමයත්, ආවේගශීලී වීම්, ආදියෙන් සිතඅවුල් වීමේ චිත්ත නියාමයත් නිසා ය.

සැබෑ අහිංසකයන්ට හිංසා කිරීම නිසා කෙනෙකුට ලැබිය හැකි විපාක දහයක් මෙහි දක්වේ. ඒ අනුව අප ජීවිතයේ විඳින දුක් කම්කටොළු වලින් සෑහෙන ප්‍රමාණයක් මෙබඳු පෙර කළ කර්ම නිසා සිදුවෙන බව සිතීමට සිදුවේ. එය හරියටම නිගමනය කළ හැක්කේ **චුතූපපාත** හෙවත් **දිබ්බචක්ඛු ඤාණය** ඇති උතුමන්ට ය. එහෙත් විඳවන ආකාරය අනුව අපට ද යම්තාක් දුරකට සිතාගත හැකි ය.

## 5.5.3.8 සිවුරු හැඳ පෙරවූ පමණකින් භික්ෂුවක් නොවේ.

සැවැත් නුවරවැසි එක් කෙළෙඹියෙක් සිය බිරිය කළුරිය කළ කල්හි පැවිදි විය. ඔහු පැවිදි වන විට තම ආවාසයට මුළුතැන්ගෙට අවශ්‍ය බඩු බාහිරාදිය මෙන්ම උයන පිහන උපකරණ ආහාර ද්‍රව්‍යය පවා රැස් කර තබා දාසයන් ලවා අහර පිසවා වළඳමින් වාසය කරන්නට විය. සිවුරු පිරිකරද දවසට කීපවරක් ම ගිහි ගෙදර දී මෙන් මාරු කරමින් හඳියි පොරවයි. එනිසා දිනපතා සෝදා වේලන සිවුරු ඇඳ ඇතිරිලි ආදිය බොහෝ ය.

දිනක් විහාර චාරිකාවේ වඩින භික්ෂූන් වහන්සේ මෙසේ සෝදා වේලෙන්නට දමා තිබූ සිවුරු පිරිකර දැක මෙතරම් සිවුරු පිරිකර කාගේ දැයි විමසූ විට සියල්ල ම මේ එක ම භික්ෂුවකගේ බව දැන ඒ බව බුදුරජාණන් වහන්සේට දන්වන ලදී. ඒ භික්ෂුව කැඳවා මේ පුවත සැබෑවක් දැයි විමසූහ. එය සැබෑයයි කී කල්හි මා මෙතරම් අල්පේච්ඡතාව පිළිබඳ දහම් දෙසද්දී මෙසේ බහු භාණ්ඩික වූයේ මන්දැයි ඇසූහ. එයින් කිපුණු ඒ භික්ෂූන් වහන්සේ එසේ නම් මට ඉන්නට කියන්නේ මෙසේදැයි කියමින් බුදුරදුන් ඉදිරියේ ම පොරවා සිටි සිවුර බිම හෙළී ය. ඒ භික්ෂුව කළ ක්‍රියාව හෙලා දුටු බුදුරජාණන් වහන්සේ අද මේ බුදු සසුනේ පැවිදිව සිව්පිරිස මැද සිවුර බිම හෙලා විළිබිය නැතිව හැසිරෙන ඔබ පෙරදවස

දිය රකුසෙකු වී වසර දොළහක් ම දේව ධර්මය හෙවත් ලැජ්ජා භය දෙක දන්නා කෙනෙකු සොයමින් සිටියා නොවේදැයි කියා දේව ධර්ම ජාතකය වදාළහ.

අනතුරුව ඔබ අල්පේච්ඡ යයි කියා සිව් පිරිස මැද කළේ අයුතු ක්‍රියාවකි. හැඳීම් පෙරවීම්වලින් තොර ශ්‍රමණයොත් සිටිති. එහෙත් එපමණකින් ශ්‍රමණයෙකු නොවන්නේ යයි වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ගාථාවෙන් දහම් දෙසූ සේක.

> "න නගගචරියා න ජටා න පඞ්කා
> නා නාසකා ථණ්ඩිල සායිකා වා
> රජොච ජල්ලං උක්කුටිකප්පධානං
> සොධෙන්ති මච්චං අවිතිණ්ණ කඞ්ඛං "

**පදාර්ථ:**

**නගගචරියා,** නිවන හෝ පාරිශුද්ධිය කැමැත්තෙන් නග්නව හෙවත් නිගණ්ඨ තපස්කම් කළත්; **න ජටා,** ජටාධර තවුසෙක් වුවත්; **න පඞ්කා,** දත් නොමැද ඇඟ මඩ තවරා තපස් කම් කළත්; **න අනාසකා,** අහර නොවළඳා තපස් කම් කළත්; **ථණ්ඩිලසායිකා** බිම ලගින තපස් කම් කළත්; **උක්කුටිකප්පධානං,** උක්කුටිකව හිඳිමින් වෙර වඩන තපස්කම් කළත් මේ කිසිවකින්; **අවිතිණ්ණකඞ්ඛං,** සෝවාන් මාර්ගයෙන් සැකයවත් නොනැසූ; **මච්චං,** මිනිසා; **න සොධෙන්ති,** පාරිශුද්ධියට පත් නොවන්නේය.

**විවරණය:**

මෙහි එදා සමාජයේ පැවති තපස් චර්යා හතක් කියවේ. මේ සියල්ල නිසරු ය. **අවිතිණ්ණකඞ්ඛං** යනු සැකය දුරු නොකළ යන අදහසයි. විචිකිච්ඡාව දුරුවන්නේ සෝවාන් මාර්ගයෙනි. ඒ අනුව මේ කිසිවකින් සෝවාන් මාර්ගයෙන් වත් ලැබෙන පාරිශුද්ධි නොලැබේ යන අදහසයි.

## 5.5.3.9 අහසේ දී පිරිනිවන් පෑ රහතන් වහන්සේ.

සන්තති ඇමතිවරයා කොසොල් රජතුමාගේ බල සම්පන්න ආමාත්‍ය වරයෙකි. වරක් පසල් දනව්වක ඇති වූ කැරැල්ලක් සන් සිඳුවීම නිසා අතිශයින් සතුටට පත් රජතුමා ඔහුට සත් දවසකට රාජ්‍යය ද පවරා ඔහුට විනෝද වීමට ඉතා දක්ෂ නිළියක්ද දුන්නේ ය. සත් දවසක් ම සුරාවෙන් මත්ව විනෝදයෙන් ගත කළ ඔහු සත්වන දින ඇතුපිටින් නාන තොටට යන අතර මහ මග පිඬු පිණිස වඩින බුදු රදුන් දැක සුරා මතින් ඇතුපිට හිඳ ගෙනම බුදුරදුන්ට හිස නමා ගියේ ය. බුදුරජාණන් වහන්සේ සිනා පහළ කළහ. ඒ මන්දැයි අනඳ තෙරුන් ඇසූ විට ආනන්දය මේ ඇමතිවරයා අද ඔය සළු අභරණ පිටින් ම මා වෙත පැමිණ සතර පද ගාථාවකින් බණ අසා රහත්ව අහසේ හිඳ ම පිරිනිවන්පාන්නේ යයි වදාළහ.

බුදුරදුන්ගේ මේ ප්‍රකාශය අසල වූ මිනිසුන්ට ඇසුණි. එය ඇසූ මිථ්‍යා දෘෂ්ටිකයෝ මේ ගෞතමයන් වහන්සේ කටට ආවක් කියති. සුරාමතින් සිටින මේ ඇමතිවරයා

සර්වාභරණයෙන් සැරසී සිටිය දී රහත් වන්නේ කෙසේ ද? අද උන්වහන්සේගේ ප්‍රකාශය බොරු වන හැටි බලමුයි සිතූහ. සම්‍යක් දෘෂ්ටිකයෝ අද බුදුරදුන්ගේ මහානුභාව බලය කොතරම් දැයි බලමුයි සිතූහ.

සන්තති ඇමති වරයා ද එදා උදේවරුව ම ජල ක්‍රීඩා කොට උයනට ගොස් මත්පැන් හලෙහි හුන්නේ ය. ඔහුගේ නිළිය ද පිරිස් මැද නෘත්‍ය ගීතාදිය දක්වන්නට වූවා ය. ශරීරයේ රංගලීලාව දක්වීමේ පහසුව සඳහා සත් දවසක් ම අල්පාහාරව සිටි ඇය එදා නැටුමෙන් අධිකව වෙහෙසවීම නිසා කුස ගින්න දැඩි වී හෘදය වස්තුව අක්‍රීය වී දැස් මුව විවරව ඇදවැටී එතැනම මළා ය. ඒ දුටු සන්තති ඇමතියාට මහත් ශෝකයක් ඇති විය. සුරාමත සිඳී ගියේ ය. සෝකය දරාගත නොහැකිවූ හෙතෙම සවස් වරුවේ බුදුරදුන් වෙත ගොස් වැඳ ස්වාමීනි, මම මහත් ශෝකයට පත්ව සිටිමි. මට පිළිසරණ වනු මැනැවැයි කීය. එවිට බුදුරජාණන් වහන්සේ අමාත්‍යය, ඔබ මේ ස්ත්‍රියගේ මරණය නිසා ම හැඬූ කඳුළු සිව් මහා සයුරටත් වඩා වැඩි යයි වදාළහ. එම දේශනාව අවසානයේ සන්තති මහාමාත්‍යවරයා රහත් බවට පත් විය. අනතුරුව තමාගේ ආයුෂ ප්‍රමාණය බැලූ එතුමාට ජීවත් වීමට වැඩි කාලයක් නැති බව දැක බුදුරදුන් වැඳ පිරිනිවන් පෑමට අවසර පැතූහ. මිථ්‍යා දෘෂ්ටිකයන්ගේ දුර්මත දුරුවීමටත් සම්‍යක් දෘෂ්ටිකයන්ගේ ශ්‍රද්ධාව වැඩි වීමටත් මෙය අවස්ථාවක් වන බව දුටු බුදුරජාණන් වහන්සේ අහසේ සිට ඔබ පෙර කළ කර්මය විස්තර කරන්නැයි වදාළහ. එසැණින් අහසට පැන නැගුණු සන්තති රහතන් වහන්සේ එහිදී ම බුදුන් වැඳ අහසේ පලක් බැඳගෙන තමා පෙර කළ ඒ මහා පුණ්‍ය කර්මය විස්තර කළේ ය.

එතුමා ඊට කල්ප අනූ එකකට පෙර විපස්සී බුදුරදුන් සමයේ බන්ධුමතී නුවර ඉපිද සිටියේ ය. කිසිවෙකුට හිංසාවක් පීඩාවක් නැති රැකියාවක් සෙවූ ඔහුට ධර්ම ඝෝෂක කර්මය හෙවත් මිනිසුන් ධර්මයට යොමු කිරීමේ ක්‍රියාව පටන් ගත්තේ ය. දැන් ඔහු මහජනයා මැදට ගොස් මම පොහොය දිනවල පෙහෙවස් සමාදන් වෙමි. දන් දෙමි බණ අසමි ඔබත් එසේ කරන්න බුදුන් දහම් සඟුන් හැර වෙනත් රත්නයක් නැත. තුණුරුවන්ට සත්කාර කරන්නැයි ඝෝෂා කරමින් යයි.

ඔහු මේ කරන ක්‍රියාව ගැන ඇසූ මන්ධුමතී රජු පැහැදී ඔබට මෙය පාගමනින් ගොස් කළ නොහැකි ය. අසු පිටින් යන්නයි කියා අශ්වයකුත් පළඳින්නට මල් දමක් දුන්නේ ය. මෙසේ කාලයක් ගිය විට රජතුමා අශ්වයන් සිව් දෙනෙකු යෙදූ රථයක් ද තවත් කලකදී එක් ඇතෙක් ද දුන්නේ ය. මෙසේ හෙතෙම ඇතුපිටින් යමින් අවුරුදු අසූදහසක් ධර්ම ඝොෂක කම කළේ ය.

මේ විස්තරය කළ අමාත්‍යවරයා එදා සිට මේ දක්වා මගේ කයෙන් සඳුන් සුවඳ හමයි මුවෙන් මහනෙල් මල් සුවඳ හමයි මේ මා පෙර කළ මහා පිංකම් යයි කියා අහසේ හිඳගෙන ම තේජෝ ධාතු සමාපත්තියට සමවැදී පිරිනිවන් පෑවේ ය. ඔහුගේ සිරුර අහසේදී ම දැවී ධාතු පමණක් ඉතිරි විය. බුදුරජාණන් වහන්සේ එම ධාතු සුදු වස්ත්‍රයකට ගෙන ස්තූපයක් කරවූහ.

දම් සභාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා අතර ගැටළුවක් ඇතිවිය. සන්තති අමාත්‍යවරයා සර්වාභරණයෙන් සැරසී සිටියදී ම රහත්ව පිරිනිවන් පෑවේය. එතුමාට කිය යුත්තේ ශ්‍රමණයෙක් කියාද බ්‍රාහ්මණයෙක් කියා ද යන්න එම ගැටළුවයි. එය දැනගත් බුදු රජාණන් වහන්සේ මගේ පුතු ගිහි වුවත් පැවිදි වුවත් ශ්‍රමණයෙකු යයි කීමට වටී යයි වදාරා මේ ගාථාවෙන් දහම් දෙසූහ.

> **"අලඞ්කතො චෙ'පි සමං චරෙය්‍ය**
> **සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී**
> **සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං**
> **සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු"**

පදාර්ථ:

**අලඞ්කතො අපි,** ගිහි වස්ත්‍රාභරණ ආදියෙන් සැරසුණු කෙනෙක් වුව ද; **චෙ,** ඉදින්, **සමංචරෙය්‍ය,** විෂම කාය දුශ්චරිත වාග් දුශ්චරිතාදියෙන් තොරව සමසේ හැසිරෙන්නේ වේද; **සන්තො,** රාගාදී කෙලෙස් සන්සිඳුවීමෙන් යුක්ත වේද; **දන්තො,** ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත වේ ද; **නියතො,** සතර මග පලයන්ට පැමිණ නිර්වාණාවබෝධය නියත වූවේ වේද; **බ්‍රහ්මචාරී,** කාමයන්ගේන් වෙන් වූ ශ්‍රේෂ්ඨ චර්යාවෙන් යුක්ත වේද; **සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං,** සියලු සත්වයන් කෙරෙහි හිංසාවෙන් තොරව දඬු පසෙක ලූ; **සො,** එබඳු පුද්ගලයාට පාපය බැහැර කළ හෙයින් බ්‍රාහ්මණ යයි ද, පාපයන් සමනය කළ හෙයින් ශ්‍රමණයයි ද කෙළෙස් බිඳ දැමූ හෙයින් භික්ෂුව යයි කිව යුතු ය.

විවරණය:

මෙම ධර්ම දේශනාව බුද්ධ ධර්මයේ එන සුවිශේෂී තැනකි. ගිහියෙකුට ශ්‍රමණයෙක් ය. භික්ෂුවක්යයි කිව හැකි ද යන්න එදත් ගැටළුවක් විය. එහිදී බුදුරජාණන් වහන්සේ වදාරන්නේ රහතන් වහන්සේ කෙනෙක් සම්බන්ධව කතා කිරීමේදී ඔහු මොන ඇඳුමින් සැරසී සිටියත් ඒ සියල්ල අභිබවා සියලු නුසුදුසු කම් අභිබවා භික්ෂුවක් හෝ ශ්‍රමණයෙකු වීමට එකම ප්‍රමිතිය නම් රහත් බව වගයි. දාරුචීරිය තවුසා රහත්ව පිරිනිවන් පෑවේ ද රිටිපට්ටාවලින් තැනූ වස්ත්‍රයක් ඇඳගෙන ය. මේ දෙදෙනාගේ ම ධාතු පූජා බුදුරදුන් විසින් ම සිදු කරන ලද්දේ ය. මෙහි සඳහන් වන සන්තො, දන්තො, නියතො බ්‍රහ්මචාරී යන ගුණ පද වලින් හැඳින්වෙන්නේ රහතන් වහන්සේ ය.

## 5.5.3.10 ලැජ්ජාවෙන් පාපය දුරලන්නා.

දිනක් අනද තෙරණුවෝ රෙදිකඩක් හැඳ කබලක් අතින්ගෙන සිඟමනේ යන දරුවෙකු දැක ඔබට මෙසේ ජීවත් වනවාට වඩා පැවිදි වුනොත් හොඳ නේදැයි ඇසූහ. ස්වාමීනි, මා පැවිදි කරන්නේ කවුදැයි දරුවා ඇසූ විට මම ඔබ පැවිදි කරන්නෙමියි කියා අනද හිමියෝ ඔහු කැඳවාගෙන ගොස් නාවා කමටහන් දී පැවිදි කරවූහ. එහෙත් හෙතෙම තමා ඇඳගෙන ආ රෙදිකඩත් කබලත් ඉවත දැමුවේ නැත. එය ගස් දෙබලක රඳවා තැබී ය.

පැවිදි උපසම්පදාව ලැබූ උන්වහන්සේ දැන් බුදුරදුන්ට ලැබෙන ලාභ සත්කාර භුක්ති විඳී, අගනා සිවුරු හඳී, පොරවයි, ශරීරයත් පුෂ්ටිමත් ය. මෙසේ හිඳින උන්වහන්සේට පැවිදි ජීවිතය ගැන කළකිරීමක් ද ඇති වී මා කෙසේ මිනිසුන් ශ්‍රද්ධාවෙන් දෙන දේ හැඳ පොරවාගෙන ඇවිදින්නේ ද නැවතත් සුපුරුදු පරිදි රෙදිකඩ ම ඇඳගෙන සිඟමන් යදිමින් ජීවත් වෙමි යි සිතා රෙදිකඩ හා කබල තියෙන තැනට ගියේ ය. එය අතටගෙන කල්පනාවට වැටුණු උන්වහන්සේ, ලැජ්ජා, භය නැති තැනැත්ත, ඔබ මෙතරම් උතුම් වස්ත්‍රයක් හැඳපොරවා සිටින ජීවිතය හැරදමා යලිත් කබලක් ගෙන සිඟමනේ යන්නට සැරසෙන්නේදැයි තමාට තමා ම දොස් කියාගත්තේ ය. එයින් උන්වහන්සේගේ සිත නැවතත් සන්සුන් විය. රෙදිකඩත් කබලත් තිබුණු තැන ම තබා ආපසු ආවේ ය.

දින කීපයකින් නැවතත් ඒ කළකිරීම මතුවිය. රෙදිකඩත් කබලත් තිබෙන තැනට ගියවිට පෙරසේ ම තමාට තමා ම දොස් නගා ගනිමින් ආපසු ආවේ ය. දැන් මෙය මෙසේ නිතර නිතර සිදුවේ. එසේ යන එන විට ඔබ කොහි ගියේදැයි භික්ෂූහු විමසති. එවිට මම ගුරුවරයා වෙත ගියෙමියි උන්වහන්සේ පිළිතුරු දෙයි. මෙසේ යමින් එමින් සිට අන්තිමේදී ඒ රෙදිකඩ ම අරමුණු කරගෙන කාම සංකල්ප මැඩලා විදසුන් වඩා නොබෝ දිනකින් රහත්බවට පත් වූහ. එතැන් සිට උන්වහන්සේ පිලෝතික තෙර නමින් ප්‍රකට විය. දැන් උන්වහන්සේ ගස ලඟට ගිය ගමන නැවතී ඇත. ඇවැත්නි ගුරුතුමා හමුවීමට යන්නෙ නැද්දැයි භික්ෂූහු විමසති. ඇවැත්නි ගුරුවරයා සමග ඇළුම් කම් තිබුණු කාලයේ ගියෙමි. දැන් ඒ සියලු බැඳීම් සිඳී ගොස් ය. දැන් මට එහි ගමනක් නැතැයි කීහ. භික්ෂූන් වහන්සේලා මේ පිලෝතික තෙරණුවෝ තමා රහත් යයි කියා ගනිතියි බුදුරදුන්ට දැන්වූහ. එවිට උන්වහසේ මා පුතු ගුරුවරයා සමග ඇළුම් තිබුණු කාලයේ එහි ගියේ ය. දැන් සියලු බැඳීම් දුරු කර ඇත. තමන්ගේ අකුසල විතර්ක තමා ම ලැජ්ජාවෙන් මැඩගෙන රහත් බවට පත්වූයේ යයි වදාරා මේ ගාථාව දේශනා කළ සේක.

**''හිරී නිසෙධො පුරිසො**
**කොචි ලොකසමිං විජ්ජති**
**යො නින්දං අපබොධති**
**අසෙසා භද්‍රො කසාමි ව''**

**පදාර්ථ:**

**කසා,** කසපහරින්; (ලැජ්ජා වන) **භද්‍රො අසෙසා ඉව**, වැදගත් අශ්වයෙකු මෙන්; **යො,** යමෙක්; **නින්දං,** නින්දාව හෙවත් නින්දනීය අකුසල අදහස්; **අපබොධති,** සිය සිතින් මග හරවා ලයිද නැතහොත් එබඳු අකුසල අදහස්වල දොස් දකී ද; **හිරී නිසෙධො;** එසේ ලැජ්ජාවෙන් අකුසල් දුරු කරන; **පුරිසො,** පුරුෂයෙක්; **ලොකසමිං,** ලෝකයෙහි (මිනිසුන් අතර) **කොචි විජ්ජති,** පහළවන්නේ කලාතුරකින් කෙනෙකි.

"අසෙසා යථා භද්‍රො කසානිවිට්ඨො
ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච විරියෙන ච
සමාධිනා ධම්ම විනිච්ඡයෙන ච
සම්පන්න විජ්ජාචරණා පතිස්සතා
පහස්සථ දුක්ඛමිදං අනප්පකං"

පදාර්ථ:

**කසා**, කසයෙන්; **නිවිට්ඨො**, පහරලත්; **භද්‍රො අසෙසා** **යථා** වැදගත් අශ්වයෙකු මෙන්; **ආතාපිනො භවථ**, කෙලෙස් තවන විරිය ඇත්තෝ වන්න; **සංවේගිනො භවථ**, සසර කළකිරුනෝ වන්න; **සද්ධාය**, ශ්‍රද්ධාවෙන්ද; **සීලෙන ච**, සීලයෙන් ද; **සමාධිනා**, සමාධියෙන් ද; **ධම්ම විනිච්ඡයෙන ච**, ධර්ම විනිශ්චය කරන විදර්ශනා ඥාණයෙන් ද යුක්තව; **සම්පන්නවිජ්ජාචරණා**, අෂ්ටවිද්‍යා හා පසළොස්චරණයෙන් සම්පූර්ණව; **පතිස්සතා**, සිහි ඇතිව; **අනප්පකං**, සුළු පටු නොවන; **ඉදං දුක්ඛං**, මේ සසර දුක; **පහස්සථ**, දුරුකරන්නේය.

විවරණය:

**සද්ධා**, කුසල් සිතක තමා හා යෙදෙන සෙසු චෛතසික හෙවත් සිතුවිලි, පහදවන ප්‍රධානතම කුසල චෛතසිකයකි. එය දෙයාකාර ය. තුණුරුවන් කෙරෙහි සිත පැහැදීමේ සිට ලෞකික කුසල සිත්වල පහල වන්නේ ලෞකික ශ්‍රද්ධාවයි. මාර්ග ඵල සිත්වල යෙදෙන ශ්‍රද්ධාව ඒකාන්තයෙන් කීවත් අරමුණෙහි ම සිත පහදවන හෙයින් ලෝකෝත්තර ශ්‍රද්ධාවයි.

**සීල** යනු ප්‍රාතිමොක්ෂ සංවර; ඉන්ද්‍රිය සංවර; ප්‍රත්‍ය සංනිශ්‍රිත; ආජීව පාරිශුද්ධි යන සතර සංවර ශීලයයි.

**විරිය** යනු කුසල සිත ධෛර්යමත් කරමින් පහල වන විරිය චෛතසිකයයි.

**සමාධි** යනු රූපාවචර ධ්‍යාන සතරත් අරූපාවචර ධ්‍යාන සතරත් යන අෂ්ට සමාපත්තියෙන් සිත සමාධි ගත කිරීමයි.

**ධම්ම විනිච්ඡය** යනු මෙය කුසල් ය අකුසල් ය වරද ය නිවරදි ද කළ යුතු ය. නොකළ යුතු ය යනාදී වශයෙන් ඇතිවන කුසලා කුසල විනිශ්චයත් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනාවෙන් සංස්කාර ධර්මයන් පිළිබඳ ව කරන විනිශ්චයත් ය. ඒ අනුව විදර්ශනා ඥානය ධර්ම විනිශ්චය නම් වේ.

විද්‍යා, යනු විදර්ශනා ඥාණ, මනොමය ඉද්ධි ඥාණ ඉද්ධි විධ ඥාණ, දිබ්බසොත ඥාණ, පරචිත්ත විජානන ඥාණ, පුබ්බෙ නිවාසානුස්සති ඥාණ, දිබ්බ චක්ඛු ඥාණ, ආසවක්ඛයා ඥාණ යන අෂ්ටවිධ ඥාණයයි.

මෙයින් **පුබ්බේ නිවාස, දිබ්බ චක්ඛු, ආසවක්ඛය** යන තුන ත්‍රිවිද්‍යා නම් වේ. ඒවා ලෝකෝත්තරය.

## 5.5.3.11 සත් හැවිරිදි වියේදී ම රහත් වූ සුබ සාමණේරයන් වහන්සේ.

සැවැත් නුවර සැරියුත් මහ රහතන් වහන්සේගේ උපස්ථායක කලයක මව් කුස එක්තරා පින්වත් කුමාරයෙක් පිළිසිඳ ගත්තේ ය. මවට අපූරු දොළදුකක් ඇති විය. එනම් සැරියුත් තෙරුන් ප්‍රමුඛ පන්සීයක් භික්ෂූන්ට සතරස භෙවත් සියැක් රස භෝජන පූජාවක් පිරිනමා තමනුත් කසාවතක් හැඳගෙන ආසන කෙළවර හිඳ ඒ භික්ෂූන්වහන්සේලාගෙන් ඉතිරිවන ඉඳුල් බත් අනුභව කිරීමයි. එම දොළදුක එසේ සන්සිඳුවන ලදී. ඉන්පසු දරුවාගේ සියලු වැදගත් මංගල අවස්ථාවල දන් පුදා, නම් තබන දවසේ දරුවාට ශික්ෂාපද සමාදන් කරවන ලෙස ද මව ඉල්ලා සිටියා ය. ඒ දරුවා පිළිසිඳ ගත් තැන් පටන් ගෙදර දොර කිසිඳු දුකක් නම් ඇති නොවී ය. ඒ නිසාම ඔහුට සුබ කුමාරයා යයි නම් තබන ලදී.

සත් හැවිරිදි වියේදී සුබ කුමාරයාට පැවිදි වීමේ ආශාවක් ඇති විය. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ ම අන්තේවාසිකයෙකු ලෙස කුමරුවා පැවිදි කරවන ලදී. පැවිදි වී අටවෙනි දවසේදී ම මහ තෙරුන් සමඟ පිඬු පිණිස යන සුබසාමණේරයන්ට අතරමගදී ජලවාහකයන් ඇල වේලිවලින් දිය ගෙන යන ආකාරයත්, ඊ වඩුවන් ඊතල ඇදහරින සැටි, වඩුවන් ලී වක ගසා රියසක් හදන හැටි දැක ඔවුන්ට එසේ කළ හැකිනම් මට මගේ සිත පාලනය කර ගත නොහැකිදැයි සිතිවිල්ලක් ඇති විය. ඒ මොහොතේ ම තමා අත තිබූ මහ තෙරුන්ගේ පා සිවුරු උන්වහන්සේට ම භාර දී ආපසු කුටියට වැඩ සිත දමනය කිරීමෙහි යෙදුනහ. සැරියුත් තෙරණුවෝ උන්වහන්සේ වෙනුවෙන් පිණ්ඩපාතය රැගෙන ආහ. ඒ අතර ඉහත කී කමටහන ම මෙනෙහි කරමින් සුබ සාමණේරයන් වහන්සේ රහත් බවට පත් වුහ. මේ අවස්ථා වේ සක් දෙවිඳු සතරවරම් දෙවිවරු සමඟ ආරක්ෂාවට පැමිණීම සාමණේරයන් රහත්වන තුරු ඉර හඳ ගමන් නැවතීම වැනි ප්‍රාතිහාර්ය රැසක් සිදුවිය. පණ්ඩිත වර්ගයේ පණ්ඩිත සාමණේරයන් රහත් වීමද සිදු වූයේ මේ ආකාරයට ය. එදා දෙසූ එම ගාථාවෙන් ම මෙහිදී ද බුදුරජාණන් වහන්සේ සාමණේරයෙන් වහන්සේගේ කමටහන අගය කරමින් ධර්ම දේශනා කළ සේක.

> "උදකං හි නයන්ති නෙත්තිකා
> උසුකාරා නමයන්ති තේජනං
> දාරුං නමයන්ති තච්ඡකා
> අත්තානං දමයන්ති සුබ්බතා"

පදාර්ථ:

**නෙත්තිකා,** දියඇළවෝ හෙවත් වාරිකම් කරුවො; **උදකං,** ජලය; **නයන්ති,** ඇල මාර්ගයෙන් කැමති තැනට ගෙන යති; **උසුකාරා,** හී වඩුවෝ; **තේජනං,** ඊ දඬු; **නමයන්ති,** අවශ්‍ය පරිදි නමති; **තච්ඡකා,** වඩුවෝ; **දාරුං නමයන්ති,** දැව නමති; **සුබ්බතා** සුවචයෝ **අත්තානං දමයන්ති,** තමා දමනය කරති;

**විවරණ:**

වාරිකම් කරුවන් කඳුගැට කපා වලවල් පුරවා වේලි බැඳ ලී කඳන් ආදියෙන් අමුණු තනා ජලය රිසි පරිදි රිසිතැනට ගෙන යන හෙයින් ඔවුන් නෙත්තිකා නමින් හඳුන්වනු ලැබේ. තෙජනං යනු දුව ය. උසුකාරා යනු ඊතල හදන වඩුවෝ ය. ඔවුහු ලී තවා ඊ තල සෘජු කරති ඇදහරිති. කචජකා යනු වඩුවෝ ය. ඔවුහු දුව සෘජු කළයුතු තැන සෘජු කරති. නැවිය යුතු තැන නවති. මේ සියල්ල සුළු වැඩ ය. අමාරු ම දෙය නම් තම සිත රාගාදී ඇදහැර පාපයෙන් වළකා දමනය කර ගැනීම යි. එය කරන්නේ සුවචයන් හෙවත් බුදුරදුන්ගේ අවවාද අනුශාසනා පිළිපදින යෝගීන් බව මෙහි සුබ්බතා යන්නෙන් කියැ වේ.

**අභ්‍යාස**

01. ධම්ම පදය යනු කුමන අයුරකින් ධර්මය පහදාදෙන ග්‍රන්ථයක් දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
02. මෙහි යෙදී ඇති උපමා එකතුවකින් පොත් පිංචක් නිර්මාණය කරන්න.
03. දණ්ඩ වග්ගයෙන් කියවෙන ධර්ම කාරණා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
04. දණ්ඩ වග්ගය ඇසුරින් ධර්ම දේශනාවක් නිර්මාණය කරන්න.

21 පාඩම

# බෞද්ධ දර්ශනය හෙවත් විදර්ශනාව

නිවන අවබෝධ කරගැනීමේ අත්‍යාවශ්‍ය ප්‍රතිපදාව බුදු දහම තුළ දැක්වෙන්නේ අනුපූර්ව ශික්ෂාව හෙවත් ත්‍රිශික්ෂාව නමින් ය. එම ත්‍රිශික්ෂාව සම්පූර්ණ කර ගැනීමේදී භාවනාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. බුද්ධ දේශනාවට අනුව භාවනාව පිළිබඳව මූලික ප්‍රභේද දෙකක් දක්වා ඇත. සමථ භාවනාව හා විපස්සනා භාවනාව ලෙස ඒවා නම් කෙරේ. සිතේ විසිරුණු ස්වභාවය වෙනුවට සිත තුළ සමාධිමත් බවක් ඇති කිරීමට සමථ භාවනාව වැඩිය යුතු ය. සිතේ පවත්නා අවිද්‍යාව දුරුකර ප්‍රඥාව වර්ධනය කිරීමට විපස්සනා භාවනාව වැඩිය යුතු ය.

බුදු රජාණන්වහන්සේ නිවන අවබෝධ කරගැනීමට දේශනා කළ අනුපූර්ව ශික්ෂණ ක්‍රමයේ මූලික පියවර තුනක් දැක්වේ. සීල, සමාධි, ප්‍රඥා ලෙස ඒවා නම් කෙරේ. පළමු පියවර සීලයවන අතර, ''**කාය වාචානං සමොධානං සීලං**'' යන පාඨයට අනුව කය, වචන දෙකේ සංවරභාවය සීලය බව එහි සරල අර්ථයයි. ඒ සඳහා කායිකව හා වාචසිකව සිදු කරන අකුසල්වලින් වැලකී සිටීමත් අනුගමනය කළයුතු කායික හා වාචසික කුසලයේ යෙදීමත් අවශ්‍ය වේ. එය වාරිත්‍ර සීලය හා චාරිත්‍ර සීලය ලෙස හැඳින්වේ. මේ සීලය ආර්ය කාන්ත සීලයක් දක්වා වර්ධනය කර ගැනීම නිවන අපේක්ෂා කරන්නෙකු විසින් කළයුතු වේ.

දෙවැනි පියවර සමාධිය වේ. ''**කුසල චිත්තස්ස එකග්ගතා සමාධි**'' යන පාඨයට අනුව කුසල් සිතේ එකග බව, තැන්පත් බව, අරමුණෙහිම පවත්නා බව සමාධිය ලෙස දැක්වේ. චරිතානුකූලව ලබාගන්නා සමසතළිස් කර්මස්ථාන අතරින් තමාට උචිත කර්මස්ථානය හෙවත් භාවනා අරමුණ අනුව වැඩිකලක් සිත එක අරමුණක තබා ගැනීමෙන් මේ සමාධිය ඇති කරගත හැකි ය. එය සමථ භාවනාව තුළින් සකස් කරගත යුතු ය. සමථ භාවනාව පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් 4 වසර ත්‍රිපිටක ධර්මය පෙළ පොතේ ඇතුළත් සමථ භාවනාව පාඩමෙන් ඔබ මේ වන විටත් ලබාගෙන ඇත. එම නිසා මෙම පාඩමෙන් විපස්සනා භාවනාව පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඔබට ලබාගත හැකිවනු ඇත.

අනුපූර්ව ශික්ෂණ ක්‍රමයේ තෙවැනි පියවර ප්‍රඥාවයි. ''**කුසල චිත්ත සම්පයුත්ත විපස්සනා ඤාණං පඤ්ඤා**'' යන පාඨයෙන් පැහැදිලි කරන්නේ කුසල් සිත හා යෙදුණු විපස්සනා ඤාණය ප්‍රඥාව බව ය. මෙම පාඨයේ එන විපස්සනා යනු කුමක් ද? ''**අනිච්චාදිවසෙන විවිධෙහි ආකාරෙහි පස්සතීති විපස්සනා**'' යන පාඨයට අනුව අනිත්‍යාදි වශයෙන් විශේෂකොට, විවිධාකාරයෙන් දැකීම විපස්සනාවයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විශේෂයෙන් බලන්නේ කුමක් ද යන්න ඊළඟට ඇති ප්‍රශ්නයයි. රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන පංචස්කන්ධ ලෝකය එසේ අනිච්චාදී වශයෙන් බැලීම මෙයින් අර්ථ ගැන්වෙයි.

''**ඉමස්මිං යෙව බ්‍යාමමත්තෙ කළෙබරෙ ලොකං ච පඤ්ඤපෙමි**'' යන පාඨයට අනුව ඉහත දැක් වූ පංචස්කන්ධයම ලෝකය ලෙස බුදු රජාණන්වහන්සේ පණවා වදාළහ. මේ පිළිබඳ අනිත්‍ය ලෙස දුක්ඛ ලෙස හා අනාත්ම ලෙස විදසුන් නුවණින් දැකීම විපස්සනාවයි. මේ නිසා අවිජ්ජාව දුරු වී ප්‍රඥාව පහළ වේ. අනුපූර්ව ශික්ෂණ ක්‍රමයේ අවසන් පියවර වූ ප්‍රඥාව - විදර්ශනා භාවනාව තුළින් වර්ධනය කළයුතු බව ඉන් පැහැදිලි වේ.

බුදුරජාණන්වහන්සේ පහළ වූ භාරතීය සමාජය තුළ සීලය හා සමාධිය පිළිබඳවත්, සීල ප්‍රතිපදාව හා සමථ භාවනාව පිළිබඳවත් ප්‍රමාණාත්මක මෙන්ම ප්‍රායෝගික අවබෝධයක් සහිත දාර්ශනිකයින් ආගමික පූජකවරුන් සිටි බවට සාක්ෂි සූත්‍ර පිටකය තුළ ඇතුළත්ව ඇත. සිදුහත් බෝසතාණන්වහන්සේගේ ආචාර්යවරුන් වූ ආළාරකාලම සහ උද්දකාරාම ඒ සඳහා උදාහරණ දෙකක් පමණි. ඔවුන් සමථ භාවනාවේ උසස්ම ප්‍රතිඵල ලබා තිබිණි. සමථ භාවනාව බුදු දහමට සුවිශේෂී නොවන අතර එය සමකාලීන භාරතීය සමාජයේ පැවැති බුදු රජාණන්වහන්සේ ද පිළිගත් ක්‍රමයකි.

විපස්සනා භාවනාව බුදු දහමට සුවිශේෂි වූවකි. පංචස්කන්ධ පිළිබඳව ත්‍රිලක්ෂණය අනුව ගලපමින් අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙස දකිමින් මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නොවේ යන දැක්මක් ගොඩ නගා ගැනීමට එය ඉවහල් වේ. තමා පිළිබඳවත්, පංචස්කන්ධ ලෝකය පිළිබඳවත් සමස්ත ලෝකය පිළිබඳවත් යථාඥාණ දර්ශනයක් ගොඩනැගීම නිවන් අවබෝධයට අත්‍යවශ්‍ය වේ. ලෞකික ප්‍රඥාවෙන් ඔබ්බට ගිය ලෝකෝත්තර ප්‍රඥාවක් ගොඩනැගීම තුළින් පමණක් නිවන අවබෝධවන අතර ඒ සඳහා ඇති එකම මඟ විපස්සනා භාවනාව ලෙස බුදු දහම අවධාරණය කරයි. සමථ භාවනාව සම්මුති සත්‍ය තුළ පවත්නාදේ භාවනා අරමුණු වශයෙන් තබා ගනිමින් තාවකාලිකව කෙලෙසුන් ප්‍රහීණ කිරීමේ ක්‍රියාවලියකි. විපස්සනා භවනාව සම්මුති සත්‍ය හා පරමාර්ථ සත්‍යය යන දෙකම තුළ පවත්නා දේ භාවනා අරමුණු වශයෙන් ගෙන ස්ථිරව ම කෙලෙස් ප්‍රහීණ කිරීමේ ක්‍රියාවලියකි.

බුදු දහමට අනුව ලෝකයේ පවත්නා ජීව, අජීව, (සවිඥ්ඤාණක, අවිඥ්ඤාණක) සියල්ල පරමාර්ථ වශයෙන් සතර ආකාර ලෙස දක්වයි. ඒවා හඳුන්වන්නේ චිත්ත පරමාර්ථ, චෛතසික පරමාර්ථ, රූප පරමාර්ථ හා නිර්වාණය ලෙසිනි. මේ සතර ආකාර වූ පරමාර්ථ අතරින් චිත්ත චෛතසික හා රූප යන තුන සංඛත ධර්ම ලෙස වර්ග කෙරේ. නිර්වාණය එකම අසංඛත ධර්මයි. සංඛත ධර්ම හඳුන්වන්නේ හේතු ප්‍රත්‍ය සමවායයෙන් හටගත් දේ යනුවෙනි.

අසංඛත වූ නිවන එයට ඇතුළත් නැත. හේතු ප්‍රත්‍ය සමවායයෙන් හටගත් සංඛත ධර්මවලට පොදු ධර්මතා තුනක් වේ. ''**තීණිමානි භික්ඛවෙ සංඛතස්ස සංඛත ලක්ඛණානි කතමානි තීණි. උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති**'' යනුවෙන් දැක්වෙන පාඨය තුළ එම ධර්මතා තුන ඇතුළත් ය. ඇතිවීම, නැතිවීම හා වෙනස් වෙමින් පැවතීම ලෙස සරලව එය දැක්විය හැකි ය. සාමාන්‍ය ව්‍යවහාරයේ පවත්නා උපත - ජීවත්වීම - හා මරණය ලෙස ද අදහස් කරන්නේ මේ

සංකල්පය ම වේ. ත්‍රිලක්ෂණය සංඛත ධර්මයන්ට පොදු වූ ධර්මතාවක් ලෙස පෙන්වා දිය හැකි ය. මේ ලක්ෂණ අනුව පංචස්කන්ධය, ලෝකය, විශේෂ ලෙස දැකීම විපස්සනා භාවනාවයි. පහත සඳහන් සටහන මේ සංකල්ප අතර පවත්නා සම්බන්ධතාව මැනවින් පැහැදිලි කරයි.

| සංඛත පරමාර්ථ ධර්ම | පංචස්කන්ධය | පංචස්කන්ධයේ ප්‍රධාන බෙදීම | විදර්ශනාව |
|---|---|---|---|
| රූප පරමාර්ථය | රූපස්කන්ධය | රූපස්කන්ධය | අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙස විදසුන් නුවණින් දැකීම |
| චෛතසික පරමාර්ථය | වේදනාස්කන්ධය<br>සංඥාස්කන්ධය<br>සංඛාරස්කන්ධය | නාමස්කන්ධය | |
| චිත්ත පරමාර්ථය | විඤ්ඤාණස්කන්ධය | | |

කෙලෙස්වලින් බර පුහුදුන් ලෝකයා පංචස්කන්ධය ඇතුළු ලෝකය දකින්නේ යථා ස්වරූපයෙන් නොවේ. අයෝනිසෝ මනසිකාරයෙන් යුතුව මඤ්ඤනාවෙන් හෙවත් විපරීත ලෙසිනි. එවිට සංඥා විපල්ලාස ඇති වේ. සංඥා විපල්ලාස සිවු වැදෑරුම් ය.

01. **අනිච්චෙ නිච්චන්ති සඤ්ඤාවිපල්ලාසො**
02. **අසුභෙ සුභන්ති සඤ්ඤාවිපල්ලාසො**
03. **දුක්ඛෙ සුඛන්ති සඤ්ඤාවිපල්ලාසො**
04. **අනත්තෙ අත්තාති සඤ්ඤාවිපල්ලාසො**

මේ විපරීත දැක්ම නිසා අනිත්‍ය, අසුභය, දුක සහ අනාත්ම බව කිසි දිනක වටහා නොගන්නා පුහුදුන් පුද්ගලයා සියල්ල නිත්‍ය ලෙස දකී. සුභ ලෙස දකී. සැප ලෙස දකී. සදාකල් පවතින සේ දකී. මේ නිසාම මම ය. මාගේ ය. මාගේ ආත්මයය යන සත්කාය සමඟ බැඳුණු තණ්හා මාන දිට්ඨි යන අකුසල් සහිත දර්ශනයක් ඇති වේ. එයින් සිත තුළ පවත්නා අවිජ්ජාව තව තවත් පෝෂණය වේ. පංචනීවරණ ධර්ම තව තවත් සිත තුළ ප්‍රබල වේ. අකුසල සක්‍රිය වේ. මෙහි ප්‍රතිඵලය වන්නේ අපුඤ්ඤාභි සංඛාර රැස් කරමින් දුගතියට පත්වීම ය. මිච්ඡා දිට්ඨිගත වීම ය. භවයෙන් භවයට ගමන් කිරීමයි.

විපස්සනා භවනාව අනිත්‍ය, දුක්ඛ, අනාත්ම සංකල්ප ඔස්සේ පංචස්කන්ධ ලෝකය දකින්නට සලස්වයි. අනිත්‍ය අනිත්‍ය ලෙසට ද, දුක දුකක් ම ලෙසට ද, අසුභය අසුභය ලෙසට ද, අනාත්මය අනාත්මය ලෙසට ද යථාභූත ඥාණ දර්ශනයක් ඇති කිරීමට උපකාරී වේ. එහි ප්‍රතිඵලය වන්නේ ලොව පවත්නා සියල්ල ම පරමාර්ථ ධර්ම සමූහයක් පමණක් බවත්, ඒ නිසා ම මම ය, මාගේ ය, මගේ ආත්මය වේ යනුවෙන් ගතහැකි කිසිවක් නොවන

බව පිළිබඳ දැක්මක් ඇතිවීමයි. එය දියුණු කර ගැනීම තුළින් අවිජ්ජාව ප්‍රහීණය කරමින් ප්‍රඥාව වර්ධනය කළ හැකි වේ. කෙළෙස් තුනීකර නිකෙලෙස් වීමට එමගින් ඉඩ සැලැසේ.

පුහුදුන් පුද්ගලයෙකුගේ සිත තුළ කෙලෙස් ක්‍රියාත්මකවන ආකාර තුනක් පවතී. **අනුසය, පරියුට්ඨාන, වීතික්කම** ලෙස එම අවස්ථා නම් කෙරේ. මෙහි උපරිම හා සමාජමය සක්‍රීය අවස්ථාව වීතික්කම ලෙස හැඳින්වේ. නිදාසිටී (අනුසය) අකුසලයන් අවදිවී සිත තුළ පමණක් ක්‍රියාත්මක වෙමින් (පරියුට්ඨාන) පවතී. එයින් ද නොනැවතී. එම අකුසල සිතුවිලි ශාරීරිකව හා වාචසිකව ක්‍රියාත්මක වීමට පටන් ගනී. කයින් සහ වචනයෙන් අකුසල සිදුවන්නේ එවිට ය. එය පුද්ගලයාටත් සමාජයටත් හානිකරයි. මේ වීතික්කම අවස්ථාව යටපත් කළ හැක්කේ සීලයෙනි. සීලය නිසා මතු වී සක්‍රීය වූ කෙලෙස් හෙවත් අකුසල චෛතසික තදංග වශයෙන් තාවකාලිකව යටපත් වේ. පුද්ගලයා සන්සුන් වේ. එහෙත් සිත තුළ පමණක් තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. එම පරියුට්ඨාන අවස්ථාවේ පවතින තත්ත්වය පාලනය කළහැක්කේ සමථ භාවනාවෙන් පමණි. සිත තුළ අකුසල් ක්‍රියාත්මකව පවත්නා පරියුට්ඨාන අවස්ථාවේ මනස තුළ අපමණ අකුසල චිත්තවීථි හටගනී. ඒවායින් සසර පුරා විපාක ලබාදෙන අකුසල කර්ම හෙවත් අපුඤ්ඤාභිසංඛාර රැස් කෙරේ. සමථ භාවනාවට සිත සමාධිගත කිරීමේ ශක්තියක් ඇති බැවින් එය සමාධි භාවනාව ලෙස ද හැඳින් වේ.

වීතික්කම හා පරියුට්ඨාන ලෙස ක්‍රියාත්මක නොවන කෙලෙස් සිත තුලම නිදා සිටී. එසේ සිටින්නේ අවදි වීමට අවස්ථාව පැමිණෙන තුරු පමණි. ඒ නිසා සීලයෙන් කෙරෙන තදංග ප්‍රහාණය හා සමථයෙන් කෙරෙන විෂ්කම්භන ප්‍රහාණය තාවකාලික වූ යටපත් කිරීමක් පමණි. සිත තුළ නිදා සිටින අකුසලයන් කෙලෙස් මුලිනුපුටා දැමිය හැකි නම් නැවත කිසි දිනක පරියුට්ඨාන - වීතික්කම නොවනු ඇත. එය කළ හැක්කේ ප්‍රඥාව දියුණු කිරීමෙන් පමණි. ලෝකෝත්තර ප්‍රඥාව දියුණු කිරීමට විපස්සනා භාවනා ඉවහල් වේ. මෙය බුදු රජාණන්වහන්සේ අනුදැන වදාළ බුදු දහමට සුවිශේෂී වූවකි. අවිජ්ජාව පවතින තුරු අනුසය වශයෙන් පවතින කෙළෙස් යටපත් කළ නොහැකි ය. විපස්සනා භාවනාව අනිත්‍යාදී වශයෙන් ලෝකය දැකීම නිසා යථාර්ථය දැකීමට යථාභූත ඤාණ දර්ශනයට සහ යෝනිසෝ මනසිකාරයට ඉඩ සලසයි. විපස්සනා භාවනාවෙන් ප්‍රඥාව දියුණු කිරීමෙන් අනුපූර්ව ශික්ෂාවේ තෙවැනි පියවර සම්පූර්ණ වේ. සියලු කෙලෙස් සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය වේ. ඒ අනුව නිර්වාණගාමී ප්‍රතිපදාව සීලයෙන් හා සමථයෙන් පමණක් කිසි දිනක සපුරා ගත නොහැකි ය. සීලය මත පිහිටා සමාධියත්, සමාධිය තුළින් විපස්සනාවත් වැඩීමෙන් පමණක් ත්‍රිවිධ ශික්ෂාව හෙවත් නිවන් මඟ සපුරාගත හැකි ය. ඒ අනුව විපස්සනා භාවනාව අත්‍යවශ්‍ය ම පියවරක් ලෙස හැඳින්විය හැකි ය. ඉහත දැක්වූ සමස්ත අදහස පහත දැක්වෙන සටහනින් ඔබට පැහැදිලි කරගත හැකිවනු ඇත.

| කෙලෙස් පවතින අවස්ථාව | ත්‍රිශික්ෂාව | කෙලෙස් ප්‍රහීණයවන ආකාරය | පිළිපැදිය යුතු මාර්ගය | මෙලොව ලැබෙන ප්‍රතිඵල | සසර ප්‍රතිඵල |
|---|---|---|---|---|---|
| අනුසය | ප්‍රඥා | සමුච්ඡේද | විපස්සනා භාවනා | මාර්ග ඵල අවබෝධය | නිර්වාණාවබෝධය |
| පරියුට්ඨාන | සමාධි | විෂ්කම්භන | සමථ භාවනාව | උපචාර - අර්පනා සමාධි | රූප - අරූප ප්‍රතිසන්ධි |
| වීතික්කම | සීල | තදංග | සීලය | මහා කුසල් සිත් ඇති වේ | කාම සුගති ප්‍රතිසන්ධි |

විපස්සනා භාවනාව තුළින් සමුච්ඡේදවශයෙන් සියලු කෙලෙස් ප්‍රහීණය කර අරහත්භාවයට පත් උතුමෝ දෙවර්ගයක් වෙති. සමථයානික, විපස්සනායානික ලෙස එම උතුමෝ නම් කෙරෙති. සමථ භාවනාව තුළින් නීවරණ ධර්ම යටපත් කොට සිත සමාධිගතකර ගැනීමෙන් හා විපස්සනා භාවනාවෙන් කෙලෙස් සමුච්ඡේද ලෙස ප්‍රහීණය කරමින් අවිජ්ජාව නසා ලෝකෝත්තර ප්‍රඥාව වැඩීමෙන් අරහත් භාවයට පත් වූ උතුමා සමථයානික නම් වේ. සිව්පිළිසිඹියා ලැබීම, අභිඥාලාභීවීම වැනි අතිරේක ඥාණයන් දියුණුකර ගැනීමට ද සමථයානික රහතන් වහන්සේට අවස්ථාව සැලසේ. විපස්සනයානිකයා යනු සමථයෙන් තොරව විදර්ශනාවෙන් පමණක් සමාධිය හා ප්‍රඥාව දියුණුකර කෙළෙස් තවන ලද රහතන්වහන්සේ ය. අවබෝධ කළ නිවන එකම වූව ද අතිරේක ඥාණ ලැබීමට විපස්සානායානිකයන් වහන්සේට අවස්ථාවක් නොලැබේ. උන්වහන්සේ ශුෂ්ක විදර්ශක රහතන්වහන්සේ ලෙස ද හඳුන්වයි. චක්ඛුපාල මහරහතන් වහන්සේ ඒ සඳහා උදාහරණයකි. සංස්කාර ධර්මයන් වහා වහා ඇතිව නැතිවන බැවින් අනිත්‍ය වේ. නැවත නැවත සිත පෙළන බැවින් දුක් වේ. තමන්ට කැමති සේ ම වසඟ යේ නොපවතින බැවින් අනාත්ම වේ යන මූලික සිතුවිලි මත විපස්සනා භාවනාව වැඩිය යුතු ය.

විපස්සනා භාවනාවේ උසස්ම ඵලය වන්නේ නිරුපධිසේස නිර්වාණයයි. එයට පෙරාතුව සෝපධිශේෂ නිර්වාණ ධාතුවත්; ලෝකෝත්තර ප්‍රඥාවත් ලබා ගැනීමට හැකි ය. විපස්සනා භාවනාවෙන් ලෞකික වශයෙන් ලැබිය හැකි ප්‍රතිඵල කිහිපයක් පහත පළ වේ.

- ජරාවට පත්වීම ස්වභාවික බව අවබෝධ කරගත හැකිවීම.
- මරණයට පත්වීම ස්වභාවික බව අවබෝධ කරගත හැකිවීම.
- ජීවිතය සැමදා එකලෙස සිතන පතන ආකාරයෙන් නොපවතින බව.
- භෞතික සම්පත් සියල්ල ද නිරන්තරව විපරිණාම ධර්මතාවට යටත් බව.
- අටලෝ දහමට මුහුණ දීමට සිදුවන බව.
- මේ තත්ත්වයන් අවබෝධකොටගෙන දෛනික ජීවිතය කළමනාකරණය කරගනිමින් කුසලයට යොමුවුණු ජීවිතයක් ගොඩනගා ගැනීම.

**අභ්‍යාස**

01. විපස්සනා භාවනාවෙන් ලැබෙන උසස්ම ඵලය කුමක් ද?
02. විපස්සනා භාවනාව පුඤ්ඤභාවනා ලෙස ද හැඳින් වේ. එයට හේතු කවරේ ද?
03. පරියුට්ඨාන අවස්ථාවේ කෙලෙස්වල ස්වභාවය කුමක් ද?
04. විපස්සනා භාවනායෙන් දෛනික ජීවිතයට ලද හැකි ආදර්ශ කවරේ ද?
05. ත්‍රිශික්ෂාව හා විපස්සනා භාවනාව අතර ඇති සබඳතාව පෙන්වාදෙන්න.
06. සංඛත පරමාර්ථ ධර්ම හා පංචස්කන්ධය අතර ඇති සබඳතාව පෙන්වාදෙන්න.
07. සමථ භාවනාව හා විදර්ශනා භාවනාව අතර මූලික වෙනස්කම පෙන්වාදෙන්න.

22 පාඩම

# සිහියේ සිවුකොණ
## (සතිපට්ඨානය)

මහා සතිපට්ඨාන සූත්‍රය දීඝ නිකායේ දහනව වැනි සූත්‍රය ලෙසටත් සතිපට්ඨාන සූත්‍රය මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයේ දසවැනි සූත්‍රය ලෙසටත් සූත්‍ර දෙකක් දක්නට ඇත. මීට අමතරව සංයුක්ත නිකායේ මහාවග්ගයේ සතිපට්ඨාන සංයුක්තයේ එන සූත්‍රය දහයක ම සතර සතිපට්ඨානය පිළිබඳ ව සඳහන් වේ. සංයුත්ත නිකායේ තවත් සූත්‍ර ගණනාවක ද සතර සතිපට්ඨානය පිළිබඳ ව කරුණු ඇතුළත් වේ.

මහා සතිපට්ඨාන සූත්‍රය ඉතා දීර්ඝ දේශනාවක් බැවින් එය දීඝ නිකායට ඇතුළත්ව ඇත. මජ්ඣිම නිකායේ ඇත්තේ මධ්‍යම ප්‍රමාණයේ සූත්‍රයකි. ධම්මානු පස්සනා සතිපට්ඨානයේ සච්චපබ්බය යටතේ ඇතුළත් වන චතුරාර්ය සත්‍ය පිළිබඳ කොටස ඉතා දීර්ඝ ලෙස; සවිස්තරාත්මකව සහ ප්‍රභේද සහිතව දීඝ නිකායට ඇතුළත් ව ඇත. මජ්ඣිම නිකායේ එම කොටස ඉතා සංක්ෂේපයෙන්, හැඳින්වීමක් ලෙසට ඇතුළත් ව ඇත. ඒ හැර අනෙකුත් සියලුම කරුණු සූත්‍ර දෙකේදී ම සමානව පවතී.

බුදුදහම මෙහි ප්‍රධාන භාවනාක්‍රම දෙකක් ලෙස සමථභාවනාව සහ විපස්සනා භාවනාව දක්වා තිබේ. මේ භාවනා ක්‍රම දෙකම සඳහා උපයෝගීවන සූත්‍රයක් ලෙස සතිපට්ඨාන සූත්‍රය හැඳින්විය හැකිය. භාවනාවට අදාළ වැදගත්ම සූත්‍රයක් ලෙසටත්; බෞද්ධයන්ගේ ගෞරවයට පාත්‍ර වූ සූත්‍රයක් ලෙසටත් මෙය අනෙකුත් සූත්‍ර අතර ඉතා වැදගත් තැනක් හිමිකර ගනී. ලෝකයේ ඇතැම් බෞද්ධ රටවල මේ සූත්‍රය ඇසුරෙන් ගොඩනගා ගත් භාවනා සම්ප්‍රදායන් ද දක්නට ලැබේ. බුරුම රටේ මහසි සයාඩෝ හිමියන්ගේ භාවනා ක්‍රමය ඒ සඳහා එක් උදාහරණයක් පමණි.

බුදුරජාණන් වහන්සේ මේ සතිපට්ඨාන සූත්‍රය දේශනා කිරීමෙන් අපේක්ෂා කළේ කුමක් ද යන්න අප පළමුව වටහා ගත යුතුය. කුරුරට කම්මාස්සදම්ම නම් නියම් ගමේදී කළ මේ දේශනාවේ ඇතුළත් පහත දැක්වෙන පාඨය එම අපේක්ෂාවන් පැහැදිලි කරන්නකි.

**''එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිදෙවානං සමතික්කමාය; දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය; නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා''**

සත්ත්වයන්ගේ පිරිසිදු බව පිණිසත්; සෝක පරිදේවයන්ගේ ඉක්මවීම පිණිසත්; දුක් දොම්නස් සන්සිඳුවීම පිණිසත්; ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අධිගමය පිණිසත්; වාණසංඛ්‍යාත තෘෂ්ණාවෙන් නික්මීම පිණිසත් එකම මග මේ සතර සතිපට්ඨාන භාවනා ලෙස දැක්වේ. නිර්වාණාවබෝධය සඳහා එම මග හැර වෙනත් මගක් නැත. ඒ නිසා සතර සතිපට්ඨාන භාවනා පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් ගිහි පැවිදි සැම කෙනෙකුම ලබාගෙන තිබිය යුතු ය. එය බෞද්ධයාගේ උතුම් පරමාර්ථය වූ නිවන අවබෝධයට හේතුවන බැවිනි. සතර

සතිපට්ඨානය යනු කවරක්ද? යන ප්‍රශ්නයට දළ පිළිතුර පහත දක්වෙන සූත්‍ර පාඨයේ අන්තර්ගත වේ.

**1. ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.**
**2. වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.**
**3. චිත්තෙ චිත්තානුපස්සී විහරති. ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.**
**4. ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං.**

එම පාඨය අනුව කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යනුවෙන් සතර සතිපට්ඨානය නම් කෙරේ. **"සති"** යනු සිහියයි. **"පට්ඨාන"** යනු මනාකොට පිහිටුවීමයි. අනුපස්සනා යනු **''අනුව සුවිශේෂී ලෙස බැලීමයි''**. කයෙහි සිහිය මනාකොට පිහිටුවා කය අනුව සුවිශේෂීව සහ සතියෙන් යුක්තව බැලීම ලෙස එය දැක්විය හැකි ය. එසේ සිහිය පිහිටුවිය යුතු ස්ථාන හතර සතිපට්ඨාන සූත්‍රයේ දක්වෙන්නේ මෙසේ ය.

**1. කය හෙවත් සිරුර (රූපකාය) පිළිබඳ ව සිහිය පිහිටුවා මෙනෙහි කිරීම.**
**2. වින්දන හෙවත් වේදනා පිළිබඳ ව සිහිය පිහිටුවා මෙනෙහි කිරීම.**
**3. සිතේ ඇතිවන විවිධ සිතුවිලි පිළිබඳ ව සිහිය පිහිටුවා මෙනෙහි කිරීම.**
**4. සිතට නැගෙන විවිධ ධර්මතා පිළිබඳ ව සිහිය පිහිටුවා මෙනෙහි කිරීම.**

මේ සතර පිළිබඳ ව මෙනෙහි කිරීමේ යෙදෙන යෝගාවචරයා තුළ තිබිය යුතු ලක්ෂණ තුනක් ඉහත කී පාඨයේ අතුළත් ය. **ආතාපී** හෙවත් කෙලෙස් තවන දැඩි වීර්ය; එයින් පළමුවැන්නයි. සම්මා වායාම යනුවෙන් දක්වෙන්නේ ද මේ කෙලෙස් තවන වීර්යයේ ආකාර සතරකි. එම පාඨයේම එන **සම්පජානෝ** යනු නුවණින් යුක්ත බවයි. එය දෙවැනි ලක්ෂණයයි. **සතිමා** යනු සිහිය ඇත්තායි. (සති මා) මේ ලක්ෂණ තුන සතර සතිපට්ඨානයේ සිත පිහිටුවීමට අවශ්‍ය ම අංගවේ. එහි ඊළඟ ඵලය වන්නේ මම ය මාගේ ය යන ආත්ම දෘෂ්ටිගතිකත්වය නිසා පුද්ගලයා තුළ ඇතිවනඅභිජ්ඣා ව හෙවත් දැඩි ලෝභය සහ දෝමනස්ස ස්වභාවය ප්‍රහීන වීමයි.

සතර සතිපට්ඨාන භාවනාව වැඩීම නිසා පුද්ගලයා තුළ ගොඩ නැගෙන දැක්ම වන්නේ **"යමක් අනිත්‍ය ද එය දුක් සහගත ය; යමක් දුක් සහගත ද එය අනාත්ම ය; යමක් අනාත්ම ද එය මම නොවේ, මගේ නොවේ, මගේ ආත්මය නෙවේ; යන්නයි. (යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා යදනත්තා නෙතං මම; නෙසෝහමස්මි; නෙසෝමේ අත්තා)''** මේ දර්ශනය ලෝකෝත්තර ප්‍රඥාව ලබා ගැනීමට අත්‍යවශ්‍යවේ. ඒ සඳහා සතර සතිපට්ඨානය විදර්ශනා භාවනා වශයෙන් වැඩිය යුතු ය.

සතර සතිපට්ඨානයේ භාවනා අරමුණු (කර්මස්ථාන) සංඛ්‍යාව පිළිබඳ සටහන.

| සතිපට්ඨානය | භාවනා කමටහන් සංඛ්‍යාව |
|---|---|
| කායානුපස්සනාව<br>(භාවනා අරමුණු 14) | 1. ආනාපාන පබ්බය<br>2. ඉරියාපථ පබ්බය<br>3. චතුසම්පජඤ්ඤ පබ්බය<br>4. පටික්කූල මනසිකාර පබ්බය<br>5. ධාතු මනසිකාර පබ්බය<br>6. නවසීවථික පබ්බය (නවසීවථික පබ්බයේ භාවනා අරමුණු - (6-14) නවයකි. |
| වේදනානුපස්සනාව<br>(භාවනා අරමුණු 01) | 15. සුඛ, දුක්ඛ උපේක්ඛා, සාමිස සුඛ, සාමිස දුක්ඛ, සාමිස උපේක්ඛා; නිරාමිස දුක්ඛ, නිරාමිස සුඛ, නිරාමිස උපේක්ඛා |
| චිත්තානුපස්සනාව<br>(භාවනා අරමුණු 01) | 16. සරාග-විරාග; සදෙස-වීතදෙස; සමෝහ-වීතමෝහ සංඛිත්ත-වික්ඛිත්ත; මහග්ගත-අමහග්ගත; සඋත්තර-අනුත්තර; සාමාහිත-අසාමාහිත; විමුක්ත-අවිමුක්ත |
| ධම්මානුපස්සනාව<br>(භාවනා අරමුණු 05) | 17. නීවරණ පබ්බය 18. ඛන්ධ පබ්බය 19. ආයතන පබ්බය<br>20. බොජ්ඣංග පබ්බය 21. චතුසච්ච පබ්බය |

එම සටහනට අනුව කායානුපස්සනා සතිපට්ඨානයට අදාළ වන්නාවූ කර්මස්ථාන තුදුසකි. කාය ලෙස සලකන රූප සමූහය සත්ව පුද්ගල ආත්ම යැයි ගෙන අයෝනිසෝ මනසිකාරයෙන් හෙවත් නුනුවණින් බැලීමෙන් නිත්‍ය සුඛ සුබ ආත්ම වශයෙන් දැකීමෙන් මනස තුළ කෙලෙස් නැඟී සිටී. යොනිසෝ මනසිකාරයෙන් අනිත්‍ය අසුභ දුක්ඛ අනාත්ම වශයෙන් දැකීමෙන් එය වලක්වා ගත යුතු ය. ඒ සඳහා ඉහත දැක්වූ තුදුස් ආකාර වූ භාවනා අරමුණු උපයෝගි කර ගනිමින් සමථ විපස්සනා භාවනා වැඩීම කළ යුතු ය.

වේදනානු පස්සනාව ද එක් භාවනා ඇරමුණකි. එම අරමුණ නුවණින් මෙනෙහි කිරීමේ දී මූලික වශයෙන් ඇතිවන තුන් වැදෑරුම් වේදනාව හා නැවත දස ආකාරයකින් අනිත්‍යාදි වශයෙන් බලන්නාවූ විපස්සනා ඤාණයෙන් යුක්ත වූ සිහිය වේදනානුපස්සනා සතිපට්ඨානයයි.

චිත්තානුපස්සනාව තවත් භාවනා අරමුණකි. සරාග චිත්තාදි වශයෙන් සොළොස් ආකාරයකින් සිතේ ස්වභාවය නුවණින් සලකා බලන්නා වූ ඤාණයෙන් යුක්ත වූ සිහිය චිත්තානුපස්සනා සතිපට්ඨානයයි.

ධම්මානුපස්සනාව භාවනා අරමුණු පහකින් යුක්ත ය. නීවරණ, ඛන්ධ, ආයතන ධර්ම ස්වර්ග මෝක්ෂයට බාධක වන ආකාරයත් බොජ්ඣංග සහ සච්ච යන ධර්මයන් නිවනට උපකාර වන ආකාරයත් සලකා බලමින් සිහිය පිහිටුවා ගැනීම ධම්මානුපස්සනා සතිපට්ඨානයයි.

සතර සතිපට්ඨාන භාවනාවට අයත් කර්මස්ථාන හෙවත් භාවනා අරමුණු එක්විස්ස සමථ භාවනා හා විපස්සනා භාවනා යන වර්ග දෙක සඳහා ම යොදගත හැකි ය. එම අරමුණු සම්මුති සත්‍ය තුළ පමණක් දකිමින් ඒවායේ පවත්නා ස්වභාවයන් පිළිබඳව පමණක් සිත යොමුකරමින් සිත සමාධිගත කිරීම සමථයට අයත් වේ. එම කර්මස්ථානවල ඇතිවීම නැතිවීම බලමින්, අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙස දකිමින්; උපාදන නොකර ගනිමින් එම ධර්මතා පරමාර්ථ ධර්ම පමණක් ලෙස වටහා ගැනිම තුළින් ඥාණය වර්ධනය කිරීම විපස්සනාවට අයත්වේ.

## කායානුපස්සනා සතිපට්ඨානය

කාය නම් ශරීරයයි. පිළිකුල් සහගත වූ කෙස්, ලොම්, නිය, දත් ආදි කොට්ඨාසයන් ද චක්ඛු රෝග, සෝත රෝග ආදී සියගණන් රෝගයන්ට ද උත්පත්ති ස්ථානවන බැවින් මේ ශරීරය කාය නම් වේ. එම කය අනුව නුවණින් බැලීම කායානුපස්සනාවයි. කයේ ස්වභාවය හා ක්‍රියාකාරිත්වය විපස්සනා ඥාණයෙන් බලන්නේ කෙසේ ද යන්න සතිපට්ඨාන සූත්‍රයෙන් පැහැදිලි කෙරේ. ඒ සඳහා කායානුපස්සනාව කොටස් හයක් ලෙසටත්, කර්මස්ථාන තුදුසක් ලෙසටත් දක්වා ඇත. මෙහි 'පබ්බ' යනු පුරුක යන අදහස දෙයි.

### 01. ආනාපාන පබ්බය

පියවර හතරකින් යුක්තව හුස්ම ඉහළට ගැනීම හා පහළට හෙළීම පිළිබඳ ව භාවනා අරමුණක් වශයෙන් මෙනෙහි කිරීම.

### 02. ඉරියාපථ පබ්බය

පුද්ගලයා විසින් නිතර සිදුකරන විවිධ ඉරියව් පිළිබඳ ව භාවනා අරමුණක් වශයෙන් මෙනෙහි කිරිම.

### 03. සම්පජඤ්ඤපබ්බය

සියලු කටයුතුවලදී සාත්ථක සම්පජඤ්ඤය; (ඒවා අර්ථවත් ද) සප්පාය සම්පජඤ්ඤය; (ඒවා තමාට ගැලපේ ද) ගෝචර සම්පජ්ඤ්ඤය; (තමන්ගේ කමටහන හෝ මහණකමට අදාළ ද) අසම්මෝහ සම්පජඤ්ඤය; (මුලාවකින් තොරව කෙරෙන්නේ ද) යන සතරාකාර නුවණින් මෙනෙහි කිරීම.

### 04. පටික්කුලමනසිකාර පබ්බය

ශරීරය තුළ ඇති දෙතිස් කුණප කොට්ඨාසයන් ගේ පිළිකුල් බව නුවණින් මෙනෙහි කිරීම.

### 05. ධාතු මනසිකාර පබ්බය

ශරීරය තුළ ඇති විසි වැදෑරුම් පඨවිධාතුන් ද දෙළොස් වැදෑරුම් ආපෝධාතුන් ද, සතර වැදෑරුම් තේජෝ ධාතුන් ද, සය වැදෑරුම් වායෝ ධාතුන් ද පිළිබඳ ව නුවණින් මෙනෙහි කිරිම.

### 06. නවසීවථික පබ්බය

මළ මොහොතේ සිට අවස්ථා නවයක දී මෘත ශරීරයේ ඇතිවන පිළිකුල් සහගත බව මෙනෙහි කිරීම පිළිබඳ කර්මස්ථාන නවය.

මේ තුදුස් ආකාර වූ කර්මස්ථාන විපස්සනා භාවනාවකට යොද ගැනීමේ දී පියවර නවයක් අනුව නුවණින් මෙනෙහි කළ යුතු ය.

**1. ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති.**
**2. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති.**
**3. අජ්ඣත්ත බහිද්ධා වා කායෙ කායානුපස්සි විහරති.**
**4. සමුදයධම්මානුපස්සී වා කායස්මිං විහරති.**
**5. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති.**
**6. සමුදයවයධම්මානුපස්සී වා කායස්මිං විහරති.**
**7. අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය.**
**8. අනිස්සිතො ච විහරති.**
**9. න ච කිංචි ලොකෙ උපාදියති.**

මෙම පියවර නවය විසි එක් වැදෑරුම් කර්මස්ථානයන් සමග ම පොදුවේ යොදාගැනේ. එම නිසා එම භාවනා අරමුණු විපස්සනා වශයෙන් මෙනෙහි කිරීමේ දී මේ නව වැදෑරුම් න්‍යාය අනුව ගළපා ගත යුතු ය. මෙහි සරල සිංහල අර්ථය මෙසේ දැක්විය හැකි ය.

**1. තමාගේ කය, කය ලෙස මෙනෙහි කරමින් වාසය කරයි.**
**2. අනුන්ගේ කය, කය ලෙස මෙනෙහි කරමින් වාසය කරයි.**
**3. තමන්ගේ සහ අනුන්ගේ කය, කය ලෙස මෙනෙහි කරමින් වාසය කරයි.**
**4. කයෙහි ඇතිවීමේ ස්වභාවය මෙනෙහි කරමින් වාසය කරයි.**
**5. කයෙහි නැතිවීමේ ස්වභාවය මෙනෙහි කරමින් වාසය කරයි.**
**6. වරෙක කයෙහි ඇතිවීමේ ස්වභාවය ද වරෙක නැතිවීමේ ස්වභාවය ද මෙනෙහි කරමින් වාසය කරයි.**
**7. තමාට ආශ්වාස ප්‍රශ්වාස කය ඇත්තේ ය, සත්ත්ව පුද්ගල ආදී කිසිවක් නැත්තේ යැයි සිහි ඇතිව සිටී. ඒ සිහිය ඥානයේ හා සතියේ වර්ධනය පිණිස පවතී.**
**8. තණ්හා මාන දිට්ඨි වශයෙන් කිසිවක් නොගෙන නොඇලී වාසය කරයි.**
**9. සත්ත්ව ලෝකයෙහි රූපාදි කිසිවක් ආත්මාදි වශයෙන් ගැනීමක් නොකරයි.**

## වේදනානුපස්සනා සතිපට්ඨානය

වේදනා හෙවත් වින්දනයන් තෙවැදෑරුම් ලෙස සතිපට්ඨාන සූත්‍රයේ දැක්වේ. සතුට දනවන වින්දන සුඛ වේදනා වශයෙන් ද; අසතුට දනවන වින්දන දුක්ඛවේදනා වශයෙන් ද මධ්‍යස්ථ වින්දන උපේක්ඛා වේදනා වශයෙන් ද ඒවා නම් කෙරේ. මෙම මූලික වේදනා තුන හුදු වේදනා වශයෙන් ද භෞතික වස්තූන් හා සම්පත් මුල් වීමෙන් ඇතිවන තණ්හාව අනුව ගිය වේදනාව ආමිස වේදනා වශයෙන් ද අධ්‍යාත්මික කටයුතු මුල් වීමෙන් නිරාමිස වේදනා වශයෙන් ද මෙනෙහි කෙරේ. ඒ අනුව වේදනා සතිපට්ඨානය නව වැදෑරුම් වේ. එම වේදනා නවය මෙසේ දැක්වේ.

**1. සුඛ වෙදනා** - සුව පහසු කායික මානසික වේදනා
**2. දුක්ඛ වෙදනා** - දුක් සහගත කායික මානසික වේදනා
**3. උපෙක්ඛා වෙදනා** - විශේෂ සුවයක් හෝ දුකක් නැති මැදහත් වේදනා
**4. සාමිස සුඛ වෙදනා** - පස්කම් ගුණ ඇසුරෙන් වන සුඛ වේදනා
**5. සාමිස දුක්ඛ වෙදනා** - පස්කම් ගුණ ඇසුරෙන් වන දුක්ඛ වේදනා
**6. සාමිස උපෙක්ඛා වෙදනා** - පස්කම් ගුණ ඇසුරෙන් වන මධ්‍යස්ථ වේදනා
**7. නිරාමිස සුඛ වෙදනා** කාමයන්ගෙන් වෙන්වීමෙන් වන සුඛ වේදනා
**8. නිරාමිස දුක්ඛ වෙදනා** - කාමයන්ගෙන් වෙන්වීම සමග වන දුක්ඛ වේදනා
**9. නිරාමිස උපෙක්ඛා වෙදනා** - කාමයන්ගෙන් වෙන්වීම සමග වන මැදහත් වේදනා

මෙම වේදනා අවස්ථා සහ ඒවායේ ස්වභාවය අනුව මෙනෙහි කිරීමෙන් සාමාධිය වැඩේ. කායානු පස්සනා සතිපට්ඨානයට අදළව දක් වූ නව වැදෑරුම් විපස්සනා භාවනා ක්‍රමය අනුව වේදනාව නුවණින් මෙනෙහි කිරීමෙන් ලෝකෝත්තර ප්‍රඥාව කරා ළඟාවිය හැකි ය.

**චිත්තානුපස්සනා සතිපට්ඨානය**

උපතින් ප්‍රභාස්වර වූ (පිරිසිදු) සිත සමාජය සමඟ කටයුතු කිරීමේ දී තණ්හා මාන දිට්ඨි වශයෙන් කෙලෙස් ඇතුලු වීම නිසා කිළිටි වේ. සිතේ ඇතිවන එම ස්වභාවයන් හා ක්‍රියාකාරිත්වයන් පිළිබඳ ව නුවණින් අනුපස්සනා කිරීම හෙවත් මෙනෙහි කිරීම චිත්තානු පස්සනාවයි. සිත එසේ අනුපස්සනා කළ යුතු ආකාර දහසයක් සතිපට්ඨාන සූත්‍රයේ ඇතුළත් ව ඇත.

**1. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති**
රාග සහිත වූ සිත රාග සහිත වූ සිත යයි දැනගනී.
**2. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති**
රාගයෙන් තොර වූ සිත රාගයෙන් තොර වූ සිත යයි දැනගනී.
**3. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති**
ද්වේශ සහිත වූ සිත ද්වේශ සහිත වූ සිත යයි දැනගනී.
**4. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති**
ද්වේශ රහිත වූ සිත ද්වේශ රහිත වූ සිත යයි දැනගනී.
**5. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති**
මෝහ සහිත වූ සිත මෝහ සහිත වූ සිත යයි දැනගනී.
**6. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති**
මෝහ රහිත වූ සිත මෝහ රහිත වූ සිත යයි දැනගනී.
**7. සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති**
ථීනමිද්ධයෙන් හැකුළුණා වූ සිත හැකුළුණු සිත යයි දැනගනී.
**8. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති**
උද්ධච්චයෙන් වික්ෂිප්ත (විසුරුණු) සිත විසුරුණු සිත යයි දැනගනී.

**9. මහගගතං වා චිත්තං මහගගතං චිත්තන්ති පජානාති**
රූපා'රූපාවචර මහග්ගත සිත මහග්ගත සිත යයි දැනගනී.
**10. අමහගගතං වා චිත්තං අමහගගතං චිත්තන්ති පජානාති**
කාමාවචර වූ අමහග්ගත සිත අමහග්ගත සිත යයි දැනගනී.
**11. සඋත්තරං වා චිත්තං සඋත්තර චිත්තන්ති පජානාති**
සඋත්තර හෙවත් කාමාවචර සිත සඋත්තර සිත යයි දැනගනී.
**12. අනුත්තරං වා චිත්තං අනුත්තර චිත්තන්ති පජානාති**
අනුත්තර හෙවත් රූපා'රූපාවචර සිත අනුත්තර සිත යයි දැනගනී.
**13. සමාහිතං වා චිත්තං සමාහිත චිත්තන්ති පජානාති**
උපචාර අර්පණා සමාධීන්ගෙන් යුත් සිත සමාහිත සිත යයි දැනගනී.
**14. අසමාහිතං වා චිත්තං අසමාහිත චිත්තන්ති පජානාති**
උපචාර අර්පණා සමාධි රහිත සිත අසමාහිත සිත යයි දැනගනී.
**15. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති**
තදඞ්ග විෂ්කම්භන වශයෙන් විමුක්ත සිත විමුක්ත සිත යයි දැනගනී.
**16. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති**
තදඞ්ග විෂ්කම්භන විමුක්තියෙන් තොර සිත අවිමුක්ත සිත යයි දැනගනී.

මේ සිත්වල පවත්නා ස්වභාවය ඒ අයුරින් ම නුවණින් මෙනෙහි කරමින් සමථ භාවනාව වැඩිය හැකි ය. කායානුපස්සනා සතිපට්ඨානයේ දැක්වූ නව වැදෑරුම් විපස්සනා ක්‍රමය අනුව මේ සිතේ අවස්ථා දහසය නුවණින් මෙනෙහි කිරීම විපස්සනා ඥාණයට හේතු වේ.

### ධම්මානුපස්සනා සතිපට්ඨානය

ධම්මානුපස්සනා සතිපට්ඨානය ප්‍රධාන කොටස් පහකට බෙදේ. එනම්,

**01. නීවරණ පරිගගහ**
**02. ඛන්ධ පරිගගහ**
**03. ආයතන පරිගගහ**
**04. බොජ්ඣඞ්ග පරිගගහ**
**05. සච්ච පරිගගහ** යනුවෙනි.

මෙහිදී ධම්ම යන වචනයෙන් ස්වභාවය හැඟවේ. නිවරණයන්ගේ ස්වභාවය විමසා බලා දැනගැනීම නීවරණ පරිග්ගහ නම් වේ. ස්කන්ධයන්ගේ ස්වභාවය විමසා බලා දැන ගැනීම ඛන්ධ පරිග්ගහ නම් වේ. ආයතනයන්ගේ ස්වභාවය විමසා බලා දැනගැනීම ආයතන පරිග්ගහ නම්. බොධ්‍යඞ්ගයන්ගේ ස්වභාවය විමසා බලා දැන ගැනීම බොජ්ඣඞ්ග පරිග්ගහ නම්. ආර්ය සත්‍යයන්ගේ ස්වභාවය විමසා බලා දැනගැනීම සච්ච පරිග්ගහ නම් වේ.

**නීවරණ පරිග්ගහය (නීවරණ විමර්ෂණය)**

ස්වර්ග මෝක්ෂයට බාධක ධර්මයෝ නීවරණ නම් වෙති. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්චකුක්කුච්ච, විචිකිච්ඡා යයි එබඳු නිවරණ පසෙකි.

එය වැඩීමේ ක්‍රම පසෙකි.

01. සිතෙහි නීවරණයක් ඇති වූ විට තමාගේ සිතෙහි මේ නීවරණය ඇතැයි දැන ගැනීම.
02. සිතෙහි යම් නීවරණයක් නැති කල්හි මාගේ සිතෙහි මේ නීවරණය නැතැයි දැන ගැනීම.
03. නූපන්නා වූ යම් නීවරණයක් උපදින්නේ මෙසේ යයි දැන ගැනීම.
04. උපන්නා වූ යම් නීවරණයක ප්‍රහාණය සිදු වන්නේ මෙසේ යයි දැන ගැනීම.
05. නැති වූ යම් නීවරණයක් වේ නම් එය නැවත නූපදින්නේ කෙසේදැයි දැන ගැනීම.

**ඛන්ධ පරිග්ගහය (ස්කන්ධ විමර්ෂණය)**

1. **රූපස්කන්ධය**
2. **වේදනාස්කන්ධය**
3. **සංඥාස්කන්ධය**
4. **සංස්කාරස්කන්ධය**
5. **විඥානස්කන්ධය**

යන මේවා පඤ්චස්කන්ධ නම් වේ.

ශරීරය හා සම්බන්ධ වූ සීත ආදී හේතු නිසා වෙනස් බවට පත්වන සියල්ල රූපස්කන්ධ යයි කියනු ලැබේ. වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධ තුන චෛතසිකයි. යමක් විඳ ගැනීමේ ලක්ෂණය ඇති සියලු චෛතසික වේදනාස්කන්ධ නම්. යමක් හඳුනා ගැනිමේ ලක්ෂණ ඇති සියලු චෛතසික සංඥාස්කන්ධ නම්. යමක් අභිසංස්කරණය වන (රැස්වන) ස්වභාව ඇති (පුඤ්ඤ - අපුඤ්ඤ - ආනෙඤ්ජ - අභිසංකාර වශයෙන් වූ) සියලු චෛතසික සංස්කාරස්කන්ධ නම්. යමක් දැනගැනීමේ ලක්ෂණය ඇති චිත්තය විඤ්ඤාණස්කන්ධයයි. චිත්තය වූ විඤ්ඤාණස්කන්ධය හඳුනාගත් කල්හි චෛතසික වූ වේදනා ආදි ස්කන්ධ තුන පහසුවෙන් දැනගත හැකි ය. චිත්ත හා චෛතසික එකට ම උපදින එකවර නිරුද්ධ වන එක ම අරමුණක් ගන්නා එක ම චක්ඛු ආදී වස්තුවක ම පවතින ධර්මතාවන් වන බැවිනි.

මෙහිදී කායානුපස්සනාවෙන් රූපස්කන්ධය කියන ලදි. වේදනානුපස්සනාවෙන් වේදනා ස්කන්ධය කියන ලදි. චිත්තානුපස්සනාවෙන් විඤ්ඤාණස්කන්ධය කියන ලදි. ධම්මානුපස්සනාවෙන් සංඥා, සංස්කාර, ස්කන්ධ කියන ලදි. මෙසේ ස්කන්ධයන් පිළිබඳ ස්වභාවය විමසා බැලීම ධම්මානුපස්සනාවේ ඛන්ධපබ්බය හෙවත් ස්කන්ධ පරිච්ඡේදයයි.

**ආයතන පරිග්ගහය (ආයතන විමර්ෂණය)**

ස්වකීය ස්වකීය කාර්යයන්හි ආයතනය - ප්‍රයත්නය කරන්නෝ හෙවත් යෙදෙන්නෝ ආයතනයෝ ය. ඒ අනුව යමක් කරණ කොට ගෙන චිත්ත චෛතසික ධර්මයන් ස්වකීය කාර්යයන්හි යෙදීම කෙරේ ද ඒවා ආයතන නම්.

ආයතන දොළසකි.

**01. ආධ්‍යාත්මික ආයතන 06**

චක්ඛායතන (ඇස), සොතායතන (කණ), ඝාණායතන (නාසය), ජිව්හායතන (දිව), කායායතන (කය), මනායතන (සිත) යනුවෙනි. මෙහිදී චක්ෂුප්‍රසාද ආදි ප්‍රසාද රූප ආයතන වශයෙන් ගැනෙන බව සැලකිය යුතු ය.

**02. බාහිර ආයතන 06**

රූපායතන (රූපය), සද්දායතන (ශබ්දය), ගන්ධායතන (ගන්ධය), රසායතන (රස), ඵොට්ඨබ්බායතන (ස්ප්‍රෂ්ටව්‍ය), ධම්මායතන (ධර්ම) මෙහි ධම්මායතන යනුවෙන් අදහස් කරන ලද්දේ චෛතසික පනස් දෙකත්, සුඛුමරූප දහසයත්, නිර්වාණයත් යන මේ ධර්ම හැට නවය (69) යි. මෙසේ ආයතන පිළිබඳ ස්වභාවය විමසා බැලීම ධම්මානුපස්සනාවේ ආයතන පබ්බයයි.

**බොජ්ඣඞග පරිග්ගහය (බෝධ්‍යාංග විමර්ෂණය)**

සත්‍යාවබෝධය කරන සත්ත්වයන් තුළ ඇතිවියයුතු අංග බොජ්ඣංග නම් වේ. එබඳු වූ සත්‍යාවබෝධයට උපකාරක ධර්ම සතකි.

1. **සති සම්බොජ්ඣංගය**
2. **ධම්මවිචය සම්බොජ්ඣංගය**
3. **විරිය සම්බොජ්ඣංගය**
4. **පීති සම්බොජ්ඣංගය**
5. **පස්සද්ධි සම්බොජ්ඣංගය**
6. **සමාධි සම්බොජ්ඣංගය**
7. **උපෙක්ඛා සම්බොජ්ඣංගය**

මෙහි සතිය නම් හොඳ සිහිය යි. එම සිහියෙන් ධර්මය අධර්මය මේ යැයි වෙන්කොට දැනගැනීම ධර්ම විචයයි. එසේ වෙන් වශයෙන් දැනගත් ධර්මය වඩා ගැනීමටත්, අධර්මය බැහැර කර ගැනීමටත් සිත්හි ඇති නොපසුබස්නා උත්සාහය වීර්යයි. ඒ වීර්යය හේතුවෙන් සිතෙහි අධර්මය පිරිහී ධර්මය වැඩෙන විට ඇතිවන සොම්නස ප්‍රීතියයි. ඒ ප්‍රීතිය හේතුකොට ගෙන සිත කය දෙකෙහි ම ඇතිවන නොගිලන් සැහැල්ලු පස්සද්ධියයි. එසේ කය-සිත දෙකෙහි සැහැල්ලු බව හේතුකොට ගෙන යහපත් කුසල් අරමුණක සිත

එකඟව නැවතීම සමාධියයි. ඒ සමාධිය දියුණුව වූ කල්හි වේදනාවන්ගේ නිසරු බව වැටහී සැප-දුක් දෙකෙහි කම්පා නොවන මැදහත් ගතිය උපේක්ෂාවයි. මෙසේ මේ බොජ්ඣංග සත එකකට එකක් සම්බන්ධව ඇති අයුරු සැලකිය යුතු ය. මෙසේ බෝධ්‍යංග ධර්ම නිර්වාණාවබෝධයට උපකාරක ධර්ම බව වටහා ගෙන පුරුදු කිරීම ධම්මානුස්සතියේ බොජ්ඣංග පබ්බයෙන් අපේක්ෂා කෙරේ.

**චතුසච්ච පබ්බය (චතුස්සත්‍ය විමර්ෂණය)**

**1. දුක්ඛ සත්‍යය 2. සමුදය සත්‍යය 3. නිරොධ සත්‍යය 4. මාර්ග සත්‍යය**

යනුවෙන් චතුරාර්ය සත්‍යය දක්වේ.

**දුක්ඛ:** 'දු' යනු කුච්ඡිතයට හෙවත් පිළිකුල් කටයුතු නින්දිත දෙයට නමකි. 'ඛ' යනු හිස් දෙය (අහස) ට නමකි. මෙසේ නොයෙක් උවදුරු සහිත බැවින් කුච්ඡිත හෙවත් නින්දිත නුයි 'දු' නම් ද, බාල ජනයා ධ්‍රුව-සුභ-සුඛයයි සිතුවත් එසේ නොවන එයින් හිස්වූවක් බැවින් 'ඛ' වේ නුයි 'දුක්ඛ' නම් වේ. නින්දිත වූ අසාර දය දුක්ඛ යයි එයින් පැහැදිලි වේ.

**සමුදය:** සමුදය යන්නහි 'සං' 'උ' 'අය' යනුවෙන් වචන තුනකි. 'සං' යනුවෙන් සංයෝගය ද 'උ' යනුවෙන් උත්පත්තිය ද, 'අය' යනුවෙන් කාරණය හෙවත් හේතුව ද කියැවේ.

(තෘෂ්ණා) සංයෝගය ඇති කල්හි දුක්ඛසමුදය නම් වූ පඤ්චස්කන්ධයේ උපතට එය හේතු වේ. එය දුක්ඛසමුදය නම් වේ.

**නිරොධ:** නිරොධ යන්නෙහි 'නි' 'රොධ' යනුවෙන් වචන දෙකකි. 'නි' යන්නෙන් අභාවය (නැතිබව) කියැවේ. 'රොධ යන්නෙන් චාරක හෙවත් සොරගෙය (සිරගෙය) කියවේ. එබැවින් 'නිරොධ' යනු සසර හැසිරීම නැමැති කාරාගාරයාගේ (සිරගෙහි) වැලැක්ම යයි දත යුතුයි.

**මග්ග:** 'ම' යන්නෙන් මැරීම ද 'ග' යන්නෙන් ගමන ද කියැවේ. එබැවින් කෙලෙසුන් මරමින් (නැති කරමින්) යේනුයි මග්ග නම් වේ. එනම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

මෙසේ නිර්වාණය චතුස්සත්‍යය නුවණින් විමසා දන එය අවබෝධ කිරීමේ සිහියෙන් ක්‍රියා කිරීම ධම්මානුපස්සනාවේ චතුසච්ච පබ්බයෙන් කියැවේ.

**අභ්‍යාස**

01. බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨානය දේශනා කිරීමෙන් අපේක්ෂාකල අරමුණු පහ දක්වන්න.
02. සතර සතිපට්ඨානය විපස්සනා භාවනාවක් වීමට සම්මර්ශනය කළ යුතු නව වැදෑරුම් න්‍යාය නම් කරන්න. එම නව ආකාරය වෙන් වෙන්ව හඳුන්වන්න.

23
පාඩම

# බුදු දහමේ හේතුඵලවාදය

පටිච්ච සමුප්පාදය යනු බුදුදහමේ ඉගැන්වෙන මූලික ඉගැන්වීමකි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු පළමු සතියේ බෝ මැඩ වැඩ සිටිමින් පටිච්ච සමුප්පාද ධර්මය මුල සිට අගටත් (අනුලෝම වශයෙන්) අග සිට මුලටත් (පටිලෝම වශයෙන්) මෙනෙහි කළහ. මෙම පටිච්ච සමුප්පාද හෙවත් හේතුඵල දහම බුදුරදුන්ගේ නව සොයා ගැනීමක් නොව ලොව සැමදා පවතින ධර්මතාවකි. එම ධර්මතාව බුදුන් වහන්සේ ලොවට පැහැදිලි කළහ.

ලෝකයේ ප්‍රධාන ආගම් (ලෝක ආගම්) ලෙස සලකනු ලබන යුදෙව් ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම, හින්දු ආගම සහ බුද්ධාගම යන ආගම් මූලික වශයෙන් දේවවාදී ආගම් සහ අදේවවාදී ආගම් වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය. ඒ අනුව බුදුදහම හැර අනෙකුත් ආගම් දේවවාදී ආගම් ලෙස සැලකේ. දේවවාදී ඉගැන්වීම් මගින් සත්ත්වයා හා ලෝක නිර්මාණය සර්වඥ (සියල්ල දන්නාවූ) සර්ව බලධාරී (ඕනෑම දෙයක් කිරීමේ ශක්තිය ඇති) සර්වතෝ භද්‍ර (හැම අතින් ම යහපත්) දෙවියෙකුට භාර කළහ. ආදි ඉන්දීයයන් මෙම දෙවියා "බ්‍රහ්ම" හෝ "ඊශ්වර" නමින් ද යුදෙව් හා ක්‍රිස්තියානි ආගමිකයන් "යොහොවා" නමින් ද ඉස්ලාම් ආගමිකයින් "අල්ලා" නමින් ද හඳුන්වනු ලැබී ය. මෙමගින් උත්සාහගෙන ඇත්තේ සත්ත්වයා හා ලෝකයේ නිර්මාණය මැවුම්කාර, සර්ව බලධාරී දෙවියෙකු සතු වූවක් බව පෙන්වීමට ය. පටිච්ච සමුප්පාදය මගින් මෙම දේවවාදී ආගම්හි ඉගැන්වීම් සපුරා බැහැර කළහ. මෙසේ බෞද්ධ නොවන සිද්ධාන්ත පසකින් තබා බෞද්ධ සිද්ධාන්ත විවරණය කර තහවුරු කිරීම පටිච්ච සමුප්පාදය මගින් සිදුව ඇත. කර්මය, විපාකය, සංසාරය, පුනර්භවය ආදිය නිදසුන් ලෙස දැක්විය හැකි ය. බුදුදහමේ මූලික ඉගැන්වීම් සියල්ල ගොඩනගා ඇත්තේ පටිච්ච සමුප්පාද පදනම මත ය.

**යමෙක් පටිච්ච සමුප්පාදය දකි ද**
**හේ ධර්මය දකී**
**යමෙක් ධර්මය දකි ද**
**හේ පටිච්ච සමුප්පාදය දකී**

මෙමගින් පැහැදිලි වන්නේ ධර්මාවබෝධය හා පටිච්ච සමුප්පාද අවබෝධය දෙකක් නොව එකක් ම බව යි.

උපතිස්ස, කෝලිත පිරිවැජියන් සත්‍යය සොයා යන ගමනේ දී සංජය පිරිවැජියා ගුරු කොට සත්‍යය සෙවුමුත් ඔහුගෙන් එය ලබා ගැනීමට නොහැකි වූ විට ඔහු අතහැර දෙමගක ගියහ. උපතිස්ස පිරිවැජියාට අස්සජි මහරහතන් වහන්සේ හමු වූ විට ඔබ වහන්සේගේ ශාස්තෘවරයා දෙසූ දහම කුමක්දැයි විමසී ය. අස්සජි මහ රහතන් වහන්සේගේ පිළිතුර වූයේ පටිච්චසමුප්පාදය බවයි. එය මෙසේ ය.

**යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ**
**තෙසං ච යො නිරොධො එවං වාදී මහා සමණො.**

**යම් හේතුවකින් උපදින යම් ධර්මයක් වෙත් ද**
**ඒ හේතුව තථාගතයන් වහන්සේ දේශනා කළහ.**
**ඒවායේ යම් නිරෝධයක් වේ ද එය ද වදාළහ.**
**මහා ශ්‍රමණ තෙමේ මෙබඳු වාද ඇත්තේ ය.**

සත්ත්වයා සසර සැරීමට හේතුව මේ හේතුඵල දහම නොදැනීමෙන් අවුලෙන් අවුලට පත්වන බැවින් බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. (දී.නි. මහා නිදාන සූත්‍රය)

පටිච්ච සමුප්පාද යන්න තේරුම් ගැනීමේ දී එහි වචනාර්ථය තේරුම් ගැනීම වටී. ''පටිච්ච '' යනු ප්‍රත්‍ය කොට ගෙන, හේතුකොට ගෙන යනු යි. සමුප්පාද (සං+උප්පාද) යනු හට ගැනීම යි. විශ්වයේ ස්වභාවය පිළිබඳ බෞද්ධ අවබෝධය වන්නේ අදාළ හේතුන්ගේ හා ප්‍රත්‍යයන්ගේ සමවායෙන් ඊට උචිත වූ ඵලයන් හටගන්නා බව යි. ලෝකයේ ක්‍රියාකාරීත්වය හා පැවැත්ම සිදුවන්නේ මෙම ක්‍රියාදාමය තුළින් බව ඒ අනුව ප්‍රකාශ වේ.

පටිච්ච සමුප්පාද දේශනාවෙන් ප්‍රතික්ෂේප වන කරුණු හතරක් සංයුත්ත නිකායේ අචේල කස්සප සූත්‍රයෙහි දැක්වේ. අචේල කස්සප බුදුරදුන්ගෙන් පහත සඳහන් ප්‍රශ්න අසයි.

**1. දුක තමා විසින් කරන ලද ද? (සයංකතං දුක්ඛං)**
**2. දුක අනුන් විසින් කරන ලද ද? (පරකතං දුක්ඛං)**
**3. දුක තමා සහ අනුන් යන ආයතන දෙක ම විසින් කරන ලද ද? (සයංකතං ච පරකතං ච දුක්ඛං)**
**4. දුක තමා සහ අනුන් යන ආයතන දෙක විසින් නොකරන ලද ද? (අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං දුක්ඛං)**

මෙම ප්‍රශ්න හතරට ම එසේ නොවේ යන්න බුදුරදුන්ගේ පිළිතුර විය. එයින් කණස්සල්ලට පත් අචේල කස්සප දුක නොපවත්නේ ද (නත්ථි දුක්ඛං) යනුවෙන් අසයි. මෙය ද ප්‍රතික්ෂේප කරන බුදුහු දුක සත්‍යය වශයෙන් පවත්නා බව ප්‍රකාශ කරති. අවසන් ප්‍රශ්නයට ලැබෙන ඇත යන අර්ථයෙන් අචේල කස්සප වඩාත් වික්ෂිප්ත වන්නේ ඔහුගේ මූලික ප්‍රශ්න පිටුපස පවත්නා මානසිකත්වයට අනුව එක්කෝ යමක් තමා විසින් කළ යුතු ය. නැත්නම් තමාගෙන් පරිබාහිර ආයතනයක් මගින් කළ යුතු ය. ඒ දෙක ම නොවන්නේ නම් විය යුත්තේ අහේතුකව යමක් සිදුවීම යි. අහේතුකව යමක් සිදු නොවේනම් තත්ත්වය විය යුත්තේ එම වස්තුවේ අභාවය යි. ඉහත සඳහන් කරුණු හතරට ඇතුළත් නො වී පවත්නා ධර්මතාවක් ගැන කෙසේ කතා කළ හැකි ද? අචේල කස්සපගේ මෙම ගැටලුවට බුදුරදුන් දෙන පිළිතුරු නම් දුක පටිච්ච සමුප්පන්නව සිදුවන බවයි.

මෙම පිළිතුරෙහි දාර්ශනික අර්ථය නම් අන්තවලට නොවැටීම යි. එනම් මධ්‍යයෙන් සත්ත්වයාගේ දුක පිළිබඳ පැහැදිලි කිරීම යි. දුකෙහි කර්තෘ හෙවත් කරන්නා ලෙස තමා හෝ අනුන් හෝ හඳුනා ගැනීමෙහි පිටුපස ඇත්තේ ශාස්වතවාදය හා උච්ඡේදවාදය යන අන්ත දෙකයි. මෙහි පළමු වැන්නෙන් සදාකාලික ආත්මයක් හෙවත් ක්‍රියාකාරිකයෙක් පිළිගනු ලබන අතර, දෙවැන්නෙන් එබඳු ආත්මයක් හෙවත් ක්‍රියාකාරිකයෙකුගේ පැවැත්ම නිෂේධනය කරනු ලැබී ය. මෙම ශාස්වතවාදය හා උච්ඡේදවාදය යන අන්ත දෙක ම ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ මධ්‍යයෙන් ධර්මය දේශනා කළේ පටිච්ච සමුප්පාදය පිළිබඳ ඉගැන්වීම පදනම් කොටගෙන ය.

**(එතෙ තෙ උභො අනෙත අනුපගමම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා)**

පටිච්ච සමුප්පාද ක්‍රියාකාරීත්වය ලොව සැමදා පවතී. බුදුවරුන් ලොව පහළ වුව ද නැත ද ලොව පවතී. එහෙත් බුදුරජාණන් වහන්සේ මැනවින් එම ධර්මතාව අවබෝධ කොට සත්ත්වයාට දේශනා කළහ. එම පටිච්ච සමුප්පාද න්‍යාය සරල සූත්‍රයක් මගින් මෙසේ පෙන්වා දී ඇත.

| | |
|---|---|
| **අසමිං සති ඉදං හොති** | **මෙය ඇති කල්හි මෙය වේ.** |
| **ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** | **මෙය හට ගැනීමෙන් මෙය හට ගනී** |
| **අසමිං අසති ඉදං න හොති** | **මෙය නැති කල්හි මෙය ඇති නොවේ.** |
| **ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති** | **මෙය නැති වීමෙන් මෙය නැති වේ.** |

එසේ ම පහත සඳහන් ප්‍රකාශය සැලකිල්ලෙන් විමසා බලන කල පටිච්චසමුප්පාදයේ ස්වභාවය තවදුරටත් මැනවින් අවබෝධ කරගත හැකි ය.

A ඇති විට B වෙයි.
A ඉපදීමෙන් B උපදියි.
A නැති විට B නොවේ.
A නැතිවීමෙන් B නැතිවෙයි.

මෙය තවදුරටත් පහසුවෙන් තේරුම් ගැනීම සඳහා මෙසේ දැක්විය හැකි ය.

**බීජය ඇති කල්හි පැලය ඇති වේ.**
**බීජය නැතිනම් පැලයක් ඇති නොවේ.**

පටිච්ච සමුප්පාදය ගස්වැල් සහිත සත්ත්ව ලෝකයෙහි ද මිනිස් මනසෙහි ද එකසේ ක්‍රියාත්මක වේ. නියාම ධර්ම පහක් වශයෙන් බුදුදහමේ සඳහන් වනුයේ සමස්ත ලෝකයෙහි ක්‍රියාත්මක වන මෙම ස්වභාවය යි. බුදුදහමේ දැක්වෙන නියාම ධර්ම මෙසේ ය.



1. **උතු නියාමය** ලෝකයෙහි කාලගුණික වෙනස්කම් හේතු-ඵල අනුරූපව සිදුවීම.
2. **බීජ නියාම** බීජයට අනුව පැලය හට ගැනීම හේතු-ඵල අනුරූපව සිදුවීම.
3. **කම්ම නියාම** හොඳ නරක කර්මවලට හොඳ නරක විපාක ලැබීම හේතු-ඵල අනුරූපව සිදුවීම.
4. **ධම්ම නියාම** ලෝක ධර්මතා නමින් සැලකෙන ස්වභාව ධර්මයේ සිදුවීම. හේතු-ඵල අනුරූපව සිදුවීම.
5. **චිත්ත නියාම** සිතෙහි ක්‍රියාකාරිත්වය හේතු-ඵල අනුරූපව සිදුවීම.

මෙම නියාම ධර්ම සියල්ල සමස්ත ලෝකයෙහි කායික හා මානසික ක්‍රියා විවරණය කිරීමට පොදු වූ ධර්මතාවන් ය. හේතුඵල දහමට අනුරූප නොවන කිසිවක් සමස්ත ලෝකයෙහි දක්නට නොලැබේ.

පටිච්ච සමුප්පාද සිද්ධාන්තය මගින් බුදුදහම අපහට දුක ඇතිවන්නේ කෙසේ ද යන්න හා එම දුක නැතිවන්නේ කෙසේ ද යන්න විග්‍රහ කරයි. සත්ත්වයාගේ දුක ඇතිවීම පටිච්ච සමුප්පාද ඉගැන්වීමෙන් පැහැදිලි කෙරෙනුයේ එකිනෙක හා බැඳුණු අංග දොළහකින් (12) සිදුවන්නක් ලෙස ය. එම අංග දොළහ නම් අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා, මරණ, යන මේවා ය.

මෙම අංග දොළොසින් අනුලෝම වශයෙන් සසර දුක් ඇතිවන ආකාරය පෙන්වා දී ඇත. එම හේතු ප්‍රත්‍ය ධර්මයන් නැති කිරීමෙන් සසර දුක් නැතිවන ආකාරය පටිලෝම පටිච්ච සමුප්පාදයෙන් පැහැදිලි කෙරේ. මෙසේ හේතු ප්‍රත්‍ය ධර්මතා ඇති කළ සසර දුක් ඇතිවන සැටිත් හේතු ප්‍රත්‍ය ධර්ම නැති කළ සසර දුක් නැතිවන සැටිත් පටිච්ච සමුප්පාදයෙන් පැහැදිලි කෙරේ.

දුක පිළිබඳ පටිච්ච සමුප්පාද සිද්ධාන්තයට අයත් අංග දොළොස කෙටියෙන් මෙසේ ය.

| | |
|---|---|
| **අවිජ්ජා** | අවිද්‍යාව (නොදැනීම, අනවබෝධය) චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීම. |
| **සංඛාර** | සංස්කාර හෙවත් තිදොරින් රැස් කරන කුසල් හා අකුසල්. |
| **විඤ්ඤාණ** | ඉන්ද්‍රිය හා අරමුණු හේතු කොට ගෙන ඇතිවන සිත. |
| **නාම රූප** | ශරීරය හා මනස යන අංග දෙකේ එකතුව (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ). |
| **සළායතන** | ෂඩායතන (ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස). |
| **ඵස්ස** | ස්පර්ශය (ඉන්ද්‍රිය, අරමුණු, විඤ්ඤාණය යන තුන එකට එක් වීම). |
| **වේදනා** | විඳීම ( ස්පර්ශය හේතුවෙන් ඇතිවන සැප, දුක්, උපේක්ඛා, වේදනා). |
| **තණ්හා** | තෘෂ්ණාව (වේදනාව හේතුවෙන් ඇතිවන ඇලීම). |
| **උපාදාන** | අල්ලා ගැනීම (උපාදාන හේතුවෙන් දැඩිව අල්ලා ගැනීම). |
| **භව** | භවය (උපාදාන හේතුවෙන් උපත ලැබීමට කිසියම් භවයක් ඇතිවීම). |

**ජාති** උපත (භවය ඇතිවීම හේතුවෙන් එම භවයේ උපත ලැබීම).
**ජරාමරණ** මහලුවීම, මරණය (උපත ලැබීම හේතුවෙන් මහලුවීම හා ලෙඩවීම, මරණය ආදී දුක් ඇතිවීම).

හේතුඵල සිද්ධාන්තයට අනුව සත්ත්වයාගේ අභ්‍යන්තරයෙහි දුක් ඇතිවන හා නැතිවන ආකාරය මෙම අංග දොළොසින් දැක්වේ. මෙම පුද්ගල දුකට අමතරව සමාජගත දුක යයි හැඳින්විය හැකි අංගයක් ද පවතී. බුදුරජාණන් වහන්සේ සමාජ ගත දුක ඇතිවන හා නැතිවන ආකාරය බොහෝ සූත්‍ර මගින් පෙන්වා වදාළහ. මජ්ඣිම නිකායේ සල්ලේඛ සූත්‍රයේ සමාජ දුක් ඇතිවන ආකාරය පෙන්වන්නේ මෙසේ ය.

තණ්හාව හේතුවෙන් සෙවීම වේ. සෙවීම හේතුවෙන් ලැබීම වේ. ලැබීම හේතුවෙන් හොඳ නරක තීරණය කිරීම වේ. එසේ තීරණය කිරීම හේතුවෙන් ඇලීම වේ. ඇලීම හේතුවෙන් අයිතිය පිළිබඳ හැඟීම වේ. අයිතිය පිළිබඳ හැඟීමෙන් අයිති කර ගැනීම වේ. අයිති කර ගැනීමෙන් මසුරුබව (අන් අයට හිමිකර නොදීමේ ස්වභාවය) වේ. මසුරු බව හේතුවෙන් ආයුධ ගැනීම්, කළහ, ගැටුම්, අපහාස, කේලාම් කීම, බොරුකීම, වැනි අකුසල ක්‍රියා රාශියක් ඇති වේ.

මෙහි දැක්වෙන දුක වූ කලී ඉපදීම, වයසට යෑම, ලෙඩවීම, මරණය ආදී දුක නොව තෘෂ්ණාව හේතුවෙන් මිනිසුන් එකිනෙකා හා සටන් කිරීමට පෙළඹීමෙන් ඇතිවන දුක ය.

පටිච්ච සමුප්පාද සිද්ධාන්තය අපට වැදගත් වන්නේ දුක ඇති කරවන ආකාරය හා දුක නැතිවන ආකාරය තේරුම් ගැනීමට ය. දුක ඇතිවන ආකාරය තේරුම් ගත් විට එය ඇතිවීමට හේතු වූ සාධක නැති කිරීමෙන් දුක නැති කළ හැකි ය. පටිච්ච සමුප්පාද සිද්ධාන්තයේ මූලික පරමාර්ථය වනුයේ පුද්ගල හා සමාජ දුක නැති කිරීම ය. ඒ බව පහත ධර්ම පාඨයෙන් පැහැදිලි වේ.

**හෙතුං පටිච්ච සම්භූතං හෙතු භංගා නිරුජ්ඣති.**

**හේතුවකින් හටගත් යමක් වේ නම් එම හේතුව නැතිවීමෙන් අවසන් වේ.**

**අභ්‍යාස**

01. පටිච්ච සමුප්පාද යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.
02. පටිච්ච සමුප්පාදයේ අංග දොළොස පිළිවෙළින් ලියන්න.
03. යේ ධම්මා හේතුප්පභවා යන ගාථාව සම්පූර්ණ කර අර්ථය ලියන්න.
04. සමාජගත දුක කෙටියෙන් පැහැදිලි කරන්න.

# 24 පාඩම

# කළොත් කර්මය භවය එතැන ය

බෝසතාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී දම් පුරා අවසන තුසිත දෙව්ලොව උපත ලදහ. තුසිත දෙව්ලොව දිව්‍ය සැප විඳ පංච විලෝකන පිරික්සා මේ මනුෂ්‍ය ලෝකයෙ හි සුද්ධෝදන මහරජතුමා හා මහමායා දේවිය මව්පියන් කොට උපත ලද්දේ හේතුඵල දහමට අනුරූපව දුක ඇතිවීමේ මග හා දුක නැති කිරීමේ මග ලොවට එළිපෙහෙළි කිරීමට ය. දුකෙහි ඇතිවීම හා නැතිවීම අවබෝධ නොකරන තුරු සත්ත්වයා සසර සැරිසරයි. සත්ත්වයා සසර සැරිසරන්නේ සංඛාර රැස් කිරීමෙනි. සංස්කාර යනු කුසලා කුසල කර්ම රැස් කිරීම යි.

සත්ත්වයා නැවත නැවත උපත ලබන නිසා අප විසින් සිදුකරන කුසලා කුසල කර්ම පිළිබඳව ද විමසා බැලිය යුතු ය. මෙම පාඩමෙන් අප සාකච්ඡා කරන්නේ කර්මය හා පුනර්භවය පිළිබඳව යි. මෙම මිනිස් සමාජය තුළ නානාවිධ විෂමතාවන් දක්නට ඇත. කෙනෙක් පොහොසත්ව ද තව කෙනෙක් දුප්පත්ව ද උපදිති. කෙනෙක් දීර්ඝායුෂ්කව තව කෙනෙක් අල්පායුෂ්ක වේ. කෙනෙකු රෝගී වන අතර තව කෙනෙක් නිරෝගී වේ. කෙනෙකු නුවණැති වන අතර තවකෙනෙක් අනුවණ වේ. කෙනෙකු රූපී වන අතර තවකෙනෙක් විරූපී වේ.

මෙලෙස ලෝකයේ පවත්නා විවිධත්වයට බලපාන විවිධ හේතු සාධක ඇතැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. කර්මය ද ඉන් එකකි. පුද්ගල ජීවිතයට බලපාන කරුණුවලින් එකක් වන කර්මය පිළිබඳ නිරවුල් අවබෝධයක් අප තුළ තිබිය යුතු ය. පළමුව කර්ම යන්නෙහි සරල අර්ථය තේරුම්ගත යුතු ය. කර (කිරීමේ) ධාතුවෙන් නිපන් පාලි කම්ම (සං:කර්ම) ශබ්දය කිරීම, ක්‍රියාව යන අර්ථය දෙයි. එහෙත් සෑම ක්‍රියාවක් ම කර්ම නාමයෙන් නොගැනෙන බව වටහාගත යුතු ය. බුදු දහමේ කර්ම නමින් හැඳින්වෙන්නේ සිතාමතා (සචේතනික) කරන ක්‍රියා පමණි. හොඳ හෝ නරක හෝ සිතාමතා (අචේතනික) නොකරන ක්‍රියා කර්ම ගණයට නොවැටේ.

බුදුදහමට අනුව කම්ම හෙවත් ක්‍රියා සිදුවන දොරටු තුනකි. එනම් සිත (මනෝද්වාරය) කය (කායද්වාරය) වචනය (වාග්ද්වාරය) යනුවෙනි. යම් ක්‍රියාවක් කර්මයක් වීමට සිතාමතා සිදු විය යුතු ය. චේතනා පූර්වාංගව ම සිදුවිය යුතු ය. එබැවින් බුදුරජාණන් වහන්සේ චේතනාව ම කර්මය වශයෙන් හැඳින්වූහ.

**චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි**
**චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා.**

"මහණෙනි, මම චේතනාව ම කර්මය යයි කියමි. සිතින් සිතා කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ කර්ම කෙරෙයි."

**(අංගුත්තර නිකාය, නිබ්බේධික සූත්‍රය)**

බුදු දහමට අනුව කර්මය දෙයාකාර වේ. එනම් කුසල කර්ම හා අකුසල කර්ම යි. කුසල කර්ම හා අකුසල කර්ම වෙන් වෙන්ව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ද බුදුදහමේ දක්නට ලැබේ. කිසියම් කුසල කර්මයක් කිරීමේ දී චේතනාව අලෝභ, අදෝශ, අමෝහ යන කුසල මූලයකින් පිවිතුරුව පැවතියේ නම් එම කායික වාචසික හා මානසික ක්‍රියාව කුසල කර්මයක් වේ. චේතනාව ලෝභ, දෝස, මෝහ යන අකුසල මූලයකින් දූෂිතව පැවැතියේ නම් එම කායික, වාචසික හා මානසික ක්‍රියාව අකුසලයක් වේ.

යම් ක්‍රියාවක් අකුසලයක් ද කුසලයක් දැයි තීරණය කිරීමේ දී එයින් ලැබෙන ප්‍රතිඵල ගැන ද සලකා බැලීම වැදගත් වේ.

**තමන්ට හෝ අනුන්ට හෝ තමන්ටත් අනුන්ටත් යන දෙපක්ෂයට ම හානියක් වේ නම් එය අකුසලයකි. තමන්ට හෝ අනුන්ට හෝ තමන්ට අනුන්ට යන දෙපක්ෂයට ම හානියක් නොවේනම් එය කුසලයකි.**

**(මජ්ඣිම නිකාය අම්බලට්ඨික රාහුලොවාදසූත්‍රය)**

බුදු දහම අනුව කුසල් කරන්නා කුසල විපාකත් අකුසල් කරන්නා අකුසල විපාකත් ලබයි. මේ අනුව ධර්මය හා අධර්මය යන දෙක එක හා සමාන විපාක නොදෙයි. අධර්මය දුගතියටත් ධර්මය සුගතියටත් යාමට හේතු වේ.



**දූෂිත චේතනාවෙන් කරන ලද අකුසල කර්මයෙහි විපාක ගවයා පසු පස එන රියසක මෙන් දුක් දෙමින් ලුහුබැඳ එයි. පහන් චේතනාවෙන් කරන ලද කුසල කර්මයෙහි විපාකය අත්නොහැර සිටින සෙවනැල්ල මෙන් ලුහුබැඳ එයි-**

**(ධම්ම පදය යමක වග්ගය 12 ගාථා)**



කර්මයට අනුව විපාක ලැබෙන ආකාරය විස්තර කරන බුදුරජාණන් වහන්සේ සත්ත්වයන් අතර විවිධ උස්මිටිකම්, විෂමතා පවත්නා බව දේශනා කළහ.

**කම්මස්සකා මානව සත්තා, කම්ම දායදා, කම්ම යොනි, කම්ම බන්ධූ, කම්ම පටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති**

**(මජ්ඣිම නිකාය චූලකම්ම විභංග සූත්‍රය)**

''මාණවකය, සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය උරුම කොට ඇත්තාහ. කර්මයෙන් හටගත්තාහු ය. කර්මය ඥාති කොට ඇත්තාහු ය. කර්මය පිළිසරණ කොට ඇත්තාහු ය. කර්මය සත්ත්වයා උස් පහත් වශයෙන් බෙදන්නේ ය.''

සත්ත්වයාට සිදුවන සියල්ල අතීත කර්මයන්හි විපාක නොවේ. (සබ්බං පුබ්බෙ කත හේතු) යමෙකු එසේ සිතන්නේ නම් එය බුදු දහමට පටහැනි ය. සත්ත්වයාට සිදුවන විවිධ දේ විවිධ සාධක මත සිදුවන අතර කර්මය ඉන් එකක් පමණි. ධර්මයට අනුව ලෝකයේ සිදුවන දේ නියාම පහකට අනුව සිදු වේ.

**උතු නියාමය**

ලෝකයේ හේමන්ත, ගිම්හාන, වස්සාන වශයෙන් සෘතු තුනක් දක්නට ලැබේ. මෙම සෘතුන්ට අනුව ඒ ඒ කාලවල දී ස්වභාව ධර්මය විවිධ වෙනස්කම්වලට භාජන වේ. එම වෙනස්කම් ජීවීන්ට ද බලපායි. මෙලෙස කාලගුණය වෙනස් වීමෙන් සිදුවන බලපෑම උතු නියාම යි.

**බීජ නියාමය**

ගස්වැල් මෙන් ම සත්ත්වයෝ ද බීජ නිසා විවිධ වූ ස්වරූප ගනිති. දෙමව්පියන්ගේ ආරයෙන් හිමි වූ ලක්‍ෂණ දරුවන්ට ඇත. ඇතැම් විට දරුවෝ මවට පියාට සමාන වෙති. ඒ ඒ බීජයන්ට ආවේණික ලක්‍ෂණ ගස්වැල්වල දක්නට ඇත. මෙසේ බීජයට අනුරූපව ලෝකයේ සිදුවන සියල්ල බීජ නියාමය ලෙස දැක්විය හැකි ය.

**චිත්ත නියාම**

සිත සිතින් ම දැකිය යුතු ය. වෙනත් කිසිදු ක්‍රමයකින් දැකිය නොහැකි ය. මැනීම හෝ පාලනය කිරීම කළ නොහැකි ය. රූප ආදී අරමුණු ඉන්ද්‍රිය හා ගැටුණු කල්හි සිත් පරම්පරාව ක්‍රමානුකූලව ඇතිවේ. නැතිවේ. මෙය චිත්ත නියාමය යි.

**ධම්ම නියාම**

ස්වභාව ධර්මයේ සිදුවන සිදුවීම් ලෝක ධර්මතා නමින් හැඳින්වේ. ආලෝකය ලැබෙන විට අඳුර පහවීම, හැමවිට ම ජලය පහත් තැනින් ගලායෑම බුදුවරුන් වැනි ශ්‍රේෂ්ඨයන්ගේ උපතේ දී හා විපතේ දී සිදුවන විශේෂ සිදුවීම් ආදිය ධම්ම නියාම වේ.

**කම්ම නියාම**

ඒ ඒ කුසලා කුසල කර්මයන්ට අනුරූපව විපාක ලැබීම කම්ම නියාම නම් වේ.

ඉහත දක්නා ලද නියාම ධර්මයන්ට අනුව සියල්ල කර්මානුරූපව සිදු නොවන බව අපට අවබෝධ කරගත හැකි ය.

අතීත කර්මයන්හි ලැබෙන විපාකය වෙනස් කිරීම සත්ත්වයාට කළ හැකි බව ද ධර්මයෙහි ඉගැන්වේ. සාමාන්‍යයෙන් කුසල හෝ අකුසල කර්මයන්හි විපාක දීම විය හැකි හා වැළැක්විය හැකි අවස්ථා හතරක් පවතී. **ගති, කාල, උපධි, පයෝග** යනු එම හතරයි. මේවා යහපත් ආකාරයට මෙන් ම අයහපත් ආකාරයට බලපෑ හැකි ය. යහපත් නම් **සම්පත්ති** ලෙස ද අයහපත් නම් **විපත්ති** ලෙස ද හඳුන්වයි.

විපාක දීමට තිබුණමුත් සුදුසු උපතක් නොලැබීමෙන් එය වැලකිය හැකි ය. එය ගති විපත්තිය වේ. සුදුසු උපතක් ලැබීමෙන් විපාක ලැබෙනම් එය ගති සම්පත්තිය වේ.

කිසියම් පුද්ගලයෙකු පින්කළ මුත් යම්කිසි කාලීන හේතුවක් නිසා එහි විපාකය විඳින්නට නොහැකි වුවහොත් එය කාල විපත්තිය යි. දන් දී තිබුණමුත් දුර්භික්ෂ කාලයක උපදියි. එවිට එහි විපාකය විඳීමට සත්ත්වයාට අවකාශ නොලැබේ. කළ පිනෙහි විපාකය සුදුසු කාලයක උපතක් වී නම් ලද හැකි ය. එය කාල සම්පත්තිය යි.

පින් කළමුත් ශාරීරික දුබලතා ආදිය නිසා එහි විපාකය නොලැබේ නම් එය උපධි විපත්තිය යි. බහුශ්‍රැතයෙකු වීමට පින් ඇතිමුත් බිහිරිව ඉපදීමෙන් එය වැලකිය හැකි ය. සුදුසු උපතක් ලබා කළ පින්කම්හි විපාකය ලබන්නේ නම් එය උපධි සම්පත්තිය යි.

උත්සාහයෙන් වෑයමෙන්, වීර්යයෙන් කුසලයන්හි ඵල නොලබන්නේ නම් එය පයොග විපත්ති වේ. උත්සාහයෙන්, වෑයමෙන්, වීර්යයෙන් කුසලයන්හි ඵල ලබන්නේ නම් එය පයෝග සම්පත්තිය යි.

කර්ම යන්න සාංසාරික පැවැත්මේ ප්‍රබල සාධකයකි. ඒ නිසා පුනර්භවයට ප්‍රධාන වන්නේ ද කර්මය යි. කර්මය නිතර පවත්නේ සිත ඇසුරු කොටගෙන ය. කිසියම් භවයක මරණාසන්න අවස්ථාවේ පවත්නේ චුති සිතයි. ඒ වනවිට සත්ත්වයා කළ සියලු කර්ම පවත්නේ ද චුති සිත ඇසුරු කොට ය. කර්මයේ විපාකයෝ දෙයාකාර වෙත්. ඒවා මෙසේ ය.

**01. ප්‍රතිසන්ධි විපාක**
**02. ප්‍රවෘත්ති විපාක**

ප්‍රතිසන්ධි විපාක යන්නෙන් සඳහන් කරන්නේ උපතක් ලබා දීමට සමත් කර්ම යි. උපන් පසු ජීවිතය පවත්වා ගැනීමට උපකාරවන විපාක ප්‍රවෘත්ති විපාක නමින් හැඳින්වේ. කිසියම් ක්‍රියාවක් සිතින් සිතුවත් කයින්, වචනයෙන් ක්‍රියාත්මක නොවුනේ නම් එය හුදු කර්මයකි. එහෙත් එය කයින් වචනයෙන් ක්‍රියාත්මක වූයේ නම් කර්ම පථයකි. එහෙත් සිතින් කෙරෙන අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යා දෘෂ්ටි යන අකුසලත් එහි කුසල් පක්ෂයත් කයින් වචනයෙන් ක්‍රියාත්මක නොවූව ද කර්මපථ බවට පත් වේ. ප්‍රතිසන්ධි විපාක ලබා දෙන්නේ කර්මපථ බවට පත් වූ කර්ම පමණි. අනෙක් ඒවා ප්‍රවෘත්ති විපාක ලබා දෙයි. මෙසේ ප්‍රතිසන්ධි විපාක ලබා දෙන කර්ම චුති සිත සම්බන්ධ කොට පවතී. මිය යෑමේ දී ඊළඟ භවයේ ප්‍රතිසන්ධි සිත පහළ වීමට බලපාන්නේ ද මෙම කර්ම වේ.

සත්ත්වයාගේ නැවත උපත හෙවත් පුනර්භවයට සාධක තුනක් සම්පූර්ණ විය යුතු බව මහා තණ්හාසංඛය සූත්‍රයේ සඳහන් වේ. ඒවා මෙසේ ය.

- **මව්පිය සංවාසය**
- **මව ඍතුවීම**
- **ගන්ධබ්බයාගේ (උපත ලබන්නාගේ) පැමිණීම**

මෙම සාධක පිළිවෙලින් සම්පූර්ණ වීම මගින් පුනර්භවය සිදුවන බව දැක්වේ.

කර්මය සහ විපාකය පිළිබඳ ව ද කරුණු අවබෝධ කර ගැනීම වැදගත් වේ. සත්ත්වයා සාංසාරික සත්ත්වයෙකි. සත්ත්වයාට බලපාන කර්මය සිදු කරන කෘත්‍ය වශයෙන් ද (ලබා දෙන්නාවූ විපාක අනුව) විපාක දෙන පිළිවෙළ වශයෙන් ද විපාක දෙන කාල වශයෙන් ද චතුෂ්ක තුනකින් සමන්විත වේ.

**කර්ම විපාක දීමේ දී ලබාදෙන්නා වූ විපාක (කෘත්‍ය) අනුව සතරාකාර ය.**

### ජනක කර්මය

උපත ලබාදීම. කිසියම් ප්‍රතිසන්ධියක් ලබා දීමට ඉදිරිපත්වන කර්ම මෙනමින් හැඳින්වේ. මෙය කුසල හා අකුසල වශයෙන් දෙයාකාර වේ.

### උපත්ථම්භක කර්මය

කර්ම විපාක වැඩි කිරීම. මෙම කර්මයන්ට උපතක් ලබා දිය නොහැකි ය. ජනක කර්මයෙන් උපන් කල්හි ඊට උපකාර වෙයි. එය කුසල ජනකයක් නම් සැප විපාක දීමේ දී ප්‍රවෘත්ති විපාක ගෙන දෙමින් ඒ සැපය වැඩි කරන අතර, අකුසල ජනකයක් නම් දුක් විපාක දීමේ දී දුක වැඩි කිරීමට උපකාර වේ.

### උපපීළක කර්මය

කර්ම විපාක අඩු කිරීම, ජනක කර්මයෙන් උපන් සැප වූ හෝ දුක් වූ හෝ ප්‍රවෘත්ති විපාක එකදිගට විඳින්නට නොදී බාධා කිරීම උපපීළක කර්ම නම් වේ.

### උපඝාතක කර්මය

කර්ම විපාකය නැතිකිරීම. කර්ම විපාක විඳීමට අවස්ථාවක් නොලබන කර්ම මෙනමින් හැඳින්වේ.

**කර්මය විපාක දීමේ දී විපාක දෙන ආකාරය අනුව ද සතරාකාර ය.**

### ගරුක කර්මය

ගරුක යනු බරපතල, මහා සාවද්‍ය කර්ම යි. දෙවන භවයේ දී මෙම කර්මයන්හි විපාකය අනිවාර්යෙන් ලබා දෙයි. එහි විපාකය වෙනත් කර්මයකින් වැළැක්වීමට නොහැකි ය. අෂ්ටසමාපත්ති ලබා ගැනීම ගරුක කුසල කර්ම යි. ආනන්තරිය පාප කර්ම ගරුක අකුසල කර්ම යි.

### ආසන්න කර්මය

මරණාසන්න මොහොතේ දී කරන ලද හෝ සිහිපත් කරන ලද කර්ම යි. ගරුක කර්මයක් නොමැතිවිට ඊළඟ භවය තීරණය වන්නේ මෙම කර්මයන්ට අනුකූලව යි.

### ආචිණ්ණ කර්මය

ජීවිතයේ දී නිතර පුරුදු පුහුණු කරන ලද කර්ම යි. එක් වරක් කොට නැවත නැවත සිහිපත් කිරීම මගින් වන්නේ ද මේ කර්ම යි. ආසන්න කර්මයක් ඉදිරිපත් නොවූහොත් විපාක දීමේ ප්‍රමුඛත්වය ලබන්නේ මේ කර්ම යි.

**කටත්තා කර්ම**

බලවත් චේතනාවකින් තොරව කරන කර්ම යි. එහෙත් ගරුක, ආසන්න, ආචිණ්ණ කර්ම නොමැති විට ප්‍රතිසන්ධි විපාක වුව ද ලබා දීමට සමත් වේ.

**කර්මය විපාක දීමේ දී විපාක දෙන කාල වශයෙන් ද සතරාකාර ය.**

**දිට්ඨධම්ම වේදනීය කර්මය**

කළ ජීවිතයේ දී ම විපාක දෙන කර්ම දිට්ඨධම්ම වේදනීය කර්ම වේ.

**උපපජ්ජවේදනීය කර්මය**

ඊළඟ ජීවිතයේ විපාක දෙන කර්ම උපපජ්ජවේදනීය කර්ම වේ.

**අපරාපරිය වේදනීය කර්ම**

හැකි ඕනෑම විටෙක විපාක දෙන කර්ම අපරාපරිය වේදනීය කර්ම වේ.

**අහෝසි කර්ම**

විපාක දීමට අවස්ථාවක් නොයෙදෙන කර්ම අහෝසි කර්ම වේ.

කර්මය පිළිබඳ බුදුදහම විස්තර කර ඇත්තේ මෙලෙසිනි. කුසලා කුසල කර්ම පුනර්භවයට හේතු වේ. කුසලා කුසල කර්ම ක්ෂය කිරීම මගින් පුනර්භවය හෙවත් පුනරුප්පත්තිය නැති කළ හැකි ය. සෝවාන් ඵලයට පත්වීමත් සමග දුගති ප්‍රතිසන්ධි ලබාදෙන කර්ම සපුරා අහෝසි වේ. ඉන්පසු සත්ත්වයා අපාගත නොවෙයි. අනාගාමී වීමෙන් කාමසුගතියෙහි ප්‍රතිසන්ධිය ලබාදෙන කර්ම ද අහෝසි වෙයි. රහත් වීමෙන් සියලු කර්ම අහෝසි වෙයි. රහත් වී ජීවිතය පවත්නා තුරු පමණක් අපරාපරිය වේදනීය කර්ම ප්‍රවෘත්ති විපාක ලබාදෙයි. එහෙත් කිසිවිටෙක නැවත ප්‍රතිසන්ධියක් ලබා නොදෙයි.
විශුද්ධි මාර්ගයේ පුනර්භවය පිළිබඳ ඉදිරිපත් කරන වැදගත් සාරාංශයක් මෙසේ දැක්විය හැකි ය.

**''කම්මා විපාකා වත්තන්ති විපාකො කම්ම සම්භවො**
**තස්මා පුනබ්භවො හොති එවං ලොකො පවත්තති.''**

**(කර්මයෙන් විපාක ඇති වේ. විපාකය කර්ම බිහි කරයි.**
**එයින් පුනර්භවය සිදු වේ. ලෝකය පවත්නේ මෙසේ ය.)**

**අභ්‍යාස**

01. කම්ම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
02. කර්මයෙහි ප්‍රභේද වෙන් වෙන්ව ලියා දක්වන්න.
03. පංච නියාම ධර්ම නම් කොට ඉන් එකක් පැහැදිලි කරන්න.
04. ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක කෙටියෙන් විස්තර කරන්න.

25
පාඩම

# බුදු දහමේ චරණය

බුදුදහමේ මූලික හරය චතුරාර්ය සත්‍යය බව අපි දනිමු. සිදුහත් රජතුමා අභිනිෂ්ක්‍රමණය කළේ සත්ත්වයාගේ ඉපදීම, මහලුවීම, ලෙඩවීම, මරණය පිළිබඳ සත්‍ය ගවේෂණයක නියැළීමට ය. **(කිං කුසල ගවේසී)** කුසලය කුමක් ද? **(කිං සච්ච ගවේසී)** සත්‍ය කුමක් ද? යන්න එතුමාගේ මූලික පරීක්ෂණය විය. එතුමා මෙම ආර්ය පර්යේෂණයේ දී පළමු ව ආළාරකාලාම, උද්දකරාම පුත්ත වැනි තවුසන් කරා ගියේ ය. ඔවුන්ගේ දහම මැනවින් ප්‍රගුණ කළේ ය. නමුත් ඔහු සොයන සත්‍ය එමගින් එතුමාට නොලැබිණි. අනතුරුව එවකට ප්‍රචලිත බොහෝ පුද්ගලයන් විමුක්තිය සාධනය කළ හැකි යැයි විශ්වාස කළ කාමසුඛල්ලිකානු යෝගයත් (ශරීරයට දැඩි සැප දීම) අත්තකිලමථානු යෝගයත් (ශරීරයට දැඩි දුක් දීම) ප්‍රගුණ කළේ ය. එමගින් ද තම අපේක්ෂාවන් ඉටු නොවන බව ඔහු අවබෝධ කර ගත්තේ ය. කෙසේ වුව ද මෙම අන්තද්වයේ නිස්සාරත්වය දත් බෝසතාණෝ එම අන්ත බැහැර කළහ. මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කළහ. වෙසක් පුන් පොහෝ දින මධ්‍යම රාත්‍රියේ දී බෝ මැඩ දී පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්ඛය ඥාණය යන ත්‍රිවිද්‍යා පසක් කොට බුද්ධත්වයට පත් වූහ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද පළමු ධර්ම දේශනාව ධම්මචක්කප්පවත්තන සූත්‍රය යි. එමගින් චතුරාර්ය සත්‍ය දේශනාව ලෝකයට ගෙනහැර දැක්වූහ. එම චතුරාර්ය සත්‍ය මෙසේ ය.

01. **දුක්ඛාර්ය සත්‍යය**
02. **දුක්ඛ සමුදයාර්ය සත්‍යය**
03. **දුක්ඛ නිරෝධාර්ය සත්‍යය**
04. **දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍යය**

මෙමගින් ඉගැන්වෙන්නේ දුකත්, දුකට හේතුවත්, දුක නැති කිරීමත්, දුක නැති කිරීමේ මාර්ගයත් ය. මෙහි මූලික පරමාර්ථය වන්නේ දුක නැති කිරීමේ මාර්ගය හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ග ප්‍රතිපදාව පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාගැනීම යි.

මධ්‍යම ප්‍රතිපදාව යන්නෙහි අර්ථය හීන, ග්‍රාම්‍ය, පෘථග්ජනයන්ට අයත්, අනාර්ය, අනාර්ථකාරී කාමසුඛල්ලිකානු යෝගය හෙවත් කාමයන්හි ඇලී ගැලී විසීමත්, දුක් සහිත අනාර්ය, අනර්ථකාරී අත්තකිලමථානුයෝගය හෙවත් විවිධ කටුක ව්‍රතවලින් කයට දුක් දීමත් යන අන්ත දෙක බැහැර කිරීම ය. බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රයේ මෙම මධ්‍යම ප්‍රතිපදාව දේශනා කරන්නේ නෙත් පාදවන (චක්ඛු කරණී) ඥාණය ගෙනදෙන (ඥාණ කරණී) උපසමයටත්, අභිඥාවටත්, සම්බෝධියටත්, නිර්වාණයටත් (උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය, නිබ්බාණාය.) හේතුවන දහමක් බව යි.

ආර්ය අෂ්ටාංගික මාර්ගය නිර්වාණ අවබෝධය පිණිස අනුගමනය කළයුතු පිළිවෙත යි. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම අතුරින් කොටස් අටක් ම මෙහි ඇතුළත් වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන තැනැත්තා සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධාන, සතර ඍද්ධිපාද, පංචේන්ද්‍රිය, පංච බල, සත්ත බොජ්ඣංග යන සෙසු ධර්ම වඩන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ බව මජ්ඣිම නිකායේ සළායතන සූත්‍රයේ සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට සූදානම් වූ මොහොතේ උන්වහන්සේ සමීපයට වැඩම කළ සුභද්‍ර භික්ෂුවට දේශනා කරන්නේ යම් ශාසනයක ආර්ය අෂ්ටාංගික මාර්ගය ඇත්නම් එම ශාසනයේ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන පුද්ගලයන් සිව් දෙනා ම සිටින බව යි.

ලාභයන් අතර නිරෝගිකම උසස් බවත් සැප අතර නිවන ශ්‍රේෂ්ඨ බවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය නිවනට ළඟාවිය හැකි ශ්‍රේෂ්ඨතම මාර්ගය බවත් බුදුරජාණන් වහන්සේ මාගන්දිය නම් පිරිවැජියාට දේශනා කළ බව මජ්ඣිම නිකායේ මාගන්දිය සූත්‍රයේ සඳහන් වේ.

දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවේ දැක්වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය හෙවත් මධ්‍යම ප්‍රතිපදාව මෙසේ ය.

- **සම්මා දිට්ඨි** **නිවැරැදි දෘෂ්ටිය**
- **සම්මා සංකප්ප** **නිවැරැදි කල්පනාව**
- **සම්මා වාචා** **නිවැරැදි වචනය**
- **සම්මා කම්මන්ත** **නිවැරැදි ක්‍රියාව**
- **සම්මා ආජීව** **නිවැරැදි දිවි පැවැත්ම**
- **සම්මා වායාම** **නිවැරැදි උත්සාහය**
- **සම්මා සති** **නිවැරැදි සිහිය**
- **සම්මා සමාධි** **නිවැරැදි සමාධිය**



**''ඉදං ඛො පන භික්ඛවේ දුක්ඛ නිරොධගාමිණී පටිපදා අරියසච්චං අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො සෙය්‍යථීදං සම්මා දිට්ඨි, සම්මා සංකප්පො, සම්මා වාචා, සම්මා කම්මන්තො, සම්මා ආජීවො, සම්මා වායාමො. සම්මා සති, සම්මා සමාධි.''**

**''මහණෙනි, මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාර්ය සත්‍ය යි. එනම් ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ඒ කෙසේ ද යත් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම. සම්මා සති, සම්මා සමාධි ය යි.''**

මෙලෙස දම්සක් පැවැතුම් සූත්‍රයේ දැක්වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගය සම්මා යන උප පදයෙන් විශේෂ කොට දැක්වෙන්නේ බුදුදහමේ ඉගැන්වෙන කුසල් මාර්ගය අනුගමනය කරමින් ඉදිරියට යා යුතු බව පෙන්වීමට ය. වෙනත් දර්ශනවාදයන්ගෙන් වෙන් කොට දැක්වීම එහි අරමුණ වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය නමින් හැඳින්වෙන

මෙම ප්‍රතිපදාව බුදුරජාණන් වහන්සේ පළමුව දේශනා කළේ පස්වග මහණුන්ට ය. එමගින් අපේක්ෂා කළේ ඔවුන් තුළ පැවැති වැරැදි විශ්වාස හා දෘෂ්ටීන් ඉවත් කොට ආර්ය ධර්ම මාර්ගයට ඔවුන් යොමු කිරීම ය.

මිථ්‍යා දෘෂ්ටියෙන් වෙන්වීම හෙවත් සම්මා දිට්ඨිය පළමු පියවර වශයෙන් අත්‍යවශ්‍ය බව එමගින් අවධාරණය කෙරේ. යහපත් දැකීමෙන් තොරව අඳුරේ යෑම විමුක්ති මාර්ගයේ ගමන් කිරීම නොවේ. දුකෙහි නැතිවීම ඇති කරනුයේ ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙනි. එය මෙසේ දැක්වේ.

**සම්මා දිට්ඨි**

නිවැරැදි දෘෂ්ටිය, දැක්ම හෙවත් අවබෝධය යි. දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය යන චතුරාර්ය සත්‍යය පිළිබඳ ඥාණය සම්මා දිට්ඨිය ලෙස දැක්වේ. දසාකාර වූ මිථ්‍යා දෘෂ්ටියෙන් බැහැරව තමා, සත්ත්වයා, ලෝකය, මෙලොව, පරලොව ආර්ය මාර්ගය වැනි කරුණු පිළිබඳ නිවැරැදි අවබෝධය මෙමගින් අදහස් කෙරේ. සම්මා දිට්ඨිය නොමැති ව ආර්ය මාර්ගයෙහි ගමන් කළ නොහැකි ය. ආර්ය මාර්ගයෙහි අනෙකුත් අංගයන්ට පෙරටුව සම්මා දිට්ඨිය ගමන් කරනු ලැබේ. සම්මා දිට්ඨිය ඇතිවීමට බලපාන සාධක දෙකක් ධර්මයෙහි ඉගැන්වේ. පරතෝඝෝෂය හෙවත් අනුන්ගෙන් කරුණු අසා දැන ගැනීම සහ යෝනිසෝමනසිකාරය හෙවත් ඒ අසා දැනගත් ධර්මය නිවැරැදි කල්පනා කොට බැලීම යනු ඒ සාධක දෙක යි.

**සම්මා සංකප්ප**

නිවැරැදි සංකල්පනාව යි. නෙක්ඛම්ම සංකප්ප (කාමයන්ගෙන් තොරවීම) අව්‍යාපාද සංකප්ප (ක්‍රෝධයෙන් තොරවීම) අවිහිංසා සංකප්පය (හිංසාවෙන් තොරවීම) යන නිවැරැදි සංකල්පනා හෙවත් සිතුවිලිවලින් යුක්තවීම සම්මා සංකප්ප යන්නෙන් අදහස් කෙරේ. මෙම සංකල්ප හටගන්නේ අලෝභ, අදෝස, අමෝහ යන ත්‍රිවිධ අකුසල මූල හේතු කොටගෙන ය. කාම සංකල්ප, ව්‍යාපාද සංකල්ප, විහිංසා සංකල්ප යනු මෙහි මිථ්‍යා සංකල්පයෝ ය. මෙම මිථ්‍යා සංකල්පයන්ගෙන් බැහැරවීම සම්මා සංකල්පයෝ වෙති.

**සම්මා වාචා**

නිවැරැදි වචන භාවිතය යි. බොරු කීමෙන් වැළැකී සත්‍යය කීම, කේලාම් කීමෙන් වැළැකී අනුන් සමගි කරන වචන කීම, රළු වචන කීමෙන් වැළැකී මෘදු වචන කීම, හිස් වචන කීමෙන් වැළැකී අර්ථවත් වචන කීම සම්මා වාචා නම් වේ. සම්මා වාචා යන්නෙන් පුළුල් අර්ථයක් දෙයි. භාෂාව භාවිත කළ යුත්තේ කෙසේ ද යන්න මෙයින් විස්තර කෙරේ. ඇතමෙක් අත්තුක්කංසනය (තමා හුවා දැක්වීම) පරවම්භනය (අනුන් හෙළා දැකීම) යන දෙක සඳහා භාෂාව යොදා ගන්නා බව පධාන සූත්‍රයේ සඳහන් වේ. සමාජය තුළ ගැටුම් ඇතිවීමටත් ගැටුම් සමනය කිරීමටත් භාෂාව උපයෝගී වන බව අරණ විභංග සූත්‍රයේ සඳහන් වේ. වචන හෙවත් භාෂාව මැනවින් හැසිරවීම සම්මා වාචා ලෙස තවදුරටත් හැඳින්විය හැකි ය.

**සම්මා කම්මන්ත**

නිවැරැදි ක්‍රියාවෙන් යුක්ත වීමයි. පරපණ නැසීමෙන් වැළකී සියලු සත්ත්වයනට දයාව දැක්වීම, අන්සතු දේ ගැනීමෙන් වැළකී අන්‍යයන් සතු දේ ආරක්‍ෂා කිරීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී සදාචාරවත් දිවියක් ගත කිරීම සම්මා කම්මන්ත නම් වේ. සම්මා කම්මන්තයෙන් යුක්තවීම මගින් පුද්ගල යුතුකම් හා අයිතිවාසිකම් හි තහවුරු වීමක් ද දක්නට ලැබේ. එමගින් සාර්ථක සමාජ සම්බන්ධතා ගොඩනැගීමක් ද සිදු වේ. බියෙන් සැකයෙන් තොරව පුද්ගලයාට ජීවත්වීමේ පසුබිම ද මෙම සම්මා කම්මන්තය තුළින් නිර්මාණය වේ.

**සම්මා ආජීව**

නිවැරැදි දිවි පැවැත්ම යි. සතුන් වෙළඳාම, ආයුධ වෙළඳාම, වසවිෂ වෙළඳාම, මස් වෙළඳාම, මත්පැන් වෙළඳාම වැනි වැරැදි දෑ නොකොට නිවැරැදි මාර්ගවලින් දිවිපැවැත්ම සම්මා ආජීව නම් වේ. මෙමගින් මිථ්‍යා ආජීවයෙන් බැහැරවීම අදහස් කෙරේ. සිගාල, ව්‍යග්ඝපජ්ජ, පත්තකම්ම, අණන, කාමභෝගී වැනි සූත්‍රයන්හි දී සම්මා ආජීවය පිළිබඳ කරුණු දක්වා ඇත. සාහසික ක්‍රියාවන්හී නොයෙදෙමින් ධාර්මිකව ධනය ඉපයීම වැදගත් බව බුදුදහමේ ඉගැන්වීම යි. පන්සිල් ආරක්ෂා කරමින් වෙහෙස වී ධනය ඉපයීම බුදුදහම අනුමත කරයි. පන්සිල් සුරකින ක්‍රියා ධාර්මික ක්‍රියා වේ.

**සම්මා වායාම**

නිවැරැදි උත්සාහය යි. උපන් කුසල් උපදවා ගැනීමටත් නූපන් කුසල් වැඩිදියුණු කර ගැනීමටත්, නූපන් අකුසල් නූපදවීමටත්, උපන් අකුසල් නැති කර දැමීමටත් දරණ උත්සාහය සම්මා වායාම නම් වේ. සතර සම්‍යග්ප්‍රධාන ලෙස ද මේවා දැක්වේ. මෙම කරුණු විස්තර කරන තැනක සම්මා වායාමයේ ලක්ෂණ ලෙස (සංවරප්පධාන) සංවරවීමට උත්සාහ කිරීම, (පහානප්පධාන) උපන් කාම සිතුවිලි, ව්‍යාපාද සිතුවිලි, විහිංසා සිතුවිලි අත්හැරීමට උත්සාහ කිරීම, (භාවනප්පධාන) සිත දියුණු කිරීමට උත්සාහ කිරීම, (අනුරක්ඛනාප්පධාන) උපදවා ගත් යහපත් සමාධි නිමිත්ත ආරක්ෂා කිරීමට උත්සාහ කිරීම යන කරුණු සතර දක්වා ඇත.

**සම්මා සති**

නිවැරැදි සිහිය යි. කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව යන කරුණු විෂයයෙහි පිහිටුවන සිහිය සම්මා සතිය නම් වේ. සම්මා සතිය උපදවා ගැනීම පිණිස කල්‍යාණ මිත්‍ර සේවනය හා යෝනිසෝමනසිකාරය (සිහිබුද්ධියෙන් මෙනෙහි කිරීම) කළයුතු වේ. සිහියෙන් කටයුතු කරන ලෙස බුදුරජාණන් වහන්සේ නිතර උපදෙස් දුන් බව බොහෝ සූත්‍ර දේශනා මගින් පැහැදිලි වේ.

**සම්මා සමාධි**

නිවැරැදි සමාධිය යි. සිත එකග කිරීමට හේතුවන රූප හා අරූප ධ්‍යානයන් වැඩීම සම්මා සමාධි නම් වේ. කුසල් සිතෙහි එකග බව සමාධි ලෙස දැක්වේ. සිත එකග වන්නේ ප්‍රථම ධ්‍යානය, ද්විතිය ධ්‍යානය, තෘතිය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය යන ධ්‍යාන සතර වැඩීමෙනි. මෙම ධ්‍යාන මගින් කෙරෙණුයේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච

කුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ ධර්ම පස යටපත් වීමයි. මෙමගින් පංච නීවරණ ධර්ම සම්පූර්ණ වශයෙන් යටපත් නොවේ. ධ්‍යාන පවතින තාක් නීවරණ ධර්ම යටපත් වේ. ධ්‍යානයෙන් සිත වෙන් වූ විගස නැවැත එම නීවරණ ධර්ම සිතට පැමිණේ. නීවරණ ධර්ම සම්පූර්ණ වශයෙන් යටපත් වනුයේ මාර්ග ඵල ලැබීමෙන් පසුව යි.

මෙම ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි අංග සීල, සමාධි, පඤ්ඤා යනුවෙන් ත්‍රිවිධ ශික්ෂාවක ට අන්තර්ගත වේ. එය මෙසේ ය.

**සම්මා දිට්ඨි**
**සම්මා සංකප්ප** } **පඤ්ඤා**

**සම්මා වාචා**
**සම්මා කම්මන්ත** } **සීල**
**සම්මා ආජීව**

**සම්මා වායාම**
**සම්මා සති** } **සමාධි**
**සම්මා සමාධි**



බුදුදහමේ ඉගැන්වෙන ත්‍රිවිධ ශික්ෂාව විමුක්ති මාර්ගයට අනුපූර්ව ශික්ෂාවකි. එනම් සරල හා පහසු ආරම්භයක සිට ක්‍රමයෙන් ගැඹුරට ගමන් කරන්නකි. ඒ අනුව ආර්ය මාර්ගය පටන් ගන්නේ සීලයෙනි. සීලය සම්පූර්ණ වූ පසු සීලයෙන් යුතුව සමාධිය වැඩිය යුතු ය. සීලයත් සමාධියත් සම්පූර්ණ වූ පසු එම දෙකින් ම යුතුව ප්‍රඥාව වැඩිය යුතු ය.

මෙහි දී පැන නගින ගැටලුවක් නම් නිවන් මාර්ගය සීල, සමාධි, ප්‍රඥා යන ආකාරයෙන් ගැඹුරට යන්නේ නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨියෙන් ආරම්භ වන්නේ කවර හෙයින් ද යන්න යි. ප්‍රඥාවට ආදාළ අංග පළමුව දැක්වීමට හේතුව වන්නේ නිවැරැදි අවබෝධය හා නිවැරැදි ආකල්ප නොමැතිවිට බුදුන් දේශිත ධර්ම මාර්ගයේ ගමන් කිරීමට අපහසු බැවිනි. (පඤ්ඤාවන්තස්සායං ධම්මො)

මෙම ත්‍රිවිධ ශික්ෂාව එකිනෙක වෙන් වෙන්ව නොව එකවර දියුණු කළ යුතු ධර්මතා බවත් එමගින් සත්ත්වයාට සසර දුකට හේතුව හා තෘෂ්ණාවත් එම තෘෂ්ණාව නැති කිරීම නම් වූ නිර්වාණාවබෝධයත් සාක්ෂාත් කළ හැකි ය.

**අභ්‍යාස**

01. දුරුකළ යුතු අන්ත කවරේ දැ යි ලියන්න.
02. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දක්වන්න.
03. සම්මා කම්මන්තයෙන් යුතුව කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

**පැවරුම**

01. ආර්ය අෂ්ටාංගික මාර්ගය නිරතුරුව දියුණු කිරීමෙන් යහපත් පුද්ගලයෙකු නිර්මාණය වේ. මැයෙන් ඔබ පිරිවෙනෙහි වාර්ෂික සඟරාවට ලිපියක් සකස් කරන්න.

**භාවිතයට**

**මග්ගානට්ඨංගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා**
**විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානං ච චක්ඛුමා**

(සියලු මාර්ග අතුරෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය ශ්‍රේෂ්ඨ ය. සියලු සත්‍ය අතුරෙන් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍ය ශ්‍රේෂ්ඨ ය. සියලු ධර්ම අතුරෙන් නිවන ශ්‍රේෂ්ඨ ය. ද්විපාද සත්ත්වයන් අතුරෙන් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ ය.)

**(ධම්ම පදය මග්ග වග්ගය)**

| 26 පාඩම | # මිහින්තලාවයි දහම් අමාවයි |
|---|---|

බුදු දහම ලක්දිවට පැමිණියේ ක්‍රි.පූ. 3වන ශතවර්ෂයේදී ය. ඒ වන විට ලංකාවේ මුල් බැසගත් ආගමක් නොවී ය. එවකට තිබූ ඇදහිලි විශ්වාස අතර යක්ෂයන් පිදීම ප්‍රධාන විය. පණ්ඩුකාභය රජු චිත්තරාජ, කාලවේල යන යක්ෂයන් දෙදෙනාට දේවාල කරවූ බව මහාවංශයේ සඳහන් වේ. අනෙක් අතට ඔවුන් රජුගේ ම හිතවතුන් ලෙස සිට මියගිය වුන් බැවින් එය මළවුන් පිදීමේ සිරිතක් ලෙසට සැලකිය හැකි ය. මේ අවධියේ දඹදිව තිබූ විවිධ ආගම්වල පූජකයන් ද ලංකාවට සංක්‍රමණය වී සිටි බවට සාධක හමුවේ. ඒ අතර බ්‍රාහ්මණයෝ ද වූහ. පණ්ඩුකාභය කුමරුට ශිල්ප ඉගැන්වූයේ ද බ්‍රාහ්මණයෙකි. තව ද පණ්ඩුකාභය රජු ජෝතිය, ගිරි හා කුම්භණ්ඩ යන නිගණ්ඨයන්ට ආරාම කරවූ බවට සඳහන් වීමෙන් ජෛනයන් හෙවත් නිගන්ඨයන් ද මෙහි වාසය කළ බව පෙනී යයි. පසුකලෙක වළගම්බා රජු අභයගිරිය ඉදිකරවූයේ ඒ ගිරි නිගන්ඨයාගේ අසපුව තිබුණු තැන ය. මීට අමතරව පරිබ්‍රාජකයන් ආජීවකයන් වැනි ශ්‍රමණයන් ද ලක්දිව ගැවසී තිබේ. පණ්ඩුවාසදේව, භද්දකච්චායනා වැනි අය දඹදිවින් මෙරටට පැමිණ ඇත්තේ පරිබ්‍රාජක වැනි තවුස් වෙස් ගෙන ය. එයින් පෙනෙන්නේ ඔවුන් මෙරටට ජනයාට හුරුපුරුදු අය වූ බවයි.

බුදුරජාණන් වහන්සේ තෙවරක් ම ලක්දිවට වැඩම කළහ. එයින් නාගදීපයට හා කැළණියට වැඩම කළ අවස්ථාවල දී මුහුදුකරයේ ජීවත්වූ නාග ගෝත්‍රිකයෝ බුදුන් සරණ ගියහ. මහියංගනයට වැඩි පළමු ගමනේ දී කඳුකරයේ විසූ සුමන දිව්‍යරාජයා බුදුරදුන් සරණ ගියේ ය. ඔහුගේ ආරාධනය පරිදි සමනළ කන්දට වැඩම කළ උන්වහන්සේ එහි සිරිපා සටහන් තැබූහ. එසේ ම ඒ අවස්ථාවේ සොළොස්මස්ථාන පිහිටි තැන්වල උන්වහන්සේ ස්වල්ප වේලාව බැගින් වැඩහුන් බව සඳහන් වේ. එහෙත් මේ කිසිවක් නිසාවත් කිසිම ආගමක් ලංකාවේ බලවත් ආගමක් ලෙස පිළිගැනී තිබුණේ නැත.

### අශෝක රජතුමාගේ ධර්මප්‍රචාරය

අශෝක රජතුමා දඹදිව එක්සේසත් කොට දිග්විජය නවත්වා ඒ වෙනුවට ධර්මවිජය ආරම්භ කළේ ය. ඒ අනුව පළමුකොට එතුමා අවට රටවල් සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගත්තේ ය. ලංකාවේ තිස්ස රජතුමා ද එතුමාගේ ජයග්‍රහණයට සුභපතා දූතයන් අත පඬුරු යැවී ය. එතැන් සිට දෙදෙනා නොදුටු මිතුරෝ වූහ. අශෝක රජතුමා තිස්ස රජතුමාට රජකෙනෙකුට අවශ්‍ය රාජකීය භාණ්ඩ තෑගි කර එවා නැවත අභිෂේක කරන ලෙස ඉල්ලා සිටියේ ය. තමනුත් තෙරුවන් සරණ ගිය බැවින් තිස්ස රජුටත් තෙරුවන් සරණ යන ලෙස ද දන්වා එවී ය. ඒ අනුව තිස්ස රජු තෙරුවන් සරණ ගොස් නැවත අභිෂේක කළේ ය. ලක් රජු කෙරෙහි අශෝක රජතුමාගේ සැලකිල්ල කෙතරම් වීද යත් තම ගෞරව නාමය වූ 'දේවානම්පිය' යන්න ද තිස්ස රජුට ප්‍රදානය කර එවී ය. එතැන් සිට ලක්රජු දේවානම්පිය තිස්ස නම් විය.

## මහින්දාගමනය

මිහිඳු මා හිමියන් ලක්දිවට වැඩම කළේ ක්‍රි.පූ. තුන්වන ශතවර්ශයේ මැද භාගයේ පොසොන් පොහොය දිනක ය. එකල පොසොන් පොහොය දිනය නැකැත් කෙළි දිනයකි. දෙවනපෑතිස් රජතුමා ද එදින මිහින්තලයේ දඩ කෙළියේ යෙදී සිටියේ ය. ඒ මස් පිණිස නොව ක්‍රීඩා පිණිසත්, ශිල්ප දැක්වීම පිණිසත් ය. අම්බස්ථලයට වැඩමවා සිටි මිහිඳු මාහිමියන් ඇතුළු දූත පිරිස ලක්රජුට මුණ ගැසුණේ ඔහු මුවෙකු පසුපස ලුහුබඳිද්දී ය. ''තිස්ස'' යැයි තමන් අමතනු ඇසී නැවතී බැලූ රජතුමාට මිහිඳු මා හිමියන් වහන්සේ

**සමණා මයං මහාරාජ ධම්මරාජස්ස සාවකා**
**තවෙව අනුකම්පාය ජම්බුදීපා ඉධාගතා**

යනුවෙන් තමන් කවුරුද කුමක් සඳහා පැමිණියේදැයි පැහැදිලි කළහ. මේ තම නොදුටු මිතුරාගේ පුතණුවන් බව හඳුනාගත් රජු උන්වහන්සේ ප්‍රධාන පිරිස සාදරයෙන් පිළිගෙන අඹ සෙවණක වඩා හිඳුවී ය. එහිදී අඹ ප්‍රශ්නය සහ ඥාති ප්‍රශ්නය අසා රජතුමාගේ නුවණ මට්ටම තේරුම්ගත් මිහිඳු හිමියෝ රජුට **චූලහත්ථිපදෝපම සූත්‍රයෙන්** දහම් දෙසූහ. එය තුනුරුවන් කෙබඳු ද යන්නත් රහත් බව හා චතුරාර්ය සත්‍ය වැනි ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳවත් කරුණු ඇතුළත් අගනා සූත්‍රයකි. එයින් රජතුමාට බුදු දහමත් බුදුරදුන් සහ මහසඟරුවනත් පිළිබඳ මූලික දැනුමක් ඇතිවිය. රජතුමා බුදුදහම වැළඳගත්තේ ය. එදා මහින්ද මා හිමියන් සමග ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලාත් සුමන සාමණේරයන් සහ භණ්ඩුක උපාසකයනුත් යන සය දෙනෙක් පැමිණියෝ ය. එයින් සුමන සාමණේරයෝ සංඝමිත්තාවගේ පුතණුවෝ ය. භණ්ඩුක උපාසකයා මිහිඳු මා හිමියන්ගේ සුළු මවගේ දියණියගේ පුතනුවණන් ය.

එදා සැගිරියේ ම විසූ දූත පිරිස් පසුදා රජුගේ ඇරයුම් පරිදි අනුරපුර අගනුවරට වැඩම කළහ. රජතුමා දන් පිළිගැන් වූ අතර මහතෙරණුවෝ රැස්ව සිටි පිරිසට පේතවත්ථු සහ විමානවත්ථු කතාපුවත්වලින් අනුමෝදනා කළහ. ඒවායේ ඇතුළත් වන්නේ කළකම් පල දී ප්‍රේතලොව සහ දෙව්ලොව උපන් අයගේ කතාපුවත් ය. එතැන්සිට දිගට ම ධර්මදේශනා පැවැත්විණ. ඒ දේශනා අතර නිරා දුක ගැන කියැවෙන **දේවදූත** සූත්‍රයත්, දියුණුවන්නන් හා පිරිහෙන්නන් ගැන කියැවෙන **බාලපණ්ඩිත** සූත්‍රයත් ප්‍රධාන වේ. එමගින් සුවසේ විසීමට කෙනෙකුට සදාචාරයේ ඇති වැදගත්කම පහදා දුන් අතර ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ ව අලුත් අරමුණක් ඇති නව දර්ශනයක් ශ්‍රාවක ජනයා තුළ පහළ විය.

මුලින් ම දූත පිරිස වැඩ සිටියේ මහමෙව්නා උයනේ පිහිටි රජමාලිගයේ ය. ඒත් රජතුමාගේ බලවත් ඇවටිල්ල නිසා ය. අනතුරුව දෙවනපෑතිස් රජතුමා මහමෙව්නා උයන ද උන්වහන්සේලාට අතපැන් වත්කොට පිදී ය.

මහමෙව්නා උයන සඟසතු කිරීමෙන් පසු මිහිඳු හිමියෝ එම භූමියේ බුද්ධ සාසනයේ මූලස්ථානය වූ මහාවිහාරය පිළියෙල කරන්නට කටයුතු කළහ. ඒ සඳහා භූමිය මැනීමේදී රජතුමා තමන්ගේ මාලිගාවත් ඒ භූමියට ම ඇතුළත් කොට මනින ලෙස ඉල්ලා සිටියේ ය. එසේ කළේ තමන්ටත් සාසනික නීතියට අනුව කටයුතු කළ හැකි ය කියා ය. මෙය ලංකාවේ රජතුමා සාසනයට අවනත කෙනෙක් විය යුතු ය යන සම්ප්‍රදාය ඇතිවීමට ප්‍රධාන කාරණය විය.

අනතුරුව මිහිඳු හිමියන්ගේ කැමැත්ත පරිදි වෙන ම ආවාස ගෙයක් ඉක්මනින් තනවන ලදි. එය මැටියෙන් තනා කොළ අතු දමා පිළිස්සීම නිසා කලු පැහැ ගත්තේ ය. එනිසා එය **කාලපාසාද** නමින් ප්‍රකට විය. එම ආරාමය **තිස්සාරාමය** නම් විය.

නොබෝදවසකින් දෙවනපෑතිස් රජු දූන් බුදුසසුන මෙරට පිහිටියේ දැයි තෙරුන් වහන්සේගෙන් විචාළේ ය. උන්වහන්සේගේ පිළිතුර වූයේ ලංකාවේ දෙමව්පියන්ගෙන් ලංකාවේ ම උපන් පුතෙකු ලංකාවෙහිදී ම පැවිදි වී ලංකාවෙහිදී ම විනය හදාරා ලංකාවෙහිදී ම විනය සංගායනා කළ විට සසුන මුල්බැස ගත්තා වන්නේ ය යනු ය. මෙයින් ප්‍රකට වන්නේ බුදුසසුන ලංකාවට පවරාදීමට මිහිඳු හිමියන්ට කොතරම් උවමානවක් තිබුණේ ද යන්නයි. මේ අරමුණ නොබෝ කලකින් අරිට්ඨ තෙරණුවෝ ඉටු කළහ.

මහින්ද තෙරුන් ඇතුලු දූත පිරිස විසිහය දවසක් අනුරාධපුරයේ වැඩ විසූහ. වැඩකටයුතු සීඝ්‍රයෙන් කෙරීගෙන ගියේ ය. අලුත් ධර්මයෙහි අගය වැසියන්ට පහදා දෙනු වස් උන්වහන්සේ **අග්ගික්ඛන්දෝපම, ධම්මචක්කපවත්වන** ආදි සූත්‍ර දේශනා රාශියක් කළහ. විසිහත්වෙනි දවසේ උන්වහන්සේලා අනුරාධපුරයෙන් නික්ම වස්වසනු පිණිස මිහින්තලයට වැඩම කළහ. එදා ම රජතුමාගේ බෑණනු වූ මහා අරිට්ඨ අමාත්‍යයා තවත් පනස්පස්දෙනෙකු සමග පැවිදි විය. මේ වන විට වස්විසීමට භික්ෂූන් හැටදෙනමක් වූහ. ඔවුන්ට එහි ආවාස නොතිබූ බැවින් දෙවනපෑතිස් රජතුමා වර්තමාන කණ්ඨක චෛත්‍යය අවට පිහිටි ගල්ලෙන් හැට අටක් සුද්ධ පවිත්‍ර කරවා ආවාස හැටියට සකස් කරවී ය.

මේ අතර මහා නාග යුවරජුගේ මෙහෙසිය වූ අනුලා දේවිය හා පිරිවර ස්ත්‍රීහු පැවිදි වීමට කැමැත්ත පළ කළෝ ය. ස්ත්‍රීන් පැවිදි කිරීම තමාට කළ නොහැකි බැවින් ඒ බව දඹදිව අගරජුට දන්වා තම නැගණිය වූ සංඝමිත්තා රහත් තෙරණිය වැඩමවා ගන්නා ලෙස තෙරණුවෝ දැන්වූහ. ඒ අනුව දෙවනපෑතිස් රජතුමා සංඝමිත්තා තෙරණිය වැඩමවා ගෙන එන ලෙසත් ඒ සමගම ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් ද වැඩම කරවන ලෙසත් ඉල්ලා අශෝක රජු වෙත දූත පිරිසක් යැවී ය. සංඝමිත්තාවන් පැමිණෙන තෙක් අනුලා දේවිය ඇතුලු පිරිස දසසිල් රකිමින් නගරයෙහි එක් පසෙක ඔවුන් සඳහා කරවන ලද උපාසිකා විහාරයේ වාසය කළහ.

වස් කාලයෙන් පසු මිහිඳු මාහියන්ට ලක්දිව සර්වඥ ධාතු නිදන් කොට සෑයක් ඉදිකරවීමට අවශ්‍ය විය. ඒ අනුව ඒ සඳහා ධාතූන් වහන්සේ වැඩමවා ගෙන ඒමට අශෝක රජු වෙත දූතයෙකු ලෙස සුමන සාමණේරයන් වහන්සේ පිටත් කරන ලදි. උන්වහන්සේ අශෝක රජතුමාගෙන් බුදුරදුන්ගේ දකුණු අකුදාව ද, බුදුරදුන්ගේ පාත්‍රා ධාතුව ද ඇතුලු වෙනත් ධාතු රැසක් ද ලබාගෙන ආහ. එම ධාතූන් වහන්සේලා මද කලක් මිහින්තලයේහිම කඳුමත තැන්පත් කරන ලද අතර එහි පුදපූජා සිදුවූ බැවින් එතැන්පටන් එය **චේතියගිරි (සෑගිරි)** නම් විය. දකුණු අකුධාතුව තැන්පත් කොට ථූපාරාමය දාගැබ තනන ලද්දේ ය. එය ලංකාවේ ඉදිකරන ලද ප්‍රථම ස්තූපයයි.

**මෙහෙණි සස්න සහ ශ්‍රී මහා බෝධිය**

උඳුවප් මාස පුන් පොහොදා සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධි ශාඛාව ද රැගෙන වැඩම කළා ය. අනුලා දේවිය ඇතුලු පිරිවර ස්ත්‍රීහු මෙහෙණි සස්නෙහි පැවිදි වූහ. ඔවුන් වැඩසිටි උපාසිකා විහාරය එතැන් පටන් **හත්ථාළ්හක** නමින් මෙහෙණි ආරාමයක් බවට පත්විය. සඟමිත් තෙරණියෝ ද එහි වැඩවාසය කළෝ ය.

බෝධිරෝපණය මහත් උත්සවශ්‍රීයෙන් කරන ලදි. එම උළෙලට ලංකාවේ සිව්දෙසින් විවිධ රාජකීය නියෝජිතයෝ පැමිණ සිටියහ. ශ්‍රී මහා බෝධියට උපස්ථාන පිණිස අශෝක අධිරාජයා විසින් ම දහඅට කුලයක ජනයා එවනු ලැබූහ. ඔවුන් ලංකාවේ විවිධ කලා ශිල්ප බිහි කිරීමට දායක වූ බව සඳහන් වේ. ශ්‍රී මහා බෝධියෙන් හටගත් අංකුර ලංකාවේ විවිධ තැන්වල රෝපණය කරන ලදි. එසේ රෝපණය කරන ලද තැන් තිස් දෙකකි.

ශ්‍රී මහා බෝධියත්, පාත්‍රා ධාතුවත් මෙරට බුදු දහම සංකේතවත් කරවන ප්‍රධාන සංකේත දෙකක් විය. බෞද්ධ සංස්කෘතිය මෙහි පිහිටීමට ප්‍රබල සාධක දෙකක් ද විය. පාත්‍රා ධාතුව මෙහි වැඩ සිටීම සැලකුණේ බුදුරදුන් වැඩසිටීම ලෙස ය. එය තැන්පත් කරන ලද්දේ රජ ගෙදරම ය. එය රාජ්‍ය සංකේතයක් ලෙස ද සලකන ලදි. වළගම්බා රජු දවස රජමැදුර වැටලූ ද්‍රවිඩයන් පාත්‍රා ධාතුව පැහැරගෙන ගියේ නැවත එය රැගෙන අවුත් ලංකාවේ රජකමට උරුමකම් කීමට ය. පසුකලෙක එම තැන ලැබුණේ දන්ත ධාතුවටයි.

ලංකාවට වඩින විට මිහිඳු තෙරණුවෝ දෙතිස් වියේ පසු වූහ. උන්වහන්සේ පුරා අසූ වසක් ආයු වළඳා දෙවනපෑතිස් රජු ඇවෑමෙන් රජ පැමිණි උත්තිය රජුගේ (ක්‍රි.පූ. 200) අටවැනි වර්ෂයේ දී සෑගිරියේදී ම පිරිනිවන් පෑහ. උන්වහන්සේගේ ධාතු නිදන් කොට සෑගිරියේ ස්තූපයක් කරවන ලදි. ඊළඟ අවුරුද්දේ දී සංඝමිත්තා තෙරණියෝ ද අනුරාධපුර හත්ථාළ්හක මෙහෙණවරයේදී පිරිනිවන් පෑහ.

මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය සිංහල සංස්කෘතියේ ආරම්භය ලෙස සැලකිය හැකි ය. උන්වහන්සේ ලංකාවට අලුත් ආගමක් පමණක් නොව එවකට කීර්තියෙන් අගතැන්පත් මුළු සභ්‍යත්වයක් ම මෙරටට ගෙනා සේක. සංඝාරාම සහ චෛත්‍ය ඉදිකිරීමත් ඒ සමගම මෙරටට කලාව හා ගෘහනිර්මාණ ශිල්පය ඇබ්බැහි කිරීමත් උන්වහන්ගෙන් සිදුවූ මෙහෙවරකි. මිහිඳු මාහිමියන් වහන්සේ සිංහල සාහිත්‍යයේ ආදි කතෘවරයා ලෙසද සැලකිය හැකි ය. උන්වහන්සේ ත්‍රිපිටක අටුවා ලක්දිවට ගෙනවුත් දීපවාසීන්ගේ යහපත සඳහා හෙළබසට පෙරළා තැබූ බව බුද්ධඝෝෂ මාහිමියෝ සඳහන් කරති. මෙසේ උන්වහන්සේ සිංහල භාෂාව සාහිත්‍ය භාෂාවක් බවට පත්කොට එහි සාහිත්‍යාරම්භය ද සිදු කළහ. උන්වහන්සේ අශෝක හෝඩිය ද මෙරටට ඇබ්බැහි කරන්නට ඇතැයි සිතිය හැකි ය. එපමණක් නොව සිංහල ස්ත්‍රීන්ගේ ජීවිතය හා චරිතය හැඩගැස්වීම සඳහා සංඝමිත්තා තෙරණිය ද එබඳු ම මෙහෙයක් සිදු කළා ය. මහින්දාගමනය වනාහි ලංකා සංස්කෘතියේ ආරම්භය වූවා සේම ඉන්දියාව හා ලංකාව අතර පැවති සාමාජික, සංස්කෘතික හා රාජ සම්බන්ධතා රාශියක කුළුගැන්වීමකැ'යි වල්පොල රාහුල හිමියෝ ලක්දිව බුදුසමයේ ඉතිහාසයේ දී සඳහන් කරති.

**අභ්‍යාස**

01. මහින්දාගමනයට පෙර ලක්වැසියන් බුදුදහම ගැන දන සිටි බවට සාධක තුනක් ඉදිරිපත් කරන්න.
02. අශෝක රජතුමා ධර්මදූතයන් යැවූ රටවල් අතරින් ලංකාවට විශේෂ සැලකිල්ලක් දක්වූ බවට ඔබට පෙනෙන සාධක මොනවාද?
03. මහින්දාගමනයෙන් ලංකාවේ සිදුවූ පරිවර්තනය සහ සංස්කෘතික ප්‍රබෝධය පිළිබඳ ව කෙටි සටහනක් ලියන්න.

27
පාඩම


# මහතෙර සසුනෙන් බිඳීගිය වාදය
## (මහායානය)

**මහායානයේ ප්‍රභවය**

වර්තමාන ලෝකය තුළ බුදු දහමේ ප්‍රධාන සම්ප්‍රදායයන් දෙකක් සක්‍රීයව පවතී. එම සම්ප්‍රදායයන් දෙක හඳුන්වන්නේ **ථේරවාදය** සහ **මහායානය** යනුවෙනි. **ශ්‍රී ලංකාව, බුරුමය, තායිලන්තය, මියැන්මාරය** වැනි රටවල ථේරවාදී සම්ප්‍රදාය ක්‍රියාත්මක වන අතර **චීනය, ටිබැටය, ජපානය** වැනි රටවල මහායාන සම්ප්‍රදාය ක්‍රියාත්මක වේ.

ථේරවාදීන් විවිධ නිකායන්ට බෙදීයාම නිසාත්, ධර්ම න්‍යායයන් සඳහා විවිධ අර්ථකථන මතුකිරීම නිසාත් මහායාන වාදය ඇති වූ බවට ශාසන ඉතිහාසය සාක්ෂි දරයි. මුල් බුදු සමය නව අර්ථකථනයන්ට බඳුන් කිරීම මහායානයේ විශේෂ ලක්ෂණයක් සේ පෙනේ. ඒ අනුව ථේරවාදීන් මුල් බුදු වදන් ඒ ආකාරයෙන් ම ආරක්ෂා කරගැනීමට වෙරදැරූ අතර සර්වාස්තිවාදීන් ප්‍රමුඛ ප්‍රතිසංස්කරණවාදීහු නිරන්තරයෙන් බුදුවදන් සකස් කිරීමට වෙර දැරූහ. එහි ප්‍රතිඵලය වූයේ මහායානයේ සම්භවය යි.

ශාසන ඉතිහාසයේ දැක්වෙන කරුණු අනුව බුදුරදුන්ගේ ශ්‍රාවක භික්ෂු පිරිස පඨමාභිසම්බෝධි යුගයෙහි සමගි සම්පන්නව හා විනයගරුකව විසූ හ. එසේ වුව ද බුදුරදුන් ජීවමාන සමයෙහි ම භික්ෂූන් අතර යම් යම් මතභේද ඇති වූ බව පැහැදිලිව ම දැකිය හැකි ලක්ෂණයකි. භික්ෂූන් වහන්සේලා අතර පැහැදිලි නිකාය භේදයක් පිළිබඳව තොරතුරු හමුවන්නේ දෙවැනි ධර්ම සංගායනාවෙන් පසුව වුව ද නිකාය භේදයෙහි මූල බීජ බුදුරදුන් ධරමාන කාලයේ දීම දක්නට ලැබුණි. දේවදත්ත, සාති, ඡබ්බග්ගිය ආදී භික්ෂූන්ගේ ක්‍රියා කලාපයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙය වටහා ගැන්ම පහසු ය. උන්වහන්සේලා ගෙන් හටගත් එකී මූලබීජ අනුක්‍රමයෙන් සංවර්ධනය වී විකාශයට පත්වීමට ශතවර්ෂ ගණනක් ගතවිය. ඒ අනුව පශ්චාත් කාලීනව මහායානය බිහිවීමට බලපෑ මූලික සිද්ධාන්ත බුදුරදුන් ධරමාන අවධියේ දී ම රෝපණය වන්නට වූ බැව් සිතීම සාධාරණ ය. ඒ අනුව බෞද්ධ සංඝ සමාජය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදුණි. භික්ෂු සමාජයේ වැඩි පිරිසක් නියෝජනය කළේ අලුතෙන් බිහි වූ මහා සාංඝික සම්ප්‍රදායයයි.



දෙවැනි ධර්ම සංගායනාව පැවැති අවස්ථාවේ දී වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව පිළිගත් විශාල භික්ෂු පිරිසක් සිටියහ. උන්වහන්සේලා සංගීතිකාරක භික්ෂු පිරිසෙන් වෙන්ව වෙනම ධර්ම සංගායනාවක් පැවැත් වූ බව ද එබැවින් එම පිරිස මහා සංඝික යන නමින් හැඳින් වුණු බව ද ශාසන ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලි වෙයි. මහායානය සම්ප්‍රදායක් වශයෙන් ස්ථිරව තහවුරු වූයේ සිව්වන ධර්ම සංගායනාවෙන් අනතුරුව ය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු කුෂාණ වංශික කණිෂ්ක රජුගේ ප්‍රධාන දායකත්වයෙන් කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ දී පාර්ශ්ව තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් සිව්වසක් පුරා මෙම සංගීතිය පැවැත්වුණි. වසුමිත්‍ර, අශ්වඝෝෂ හා පූර්ණ යසස් වැනි තෙරවරුන් මීට සහභාගි වී ඇත. එහි මාධ්‍යය වූයේ සංස්කෘත භාෂාවයි.

## මහායානයේ මූලික ඉගැන්වීම්

> විභාෂා නම් වූ අටුවාග්‍රන්ථ
> මූලික සූත්‍ර දහය
> දස භූමි සංකල්පය
> පාරමිතා සංකල්පය
> ත්‍රිකාය සංකල්පය
> බෝධි සත්ත්ව සංකල්පය
> බෝධි චිත්ත සංකල්පය

### විභාෂා නම් වූ අටුවාග්‍රන්ථ

සිව්වන ධර්ම සංගායනාවේ එක් ප්‍රතිඵලයක් වූයේ ත්‍රිපිටකයට විභාෂා නමින් අටුවා ග්‍රන්ථ රචනා කිරීමයි.

| | |
|---|---|
| 01. විනය පිටකය | විනය විභාෂා |
| 02. සූත්‍ර පිටකය | උපදේශක ශාස්ත්‍ර |
| 03. අභිධර්ම පිටකය | මහා විභාෂා |

මෙම විභාෂා ග්‍රන්ථ රචනයෙහි ප්‍රතිඵලයක් ලෙස මහායාන වාදය ක්‍රමානුකූල පදනමක් ඔස්සේ සකස් වුණි. මෙතෙක් ගොඩනැගෙමින් පැවැති මහායාන අදහස් වඩාත් සංවිධානාත්මක පදනමකින් මෙම සංගායනාව ඔස්සේ ඒකරාශී වුණි. මහායානයේ සම්භවය සම්බන්ධව සිව්වැනි සංඝායනාව ඉතා වැදගත් වන්නේ එම නිසා ය. මෙම සංගීතියෙන් පසුව ථෙරවාදයෙන් බැහැර වූ සියලු ම සම්ප්‍රදායයන් මහායාන නමින් ස්ථිර පදනමක් ඔස්සේ තහවුරුව අනුක්‍රමයෙන් වර්ධනය වන්නට විය. එබැවින් ප්‍රථම මහායාන ධර්ම සංගායනාව මෙම සිව්වැනි සංගායනාව ලෙස දැක්විය හැකි ය. මෙයින් පසු කණිෂ්ක රජුගේ අනුග්‍රාහකත්වයෙන් මහායාන බුදු සමය මධ්‍ය ආසියාවේ ද චීනය වැනි රාජ්‍යවල ද ව්‍යාප්ත වී ගියේ ය. ථෙරවාදයට සාපේක්ෂව මහායානය ඉක්මනින් ජනප්‍රිය වූයේ එහි පැවැති ලිහිල් ප්‍රතිපත්ති නිසා සේ ම පොදුජන ජීවිතයට අදාළව ආමිස පූජාවන්ට ද ප්‍රමුඛ තැනක් ලැබුණු හෙයිනි.

**මූලික සූත්‍ර දහය**

මෙම මහායාන ධර්මයේ ඉගැන්වෙන ධර්ම සූත්‍ර 10 ක් වේ. ඒවා මෙසේ ය.

01. අෂ්ට සාහශ්‍රික ප්‍රඥාපාරමිතා සූත්‍රය
02. සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය.
03. ලලිත විස්තර සූත්‍රය
04. ලංකාවතාර සූත්‍රය
05. සුවර්ණ ප්‍රභාස සූත්‍රය.
06. ගණ්ඩව්‍යූහ සූත්‍රය
07. තථාගත ගුහ්‍යක සූත්‍රය
08. සමාධිරාජ සූත්‍රය.
09. දශ භූමිශ්වර සූත්‍රය.
10. විමලකීර්ති සූත්‍රය.

**දස භූමි සංකල්පය**

මහායානයේ එන ඉගැන්වීම් අතර දශභූමිවලට සුවිශේෂී තැනක් හිමිවෙයි. ථෙරවාදී බුදුසමයෙහි සෝවන් ආදී ලෙස ඉගැන්වෙන මාර්ගඵල සිත්වලට අනුරූපී වන ලෙස මෙම දශභූමි ගොඩනගා ඇතිබව පෙනේ. දශභූමිවලට ඇතුළත් වන්නේ මේවා ය.

| | |
|---|---|
| 01. ප්‍රමුදිතා | ප්‍රීතිමත් |
| 02. විමලා | නිර්මල |
| 03. ප්‍රභාකරී | බබළන |
| 04. අර්චිස්මතී | ඔප්නැගෙන |
| 05. සුදුර්ජයා | අත්කරගැනීමට දුෂ්කර |
| 06. අභිමුඛී | මුහුණට මුහුණලා සිටින |
| 07. දූරංගමා | ඈත ගමන් කරන |
| 08. අචලා | නිශ්චල |
| 09. සාධුමතී | යහපත් අදහස් ඇති. |
| 10. ධර්ම මේඝා | දහම් වළාකුලක් වැනි |

**පාරමිතා සංකල්පය**

ථෙරවාදයේ බුද්ධකාරක ධර්ම දස පරමිතා ලෙස දැක්වේ. මහායානයේ මුල් යුගයේ පාරමිතා 6ක් වූ අතර පසුකාලීනව එය ද දහයක් බවට පත්වුණි. එහි මූලික ෂඩ් පාරමිතා මෙසේ ය.

| | | |
|---|---|---|
| 01. දාන පාරමිතා | 02. ශීල පාරමිතා | 03. ක්ෂාන්ති පාරමිතා |
| 04. වීර්ය පාරමිතා | 05. ධ්‍යාන පාරමිතා | 06. ප්‍රඥා පාරමිතා |

පසුව එකතු වූ පාරමිතා සතර මෙසේ ය.

**01. උපාධි කෞශල්‍ය පාරමිතා** **02. ප්‍රණිධාන පාරමිතා**
**03. බල පාරමිතා** **04. ඥාන පාරමිතා**

මින් ප්‍රධානත්වයෙහිලා සලකනුයේ ප්‍රඥා පාරමිතාව යි. එහි ශ්‍රේෂ්ඨත්වය විදහා දැක්වීම සඳහා රචනා කළ ප්‍රඥා පාරමිතා නමැති විශාල ධර්ම ග්‍රන්ථයක් ද වෙයි.

### ත්‍රිකාය සංකල්පය

මහායානයට අයත් තවත් සුවිශේෂී ඉගැන්වීමක් නම් ත්‍රිකාය සංකල්පය යි. සෑම බුදුවරයෙකුට ම කාය තුනක් ඇතිබව එමගින් ඉගැන් වේ. ඒවා නම්,

**01. ධර්ම කාය**
**02. සම්භෝග කාය**
**03. නිර්මාණ කාය යි.**

මෙහි ධර්මකාය යනු බෝධිපාක්ෂික ධර්ම හා වෙනත් උසස් දහම්වලින් පිරිසිදු කළ සිරුරයි. බුදුරදුන්ට අයත් නිය ම සිරුර මෙයයි. මෙය ශරීරයක් නොවේ. එය ශූන්‍යතා ධර්මයයි. සම්භෝග කාය වනාහි බුදුරදුන්ගේ සූක්ෂම ශරීරය යි. බුද්ධත්වයේ අනුපම සුවය ද ගුණ ධර්ම හා ඥාන බලයෙන් ලැබෙන සුවය ද විඳගන්නේ මෙම ශරීරයෙනි. මෙම ශරීරයේ සිට බුදුරදුන් පරමාර්ථ ධර්ම බෝසත්වරුන්ට දේශනා කරති. නිර්මාණකාය යනු බුදුරදුන්ගේ මනුෂ්‍ය ශරීරය යි. මේ ශරීරය උපයෝගී කරගෙන උන්වහන්සේ ලෝකවාසීන්ට සේවය කරති. ධර්ම කාය වශයෙන් ඇත්තේ එකකි. එහෙත් නිර්මාණකාය හා සම්භෝග කාය කිහිපයක් තිබිය හැකි ය. ථෙරවාදීහු බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් නමදින අයුරින් මහායානිකයෝ මෙම ත්‍රිකාය නමදිති.

### බෝධි සත්ත්ව සංකල්පය

පොදුවේ සෑම බෞද්ධ සම්ප්‍රදායක ම බෝධිසත්ත්ව සංකල්පය දැක්වෙයි. බුදු බව පතා ගුණදම් පුරන්නා වූ පුද්ගලයා බුද්ධාංකුර හා බෝධිසත්ත්ව නම් වේ. මහායානයේ මෙම බෝධිසත්ත්ව සංකල්පය ඉතා දැඩිව අවධාරණය කොට ඉගැන් වේ. බුද්ධයානයෙන් නිර්වාණ පදප්‍රාප්තිය මහායානයේ ප්‍රධාන ඉගැන්වීමයි. සියලු දෙනා ම බුදුවබ ලබන බවත්, එබැවින් මෙලොව ජීවත්වන සියලු දෙනා ම බුද්ධාංකුරයින් බවත් මහායානයේ ඉගැන්වෙයි. එසේ ම ජනතාවගේ යහපත උදෙසා පරමාදර්ශී චරිතයක් වූ බෝධිසත්ත්වවරයන් මෙසේ ඔප්නංවා ඇත්තේ උන්වහන්සේලා දුකෙහි ගැලී වසන පොදු මහජනතාව ඒ දුකින් මුදවා ගැනීමට උත්සුකවීම නිසයි. මෙම බෝධිසත්ත්ව සංකල්පය පිළිගත් මහායානිකයෝ රහතන් වහන්සේගේ නිර්වාණාවබෝධය ශ්‍රේෂ්ඨ යැයි, නොපිළිගත්හ. ඔවුහු බුදුරදුන්ගේ මූලික දේශනාවල අනුත්තර සම්මා සම්බෝධිය පිළිබඳව මිස අරහත් බෝධියක් ගැන සඳහන් නොවෙතියි ප්‍රකාශ කළ හ. පසේ බුදුවරුන් ද චතුරාර්ය සත්‍යය

අවබෝධ කරගත්ත ද දුකෙහි ගැලී වසන පොදු සත්ත්වයා ඒ දුකින් මුදවා ගැනීමට උත්සුක නොවන බව මහායාන මතය යි. මේ අනුව මහායානිකයෝ බුද්ධශ්‍රාවකයන්ගේ හා රහතන් වහන්සේලාගේ මෙන් ම පසේ බුදුවරයන් වහන්සේලාගේ ද ආධ්‍යාත්මික ආත්මාර්ථකාමිත්වය හෙළා දුටුවෝ ය. එකී උතුමන්ගේ නිර්වාණාවබෝධය ශ්‍රේෂ්ඨ යැයි මහායානිකයෝ නොපිළිගත්හ. මෙසේ මහායානය තුළින් මතුකොට ඇති බෝධිසත්ත්ව සංකල්පයේ දී ඊට අයත් වූ බෝධිසත්ත්වවරුන් රාශියක් දක්වා ඇත. උන්වහන්සේලා ප්‍රමාණාත්මකව දැක්විය නො හැකි ය. එහෙත් නමින් දක්වා ඇති බෝධිසත්ත්ව සංඛ්‍යාව අට නමකි. එම බෝසත්වරුන්ගේ නම් මෙසේ ය.

| | | |
|---|---|---|
| **01. අවලෝකිතේශ්වර** | **02. ආකාශ ගර්භ** | **03. වජ්‍ර ගර්භ** |
| **04. ක්ෂිති ගර්භ** | **05. සර්ව නිර්වාණ විෂ්කම්භී** | **06. මෛත්‍රෙය.** |
| **07. සමන්ත භද්‍ර** | **08. මංජු ශ්‍රී** | |

බෝසත්වරුන් ලෞකික හා ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් කොට දක්වා ඇත. සහස්‍ර සංඛ්‍යාත ලෞකික බෝධිසත්ත්වවරු සිටිති. උන්වහන්සේලා සාමාන්‍ය මනුෂ්‍යයන් හා සමාන වන අතර පරාර්ථ චර්යාවෙහි නිරත වෙති. පූර්ණ පෙරුම් ඇති ප්‍රඥා ආඪ්‍ය වූවෝ ලෝකෝත්තර බෝසත්වරු ය. අපරිමිත බෝසත්වරුන් අතර අවලෝකිතේෂ්වර හා මංජු ශ්‍රී ප්‍රමුඛ යහ.

**බෝධි චිත්ත සංකල්පය**

මහායාන බුදුදහමේ බෝධි සත්ත්ව සංකල්පය හා බැඳුණු **''බෝධි චිත්ත''** සංකල්පය ද විශේෂවෙයි. බෝධි චිත්තය උපදවා ගැනීමේ කැමැත්තක් ඇති බෝසත්වරයෙකු අනුග මනය කළ යුතු සප්ත විධ වූ පූජාව හඳුන්වන්නේ **''අනුත්තර පූජා''** යනුවෙනි. **වන්දන; පූජන; පාපදේසන; පුණ්‍යානුමෝදන; බුද්ධාධ්‍යෙෂණ; බුද්ධයාචන** සහ **බෝධි පරිණාමන** යනුවෙන් එම සත්විධ වූ අනුත්තර පූජා නම් කෙරේ. මේ ඇසුරෙන් සාමාන්‍ය ජනතාව තුළ ශ්‍රද්ධාව ජනනය කිරීම සඳහා විවිධ පුදපූජා ක්‍රම රාශියක් බිහිවිය. එම පුදපූජා තමාගේ ආරක්ෂාවට, බුදුරජාණන් වහන්සේට ගරුකිරීමට, බෝසතුන්ගෙන් ඉල්ලීම් කිරීමට, තමන්ගේ බෝධිසත්ත්ව චිත්තය සංවර්ධනය කිරීමට හා භක්තිය සංවර්ධනයට ඉවහල් කර ගැනිණි. වර්තමාන ථෙරවාදි සම්ප්‍රදාය තුළ ක්‍රියාත්මක වන පුද පූජා ක්‍රම හා ජනකාන්ත, අලංකාර උත්සව බොහොමයක් මේ මහායාන පුදපූජාවල අභාසයෙන් පෝෂණය වී ඇති බව අමතක නොකළ යුතු ය. මන්ද ඇතැම් ථෙරවාදි ජනකාන්ත පූජාක්‍රම මහායාන සම්ප්‍රදාය ඇසුරෙන් පෝෂණය වූ බව අමතක වන තරමට ඒවා ථෙරවාදී සම්ප්‍රදාය තුළට බැසගෙන ඇති හෙයිනි.

## මහායානය සංවර්ධනය කළ පඬිවරු

මහායානය පිළිබඳ කරුණු ඉගෙනීමේ දී මහායාන පඬිවරුන් පිළිබඳ නාමිකව හෝ දැන සිටීම ඉතා වැදගත් ය. මහායානයේ අටුවාචාරීන් හා පඬිවරුන් 23 දෙනෙකුගේ නම් සඳහන්ව ඇත.

01. නාගාර්ජුන
02. ආර්ය දේව
03. අශ්වඝෝෂ
04. පාර්ශ්ව
05. වසුමිත්‍ර
06. මාතෘචේථ
07. අසංග
08. වසුබන්ධු
09. මනෝරථ
10. කුමාර ලබ්ධ
11. ධර්මපාල
12. ශාලිභද්‍ර
13. ප්‍රභාකර මිත්‍ර
14. චන්ද්‍රගෝමී
15. දින්නාග
16. ස්ථිරමතී
17. ශාන්තිදේව
18. ආර්ය ශූරපාද
19. ධර්මකීර්ති
20. ශාන්ත රක්ෂිත
21. පද්ම සම්භව
22. කමලශීල
23. දේවේන්ද්‍රබෝධි

භාරතීය ජන සමාජයෙහි දේව භක්තිය මත මුල්බැසගත් දේව වන්දනාවට එරෙහිව බෝධිසත්ත්ව වාදය නමැති නවතම සංකල්පය ආදේශ කළෝ මෙම මහායානික පඬිවරයෝ ය. එය අර්ථ සම්පන්න වූත් ගෞරවාන්විත වූත් උත්සාහයකි. මෙම පඬිවරුන් විසින් සංවර්ධනය කළ මහායාන දර්ශනය ඉතා වේගයෙන් ජනප්‍රියත්වයට පත්විණ. කල්යාමේ දී එය චීනය, කොරියාව, ජපානය ආදී රටවලට ද පැතිර ගියේ ය. බෞද්ධ දර්ශනයට, බෞද්ධ සාහිත්‍යයට සහ බෞද්ධ කලා ශිල්ප දියුණුවට මහායානිකයන් ගෙන් ඉටුවූයේ මහාර්ඝ සේවාවකි. ඒ කෙරෙහි ථෙරවාදීන්ගේ කෘතඥතා පූර්වක සම්භාවනාව ඔවුන් වෙත පුදකළ යුතු වේ.

### ථෙරවාදී සම්ප්‍රදාය හා මහායාන සම්ප්‍රදායයේ පවත්නා සමාන අසමානතා

| මහායාන සම්ප්‍රදාය | ථෙරවාදී සම්ප්‍රදාය |
|---|---|
| හය ආකාර වූ පාරමිතා සංකල්පය | දසපාරමිතා සංකල්පය |
| දසභූමි සංකල්පය | භූමි සංකල්පය |
| සම්බුද්ධත්වයෙන් පමණක් නිවන අවබෝධය | බුදු, පසේබුදු, අරහත් යන තුන්වැදෑරුම් ක්‍රමයෙන් නිවන අවබෝධය |
| බුදුවරු මනුෂ්‍ය ලෝකයේ පහළ නොවේ. | බුදුවරු මිනිසුන් අතර මිනිසෙකු තුළින් ම පහළ වෙයි. |
| බෝසතාණන්වහන්සේ මහා කරුණාවෙන් සමන්විත විය යුතු ය. | බෝසතාණන් වහන්සේ කරුණු අටකින් සමන්විත විය යුතු ය. |
| භක්ති මාර්ගය හා ඥාණ මාර්ගය වැදගත් කොට සලකයි. | ඥාණ මාර්ගය වැදගත් කොට සලකයි |
| ක්ලේශාවරණ - ඥෙයාවරණ ක්ෂය කිරීම | කම්මාවරණ, ක්ලේශාවරණ, දිට්ඨාවරණ ක්ෂය කිරීම |
| ධාරණී නම් වූ ආරක්ෂක මන්ත්‍ර | පිරිත් දේශනාව - චතුභාණවාර පාළි |
| සංස්කෘත භාෂාව මාධ්‍යය වශයෙන් යොදා ගැනීම | පාලි භාෂාව මාධ්‍යය වශයෙන් යොදා ගැනීම |

# 28 පාඩම

# දහමත් දැන දෙසුමත් දැන දහම් දෙසමු

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ එතෙක් කිසිවෙකුට නොපෙනී යටපත් වී තිබුණු ලෝක සත්‍යය හෙවත් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන උතුම් වූ බුද්ධත්වයට පත් වූ සේක. එතැන්සිට උන්වහන්සේ එම ධර්මය ලොවට දෙසා වදාළහ. එම දේශනා අසා අවබෝධ කරගෙන මහරහත් සඟ පිරිස බිහිවිය. පිරිස හැට නමක් වූ සැණින් බුදුරජාණන් වහන්සේ 'චරථ භික්ඛවේ චාරිකං' යනාදි වශයෙන් උන්වහන්සේලා ගම්දනව්වල සැරිසරමින් දහම් දෙසන්නට යෙදවූහ. ඒ අනුව ධර්ම දේශනා කිරීම එතැන්සිට භික්ෂූන් වහන්සේට පැවරුණු වගකීමක් විය.

එම ධර්මය දේශනා නොකළහොත් අතුරුදන් විය හැකි බව අංගුත්තරයේ පඤ්චක නිපාතයේ සද්ධම්ම සම්මෝස සූත්‍රවල සඳහන් වේ. තවද හැමඅතින් ම පිරිපුන් භික්ෂූන් නමක් වීමට නම් උන්වහන්සේ ධර්ම කථිකයෙකුවීමත් අවශ්‍ය බව අංගුත්තර අට්ඨක නිපාතයේ සමන්තපාසාදික සූත්‍රයේදී වදාරා තිබේ.

එසේ වුවත් ධර්ම කථිකත්වය හැමට ම ලැබිය හැකි ශක්තියක් නොවේ. ධර්ම දේශකයෝ දුර්ලභ ය. ''තථාගතප්පවේදිතස්ස ධම්මවිනයස්ස දෙසෙතා පුග්ගලො දුල්ලභො ලෝකස්මිං'' යනුවෙන් ඒ බව අංගුත්තර තික නිපාතයේ සඳහන් වේ. එසේ ම කාහට හෝ ධර්ම කථිකත්වය පිහිටා තිබේ නම් එය ඔහුට ලැබුණු උතුම් ලාභයක් බව ''අද්ධමිදං භික්ඛවේ ලාභානං යදිදං ධම්ම කථිකත්තං'' යනුවෙන් වදාරා තිබේ.

එහෙත් අද ධර්ම කථිකයෝ අපමණ සිටිති. එසේ නම් ධර්ම කථිකයන් දුර්ලභ වන්නේ කෙසේදැයි සිතෙනු ඇත. බණ යැයි කියා මොනවා හෝ දේශනා කළ පමණින් කෙනෙක් ධර්ම කථිකයෙක් වන්නේ නැත. ඒ බව අංගුත්තර චතුක්ක නිපාතයේ **ධම්මකථික** සූත්‍රයේ විග්‍රහ කරන්නේ මෙසේ ය. ධර්ම කථිකයෝ හතර දෙනෙකි.

* **මෙලොව එක්තරා ධර්ම කථිකයෙක් කියන්නේ ටික ය. එය ද හරයක් නැති ප්‍රලාප ය. එය අසන පිරිස ද සාරවත් දේ හෝ නිසරු දේ තෝරා ගන්නට සමත්තු නොවෙති. එබඳු පිරිසක් මැද ඒ කථිකයා ධර්ම කථිකයෙකු වන්නේ ය.**

* **තවත් ධර්ම කථිකයෙක් ද කියන්නේ ටිකකි. එහෙත් එය හරවත් ය. අසන පිරිස ද සරු දේ නිසරු දේ තෝරාගන්නට සමත් ය. එබඳු පිරිසක් මැද ඒ කථිකයා ධර්ම කථිකයෙකි.**

* **තවත් ධර්ම කථිකයෙක් දිගින් දිගට බොහෝ දේ කියයි. ඒ සියල්ල නිසරු ය. අසන පිරිස ද සරු දේ හෝ නිසරු දේ තෝරාගන්නට අසමත් ය. එබඳු පිරිස මැද ඒ කථිකයා ද ධර්ම කථිකයෙක් වේ.**

* **තවත් ධර්ම කථිකයෙක් බොහෝ දේ දෙසයි. ඒවා හරවත් ය. අසන පිරිස ද සරු දේ නිසරු දේ තෝරා ගන්නට සමත් ය. එබඳු පිරිසක් මැද එම කථිකයා ධර්ම කථිකයෙක් වෙයි.**

මේ අතුරින් පළමුවන හා දෙවන කථිකයන් ධර්ම කථිකයන් වන්නේ අසන්නන් සරු දේ නිසරු දේ තීරණය කරන්නට තරම් බුද්ධියක් නැති පිරිසක් වීම නිසා ය. ඔවුහු සැබෑ ධර්ම කථිකයෝ නොවෙති. සැබෑ ධර්ම කථිකයන්යැයි පිළිගැනෙන්නේ දෙවන සතරවන ධර්ම කථිකයෝ ය.

## ධර්ම ගෞරවය

ධර්මය දේශනා කිරීම ඉතා ගෞරවයෙන් කළ යුතු කටයුත්තකි. මන්ද, බුදුරජාණන් වහන්සේ පවා ධර්මය ගුරුවරයා ලෙස සැලකූ නිසා ය. බුද්ධත්වයෙන් පස්වන සතියේ අජපාල නුගරුක මුල වැඩ සිටි බුදුරජාණන් වහන්සේට තමාට ගුරුවරයෙකු සිටියේ නම් මැනවැයි සිතිණ. එහෙත් ඒ සඳහා සුදුස්සෙකු තුන්ලොව ම නොවූ හෙයින් තමා අවබෝධ කරගත් ධර්මය ම ගුරු තන්හි තබාගත් බව අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ උරුවේල සූත්‍රයේ සඳහන් වේ.

එසේම බුදුරදුන්ගෙන් පසුව ශාසනයේ ශාස්තෘවරයා ලෙස ශ්‍රාවකයන්ට අනුමත කරන ලද්දේ ද ධර්ම විනයයි. ''යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තෝ සො වො මමච්චයෙන සත්ථා'' යනුවෙන් ඒ බව මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වේ.

## සකස්ව දහම් දෙසීම

බුදුරජාණන් වහන්සේ පවා කා හට දහම් දෙසූවත් එය පිළිවෙලකට ම දෙසන බව අංගුත්තර පඤ්චක නිපාතයේ සීහ සූත්‍රයේ සඳහන් වේ. සකස්ව දහම් දෙසීම නම් සූදානම් වී දෙසීමයි. එහිදී දේශකයා ධර්මයත් පාලිභාෂාවත් හොඳින් ඉගෙනගෙන සකස් විය යුතු ය. කරන දේශනය ක්‍රමවත් ව සංවිධානය කරගෙන ශ්‍රාවකයාගේ මට්ටම ගැන සලකා බලා දෙසිය යුතු ය. එහිදී ලාභාපේක්ෂාවෙන් තොරව තමනුත් ආධ්‍යාත්මිකව සකස් වී සැදීපැහැදී දහම් දෙසිය යුතු ය.

## ධර්ම දේශක ගුණාංග

බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ධර්ම දේශක ගුණාංග මෙන් ම ධර්ම දේශනා පිළිවෙතක් ද තිබේ. දිනක් උදායි තෙරණුවෝ මහා ගිහි පිරිසක් පිරිවරාගෙන දහම් දෙසමින් උන්හ. ඒ බව අනඳ තෙරුන් බුදුරදුන්ට පෙන්වූ විට උන්වහන්සේ මෙසේ වදාළහ. ''ආනන්දයෙනි, අනුන්ට දහම් දෙසීම පහසු කරුණක් නොවේ. එසේ දහම් දෙසන්නා තමා කරුණු පහකින් සමන්විතව දහම් දෙසිය යුතු ය.'' එය මෙසේ ය.

## 1. ආනුපුබ්බී කථා

අනුපිළිවෙල කතාවට අනුව දහම් දෙසමියි සිතා දෙසිය යුතු ය. ආනුපුබ්බී කථා නම් **දාන කථා** පරිත්‍යාගශීලිභාවය ගැන කීම, **සීල කථා** හික්මීම විනය ගැන කීම. **සග්ග කථා** දෙව් මිනිස් ස්වර්ගයට මග කීම. **කාමානං ආදීනවං** පඤ්චකාමයේ දොස් දැක්වීම. **ඕකාරං** පඤ්චස්කන්ධයේ ළාමක නිසරු බව කීම. **සංකිලේසං** කෙලෙසුන්ගෙන් කිලිටිවන සැටි කීම. **නෙක්ඛම්මේ ආනිසංසං** කාමයන්ගෙන් වෙන්වීමේ අනුසස් කිම. දේශකයා තමාගේ දේශනාව මේ කාරණා අඩංගු කරගෙන ආරම්භ කිරීමත් මේවා පැහැදිලි කිරීමේ අදහසින් දෙසිමත් වැදගත් ය.

## 2. පරියාය දස්සාවි

හාත්පසින් කරුණු ගෙනහැරපාමින් දෙසමියි සිතා දහම් දෙසිය යුතු ය. ඒ අනුව දේශකයා තමා දෙසන මාතෘකාව පිළිබඳ ව හේතු කාරණා සාධක දැක්වීම, ඊට පදනම් වන ධර්ම න්‍යාය ගෙනහැර දැක්වීම, ධර්ම - අර්ථ පද පිළිබඳ අටුවා ඇසුරින් විවරණ සැපයීම, උපමා උදාහරණ ආදිය දැක්වීම, එම ධර්මයන්ගේ විවිධ ප්‍රභේද දැක්වීම, අවශ්‍ය වූ විට ධර්මයට බැහැරින් වෙනත් කරුණු ගෙන සංසන්දනය කොට දැක්වීම කළ යුතු ය.

## 3. අනුද්දයතං පටිච්ච

අනුකම්පා පෙරදැරි කරගෙන දහම් දෙසීම කළ යුතු ය. ඒ බව කස්සප සංයුත්තයේ චන්දූපම සූත්‍රයේ මෙසේ සඳහන් වේ. ''මහණෙනි අනුන්ට දහම් දෙසන භික්ෂූන් වහන්සේ නමක් භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය, ස්වාක්ඛාතය, සංදිට්ඨිකය යනාදී වශයෙන් එහි ගුණ මෙනෙහි කරමින්, ''මා දෙසන මේ ධර්මය අනේ, මහජනයා අසත් නම්, අසා වටහා ගනිත් නම්, වටහා ගෙන දැහැමි වීම පිණිස පිළිපදිත් නම් මැනව''යි කියා ධර්මයේ යහපත්භාවය පෙන්නුම් කරනු පිණිස දහම් දෙසිය යුතු ය. එසේ කරුණාව පෙරදැරි කරගෙන, දයාව අනුකම්පාව පෙරදැරි කරගෙන දහම් දෙසයි නම් එබඳු භික්ෂුවගේ දහම් දෙසීම පිරිසිදු දෙසුමක් වේ.

## 4. න ආමිසන්තරෝ

මහණෙනි, යම් භික්ෂුවක් ''අනේ, මහජනයා මගේ ධර්ම දේශනාව අසත්වා, අසා පැහැදෙත්වා, පැහැදී පැහැදුණු බව පුදපූජා ආදියෙන් පෙන්නුම් කෙරෙත්වා '' යි යන සිතින් අනුන්ට දහම් දෙසයි නම් ඒ භික්ෂුවගේ ධර්ම දේශනාව අපිරිසිදුයයි එම සූත්‍රයේ සඳහන් වේ. එමනිසා ලාභ අපේක්ෂාවෙන් කිසිවිටෙකත් දහම් නොදෙසිය යුතු ය.

## 5. අත්තානං ච පරං ච අනුපහච්ච

තමනුත් අනුනුත් දේශනාවට ගාවාගෙන දහම් නොදෙසිය යුතු ය. එසේම තමා හුවා දක්වමින් (අත්තුක්කංසන) අනුන් හෙළා දකිමින් (පරවම්භන) දහම් දෙසීම ද නොකළ යුතු ය.

● අත්තුක්කංසන

ධර්ම දේශනයේදී තමා හුවා දක්වීම තමා වර්ණනා කර ගැනීම නොකළ යුත්තකි. ''මහණෙනි මේ සසුනේ භික්ෂුවක් මහජනයා මා හොඳින් පිළිගෙන ඇතැයි තමා ගැන ඉහළින් සිතා ගෙන ගෙවල්වලට යයි නම්, එසේ සිතාගෙන වැඩහිඳී නම්, ඉහළින් සිතාගෙන දහම් දෙසයි නම් ඒ නිසා ම මල මූත්‍ර වේග පවා දරාගෙන පැය ගණන් වැඩහිඳී නම් එය පැවිද්දෙකුගේ රෝගයකැ''යි අංගුත්තර චතුක්ක නිපාතයේ රෝග සූත්‍රයේ සඳහන් වේ.

● පරවම්භන

අනුන් හෙළා දැකීම, අනුන්ට පහර ගැසීම, දේශකයෙකු විසින් දහම් දෙසීමේදී නොකළ යුත්තකි. ධර්මය යනු අනුන්ට පහර දෙන අවියක් නොවේ. පහරලත් මිනිසුන්ගේ සිත් සුවපත් කරන ඔසුවකි. එබැවින් ශ්‍රාවකයා හෙළා නොදැකීමට දේශකයා ප්‍රවේශම් විය යුතු ය. මහජනයා මෝඩ ය. අනුවණ ය යනාදී වශයෙන් ඔවුන්ගේ පෙනෙන දුර්වලකම් වුවද ලැජ්ජා ඇතිවන, සිත් රිදෙන ආකාරයෙන් නොකිව යුතු ය. අනුකම්පාවෙන් ම කියාදිය යුතු ය.

## වස් විසීම කඨිනය හා කඨිනානිසංස දේශනා

බුදු සසුන ඇරඹීමෙන් පසුව බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේට වස් විසීම අනුදත් සේක. ඒ හා සම්බන්ධ විනය නීති පැනවීම් සිදුවිය. වස් විසූ භික්ෂූන් වහන්සේට කඨිනයක් පිළිගැනීම. අනුදැන වදාළ නිසා උපාසකඋපාසිකා පිරිස් එක්ව කඨින පූජා සිදු කළහ. මහත් ඵල ආනිසංස ලැබෙන පින්කමක් වූ බැවින් රාජ රාජ මහාමාත්‍යාදීන් පවා මහත් ගෞරව පෙරදැරිව කඨින පින්කම් සිදු කළහ. කඨිනානිසංස ධර්ම දේශනාව පවත්වන්නේ එහි අනුහස් ගෙන හැර දක්වීම සඳහා ය. එම දේශනාව සිදුකරන භික්ෂූන් වහන්සේ මහත් ගෞරවයෙන් යුතුව මෙබඳු කරුණු ඇතුළත් කොට ආනිසංස දේශනා කළ යුතු ය.

## කඨිනය යනු කුමක්ද?

දැඩි බව, තද බව, උසස් කිරීම, ස්ථිර කිරීම යනුවෙන් ''කඨිනය'' නැමැති වචනය සඳහා ශබ්ද කෝෂයන් විවිධ පදගතාර්ථයන් සපයා ඇත. නමුත් බුදුසමය තුළ මෙම වචනය භාවිත කරනුයේ උක්ත අරුතින් නොව ඊට හාත්පසින් ම වෙනස් වූ බෞද්ධ විනය කර්මයක් හැඳින්වීම සඳහා ය. කිසියම් උපසපන් භික්ෂුවක් වස් සමය එළඹුණු පසු ''ඉමස්මිං විහාරේ ඉමං තෙමාසං වස්සං උපේමි. ඉධ වස්සං උපේමි.'' මෙම වස් තෙමාසයෙහි මෙම ආරාමයෙහි වස් එළඹෙමි යනුවෙන් අධිෂ්ඨාන කොට කිසියම් නිශ්චිත වාසස්ථානයක් සීමාවන් වශයෙන් නියම කර ගැනීමෙන් පසු එම වස් තෙමස පුරාවටම එළඹි සිහියෙන් යුතුව විනයානුකූලව වස් ආරක්ෂා කරමින් කටයුතු කර මහා පවාරණයෙන් වස් පවාරණය සිදු කිරීමෙන් අනතුරුව එම භික්ෂුවට වස් කාලයට පසුව එළඹෙන චීවර මාසයේදී දායකයන් විසින් පිරිනමනු ලබන චීවරය හෝ වස්ත්‍රය හැඳින්වීමට බුදුසමයේ ''

කඨිනය '' යන වචනය භාවිත කෙරේ. එසේම බෞද්ධ ආරාමික සංස්ථාව තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය නම් කඨින පූජාව සිදු කිරීමේදී ගිහි පැවිදි දෙපාර්ශ්වයේ අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමය.

''කඨිනං නාම කිං කෙන නිදානෙන මහෙසිනා
අනුඤ්ඤාතං කිමත්ථාය කස්මා කඨිනන්ති වුච්චති
කෙහි කස්ස ච කං තෙන දාතබ්බං කත්ථ වා කදා
ඉච්චෙවමාදි ඤාතබ්බා කඨිනස්ස විසෙසතො''

01. කඨින පූජාව යනු කුමක් ද?
02. ඒ කඨිනයට කවර නිදානයක් ද?
03. කුමක් පිණිස අනුදැන වදාරන ලද්දේ ද?
04. ඊට කවර හෙයකින් කඨිනය යැයි කියනුයේ ද?
05. එය කවුරුන් විසින්?
06. කාහට?
07. කවර කලක?
08. කොතැනදී දිය යුතු ද? යන ආදී කරුණු සම්බන්ධව අවධානය යොමුකළ යුතු ය.

බුදුන් වහන්සේ උපසපන් භික්ෂුවට කඨිනය ලබා ගැනීමට අවසර ලබා දෙන්නට වූයේ භික්ෂු ජීවිතයේ විනයානුකූල පැවැත්ම හා ගිහි ජනතාවට ඒ තුළින් ලැබෙන යහපත සලකා ගනිමිනි. එනම් කඨිනය යනු කඨිනය ඇතිරීම සඳහා දෙනු ලබන වස්ත්‍රයයි. එය බුදුන්වහන්සේ දැකීම පිණිස පැමිණි පාවෙය්‍යක භික්ෂූන් තිස් නමක් නිදාන කොට අනුදැන වදාරන ලදි. කුමන හේතුවක් නිසා ද කඨිනලාභී භික්ෂුවට පඤ්ච ආනිසංසයක් ලැබෙන නිසාවෙනි. එසේම දායක පිරිසට යහපත උදෙසාවෙනි. මෙය මහත්ඵල මහානිසංස පිංකමක් වන අතර කිසිදු විටෙක නොසැලෙන බැවින් දෙව් මිනිසුන් ආදී සැදැහැවතුන් විසින් සිදු කළයුතු වන්නේ ය. මෙලෙස පුදන ලද කඨින චීවරය කවරකු ලබන්නේ ද වස් ශික්ෂාපද ආරක්ෂා කළ භික්ෂුවයි. එය කුමන අයුරකින් දිය යුතු ද නම් තුන් සිවුරු අතුරින් වස්ත්‍රයක් දිය යුත්තේ ම ය. මෙය කුමන කාල වකවානුවක දිය යුතුවන්නේ ද නම් වප්මස අවපැලවියෙහි පටන් ඉල් පුරපසළොස්වක දක්වා පූජා කළ හැකි අතර, එය වස්සාවාසික සීමාව තුළ දීම ද විශේෂයකි. එය අන්‍යස්ථානයක වස් විසූ භික්ෂුවකට පූජා කළ නොහැකි ය.

**වස් එළඹීම.**

බුද්ධ දේශනාව අනුව භික්ෂූන් වහන්සේලා ඍතු තුනෙහිදී ම ගම්දනව් සිසාරා චාරිකාවෙහි සැරිසරන්නට වූහ. මේ දෙස බලා සිටි බොහෝ මිනිසුන් තණ පැළෑටි හා කුඩා ප්‍රාණීන් පාගමින් වැස්සට තෙමෙමින් මෙලෙස භික්ෂූන් ක්‍රියා කිරීම නිසා නින්දා කරන්නට, අපහාස කරන්නට, දොස් නගන්නට වූ බව විනය පිටකයේ චුල්ලවග්ග පාලියේ දැක්වේ.

''මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති කථං හි නාම සමණා සක්‍යපුත්තියා හෙමන්තම්පි, ගිම්හම්පි, වස්සම්පි චාරිකං චරිස්සන්ති. හරිතානි තිණානි සම්මද්දන්තා, එකින්ද්‍රියං ජීවං විහෙඨෙන්තා...''

(විනය පිටකය, මහාවග්ග පාළි, වස්සූපනායිකය)

මෙම පුවත සැළවු පසු බුදුන්වහන්සේ තම ශ්‍රාවක භික්ෂු සංඝයාට

''අනුජානාමි භික්ඛවේ වස්සං උපගන්තුං.''

(විනය පිටකය, මහාවග්ග පාළි, වස්සූපනායිකය)

යනුවෙන් වැසි සාරමාසය තුළ වස් වසන්නට අනුදැන වදාළහ.

## පෙරවස් හෝ පසුවස් එළඹීම

පෙරවස් නම් ඇසළ මස අවපෑළවිය දින වස් විසීමයි. පසු වස් විසීම යනු නිකිණි මස අවපෑළවිය දින වස් විසීමයි. උපසපන් භික්ෂූන් වහන්සේලාට වස් විසීම ක්‍රම දෙකක් යටතේ බුදුන්වහන්සේ හඳුන්වා දෙන්නට වූයේ පළමු අවස්ථාව තුළ වස් විසීමට නොහැකි වූ භික්ෂුවට පසුවස් එළඹිය යුතු බව අවධාරණය කරමිනි. උපසපන් භික්ෂුවක් පෙරවස් හෝ පසුවස් සමාදන් විය යුතු ම ය. ආරාධනා කළත් නොකළත් එය කිරීම අනිවාර්ය වේ.

''ද්වෙ මෙ භික්ඛවෙ වස්සූපනායිකා පුරිමිකා ච පච්ඡිමිකා ච අපරජ්ජුගතාය ආසාළ්හියා පුරිමිකා උපගන්තබ්බං මාසගතාය අසාළ්හියා පච්ඡිමිකා උපගන්තබ්බා ඉමෙ බො භික්ඛවෙ ද්වෙ වස්සූපනායිකා.''

(විනය පිටකය, මහාවග්ග පාළි, වස්සූපනායිකය)

යනුවෙන් උපසපන් භික්ෂුව ඇසළ පොහොය දිනට පසුදින පෙරවස් විසීම ද, ඇසළ පොහොයෙන් මසක් ගතවූ තැන පසුවස් විසීම ද කළයුතු බව මහාවග්ග පාලියේ පෙන්වා දී ඇත.

## සතිකරණය හා සත්තාහකරණය යනු කුමක්ද?

වස් සමාදන් වන උපසපන් භික්ෂුව වස් කාලසීමාව තුළ විනය ශික්ෂා රාශියක් ආරක්ෂා කරමින් දෛනික ජීවිතය ගත කිරීමට බැඳී සිටියි. වස් සමාදන් වූ පසු ඊට ප්‍රථම පැවති, එනම් වස් එළඹීමට ප්‍රථම ගත කළ දෛනික භික්ෂු ජීවිතය හාත්පසින් ම වෙනසකට භාජනය කළ යුතු වන්නේ ය. එයට හේතුව නම් වස් විසූ පසු සේනාසනයෙන් යම් විටෙක බැහැර වන්නේ නම් එය සුවිශේෂී ම කරුණක් නිසා ම පමණි. එසේ නොමැතිව තමාට අවශ්‍ය ඕනෑ ම විටෙක වස් ආවාසයෙන් බැහැර විය නොහැකි ය. වස් සමාදන් වූ දින සිට පවාරණය දක්වා කාල සීමාව මනා අවබෝධයෙන් ගත කළ යුතු ය. කිසියම් විටෙක වස් ආවාසයෙන් බැහැර වන්නේ නම් විනය ශික්ෂා දෙකක් යටතේ බැහැර විය යුතු ය.

කිසියම් ආරාධනාවක් හෝ පොහොය කිරීම ආදී විනය කර්මයකට හෝ පෙරවස් හා පසුවස් වසන උපසපන් භික්ෂුව එදින ම පැමිණෙන බවට අධිෂ්ඨාන කරමින් වස් ආවාසයෙන් බැහැර වන්නේ නම් සතිකරණය නම් වේ. නමුත් මෙහිදී පසු දින අරුණෝදය උදාවූයේ නම් වස් ඡේදනය සිදු වේ. දින සතක් ඇතුළත පැමිණෙන බව අධිෂ්ඨාන කරගෙන ආවාසයෙන් බැහැරව වසන්නේ නම් එය සත්තාහකරණය නම් වේ. උන්වහන්සේ සය දිනකින් පැමිණිය යුතු ය. සත්වන දින අරුණ උදාවන්නට පෙර නොපැමිණියේ නම් වස් ඡේදනය සිදු වේ. එලෙස යම් විටෙක නොවූයේ නම් වස් විසූ උපසපන් භික්ෂුවට වස් පවාරණය කිරීම, කඨිනය භාර ගැනීම හා කඨින ආනිසංස ලබා ගැනීමට හැකි වන බව වස්සූපනායික ඛන්ධකයේ දක්වා ඇත.මෙහිදී විශේෂයෙන් ම සත් දෙනෙකු වෙනුවෙන් බැහැරව යෑමට අනුදැන වදාරා ඇත. එනම්, භික්ෂුව, භික්ෂුණිය, සික්ඛාමානා ව, සාමණේර නම, සාමණේරිය, උපාසක හා උපාසිකා යනුවෙනි.

**කඨිනය සිදු කරන ක්‍රමවේදය.**

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් මැනවින් සපුරන උපසපන් වස්සාවාසික භික්ෂු සංඝයා උදෙසා ගිහි හෝ පැවිදි හෝ කිසියම් සැදැහැවතෙකු විසින් '' **ඉමං කඨින දුස්සං භික්ඛු සංඝස්ස දෙම**'' යන කර්ම වාක්‍ය තෙවරක් කියා වස්ත්‍රය සඟසතු කොට පූජා කළ පසු මහසඟ රුවන එම කඨින වස්ත්‍රය රැගෙන පොහොය සීමාවට රැස්ව කඨින වස්ත්‍රය දීමට සුදුසු භික්ෂුවක් තෝරා

**'' සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉදං සංඝස්ස කඨිනදුස්සං උප්පන්නං යදි සංඝස්ස පත්තකල්ලං, සංඝො ඉමං කඨින දුස්සං ඉත්ථංනාමස්ස භික්ඛුනො දදෙය්‍ය, කඨිනං අත්ථරිතුං එසා ඤත්ති.''**

යනාදී වශයෙන් නියමිත කර්ම වාක්‍යයන් පැවසීමෙන් පසු කඨින වස්ත්‍රය සුදුසු පරිදි අඳනයක් හෝ සිවුරක් වශයෙන් එදින ම සකසා පඬු පොවා කප් බිංදුව තබා කඨිනය ඇතිරීමට එම භික්ෂුවට ලබා දිය යුතු ය. කඨින වස්ත්‍රය පිළිබඳ ව සේදීම, නූල් ගසා කඩ වෙන් කිරීම, කැපීම, බොරු නූල් දමා කඩ එකතු කිරීම, මැසීම, පඬු පෙවීම, කප් බිංදුව තැබීම යනුවෙන් කළ යුතු පූර්ව කෘත්‍ය හතක් කඨිනයක් වශයෙන් පිරිනැමිය හැකි වස්ත්‍ර තුනක් පිළිබඳව ද විනයෙහි සඳහන් වේ. ඒ මෙසේය.

**01. සුදු පැහැති වර්ණ ගැන්විය හැකි අලුත් වස්ත්‍රයක් දීම.**
**02. සුදුසු පරිදි වර්ණ ගන්වන ලද අලුත් දෙපට හෝ තනිපට සිවුරක් දීම.**
**03. සුදුසු පරිදි වර්ණ ගන්වන ලද අලුත් අඳනයක් දීම.**

එබඳු කඨිනයක් ලද භික්ෂුව ඊට නියමිත විනය පිළිවෙත් නිමවා ''ඉමිනා චීවරේන කඨිනං අත්ථරාමි.'' මේ සිවුරෙන් කඨිනය අතුරමි යනුවෙන් කඨිනය ඇතිරිය යුතු ය. ඉනික්බිතිව වස් තෙමස තුළ වස් ශික්ෂා පදය ආරක්ෂා කරමින් එකට වැස වස් පවාරණය කරන ලද අනෙකුත් භික්ෂූන්ට ද පිං අනුමෝදන් කළ යුතු වන්නේ ය. එසේ ම කඨින චීවර පූජාවක් සිදු කරන අවස්ථාවක දී දායකයන් විසින් අවශේෂ පිරිකර ද පූජා කරනු ලබයි.

එම සියලු පූජාවන් කඨිනානිසංස පරික්ඛාර ගණයෙහි ලා සැළකේ. එමෙන් ම කඨින චීවර පූජාව අට මහා කුසල් ගණයෙහි ලා සැළකේ. එනම් ''**කඨිනවඨපරිකඛාරං වාසදානංච උතතමං**'' යනුවෙන් දක්වනු ලබන්නේ කඨින චීවර පූජාව අටමහා කුසල් අතර ප්‍රථම ගණයෙහි ලා සලකා ඇති බව ය.

## කඨිනයක් ලබන භික්ෂුවට ලැබෙන පඤ්චවිධ ආනිසංස

විනය පිටකයේ කඨිනක්ඛන්ධකය විවරණය කරන ආකාරයට කඨිනයක් ඇතිරූ භික්ෂුවට පඤ්චවිධ ආනිසංසයක් ලැබෙන බව පෙන්වා දී ඇත. එම ආනිසංස පස නම් මෙසේ ය.

**'' අනුජානාමි භිකඛවෙ වසසං වුතථානං භිකඛූනං කඨිනං අතථරිතුං. අතථතකඨිනානං බො භිකඛවෙ පඤච කපපිසසනති. අනාමනතචාරො, අසමාදානචාරො, ගණභොජනං, යාවදතථ චීවරං යොච තතථ චීවරුපපාදො, සො නෙසං භවිසසති. අතථතකඨිනානං වො භිකඛවෙ ඉමානි පඤච කපපිසසනති.''**

**(විනය පිටකය, මහාවගග පාලි කඨිනකඛනධකය)**

මෙහි දී බුදුන්වහන්සේ අවධාරණය කරනු ලබන්නේ පෙරවස් මනාව ආරක්ෂා කරන ලද භික්ෂුවට කඨින චීවරය ලැබීමත් සමග ම මෙම ආනිසංස පස ලැබෙන බව ය. එනම්,

**01. භික්ෂූන්ගෙන් නොවිමසා ගම තුළ චාරිකාවෙහි හැසිරීමට හැකි වීම.**
**02. තුන් සිවුර නොගෙන චාරිකා කළ හැකි වීම.**
**03. ආරාධනා ලැබ හෝ දැනුම් දී ලබාගත් ආහාර වැළඳීම.**
**04. කැමති පරිදි සිවුරු ලැබිය හැකි වීම.**
**05. තමා වසන ආරාමයේ සංඝයාට ලැබෙන සිවුරු තමාට පිළිගත හැකිවීම.**

බුදුන් වහන්සේ කඨිනය අනුදැන වදාරන්නට වූයේ හේතු සාධක රාශියක් පදනම් කොට ගනිමිනි. විශේෂයෙන්ම බුදුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන කාලය තුළදී උන්වහන්සේ බැහැදැකීමට පැමිණි පාවා නුවර වැසි භික්ෂූන් වස්සාන කාලය තුළ දී නොයෙක් අපහසුතාවන්ට පත්වන්නට යෙදුණි. එම හේතු කාරණා ද පදනම් කොට ගනිමින් උපසපන් භික්ෂූන් වහන්සේට මෙලෙස පඤ්චවරයක් ලබා දෙන්නට ඇත.

මෙලෙස ඉහත දක්වන ලද කරුණු අනුව පැහැදිලි වන්නේ උපසපන් භික්ෂූන් වහනසේට වස්සාවාසික ශික්ෂා පදය මනාව ආරක්ෂා කොට වත්පිළිවෙත් පුරා මහා පවාරණයෙන් පවාරණය වී පොහොය සීමාව තුළ කඨින චීවරය ලබා ගැනීමෙන් පමණක් ම මෙම ආනිසංස පස ලැබෙන බව ය.

### කඨින චීවරය පූජා කිරීමෙන් දායක පිංවතුන් ලබන කඨිනානිසංස

කඨින චීවර පූජාව වූ කලී අටමහා කුසල් අතර පළමු වැන්න නිසාවෙන් එම පූජාව කිරීමට සැදැහැති දායක පිංවතුන් තුළ මහත් වූ අභිලාෂයක් ඇත. එම නිසා කඨින චීවර දායකත්වය ලබා ගැනීමේදී විහාරස්ථාන දායක පිරිසගේ පොදු අනුමැතිය තිබීම අනිවාර්ය ය වේ. එසේ දායකත්වය ලබාගත් දායක පිරිස හිමිදිරි උදෑසන ගරු සම්මාන සහිත මනහර පෙරහැරකින් කඨින වස්ත්‍රය වැඩමවා ගෙන අවුත් සංඝයා උදෙසා පූජා කිරීම අතීතයේ සිටම පැවත එන සිරිතකි. එසේ ම මෙහි සුවිශේෂී ලක්ෂණය වන්නේ කඨින චීවරය පූජා කිරීමේ ආනිසංස සැම දෙනාට ම අත්පත් වීම ය. එම අවස්ථාව උදාකර ගැනීම සඳහා කඨින චීවරය සාංඝික වශයෙන් පූජා කිරීමට බෞද්ධයෝ සැමදා කැමති වූහ. සාංසාරික ජීවිතය තුළ සැප විපාක ලබාගැනීමට හා විමුක්ති මාර්ගය සකසා ගැනීමට කඨින පිංකම මහත් වූ ශ්‍රද්ධාවෙන් සිදු කිරීමට බොහෝ දෙනා ප්‍රයත්න දරති. වස්කාලය තුළ හා කඨින චීවරය පූජා කරන දිනයේදී කඨිනානිසංස දැන ගැනීමට බෞද්ධයෝ කැමති වෙති.

කඨින චීවර පූජාව මහා සංඝරත්නයට පූජා කිරීමෙන් ලැබෙන ආනිසංස පිළිබඳ ව පැහැදිලි විවරණයක් ඇතුළත් වන්නේ නාගිතාපදානයෙහි ය. කිසියම් දායක පිරිසක් කඨින චීවරයක් පූජා කරන්නේ නම් කඨිනානිසංස මෙපමණකැයි කිව නොහැකි ය. නාගිත හිමියන් තමන් සිදුකළ කඨින පූජාවන්ගෙන් ලැබූ කඨිනානිසංස මෙලෙස පෙන්වා දී ඇත.

**01. දුගතිගාමී නොවීම.**
**02. දෙව්ලොව දිව්‍යමය සම්පත් ලැබීම.**
**03. සක්විති රාජ්‍ය සම්පත් ලැබීම.**
**04. උපනුපන් තැන්හි සියලු සැප ලැබීම.**
**05. පුරුෂයන් අතර උතුම් පුරුෂයකු වීම.**
**06. දිව්‍ය ලෝකයෙහි හා මනුෂ්‍ය ලෝකයෙහි පමණක් ඉපදීම.**
**07. පහත් කුලවල නො ඉපදීම.**
**08. මිනිසුන්ට ප්‍රධානියෙකු වීම.**
**09. සක්දෙව් රජ පදවිය ලැබීම.**
**10. නිවනට ද පත්වීම.**

### නාගිතාපදානයේ දැක්වෙන කඨිනානිසංශ

**''අහො බුද්ධො අහො ධම්මො අහො සංඝස්ස සම්පදං**
**පරිත්තදානං දත්වාන ලද්ධා මෙ විපුලං සුඛං''**

බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් කඨින දානය සිදුකරන්නට වූ බව මෙහිදී පැහැදිලි වේ. එසේ ම විපුල වූ සැපයක් (විපුලං සුඛං) මෙලොව හා පරලොව යන දෙකෙහිදී ම ලැබූ බව සඳහන් කර ඇත.

චීවර පිණ්ඩපාතය හා මල් පහන් කොඩි කුඩ ආදී එදින කරන සියලු පූජාවලින් කඨින ආනිසංස ලැබේ. එසේ ම කඨිනය මැසීම කෙතරම් ආනිසංසදායක ද යත් ඉදිකටු, පහරක් පාසා සක්විති රජ සම්පත් ලැබීමට හේතු වනබව ''ආරපථෙ ආරපථෙ - චක්කවත්තිසිරිං ලභෙ ''යනුවෙන් දක්වා තිබේ. මෙම කරුණු සැළකිල්ලට ගනිමින් කඨිනයේ වැදගත්කම පැහැදිළිවන පරිදි කාලෝචිත ධර්ම දේශනාවක් කිරීමට පුහුණුවන්න.

### මතක ධර්ම දේශනාව

හත්දවසේ මතක ධර්මදේශනාවලදී මරණය පිළිබඳ පැහැදිලි කිරීමක් සහිත දේශනාවක් පැවැත්වීම මූලික සම්ප්‍රදාය ය. එහිදී පහත මාතෘකා ද භාවිත කළ හැකි ය.

**''උපනීයති ලොකො අද්ධුවොති.... අත්තාණො ලොකො අනභිස්සරොති.... අස්සකො ලොකො සබ්බං පහාය ගමනීයන්ති.... ඌනො ලොකො අතිත්තො තණ්හාදාසොති....''**

**(මජ්ඣිමනිකාය, 02, රාජ වග්ගය, රට්ඨපාල සූත්‍රය)**

ජරාව විසින් ලෝකය මරණය කරා පමුණුවනු ලැබේ එබැවින් අස්ථිර ය. ලෝකය රැකවරණයෙන් තොර ය. එබැවින් අධිපතිත්වයක් නැත. ලෝකය ස්වකීයත්වයෙන් තොරය සියල්ල හැරදමා යා යුතු ය. ලෝකය ඌනය අතෘප්තිකර ය. තණ්හාවට දාසයෙකි.

**''උපනීයති ජීවිතමප්පමායු ජරූපනීතස්ස න සන්ති තාණා**
**එතං භයං මරණෙ පෙක්ඛමානො පුඤ්ඤානි කයිරාථ සුඛාවහානි''**

**(අංගුත්තර නිකාය, බ්‍රාහමණ වග්ගය, පඨමදෙවබ්‍රාහමණ සූත්‍රය)**

මේ ජීවිතයේ ආයුෂ වහා ගෙවී යයි. ජරාව කරා එළඹේ. මෙලෙස මරණයේ භය දකිනු ලබන්නේ පින් කළ යුතු ය. එය සැප ගෙනදේ.

**''නත්ථි ඛො මහාරාජ ජාතස්ස අඤ්ඤත්‍ර ජරාමරණා. යෙපි තෙ මහාරාජ ඛත්තියමහාසාලා අඩ්ඪා මහද්ධනා මහාභොගා පහූතජාතරූපරජතා පහූතවිත්තූපකරණා පහූතධනධඤ්ඤා තෙසම්පි ජාතානං නත්ථි අඤ්ඤත්‍ර ජරාමරණා....''**

**(සංයුත්ත නිකාය, කොසල සංයුත්තය, රාජ සූත්‍රය)**

මහරජ, උපන් පුද්ගලයාට ජරාමරණ හැර වෙන කිසිවක් නැත. ආඪ්‍ය වූ මහත් ධනය ඇති මහත් භෝග ඇති බොහෝ රන් රිදී ඇති බොහෝ වස්තු උපකරණ ඇති බොහෝ ධාන්‍ය ඇති ක්ෂත්‍රිය මහාසාලයන් වෙත් ද? උපන්නා වූ ඔවුන්ට ද මරණය හැර වෙන කිසිවක් නැත....

අනුමෝදනා දේශනා

ඒ ඒ නිකායික සම්ප්‍රදායයන්ට අනුගත වෙමින් අවස්ථාවට ගැලපෙන පරිදි කාලෝචිතව නිවැරදිව දහම් කරුණු පහදා දෙමින් දේශනාවන් පැවැත්වීම පිළිබඳ නිසි පුහුණුවක් ලබාගැනීම උචිත ය. තුන්මාසයේ පින්කමක් සහ වාර්ෂික පින්කමක් සිදුකරන අවස්ථාවක දී බෞද්ධ ප්‍රතිපදාවට අනුකූලව දැහැමි දිවි පෙවෙතක් ගතකරමින් නිවන් මග සාදාගැනීමට උපකාරී වන මාර්ග දර්ශනය පැහැදිලි කරන දේශනාවක් පැවැත්වීම කෙරෙහි අවධානය යොමුකරන්න. එහිදී පහත දේශනා පාඨ ඇසුරු කරගන්නා අතර වෙනත් අවස්ථාවෝචිත දේශනා පාඨ ඇසුරු කිරීම ද ඉතා වැදගත් ය.

**''තිණ්ණං භික්ඛවෙ, සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. කථමෙසං තිණ්ණං? සද්ධාය භික්ඛවෙ සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස භික්ඛවෙ.... දක්ඛිණෙය්‍යානං භික්ඛවෙ....''**

**(අංගුත්තර නිකාය, තික නිපාතය, චූලවග්ගය, සම්මුඛීභාව සූත්‍රය)**

මහණෙනි කරුණු තුනක් එකතුවීම නිසා ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයා බොහෝ පින් රැස් කරයි. කවර කරුණු තුනක් ද ශ්‍රද්ධාව, දෙය්‍යධර්මය, දක්ෂිණාර්හ පුද්ගලයන් යනුවෙනි.

**''සබ්‍රහ්මකානි භික්ඛවෙ, තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සපුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරො අජ්ඣාගාරෙ පූජිතා හොන්ති. සාහුනෙය්‍යානි භික්ඛවෙ,.... බ්‍රහ්මාති භික්ඛවෙ මාතා පිතුන්නං එතං අධිවචනං පුබ්බාචරියාති භික්ඛවෙ.... තං කිස්ස හෙතු බහුකාරා භික්ඛවෙ මාතාපිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරොති.''**

**(අංගුත්තර නිකාය, තික නිපාතය, දෙවදූත වග්ගය, සබ්‍රහ්මක සූත්‍රය)**

මහණෙනි යම් කුලපුත්‍රයෙකුගේ ගෙදර මව්පියන් පුදන ලද්දේ වේද එම ගෙදර බ්‍රහ්මයා සහිත ය. පූර්වාචාර්යන් සහිත ය, සාහුනෙය්‍යක ය. මහණෙනි බ්‍රහ්ම යන්න, පූර්වාචාර්ය යන්න මව්පියන්ට විශේෂ නාමයන් ය. එයට හේතු කිම මහණෙනි මව්පියෝ දරුවන් කවා පොවා පොෂණය කොට මේ ලෝකය පෙන්වන්නෝ ය.

**''නිහීයති පුරිසො නිහීනසෙවී න ච හායෙථ කදාචි තුල්‍යසෙවී**
**සෙට්ඨ මුපනමං උදෙති ඛිප්පං තස්මා අත්තනො උත්තරිං භජෙථාති''**

**(අංගුත්තර නිකාය, පුග්ගල වග්ගය, ජිගුච්ඡිතබ්බ සූත්‍රය)**

නිහීන පුද්ගලයන් ඇසුරු කරන්නා පිරිහේ. සමානයන් ඇසුරු කරන්නා කිසිදිනකත් නොපිරිහේ. ශ්‍රේෂ්ඨ පුද්ගලයා ඇසුරු කරන්නා වහා ශ්‍රේෂ්ඨත්වයට පත්වේ. ඒ නිසා තමාට වඩා ශ්‍රේෂ්ඨ අයෙකු ඇසුරු කරන්න.

**සත්තිමානි භික්ඛවෙ ධනානි කතමානි සත්ත? සද්ධාධනං, සීලධනං, හිරිධනං, ඔත්තප්පධනං, සුතධනං, චාගධනං, පඤ්ඤාධනං.**

**(අංගුත්තර නිකාය, ධන වග්ගය, විත්ථතධන සූත්‍රය)**

මහණෙනි, ධන හතකි. ඒ කවර හතක් ද?. ශ්‍රද්ධා ධනය, ශීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය, සුත ධනය, චාග ධනය, ප්‍රඥා ධනය යනුවෙනි.

**ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, මහා මංගල සූත්‍රය, පත්තකම්ම සූත්‍රය, චුල්ල කම්ම විභංග සූත්‍රය, පරාභව සූත්‍රය, වසල සූත්‍රය** ආදී ගිහි ජීවිතය සාර්ථක කරගැනීමට අදාළ සූත්‍ර දේශනා ඇසුරු කරගනිමින් විචිත්‍ර ධර්ම කථිකයාණන් වහන්සේ නමක් විය හැකි ය. ධර්ම දේශනාවක් පැවැත්වීමේදී ශ්‍රාවකයා තුළ එම දහම තහවුරු කරවීම දේශකයන් වහන්සේගේ ප්‍රධාන අපේක්ෂාවක් විය යුතු ය. සච්චවිභංග සූත්‍රයේදී ඒ බව මෙසේ පැහැදිලි කර ඇත.

| | |
|---|---|
| **ආචික්ඛනා** | කරුණු වශයෙන් සංක්ෂිප්තව නාමිකව කරන හඳුන්වා දීම. |
| **දෙසනා** | කරුණු විස්තරාත්මකව පැහැදිලි කිරීම |
| **පඤ්ඤපනා** | දහම් කරුණු හඳුනා ගැනීමට අවකාශ සැලසීම |
| **පට්ඨපනා** | හඳුනාගත් කරුණු තහවුරු කිරීම |
| **විවරණ** | තහවුරු වූ කරුණු විවෘත්ත තර දක්වීම |
| **විභජනා** | විවරණය කළ දහමෙහි ප්‍රභේද දැක්වීම |
| **උත්තානිකම්ම** | හැම අතින්ම අනාවරණය වූ කරුණක් කොට දැක්වීම. |

මෙසේ හැම අතින් ම සුපිරිසිදු දහමක් දේශනාකරන විට ශ්‍රාවකයාට දෙලොවාභිවෘද්ධිය සලසා ගත හැකි ය.

**අභ්‍යාස**

01. සාම්ප්‍රදායික ධර්ම දේශනාවක ඇතුළත් විය යුතු අංග පිළිබඳ ව ගුරුවරයා සමග සාකච්ඡා කර ධර්ම දේශනා පුහුණු වැඩසටහනක් සිදු කරන්න.

02. කඨිනය හා සම්බන්ධ පෞරාණික සිරිත් හා විනයානුකූල පිළිවෙත් පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

# 29 පාඩම
# රජු දැහැමි වේ නම් රට දැහැමි වේ ම ය

බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ ලෞකික හා ලොකෝත්තර දියුණුවට ඉවහල්වන සෑම විෂයයක් පිළිබඳව ම දහම් දෙසූහ. එහිලා උන්වහන්සේගේ විශේෂ අවධානයට ලක් වූ තේමාවකි, රාජ්‍ය පාලනය. ඊට හේතුව යහපත් දේශපාලන වාතාවරණයක් නොමැති රටක, ප්‍රදේශයක වෙසෙන පුද්ගලයාට තමා අපේක්ෂා කරන ලෞකික හෝ ලෝකෝත්තර දියුණුවක් ලබා ගැනීමට නොහැකි වීම යි.

බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ උන්වහන්සේට දක්නට ලැබුණු රාජ්‍ය පාලනය හුදෙක් පුද්ගලයාගේ යහපතට බාධා පමුණුවන එකක් විය. සංයුත්ත නිකායේ මාර සංයුත්තයේ රජ්ජ සූත්‍රයේ සඳහන් කරුණකින් එය පැහැදිලි වෙයි. දිනක් බුදුරජාණන් වහන්සේ කොසොල් රට හිමවත් පෙදෙසෙහි වනයක විවේක සුවයෙන් වැඩසිටින විට පහළ වූ සිතිවිල්ලක් වූයේ,

**"නොනසමින් නොනස්වමින් නොදිනමින් නොදිනවමින් ශෝක නොකරමින් ශෝක නොකරවමින් දැහැමින් රාජ්‍යය කරවන්නට හැකි ද?" යන්නයි.**

**("සක්කා නු ඛො රජ්ජං කාරෙතුං අහනං අඝාතයං අජිනං අජාපයං අසොචං අසොචයං ධම්මෙනාති")**

රාජ්‍ය පාලනය සම්බන්ධව පැවති මෙවන් පසුබිමක බුදුන් වහන්සේ රාජ්‍ය පාලනයට අදාළ ව සිය දේශනා පවත්වමින් ඉදිරිපත් කරන්නට වූයේ රටකට, ප්‍රදේශයකට දැහැමි පාලකයකුගේ අවශ්‍යතාව අනිවාර්ය වියයුතු බව යි.

රටක පළමු වැසියා පාලකයා ය. ඔහු අනුගමනය කිරීම රටවැසියාගේ ස්වභාවය යි. ඒ නිසා ම රටවැසියාගේ යහපත හෝ අයහපත තීරණය වන්නේ පාලකයාගේ නැතහොත් රජුගේ ඇවතුම් පැවතුම් මත ය. පාලකයා දැහැමි අයෙකු වුවහොත් සමස්ත වැසියෝ ම සැපවත් වෙති. මෙම පාඨයෙන් එය පැහැදිලි වේ.

**සබ්බං රට්ඨං සුඛං සෙති**
**රාජා චෙ හොති ධම්මිකො**

යම් ගව රැළක නායක ගවයා නිවැරදි ව ඍජු ව ගමන් කරන තාක් සෙසු ගවයෝ ද නිවැරදි ව ඍජු ව ගමන් කරති. එසේ ම ගව නායකයා වැරදි ව ඇද ව ගමන් කරන්නේ නම් සෙසු ගවයෝ ද එසේ ගමන් කරති.

**ගවං චෙ තරමානානං**
**උජුං ගච්ඡති පුංගවො**
**සබ්බා තා උජුං ගච්ඡන්ති**
**නෙත්තෙ උජු ගතෙ සති**

මෙම නිදර්ශනය ආදර්ශය කර ගන්නා බුදුරජාණන් වහන්සේ පාලකයා සම්බන්ධ ව පුන පුනා ඉදිරිපත් කළ එකම අදහස වූයේ ධාර්මිකත්වය මූලධර්මය වශයෙන් තබා සිය පාලනය පවත්වාගෙන යා යුතු බව යි. පාලකයකුගේ ධාර්මිකත්වය යනු කුමක් ද යන්න බුදුරජාණන් වහන්සේ දීඝ නිකාය චක්කවත්ති සීහනාද සූත්‍රයේ දී පෙන්වා දී ඇත. ඒ අනුව පාලකයා ධර්මයට ගරු කරන්නෙකි. (ධම්මං ගරු කරොන්තො) ධර්මයට සත්කාර කරන්නෙකි (ධම්මං සක්කරොන්තො) ධර්මයට අවනතව ක්‍රියා කරන්නෙකි (ධම්මං මානෙන්තො) ධර්මයට පුද සත්කාර කරන්නෙකි. (ධම්මං පූජෙන්තො) ධර්මයට අනුකූලව ක්‍රියා කරන්නෙකි. (ධම්මං අපචාය මානො) ධර්මය ධජය ලෙස සලකන්නෙකි. (ධම්මධජො) ධර්මය අධිපතිකොට සලකන්නෙකි. (ධම්මාධිපතෙය්‍යො)

මීට අමතර ව දැහැමි පිළිවෙත් ඇසුරෙන් රටවැසියා රැක බලා ගත යුතු ය. යම් විටක පාලකයා අධාර්මික වන්නේ නම් ඔහුගෙන් පසු ව සිටින ඇමති මණ්ඩලය ආදි සියලු දෙනාත් ක්‍රමයෙන් එය ස්වාභාවික පරිසරයට පවා බලපා නැවත එය රට වැසියාට ම අයහපත් අයුරින් ක්‍රියාත්මක වන බව ද බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකාය චතුක්ක නිපාතයේ අධම්මික සූත්‍රයේ දී පැහැදිලි කළහ.

රටක පාලකයා ධාර්මික වත් පිළිවෙත් රකිමින් සිටීමෙන් පමණක් එරට ධාර්මික වන්නේ නැත. රටක් අධාර්මික වීමට බලපාන ප්‍රධාන සාධකයකි, ආර්ථික අසමතුලිතතාව. ඒ බව චක්කවත්ති සීහනාද සූත්‍රයේ දී අපූරුවට පැහැදිලි කර ඇත. එම නිසා රටේ ධාර්මිකත්වය සුරකින්නට නම් පාලකයා රට තුළ ස්වයං පෝෂිත ආර්ථිකයක් සකස් කර ගැනීමට අදාළ පසුබිම සැකසිය යුතු ය. දීඝ නිකාය කූටදන්ත සූත්‍රයේ දී ඒ බව පැහැදිලි කර ඇත. ඒ අනුව පාලකයා,

01. **මූල ධනය (ප්‍රාග්ධනය), වෙළඳපොළ ආදිය ලබා දෙමින් වෙළඳාම ශක්තිමත් කිරීමත්**
02. **බිත්තර වී, ගොවිපොළ, පොහොර ආදිය ලබා දී කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීමත්**
03. **හැකියා මත රැකියා ලබා දී ඊට සරිලන වැටුප් ආදිය සැපයීමෙන් රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමත් කළ යුතු ය.**

මේ ආකාර දැහැමි පාලනයක් උදෙසා බුදුරජාණන් වහන්සේ විසින් නිර්දේශිත ප්‍රතිපත්තිමය ඉගැන්වීම් රාශියක් ඇත. එනම්,

01. දස සක්විති වත්
02. දස රාජ ධර්ම
03. සප්ත අපරි හානිය ධර්ම
04. සතර සංග්‍රහ වස්තු ආදිය යි.

**1. දස සක්විති වත්.**

දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් අවධාරණය කෙරෙන ධාර්මික පාලන ප්‍රතිපත්තියක් ලෙස මෙය දැක්විය හැකි ය. රාජ්‍ය පාලනය සඳහා පරමාදර්ශී පාලකයා ලෙස බුදුසමය පෙන්වා දෙන්නේ සක්විති (චක්‍රවර්ති) රජු ය. ඔහුගේ පාලනයේ ඇති විශේෂතා කීපයකි.

01. දැහැමින් රට පාලනය කිරීම.
02. මිනිස් වර්ගයාගේ පමණක් නොව සිව්පා පක්ෂීන්ගේ පවා ජීවිත සුරක්ෂිත කිරීම.
03. ආර්ථිකය සුරක්ෂිත කිරීම.
04. විශාරදයන්ගෙන් උපදෙස් ලබා ගැනීම.

මෙම කරුණු සියල්ල අන්තර්ගත වන සක්විති වත් 10 මෙසේ ය.

01. රජුගේ පුත්‍ර දාරාදීන්ගේ ධාර්මික රැකවරණය සංවිධානය කිරීම.
02. බල සෙන් පිළිබඳ ධාර්මික රැකවරණය සැලසීම.
03. රාජ්‍යයෙහි අනුයුක්ත ක්‍ෂත්‍රියයන් පිළිබඳ ව ධාර්මික රැකවරණය සැලසීම.
04. බ්‍රාහ්මණ ගෘහපතියන් පිළිබඳ ධාර්මික රැකවරණය සැලසීම.
05. නියම්ගම් ජනපදවාසීන් පිළිබඳ ධාර්මික රැකවරණය සැලසීම.
06. රටේ සදාචාර නියමයන් වන මහණ බමුණන් පිළිබඳ ධාර්මික රැකවරණය සැලසීම.
07. සිව්පා පක්ෂීන් පිළිබඳ ධාර්මික රැකවරණය සැලසීම.
08. රාජ්‍යයේ අධර්ම ක්‍රියා නැවැත්වීමට ක්‍රියා කිරීම.
09. නිර්ධනයන්ට තමා අභිමත කර්මාන්ත සඳහා ධනය පරිත්‍යාග කිරීම.
10. ආත්ම දමනයෙහි නියුක්ත මහණ බමුණන් වෙත වරින් වර එළඹ කුසලය අකුසලය, යහපත අයහපත පිළිබඳ විචාරා දැන ක්‍රියා කිරීම.

## 2. දසරාජ ධර්ම

දස රාජ ධර්මයෙන් ද දැක්වෙන්නේ පාලකයෙකු සතු විය යුතු උසස් වූ ද උදාර වූ ද ආචාර ධර්ම පද්ධතියකි. ඒවා නම්

**දානං සීලං පරිච්චාගං**
**අජ්ජවං මද්දවං තපං**
**අක්කොධො අවිහිංසා ච**
**ඛන්තී ච අවිරොධතා**

දාන යනු දීම යි. ජනතාවගේ ආර්ථික ශක්තියට අදාළ මූල ධනය දීමත්, ආහාර පාන නිවාස ආදි අනෙකුත් පහසුකම් සලසා දීමත් මෙයින් අදහස් කෙරේ. රට තුළ සදාචාරය සුරකිනු පිණිස නීතිය ආදිය ද ඇසුරෙන් අවශ්‍ය කටයුතු කිරීම සීලයයි. පරිච්චාග යනු රටවැසියා වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුකම් ආදි සියල්ල කැප කරමින් කටයුතු කිරීමයි. අජ්ජ ව නම් ඍජු හෙවත් අවංක, සාධාරණ තීරණ ගනිමින් අගතිගාමී නොවී ස්ථිර ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීමයි. මද්දව නම් ආශ්‍වාදායක ලක්‍ෂණවලින් මිදී මහජනයා කෙරෙහි අනුකම්පාවෙන් මෘදු ලෙස ක්‍රියා කිරීමයි. තප යනු තපසයි. ඉන්ද්‍රිය දමනය සහිත ව හැඟීම්වලට වහල් නොවී කටයුතු කිරීම යි. ජනතාව දරුවන් සේ සලකා ඔවුන් සමග මිත්‍රශීලීව කටයුතු කිරීම අක්‍රෝධ නම් වේ. ජනතාව විෂයෙහි සියලු කායික මානසික හිංසන ක්‍රියාවලින් මිදී කටයුතු කිරීම අවිහිංසා නම් වේ. ඛන්ති නම් ඉවසීම යි. ඉක්මන් තීරණවලට නොයා කල්යල් බලා කටයුතු කිරීම යි. අවිරෝධය නම් ජනතාව සමග ගැටුම් ඇති නොකර ගනිමින් ජනතා අදහස්වලට ඇහුම්කන් දී කටයුතු කිරීම යි. මෙම ප්‍රතිපත්ති නිසා ඕනෑම රටක සාමයත් සමෘද්ධියත් ඇති වේ.

## 3. සප්ත අපරිහානිය ධර්ම

මෙම පිළිවෙත දීඝනිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ "පෝරාණ වජ්ජී ධම්ම" ය ලෙස සඳහන් ව ඇත. වජ්ජී දේශයේ ලිච්ඡවී රාජවංශිකයන් විසින් අනුගමනය කරන ලදැයි සැලකෙන මෙම ප්‍රතිපත්ති ධාර්මික රාජ්‍යයක සැකැස්මට හේතු විය. යම් රාජ්‍යයක මෙම පිළිවෙත් ආරක්‍ෂා කරන්නේ නම් එය නොපිරි හී පවතින බව බුදුන් වහන්සේ දේශනා කොට ඇත. එම අපරිහානි ප්‍රතිපත්ති හත නම්,

01. නිතර නිතර රැස්වීම.
02. සමගියෙන් රැස් ව සමගියෙන් ක්‍රියා කොට සමගියෙන් විසිර යාම.
03. නොපැනවූ නීති නො පැනවීම හා පනවන ලද නීති ආරක්ෂා කිරීම.
04. වැඩිහිටියන්ගේ උපදෙස් ගරු කිරීම.
05. කුල කාන්තාවන්ගේ ආරක්ෂාව සැලසීම.
06. ඓතිහාසික ස්ථාන රැකබලා ගැනීම.
07. වරින්වර මහණ බමුණන්ට රැකවරණය ගරුසරු ව සැලකීම හා උපදෙස් ලබා ගැනීම.

### 4. සතර සංග්‍රහ වස්තු

දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍රයේ දී තුදුස් ලාමක ධර්ම යටතේ දක්වා ඇති මෙම සතර සංග්‍රහ වස්තුව දැහැමි රාජ්‍ය පාලනයට අදාළ තවත් ප්‍රතිපත්තියක් ලෙස සඳහන් කළ හැකි ය. දැහැමි පාලකයා මෙහි සඳහන් කරුණු සතර මහජනයා වෙනුවෙන් වූ සංග්‍රහ වස්තු හතරක් ලෙස සලකා කටයුතු කළ යුතු ය. ඒවා නම්,

01. දානය
02. ප්‍රිය වචනය
03. අර්ථ චරියාව
04. සමානාත්මතාව යනු යි.

මෙහි දානය යනු දසරාජ ධර්මවල දක්වූ දානය ම ය. රටේ මහජන ශුභ සිද්ධිය උදෙසා අවශ්‍ය කටයුතු සම්පාදනයයි. රටේ ස්වයංපෝෂිත ආර්ථික පසුබිමක් ඇතිවීමට අවශ්‍ය පදනම පාලකයා විසින් ඇති කළ යුතු ය. ඒ සඳහා විවිධාකාරයෙන් කෙරෙන රාජ්‍ය මැදිහත් වීම තවදුරටත් දානය යන්නට අර්ථ වශයෙන් දැක්විය හැකි ය.

පාලකයා කෙරෙහි මහජනයාගේ විශ්වාසය ඇතිවන්නේ ඔහු තුළ පවතින සත්‍යවාදී බව පදනම් කරගෙන ය. පාලකයාගේ ඕනෑම ප්‍රකාශයක් මහජනයාට පිළිගැනීමට සිදුවේ. පාලකයාගේ එම ප්‍රකාශ බොරුවෙන්, මුසාවෙන් යුක්ත නම් මහජනයා ඉන් මුළා වෙති. එය පාලන පෞරුෂයට හානිකරය. එම නිසා පාලකයා සත්‍යවාදී හා සත්‍ය ගරුක ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය. පාලකයාගේ වචන ප්‍රිය වචන බවට පත්වන්නේ එවිට ය.

සතර සංග්‍රහ වස්තුවේ දැක්වෙන අර්ථචරියා යන්න අර්ථ කිපයක් ඇති සංකල්පයකි. පාලකයා තමාගේ යහපත උදෙසා නොව මහජන සුභසිද්ධිය උදෙසා කටයුතු කළ යුතු බව අර්ථචරියා යන්නේ මූලික අදහසයි. නිතරම ජනයාගේ සුබසෙත ගැනම සිතිය යුතු ය.

අර්ථ චරියා යන්නට තිබෙන තවත් අර්ථයක් නම් රට තුළ ආර්ථික ශක්තිය ඇති කිරීම යන්න යි. කූටදන්ත ආදි සූත්‍රවල දක්වූ කරුණු ඇසුරෙන් පාලකයාට එය රට තුළ සිදුකළ හැකි ය.

රටක පාලකයා නිරන්තරයෙන්ම කටයුතු කළ යුත්තේ සමස්ත මහජනයා කෙරෙහි වූ සමසිතින් ය. කුල, මල, ජාති, ආගම්, පක්ෂ, පාට ඔහුට තිබිය නොහැකි ය. රටේ සියලු දෙනාම තම දරුවන් සේ සලකා අපක්ෂ පාතී ව කටයුතු කිරීම පාලකයාගේ සමානාත්මතා ගුණය යි. එමෙන් ම ඔහු සිය පාලන කටයුතුවලදී අටලෝ දහමින් කම්පා නොවී උපේක්ෂා සහගතව සමසිතින් සිටීම ද සමානාත්මතා ගුණය ලෙස දක්වේ.

මේ ආකාර වූ බුදු දහමින් නිර්දේශිත දැහැමි රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ඔස්සේ රටක්, ප්‍රදේශයක් පාලනය කිරීම තුළින් මහජනයාට සියලු අරමුණු ඉටු කරගනිමින් යහපත් ජීවිත ගෙවන්නට හැකියාව ලැබෙන බව විශ්වාසය යි.

**අභ්‍යාස**

පහත සඳහන් රචනාමය ප්‍රශ්නවලට ප්‍රමාණාත්මක විස්තර පිළිතුරු සපයන්න.

01. රටකට දැහැමි පාලනයක ඇති අවශ්‍යතාව පැහැදිලි කරන්න.
02. බුද්ධ දේශිත පාලන ප්‍රතිපත්තිවල ඇති විශේෂතාව පහදන්න.
03. ස්වයංපෝෂිත ආර්ථික රටාවක් රට තුළ ඇතිකරලීම විශේෂ වන්නේ ඇයි දැයි පහදන්න.
04. රටක මහජනයාගේ සියලු කාරණා විෂයෙහි වගකිවයුත්තා පාලකයාය. පහදන්න.
05. දස සක්විතිවත් හි අන්තර්ගතය පිළිබඳ විමසීමක් කරන්න.
06. දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලන ශික්ෂණය තහවුරු කරයි. විමසන්න.

30 පාඩම

# දහම රකින්නා දහමින් රැකේ

"දාළිද්දියම්පි භික්ඛවෙ දුක්ඛං ලොකස්මිං
ගිහීනො කාමභොගිනො"

අංගුත්තර නිකාය ඉණ සූත්‍රය

මෙම බුදු වදනට අනුව කාමභෝගි ගිහි ජනයාට දිළිඳුකම යනු දුකකි. දිළිඳුකමේ දුකට හසු වූ ගිහියාගේ මෙලොව ජීවිතය අසාර්ථක ය. ඊට හේතුව ගිහිකම හුදෙක් කාමභෝගීත්වය මත ම පදනම් වීම යි. දුප්පත්කමින් වෙළුණු මෙලොවක් ඇති ගිහියාගේ පරලොව ද අසාර්ථක ය. දුප්පත්කමේ අගහිගකමින් හා පීඩනයෙන් දිවිගෙවන්නාට විමුක්තියක් පිළිබඳව සිතන්නට පවා ඉඩක් නැත. මේ තොරතුරුවලින් පැහැදිලි වන්නේ පුද්ගල ජීවිතයක සියලු අභිමතාර්ථයන් දිළිඳුකම නිසා නැති වන බව යි.

මෙසේ ආර්ථික අපහසුකම මත ඇතිවන දිළිඳුකම පුද්ගල ජීවිතයට සෘජුව ම බලපා විනාශ මුඛයට ඇද දමද්දී එය ඔහුගේ සමාජ ජීවිතයට ද හානි පමුණුවයි. ඒ දිළිඳුකම සමාජ දූෂිත ප්‍රධාන සාධකය වන නිස යි. දිළිඳුකම ඇති සමාජයක වෙසෙන පුද්ගලයා දිළිඳුකම නිසා ම විවිධාකාර සමාජාපචාර රාශියක හිමිකරුවෙක් වෙයි. ඉන් සිදුවන්නේ පුද්ගලයා පමණක් නොව සමස්ත සමාජය ම අගාධයට යාමයි. මෙය හේතුඵලවාදී ව සිදුවන ආකාරය පිළිබඳව අපූරු විස්තරයක් දීඝ නිකාය චක්කවත්ති සීහනාද සූත්‍රයේ සඳහන් වේ. එහි දැක්වෙන්නේ රටක පාලකයා මැදිහත් වී දිළිඳුකමින් මිදීමට කටයුතු සම්පාදනය නොකළහොත් රටට අත්වන භයානක ඉරණමයි. ඒ අනුව දිළිඳුකම වැඩි වී ගොස් පිළිවෙළින් සොරකම, ආයුධ ගැනීම, ප්‍රාණඝාතය, බොරුකීම ආදිය අවසානයේ මහා විනාශයකින් පසු ව ඔවුනොවුන් පිළිබඳ මෘග සංඥාව (සිවුපා ආදි සතුන් තුළ ඇතිවන සිතිවිලි ඇති වී, අවිවලින් ඇන කොටා ගෙන වැනසෙන බවත් දැක්වේ.

මේ අයුරින් පුද්ගල පරිහානියටත් සමාජ පරිහානියටත් මූල හේතුව දිළිඳුකම බව පැහැදිලි ය. බුදුරජාණන් වහන්සේගේ ආර්ථික ප්‍රතිපත්තියට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් වී ඇත්තේ එම දිළිඳුකමින් මිදී ආර්ථික ශක්තිය ඇතිකර ගැනීම සඳහා ය. ඒ තුළින් මෙලොව ජීවිතය අර්ථදායි ව ගෙවන්නටත් (දිට්ඨධම්ම සුඛ) අර්ථදායි පරලොව ජීවිතය පිළිබඳ බලාපොරොත්තු තබන්නටත් (සම්පරායික සුඛ) පරම විමුක්තිය පිළිබඳ අපේක්ෂාවෙන් කටයුතු කරන්නටත් (පරමත්‍ථ සුඛ) හැකිවන බව දේශිත ය.

ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධ ව බෞද්ධ ඉගැන්වීම ප්‍රධාන තේමා තුනක් යටතේ දැක්වේ.

01. ධනෝපාර්ජනය හෙවත් ධනය ඉපයීම.

02. ධන සුරක්ෂණය හෙවත් ආරක්ෂා කිරීම.

03. ධන විසර්ජනය හෙවත් පරිහරණය. යනු ඒවා ය.

**1. ධනෝපාර්ජනය හෙවත් ධනය ඉපයීම**

අංගුත්තර නිකාය අණන සූත්‍රයේ දක්වෙන ආකාරයට ධනය ඉපයිය යුත්තේ දැහැමින් උපයන ලද ධනයක් ඇති ව එය තමන්ට ඇතැයි සතුටු විය හැකි නම් පමණි.

**"අත්ථි මෙ භොග සුඛං අධිගච්ඡති සොමනස්සං"**

මින් තහවුරු වන්නේ කුමන හෝ ආකාරයකින් ධනය උපයා සතුටු විය නොහැකි බවයි. අංගුත්තර නිකාය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී දක්වා ඇත්තේ උපයන ලද ධනය ධාර්මික විය යුතු ලෙසට යි. ඊට අදාළ ක්‍රමවේදය ද එහි සඳහන් ව ඇත. ඒ අනුව

| | |
|---|---|
| 01. උට්ඨාන විරියාධිගතෙහි | උට්ඨාන වීර්යයෙන් |
| 02. බාහාබල පරිචිතේහි | දෑත දෙපයේ මහන්සියෙන් |
| 03. සේදා වක්ඛිත්තෙහි | දහඩිය වගුරුවා |
| 04. ධම්මිකෙහි ධම්ම ලද්ධෙහි | ධාර්මික ව |

ධනය ඉපයිය යුතු ය. මෙම මූලික පදනමේ පිහිටා,

* වෙළඳාම
* කෘෂිකර්මාන්තය
* රාජ්‍ය සේවය හා
* වෙනත් ශිල්ප කර්මාන්ත

ඇසුරෙන් තම රැකියාව සකසා ගත හැකි ය. එහි දී ද

| | |
|---|---|
| 01. මංස වාණිජ්ජා | මස් වෙළඳාම |
| 02. සත්ත වාණිජ්ජා | සත්ත්ව වෙළඳාම |
| 03. සත්ථ වාණිජ්ජා | ආයුධ වෙළඳාම |
| 04. මජ්ජ වාණිජ්ජා | මත්පැන් වෙළඳාම |
| 05. විස වාණිජ්ජා | වසවිෂ වෙළඳාම |

යන වැරදි වෙළඳාම් පහෙන් හා

| | |
|---|---|
| 01. තුලා කූට | හොර තරාදි |

**02. මාන කූට** **හොර මිනුම් ක්‍රම**
**03. කංස කූට** **ව්‍යාජ භාණ්ඩ**

වශයෙන් කෙරෙන වැරදිවලින් ද මිදී වෙළඳාම කළ යුතු අතර පොදුවේ, සිය රැකියාව කිරීමේ දී

01. **උක්කෝටන** **අල්ලස් ගැනීම**
02. **වංචන** **රැවටීම**
03. **විපරාමොස** **හිංසන**
04. **ගුම්බවිපරාමොස** **මං පැහැරීම**

වැනි විසමාචාරවලට හසු නොවී කටයුතු කිරීමට ද වගබලා ගත යුතු ය.

මේ ආකාරව කුමන හෝ ධාර්මික මාධ්‍යයකින් උපයන ලද ධනය ක්‍රමානුකූල ව "සෙමෙන්" උපයන ලද්දක් විය යුතු ය. එය බමරු පැණි රැස්කරන්නා සේ ය (භමරස්සේව ඉරීයතො) වේයන් තුඹස් බඳින්නා සේ ය (වම්මිකො වූපචීයති) එමෙන් ම එය සිය අවශ්‍යතා පිරිමසා ලිය හැකි "ප්‍රමාණවත්" ධනයක් ද විය යුතු ය. එසේ නො වී ධනයම ජීවිතය යැයි සිතා එහි ගැතිව, මුළාව, නිමග්ගව (එරී) ධනය උපයන්නට ඉඩක් බුදුසමයෙන් නොලැබේ.

**2. ධන සුරක්ෂණය හෙවත් ආරක්ෂා කිරීම.**

ඉහත ක්‍රමවේදය ඔස්සේ ධනය උපයා ඊළඟට සිදුකළ යුතුව ඇත්තේ වියදම් කිරීම යි. එහෙත් වියදම් කිරීමට අවශ්‍ය නම් එය පළමු ව සුරක්ෂණය විය යුතු ය. ඊට හේතුව වියදමට පෙර ධනය විනාශවන ක්‍රම කීපයක් ඇති බැවිනි. දීඝ නිකාය සිගාලෝවාද සූත්‍රයේ "භොග විනාස මුඛ" (අපාය මුඛ) යනුවෙන් ධනය විනාශ වන ක්‍රම හයක් පෙන්වා දී ඇත. එනම්

**01. මත්පැන් (සුරා) පානයෙ හි යෙදීම**
**02. නොකල්හි වීථි සංචාරය කිරීම**
**03. උත්සව දර්ශනාදියෙහි ලොල් වීම**
**04. දූ කෙළියෙහි යෙදීම (සූදුව)**
**05. පාපී මිතුරන් ආශ්‍රය කිරීම**
**06. අලසකම**

එමෙන් ම

**01. සොරුන්ගෙන්**

02. සතුරන්ගෙන්
03. ගින්නෙන්
04. ජලයෙන්
05. රජුගෙන් ද චෞරයන්, මීයන් වැනි සතුන් හා වෙනත් උවදුරුවලින් ද උපයන ධනය විනාශ වී යා හැකි යි. ඉහතින් දක් වූ සියලු ක්‍රමවලින් ධනය රැක ගැනීමට වගබලා ගත යුතු ය. ඒ බුද්ධිමත් ව සිතා බලා සැලකිලිමත්ව කටයුතු කිරීමෙනි.

3. ධන විසර්ජනය හෙවත් වියදම් කිරීම

අංගුත්තර නිකාය ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දි උත්සාහයෙන් යුක්ත ව ධනය ඉපයීම "උට්ඨාන සම්පදා" යනුවෙනුත් මනා සැලකිල්ලෙන් ධනය ආරක්ෂා කර ගැනීම "ආරක්ඛ සම්පදා" යනුවෙනුත් දක්වා ඇත. එහිම "සමජීවිකතා" යනුවෙන් සංකල්පයක් දක්වා ඇත. ඒ බුද්ධිමත් ධන පරිහරණයයි.

උත්සාහයෙන් ධනය උපයා සුරක්ෂිත වූ ධනයක් සහිත ව සිටින පුද්ගලයා අන්තගාමී පරිභෝජනයකට නොයා යුතු ය. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී එවැනි අන්ත දෙකක් පෙන්වා දී ඇත.

01. අතු සොලවා කඩා දමා දිවුල් (දිඹුල්) පල කන්නෙකු සේ උපයන ලද ධනය සම්පූර්ණයෙන් වියදම් කිරීමේ අන්තය උදුම්බර ඛාදික.

02. නොකා නොබී අකාලයේ මියැදෙන්නට උත්සාහ ගන්නෙකු සේ උපයන ලද ධනය සම්පූර්ණයෙන් ඉතිරි කර ගැනීමේ අන්තය අජද්ධු මාරික.

මේ අන්තගාමී ධන පරිහරණය ප්‍රතික්ෂේප කරන බුදුසමය ඒ සඳහා මධ්‍යස්ථ ක්‍රමයක් හඳුන්වා දී ඇත. ඒ බෙදා පරිහරණය කිරීම යි. සිගාලෝවාද සූත්‍රයෙන් තහවුරු කරන එම ක්‍රමය යටතේ උපයන ලද ධනය කොටස් හතරකට බෙදා ඉන් එක කොටසක් දෛනික පරිභෝජනයටත්, කොටස් දෙකක් තිබෙන ධනය වැඩිකර ගැනීම සඳහා ආයෝජනයටත්, සතරවෙනි කොටස ආපදා අවස්ථාවක දී ගැනීම සඳහා තැන්පත් (නිධන්) කර තැබීමත් කළ යුතු ය.

''එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයොජයෙ
චතුත්ථංච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති''

මෙම මූලික ධන පරිහරණ සංකල්පයට අමතර ව බුදුසමය නිර්දේශ කරන තවත් සංකල්පයක් ඇත. ඒ,

"දත්වා ච භුත්වා ච යථානුභාවං"

යන දේශනාවට අනුව සුදුසු පරිදි ආත්මාර්ථයටත් පරාර්ථයටත් ගැළපෙන සේ වෙන් කොට පරිහරණය කිරීම යි. ඒ අනුව පළමුව තමන් අවශ්‍ය පරිදි ක්‍රමවත් ව පරිභෝජනය කොට සතුටු විය යුතු ය. (භොග සුඛය)

''අත්තානං සුඛෙති පීණෙති සම්මා සුඛං පරිහරති''

අනතුරුව දෙමව්පියන්ට ද ඥාති මිත්‍රාදීන්ට ද දාසි දස් කම්කරුවන්ට ද සුදුසු පරිදි ධනයෙන් කොටස් වෙන් කොට දී ඔවුන් සුවපත් කොට තමන් සතුට ලැබිය යුතු ය. මේ බව අංගුත්තර නිකාය පත්තකම්ම සූත්‍රයේ තොරතුරු සඳහන් වේ.

මීට අමතර ව අංගුත්තර නිකාය පත්තකම්ම සූත්‍රයේ දී උපයන ධනය පොදු පරිහරණයට වෙන් කළ යුතු තවත් ආකාරයක් දක්වා ඇත. ඒ පංච බලි සංකල්පය යි. මින් අදහස් කරන්නේ ඒ ඒ අවස්ථා සඳහා තම ධනය වෙන් කළ යුතු බව යි. ඒ අවස්ථා නම්,

| | |
|---|---|
| 01. ඥාති බලි | ඥාති මිත්‍රාදීන් වෙනුවෙන් |
| 02. අතිථි බලි | ආගන්තුකයින් වෙනුවෙන් |
| 03. පුබ්බපෙත බලි | මිය ගිය ඥාතීන් වෙනුවෙන් |
| 04. දේවතා බලි | ආගමික කටයුතු සඳහා |
| 05. රාජ බලි | රාජ්‍යය වෙනුවෙන් |

මේ ආකාරයට උත්සාහයෙන් ධනය උපයා එය විනාශ වීමට නොදී ආරක්ෂා කර ගනිමින් ආත්මාර්ථය හා පරාර්ථය ඉටුවන සේ පොදු වස්තුවක් කොට සලකා ධනය පරිහරණය කළ යුතු බව බුදු සමයෙන් නිර්දේශ වී ඇත.

මෙම ක්‍රමයට ආර්ථික ශක්තිය ඇතිකරගත් පුද්ගලයා මෙලොව වශයෙන් සාර්ථක වී පැසසුමට ලක්වන අතර පරලොව සුවපත් භාවය ද ළඟා කර ගනී.

ඉධෙව නං පසංසන්ති
පෙච්ච සග්ගෙ පමොදති

**අභ්‍යාස**

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න පහදන්න.

01. දිළිඳුකම සමාජ දූෂණයට ඉවහල් වන්නේ කෙසේදැයි පහදන්න.
02. පුද්ගල හා සමාජ ආර්ථික ශක්තිය බුදුසමයෙන් අගයන්නේ කවර හේතු නිසාදැයි දක්වන්න.
03. අධාර්මික ධනෝපාර්ජනය විවිධ අර්බුධ හා ගැටලුවලට පාදක වන අයුරු නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
04. සාමාන්‍ය ආර්ථික විද්‍යාවේ දී අය සහ වැය පිළිබඳ පමණක් දක්වන අතර බෞද්ධ ආර්ථික ප්‍රතිපත්තියේ දී ධන සුරක්ෂණයක් පිළිබඳ දක්වා ඇත. විමසන්න.
05. බුදුසමයෙන් පැහැදිලි කරන ආකාරයට පුද්ගලයා සතු විය යුත්තේ ධනය ඉපයීම, ආරක්ෂණය, හා පරිහරණය සම්බන්ධ ශික්ෂණයකි. විමසන්න.